අර්ථ භාව ධර්මවිස්තර

සහිත

# ඉතිවුත්තක පාළිය

ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයෙහි උපකුලපති ත්‍රිපිටක
වාගීශ්වරාචාර්ය උපාධ්‍යාය පණ්ඩිත ආගමචක්‍රවර්ති
(විද්‍යෝදය විශ්වවිද්‍යාලය) සාහිත්‍ය චක්‍රවර්ති (ඩී.ලිට්)
(ලංකා විශ්වවිද්‍යාලය)

**කිරිවත්තුඩුවේ ධර්මකීර්ති ශ්‍රී ප්‍රඥාසාරාභිධාන**

පශ්චිම දිශානුදිශාද්වයෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්වාමිපාදයන්
වහන්සේ විසින් සම්පාදිත යි.

කැලණියේ ජයසිරි නිවසෙහි
**කේ. ජී. සිරිවර්ධන මහතා විසින්**
ප්‍රකාශිත යි.

කොළඹ මරදානේ
**අනුල මුද්‍රණාලයෙහි**
මුද්‍රිත යි.

2503
1961

Reprinted and donated for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org.tw
**This book is for free distribution, it is not to be sold.**
නොමිලයේ බෙදාදීම පිණිසයි.
Printed in Taiwan

# සංක්‍ෂේපනය.

ශ්‍රී සුගත තථාගත සද්ධර්මවර චක්‍රවර්ති ස්වාමිවූ අප භාග්‍යවතුන් වහන්සේගේ පර්‍ය්‍යාප්ති ශාසන නම්වූ නවාඞ්ග සමන්‍වාගත ත්‍රිපිටක බුද්ධ වචනයෙහි ඉතිවුත්තකාඞ්ගය වනුයේ මේ **ඉතිවුත්තක පාළි** නම්වූ මනහර ධර්ම ග්‍රන්ථය යි.

එහි කිසිම සූත්‍රදේශනාවක නැති විශේෂ **ලක්‍ෂණයකින්** ප්‍රතිමණ්ඩිතවූ අංගය **ඉතිවුත්තකාඞ්ගය** යි "වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං" යන නිදානයෙන් හා "අයංපි අත්‍ථො වුත්තො භගවතා, ඉති මෙ සුතං" යන නිගමනයෙන් ද එය පැහැදිලි වෙයි

මෙය මෙසස්නෙහි ධර්මකථික උපාසිකාවන් අතුරෙන් අගතනතුරු ලත් **ඛුජ්ජුත්තරා** නම් වූ ආර්‍ය්‍යශ්‍රාවිකාවන් විසින් තමාගේ ධර්මදේශනා සමයේදී කැබූ නිදානපාඨයයි භාග්‍යවතුන්වහන්සේගේ අදහස් දත් ධර්මසංගායක ආචාර්‍ය්‍යයන් වහන්සේ විසින් මේ දේශනා ඉතිවුත්තකයන්ට කරුණු වන බව හැඟවීම පිණිස මේ ක්‍රමයෙන් නිදානය තබනලද්ද යි ද ආචාර්‍ය්‍ය මතයෙකි.

එසේ ද වුවත් එයින් මෙය බුද්ධභාෂිතයවනු මිස වේදල්ලාඞ්ගය මෙන් ශ්‍රාවකභාෂිතයක් නොවේ භාග්‍යවතුන් වහන්සේ විසින් ම වදාරන ලද්දක් ශ්‍රාවකයන් හෝ ශ්‍රාවිකාවන් ප්‍රකාශ කළ මුත් තම තමන් විසින් සිතා අත්තනොමතිකව දෙසනලද්දක් නොවනබව ප්‍රථම ධර්ම සංගීතියෙහි මහරහතන්වහන්සේගේ පිළිගැනීමෙන් ම පෙනේ

මේ පර්‍ය්‍යාප්තිධර්මය බුද්ධභාෂිතය, ශ්‍රාවකභාෂිතය, ඍෂිභාෂිතය, දෙවභාෂිතය යි භාෂිත සතරකට කොටස්කර තිබේ සියලු විනයපිටකය හා අභිධර්ම පිටකයත් ධම්මපද, චරියාපිටක, උදාන, ඉතිවුත්තක, ජාතක, සුත්තනිපාත, විමාන වත්‍ථු, පෙතවත්‍ථු, බ්‍රහ්මජාලාදි සූත්‍රයෝත් "බුද්ධභාෂිතයහ"

භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවුපිරිසට අයත් ශ්‍රාවකයන් විසින් ප්‍රකාශිතවූ අනඞ්ගන, සම්මාදිට්ඨි, අනුමාන, චූලවෙදල්ල, මහාවෙදල්ල, ථෙරථෙරීගාථා ආදි ධර්මයෝ "ශ්‍රාවකභාෂිත"යෝ ය.

බාහිර පරිබ්‍රාජකාදි තාපසයන් විසින් කියනලද සූත්‍රනිපාතයෙහි එන සියලු පරිබ්‍රාජක වර්ගයත් පාවාරිය බමුණුහුගේ අතවැසි සොළසක් බමුණු තවුසන්ගේ ප්‍රශ්න ඇතුළත් ධර්මයෝත් "ඍෂිභාෂිත" යහ

දිව්‍ය බ්‍රහ්ම ආදීන් විසින් ප්‍රකාශිත දෙවතාසංයුත්ත, දෙවපුත්තසංයුත්ත, මාරසංයුත්ත, බ්‍රහ්මසංයුත්ත, සක්ක සංයුත්ත ආදි ධර්මයෝ "දෙවභාෂිත"යෝ ය. මෙසේ ශ්‍රාවක, ඍෂි, දෙවතාදීන් විසින් තමහට ඉඩ ලැබෙන ඒ ඒ අවස්ථාවන්හිදී භාග්‍යවතුන්වහන්සේ වෙත එළඹ කළ ප්‍රකාශයෝ උන්වහන්සේගේ ද අනුමැතිය ලැබ ස්වාක්ඛාත ධර්මය වූ හෙයින් **බුද්ධභාෂිත** ම වූහ

ලියන්නන් ලියූ ඔප්පු තිරප්පුවල ඔවුන් අත්සන් කරනු ලැබුවත් රාජමුද්‍රාව නොතැබුවේ නම් වලංගු නොවන්නා සේ ශ්‍රාවකාදීන් විසින් ප්‍රකාශිත ධර්ම භාග්‍යවතුන්වහන්සේ ද පිළිගෙන වදාළ හෙයින් බුද්ධභාෂිතම වූ බව සැලකිය යුතුය. "ලියන්නන් ලියාලූ පත්කඩෙහි රජ්ජුරුවන් ලූ ඔප්පුව නිසා ඒ කෙමේ සන්හස් වී ද, එපරිද්දෙන මේ වස්තුවත් බුද්ධ භාෂිත නම් වී"යයි **සද්ධර්මරත්නාවලියෙහි** මට්ටකුණ්ඩලී වස්තුව සඳහා කියනලද්දේ එහෙයිනි.

විනයපිටකයෙහි උභතොවිභඞ්ග (පාරාජිකා පාචිත්තිය) චූළනිද්දෙස, මහානිද්දෙස, ඛන්ධක (මහාවග්ග චූළවග්ග) පරිවාරය ද, සුත්තනිපාතයෙහි මංගලසුත්ත, රතනසුත්ත, නාලකසුත්ත, තුවටකසුත්තාදි සූත්‍ර වශයෙන් නම් කළ තථාගත බුද්ධවචන ද 'සූත්‍ර" යයි දතයුතු. සාමාන්‍යයෙන් ගාථා සහිත සූත්‍ර හා විශේෂයෙන් සංයුත්තනිකායෙහි සියලු සගාථක වර්ගයට ඇතුළත් ධර්ම ද "ගෙය්‍ය" නම් වේ. ගාථා

මිශ්‍ර නොවූ සූත්‍ර හා අනික් අඞ්ග අටට ම ඇතුළත් නොවූ බුද්ධවචන ද මුළුමනින් අභිධම්මපිටකය ද "වෙය්‍යා-කරණාඞ්ගයට" ඇතුළත් වේ.

ධම්මපද, ථෙරගාථා, ථෙරීගාථා, හා සුත්තනිපාතයෙහි සුත්ත නම් නොවූ සුද්ධික ගාථා ද "ගාථාඞ්ගයට" ඇතුළත් වේ. සතුට විදහා දක්වන සොම්නස් සහගත නුවණින් ප්‍රකාශවූ ගාථාවන් ඇතුළත් දෙඅසූවක් සූත්‍ර "උදාන" නම් වේ. "වුත්තං හෙතං භගවතා" යන ආදි වශයෙන් ප්‍රකාශිත එකසිය දොළසක් සූත්‍ර "ඉතිවුත්තකාඞ්ගයට" ඇතුළත් වේ.

අපණ්ණක ජාතකාදි පන්සිය පනස් ජාතක දේශනා "ජාතකාඞ්ගයට" ඇතුළත්වන්ම "චත්තාරො මෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ" යන ආදීන් වදාළ ආශ්චර්‍ය්‍ය අද්භූතධර්ම ප්‍රතිසංයුක්ත සූත්‍රාන්තයෝ "අද්භූත ධර්මාඞ්ගයට" ඇතුළත් වෙති.

චූලවෙදල්ල, මහාවෙදල්ල, සම්මාදිට්ඨි, සක්කපඤ්හ, සංඛාරභාජනීය, මහාපුණ්ණමාදි සූත්‍ර නුවණත් සතුටත් ලැබ ලැබ පුළුවුත්තා ලද ප්‍රශ්නොත්තර මාලාවන්ගෙන් යුත් හෙයින් "වෙදල්ලාඞ්ගයට" ඇතුළත් වේ යනු **සමන්ත පාසාදිකා** නම්වූ විනයට්ඨකථාවේ හා **මහා නිද්දෙසට්ඨ කථාවේ** ද සඳහන්වූ අයුරු යි.

ඉතිවුත්තක සූත්‍ර සංඛ්‍යාව ගැන පඬුවන් අතර යම් යම් මතභේද ඇතත් එහි එන උද්දාන ගථාවන්ට අනුව සූත්‍ර විභජනය කිරීමේදී එක් එක් වර්ගයක අන්තයෙහි සඳහන් වූ උද්දාන ගාථාවන්ගෙන්ම එය දැනගත හැකිවෙයි. එසේ ද වුවත් **සාරත්ථදීපනී** විනයටීකාවෙහි එකක නිපාතයට අයත් වර්ගත්‍රයේම එන සූත්‍ර සියල්ලම එකතු කොට එකම උද්දාන ගාථා පන්තියකට ඇතුළත් කළ බව ද පෙනෙන්නට තිබේ

හෙ මෙසේ යි.

"ලොභො දොසො ච මොහො ච කොධො මක්ඛෙන පඤ්චමං
මානො සබ්බං පුන මානො ලොභො දොසෙන තෙ දස
මොහො කොධො පුන මක්ඛො නීවරණා තණ්හාය පඤ්චමං
ද්වෙ සෙක්ඛභෙදා සාමග්ගී පදුට්ඨ නිරයෙන තෙ දස
පසන්නා එක මාහායි පුග්ගලෙන අතීතෙන පඤ්චමං
එවං වෙ ඔපධිකං පුඤ්ඤං සත්තවීස පකාසිතා" යි

මෙසේ බලන කල එකක නිපාතයෙහි පළමුවන වර්ගයෙහි සූත්‍ර දසයෙක දෙවන වර්ගයෙහි දසයෙක. තුන්වන වර්ගයෙහි සතෙකැයි මෙසේ සත්විස්සෙක් ගැනෙයි. එසේම දුකනිපාතයෙහි වර්ග දෙකෙකි. එහි පළමුවන වර්ගයෙහි සූත්‍ර දසයෙකි. දෙවන වර්ගයෙහි සූත්‍ර දොළොසෙකැයි මෙසේ දෙවිස්සෙකි.

තික නිපාතයෙහි වර්ග පසෙකි. එහි පළමුවන වර්ගයෙහි සූත්‍ර දසයෙකි. දෙවන වර්ගයෙහි දසයෙකි තෙවන වර්ගයෙහි දසයෙකි සතරවැනි වර්ගයෙහි දසයෙකි පස්වන වර්ගයෙහි ද දසයෙකැයි සූත්‍ර පනසෙකි. චතුක්ක නිපාතයෙහි වර්ග නියමයෙක් නැත එහි ඇත්තේ සූත්‍ර තෙළෙසෙකි. මෙසේ මේ ව්‍යවස්ථා පරිදි ඉතිවුත්තකයෙහි සූත්‍ර එකසිය දොළසෙකි.

එහි එක් එක් ප්‍රධාන කරුණක් ඇතුළත්වූ ධර්ම එකක නිපාතයෙහි ද, කරුණු දෙකක් ඇතුළත්වූ ධර්ම දුකනිපාතයෙහි ද, කරුණු තුනක් ඇතුළත්වූ ධර්ම තික නිපාතයෙහි ද කරුණු සතරක් ඇතුළත් ධර්ම චතුක්ක නිපාතයෙහි ද සඳහන්වූ අයුරුයි.

එහෙයින් එය කොළඹ දෙමටගොඩ මහාවිසුද්ධාරාමාධි-පතිව වැඩවිසූ භදන්ත ආභිධම්මිකාචරිය **අරංගල සිරිධම්ම** මහාස්ථවිරපාදයන්වහන්සේගේ ශොධනයෙන් **ජේ. සී. ප්‍රනාන්දු සමාගම** මගින් මුද්‍රාපිතවූ ඉතිවුත්තකපාළියෙහි හා ත්‍රිපිටක සංස්කාර මණ්ඩලයෙහි සංශොධනයෙන් **ලංකා ආණ්ඩුව** මගින් ප්‍රකාශිත ඉතිවුත්තක පාළියෙහි ද මෙසේ සඳහන් වේ.

"ද්විදසුත්තර සුත්තසතෙ සඞ්ගායිත්වා සමාදහිංසු පුරා
අරහන්තො චිරට්ඨිතියා තමාහු නාමෙන ඉති වුත්තං"

යනුවෙනි.

පළමු ධම්සංගායනාවේදී අනුබුද්ධ **මහාකාශ්‍යප** මහරහතන්වහන්සේ ප්‍රධාන පන්සියයක් මහරහතන් වහන්සේලා පයර්‍යාප්ති ශාසනයෙහි චිරස්ථිතිය සඳහා **ඉතිවුත්තක** නමින් සූත්‍ර **එකසිය** දෙළසක් සංගායනා කොට තැබූහ යනු මෙහි අදහසයි.

මේ ඉතිවුත්තකයෙහි මගීවල උද්දෘත ගාථාවන්ට අනුව සූත්‍ර නාමයන් ද සඳහන් කොට බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ 24 වෙනි ග්‍රන්ථයෙහි සඳහන් කළ අයුරු ප්‍රශස්ත ය. එහෙයින් එය එසේම ගෙන බලන්නවුන්ගේ පහසුව සඳහා මෙහි ද ඇතුළත් කෙළෙමු එසේම එය පරලෝසැපත් **ඒ ඇම් ගුණසේකර** වාසල මුදලිඳුන් විසින් පිළියෙළ කළ **ශ්‍රී සද්ධර්මකෝෂයෙහි** ඉතිවුත්තකය ගැන ලියූ දහම් ලිපියෙහි ද සඳහන්ව ඇත.

මෙහි ඇතුළත් ප්‍රස්තාවනායෙහි සඳහන් පරිදි ඉතිවුත්තක සූත්‍ර සංඛ්‍යා නියමය පිළිබඳ මතභෙද ඇතත් ඒ සඳහා කිවයුතුව තිබෙන්නේ තන් තන් අර්ථකථාචාර්‍ය්‍ය මතවලට අනුව සූත්‍ර සංඛ්‍යාව ටිකක් අඩු වැඩි වුව ද "දෙ අසූ කඳුවත්" යයි කිවයුතු තන්හි "අසූ කඳුවත්" යයි සඳහන් වුවාක් මෙන් "ද්වාදසුත්තරසත සුත්තන්තා" යයි කිවයුතු තැන "දසුත්තරසත සුත්තන්තා" යි සඳහන් වූවාක් මෙනි.

එහෙයින් **සාරත්ථදීපනියෙහි:**

"කාමං චෙත්ථ අප්පකං ඌනමධිකං වා ගණනූපගං න හොතීති කත්වා අසීති ඛන්ධක වත්තානීති වත්තබ්බෙ අසීතිඛන්ධකවත්තානීති වුත්තවචනං විය ද්වාදසුත්තරසත-සුත්තානීති වත්තබ්බෙ දසුත්තරසතසුත්තන්තාති වුත්තමපි සක්කා වත්තුං" (86 පිට) යනු සඳහන් වී ඇත.

අනුබුද්ධ **බුද්ධඝොෂ** මාහිමියන්ගේ අට්ඨකථා රචනා විලාශයට වඩා බදරතිට්ඨ **ධම්මපාල** මාහිමියන්ගේ අට්ඨකථා රචනාවිලාශය බෙහෙවින් ගැඹුරු ය. උන්වහන්සේ ශාස්ත්‍රාන්තර සමයාන්තරවලිනුදු සාධක ගෙන හැර පාමින් ස්වමතය සනාථ කරනු සඳහා ප්‍රයත්න දරූසේක්ම ය. එය මෙහි දුකනිපාත දෙවෙනි වර්ගයෙහි සවන සූත්‍රාර්ථකථාව හා සසඳ බැලීමෙන් හොඳින් ස්ඵුට වෙයි. උදාන, ඉතිවුත්තක නෙත්තිප්පකරණයන්හි අට්ඨකථා එකකර්තෘක හෙයින් එහි බොහෝ තැන්වල සාම්‍යය ද පෙනෙන්නට තිබේ. ඉතිවුත්තකයෙහි දක්නට ලැබෙන ඇතැම් සූත්‍ර උදානයෙහි ද නෙත්තිප්පකරණයෙහි ද සඳහන්ව ඇති හෙයින් අට්ඨකථාවන්ගේ සාම්‍යය ද පුදුමයෙක් නොවේ.

ඉතිවුත්තකයෙහි (2 2 6) **අජාත සූත්‍රය** උදාන පාළියෙහි අටවෙනි පාටලිගාමිය වර්ගයෙහි තෙවන සූත්‍රය වශයෙන් "අත්ථි භික්ඛවෙ අජාතං, අභූතං, අකතං, අසංඛතං" යන ආදීන් පටන් ගෙන තිබෙන බව පෙනෙයි හේතු ප්‍රත්‍යයෙන් හටනොගන්නාවූ නිවන පරමාර්ථ වශයෙන් ඇති ධර්මයක් වන්නේ කෙසේද යි භික්ෂූන් අතර නිවන ගැන ඇතිවූ විමතිය දුරුකරනු සඳහා මේ සූත්‍රය වදාළහ

"ඉධ සමණබ්‍රාහමණානං නිබ්බානං නිබ්බානන්ති වාචාමත්තමෙව, තත්ථ පරමත්ථතො නිබ්බානං නාම අනුපලබ්භමාන සභාවත්තාති ලොකායතිකාදයො විය, විප්පටිපන්නානං බහිද්ධා ච පුථුදිට්ඨිගතිකානං මිච්ඡාවාදභඤ්ජනත්ථං ච ඉමං අමතමහානිබ්බානස්ස පරමත්ථතො අත්ථිභාවදීපනත්ථං තස්ස ච නිස්සරණභාවාදි ආනුභාව-වනත්තං පීතිවෙගෙන උදානවසෙන ඉමං සුත්තමභාසි" යනු ඉතිවුත්තකට්ඨකථායෙහි මෙන්ම උදානට්ඨකථාවේ ද එයට සමාන අදහස් ඇති නෙත්තිප්පකරණට්ඨකථාවේ ද සඳහන් වේ.

ඉතිවුත්තක **විසුද්ධාරාම** සංස්කරණයෙහි තිකනිපාත යෙහි ඇතැම් සූත්‍රවල හා චතුක්කනිපාතයෙහිත් "වුත්තං

හෙතං භගවතා'' යන ආදි නිදානය පිළිබඳ ප්‍රධානාංශය සඳහන්ව නැතත් එය අඩුවක් වශයෙන් පෙනුණු හෙයින් අපගේ සංස්කරණයෙහි එය ද එසේ ඇතුළත් කෙළෙමු.

ත්‍රිපිටක පරිවර්තන සංස්කාරක මණ්ඩලයෙහි ද එය කල්පනාවට භාජනවූ බව පෙනුණු හෙයින් ඒ අඩුපාඩු පුරවා එහි 24 වෙනි ත්‍රිපිටක පරිවර්තන ග්‍රන්ථයෙහි යොදා ඇතිබව දක්නට ලැබිණ.

ඉතිවුත්තකය විශ්ව විද්‍යාලයන්හි ද පිරිවෙන්හි ද උපයොග කරගනු ලබන ධර්මග්‍රන්ථයකි. මෙය පාලිභාෂා ඥානය මෙන් ම ධර්මඥානය සඳහා බෙහෙවින් උපකාර වන්නකි. මෙහි ගැඹුරු වූ ද සරල වූ ද ධර්මදෙශනා ඇතුළත් වෙයි. නවීනයකුට වුව ද සුවසේ වහා තේරුම් ගතහැකි දහම් කොටස් මෙන් ම ප්‍රවීණයකුට වුව ද සාවධානව කියවා සසඳබලා තේරුම්ගතයුතු ගැඹුරු දහම් කොටස් ද මෙහි අන්තර්ගත වෙයි. ධර්මදේශකයන්ට ද ධර්මඥානය ලබාගනු කැමති හැම දෙනාට ද ඉතිවුත්තකය ඉතා වැදගත් බණපොතකි. එබැවින් ඉතිවුත්තකපාළියෙහි අර්ථවිවරණය කොට අප විසින් ධර්මව්‍යාඛ්‍යාන ද සපයනලදි. සාමාන්‍ය යෙන් සලකන කල පෙළ වඩා නොගැඹුරු හෙයින් තැන් තැන්වල පෙනෙන ගැට පදවලට පමණක් ග්‍රන්ථිපද විවරණයක් වශයෙන් අර්ථ දී ඇත. වුවමනා තැන භාවය ද පැහැදිලි කර දක්වා ඇත.

මෙහි විශේෂ ලක්ෂණයක් නම්: වැදගත් බණපද විස්තර කිරීමයි. අර්ථකථාව හා එයින් බැහැර වූ ද ධර්ම, ග්‍රන්ථානුසාරයෙන් විස්තරකර ඇත. එසේ නොකොට සැකෙවින් ලියන්නට හැකිවුවත් බණ කියනු කැමති භික්ෂූන්ට හා ධර්මඥානය දියුණුකරගනු කැමති උපාසක උපාසිකාවන්ටත් ධර්මපුස්තකයක් වශයෙනුදු භාවිතාකිරීමට ප්‍රයෝජනවනු සඳහා මෙය මෙ සේ සපයන්නට කල්පනා කෙළෙමි. මෙහි **අනුක්‍රමණිකාවෙන්** එහි තත්වය සලකාගත හැකිවෙයි.

පෙර අපර දෙදිග විචාරකයන්ගේ මත මෙන්ම විවිධ භාෂාවන්ගෙන් රචිත ඉතිවුත්තකයන් ද විමසා සසඳා බලා සාරගර්භ ප්‍රස්තාවනාවක් සැපයූ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය **එච්. ඇස්. කාරේ** මහතාට අපගේ කෘතඥතාව පළකළයුතු ය ඉතිවුත්තකපාළිය පිළිබඳව පර්යේෂණාත්මකව කෙරෙන මෙම විවරණය විචාරකයන්ට මෙන්ම ආධුනිකයන්ට ද විපුල ප්‍රයෝජන සලස්වනු නිසැකයි

එසේම මෙහි ඉතිවුත්තක පෙළ පිටපත් කර දීමෙහි සියඹලාපේ සුධර්මාරාමාධිපති උගත් **විලිඹුල පඤ්ඤානන්ද** ස්ථවිරයන්ගෙන් හා අර්ථ භාව ධර්ම විස්තර පිටපත්කර දීමෙහි සාහිත්‍යාචාර්ය පණ්ඩිත **තලගුණේ ධම්මරතන** භික්ෂුනම ගෙන් ද ලැබුණු උපකාරය ගැන විශේෂයෙන් සඳහන් කළයුතු වෙයි.

මෙය තෙමසකින් පරිමිතවූ ස්වල්පකාලයක් තුළ මුද්‍රණය කරවා නිමවියහැකි ග්‍රන්ථයක්වූ හෙයින් ශුද්ධිපත්‍රයක් ඇතුළත් නො කරන්නට ගත් ප්‍රයත්නය අසඵල විය මේ ධර්මග්‍රන්ථය ධර්මාභිලාෂයෙන් හොඳහිතින් බලන්නවුන්ට සාමාන්‍යයෙන් ශුද්ධිපත්‍රයක් වුවමනා නො කෙරෙතත් මෙහි තැන්තැන්වල විශේෂයෙන් දක්නට ලැබෙන අවශ්‍ය සංශොධන කීපයක් පමණක් සඳහන් කරන්නට සිදුවූබව කරුණාධ්‍යාශයෙන් මතක්කරම්හ.

මෙය ඉතා සුළු කාලයක් ඇතුළත මහත්වූ ද සැලකිල්ලෙන් හොඳින් මුද්‍රණය කරවූ මරදානේ **අනුල මුද්‍රණාලයේ** අධ්‍යක්ෂක මහතාට හා එහි කෘතහස්ත කාර්යමණ්ඩලයට ද අපගේ කෘතඥතාව හිමිවෙයි.

**කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර.**

2503/1961 විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේදී ය.

# ප්‍රස්තාවනා

**ඉතිවුත්තකය** නමින් හඳුන්වනු ලබන **ඛුද්දකනිකාය** පරියාපන්නවූ පෙළ පොත යම් යම් විශ්වවිද්‍යාලයීය විභාග වලට නියමිතව ඇති හෙයින් හුදෙක් විභාගාපේක්ෂකයන්ගේ අර්ථසිද්ධියම සලකා ගෙන අලුත් සංස්කරණයක් වශයෙන් මුද්‍රණද්වාරයෙන් ප්‍රකාශයට පත්කිරීමෙහි නිරතවූ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ උප කුලපති ධුරන්ධර **කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාරාභිධාන** නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඒ සඳහා ශාස්ත්‍රීය නිබන්ධයක් සපයනු පිණිස මා වෙත කළ නියමය පරිදි උන්වහන්සේගෙන් මා ලද අනුග්‍රහයෙහිත් ධෛර්‍ය්‍යයෙහිත් ප්‍රතිඵලයක් වශයෙන් ම මෙම **ප්‍රස්තාවනාව** පිළියෙළ කළ හැකිවීම ගැන මගේ කෘතඥතාව උන් වහන්සේ වෙත පැවරෙන බව ගෞරවාදර පූර්වකව පළමු කොට මෙහි සඳහන් කළ යුතුය.

### ඉතිවුත්තකාඞ්ගය පිළිබඳ සාමාන්‍ය අටුවා මතය

ඉතිවුත්තක නම් වූ පෙළ පොත ගැන යමක් ප්‍රකාශ කිරීමට ප්‍රථම එනමින්ම හැඳින්වෙන ශාසනිකාඞ්ගය කවරේ දැ යි සලකා බැලිය යුතුය. සත්‍රුසාසනය **සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුත ධම්ම, වේදල්ල** යනුවෙන් නවාඞ්ග සමන්වාගතය යි සලකනු ලැබේ. පය්‍ර්‍යාප්ති ධර්මය පුහුණු කිරීමෙහි හෙවත් ඉගෙනීමෙහි ලා ගැනෙන අඞ්ගයන් වශයෙන් මේ නවාඞ්ගයෝ පෙළෙහි ද සඳහන් වෙති. මෙයින් ඉතිවුත්තක නම් වූ ශාසනිකාඞ්ගය ඉතිවුත්තක පාළියම ද නැතහොත් ඊට වැඩි යමක්දැ යි විශේෂයෙන් විමසිය යුතු වන්නේ අටුවාචාරීන් වහන්සේලා විසින් එකී අඞ්ගය ඉතිවුත්තක පාළියට පමණක් සීමා කිරීමට උත්සාහ ගෙන ඇති හෙයිනි. "භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරන ලදී යනාදී වශයෙන් පටන් ගැනෙන සූත්‍රාන්ත එකසිය දොළොස ඉතිවුත්තක යයි දත යුතු" යනුවෙන් ඇතැම් අටුවාවල සඳහන් වන්නේය.[1]

එහෙත් සිංහල අකුරින් ඉතිවුත්තක පාළිය ලියවී ඇති සමහර පුස්කොළ පොත්වල ද, බුරුම අකුරින් ලිඛිත එක් පුස්කොළ පොතක ද අග දැක්වෙන පාඨයකට අනුව සූත්‍රාන්ත එකසිය දසයක් මෙහි ලා සංගෘහිත වන බැව් පාලි ග්‍රන්ථ සමාගම මගින් රෝම අක්ෂරයෙන් මුද්‍රිත ඉතිවුත්තක පාළියෙහි අවසාන පිටුවේ අන්තර්ගත අධෝලිපියක ප්‍රකාශිත ය.[2] සිංහල පොත් අතරින් මිලිඳ ප්‍රශ්නයෙහි, ඉතිවුත්තකයන්ගේ ගණන දක්වා ඇත්තේ "සූත්‍ර දශාතිරේක ශත ප්‍රමාණ වූ ඉතිවුත්තක නම් ධර්ම කෙනෙක්" යනුවෙනි.[3] එහෙත් පාළි මිලින්දපඤ්හයේ එබඳු කිසිවක් සඳහන් වී නොමැත. මෙසේ එකසිය දසයකැ යි යන ගණන සූත්‍රාන්ත එකසිය දොළොසෙක් හැඳින්වීම පිණිස උපචාර වශයෙන් ව්‍යවහාර වූයේ ද නැතහොත් ඉතිවුත්තකයන්ගේ සඞ්ඛ්‍යා නියමය නිශ්චයාර්ථයෙන්ම ප්‍රකාශ කරනු සඳහා ව්‍යවහාර වූයේදැ යි නිරණාත්මකව නොකිව හැක්කේ සමන්තපාසාදිකාවේ හා සුමඞ්ගලවිලාසිනියේත් සූත්‍රාන්ත එකසිය දොළොසකැ යි (ද්වාදසුත්තරසත සුත්තන්තා) කියවෙතත් පපඤ්චසූදනී නම් වූ මජ්ඣිමනිකායට්ඨකථාවෙහි එන අලගද්දූපම සුත්තවණ්ණනාවෙහි, සූත්‍රාන්ත එකසිය දසයකැයි (දසුත්තරසතසුත්තන්තා) කෙළින්ම සඳහන් කොට ඇති හෙයිනි. ගණන පිළිබඳ මතභේදය කුමක් වුවත්, දැනට ඉතිවුත්තක පාළියෙහි සූත්‍රාන්ත එකසිය දොළොසක් සංගෘහිත බැවින්, බොහෝ දුරට පෙළ පොත අනුවම යෙමින් අටුවාචාරීන් වහන්සේ විසින් ඉතිවුත්තකාඞ්ගය විස්තර කරන්නට ඇතැයි විශ්වාස කළ හැකිය.

## ඉතිවුත්තකාඞ්ගයේ මුඛ්‍යාර්ථය

රස වශයෙන් එකවිධය යි ද, ධම්ම විනය වශයෙන් ද්විප්‍රකාරය යි ද, පිටක වශයෙන් ත්‍රිවිධය යි ද, නිකාය වශයෙන් පඤ්චවිධය යි ද, අඞ්ග වශයෙන් නව වැදෑරුම්ය යි ද ධර්මස්කන්ධ වශයෙන් සූවාසූ දහසෙකැ යි ද යනුවෙන් නොයෙක් ආකාරයෙන් බෙදා දක්වා ඇත්තේ බුදුරජාණන් වහන්සේ විසින් දෙසන ලද පර්යාප්ති ධර්මය ම ය.

සත්‍වුසාසනය නමින් හඳුන්වනුයේත් මෙය ම ය. "බහූ ඛො භික්ඛවෙ මයා ධම්මා දෙසිතා: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං"[5] යන දේශනා පාඨයෙනුත්, "ඉධ පන භික්ඛවෙ එකච්චෙ කුලපුත්තා ධම්මං පරියාපුණන්ති සුත්තං ගෙය්‍යං වෙය්‍යා-කරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං"[6] යන දේශනා පාඨයෙනුත් නවඞ්ගසත්‍වුසාසනයට අයත් ඒ ඒ ශාසනික අඞ්ගයන්ගෙන් ප්‍රකාශිත වූයේත් එමගින් උගත හැකි වූයේත් ධර්මය ම බව, මැනවින් පැහැදිලි වන්නේ ය

එසේ ම, මෙකී අඞ්ගානුසාරයෙන් කුළු ගැන්වෙන ධර්මය නො ඉගෙනීම, සද්ධර්මයේ අන්තර්ධානයට හේතුවන පළමු වැනි කරුණය යි පෙළෙහි කියවේ [7] විපස්සී ආදි අතීත බුදුවරුන්ගේ ශාසනයන් චිරස්ථායී නො වීමට හේතු වූ එක් කරුණක් නම්, එකී බුදුවරුන් වහන්සේලා විසින් නවාඞ්ග නයින් දෙශනාකරනලද ධර්මය අල්පමාත්‍රවීමය යි විනයපිටකයට අයත් පාරාජිකා පාළියෙහි සඳහන් වී ඇත [8] මෙකී සාක්ෂි අනුව ඉතිවුත්තක යයි හැඳින්විය හැකි දේශනා පාඨයන්ගෙන් වුවද මූර්තිමත් වනුයේ එකම සද්ධර්මය බව අවිවාදයෙන් පිළිගත හැකිය.

**මජ්ඣිම නිකායෙන් දැක්විය හැකි නිදසුන්:**

ඉතිවුත්තක නම් ශාසනික අඞ්ගානුසාරයෙන් ධර්මය මූර්තිමත් වන අයුරු විස්තර කරන අටුවාචාරීහු එබඳු පාඨවලින් උපලක්ෂිත දේශනා කොටස් ඉතිවුත්තක පාළියට පමණක් සීමා කළහ. එසේ සීමාකිරීමට උන් වහන්සේලා පෙලඹෙන්නට ඇත්තේ ත්‍රිපිටකයෙහි ඇතුළත් පෙළ පොතක හුදෙක් නාම මාත්‍රයම සලකා ගෙන ඒ නයින් එකී නමට සම්බන්ධ කළ හැකි ශාසනිකාඞ්ගය විග්‍ර කිරීමට කල්පනා කළ හෙයිනැ යි හැගේ උන්වහන්සේලා මේ ක්‍රමයට, උදාන හා ජාතක නම් වන ශාසනිකාඞ්ග දෙක ද උදාන පාළියත් ජාතක පාළියත් යන පොත් දෙක පිළිවෙළින් බලා ගෙන විස්තර කළහ.

ඒ කුමක් වුවත්, ඉතිවුත්තක පාළියෙන් බාහ්‍ය වූ — එහෙත් ඉතිවුත්තක ගතයෙහි ලා සැලකිය හැකි — දේශනා පාඨයන් ද තිබෙන බැව් පෙනේ නිදසුනක් වශයෙන්, "අනෙක පරියායෙන හාවුසො සාති, පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං භගවතා: අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවොති," යනුවෙන් **මජ්ඣිමනිකාය** මහාතණ්හාසඞ්ඛය සූත්‍රයෙහි සඳහන් පාඨය දක්විය හැකිය[9] භාග්‍යවතුන් වහන්සේ විසින් විඤ්ඤාණය පටිච්චසමුප්පන්නය. හෙවත් ප්‍රත්‍යය ධර්මයක් හේතුකොට උපදනේය යි නොයෙක් ආකාරයෙන් දේශනා කොට ඇති බැව් කීමෙන්, 'විඤ්ඤාණය' පිළිබඳ වැරදි දෘෂ්ටියක එල්බ ගත් සාති නම් වූ භික්ෂුවකට කරුණු පැහැදිලි කිරීමට අවශේෂ භික්ෂූන් උත්සාහ දරූ සැටි එම සූත්‍රයේ සඳහන් වේ.

අවශෙෂ භික්ෂූන්ගේ බලාපොරොත්තු ව වූයේ 'මේ පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට ඇත්තේ මෙසේය' යනුවෙන් බුදුරජාණන් වහන්සේගේ ම ධර්ම පාඨයක් ගෙනහැර පෑමෙන් සාති භික්ෂුවට කරුණු ඒත්තු ගැන්වීම ය මෙයට සමාන අන්‍ය අවස්ථාවක, අරිට්ඨ නම් වූ භික්ෂුවක් උදෙසා බුද්ධශ්‍රාවකයන් විසින් දක්වන ලද ඉතිවුත්තක දේශනා කීපයක් අලගද්දූපම සූත්‍රයෙහි සඳහන් වේ. "අනෙකපරියායෙන හාවුසො අරිට්ඨ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා අලං ච පන තෙ පටිසෙවතො අන්තරායාය අප්පස්සාදා කාමා වුත්තා භගවතා බහු දුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භියෙ‍යා .... "[10] "මිත්‍ර අරිට්ඨය, අන්තරායික ධර්මයෝ අන්තරායිකමය යි නොයෙක් ආකාරයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කොට ඇත එකී ධර්මයන් සේවනය කරන්නකුට අන්තරායකර වීමට තරම් ප්‍රමාණවත්ය කාමයන් අල්පාස්වාදජනකය යි ද, බොහෝ දුක් කරදර ඇතිකරන්නේය යි ද එහි බොහෝ අනිෂ්ට විපාක ඇතැයි ද භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කොට ඇත "

මෙකී පාඨය සඳහන් වන තැනම, කාමයන්ගේ ආදීනව දක්වීම පිණිස අරිට්ඨ භික්ෂුව උදෙසා අවශෙෂ බුද්ධ ශ්‍රාවකයන් විසින් ඉතිවුත්තක නයින් ගෙන හැර පානලද දේශනා පාඨ අතර, භාග්‍යවතුන් වහන්සේ කාමයන් ඇටසැකිල්ලකට උපමා කොට ඇතැයි ද ("අට්ඨිකංඛලූපමා කාමා වුත්තා භගවතා"), මස්වැදැල්ලකට උපමා කොට ඇතැයි ද ("මංසපෙසූපමා කාමා වුත්තා භගවතා"), තණසුළකට උපමා කොට ඇතැයි ද ("තිණුක්කූපමා කාමා වුත්තා භගවතා"), ගිනි අඟුරු වළකට උපමා කොට ඇතැයි ද ("අඞ්ගාරකාසූපමා කාමා වුත්තා භගවතා"), සිහිනයකට උපමා කොට ඇතැයි ද ("සුපිනකූපමා කාමා වුත්තා භගවතා"), සර්පයකුගේ හිසට උපමා කොට ඇතැයි ද "සප්පසිරූපමා කාමා වුත්තා භගවතා"), යනාදි වශයෙන් තථාගතයන් වහන්සේගේ දේශනා පාඨ කීපයක්ම ඉදිරිපත් කොට ඇත. මේ දේශනා පාඨ හැමෙකක් ම, ඒවා ඉදිරිපත් කොට ඇති පිළිවෙළ අනුව ඉතිවුත්තක වශයෙන් සැලකිය හැකිය.

## ඉතිවුත්තකාඞ්ගයේ සමන්වය.

යම් කිසි කරුණක් පිළිබඳව වැරදි දෘෂ්ටියක එල්බ ගත් භික්ෂුවකට ඒ ගැන දක්විය හැකි බුද්ධ මතය නම් මෙසේය යි හඳුන්වනු සඳහා කරුණු හරි හැටි වටහා ගත්තවුන් විසින් බුදුරජාණන් වහන්සේගේම දේශනා පාඨයන් ගෙන හැර පෑම හේතු කොට ගෙන ඉතිවුත්තක නම් ශාසනිකාඞ්ගයක් මුලින් ඇති වූ සැටි, යට දක්වූ අවස්ථා දෙකට අයත් නිදසුන් වලින් පැහැදිලි විය යුතුය. 'මෙසේ කියන ලද්ද' යනු, ඉතිවුත්තක යන්නෙහි වචනාර්ථය ද වේ. කරුණු වරදවා ගත් භික්ෂූන්ට ඇතැම් විට බුදුරජාණන් වහන්සේම, තමන් වහන්සේ දේශනා කොට ඇත්තේ මෙසේ යයි අවවාද මුඛයෙන් කරුණු පැහැදිලි කළ අවස්ථා ද පෙළෙහි සඳහන් වන්නේ ය. යට දක්වූ නිදසුන් වලට සම්බන්ධ කථා වස්තූන්ගෙන් ද ඒ බව හෙළි වනු ඇත. එවැනි හැම

අවස්ථාවකදී ම බුදුහු, 'භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදි' (......**වුත්තං භගවතා**) යන පාඨය වෙනුවට, 'මවිසින් වදාරන ලදි' ( ...**වුත්තං මයා**) යනුවෙන්, තමන්වහන්සේ-ගේ ම දේශනා පාඨයක් මතු කොට දක්වූහ මෙසේ, මවිසින් වදාරන ලදැ යි බුදුරජාණන් වහන්සේ විසින් වුව ද තමන් වහන්සේගේ දෙශනාපාඨයක් මතුකොට දක්වන පමණින් එය ද ඉතිවුත්තකයක් වන සැටි මෙයින් වටහා ගත හැකි වේ.

## ඉතිවුත්තකයක් හඳුනා ගන්නා අයුරු

ඉතිවුත්තක වශයෙන් ගැනෙන දේශනා පාඨයන් බුද්ධශ්‍රාවකයන් විසින් යම් යම් අයගේ සැලකිල්ලට භාජන කොට ඇත්තේ කරුණු පැහැදිලි කිරීමට පමණක් නොව, කරුණු පැහැදිලි කරවා ගැනීමට ද බැව් පෙළෙන් ලැබෙන සාක්ෂිවලින් පෙනේ. මහා ශ්‍රාවකයකු හමුවට වරක් පැමිණි බුද්ධමාමක ගෘහස්ථයකු අට්ඨක වග්ගයේ එන මාගන්දිය ප්‍රශ්නයේ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදාරා ඇතැයි කියමින් එහි සඳහන් ගාථාවක අරුත් විස්තර වශයෙන් තෝරා දෙන ලෙස ඉල්ලීමක් කළ සැටිත්, එය සාර්ථක කරගත් සැටිත්, **සංයුත්තනිකායෙහි** සඳහන් වේ. අරුත් පැහැදිලි කරවා ගැනුමට ඔහු ගෙන හැර පෑ ඉතිවුත්තකය එම නිකායෙහි දක්වෙන්නේ මෙසේය: "**වුත්තමිදං** භනෙත **භගවතා** අට්ඨකවග්ගිකෙ මාගන්දිය පඤ්හෙ:[11]

"ඔකං පහාය අනිකෙතසාරී
ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි
කාමෙහි රිත්තො අපුරක්ඛරානො
කථං න විග්ගය්හ ජනෙන කයිරා ති"

බුදුන් වදාළ ධර්මය පිළිබඳ යම් කරුණක් තව කෙනෙකුට පැහැදිලි කිරීමේදී හෝ, විස්තර වශයෙන් කෙනෙකුගෙන් අසා දැන ගැන්මේ දී හෝ, තමන් බුද්ධ වචනය වශයෙන්

නිවැරදිව සලකා ගත් යමක් උද්ධෘත පාඨයක් වශයෙන් ප්‍රකාශ කිරීමේ දී එම දේශනා පාඨය ඉතිවුත්තකයක් වන්නේය. මේ අනුව සලකන කල, ඉතිවුත්තක දේශනාවන් ඉතිවුත්තක පාළියට පමණක් සීමා වේ යයි පිළිගත නොහැකිය.

## ඉතිවුත්තකාඞ්ගය හා සෙසු ශාසනිකාඞ්ගයන් අතර සම්බන්ධය

පසේ බුදුවරුන්ගේ උදාන ගාථාවන් අවස්ථානුරූපව වෙය්‍යාකරණයන් ද විය හැක්කා සේ, කවර බුද්ධ වචනයක් වුව ද අවස්ථානුකූලව ඉතිවුත්තකයක් ද විය හැකිය. මෙය හේතුකොට ගෙන ඉතිවුත්තක නම් වූ ශාසනිකාඞ්ගය සෙසු ශාසනිකාඞ්ග අට හා ගැටෙන බව ද පෙනේ. ශාසනිකාඞ්ගයන් මෙසේ ගැටෙන බැව් ටීකාචාරීහු ද පිළිගත්හ. එහෙයින් මෙම අඞ්ගයන්, සංකර ලක්ෂණයෙන් නොහොත් මිශ්‍ර ලක්ෂණයෙන් යුක්තය යි **සාරත්ථදීපනී** නම් විනයටීකාවෙහි සඳහන් වන්නේය. ("......එවං සුත්තාදීනං අඞ්ගානං අඤ්ඤමඤ්ඤසංකරතා වෙදිතබ්බා").[12] ශාසනිකාඞ්ගයන් මෙසේ එකිනෙක ගැටෙන්නේ එකී අඞ්ගයන්ගේ බෙදුම ප්‍රත්‍යෙක වශයෙන් එක් එක් අඞ්ගයකට අනුරූප වූ ස්වභාව ලක්ෂණ සලකා ගෙන ඇති වූවක් මිස එම අඞ්ගයන්හි වෙන වෙනම ඇතුළත් විය යුතු ධර්මකාරණ අනුව සිදු නොවූවක් බැවිනි.

## බෞද්ධ සංස්කෘත ග්‍රන්ථවල මෙය විස්තර කොට ඇති අයුරු.

බෞද්ධ සංස්කෘත ග්‍රන්ථවල නම්: ඇතැම් විට නවාඞ්ගයක් ද, ඇතැම් විට ද්වාදශාඞ්ගයක් ද සඳහන් වේ. එනමුත් මේ සංග්‍රහ නය දෙකට ම යට කී ශාසනිකාඞ්ගය ඇතුළත් වේ. එසේ වුවත්, එකී ග්‍රන්ථවල මෙම අඞ්ගය හැඳින්වෙන්නේ **ඉතිවෘත්තක** යනුවෙනි. සර්වාස්තිවාදී අභිධර්ම ග්‍රන්ථයක් වන **අභිධර්මසමුච්චයේ** මෙකී ශාසනිකාඞ්ගය

විස්තර කොට ඇත්තේ ආර්යශ්‍රාවකයන්ගේ පූර්ව ලෞකික විත්තීන් ඇතුළත් වන දේශනා කොටසක් වශයෙනි. (ඉතිවුත්තකං කතමත්? යදාර්යශ්‍රාවකානාං පූර්වලෞකිකං වෘත්තං දේශයන්ති)[13] **ඉතිවෘත්තක** යනුවෙන් බෞද්ධ සංස්කෘත ග්‍රන්ථවලට පෙරළා තිබුණු පදයේ 'වෘත්ත' යන කොටස සලකාගෙන 'විත්ති' යන අරුත සංස්කෘත අර්ථ කථාකරුවන් මෙයට සම්බන්ධ කළ බැව් මෙයින් පැහැදිලි විය යුතුය.

බෞද්ධ සංස්කෘත ග්‍රන්ථානුසාරයෙන් මෙම පදය වරදවා තේරුම් ගත් බු-තෝං නම් වූ මධ්‍යකාලීන තිබ්බතීය ඉතිහාසඥයා ද මෙකී අඞ්ගයෙහි ලා ගැනෙන්නේ ගෞතමයන් වහන්සේ පිළිබඳව දක්වෙන කථාවස්තූන් වැනි පූර්ව විස්තර ඇතුළත් වෘත්තාන්ත යයි දීඝවාස කෙළේ ය[14] මෙම ශාසනාඞ්ගයට අරුත් සැපයූ පිළිවෙළ අනුව සංස්කෘත අර්ථකථාකරුවන් පාළි අටුවාචාර්යවරයන් හා ටීකාචාර්යවරයන් හා සසඳා බලන කල, ඔවුන් පරිවර්තන දෝෂයන් හේතුකොට ගෙන අවුලෙන් අවුලටම ගිය බව අමුතුවෙන් නො කිවමනා ය. **ඉතිවුත්තක** යන පාළි වචනය **ඉත්‍යුක්ත** යනුවෙන් නිවැරිදිව බෞද්ධ සංස්කෘත ග්‍රන්ථවලට ඇතුළත් වූයේ නම් යට දැක්වූ අවුලෙන් බෞද්ධ සංස්කෘත අර්ථකථාකරුවන්ට නො අනුමානවම බේරෙන්නට ඉඩ තිබුණි

**ඉතිවුත්තක හා ඊට සම්බන්ධ පිටකය.**

ඉතිවුත්තක යන පාළි පදය යට කී පරිදි සංස්කෘතයට පෙරළා ගෙන ඊට අමුතු අරුත් දුන් සර්වාස්තිවාදීහු, අනතුරුව එහි ලා ගැනෙන ධර්මස්කන්ධයන් විනයපිටක පරියාපන්න වන්නේය යි සැලකූහ ද්වාදශාඞ්ගයන් අතරින් නිදාන, අවදාන, ඉතිවෘත්තක හා ජාතක යන කොටස් සතර විනය පිටකයට පරිවාර වශයෙන් (ශ්‍රාවක, බෝධිසත්ත්ව යන) දෙ පිටකයන්හි ම ඇතුළත් වේය යි අභිධර්මසමුච්චයේ

සඳහන් වේ. ("නිදානමවදානමිතිවෘත්තකං ජාතකං චෙතානි චත්වාරි අවයොඃ පිටකයොඃ සපරිවාරෙ විනය පිටකෙ සංගෘහීතානි භවන්ති")[15] යනුවෙනි.

අද, ථෙරවාදීන්ගේ පිළිගැනීම වනුයේ ඉතිවුත්තකය **ඛුද්දක නිකාය** පරියාපන්නවූ ග්‍රන්ථයක් වශයෙන් සූත්‍ර පිටකයට ඇතුළත් බවය එහෙත් පෙර, මේ පිළිබඳව ථෙරවාදීන් අතර ද මතභෙදයක් පැවැත්තේය යි **සුමඞ්ගල විලාසිනියෙහි** දැක්වෙන විස්තරයකින් පෙනේ. **ඉතිවුත්තකය** ද, ජාතක, නිද්දෙස, පටිසම්භිදාමග්ග, සුත්තනිපාත, ධම්මපද' උදාන ආදි වෙනත් පෙළ පොත් කීපයක් සමඟ ගෙන සාමූහිකව 'ඛුද්දකගන්ථ' යනුවෙන් ප්‍රථම සංගායනාවේ දී හඳුන්වන ලදැයි ද, එම **ඛුද්දකගන්ථය** අනතුරුව **අභිධර්ම** පිටකයෙහි ලා සංග්‍රහ වූයේය යි දීඝභාණකයන් විශ්වාස කරන බව ද, සූත්‍ර පිටකයෙහි ලා සංග්‍රහවිණැයි මජ්ඣිම භාණකයන් සලකන බව ද එහි විස්තරයෙන් කියවේ[16] මෙසේ ඉතිවුත්තකය, ඒ ඒ නිකායයන් අතර පැවැති මතභෙද නිසා හෝ එකම නිකායකට අයත් භාණකයින් දෙකොටසක් අතර පැවැති මතභෙද නිසා හෝ වරක් විනය පිටකයෙහි ද, වරක් සූත්‍ර පිටකයෙහි ද, වරක් අභිධර්ම පිටකයෙහි ද සංගෘහීත වීයැයි සැලකිය හැකිය.

### ස්වරූප ලක්ෂණ

ස්වභාව **ලක්ෂණ** අනුව සලකන කල 'මෙසේ වදාරන ලදැයි' යන හැඳින්වීම් මාත්‍රයකින් යුත් දේශනා පාඨයන් ඉතිවුත්තක සංඥෙන යයි කිව හැකි නමුත් ස්වරූප ලක්ෂණ අනුව ඒවා විවිධාකාර වීයැයි ද සිතිය හැකිය **"වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං,"** යන ප්‍රමුඛ පාඨයෙන් ඉතිවුත්තක පාළියෙහි සංගෘහීත ඉතිවුත්තක දේශනාවන් බොහොමයක්ම සමුපලක්ෂිත ය එහෙත් "අනෙකපරියායෙන හාවුසො සාති පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං **වුත්තං භගවතා** අඤ්ඤත්‍ර පච්චයා නත්‍ථි විඤ්ඤාණස්ස සම්භවොති" යනුවෙන්, කලින් මජ්ඣිම

නිකායෙන් ගෙන හැර දැක්වූ ඉතිවුත්තකයෙහි නම්, **"වුත්තං භගවතා** .... ති" යයි හැඳිනිය හැකි කොටස ප්‍රමුඛ පාඨයක් සේ යෙදී නැත.

ප්‍රාථමික පාඨයන්ගෙන් උපලක්ෂිත ඉතිවුත්තක දේශනා ද **මජ්ඣිමනිකායෙහි** නැත්තේ නොවේ. එහෙත් ඒවා, ඉතිවුත්තක පාළියෙහි යෙදී ඇති ප්‍රමුඛ පාඨයට වඩා වෙනස්ය යි කිව යුත්තේ **"වුත්තං ඛො පනෙතං භගවතා,"** යන පද පිළිවෙළින් ඇතැම් විට යුක්ත හෙයිනි: මෙයට නිදසුනක් වශයෙන් "වුත්තං ඛො පනෙතං භගවතා, ධම්මදායාදා මෙ භික්ඛවෙ භවථ මා ආමිසදායාදා ති"[17] යනුවෙන්, **මජ්ඣිමනිකායෙහි** එන දේශනා පාඨයක් දැක්විය හැකිය. යම් විටක භික්ෂූන්ට තමන් වහන්සේගේම කියමනක් මෙලෙසින් සිහිපත් විය හැකි යයි සලකා බුදුරජාණන් වහන්සේ විසින්ම ඉතිවුත්තක ස්වරූපයෙන් මෙය වදාළ බැව් එම සූත්‍රයෙන් පෙනේ. එහෙත් ඉතිවුත්තක ස්වරූපයෙන් වෙන්කොට, අවවාද මුඛයෙන්, උන්වහන්සේ විසින් එයම සූත්‍රයේ මුලට දේශනා කොට ඇත්තේ "ධම්මදායාදා මෙ භික්ඛවෙ භවථ, මා ආමිසදායාදා, අත්ථි මෙ තුම්හෙසු අනුකම්පා කින්ති මෙ සාවකා ධම්මදායාදා භවෙය්‍යුං නො ආමිසදායාදා ති" යනුවෙනි. අදහස් අතින් සමාන වුව ද, සූත්‍රයේ මුලට දැක්වෙන පාඨය ඉතිවුත්තකයක් නොවන්නටත්, අතරක දැක්වෙන පාඨය ඉතිවුත්තකයක් වන්නටත් එකම හේතුව නම්, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මෙසේ වදාරන ලදැයි' යන කියමනකින් සූත්‍රයෙහි අතරක එන ඉතිවුත්තක දේශනා පාඨය සමුපේතවී තිබීම ය. දේශනා පාඨයක් ඉතිවුත්තකයක් වන්නේ අවස්ථානුකූලව ය යි කලින් පවසන ලද්දේ ද එනිසාම ය. **මජ්ඣිම නිකායෙන්** දැක්විය හැකි තවත් නිදසුනක් මෙසේ ය: **"වුත්තං ඛො පනෙතං භගවතා:** යො පටිච්චසමුප්පාදං පස්සති, සො ධම්මං පස්සති, යො ධම්මං පස්සති, සො පටිච්චසමුප්පාදං පස්සතීති."[18] මෙහි ප්‍රමුඛ පාඨය ද යට දැක්වූ නිදසුනෙහි ආ ප්‍රමුඛ පාඨය හා සමාන ය.

ඉතිවුත්තකයකට මුල්වන පාඨය ඇතැම් විට යට කී නිදසුන්වල යෙදුණ පාඨයනට ද වඩා වෙනස් විය හැකි බැව් **අඞ්ගුත්තරනිකායෙන්** දක්විය හැකි නිදසුන් කීපයකින් පෙනේ. එහි, ඉතිවුත්තයකට මුල්වූ දේශනා පාඨය '**වුත්තමිදං** භන්තෙ **භගවතා කුමාරිපඤ්හෙසු**"[19] යනාදි වශයෙන් හෝ **වුත්තමිදං** ආවුසො **පාරායනෙ මෙත්තෙය්‍යපඤ්හෙ**[20]" යනු විසින් හෝ කොතැන සඳහන් වන්නේදැයි සම්බන්ධය දක්වා අනතුරුව බුද්ධභාෂිත ගාථාවක් ද සඳහන් කොට ඇත. මෙවැනිම නිදසුනක් මෙයට කලින් ඉතිවුත්තකයක ස්වභාව ලක්ෂණ ගැන කරුණු ප්‍රකාශ කිරීමේදී **සංයුත්ත නිකායෙන්** ද ගෙනහැර පෑ බව මෙහිදී විශෙෂයෙන් සඳහන් කළ යුතුය.[21]

දේශනා පාඨයකට පූර්වාඞ්ගම ව නොව අපරාඞ්ගම ව ද '**ඉති ඛො පනෙතං වුත්තං භගවතා**' යනුවෙන් වගන්තියක් ඇදීමෙන් සැදුණු ඉතිවුත්තක විසි එකක් **මජ්ඣිම නිකායෙහි** සෙවිතබ්බාසෙවිතබ්බ සූත්‍රයෙහි සංගෘහිත වී ඇත්තේය.[22] එහි සඳහන් එක් එක් දේශනා පාඨයක් පාසාම 'මෙසේ භාග්‍යවතුන් වහන්සේ වදාරන ලද්දේ කුමක් පිළිබඳව දැයි' ප්‍රශ්නයක්ද තබා ඇත. ("ඉති ඛො පනෙතං වුත්තං භගවතා, කිඤ්චෙතං පටිච්ච වුත්තං"). එසේ තබා තිබෙන ප්‍රශ්නයන් හේතුකොට ගෙන, මුලදී සැකෙවින් දේශනා කරන ලද යම් යම් කරුණු පිළිබඳව විස්තර විභාග වෙන වෙනම දක්වා ඇත. සංක්ෂිප්තභාෂිතයක්, මෙසේ විස්තර වශයෙන් විභාග කිරීම ධර්මය හරි හැටි තේරුම් ගත්තවුන්ට දුෂ්කර කාර්යයක් නොවීය.

ඉතිවුත්තකයක ස්වරූප ලක්ෂණ තවත් දුරට වෙනස් වූ සැටි **මිලින්දපඤ්හ** නම් පාළි පොතෙන් ද තේරුම් ගත හැකිය. **වුත්ත** ශබ්දය වෙනුවට **භාසිත** ශබ්දය යොදා දක්වෙන ඉතිවුත්තකයක් මෙහි ඇත්තේ ය. පහත සඳහන් වනුයේ එම පොතෙන් තෝරා ගත් නිදසුනකි: "**භාසිතමෙතං** මහාරාජ **භගවතා** දෙවාතිදෙවෙන

චක්කවාකජාතකෙ:

> “යො න හන්ති න ඝාතෙති
> න ජිනාති න ජාපයෙ
> මෙත්තං සො සබ්බභූතෙසු
> වෙරං තස්ස න කෙනචී ති”[23] යි.

## ශ්‍රාවකභාෂිත ඉතිවුත්තක

**මිලින්දපඤ්හයේ** දක්වෙන ඉතිවුත්තකයන් වෙනස් වූයේ ස්වරූප ලක්ෂණ අතින් පමණක් නොවේ. බුද්ධභාෂිත දේශනාපාඨයන්ට පමණක් සීමා නොකොට ශ්‍රාවක භාෂිත දේශනා පාඨයන් ද ඉතිවුත්තක ස්වරූපයෙන් ගෙන පෑමෙන් එහි නවතාවක් දිස්වේ. සැරියුත් මහතෙරුන්ගේ දේශනා පාඨයක් ඉතිවුත්තක නයින් මෙහි දක්වා ඇත්තේ මෙසේ ය: “**භාසිතමෙතං** මහාරාජ ථෙරෙන **සාරිපුත්තෙන** ධම්මසෙනාපතිනාපි:

> “යථා සුමනෙනා මාතඞ්ගො සකං සොණ්ඩං න මද්දති
> භක්ඛාභක්ඛං විජානාති අත්තනො වුත්තිකප්පනං
> තථෙව බුද්ධ පුත්තෙන අප්පමත්තෙන වා පන
> ජිනවචනං න මද්දිතබ්බං මනසිකාරවරුත්තමන්ති”[24]

තවද **චුල්ලපන්ථක** ස්ථවිරයන්ගේ දේශනා පාඨයක් ඉතිවුත්තක ස්වරූපයෙන් එහි මෙසේ දක්වා ඇත: “**භාසිතමෙතං** මහාරාජ ථෙරෙන **චුල්ලපන්ථකෙන**:

> “යදා කිලෙසා ඔපතන්ති සාමඤ්ඤගුණධංසනා
> සතිපට්ඨාන ලකුටෙන හන්තබ්බා තෙ පුනප්පුනන්ති”[25]

## බ්‍රහ්මභාෂිත ඉතිවුත්තකයක්

එපමණක් නොව, බ්‍රහ්මභාෂිත දේශනා පාඨයක් ද ඉතිවුත්තක ස්වරූපයෙන් සිය පොතෙහි **මිලින්දපඤ්හ** කතුවරයා ඇතුළත් කොට ඇත්තේය. “**භාසිතමෙතං** මහාරාජ **බ්‍රහ්මුනා සහම්පතිනා** භගවතො සන්තිකෙ:

සෙවෙථ පන්තානි සෙනාසනානි
චරෙය්‍ය සංයොජන විප්පමොක්ඛා
සචෙ රතිං නාධිගච්ඡෙය්‍ය තත්ථ
සඞ්ඝෙ වසෙ රක්ඛිතත්තො සතිමා ති"[26] යි.

## සිංහල පොත්වල මෙය දක්වෙන අයුරු

ඉතිවුත්තකයන්ගේ ස්වරූප ලක්ෂණ මෙතෙක් දක්වූ ක්‍රම පිළිවෙළින් හාත්පසින් වෙනස් වූයේ ලක්දිව පහළ වූ පොතපතිනැයි කීම අතිශයෝක්තියක් නොවේ. ත්‍රිපිටකයේ කොතැනකින් හෝ බුදුවදනක් උදුරා ඉතිවුත්තකයක් සේ දක්වීමේ දී **'වදාළේ මැ නො,' කීයේ මැ නො,' 'එසින් කීහ,'** යන මේ කවර විධියකට හෝ අයත් පූර්වෝක්ත පදයකින් එම දේශනා පාඨය ඉදිරිපත් කිරීම අමාවතුර, ධර්මප්‍රදීපිකා, පූජාවලි, ආදි සිංහල පොත් කතුවරුන් අනුගමනය කළ සිරිත විය. මේ ස්වරූප ලක්ෂණ මෙරට ලියැවුණු පාළි අටුවාවල ද දක්නා හැකිය. **'තෙන වුත්තං,' 'තෙනාහ'** යනාදී වශයෙන් එකී පද පාළි අටුවාවල යෙදුණේ ය මින් 'තෙන වුත්තං' යන්න 'වදාළේ මැ නො' 'කීයේ මැ නො' යන පදයන්ට කෙළින්ම සම්බන්ධකම් ඇත්තේය සි කිව හැක්කා සේම තෙනාහ' යන පදය එසින් කීහ' යන පදයට නෑකම් ඇති බවක් හඟවයි. මේ පාඨයන් පළමුව සිහළ බසින් යෙදී පසුව පාළියට ද පෙරළා ගන්නා ලදැයි නිශ්චය වශයෙන් නො කිව හැකිය.

එහෙත්, පාළි අටුවාවන් පවා මුලින් පැවැති සිංහල අටුවාවන් ආශ්‍රයෙන් හෝ, ඒවායේ පරිවර්තන වශයෙන් හෝ පිළියෙළ විනැයි පිළිගනිතොත්, යට කී පාඨයන් ද මුලදී සිංහලෙන් එසේ යෙදුණ හෙයින්, පාළි අටුවාවලට ද එලෙසින්ම පෙරළන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. තවද පැරණි සිංහල සාහිත්‍යයෙහි ලා ගැනෙන පද්‍ය පොත් වැඩි ගණනක් ම වාගේ සිංහලෙන් තිබුණ අටුවා පාළියට මුලින්ම පෙරළන්නට පටන් ගත් කාලයට වඩා වයසින් බාල වුවද, එම පොත්වල යට දක්වුණු ආකාර පාඨ එසේ

ඇතුළත් වන්නට හේතුව ඒවා පාළි අටුවාවලින් සිංහලට පෙරළා හත් නිසාය යි නිගමනය කිරීමට වඩා දීර්ඝ කාලයක සිට එලෙසින් ම හෙළ බසින් ව්‍යවහාර වූ නිසාය යි සැලකීම හේතු සහිත සේ පෙනේ.

## ඉතිවුත්තකයක් සූත්‍රාන්තයක් වන අයුරු

ඉතිවුත්තක ස්වරූපයෙන් ගළපා ගනු ලැබූ සංක්‍ෂිප්ත භාෂිත වූ දේශනා පාඨයක් විස්තරාර්ථ වශයෙන් විභාග කිරීමේ දී ඇතැම් විට සූත්‍රාන්තයක් බවට ද පත් වන්නට ඇත  එවැනි සූත්‍රාන්තයක් 'ඉතිවුත්ත' හා 'පටිච්ච වුත්ත' යන ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත විය  මෙයින් පළමු කොටසින් ගැනෙන්නේ මුලින් මාතෘකා වශයෙන් තෝරා ගත් සංක්‍ෂිප්ත භාෂිත වූ දේශනා පාඨය ය. දෙ වැනි කොටසින් කියවෙන්නේ එම දේශනා පාඨය කුමක් පිළිබඳව වදාරන ලද්දේ ද යනු ය ('කිංසෙඩවත්තං පටිච්ච වුත්තං”) ඉතිවුත්තකයන්ගේ විවිධාකාර ස්වරූප ලක්‍ෂණ ගැන කරුණු කීමේ දී සෙවිතබ්බාසෙවිතබ්බ නම් වූ සූත්‍රයෙහි දක්වෙන ඉතිවුත්තක විසිඑකෙහිම වෙන වෙනම මේ දෙකොටස ඇතුළත් වී ඇතැයි කලින් සඳහන් කෙරිණ  එම සූත්‍රයේ ඇතුළත් එක් එක් දේශනා පාඨයක් පිළිබඳව වෙන වෙනම දක්වෙන විස්තරාර්ථය අල්පමාත්‍ර හෙයින් ඒ සියල්ලම එක සූත්‍රයක සංගෘහිත කළ හැකි විය.

එහෙත් ආකඞ්ඛෙය්‍ය සූත්‍රයෙන් ද සතිපට්ඨාන සූත්‍රයෙන් ද දක්වෙන පරිදි, 'ඉතිවුත්ත' යනුවෙන් තෝරා ගන්නාලද එක් දේශනා පාඨයක් 'පටිච්චවුත්ත' යනුවෙන් ඒ පිළිබඳව ප්‍රකාශවන විස්තර විභාගය නිසා සෑහෙන පමණ දිගින් යුත් තනි සූත්‍රාන්ත දේශනාවක් විය හැකි බැව් මැනවින් පැහැදිලි වන්නේය  මාතෘකා පාඨයට සම්බන්ධ පටිච්චවුත්ත කොටසෙහි ලා යමක් කියන ලද ද ඒ සියල්ලම — එනම් විස්තර දේශනාව ම — මාතෘකා පාඨය පිළිබඳවම ප්‍රකාශිතය යි මේ සූත්‍ර දෙකෙහිම සඳහන් වනුයේ. **“ඉති යන්තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තන්ති”** යනුවෙනි

## ඉතිවුත්තක පාළිය

ශාස්තිකාඞ්ගයක් වශයෙන් ඉතිවුත්තක යනු කවරේදැයි හඳුන්වනු සඳහා මෙතෙක් කළ විස්තරය **ඉතිවුත්තක පාළිය** නම් වූ **ඛුද්දකනිකාය** පරියාපන්න ග්‍රන්ථයෙහි ද තත්ත්වාවබෝධයට පසුබිම් වන්නේ ය. එම ග්‍රන්ථය අද සූත්‍ර එකසිය දෙළොසකින් සමන්විත ය. මෙහි සූත්‍ර කොපමණ මුලින් ඇතුළත් වූයේ ද යන්න සම්බන්ධයෙන් මතභේදයකට තුඩු දුන් කරුණු ගැන ප්‍රාරම්භයෙහි ප්‍රකාශ විය.

## සූත්‍රවල යෙදෙන ප්‍රාරම්භ පාඨය.

අද භාවිතා වන සංස්කරණයන්හි ඇතුළත් සූත්‍ර එකසිය දෙළොසින් වැඩි ගණනකම **'වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං'** යනුවෙන් ප්‍රාරම්භ පාඨයක් යෙදේ. එම පාඨය එසේ නොයෙදෙනුයේ වර්ගයක ආදියෙහි හෝ අවසානයෙහි හෝ එන සූත්‍රවල නොවේ. ආදි, අන්ත යන දෙකෙළවරට අතරින් යෙදෙන සූත්‍රවල පමණකි. පාළි ග්‍රන්ථ සමාගම වෙනුවෙන් ඉතිවුත්තක පාළිය සකස් කළා වූ **අර්න්ස්ට් වින්ඩිෂ්** මහතා ද, තමන් පරීක්ෂා කළ පුස්කොළ පොත් අතරින් හැමෙකකම, පනස් වැනි සූත්‍රය දක්වා — එනම් තිකනිපාතයෙහි පළමුවැනි සූත්‍රය දක්වා— මේ පාඨය අවිශෙෂයෙන් යෙදී ඇති බැව් පවසයි[27] මෙකී ලක්ෂණය බහුල වශයෙන් බලපවත්වා ඇත්තේ තිකනිපාතයට අයත් චතුර්ථ වර්ගයේ පටන්ය. එහෙත් හැම වර්ගයකම ආදියෙහිත් අවසානයෙහිත් එන සූත්‍රවල එබන්දක් අවිද්‍යමාන වන හෙයින් ඉතිවුත්තක පාළිය පුස්කොළ පොත්වල ලේඛනාරූඪ කළ ලේඛකයින්ගේ ප්‍රමාද දෝෂයක් නිසා මෙසේ සිදුවන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. එය එසේමය යි පිළිගත හැක්කේ මෙකී අඩුපාඩුවෙන් යුත් සමහර පාළි සූත්‍ර දේශනා,[28] සර්වාස්ති වාදී සංස්කෘත පිටපතකින් චීන බසට නඟා ගත් ඉතිවෘත්තකයෙහි ද කෙසේ හෝ සංග්‍රහ වී ඇති හෙයිනි. පරිවර්තනය සඳහා තෝරා ගන්නා ලද මූල් සංස්කෘත

පිටපතේ එවැනි උද්ගතතාවක් නොතිබුණු නිසා, චීන සංස්කරණයට ද එවැනි සූත්‍ර ඇතුළත් කර ගැනීම බාධාවක් නුවූණා විය හැකිය.

## අටුවාවේ දැක්වෙන තේරුම

අනඳ මහතෙරුන් විසින් ඉතිවුත්තක පාළියෙහි එන සූත්‍රවල මුලට යොදන ලද ‘වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං’ යන ප්‍රාරම්භ පාඨය, අටුවාවේ තෝරා ඇත්තේ ‘භාග්‍යවතුන් වහන්සේ විසින්, රහතුන් වහන්සේ විසින්, මෙය වදාළ බව මවිසින් අසන ලදී’ යනුවෙනි. ‘ඉති මෙ සුතං’ යන පාඨයෙහි ‘ඉති’ ශබ්දය, නිදර්ශිතාර්ථයෙන්[29] යොදා ඇතැයි ද, එහෙයින් එම පාඨය ‘එවං මෙ සුතං’ යන්න හා අරුතින් සමාන වන්නේය යි ද එහි දැක්වේ. අනඳ මහතෙරුන් හැම සූත්‍රයක්ම මේ නයින් තමන්වහන්සේ ඇසූ අයුරින්ම දක්වා ඇති හෙයින් එහි යුක්තායුක්තිය පිළිබඳ වගකීයමෙන් ගැලවී ඇතැයි ද අටුවාවේ ප්‍රකාශිතය. (“නාහං සයම්භූ, න මයා ඉදං සච්ඡිකතන්ති අත්තානං පරිමොචෙන්තො ඉති මෙ සුතං, මයාපි එවං සුතන්ති ඉමිනා ඉදානි වත්තබ්බං සකලං සුත්තං නිදස්සෙති”).[30] එසේම ‘ඉති මෙ සුතං’ යන්නෙන් භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි ම සිට ඇසූ බවකුත් ප්‍රකාශ වන්නේය යි අටුවාවේ වැඩිදුරටත් සඳහන් වේ. (“භගවතො සම්මුඛා සුතාකාරතො...”)[31]

## සූත්‍රධර්මයේ විවිධාකාරය.

පාඨකයකුට යට දැක්වුණු අටුවා මතය අවිවාදයෙන් පිළිගැනීමට බාධකයක්ව පවතින්නේ ‘ඉති මෙ සුතං’ යන්න ‘සම්මුඛා මෙ සුතං’ යන්න හා අරුතින් සමානය යි එහි සඳහන් ව ඇති හෙයිනි. ශ්‍රාවකයකු බුදුන් වදාළ ධර්මය ප්‍රධාන වශයෙන් තුන් ආකාරයකින් ඇසූ බැව් පෙළෙහි එන නිදසුන්වලින් පෙනේ. ඒ තුන් ආකාරයෙන් ඇසූ ධර්මය ඔහු පිළිවෙළින් හැඳින් වූයේ

'සම්මුඛා මේ සුතං,' 'එවං මේ සුතං,' 'ඉති මේ සුතං' යනුවෙනි. බුදුන් හමුයෙහි නැත්නම් ඉදිරියෙහි අසළින්ම සිට තමන් ඇසූ ධර්මය 'සම්මුඛා මේ සුතං' යයි ද බුදු පිරිස අතර බුදුන්ට ඈතින් සිට ඇසූ ධර්මය 'එවං මේ සුතං' යයි ද, අන්‍යයකුගෙන් බුද්ධභාෂිත ය යි තමන් අසා දැනගත් ධර්මය 'ඉති මේ සුතං' යනුවෙන් ද හැඳින්විණැ යි සලකතොත්, 'සම්මුඛා මේ සුතං' යන්න හා 'ඉති මේ සුතං' යන පාඨය අරුතින් සමානවීය යි නො කිව හැකිය.

මෙකී තුන් ක්‍රමයේ ම පාඨයන් පෙළෙහි විද්‍යමාන වන්නේ එකිනෙක අතර පවත්නා යම් කිසි විශේෂත්වයක් සලකාගෙන මිස, ඒවා සමානාර්ථයෙන් යුත් පාඨයන් සේ සැලකූ නිසා නොවේය යි සිතෙන්නේ අනඳ මහතෙරුන් විසින් ම මේ ත්‍රිවිධ පයඝීයයන් අනුගමනය කොට ඇති හෙයිනි.

බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ වසද්දී ආනන්ද ස්ථවිරයන් වහන්සේ වරක් තථාගතයන් වහන්සේගේ ආශ්චර්ය අද්භූත ධර්ම කාරණා දහනවයක් සම්මුඛා සුත ධර්මයන් වශයෙන් වදාළහ [32] එය අසා සිටි බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්ථවිරයන් අමතා තවද ආශ්චර්ය අද්භූතධර්ම කාරණ තුනක් එම විස්තරයට එකතු කළ සේක. බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වැඩි කලක් ගත වන්නට පෙර ඡන්න නම් භික්ෂුවට ධර්ම දේශනා කළ ආනන්ද ස්ථවිරයන් වහන්සේ තමන් වහන්සේ වදාළේ භාග්‍ය-වතුන් වහන්සේ විසින් කාවෙක කච්චාන ගොත්‍රික භික්ෂුවට අවවාද මුඛයෙන් දේශනා කරද්දී සම්මුඛයෙහි සිට ශ්‍රවණය කළ ධර්මයකැයි ප්‍රකාශ කළහ. ("සම්මුඛා මෙතං ආවුසො ඡන්න භගවතො සුතං; සම්මුඛා ච පටිග්ගහිතං, කච්චාන ගොත්තං භික්ඛුං ඔවදන්තස්ස: ද්වයනිස්සිතො ඛ්වායං කච්චාන ලොකො යෙභුය්‍යෙන අත්ථිතඤ්ච නත්ථිතඤ්ච")[33] මෙසේ ධර්මය සම්මුඛා සුත ,වශයෙන් වරෙක වදාළා වූ ආනන්ද ස්ථවිරයන් ඉතිවුත්තක පාළියෙහි සංග්‍රහ කළ

දේශනා පාඨයන් ද එපරිද්දෙන් ම නො හැඳින්වූයේ 'සම්මුඛ මෙ සුතං', 'එවං මෙ සුතං', හා 'ඉති මෙ සුතං' යන ත්‍රිවිධ පය්‍යායෙහි විද්‍යමාන වූ විශෙෂත්වය නිසාමය යි හැඟෙයි.

**අටුවාවේ සඳහන්වන අන්‍ය මතයක්.**

ඉතිවුත්තක පාළියෙහි එන දේශනා පාඨයන් බුදුරජාණන් වහන්සේගේ සම්මුඛයෙහි සිට ශ්‍රවණය කළ ශ්‍රාවක - ශ්‍රාවිකාවකගෙන් හෝ මුඛ පරම්පරානුසාරයෙන් දැන කියා ගත් ශ්‍රාවක-ශ්‍රාවිකාවක-ගෙන් හෝ අසා දැන ගෙන ආනන්ද ස්ථවිරයන් විසින් ප්‍රථම සංගායනාවේදී වදාරන ලද්දේය යි විශ්වාස කිරීමට තුඩු දෙන සාක්ෂියක් **ඉතිවුත්තකට්ඨකථා**වේ සඳහන් වී ඇත එම අටුවාවේ සඳහන් පරිදි සමහරුන්ගේ විශ්වාසය වූයේ ඉතිවුත්තක පාළියෙහි දක්වෙන සූත්‍රයන්ගේ මූලට යෙදෙන 'වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං' යන නිදාන පාඨය පළමුවෙන් ආනන්ද මහතෙරුන් විසින් වදාරන ලද්දක් ලෙස නොව **ඛුජ්ජුත්තරා** නම් ආය්‍යී ශ්‍රාවිකාව විසින් උදෙන රජුගේ අන්තඃපුරයෙහි විසූ සාමාවතිය ප්‍රමුඛ පන්සියයක් සත්‍රීන්ට කොසඹෑ නුවරදී තමන් දිනපතා බුදුන්ගෙන් ඇසූ ධර්මය මෙසේය යි දක්වීමට පෙරාතුව ප්‍රකාශ කරනු ලැබූවක් ලෙසය ("අපරෙ තාව ආහු: න පන ථෙරෙන භාසිතන්තා ඉදං හි නිදානං ආයස්මතා ආනන්දෙන න පඨමං භාසිතං, ඛුජ්ජුත්තරාය පන භගවතා උපාසිකාසු බහුස්සුතභාවෙන එතදග්ගෙ ඨපිතාය සෙක්ඛපටිසම්භිදප්පත්තාය අරියසාවිකාය සාමාවතී පමුඛානං පඤ්චන්නං ඉත්ථිසතානං පඨමං භාසිතං")[34]

තවද, එම සූත්‍ර දේශනාවන් ඛුජ්ජුත්තරාව අතින් භික්ෂුණීන් අතට පත් බවත් භික්ෂුණීන් අතින් භික්ෂූන් අතට පත් බවත් ප්‍රථම සංගායනාවේ ආනන්ද මහතෙරුන් ඒවා පාළියට නැගීමේදී ඛුජ්ජුත්තරාව විසින් මුලින් ඊට තබන ලද නිදාන පාඨයෙන්ම උපලක්ෂිත කළ බවත් සමහරුන්ගේ පිළිගැනීමය යි අටුවාවේ වැඩිදුරටත් සඳහන් වන්නේය.[35]

සමහරුන්ගේ පිළිගැනීමක් වශයෙන් අටුවාවේ සඳහන් වන මේ විස්තරය සත්‍යපදනමකින් යුක්තවූවකැයි අප පිළිගනිතොත් ඉතිවුත්තක පාළියෙහි ඇතුළත් සූත්‍ර දේශනාවන්ගේ මුලට යෙදෙන නිදාන පාඨය 'ඉති මෙ සුතං' යනුවෙන් අනඳ මහතෙරුන් අවසන් කොට ඇත්තේ ද මුඛ පරම්පරානුසාරයෙන් තමන් වහන්සේ එම දේශනාවන් ශ්‍රවණය කළ බැවිනැයි සිතිය හැකිය.

මේ සූත්‍ර දේශනාවන් බුදුරජාණන් වහන්සේ ඛුජ්ජුත්තරාව උදෙසා අවවාද මුඛයෙන් වදාරනු සම්මුඛයෙහි සිට අනඳ මහතෙරුන් අසා සිටියේ නම් නිදාන පාඨයේ පද පිළිවෙළ 'වුත්තං හෙතං භගවතා වුත්තමරහතා ති මෙ සුතං' යනු වෙනුවට 'සම්මුඛා ච මෙ තං භගවතො සුතං; සම්මුඛා ච පටිග්ගහිතං, ඛුජ්ජුත්තරං උපාසිකං ඔවදන්තස්ස' යනාදි ලෙසින් හෝ 'සම්මුඛා ච මෙ තං සුතං, සම්මුඛා ච පටිග්ගහිතං, තෙන භගවතා තෙන අරහතා ඛුජ්ජුත්තරං උපාසිකං ඔවදතා වුත්තනති' යනාදී වශයෙන් හෝ වෙනස් වන්නට ඉඩ තිබුණි.

එසේ නැත්නම් බුදු පිරිසෙහි ඈතින් හෝ සිට ගෙන එම සූත්‍ර දේශනාවන් උන්වහන්සේ ශ්‍රවණය කළසේක් නම් 'එවං මෙ සුතං' යනුවෙන් වත් ඒ බව ප්‍රකාශ වනු නියතය. එවැනි කිසිවක් මෙහි සඳහන් නොවන හෙයිනුත් සමහරුන්ගේ මතයක් ලෙස ඛුජ්ජුත්තරාව සම්බන්ධයෙන් අටුවාවේ සඳහන් කොට ඇති කථා ප්‍රවෘත්තියෙනුත් ඉතිවුත්තක පාළියෙහි යෙදෙන සූත්‍ර දේශනාවනට 'වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං' යනාදි ලෙසින් අනඳ මහතෙරුන් විසින් නිදාන පාඨයක් තබන ලද්දේ තමන් වහන්සේ එම සූත්‍ර දේශනාවන් මුඛපරම්පරානු-සාරයෙන් ම ශ්‍රවණය කළ නිසාය යි අනුමානයෙන් සිතාගත හැකි ය.

එසේ නම් මෙකී පාඨයේ මුළු තේරුම 'භාග්‍යවතුන් වහන්සේ විසින් අර්හතුන් වහන්සේ විසින් මෙය වදාළසේකැ යි ම විසින් අසන ලදි' යනු වී ය යි සැලකිය

හැකිය. තවද ඉතිවුත්තක පාළියෙහි එන හැම සූත්‍ර දේශනාවකම අතරක දක්වෙන ගාථාවට හෝ ගාථා පඞ්ක්තියට හෝ පෙරාතුව 'මෙය මෙසේ පවසනු ලැබේ' යන තේරුමින් යුත් **'තත්ථෙතං ඉති වුච්චති'** යයි පාඨයක් අනඳ මහතෙරුන් ඇතුළත් කොට ඇත්තේ ද මේ සූත්‍ර දේශනාවන් පිළිබඳව තමන් වහන්සේ ඇති සම්බන්ධයක් සලකාගත් හෙයිනැයි හැගේ. එසේද වුව අටුවාචාර්යයන් වහන්සේ ඉතිවුත්තක සූත්‍ර දේශනාවන් සියල්ලක්ම අනඳ මහතෙරුන් විසින් බුදුන් හමුයෙහි සිට ම අසා දැනගන්නා ලදැයි තරයේ ම විශ්වාස කළහ.

**සූත්‍රවල සැලැස්ම.**

නිදාන වශයෙන් දක්වා ඇති ප්‍රාරම්භ පාඨයට අනතුරු ව බුදුන් වදාළ පර්යාප්ති ධර්මය මතු කෙරෙන දේශනා පාඨයක් ඉතිවුත්තක පාළියෙහි එන හැම සූත්‍රයක ම ඇතුළත් ය එම දේශනා පාඨයේ අවසානයට 'මේ අරුත භාග්‍යවතුන් වහන්සේ වදාළසේක එහිලා මෙය මෙසේ පවසනු ලැබේ' යයි ගද්‍යපාඨයක් දක්වා ඊට අනතුරු ව මුලින් ප්‍රකාශ කළ දේශනා පාඨයේ තේරුමට බොහෝ සෙයින් සමානය යි කිව හැකි පද්‍ය කොටසක් ද ඇඳ ඇත එම පද්‍ය කොටසට පසු 'මෙම අරුත ද භාග්‍යවතුන් වහන්සේ වදාළසේකැයි ම විසින් අසන ලදි' යනුවෙන් දැක්වෙන තවත් වගන්තියකින් සූත්‍රය කෙළවර වේ

**පද්‍යමය පටිච්චවුත්ත කොටස.**

මේ බඳු ලක්ෂණයෙන් සූත්‍රාරූඪ වූ ඉතිවුත්තකයන්ගේ 'පටිච්චවුත්ත' කොටස එහි සඳහන් පද්‍ය කොටසින් සම්පූර්ණ වන්නට ඇතැයි සිතිය හැක්කේ 'තත්ථේතං ඉති වුච්චති' යනුවෙන් දැක්වෙන පාඨයකට අනතුරුව එය සූත්‍රයෙහි අන්තර්ගතවන බැවිනි. ඉතිවුත්තකාඞ්ගය පිළිබඳ මෙම ලිපියෙහි මුලින්ම කරුණු දක්වීමේ දී ඉතිවුත්තකයක්, ස්වරූප ලක්ෂණ අනුව 'පටිච්චවුත්ත' කොටසකින් ද සමන්විතව සූත්‍රාරූඪ විය හැකි බැව් සඳහන් කෙරිණ එහි

නිදසුන් වශයෙන් දැක්වූ 'පටිච්චවුත්ත' කොටස් ගද්‍යයෙන් උපලක්ෂිත වුව ද දැන් ඉතිවුත්තක පාළියෙහි පෙනෙන පරිදි පද්‍යයෙන් වුව ද එය සමුපේත විය හැකි බැව් සැලකිය යුතුය.

**සැලැස්මට අයත් අඞ්ගයන්ගේ විලෝපනය.**

ඉතිවුත්තක පාළියෙහි සංගෘහීත ඛුද්දක ධම්මක්ඛන්ධ-යන්ගෙන් බොහොමයක් යට දැක්වුණු ක්‍රම විසින් පරිමිත ව සූත්‍රාරූඪ වීය යි කිව හැකි වුව ද මෙතෙක් භාවිතා වූ සංස්කරණවල මින් සමහර අඞ්ග ලක්ෂණයන් අදෘශ්‍යමාන වීයයි ද කීම යුතුය උදාහරණයක් වශයෙන් දක්වතොත් පාළි ග්‍රන්ථ සමාගම මගින් මුද්‍රිත ඉතිවුත්තක පාළියෙහි තිකනිපාතයට අයත් චතුත්ථ හා පඤ්චම වග්ගයන්හි ඇතුළත් සූත්‍ර සොළොසකත් චතුක්කනිපාතයට අයත් සූත්‍ර එකොළොසකත්, 'වුත්තං හේතං භගවතා වුත්තමරහතාති මෙ සුතං' යන ප්‍රාරම්භ නිදාන පාඨයත්, 'එතමත්ථං භගවා අවොච, තත්ථේතං ඉති වුච්චති' යන මධ්‍ය පාඨයත්. 'අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතං' යන පර්‍ය්‍යවසාන පාඨයත් සඳහන් නොවන බව විශේෂයෙන් කිව යුතුය

එකී පාඨයන් එහි සූත්‍ර කීපයකම සඳහන් නොවූයේ එම පුස්තකය සකස් කිරීමේ දී උපයෝගී කරගන්නා ලද පුස්කොළ පොත්වල එවැනි ඌනතාවයන් විද්‍යමාන වූ හෙයිනි එනමුත් එකී විෂමතාවන්, ඉතිවුත්තක පාළිය පුස්කොළ පොත්වල ලියූ ලේඛකයින්ගේ මනදෝෂසාහසය නිසා ඇති විනැයි සැලකිය හැක්කේ එම අඩුපාඩුකම් වැඩියක් ම බල පා ඇත්තේ මෙම පුස්තකයෙහි සඳහන් වර්ගයන්ගේ ආරම්භයෙහිවත් අන්තයෙහිවත් නොවන හෙයිනි තවද එවැනි ඌනතාවන්ගෙන් පාළියෙහි උපලක්ෂිත ඇතැම් සූත්‍ර දේශනා වීත ඉතිවෘත්තකයෙහි සංගෘහීත වී ඇති බැවින් මේ අඩුපාඩුව සූත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමට තරම් බලවත් කාරණයක් ලෙස පැරණි සංස්කාරක

වරු නොසැලකූහ යි ද විය හැකිය. නොඑසේ නම් චීන ඉතිවෘත්තකයට මූල ග්‍රන්ථය වූ සර්වාස්තිවාදි සංස්කෘත පිටපතේ එවැනි ඌනතාවක් නොතිබුණු නිසාය යි ද විය හැකිය.

**නිපාත භේදය හා වර්ග භේදය.**

ඉතිවුත්තක පාළිය ප්‍රධාන වශයෙන් නිපාත සතරකට බෙදා ඇත එකක, දුක, තික, චතුක්ක වශයෙන් එකී නිපාතයන් පිළිවෙළින් හඳුන්වනු ලැබේ. එකී නිපාතයන්හි සූත්‍ර දේශනාවන් සංගෘහිත වී ඇත්තේ එම සූත්‍ර දේශනාවන්ට අයත් මාතෘකා ධර්මයන්ගේ සංඛ්‍යාව ඒ ඒ නිපාතයන්ගේ සංඛ්‍යා නියමය හා ගැළපෙන තරමිනි. අනතුරුව එම නිපාතයන් වර්ගයන්ට ද බෙදා ඇත මේ වර්ගයන් පිළිවෙළින් නම් කොට ඇත්තේ පඨම, දුතිය ආදි වශයෙනි. වර්ගයන් කිසියම් රීතියක් අනුව සකස්වූ බවක් නො පෙනේ. නිපාතයෙන් නිපාතයට වර්ගයන්ගේ ගණන වෙනස්වූ බව පමණක් කිව හැකිය. එහෙත් නිපාතයන් මෙන් වර්ගයන් ද සංඛ්‍යා වශයෙන් ක්‍රමයෙන් වැඩෙන පිළිවෙළක් අනුව වෙනස් වීය යි නො කිව හැකි ය.

එකක නිපාතයෙහි පඨම, දුතිය, තතිය යනුවෙන් වර්ග තුනකි. දුක නිපාතයෙහි පඨම, දුතිය වශයෙන් වර්ග දෙකකි. තික නිපාතයෙහි පඨම. දුතිය, තතිය, චතුත්ථ, පඤ්චම යනුවෙන් වර්ග පසකි. චතුක්ක නිපාතයේ වර්ග භේදයක් නොමැත

**වර්ගයනට අයත් සූත්‍ර සංඛ්‍යා.**

නිපාතවල හෝ වර්ගවල හෝ වෙන වෙනම සංගෘහීත වී ඇති සූත්‍ර සංඛ්‍යාවන් පිළිබඳව ද එකම රීතියක් අනුගමනය කළ බවක් නොපෙනේ. එකක නිපාතයේ මුල් වර්ග දෙකෙහි වෙන වෙනම සූත්‍ර දසය බැගිනුත් තෙවැනි වර්ගයෙහි සූත්‍ර හතකුත් යනුවෙන් සූත්‍ර විසිහතක් ඇතුළත් ය. දුක නිපාතයට අයත් වර්ග දෙකෙහි පිළිවෙළින් සූත්‍ර දසයකුත් දොළොසකුත් යනුවෙන් සූත්‍ර විසිදෙකක් ඇතුළත්ය.

සූත්‍ර දසය බැගින් සමන්විත වර්ග පසකින් යුත් තික නිපාතයෙහි මුළු සූත්‍ර ගණන පනසක් ය. වර්ග භෙදයක් නොමැති චතුක්ක නිපාතය සූත්‍ර තෙලෙසකින් යුක්ත ය. මෙසේ ඉතිවුත්තක පාළියෙහි සම්පූර්ණ සූත්‍ර ගණන එකසිය දෙළොසක් වන්නේ ය.

**ගද්‍ය පද්‍ය දෙකොටස අතර සම්බන්ධය.**

මෙහි ඇතුළත් ගද්‍ය හා පද්‍ය කොටස් අතර පවත්නා සම්බන්ධය කෙබඳු දැයි සලකා බලන කල, ඇතැම් තැනක මේ දෙ කොටස එකිනෙකට බොහෝ සෙයින් ගැළපෙන බවත්, අන් තැනක අන්‍යොන්‍ය විසදෘශබ්ධය ඇති බවත්, මැනවින් පැහැදිලි වන්නේ ය. මෙයින් පළමුව කී පිළිවෙළේ සම්බන්ධයට නිදසුන් වශයෙන් ඒකක නිපාතයෙහි ප්‍රථම වග්ගයේ එන සූත්‍ර දසයම දැක්විය හැකිය. මෙහි මුල් සූත්‍ර සයේ ගද්‍ය පද්‍ය දෙකොටස අතර සවල්ප මාත්‍ර වෙනසක් ලෙස පෙන්විය හැක්කේ 'එක ධම්මං භික්ඛවෙ පජහථ' යනුවෙන් ගද්‍ය කොටසෙහි සඳහන් කොට ඇති නියෝගය පද්‍යයෙහි අවිද්‍යමාන වීම ය. මේ සුළු වෙනස හැරුණු විට එම සූත්‍රවල ගද්‍ය පද්‍ය දෙකොටස් අතර ඉතා කිට්ටු සම්බන්ධයක් පවත්නේය යි පිළිගත යුතු ය.

එහෙත් දුක නිපාතයෙහි දුතිය වග්ගයේ එකොළොස් වැනි සූත්‍රයේ සඳහන් පරිදි ගද්‍යයෙන් ප්‍රකාශිත වන කරුණ පද්‍යයෙන් ද එලෙසින්ම ප්‍රකාශ නො වන්නේ ය. අවගුණ දෙකක් දුරු නොකොට අපායගාමී වන නිරයගාමී වන තැනැත්තන් දෙදෙනකු මෙම සූත්‍රයේ ගද්‍ය කොටසෙහි හඳුන්වා ඇත. එනම් තමන් බ්‍රහ්මචාරී නොවී බ්‍රහ්මචාරීයයි ලොවට ප්‍රකාශ කරන තැනැත්තාත්, සමකු බ්‍රහ්මචර්‍යාව නියම ලෙස රකිද්දීත් අමූලික චෝදනාවක් ඔහුට විරුද්ධව නැගීමෙන් අබ්‍රහ්මචර්‍යාවෙන් යුක්තවූවකුය යි කියමින් ඔහු වෙහෙසවන තැනැත්තාත් යන මේ දෙදෙනා ය. එහෙත්, පද්‍ය කොටසෙහි සඳහන් කොට ඇත්තේ අනුන් සම්බන්ධයෙන්

නැති දෙස් බොරුවට කියාපාන්නා ද සමක් කර පසුව එය තමන් නොකෙළේය යි කියන්නා ද යන පුද්ගලයන් දෙදෙනා ගැන ය.

එසේම තිකනිපාතයට අයත් පඨම වග්ගයේ නොවැනි සූත්‍රයෙහි ගද්‍ය කොටසෙහි 'සුඛ', 'දුක්ඛ'. 'අදුක්ඛමසුඛ' යනුවෙන් 'වේදනා' තුන් ජාතියක් ගැන සඳහන් වන නමුත් එහි පද්‍යකොටසින් වේදනාවන්ගේ සංඛ්‍යා නියමයක් ගැන නො කියවේ ඒ වෙනුවට එහි ප්‍රකාශ වනුයේ යම් කිසි බුද්ධශ්‍රාවකයකු වේදනා ද, වේදනාවන්ගේ සම්භවය ද, වේදනාවන්ගේ නිරොධය ද, වේදනාවන්ගේ නිරොධගාමිණී මාර්ගය ද දැන වේදනාවන් ක්ෂය කෙළේ නම් ඔහු පිරිනිවියාවූ පුද්ගලයකු වන බව ය. මේ ක්‍රමයට එම වග්ගයේ පස් වැනි හා සත් වැනි සූත්‍රවල 'එසනා' ජාති තුනක් ගැන ද 'ආසව' ජාති තුනක් ගැන ද පිළිවෙළින් සඳහන් වෙතත් ඒ හා සම්බන්ධ පද්‍ය කොටස්වලින් කියවෙනුයේ චතුරාර්‍ය්‍යසත්‍ය තයින් 'එසනා' ද, 'ආසව' ද දත යුතු බව ය එම වග්ගයේ නව වැනි සූත්‍රයේ ගද්‍ය කොටසෙහි 'කාම තණ්හා', 'භව තණ්හා', 'විභව තණ්හා' යනුවෙන් තණ්හාවේ ප්‍රභේද තුනක් දක්වෙතත් පද්‍ය කොටසෙහි සඳහන් කොට ඇත්තේ තණ්හායොගයෙන් ප්‍රතිබද්ධ සත්වයන් ජාතියෙන් ජාතියට යෙමින් සසර දික් කර ගන්නා බව හා තණ්හාව නැසුවාවූ යම් කෙනෙක් වෙත් නම් ඔවුහු ක්ෂීණාශ්‍රව පුද්ගලයෝම වන බවත් ය.

තවද තිකනිපාතයේ තතිය වග්ගයේ තෙවැනි සූත්‍රයෙහි ගද්‍ය කොටසින් දෙවිවරුන් කලින් කල ශබ්ද පූජා පවත්වන අවස්ථා තුනක් ගැන කියවෙ එම අවස්ථා නම්: ආර්‍ය්‍යශ්‍රාවකයකු කසාවත් පොරවා පැවිදිවීමට කල්පනා කරන අවස්ථාව, ආර්‍ය්‍යශ්‍රාවකයකු සත් බොධිපාක්ෂික ධර්මයන් පිළිබඳව භාවනානුයොගීව කල් යවන අවස්ථාව හා ආර්‍ය්‍යශ්‍රාවකයකු ආශ්‍රවක්ෂය කිරීමෙන් නිවන් පසක් කොට වාසය කරන අවස්ථාව යන මේ තුනය. එහෙත් පද්‍ය කොටසින් ප්‍රකාශ

වනුයේ මාරසේනා පරාජය කළා වූ ක්ෂීණාශ්‍රව වූ බුද්ධ ශ්‍රාවකයාට දෙවිවරු ද නමස්කාර කරති යන සාමාන්‍ය විස්තරයකි.

ගද්‍ය හා පද්‍ය කොටස්වල අදහස් එකිනෙක හා ගැටෙන අවස්ථා මෙහි විද්‍යමාන වන බව මොරිස් වින්ටනිට්ස් මහතා ද පිළිගත් කරුණකි [36] තවද සූත්‍ර වශයෙන් වෙනම හැඳින්විය හැකි ඇතැම් ගද්‍ය කොටස් ද මෙහි දුර්ලභ නොවේය යි පවසන ඒ මහතා එකී ගද්‍ය කොටස්වලට අන තුරුව දැක්වෙන පද්‍යයන් ඒ හා ඇත කෙතරම් සම්බන්ධයක් දරන්නේදැයි කියතොත් එම සම්බන්ධය ඇතැම් විට වචනවල සමානලක්ෂණ උඩ පමණක් ඇතිවූවකැයි ද සඳහන් කොට ඇත. [37] හෙත් සාමාන්‍ය වශයෙන් සලකන කල ගද්‍ය යෙහිත් පද්‍යයෙහිත් අධ්‍යාශය එකක්ම වන අතර පද්‍යයෙන් අදහසක් ප්‍රකාශ කෙරෙනවාට වඩා පැහැදිලි ලෙසත් වඩා උචිත ලෙසත් වඩා මනොඥ ලෙසත් ගද්‍යයෙන් එය ප්‍රකාශ කෙරෙන අවස්ථා මෙහි විරල නොවේය යි ද වින්ටනිට්ස් මහතා පවසා ඇත [38]

යට දැක්වුණු විස්තරයෙන් පෙනී යන්නේ ඉතිවුත්තක පාළියෙහි ඇතුළත් ගද්‍ය දේශනාපාඨයනට පටිච්චවුත්ත' කොටස් වශයෙන් ඈඳ ගෙන ඇති පද්‍ය කොටස්වල අරුත්, මාතෘකාවන ධර්මය අතින් එකී ගද්‍ය කොටස් හා එකිනෙකට ප්‍රතිපක්ෂවීම කලාතුරකින් සිදුවූ බවත් එම ධර්මය මූර්තිමත් කිරීමේදී උපයෝගී කරගන්නාලද මූලික කරුණුවල සංඛ්‍යා නියමය අනුව නම් එය බහුලව සිදු වූ බවත් ය.

### විෂමතාවයන්

මූලික කරුණුවල සංඛ්‍යා නියමය අනුව පරස්පරකම් දැක්විය හැක්කේ ගද්‍ය පද්‍ය කොටස් අතර පැවැති සම්බන්ධය උඩ පමණක් නොවේ. ඉතිවුත්තක සූත්‍රදේශනාවල ඇතුළත් මූලික කරුණු ද ඇතැම්විට ඒවා සංග්‍රහ වී ඇති නිපාතවල සංඛ්‍යා නියමය හා ප්‍රතිපක්ෂ වේ. මෙයට නිදසුනක් වශයෙන්

තිකනිපාතයේ පඤ්චම වග්ගයේ එන තෙවැනි සූත්‍රය දැක්විය හැකිය. මෙහි ඇතුළත් විස්තරය පුද්ගලයින් දෙදෙනකු පිළිබඳ එකකි. තමන් ධර්මය නො දැකීම හේතුකොට ගෙන බුදුන් නොදකින පුද්ගලයාත්, තමන් ධර්මය දැකීම හේතු කොටගෙන බුදුන් දකින පුද්ගලයාත් ගැන කරුණු මෙහි සඳහන් වේ. මින් පළමුවැන්නා බුදුන්ගේ සිවුරු කොණ අතින් අල්ලා ගෙන බුදුන් පසුපස ගමන් කළ ද සර්ව ලක්ෂණ හේතුකොටගෙන බුදුන්ගෙන් බොහෝ සේ ඈත් වූවකු යයි ද, දෙවැන්නා යොදුන් සියයක් ඈතින් විසුව ද සර්ව ලක්ෂණ අනුව බුදුන්ට ඉතාම ළං වූවකු යයි ද මෙහි ප්‍රකාශ වේ. මෙයට මාතෘකා වූ ධර්මකාරණාවල සංඛ්‍යා නියමය අනුව මෙකී සූත්‍රය වඩා ගැළපෙනුයේ තිකනිපාතයට නොව දුක නිපාතයට ය. චීන ඉතිවෘත්තකයෙහි නම් මෙය තිකනිපාත යට අයත් සූත්‍ර දේශනා අතර සංග්‍රහ වී නොමැත. ඊට හෙතුව මාතෘකා වූ ධර්මයන්ගේත් නිපාතයේත් සංඛ්‍යා නියමය පිළිබඳ පරස්පරවිරොධයම වන්නට බැරි නැත.

මෙවැනි පරස්පර විරොධතාවන්ගෙන් ගහන තවත් සූත්‍ර දේශනාවක් ලෙස චතුක්ක නිපාතයට අයත් පස් වැනි සූත්‍රය දැක්විය හැකිය. එහි ගුණ ධර්ම කීපයකින් සමන්විත භික්ෂුවකගේ දැක්ම ද මහොපකාර වන බව සඳහන් වේ. එකී ගුණධර්මයන් පිඬුකොට ගත් කල පහක් බව පෙනේ. එනම් සීලසම්පන්න වීම, සමාධිසම්පන්න වීම, ප්‍රඥාසම්පන්න වීම, විමුක්ති සම්පන්න වීම හා, විමුක්ති ඥානදර්ශනසම්පන්න වීමත් ය. මෙකී ගුණ ධර්මයන්ගෙන් යුක්ත භික්ෂුවක් සෙවනය කරන ආශ්‍රය කරන තැනැත්තාගේ ද අසම්පූර්ණ වූ එකී ගුණධර්මයන් සම්පූර්ණ වන්නේය යි ද එහි පිළිවෙළින් කියවේ. ඉතිවුත්තක පාළියෙහි පඤ්චක නිපාතයක් නො මැති හෙයින් චතුක්ක නිපාතයෙහි මේ සූත්‍රය සංග්‍රහ වූයේ දැ යි කිව නොහේ. මෙය ද චීන ඉතිවෘත්තකයට ඇතුළත් වී නොමැත. චතුක්කනිපාතයෙහි නවවැනි සූත්‍රය ද එහි සඳහන් මූලික කරුණු අනුව වඩාත් ගැළපෙනුයේ දුකනිපාතයට ය. මේ

නිගමනය යුක්තිසහගතය යි කිව හැක්කේ ධම්මචින්තයෙන් ඇත් වූ ද ඇත් නුවූ ද භික්ෂූන් දෙවගීයක අඞ්ගලක්ෂණ, පුද්ගල භෙදයක් අනුව එහි සඳහන් වී ඇති හෙයිනි.

**පද්‍යයන්හි ඇතුළත් ඇතැම් ව්‍යාකරණ ලක්ෂණ**

ඉතිවුත්තක පාළියෙහි එකක, දුක, තික යන නිපාත යන්හි එන පද්‍යයන්ගෙන් බොහොමයක් එහි දක්වෙන ගද්‍ය කොටස්වලට වඩා පැරණි ලක්ෂණයන්ගෙන් යුක්ත ය යි විචාරකයෝ පවසති සමහර පදයන්හි ‘ලුද්ධාසෙ’ ‘දුට්ඨාසෙ,’ ‘මූළ්හාසෙ,’ ‘කුද්ධාසෙ,’ ‘මක්ඛාසෙ’ යනුවෙන් යෙදෙන බහු වචන ප්‍රථමාවිභක්ත්‍යන්ත මාගධික ප්‍රත්‍යයන් නිසා ද, කාලාතිපත්තියෙන් යෙදෙන ‘අගමිස්ස’ වැනි ක්‍රියා පද නිසා ද, ‘වෙය්‍යාකරණාය’ යනුවෙන් චතුර්ථියෙන් යෙදෙන විභක්ති ප්‍රත්‍යයන් නිසා ද, ඔව්හු මෙසේ නිගමනය කෙරෙති.

**පද්‍යයන්හි එන වෘත්තයන්**

මෙහි දක්වෙන පද්‍යයන් විරිත් තුනකින් ප්‍රබන්ධිත ය. එනම්: ශ්ලෝක, ත්‍රිෂ්ටුභ් හා ජගතී යන තුන ය පොතට අයත් සූත්‍ර එකසිය දොළොසින් අනූ අටකම සඳහන් පද්‍යයන් ප්‍රබන්ධිත වී ඇත්තේ ශ්ලෝකවෘත්තයෙන් බවත් අවශෙෂ සූත්‍ර තුදුසෙහි එන පද්‍යයන්ගේ පාද මුළුමනින්ම පාහේ ඉතිරි වෘත්ත දෙකින් එකකින් ප්‍රබන්ධිත බවත් **ජස්ටින් හාට්ලි මුවර්** මහතා ප්‍රකාශ කොට ඇත.[39]

**පුනරුක්ත ලක්ෂණ**

ඉතිවුත්තක පාළිය පුනරුක්තාර්ථ දෙෂයෙන් ද සම් ප්‍රකාරයෙන් නොමිදුණු ග්‍රන්ථයකි තිකනිපාතයෙහි පඤ්චම වග්ගයේ නවවැනි සූත්‍රයෙහි යුග වශයෙන් කරුණු තුනක් දක්වේ එනම් ‘ආමිසදාන’ **හා** ‘ධම්මදාන’, ‘ආමිසසංවිභාග’ හා ‘ධම්මසංවිභාග’, ‘ආමිසානුග්ගහ’ හා ‘ධම්මානුග්ගහ’ යනුයි. මෙකී කරුණුම යුග වශයෙන් දක්වෙන තවත් කරුණක් සමඟ චතුක්ක නිපාතයෙහි පළමුවැනි සූත්‍රයේ සඳහන් වී ඇත එහි අතිරෙක වශයෙන් එකතු කොට ඇති යුග්මධර්මය නම් ‘ආමිසයාග’ හා ‘ධම්මයාග’ යනුයි

එකම සූත්‍රය වචනයක පමණක් වෙනසක් ඇති කිරීමෙන් ද්විගුණ ත්‍රිගුණ වූ අවස්ථා ද මෙහි ඇත. එකක නිපාතයෙහි ප්‍රථම වර්ගයේ එන මුල් සූත්‍ර සය ද, තික නිපාතයෙහි ප්‍රථම වර්ගයේ තෙවැනි, පස්වැනි හා සත්වැනි සූත්‍රයන් ද මෙසේ ගුණකරණයෙන් අධික වූ සේ පෙනෙතත් එහි දැක්වෙන කරුණුවලින් කිසිවක් පර්‍යායපති ධර්මයට පටහැනියයි නො කිව හැකි ය.

**ත්‍රිපිටකයට අයත් වෙනත් සූත්‍ර දේශනාවන් හා මෙහි ඇති සම්බන්ධය.**

සූත්‍රදේශනාවන් සංග්‍රහ කොට ඇති ආකාරයෙනුත් එම දේශනාවන්හි අන්තර්ගත ධර්මයෙනුත් ඉතිවුත්තක පාළියෙහි එන සූත්‍ර දේශනා ත්‍රිපිටකයේ ඇතැම් කොටස් හා කිට්ටු සම්බන්ධයකින් යුක්ත බැව් පෙනේ. මෙහි දේශනා පාඨයනට වෙන වෙනම සම්බන්ධවන ත්‍රිපිටක ධර්ම කොටස් කවරේදැයි වින්ඩිෂ් මහතා තමන් පාළි ග්‍රන්ථ සමාගම සඳහා පිළියෙළ කළ ඉතිවුත්තක සංස්කරණයෙහි පිටුවෙන් පිටුවට ඇතුළත් කොට ඇති අධොලිපි අතර දක්වා ඇත.

ඉතිවුත්තක සූත්‍රදේශනා සංග්‍රහ වී ඇත්තේ මාතෘකා ධර්ම අනුව පිළිවෙළින් වැඩෙන සංඛ්‍යා නියමයක් උඩ ය. එනිසා එවැනිම ලක්ෂණයකින් හෙබියාවූ අංගුත්තර නිකායෙහි මෙන් මෙහි ද, සූත්‍රදේශනාවන් නිපාතවල සංගෘහිත වී ඇත. එහෙත් අංගුත්තර නිකායෙහි මෙන් නිපාත එකොළොසක් මෙහි නැත. ඇත්තේ එකක, දුක, තික, චතුක්ක වශයෙන් නිපාත සතරක් පමණකි.

අංගුත්තර නිකාය හා සම්බන්ධයක් මෙම සූත්‍රදේශනාවල විද්‍යමාන වනුයේ සංග්‍රහ නය පමණකිනැයි වරදවා නොගත යුතු ය. මෙහි චතුක්ක නිපාතයෙහි ඇතුළත් සූත්‍ර දේශනා කිපයක්ම අංගුත්තර නිකායෙහි එන චතුක්ක නිපාතයෙහි ඇතුළත් ඇතැම් සූත්‍ර කොටස් හා බොහෝදුරට සමානය. නිදර්ශන වශයෙන් ඉතිවුත්තක සූත්‍රදේශනා අතුරින් චතුක්ක

නිපාතයෙහි දෙ වැනි, ස වැනි, සත් වැනි, නවවැනි, එකොළොස් වැනි, දෙළොස් වැනි හා තෙළෙස් වැනි සූත්‍රයන් අංගුත්තර නිකායෙහි චතුක්ක නිපාතයට අයත් උරුවෙල වග්ගයේ සත් වැනි සූත්‍රය, භණ්ඩගාම වග්ගයේ නව වැනි සූත්‍රය, පත්තකම්ම වග්ගයේ තෙ වැනි සූත්‍රය, උරුවෙල වග්ගයේ සවැනි සූත්‍රය, චර වග්ගයේ පළමු වැනි සූත්‍රය චර වග්ගයේ දෙ වැනි සූත්‍රය හා උරුවෙල වග්ගයේ තෙ වැනි සූත්‍රය යන මෙකී සූත්‍ර කොටස් හා පිළිවෙළින් සම්බන්ධයයි සැලකිය හුතු ය එසේම තික නිපාතයෙහි පඨම වග්ගයේ මුල් සූත්‍රයේ ගද්‍ය කොටසින් ප්‍රකාශවෙන කරුණු අංගුත්තර නිකායෙහි තික නිපාතයට අයත් මහා වග්ගයේ නව වැනි සූත්‍රයේ ද සඳහන් වී ඇත.

ගද්‍ය පද්‍ය දෙකොටසින් ඉතිවුත්තක පාළිය සමන්විත වීම හේතුකොට ගෙන එක් අතකින් උදාන පාළිය හා සමාන වන්නේය යි ද සැලකිය හැක උදාන පාළියෙහි ඇතුළත් වන ගද්‍ය කොටස් උදාන ගාථාවන් වස්තු කොට ගෙනම ඒ ඒ සූත්‍රවල නිදාන වශයෙන් එකතු වී ඇත එහෙත් ඉතිවුත්තක පාළියෙහි ඇතුළත් වන ගද්‍ය කොටස් පද්‍ය කොටස්වල අරුත් තුළු ගැන්වීමට වදාරා ඇතැයි සැලකීම වෙනුවට ගද්‍ය කොටස්වලින් සඳහන් වන අරුත් වඩාත් සවිර කිරීමට පද්‍යයන් සම්බන්ධ කරගෙන ඇතැයි කිව හැකිය. ඉතිවුත්තක දෙශනා පාඨවලින් සමහරක් 'වුත්තං හෙතං භගවතා' යනු විසින් යෙදෙන පූර්ව පාඨයෙන් ඉතිවුත්තක නියායෙන් ම මහානිද්දෙසයෙහි ද සඳහන් වී ඇත.[40] එහෙත් එම දෙශනා පාඨයන් දැක්වීමේ දී ඉතිවුත්තක පාළිය පිළිබඳ නාම මාත්‍රයකුදු ඒ කිසිතැනක නොකියවේ.

**චීන ඉතිවුත්තකය.**

චීන ත්‍රිපිටකයෙහි සංගෘහීතව ඇති ඉතිවෘත්තක ධර්ම කොටස්‍යංශයන් ගැන අපට සාමාන්‍ය අවබොධයක් ලබාගත හැක්කේ කේ. වටනාබේ මහතා විසින් පවත්වනලද තුලනාත්මක පර්‍යේෂණානුසාරයෙනි.

**එහි නිපාත හා වර්ග භේදය**

වටනාබේ මහතා සඳහන් කොට ඇති පරිදි චීන **ඉතිවෘත්තක** සංග්‍රහය එකධම්මඛණ්ඩ, ද්විධම්මඛණ්ඩ, ත්‍රිධම්මඛණ්ඩ යනුවෙන් හැඳින්විය හැකි ප්‍රධාන කොටස් තුනකින් යුක්තය [41]. අනතුරුව මෙකී කොටස් වර්ගවලට ද බෙදා ඇත. එකධම්මඛණ්ඩයෙහි හා ද්විධම්මඛණ්ඩයෙහි වර්ග සතර බැගින් ඇති අතර ත්‍රිධම්මඛණ්ඩයෙහි වර්ග තුනක් පමණක් ඇත්තේය. මෙහි 'ධම්මඛණ්ඩ' යනුවෙන හැඳින්වෙන පදය පාළි ඉතිවුත්තකයේ 'නිපාත' යන පදය හා සැසඳේ.

**සූත්‍ර සංඛ්‍යාව**

චතු වර්ගික වූ එකධම්මඛණ්ඩයෙහි පළමු වැනි හා දෙ වැනි වර්ගයන්හි සූත්‍ර දොළොස බැගින්ද තෙ වැනි හා සිවු වැනි වර්ගයන්හි පිළිවෙළින් සූත්‍ර විසිතුනක් හා තෙළෙසක් ද යනුවෙන් සූත්‍ර සම සැටක් ඇතුළත්ය. එසේම චතුර්වර්ගික වූ ද්විධම්මඛණ්ඩයෙහි පළමු වැනි දෙ වැනි හා තෙ වැනි වර්ගයන්හි සූත්‍ර දොළොස බැගින් ද සිවුවැනි වර්ගයෙහි සූත්‍ර තුදුසක් ද යනුවෙන් සූත්‍ර පනසක් සංගෘහිත ය. ත්‍රිවර්ගික වූ ත්‍රිධම්මඛණ්ඩයෙහි පළමුවැනි දෙවැනි හා තෙවැනි වර්ගයන්හි පිළිවෙළින් සූත්‍ර තෙළෙසක් ද, දොළොසක්ද, තුනක් ද යනුවෙන් සූත්‍ර විසි අටක් සංගෘහිත ය. ධම්මඛණ්ඩත්‍රයෙහි ම මෙසේ ඇතුළත් වන මුළු සූත්‍ර සංඛ්‍යාව එකසිය තිස් අටකි

**චීන ඉතිවෘත්තකයත් පාළි ඉතිවෘත්තකයත් අතර සම්බන්ධය.**

සූත්‍ර සංඛ්‍යාව අනුව චීන ඉතිවෘත්තකය පාළි ඉතිවුත්තකයට වඩා ප්‍රමාණයෙන් විශාල වූවක් බව පෙනෙතත් පාළි ඉතිවුත්තකයෙහි එන සූත්‍ර දේශනා සියල්ලම එහි නිරවශෙෂයෙන් සංග්‍රහ වී නොමැත එවැනි අසංගෘහිත සූත්‍ර දේශනා ලෙස එකක නිපාතයෙන් එකකුත්, දුක නිපාතයෙන් දෙකකුත්, තික නිපාතයෙන් තිස් එකකුත්, චතුක්ක නිපාතයෙන් සියල්ලමත් – එනම් සූත්‍ර තෙළෙසකුත්

යනුවෙන් සූත්‍ර සතලිස්හතක් දැක්විය හැකිය.[42] මේ අනුව පාළිඉතිවුත්තක සූත්‍ර දේශනා අතුරෙන් හැට පහක් පමණ චීන ඉතිවෘත්තකයෙහි සංග්‍රහ වී ඇත.

ස්වරූප ලක්ෂණ අතින් ද චීන ඉතිවෘත්තකය පාළි ඉති-වුත්තකය හා සමානයයි වටනාබේ මහතා කියයි. එකී සූත්‍ර දේශනාවන් පාළියෙහි මූල් නිපාත දෙකේ ඇතුළත් සූත්‍ර දේශනාවන් හා කොතෙක් දුරට සමානදැයි කිවහොත් අක්ෂර පද ව්‍යඤ්ජන අතින් ද සදෘශ වන්නේයයි එම මහතා පවසයි.[43] තවද ඒ මහතා එහි ධම්මඛණ්ඩය ඌනලක්ෂණ යන්ගෙන් යුක්තය යි ද, ග්‍රන්ථාවසානයේ උද්දානයක් නොමැත්තේයයි ද සඳහන් කරයි.[44] එහෙත් සංස්කරණ දෙකෙහිම ගැණෙන සූත්‍රයන්ගේ ක්‍රම පිළිවෙළ අනුව මෙම සූත්‍ර දේශනාවන් එකම මූලාශ්‍රයකින් වැඩී දියුණු වීයයි සැලකීම එතරම් දුෂ්කර නොවෙතත් චීන සංස්කරණයෙහි සංගෘහීත වූ සූත්‍ර දෙශනාවන් අමුතු විස්තරයන්ගෙන් යුක්තව පළල්ව වැඩුණු ශෛලියකින් සමලඞ්කෘත වූ හෙයින් පෙළෙහි ඉතිවුත්තක සූත්‍ර දේශනා සංග්‍රහවුණු වකවානුවට වඩා මෑත යුගයකට චීන ඉතිවෘත්තකය අයත් වන්නේය යි ද එම මහතා වැඩි දුරටත් පවසා ඇත.[45]

**චීන සංස්කරණයේ කර්තෘවරයා.**

එකධම්මඛණ්ඩ, ද්විධම්මඛණ්ඩ, ත්‍රිධම්මඛණ්ඩ යනු විසින් සට හඳුන්වන ලද්දේ චීන වචන සංස්කෘතට නඟා ගැනීමේ දී වටනාබේ මහතා යෙදූ පාඨයන් ය. සංස්කෘත පාඨයන්ගෙන් මෙකී කොටස් හඳුන්වා ඇත්තේ චීන ඉතිවෘත්තකය ද මූල් සංස්කෘත පිටපතකින් පරිවර්තිත සංග්‍රහයකැයි සලකන හෙයිනි. චීන ඉතිවෘත්තකයේ පරිවර්තකයා වූයේ යවං - චවං නම් වූ සුප්‍රසිද්ධ වන්දනා-කාරයාය. යවං - චවං චීන බසට මෙය නඟාගත්තේ ක්‍රිස්තු වර්ෂ 650 දී යයි මෙම සංග්‍රහයෙහිම සඳහන් වී ඇත. මෙසේ චීන බසට නඟාගැන්මේදී සංස්කෘතෙන් රචිත සර්වාස්ති වාදීන්ගේ කිසියම් ඉතිවෘත්තක ග්‍රන්ථයක් ඔහු විසින් මූල් පිටපත වශයෙන් පිහිට කරගන්නට ඇතැයි සලකනු ලැබේ.

ආදියෙහි සංස්කෘතෙන් රචිතවූ ඉතිවෘත්තක ග්‍රන්ථයක් හෝ ඉන් කොටසක් හෝ මෙතෙක් සම්භව් නැති හෙයින් එකී මුල් පිටපතේ ස්වරූප කෙබඳු වී දැයි දැනගත හැක්කේ මේ චීන සංස්කරණය අනුසාරයෙන් පමණකි.

**නිපාත පිළිවෙළ උල්ලඞ්ඝනය වූ අවස්ථා.**

මෙසේ සංගෘහීත වූ දේශනා අතුරෙන් තික නිපාතයට අයත් පාළි සූත්‍ර තුනක් **චීන ඉතිවෘත්තකයෙහි** ද්විධර්මඛණ්ඩ-යෙහි ඇතුළත් කොට ඇත. එනම් තික නිපාතයෙහි ද්විතීය වග්ගයේ සිවු වැනි හා පස් වැනි සූත්‍රයනුත් පඤ්චම වග්ගයේ නව වැනි සූත්‍රයත් ය. මින් පළමුව සඳහන් සූත්‍ර දෙක නිපාත උල්ලඞ්ඝනයෙන් ද්විධර්මඛණ්ඩයට ඇතුළත් කිරීමේ යුක්තියක් නම් නො පෙනේ. එම සූත්‍රවලින් ප්‍රකාශ වන ධර්මකාරණා ද තිකනිපාතය හා සාකල්‍යයෙන් ගැළපේ.

පළමු සූත්‍රයෙන් අතීත, අනාගත, පච්චුප්පන්න යනුවෙන් අධ්ව තුනක් ගැන ද, දෙවැනි සූත්‍රයෙන් කායදුච්චරිත, වචීදුච්චරිත, මනොදුච්චරිත, යන ත්‍රිවිධ දුශ්චරිතයන් ගැන ද කරුණු දක්වා ඇති හෙයින් එම සූත්‍ර තික නිපාතයෙන් වෙනස් කොට ද්විධර්මඛණ්ඩයට ඇතුළත් කර ගත්තේ කවර සුදුසුකමක් නිසා දැයි නොකිව හැකිය. මේ සූත්‍ර දෙක ද්විධර්මඛණ්ඩයට සුදුසු වූයේ නම් ඊට අනතුරුව පාළියෙහි දක්වෙන සූත්‍රය ද එලෙසින් ම චීන ඉතිවෘත්ත-කයෙහි ද්විධර්මඛණ්ඩයෙහි ලා සංග්‍රහ නොකෙළේ මන්දැයි ප්‍රශ්නයක් ද මතුකළ හැකිය කුමක්හෙයින් ද යත්? එම සූත්‍රයෙහි ත්‍රිවිධ සුචරිතයන් ගැන කරුණු ප්‍රකාශවන බැවිනි. එහෙත් එම සූත්‍රය – එනම්, තිකනිපාතයෙහි ද්විතීය වග්ගයේ සවැනි සූත්‍රය, චීන ඉතිවෘත්තකයෙහි ත්‍රිධර්මඛණ්ඩයෙහි ලා ගැණෙන දෙවැනි වර්ගයෙහිම සංගෘහීත වී ඇත. චීන ඉතිවෘත්තකයට පිහිට කරගත්තා ලද මූල් පිටපත සංසකෘතයෙන් රචිත එකකැයි සලකන හෙයින් මෙකී දෝෂයත් එම මුල් පිටපතෙන් චීන සංස්කරණයට ඇතුළු වූයේ ද නැත්නම් චීන සංස්කාරකයාගේ අත්තනොමතය

අනුව සිදු වූයේදැයි මෙයට සම්බන්ධ චීන හා පාළි සූත්‍රදේශනා-වන් තුලනාත්මකව විභාග නොකොට නිශ්චය කිරීම උගහට ය.

චීන සංස්කාරකයා අභිධර්මඛණ්ඩයෙහි ලූ පාළි තික නිපාතයට අයත් තුන් වැනි සූත්‍රයෙහි යුග වශයෙන් ගැණෙන කාරණා තුනක් ප්‍රකාශිත ය. එම යුගනද්ධ කරුණු නම්: 'ආමිසදාන' හා 'ධම්මදාන', 'ආමිසසංවිභාග' හා 'ධම්ම සංවිභාග', සහ 'ආමිසානුග්ගහ' හා 'ධම්මානුග්ගහ 'යනුයි. යුග වශයෙන් මෙකී කරුණු මේ සූත්‍ර දේශනාවෙහි දක්වා ඇති හෙයින් චීන සංස්කාරකයා අභිධර්මඛණ්ඩයට එය වඩාත් උචිතය යි නිරණය කළා විය හැක. නො එසේ නම් සූත්‍රයෙහි එන ගාථාවල 'දාන' හා 'සංවිභාග' යන වචන දෙක පමණක් සඳහන්ව ඇති හෙයින් එකී පදයන් සලකා ගෙන එලෙසින් සංග්‍රහ කෙළේය යි ද සිතිය හැක. එනමුත් 'අනුග්ගහ' යන වචනය සූත්‍රයෙහි ගාථාවල කෙළින්ම සඳහන් නුවූවත් එම අරුත එහි වෙනත් වචනවලින් ප්‍රකාශිත වන හෙයින් මෙම සූත්‍රය අභිධර්මඛණ්ඩයෙහි ඇතුළත් කිරීම ගැන සංස්කාරකයා සුපරීක්ෂාකාරීව කටයුතු කොට ඇතැයි නො පැසසිය හැකිය.

### ඇතැම් සූත්‍ර චීන ඉතිවෘත්තකයේ සංග්‍රහ නොවීමට හේතු.

පාළි ඉතිවුත්තකයට අයත් සූත්‍ර සතලිස් සතක්ම චීන ඉතිවෘත්තකයෙහි සංග්‍රහ වී නැතැයි කලින් සඳහන් කරන ලදි. එසේ ලොප් කළ සූත්‍ර අතුරෙන් තික නිපාතයට අයත් සූත්‍ර තුනකුත් චතුක්ක නිපාතයට අයත් සූත්‍රයකුත් ගැන පමණක් චීන සංස්කාරකයා යුක්තියක් අනුව ක්‍රියා කර ඇතැයි සඳහන් කළ හැකි ය. ඔහුට එම සූත්‍ර දේශනාවන් ලොප් කිරීමට තුඩු දුන් කාරණය වන්නට ඇත්තේ එහි වෙන වෙනම ප්‍රකාශ වන මාතෘකා ධර්මයන් ඒවා සංග්‍රහවී ඇති නිපාතයන්ගේ සංඛ්‍යා නියමය හා නොගැළපීම ය. එම සූත්‍ර දේශනා අතුරෙන් දෙකක විද්‍යමාන වන පරස්පර විරෝධ ලක්ෂණ ගැන තරමක විස්තරයක් මෙයට කලින් ප්‍රකාශ කෙරිණ.[46]

චතුක්ක නිපාතයෙහි එන සූත්‍ර දේශනා සියල්ලමත් චීන සංස්කරණයෙන් ලොප් කරන්නට ද ඇත්තේ එම දේශනා පාඨයන් **අංගුත්තර නිකායෙහි** චතුක්ක නිපාතයට අයත් ඇතැම් සූත්‍ර කොටස් හා සමාන වන හෙයිනැයි සිතිය හැක එසේම **අංගුත්තර නිකායෙහි** එන මේ හා සමාන සූත්‍ර දෙශනාවල 'වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං' යන ප්‍රාරම්භ නිදාන පාඨයත් 'එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති' යන මධ්‍ය පාඨයත්, 'අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතං' යන අවසාන පාඨයත් නොයෙදෙන හෙයිනුත් ඉතිවුත්තක සූත්‍ර දේශනාවල පමණක් එසේ යෙදෙන හෙයිනුත් ඒවා ප්‍රතික්ෂෙප කිරීමට ප්‍රොත්සාහී වියයි ද සිතිය හැකිය එහෙත් යටකී 'වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං' යනාදී තුන් වැදෑරුම් පාඨයන් ඛුද්දක නිකාය පරියාපන්න සූත්‍ර දේශනයන්හි ලක්ෂණයක්ම වියයි සලකතොත් එකී පාඨයන් අංගුත්තර නිකායෙහි නොයෙදුණු තරමින් මුළු සූත්‍රයම අංගුත්තර නිකායෙන් පසුකලක ඉතිවුත්තක සූත්‍ර දේශනා අතරට වැද්ද ගන්නා ලදැයි සිතාගෙන එය ප්‍රතික්ෂෙපකිරීම කිසිසේත් ප්‍රඥාගොචර නොවේ

තවද ඉතිවුත්තක පාළියෙහි එන සූත්‍ර දේශනාවන් මුඛපරම්පරානුසාරයෙන් ඛුජ්ජුත්තරාවන්ගෙන් භික්ෂූන් අතට පත් ධර්ම දායාදයක් වශයෙන් සැලකූ අනඳ මහතෙරුන් විසින් එම දේශනාවන් ප්‍රථම සංගායනාවේ දී සූත්‍රාරූඪ කෙරිණැයි විශ්වාස කරතොත් එම දේශනාවල ප්‍රතික්ෂෙප කළ යුතුයයි දැක්විය හැකි කිසිවක් නොමැති බැවි පිළිගත හැකිය වෙනසක් වශයෙන් කළ හැක්කේ සූත්‍රයක අවිරොධ ලක්ෂණයන් මඟහරවා ගැනීම සඳහා එය නුසුදුසු නිපාතයක සංග්‍රහවී තිබේ නම් ඉන් එය මුදා ඊට අනුකූල වූ නිපාතයක සංග්‍රහ කිරීම පමණකැයි කිව හැකිය

එච්. ඇස්. කූරේ

# අධෝලිපි

1. **සමන්තපාසාදිකා**: (සයිමන් හේවාවිතාරණ ග්‍රන්ථ මාලාවේ 28 වැනි පොත, ප්‍රථම භාගය) 16 වැනි පිටුව.
2. Ernst Windisch: Itivuttaka, 124 වැනි පිටුවේ 10 වැනි අධෝලිපිය.
3. **මිලින්ද ප්‍රශ්නය**: (බාණගල ශ්‍රී රේවත ඤාණරතන නායක ස්ථවිරයන් වහන්සේගේ සංස්කරණය), 115 වැනි පිටුව.
4. **පපඤ්චසූදනී**: (සයිමන් හේවාවිතාරණ ග්‍රන්ථමාලාවේ 44 වැනි පොත, ද්විතීය භාගය), 88 වැනි පිටුව.
5. **අංගුත්තරනිකාය**: චතුක්කනිපාත, යොධාජීවවග්ග, 6 වැනි සූත්‍රය.
6. **මජ්ඣිමනිකාය**: මූලපණ්ණාස, තතියවග්ග අලගද්දූපම සූත්‍රය.
7. **අංගුත්තරනිකාය**: පඤ්චක නිපාත, සද්ධම්මවග්ග, 5 වැනි සූත්‍රය.
8. **සුත්තවිභඞ්ග**: වේරඤ්ජකණ්ඩ, සික්ඛාපදපඤ්ඤත්තියාචනකථා
9 **මජ්ඣිමනිකාය**: මූලපණ්ණාස, චතුත්ථවග්ග, 8 වැනි සූත්‍රය.
10. **මජ්ඣිමනිකාය**: මූලපණ්ණාස, තතියවග්ග, 2 වැනි සූත්‍රය.
11. **සංයුත්තනිකාය**: ඛන්ධසංයුත්ත, නකුලපිතුවග්ග, 3 වැනි හාලිද්දිකානි සූත්‍රය.
12. **සාරත්ථදීපනී** බිහල්පොල සිරි දේවරක්ඛිත නායක ස්ථවිරයන් වහන්සේගේ සංස්කරණය), 80 වැනි පිටුව.
13. Pralhad Pradhan: Abhidharma - samuccaya (Visva Bharati studies, 12), 78 වැනි පිටුව.

14. Bu-ston: The Jewelry of Scripture, 33 වැනි පිටුව.

15. Abhidhamasamuccaya ඉහත සඳහන් සංස්කරණය 79 වැනි පිටුව.

16. **සුමඞ්ගලවිලාසිනී**: (සයිමන් හේවාවිතාරණ ග්‍රන්ථ මාලාවේ, හෙයියන්තුඩුවේ ධම්මකිත්ති සිරි දෙවමිත්ත නායක ස්ථවිරයන් වහන්සේගේ සංස්කරණය), ප්‍රථම භාගය, 11 වැනි පිටුව.

17. **මජ්ඣමනිකාය**: මූලපණ්ණාස, පඨමවග්ග, 3 වැනි ධම්මදායාද සුත්‍රය.

18. **මජ්ඣිමනිකාය**: මූලපණ්ණාස, තතියවග්ග 8 වැනි මහාහත්ථිපදොපම සුත්‍රය.

19. **අංගුත්තරනිකාය**: දසක නිපාත, මහා වග්ග, 26 වැනි සුත්‍රය.

20. **අංගුත්තරනිකාය**: ඡක්ක නිපාත, මහාවග්ග, 7 වැනි සුත්‍රය

21. **සංයුත්තනිකාය**: ඛන්ධසංයුත්ත, නකුලපිතුවග්ග, 3 වැනි හාලිද්දිකානි සුත්‍රය. 11 වැනි අධොලිපිය බලන්න.

22 **මජ්ඣිමනිකාය**: උපරිපණ්ණාස, අනුපදවග්ග, 4 වැනි සුත්‍රය.

23. **මිලින්දපඤ්හා**: (මාතර කිතුලෙවෙල ආචාර්ය පියරතන ස්ථවිරයන් වහන්සේ හා ආචාර්ය කඹුරුපිටියේ ගුණරතන නායක ස්ථවිරයන් වහන්සේත් විසින් සංශොධිත සංස්කරණය), 320 වැනි පිටුව.

24 එම, 294 වැනි පිටුව.

25 එම, 295 වැනි පිටුව.

28. එම, 321 වැනි පිටුව.

27. Itivuttaka (ඉහත සඳහන් සංස්කරණය), Preface, vi වැනි පිටුව.

28. **ඉතිවුත්තකපාළි**: තිකනිපාත, චතුත්ථ වග්ග, 3, 5, 6, 7, වැනි සූත්‍ර සහ පඤ්චමවග්ග, 6, 8, 9 වැනි සූත්‍ර.

29. **ඉතිවුත්තකට්ඨකථා** (සයිමන් හේවාවිතාරණ ග්‍රන්ථ මාලාවේ 28 වැනි පොත), 18 වැනි පිටුව.

30. එම, 16 වැනි පිටුව.

31. එම, 17 වැනි පිටුව.

32. **මජ්ඣිමනිකාය**: උපරිපණ්ණාස, සුඤ්ඤතවග්ග, 3 වැනි සූත්‍රය

33 **සංයුත්තනිකාය**: ඛන්ධසංයුත්ත, ථෙරවග්ග, 8 වැනි සූත්‍රය

34 **මජ්ඣිමනිකායට්ඨකථා**: (ඉහත සඳහන් සංස්කරණය), 22 වැනි පිටුව.

35. එම, 25 වැනි පිටුව.

36. Winternitz: A History of Indian Literature, II වැනි කාණ්ඩය, 92 වැනි පිටුව.

37. එම, 92 වැනි පිටුව.

38. එම, 8 වැනි පිටුව.

39 Journal of The American Oriental Society, 28 වැනි ශාස්ත්‍රීය සඟරාවෙහි Metrical Analysis of The Pali Itivuttaka, A Collection of Discourses of Buddha යන මැයෙන් යුත් ලිපියෙහි 317 වැනි පිටුවේ පටන් 330 වැනි පිටුව දක්වා.

40 මහානිද්දෙස: කාමසුත්තනිද්දෙස, තුවටකසුත්තනිද්දෙස, සාරිපුත්තසුත්තනිද්දෙස, ගුහට්ඨකසුත්තනිද්දෙස, මහාවියූහසුත්තනිද්දෙස.

41. Journal of The Pali Text Society, වර්ෂ 1906 – 1907 ශාස්ත්‍රීය සඟරාවෙහි A Chinese Collection of Itivuttakas යන මැයෙන් යුත් ලිපියෙහි 44 වැනි පිටුව.

42. එකක නිපාතයෙහි තතිය වග්ගයේ 2; දුක නිපාතයෙහි පඨම වග්ගයේ 10, දුතිය වග්ගයේ 4; තික නිපාතයෙහි පඨම වග්ගයේ 1 – 9, දුතිය වග්ගයේ 2, 7, 8, 9, 10, තතිය වග්ගයේ 1, 2, 3, 4, 6, 8, චතුත්ථ වග්ගයේ 2, 4, 8, 9, 10, පඤ්චම වග්ගයේ 2, 3, 4, 5, 7, 10; චතුක්ක නිපාතයෙහි 1 — 13;

43. ඉහත සඳහන් ලිපිය, 45 වැනි පිටුව.

44 එම, 45 වැනි පිටුව

45 එම, 48 වැනි පිටුව.

46 විෂමතාවයන් යන ශීර්ෂය යටතේ දැක්වෙන විස්තරය බලන්න

# ඉතිවුත්තක සූත්ත සූචි


| විෂය | | පිට |
|---|---|---|

## එකක නිපාතය

### පළමුවන වර්ගය

| | | |
|---|---|---|
| 1. ලෝභ සූත්‍රය | | 1 |
| 2. දෝස | ,, | 13 |
| 3 මෝහ | ,, | 17 |
| 4. කෝධ | ,, | 19 |
| 5. මක්ඛ | ,, | 20 |
| 6. මාන | ,, | 22 |
| 7 සබ්බපරිඤ්ඤා | ,, | 23 |
| 8. මාන පරිඤ්ඤා | ,, | 27 |
| 9. ලෝභ පරිඤ්ඤා | ,, | 28 |
| 10. දෝස පරිඤ්ඤා | ,, | 29 |

ප්‍රථම වර්ගය සමාප්ත යි.

### ද්විතීය වර්ගය

| | | |
|---|---|---|
| 1. මෝහපරිඤ්ඤා | | 32 |
| 2. කෝධපරිඤ්ඤා | | 32 |
| 3. මක්ඛ පරිඤ්ඤා | | 33 |
| 4 අවිජ්ජා නීවරණ | | 33 |
| 5. තණ්හාසංයෝජන | | 38 |
| 6. පඨම සෙඛ | | 40 |
| 7. දුතිය සෙඛ | | 45 |
| 8 සඞ්ඝභෙද | | 48 |
| 9 සංඝසාමග්ගි | ,, | 53 |
| 10. පදුට්ඨපුග්ගල | ,, | 54 |

දෙවෙනි වර්ගය සමාප්ත යි.

### තෘතීය වර්ගය

| | |
|---|---|
| 1. පසන්නචිත්ත | 58 |
| 2. මාපුඤ්ඤභායී | 59 |
| 3. උභො අත්ථ | 64 |
| 4. අට්ඨිපුඤ්ජ | 68 |
| 5 සම්පජානමුසාවාද | 71 |
| 6. දානසංවිභාග | 74 |
| 7. මෙත්තාචෙතොවිමුත්ති | 78 |

තෙවන වර්ගය සමාප්ත යි

එකක නිපාතය නිමි

## දුක නිපාතය

### පළමුවන වර්ගය

| | |
|---|---|
| 1. පඨම භික්ඛු | 84 |
| 2. දුතිය භික්ඛු | 88 |
| 3. තපනීය | 89 |
| 4. අතපනීය | 91 |
| 5. පාපකසීල | 92 |
| 6. භද්දකසීල | 94 |
| 7. අනාතාපී | 95 |
| 8. පඨම ජනකුහන | 97 |
| 9. දුතිය ජනකුහන | 101 |
| 10. සොමනස්ස | 102 |

පළමුවන වර්ගය සමාප්ත යි.

| විෂය | පිට |
|---|---|
| **දෙවන වග්ගය** | |
| 1. විතක්ක | 108 |
| 2 දෙසනා | 116 |
| 3. විජ්ජා | 118 |
| 4. පඤ්ඤාපරිහානි | 120 |
| 5. සුක්ක ධම්ම | 123 |
| 6. අජාත | 127 |
| 7. නිබ්බානධාතු | 131 |
| 8. පටිසල්ලාන | 136 |
| 9. සික්ඛානිසංස | 139 |
| 10. ජාගර | 143 |
| 11. ආපායික | 148 |
| 12. දිට්ඨිගත | 151 |
| **දෙවෙනි වග්ගය සමාප්ත යි** | |
| **දුකනිපාතය නිමි.** | |
| **තික නිපාතය** | |
| **පළමුවන වග්ගය** | |
| 1. අකුසල මූල | 156 |
| 2. ධාතු | 160 |
| 3. පඨම වෙදනා | 163 |
| 4. දුතිය වෙදනා | 171 |
| 5. පඨම එසනා | 174 |
| 6. දුතිය එසනා | 176 |
| 7. පඨම ආසව | 177 |
| 8 දුතිය ආසව | 178 |
| 9. තණ්හා | 179 |
| 10 මාරධෙය්‍ය | 181 |
| **ප්‍රථම වග්ගය සමාප්ත යි** | |

| විෂය | පිට |
|---|---|
| **දෙවන වග්ගය** | |
| 1. පුඤ්ඤකිරියවත්ථු | 183 |
| 2. චක්ඛු | 189 |
| 3. ඉන්ද්‍රිය | 192 |
| 4. අද්ධා | 196 |
| 5. දුච්චරිත | 200 |
| 6. සුචරිත | 201 |
| 7. සොචෙය්‍ය | 202 |
| 8. මොනෙය්‍ය | 203 |
| 9. පඨමරාග | 207 |
| 10. දුතියරාග | 209 |
| **දෙවෙනි වග්ගය සමාප්ත යි** | |
| **තුන්වන වග්ගය** | |
| 1. මිච්ඡාදිට්ඨිකම්ම-සමාදාන | 212 |
| 2. සම්මාදිට්ඨිකම්ම-සමාදාන | 214 |
| 3. නිස්සරණීය | 214 |
| 4. සන්තතර | 215 |
| 5. පුත්ත | 218 |
| 6. වුට්ඨි | 220 |
| 7. සුඛපත්ථනා | 222 |
| 8. භිදුර | 225 |
| 9. ධාතුසංසන්දන | 229 |
| 10. පරිහාන | 232 |
| **තුන්වන වග්ගය සමාප්ත යි** | |
| **සතරවන වග්ගය** | |
| 1. විතක්ක | 234 |
| 2. සක්කාර | 237 |

| විෂය | පිට |
|---|---|
| 3. දෙවසද්ද | 239 |
| 4. පුබ්බනිමිත්ත | 243 |
| 5. බහුජනහිත | 252 |
| 6. අසුභානුපස්සී | 255 |
| 7. ධම්මානුධම්ම පටිපන්න | 268 |
| 8. අන්ධකරණ | 271 |
| 9. අන්තරාමල | 274 |
| 10. දෙවදත්ත | 275 |

**සතරවන වර්ගය සමාප්ත යි**

**පස්වන වර්ගය**

| විෂය | පිට |
|---|---|
| 1. අග්ගප්පසාද | 280 |
| 2. ජීවිකා | 283 |
| 3. සංඝාටිකණ්ණ | 288 |
| 4. අග්ගි | 290 |
| 5. උපපරික්ඛ | 294 |
| 6. කාමූපපත්ති | 297 |
| 7. කාමයොග | 300 |
| 8. කල්‍යාණසීල | 306 |
| 9. දාන | 309 |
| 10. තෙවිජ්ජ | 312 |

**පස්වන වර්ගය සමාප්ත යි**

## චතුක්ක නිපාතය

| විෂය | පිට |
|---|---|
| 1. බ්‍රාහමණ | 318 |
| 2. චතුරනවජ්ජ | 322 |
| 3. ආසවක්ඛය | 325 |
| 4. සමණබ්‍රාහමණ | 329 |
| 5. සීලසම්පන්න | 331 |
| 6. තණ්හුප්පාද | 335 |
| 7. සබ්‍රහමක | 337 |
| 8 බහුකාර | 341 |
| 9 කුහ | 344 |
| 10. පුරිස පියරූප | 346 |
| 11 චර | 353 |
| 12. සම්පන්නසීල | 356 |
| 13. ලොක | 361 |

# ධම්මවිත්ථාරානුක්කමණිකා


අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා 198
අක්ඛෙය්‍ය සඤ්ඤිනො 198
අක්ඛෙය්‍යං ච පරිඤ්ඤාය 199
අකුසල මූල 157
අකුසලං පජහති 44
අග්ගස්මිං දතං දදතං 282
අජාතං අභූතං 128
අට්ඨ අනරිය වොහාර 73
අත්තානුවාදභය 126
අත්ථංගතො සො 211
අතීතො අද්ධා, අනාගතො අද්ධා, පච්චුප්පන්නො අද්ධා 197
අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවීන්ද්‍රිය 193
අනභිජානතය 26
අනවඤ්ඤත්ති පටිසංයුත්තො 235
අනාගාමිතාය 11
අනාගාමීනු 30
අනීඝං 100
අනුපබ්බජ්ජා 330
අනුපාදිසෙස 133
අප්පමාණං 82
අප්පමාණං නිරූපධිං 248
අප්පමාද 66
අප්පානි, සුලභානි, අනවජ්ජානි 323
අපරිජානතය 26
අභිජ්ඣා 357
අරියාය පඤ්ඤාය 121
අවිජ්ජානීවරණය 36
අවිජ්ජා පුබ්බංගමා i19
අවිරාජය 26
අස්සමෙධං 83
අසංඛ්‍ය කල්ප 314

| | |
|---|---|
| අසෙඛ සීලක්ඛන්ධ, සමාධික්ඛන්ධ, පඤ්ඤක්ඛන්ධ | 182 |
| ආගාමී, අනාගාමී, ඛීණාසව | 301 |
| ආතාපී, ඔත්තප්පී | 96 |
| ආදිකල්‍යාණං, මජ්ඣෙකල්‍යාණං, පරියොසානකල්‍යාණං | 253 |
| ආනාපානසති | 257 |
| ආසවානං ඛයා අනාසවං | 317 |
| ආසවානං ඛයාය | 103 |
| ආසවානං ච සම්භවං | 177 |
| ආහුනෙය්‍ය | 339 |
| ඉත්ථිභාවඤ්ඤථාභාව | 40 |
| ඉදං සච්චන්ති මඤ්ඤති | 122 |
| ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා | 86 |
| උජුමග්ගානුසාරිනො | 195 |
| උපධි | 226 |
| එකං ධම්මං අතීතස්ස | 72 |
| එකොදිභූතො | 147 |
| ඔපධිකං පුඤ්ඤං | 248 |
| ඔපධිකානි පුඤ්ඤකිරියවත්ථූනි | 80 |
| ඔසධිතාරකා | 81 |
| කතමං එකධම්මං | 12 |
| කම්මාරාමො | 233 |
| කල්‍යාණමිත්තතා | 46 |
| කල්‍යාණාධිමුත්තිකා | 230 |
| කල්‍යාණසීලො, කල්‍යාණධම්මො, කල්‍යාණපඤ්ඤො | 307 |
| කලං නාග්ඝන්ති සොළසිං | 80 |
| කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා, | 180 |
| කාමවිතක්ක, ව්‍යාපාදවිතක්ක, විහිංසාවිතක්ක | 272 |
| කාමෙසනා, භවෙසනා, බ්‍රහ්මචරියෙසනා | 175 |
| කායදුච්චරිතං, වචීදුච්චරිතං, මනොදුච්චරිතං | 200 |
| කායවිඤ්ඤාණ | 226 |
| කායසුචරිතං, වචීසුචරිතං, මනොසුචරිතං | 201 |
| කාලවිපස්සී ච කුසලෙසු | 145 |
| කාලං කංඛති | 227 |

කුසලං භාවෙති 44
කො න යජෙථ කාලෙ 310
චක්ඛුමන්තො ච පස්සන්ති 154
චරිමාලොපය 76
චවමානෙ, උපපජ්ජමානෙ, යථාකම්මූපගෙ සත්තෙ 317
ඡින්නසංසය 304
ජාගරස්ස භික්ඛුනො 146
ජාගරො 144
ජානතො, පස්සතො 326
ඤාණභය, සාරජ්ජභය 62
ත්‍රිවිද්‍යා 314
තණ්හාදුතිය 40
තණ්හායෙතං අධිවචනං 348
තණ්හා සංයොජන 38
තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ 246
තථාගතං 110
තනූ සංයොජනා හොන්ති 82
තපනීයා ධම්මා 90
තිට්ඨන්තෙව පඤ්චින්ද්‍රියානි 135
තීරණපරිඤ්ඤා 26
තීනි ඨානානි අනුමොදන්ති 246
ද්වෙ විතක්කා 112
ද්වෙෂය 13
දණ්ඩභය 126
දාන, දම, සංයම 64
දානමයං පුඤ්ඤකිරිය වත්ථු සීලමයං පුඤ්ඤකිරිය වත්ථු භාවනාමයං පුඤ්ඤකිරිය වත්ථු 183
දාන සංවිභාග 76
දිට්ඨධම්මික 65
දුක්ඛතො දට්ඨබ්බා, සල්ලතො දට්ඨබ්බා, අනිච්චතො දට්ඨබ්බා 172
දුග්ගතිභය 126
ධම්මදායාද-ආමිසදායාද 320

ධම්මානුධම්මපටිපන්න 269
ධම්දූතය 250
න මෙ තෙ භික්ඛවෙ 330
නයිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං 99
න සමනුපස්සාමි 35
නිද්දාරාමො 234
නිබ්බානධාතු 134
නිබ්බානොගධගාමිනං 101
නිබ්බිදාය - විරාගාය 155
නිබ්බින්දති, විරජ්ජති, විමුච්චති 117
නිබ්බෙධගාමිනී පඤ්ඤා 122
නිම්මානරතිනො 298
නීවරණ 36
නෙක්ඛම්මවිතක්ක, අව්‍යාපාදවිතක්ක, අවිහිංසා විතක්ක 274
පච්චුපට්ඨිතකාම 298
පජහති 11
පටිසල්ලානාරාමා 137
පරනිම්මිතවසවත්තිනො 299
පරානුද්දයතා පටිසංයුත්තො 236
පරානුවාදභය 126
පස්සතො උපධික්ඛයං 83
පහාන පරිඤ්ඤා 26
පංසුකූල - පූතිමුත්ත භෙසජ්ජ 324
පාපකෙන සීලෙන 93
පාපං පාපකතො පස්සති 117
පාපිකාය දිට්ඨියා 93
පුබ්බදෙව 340
පුබ්බාචරිය 339
බ්‍රහ්ම 338
බ්‍රහ්මචරිය 249
බ්‍රූහෙතාරො සුඤ්ඤාගාරානං 138
භද්‍රක දෘෂ්ටිය 94
භද්‍රක සීලය 94

අර්ථ භාව ධර්ම විස්තර සහිත වූ

# ඉතිවුත්තක පාළිය

**නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.**

## එකකනිපාතො

### පඨමො වග්ගො

**1 - 1 - 1**

**වුත්තං හෙතං** භගවතා, **වුත්තමරහතාති** මෙ සුතං. එකධම්මං භික්ඛවෙ පජහථ, අහං වො පාටිභොගො අනාගාමිතාය, කතමං එකධම්මං? ලොභං භික්ඛවෙ එකධම්මං පජහථ, අහං වො පාටිභොගො අනාගාමිතායාති එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

යෙන ලොභෙන ලුද්ධාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං ලොභං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචනන්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා **ඉති** මෙ **සුතන්ති**.

**අර්ථය**:-

**භගවතා**, භාග්‍යවතුන් වහන්සේ විසින්; **එතං**, මේ ධර්මය; **වුත්තං හි**, වදාරන ලද්දේ ම ය; **අරහතා**, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින්; **වුත්තං ඉති**, වදාරන ලද්දේය යනු; **මෙ**, මාගේ; **සුතං**, ඇසීම යි.

**භික්ඛවෙ**, මහණෙනි; **එකධම්මං**, එක් ධර්මයක්; **පජහථ**, දුරුකරව්; **අහං**, මම; **වො**, තොපට; **අනාගාමිතාය**, අනාගාමි මාර්ගය ලබනු සඳහා; **පාටිභොගො**, ඇප වෙමි; **කතමං එකධම්මං**, කවර එක් ධර්මයක් ද යත්? **භික්ඛවෙ**, මහණෙනි;

**ලොභං**, ලොභයවූ; **එකං ධම්මං**, එක ම ධර්මය; **පජහථ**, දුරු කරව්; **අහං**, මම; **වො**, තොපට; **අනාගාමිතාය**, අනාගාමි බැව් පිණිස; **පාටිභොගො ඉති**, ඇප වෙමි යනු යි;

**භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **එතං අත්ථං**, මේ කාරණ දේශනාව; **අවොච**, වදාළසේක; **තත්ථ**, එහි ලා; **එතං ඉති**, මේ යයි; **වුච්චති**, කියනු ලැබේ.

**යෙන ලොභෙන**, යම් ලෝභයකින්; **ලුද්ධාසෙ**, ලොභිවූ; **සත්තා**, සත්වයෝ; **දුග්ගතිං**, දුගතියට; **ගච්ඡන්ති**, යෙත් ද; **තං ලොභං**, ඒ ලොභය; **සම්මා**, මනාකොට; **අඤ්ඤාය**, දැන; **විපස්සිනො**, ප්‍රාඥයෝ; **පජහන්ති**, දුරු කෙරෙත්; **පහාය**, ලෝභය අත්හැර; **ඉමං ලොකං**, මේ පඤ්චස්කන්ධ සංඛ්‍යාත ලෝකයට; **කුදාචනං**, කිසි කලෙකත්; **පුන**, නැවත; **න ආයන්ති**, නො පැමිණෙත්;

**භගවතා**, භාග්‍යවතුන් වහන්සේ විසින්; **අයං අත්ථො අපි**, මේ මතු කියනු ලබන දේශනාව ද; **වුත්තො ඉති**, වදාරන ලද්දේ ය යනු; **මෙ**, මා විසින්; **සුතං ඉති**, අසන ලද්දේ ය යනු යි;

## ප්‍රාරම්භය

**එවං මෙ සුතං** යනු සූත්‍ර පිටකයෙහි ඇතුළත් සූත්‍ර යන්හි නිදානය බව ප්‍රකට කරුණෙකි. එසේ ද වුවත් **ඉතිවුත්තක** පාළියෙහි දක්නට ලැබෙන වෙනස නම් ප්‍රාරම්භයෙහිත් නිගමනයෙහිත් **ඉති මෙ සුතං** යනු යෙදීම ය. මෙහි අර්ථය "එවං මෙ සුතං" යන්නෙහි අර්ථය ම ය. කියන ලද කරුණ නැවතත් ප්‍රකාශ කිරීම නිගමනය යි. මෙය **ඛුජ්ජුත්තරා** උපාසිකාවන් විසින් කළ **ඉතිවුත්තක** දේශනායෙහි විශේෂ ලක්ෂණය බව පෙනෙයි. එයින් ම ඒ ආර්යශ්‍රාවිකාවගේ ප්‍රතිවේධ බහුශ්‍රැතත්වය ද පැහැදිලි වෙයි.

එහෙයින් කිහ අට්ඨකථාචාර්ය **භදන්ත ධම්මපාල** මහා ස්වාමිපාදයන් වහන්සේ විසින් තමන් වහන්සේගේ පරමත්ථදීපනී නම් **උදානට්ඨකථායෙහි**:—

"පුබ්බෙ **ඉති** මෙ **සුතං**ති නිදානවසෙන වුත්තො යෙව හි අත්ථො ඉධ නිගමනවසෙන **ඉති** මෙ **සුතං**තිපි පුන වුත්තො, වුත්තසෙසව හි අත්ථස්ස පුනවචනං නිගමනන්ති ඉති සද්දස්ස අත්ථුද්ධාරෙ එවං සද්දෙන සමානත්ථතාය **එවං මෙ සුතං**ති එත්ථ විය අත්ථයොජනා ච **ඉතිවුත්තක වණ්ණනාය** අම්හෙහි පකාසිතොයෙවාති" යි.

සූර්යෝදයෙහි අරුණෝද් ගමනය මෙන් බුද්ධ දෙශනා නමැති සූර්යයාගේ අරුණාලොකය වැනි වූ "ඉති මෙ සුතං" යන නිදානය **සුදුසු** තැන ප්‍රකාශ කරන ලද්දේ ය යනු "අරුණුග්ගමනං විය සූරියස්ස උදයතො භගවතො වචනස්ස පුබ්බඞ්ගමං හවිතුංති ඨානෙ නිදානං ඨපෙන්තො **ඉති** මෙ **සුතං**ති ආදිමාහ" යනු පරමත්ථදීපනී නම් වූ **ඉතිවුත්තකට්ඨකථායෙහි** කියන ලද්දේ ය.

"වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං" යන මේ නිදානයෙහි "වුත්ත" ශබ්දය දෙවරක් යෙදීම පුනරුක්ත දෝෂය නොවේදැයි මෙහිදී නැගිය හැකි ප්‍රශ්නයක් වෙයි. එයට පිළිතුරු නම්:— "අධිකවචනං හි අඤ්ඤමත්ථං බොධෙතීති න පුනරුත්තදොසො" යනු **පරමත්ථ දීපනියෙහි** දැක්වූ ලෙසින් "වුත්තං"යි දෙවරක් යෙදීම අනික් අර්ථයක් අවබෝධ කරවනු සඳහා ය. පළමු "වුත්තං" යන්නෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් ම ස්වයංභූඥානයෙන් අවබෝධ කළ ධර්මය මුත් අනිකක් නොවන බව හඟවයි. දෙවෙනි "වුත්ත" ශබ්දයෙන් පෙර බුදුවරයන් විසින් වදාළ ධර්මය ම අතීත්වූ ආර්ය සංඝයා විසිනුදු වදාරන ලදැයි හැඟවීම තවත් කරුණෙකි. "වුත්තං හෙතං භගවතා අරහතාතිපි වුත්තං" යනු ඒ සඳහා දැක්වූ අට්ඨකථා නය හෙයින් මෙහි පුනරුක්ත දෝෂයක් නැත්තේ ය.

මෙහි තවත් එක් අදහසක් නම්:— භාග්‍යවතුන් වහන්සේ විසින් ම මෙය වදාරන ලද්දේය එය උන්-වහන්සේ හැර අන්‍ය තීර්ථක ශාස්තෲවරයකු විසින් දෙසන ලද්දෙක් නොවේ. ආරංචි කථාවකින් අසාගෙනත් නොවේ යයි අනුශ්‍රව ප්‍රතික්ෂෙපය සඳහා නොහොත් ආරංචි කථාවක් නොවන බව ප්‍රකාශ කිරීම් වශයෙන් දක්වන ලදැයි යනු "වුත්තං හෙතං භගවතා, තං ච බො භගවතා ව වුත්තං, න අඤ්ඤෙන වුත්තම්ව සුතං" යන අටුවා වචනයෙන් පැහැදිලි වෙයි.

තව ද වෛනෙයජනයන්ගේ අදහස්වලට අනුකූලව හේතු යුක්ති සහිතව වදාළ දේශනාවක් හෙයින් ද අන් කිසි මහණ බමුණකු විසින් මෙසේ නොපැවැත්විය හැකි හෙයින් ද මෙහි ස්ථිරත්වය දක්වනු සඳහා "වුත්ත" ශබ්දය දෙවරක් කියනලදි. එසේම අසන්නවුන්ට හොඳින් අර්ථාවබෝධය කර ගැනීමට දේශනාව දැඩිකොට දක්වනු සඳහා ද 'වුත්ත" ශබ්දය දෙවරක් කියනලදි. එසේම භාග්‍යවතුන් වහන්සේගෙන් අසාගත් ධර්මය නැවත ආර්ය ශ්‍රාවිකාවක් විසින් ප්‍රකාශකළත් භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවු පිරිසට ම සාධාරණ වන හෙයින් ඒ සිවු පිරිස විසින් ම අසා පිළිගෙන පිළිපදිමින් ලෞකික ලෝකෝත්තර අර්ථසිද්ධිය සලස්වා ගත යුතු බව ප්‍රකාශ කරනු සඳහා ද "වුත්ත" ශබ්දය දෙවරක් කියනලදි.

මෙසේ අත්‍යර්ථදීපක "වුත්ත" ශබ්දය පුනරුක්තයක් නොවන බවට අර්ථකථායෙහි සාධක දක්වා තිබේ. මේ ඉතිවුත්තක නිදානය ම ධර්මභාණ්ඩාගාරික ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේ පිළිගෙන බුද්ධපරිනිර්වාණයෙන් තෙමස-කින් ආයුෂ්මත් අනුබුද්ධ **මහාකාශ්‍යප** මහරහතන් වහන්සේ ප්‍රධාන පන්සියයක් මහරහතුන් මැද ප්‍රථම ධර්මසංගායනා වෙහිදී ම ඉදිරිපත් කළහ.

**ඉතිවුත්තකය** වනාහි එකක නිපාතය, දුකනිපාතය, තිකනිපාතය, චතුක්කනිපාතය යි නිපාත සතරෙකින් සංග්‍රහවූයේ වේ. මෙය විනයපිටකය සුත්තන්තපිටකය අභිධම්මපිටකය යන පිටකත්‍රය ධර්මයන් අතුරෙහි සුත්තන්තපිටකයට ඇතුළත් වේ. දීඝනිකාය, මජ්ඣිම නිකාය, සංයුත්තනිකාය, අඞ්ගුත්තරනිකාය, ඛුද්දකනිකාය යන පස් මහා නිකායයන් අතුරෙහි ඛුද්දකනිකායට ඇතුළත් වේ. සූත්‍රය ගෙය්‍යය වෙය්‍යාකරණය ගාථාය උදානය ඉතිවුත්තකය ජාතකය අබ්භූතධම්මය වෙදල්ලය යන නවාඞ්ග ශාස්තෘ ශාසනයෙහි ලා ඉතිවුත්තකාඞ්ගයට ඇතුළත් වේ. සුඅසූදහසක් ධම්සකන්ධයන් අතුරෙන් කීපයකට ඇතුළත් වේ. සූත්‍ර වශයෙන් එකක නිපාතයෙහි සූත්‍ර සත්විස්සෙක (27). දුක නිපාතයෙහි දෙවිස්සෙක (22). තික නිපාතයෙහි පනසෙක (50) චතුක්ක නිපාතයෙහි, තෙළෙසකැ (13) යි මෙසේ සූත්‍ර සියල්ලම එකසිය දෙළොසෙක.

නිපාතයන් අතුරෙහි එකකනිපාතය ආදි වේ. වර්‍ගයන් අතුරෙහි පාටිභොග වග්ගය යි. සූත්‍රයන් අතුරෙහි ලොභ සූත්‍රය යි. "වුත්තං හෙතං භගවතා" යන ආදි වූ ආයුෂ්මත් ධර්ම භාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් ප්‍රථම සංගීතියෙහි වදාරනලද එකකනිපාතය ආදි වේ.

කුමක් හෙයින් මෙය අනික් සූත්‍රයන්හි මෙන් "එවං මෙ සුතං එකං සමයං" යන ආදීන් කාලදෙශාදීන් නොදක්වා අමුතු නිදානයෙකින් කියන ලද්ද යත්? ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් නොවදාරන ලද්දක් හෙයින් මෙසේ කීහ යි ඇතැම් තෙර කෙනෙක් කියත්. එසේ ද වුවත් මේ නිදානය ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද පිළිගෙන තිබෙන බව මෙහි සඳහන් කර ඇත. භාග්‍යවතුන් වහන්සේ විසින් උපාසිකාවන් අතුරෙහි බහුශ්‍රැතභාවයෙන් අගතැන් පත් කොට තබනලද සෙබපටිපදාවට පැමිණි

**ඛුජ්ජුත්තරා** නම්වූ ආයජීශ්‍රාවිකාව විසින් **සාමාවතී** දේවිය ප්‍රධාන කොට ඇති පන්සීයක් සත්‍රීන්ට පළමු කොට මෙය ප්‍රකාශ කරන ලදී.

එහි **පිළිවෙළ කථාව** සැකෙවින් මෙසේ යි, මෙයින් කල්ප ලක්‍ෂයකින් පූර්වයෙහි **පියුමතුරා** නම් සර්ඥයන් වහන්සේ ලොව පහළව පවත්වනලද උතුම් දම්සක් ඇති සේක් හංසවතී නුවර වැඩවාසය කරනසේක. ඉක්බිති හංසවතියෙහි එක් කුලදියණියක් බුදුන්ගෙන් බණ අසන්නට යන උපාසිකාවන් සමග විහාරයට පැමිණියා ය. එහිදී එක් උපාසිකාවක් බහුශ්‍රැත තැනැත්තියන් අතුරෙන් අග්‍ර ස්ථානයෙහි තබනු දැක තොමෝත් පූජා කොට ඒ තනතුර පැතුවාය. ශාස්තෲන් වහන්සේ ද "අනාගතයෙහි **ගෞතම** නම් සම්‍යක් සම්බුදුන්ගේ ශ්‍රාවිකාවූ උපාසිකාවන් අතුරෙහි බහුශ්‍රැත තැනැත්තියන්ට අග්‍ර වන්නීය"යි මැයට විවරණ දුන්සේක. ඕතොමෝ එතැන් පටන් දෙව් මිනිස් දෙගති–යෙහි හැසිරෙන්නී කල්පලක්‍ෂයක් ඉක්මුණු කල්හි මේ භද්‍රකල්පයෙහි අප බුදුන් සමයෙහි දෙව්ලොවින් චුත ව **ඝෝෂිත** සිටුහුගේ ගෘහයෙහි දැසියකගේ කුස පිළිසිඳ ගත්තා ය. **උත්තරා** යයි මැයට නම් කළහ. ඕ කුදුවූ සිරුර ඇතිව උපන් හෙයින් **ඛුජ්ජුත්තරා**ය යි ප්‍රකට වූවා ය.

ඕ තොමෝ මෑතකාලයෙක්හි ඝෝෂිත සිටුහු විසින් උදෙනි රජහට සාමාවතිය පාවා දුන් කල්හි ඇයට මෙහෙ කරන්නියක වශයෙන් භාරදෙන ලද්දී උදෙන රජහුගේ ඇතුළු නුවරම වෙසෙයි. එසමයෙහි ඝෝෂිතය, කුක්කුටය පාවාරිකය යි සිටුවරු තුන්දෙනෙක් බුදුන් උදෙසා විහාර තුනක් කරවා දනවූ සැරිසරා වැඩමවන බුදුන් ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයාට විහාර පූජා කොට මහදන් පැවැත්වූහ. මේ පූජාවන් සඳහා මසක් පමණ කල් ඉක්මුණේ විය. ඉක්බිති මොවුන්ට මෙබඳු සිතෙක් විය. බුදුවරයෝ නම් සියලු ලෝකයාහට අනුකම්පා ඇතිසේක. එහෙයින් අන්‍යයන්ටත්

ඉඩ දෙමු යි කොසඹෑනුවර වැසි ජනතාවටත් අවකාශ සැලැස්වූහ. එතැන්පටන් නුවර වීථි පිළිවෙළින් මහදන් දෙන්ට පටන්ගත්හ.

ඉක්බිති එක්දිනක් ශාස්තෲන් වහන්සේ භික්ෂු සඞ්ඝයා විසින් පිරිවරන ලදුව සුමන නම් වූ ප්‍රධාන මාලාකාරයාගේ නිවසෙහි වැඩහුන්සේක. එකෙණෙහි ඛුජ්ජුත්තරා තොමෝ සාමාවතියට මල් ගෙන එනු පිණිස කහවණු අටක් ගෙන ඒ මාලාකාරයාගේ ගෘහයට පැමිණියා ය. මාලාකාර තෙම ඇය දැක, "අම්ම උත්තරාවෙනි! අද තුඹට මල් දීමට ඉඩක් නැත. මම බුදුන් ප්‍රමුඛ භික්ෂුසඞ්ඝයා වළඳවමි නුඹත් මීට සහභාගී වෙව. මෙසේ මේ පින්කමින් අනුන්ට වැඩකාර කමින් මිදෙන්නෙහි" යයි කීය. ඉක්බිති ඛුජ්ජුත්තරා තොමෝ බුදුන්ගේ දානශාලායෙහි වතාවත් කළා ය. ඕතොමෝ ශාස්තෲන් වහන්සේ විසින් උපනිසින්නක කථා (=වැඩහිඳිනා අවස්ථායෙහි කළ ධර්මදේශනා) වශයෙන් වදාළ තාක් ධර්මය ඉගෙන ගත්තා ය. වැළඳූ ඉක්බිති වදාළ අනුමෙවෙනි බණ අසා සෝවාන් පෙලෙහි ද පිහිටියා ය.

ඛුජ්ජුත්තරා තොමෝ සෙසු දිනවල මල් ගෙන එන්නී කහවණු සතරක මල් රැගෙන එන්නී ය. අනික් කහවණු සතර සඟවා ගන්නී ය. එදින මාර්ගඵලප්‍රාප්ත ආර්‍ය්‍ය ශ්‍රාවිකාවක් වූ හෙයින් අන්සතු දෑයෙහි සිත් නොඋපදවා කහවණු අටම දී පැස පුරා මල්ගෙන සාමාවතී දේවියගේ හමුවට පැමිණියා ය. ඉක්බිති සාමාවතී දේවීතොමෝ ඇය අතින් මෙසේ විචාළා ය. "අම්ම උත්තරාවෙනි! නුඹ අනික් දිනවල මෙතෙක් බොහෝ මල් නොගෙනෙන්නෙහි ය. අද මල් බොහෝ ය. කිම මාලාකාර තෙම අප සඳහා වැඩියක් පහන් වූයේ ද?" යනු යි ඕතොමෝ බොරු කියන්නට නුසුදුසු බැවින් මෙතෙක් දවස් මම යුෂ්මතිය රැවටූයෙමි. අද මම සම්‍යක් සම්බුදුන්ගේ ධර්මය අසා නිවන් පසක් කෙළෙමි. එහෙයින් ඔබ වඤ්චා නොකෙරෙමි යි කීවා ය. නුවණැති දේවීත් "කොල දුෂ්ට දැසිය! මෙතෙක් කල් තී විසින් ගන්නාලද

කහවණු දෙව යි'' තජ්ජනය නොකොට පෙර කුශල කර්ම හේතුවෙන් මෙහෙයනු ලබන්නියක මෙන් ''මෑණියනි! ඔබ විසින් පානය කරනලද අමෘතය අපටත් පොවන්නැ''යි කී කල්හි එසේ වී නම් ''මා නහව''යි කියා සිටි දැසිය සොළොස් කළයක් සුවඳ පැනින් නහවා සළු දෙකක් ද දුන්නා ය

ඕතොමෝ එකක් හැඳ එකක් පෙරව අස්නක් පනවා ගෙන එහි වැඩ හිඳ විජිනිපත අතට ගෙන පහන් අසුන් ගෙන හුන් පන්සියයක් සත්‍රීන් අමතා සෙඛපටිපදායෙහි සිට ශාස්තෲන් වහන්සේ විසින් දෙසනලද ක්‍රමයෙන් ම ඔවුනට ධර්මදේශනා කළා ය. දෙසුන් කෙළවර සියල්ලෝ සෝවාන් පෙලෙහි පිහිටියහ. බණ අසා පසුව එ හැම දෙනම බුජ්ජුත්තරාවට වැඳ ''මෑණියනි! අද පටන් කිලුටු කමක් නො කරනු මැනව. අපගේ මව් තනතුරෙහි හා ගුරු තනතුරෙහි ද පිහිටුවයි'' ගුරු තනතුරෙහි තැබූහ.

කුමක් හෙයින් මෝ තොමෝ දැසියක් ව උපන්නී ද යත්?

බුජ්ජුත්තරා තොමෝ පෙර කසුප් සම්මා සම්බුදුන් කල බරණැස් නුවර සිටු දුවණියක් ව ඉපද සිට එක් රහත් මෙහෙණින්නක් එම කුලයට ගිය කල්හි ''ආයනීාවෙනි! මට මේ ඇඳුම් පෙට්ටිය දෙනු මැනව''යි මෙහෙකරවා ගත්තා ය. සප්විරාව ද නොදුන හොත් මා කෙරෙහි වයිර බැඳ නිරයෙහි උපදින්නී ය. දුනහොත් අනුන්ට දැසියක් ව උපදින්නී ය. නිරයෙහි දැඩි දුක් විඳීමට වඩා දැසිබවම උතුමැ යි අනුකම්පා පිණිස ඇයගේ වචනය ඉටුකළා ය. ඕ තොමෝ එම කර්මයෙන් ජාති පන්සියක් අනුන්ට දැසියක් ව ම උපන්නා ය.

කුමක් හෙයින් කුදු වූවා ද යත්?

බුදුන් වහන්සේ නූපන් කල්හි ම බරණැස් රජහුගේ ගෙහි වසන්නී රජහට කුලුපග වූ කුදු වූ සිරුරු ඇති එක් පසේ

බුදුවරයකු දැක තමා හා සමග වසන්නා වූ ස්ත්‍රීන් ඉදිරියෙහි සිනා වසයෙන් "පසේ බුදුන් වඩින්නේ මෙසේ ය" යි කෙළි කවට කම් කළා ය. ඒ පවින් කුදු ව උපන්නා ය.

කුමක්හෙයින් මහා ප්‍රාඥ වී ද යත්?

මෝ තොමෝ බුදුන් නූපන් කල්හි ම බරණැස් රජුහුගේ ගෙහි වසන්නී පසේ බුදුවරයන් අට නමක් රජගෙයින් උණු කිරිබත් පුරා දුකසේ ගෙනයන පාත්‍රයන් දැක ඇත් දළින් කළ දරනු අටක් පූජා කොට මෙහි තබාගන වඩිනු මැනව යි සැලකළා ය. තව ද එසේ කොට බැලූ කල්හි "මා විසින් මේ සියල්ලක් නුඹ වහන්සේට පුදන ලද්දේ ය. එ හෙයින් රැගෙන වඩිනු මැනවයි" ද සැලකළා ය. උන් වහන්සේ ඒ හැම නන්දමූලක පබ්භාරයට ම රැගෙන වැඩියාහු ය. ඒ පිනින් මහ පැණැති වූවා ය.

ඉක්බිති ඇයට සාමාවතී දේවිය ප්‍රමුඛ පන්සියක් ස්ත්‍රීහු "මැණියෙනි නුඹ දිනක් පාසා බුදුන් සමීපයට ගොස් වදාළ තාක් ධර්මය අසා අවුත් අපට කියව" යි කීහ. ඕ එසේ කරන්නී මෑත භාගයෙහි ත්‍රිපිටකධර වූවා ය. එහෙයින් ඇය ශාස්තෲන්වහන්සේ "එතදග්ගං භික්ඛවෙ මම සාවිකානං උපාසිකානං බහුස්සුතානං යදිදං ඛුජ්ජුත්තරා" යි අග්‍රස්ථානයෙහි තබා වදාළහ.

මෙසේ තථාගතයන් වහන්සේ විසින් උපාසිකාවන් අතරෙන් බහුශ්‍රැතභාවයෙන් අග්‍රස්ථානයෙහි තබනලද **ඛුජ්ජුත්තරා** නම් ආර්‍ය්‍යශ්‍රාවිකා තොමෝ ශාස්තෲන් වහන්සේ කොසඹෑ නුවර වැඩ වාසය කරන කල්හි කලින් කල බුදුන් ළඟට ගොස් බණ අසා ඇසූ බණ ඇතුළු නුවරට ගොස් **සාමාවතිය** ප්‍රමුඛ වූ ආර්‍ය්‍යශ්‍රාවිකා වූ පන්සියයක් ස්ත්‍රීන්ට උන්වහන්සේ විසින් දෙසනලද නියායෙන් තමන් ඔබ හමුවෙන් ඇසූ බව ප්‍රකාශ කරන්නී "වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං" යන ආදි නිදානය තැබුවා ය.

**භාවය:–**

භාග්‍යවතුන් වහන්සේ විසින් ම මේ ධර්‍ම දේශනාව වදාරන ලද්දේ ය. අර්හත් වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් වදාරන ලද ක්‍රමයෙන් ම මාගේ ඇසීම වේ මහණෙනි! එක් ධර්‍මයක් සමුච්ඡේදප්‍රහාණ වශයෙන් දුරුකරව්. (එහෙයින්) මම නුඹලාට අනාගාමි භාවය පිණිස ඇප වෙමි. කවර එක් ධර්‍මයක් ද? මහණෙනි, ලෝභ නම් වූ එකම ධර්‍මය දුරුකරව්. මම නුඹලාට අනගැමි බැව් පිණිස ඇප වෙමි යනු යි. භාග්‍යවතුන් වහන්සේ සූත්‍රයෙහි මේ අර්ථය වදාළ සේක් ද? එහි ලා ගාථාබන්ධ වශයෙන් ද මෙය මෙසේ කියනු ලැබේ.

රූපාදි යම් අරමුණෙක්හි ඇලීම් රසයෙන් පැවති ලෝභයෙන් ගිජු වූ යම් සත්ත්ව කෙනෙක් කිසියම් කාය සුචරිතාදියක් නො කොට දුකට පිහිට වූ නිරය, තිරිසන් යොනිය, ප්‍රේත විෂය යන දුගතියකට යෙත් ද, කියන ලද පරිදි වූ ඒ ලෝභය සවභාව වශයෙන් හටගැනීම් වශයෙන් දුරුකිරීම් වශයෙන් මධුරාකාර වශයෙන් ආදීනව වශයෙන් නිගීම (බැහැරලීම්) වශයෙන් දැයි මෙකී අයුරින් තත්වා–කාරයෙන් දැන රූපාදි පඤ්ච උපාදානස්කන්ධය අනිත්‍යාදි විවිධාකාරයෙන් දක්නා වූ ප්‍රාඥයෝ විදර්ශනා ප්‍රඥව පෙරටු කොට ඇති මාර්‍ගඥානයෙන් එය දුරු කෙරෙති. සහජේකට්ඨ පහානෙකට්ඨ = (ඉපදීමේදී ලෝභය හා සමග එක්ව උපන්, දුරුකිරීමේදී ඒ හා එකතුව දුරු වන) අවශෙෂ කෙලෙසුන් සමග ඒ ලෝභය අනාගාමි මාර්‍ගයෙන් දුරු කොට නැවත පසුව මේ කාමධාතු සඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධ ලෝකයට පිළිසිඳ ගැනීම් වශයෙන් කිසිකලෙකත් නොපැමිණෙත්. මේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේය. නොහොත් (අපි ශබ්දයෙන්) දූත් මතූ කියනු ලබන සූත්‍රයෝ ද සර්වඥයන් වහන්සේ විසින් වදාරන ලද්දැහු ය යනු මා විසින් අසන ලද්දේ ය.

මේ සූත්‍රයෙහි සමුදය සත්‍යය ස්වරූපයෙන්ම ආයේ ය. ප්‍රහාණයට කරුණු දැක්වීමෙන් මාර්ග සත්‍යය ද මේ උභය හේතු දැක්වීමෙන් ඔවුන්ගේ ඵලය වූ සෙසු සත්‍ය දෙක ද සැලකියයුතු යි. ගාථායෙහි දුක්ඛ, සමුදය, මාර්ග යන සත්‍යත්‍රය කියනලද අයුරින්ම අවබෝධ වෙයි. නිරෝධ සත්‍යය එහි ලා ගතයුතු.

**ධර්ම විස්තර**:-

**පජහථ** - දුරු කරව්. මෙහි දුරුකිරීම තදඞ්ගප්පහානය, වික්ඛම්භනප්පහානය, සමුච්ඡේදප්පහානය, පටිප්පස්සද්ධිප්ප-හානය, නිස්සරණප්පහානය යි පඤ්චවිධ වේ.

එහි ප්‍රදීපයෙන් අඳුරු දුරු කරන්නාක් මෙන් අලෝභාදියෙන් ලෝභාදියගේ ද, නාමරූපයන් පිරිසිඳ දන්නා විදර්ශනා ප්‍රඥයෙන් ඒ ඒ කෙලශයන්ගේ ද දුරු කිරීම **තදඞ්ගප්පහාන** නම් වේ. කළය දැමූ කල දිය සෙවෙල් මැඩ පවතින්නාක් මෙන් උපචාර අර්පණ භේද වූ සමාධියෙන් නීවරණ ධර්මයන් මැඩලීම "**වික්ඛම්භනප්පහාන** නම් වේ. සතර ආර්‍ය මාර්ගයන් වැඩීමෙන් කෙලෙසුන්ගේ සමුච්ඡින්දනය (මතුව සිඳීම) **සමුච්ඡේදප්පහාන** නම් වේ. ඒ ලක්ෂණයෙහි කෙලෙසුන්ගේ සන්සිඳුවීම් ගතිය **පටිප්පස්සද්ධිප්පහාන** නම් වේ. සියලු සංස්කාර ධර්මයන් ගෙන් දුරු වූ නිර්වාණය **නිස්සරණප්පහාන** නම් වේ.

මෙසේ පස්වැදෑරුම් ප්‍රහාණයන් අතුරෙහි අනාගාමි ආර්‍යශ්‍රාවකයාගේ ප්‍රහාණය මෙහි ලා අභිප්‍රේත හෙයින් සමුච්ඡේද ප්‍රහාණය යි දතයුතු. එහෙයින් පජහථ යන්නෙන් දුරු කරව්, සිඳිව්. යන අර්ථය ගැනෙයි.

**අනාගාමිතාය** - අනගැමි බැව් පිණිස; පිළිසිඳ ගැනීම් වශයෙන් කාමභවයට නො පැමිණෙන හෙයින් අනාගාමි නම් වේ. යම් ධර්මයක්හුගේ අවබෝධයෙන් යමෙක් කාම භවයට නො යේ ද හෙතෙම අනාගාමි යයි කියනුලැබේ.

වෛනෙය ජනයන් හික්මවීමෙහි දක්‍ෂවූ භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ අදහස්වලට අනුව තුන්වන මාර්ගාධිගමය ලඝු වූ ක්‍රමයෙකින් එකම ධර්මයක් සම්පූර්ණකරලීම් මාත්‍රයෙන් සපිරකොට වදාළසේක.

**කතමං එකධම්මං** යන මෙහි **කතමං** යනු පෘච්ඡා වචනය යි. පෘච්ඡා තොමෝ පස්වැදෑරුම් වන්නීය. අදිට්ඨජෝතනා පුච්ඡාය, දිට්ඨසංසන්දනා පුච්ඡාය, විමතිච්ඡෙදනා පුච්ඡාය, අනුමති පුච්ඡාය, කථෙතුකම්‍යතා පුච්ඡාය යනු යි. නොදන්නා ලද්දක් දැනගනු පිණිස කරනු ලබන ප්‍රශ්නය **අදිට්ඨ ජෝතනා** නමු. දන්නාලද්ද අන්‍ය පණ්ඩිතයන් සමග සංසන්දනය කිරීම පිණිස පුළුවුත්නී **දිට්ඨ සංසන්දනා** නමු. හටගත් සැකය දුරලනු සඳහා විචාරනු ලබන ප්‍රශ්නය **විමතිච්ඡෙදනා** නමු. අනුන්ගේ කල්පනාව ගැනීම පිණිස විචාරනලද්ද **අනුමතිපුච්ඡා** නමු. කියා දෙනු කැමැත්තෙන් අසනු ලබන ප්‍රශ්නය **කථෙතුකම්‍යතා පුච්ඡා** නමු. මෙහි පළමුකී ත්‍රිවිධ පෘච්ඡාවෝ භාග්‍යවතුන් වහන්සේ සඳහා නොවෙත්. තථාගතයන් වහන්සේට නොදත් දෙයක් හෝ දත් දෙය සසඳ බැලීමක් හෝ සැකය දුරුකර ගැන්මක් හෝ නොමැති හෙයිනි. අනික් දෙක තථාගතයන් වහන්සේට සාධාරණ වේ.

**ලොභං භික්ඛවෙ එකධම්මං** යන මෙහි ලෝභය නම් යම් කිසි අරමුණෙක්හි ඇලීම යි. එය මක්කටාලෙපයක් (වඳුරකුගේ ලහටුයෙහි ඇල්මක් මෙනි) ආරම්මණ ගහනය (අරමුණු ගැනීම) මෙහි ලක්‍ෂණය යි. අරමුණෙහි ඇලීම රසය යි. රත්වූ කබලෙක්හි බහාලනලද මස් පිඩක් මෙනි සංයොජනයන්ට හිත වූ ධර්මයන් කෙරෙහි මධුරාකාරයෙන් දැකීම පදට්ඨානය යි. වහ වහා දුවන සැඩ පහරක් මෙන් තෘෂ්ණා නමැති නදියෙහි වැඩෙන්නා වූ ලෝභය තෙමේ සත්ත්වයා අපාය මහා සමුද්‍රයෙහි ගෙන යෙයි. සියලු ආශාවන්ටම සාමාන්‍ය වචනයක් වූ මේ ලෝභ ශබ්දයෙන් කාමරාගය ප්‍රකාශ කෙරෙයි. හෙ වනාහි අනාගාමී

මාගීයෙන් නැසිය යුතු වේ. තවද **පජහථ** යන්නෙන් **පරිඥා** සච්ඡිකිරියා භාවනාභිසමයයන් හා සමග **පහාණ** පරිඥාව ද සීලවිසුද්ධි ආදි ෂඩ් විසුද්ධීන් හා සමග පටිපදා ඥාණදස්සනවිසුද්ධිය ද දක්වන ලද්දේ ය.

**පළමුවන සූත්‍ර විවරණය යි.**

## 1 - 1 - 2

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

එකධම්මං භික්ඛවෙ පජහථ, අහං වො පාටිභොගො අනාගාමිතාය. කතමං එකධම්මං? **දොසං** භික්ඛවෙ **එක** ධම්මං පජහථ, අහං වො පාටිභොගො අනාගාමිතායාති, එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති,

සෙන දොසෙන දුට්ඨාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං දොසං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචනන්ති,

අයමපි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති,

**අර්ථය**:-

පළමුවැනි සූත්‍රයට කී අයුරු යි. **දොසං එකධම්මං** ද්වේෂය නම් වූ එකම ධර්මය, **යෙන දොසෙන**, යම් ද්වේෂයකින් **දුට්ඨාසෙ**, ද්වේෂිත වූ; **සත්තා**, සත්වයෝ;

**භාවය**:- සුබොධ යි.

**ධර්ම විස්තර**:-

මේ සූත්‍රය ද්වේෂ බහුල වූ සත්වයන්ගේ අදහස් බලා වදාරනලද හෙයින් "දොසං භික්ඛවෙ එකධම්මං පජහථ" යී ආයේ ය.

**ද්වේෂය නම්** - "අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති" යනුවෙන් (මෙ තෙම) මට අවැඩක් කෙළේ යයි කෝපයක් උපදී යන ආදි ක්‍රමයෙන් සූත්‍රයෙහි කියන ලද නව

ආඝාත වස්තූන්ගේ ද "අනත්ථං මෙ නාචරි" (මේ තෙම) මට වැඩක් නො කෙළේය යන ආදීන් එයට විරුද්ධ වශයෙන් සිද්ධවූ නවදෙනාගේ දූ යි මෙසේ අටළොස් වැදෑරුම්වූ ආඝාත වස්තූහු ද කණු කටු ආදියෙහි හැපීමෙන් හටගන්නා අස්ථානකොපය හා සමග එකුන් විසි වැදෑරුම් වෙත්.

(1) මෙතෙම මට අවැඩක් කෙළේ ය. (2) දැන් අවැඩක් කෙරෙයි. (3) මතු අවැඩක් කරන්නේ ය. (4) මට අප්‍රියවූවහුට හිතයක් කෙළේ ය. (5) දැනුදු කෙරෙයි. (6) මතු ද කරන්නේ ය (7) මාගේ මිත්‍රයාට අවැඩක් කෙළේ ය. (8) දැනුදු කෙරෙයි. (9) මතු ද කරන්නේ ය. (10) මට හිතවූ දැයක් නොකෙළේ ය. (11) දැනුදු නො කෙරෙයි. (12) මතු ද නො කරන්නේ ය. (13) මාගේ මිතුරාට හිතවූ දැයක් නො කෙළේ ය. (14) දැනුදු නො-කෙරෙයි. (15) මතු ද නො කරන්නේ ය. (16) මාගේ සතුරාට හිතවූවක් කෙළේ ය. (17) දැනුදු කෙරෙයි. (18) මතු ද කරන්නේ ය. යනු අටළොස් ආඝාත වස්තූහු යි. අනුන් කිළිටි කරවමින් තමනුත් කිළුටු වන සවභාවය ඇති මේ ද්වෙෂය හැම ලෙසින්ම නපුරු ය, දණ්ඩෙන් පහට ආශිවිෂයක්හු මෙන් චණ්ඩත්වය ලක්ෂණ කොට ඇත්තේ ය නමන් හඳවන ලැව්ගින්නක් මෙන් දැවීම් කිස ඇත්තේය. ලබනලද අවකාශ ඇති සතුරකු මෙන් දූසසනය (කෙලෙසීම) එළ කොට ඇත්තේ ය. විෂයෙන් හැනූ ගොමූත්‍රය මෙන් පුණෝකත ආඝාත වස්තූන් ආසන්න කාරණ කොට ඇත්තේ ය.

මෙ කියනලද ආඝාත වස්තූන් දුරුකළ හැකි කරුණු පසෙකි. යමකු කෙරෙහි ක්‍රෝධය උපන්නේ වී නම් ඔහු කෙරෙහි මෛත්‍රිය වැඩියයුතු ය. කරුණාව මුදිතාව උපෙක්ෂාව අසතිඅමනසිකාරය හෙවත් ඔහු ගැන සිහි නො කිරීම හෝ මෙනෙහි නො කිරීම වැඩියයුතු ය. එසේම යමකු කෙරෙහි කෝපයක් හටගනී නම් ඔහු කෙරෙහි

කම්මස්සකතාව සිතියයුතු ය. මෙතෙම කර්මය ස්වකීය කොට ඇත්තෙක. කර්මය දායාදයක් කොට ඇත්තෙක කියා යි. එසේම යමෙක් අපිරිසුදු කායසමාචාර (කය පිළිබඳ හැසිරීම්) අපිරිසුදු වචීසමාචාර (වචන කථාකිරීම්) ඇත්තෙක් වී නම් එබඳු පුද්ගලයා කෙරෙහි ද ආඝාතය දුරුකළයුතු ය. නො එසේ වුවහොත් "කකචූපම ඔවාදය" සිහිකළයුතු ය. නැතහොත් මහණෙනි! මේ කරුණු සතක් ක්‍රොධ කරන ස්ත්‍රියකු කරා හෝ පුරුෂයකු කරා පැමිණෙයි, සතුරෙක් සතුරකුගේ වර්ණවත් බවට නොසතුටු වෙයි. යම් කිසි ලෙසකින් හෙතෙම මනාව ස්නානය කොට සුවඳ විලවුන් ඇඟ ගල්වා හිස රැවුල් කපා සුදු වස්ත්‍ර හැඳ වසන්නේවී නමුදු දුර්වර්ණ ම වෙයි. එසේම සතුරෙක් සතුරකුගේ දුඃඛශයනය කැමති වෙයි. බොහෝ ධනය නොකැමති වෙයි. සම්පත් නොකැමැති වෙයි. කීර්තිය නොකමැති වෙයි. මිතුරන් නොකමැති වෙයි. මරණින් මතු නරකයෙහි ඉපදීම කැමති වෙයි. මෙකී විපාක වශයෙන් තමන්ටත් එසේම සිදු වෙයි. ක්‍රොධ බහුල තැනැත්තේ කයින් දුසිරිත් කෙරෙයි. වචනයෙන් හා සිතින් ද දුසිරිත් කෙරෙයි. නපුරක්ම සිතයි. එසේ කොට මරණින් මතු නිරයෙහි උපදියි. යනාදි බුදුවදන් සිහි කළ යුතු යි.

"කුද්ධො අත්ථං න ජානාති කුද්ධො ධම්මං න පස්සති"

(අංගුත්තර සත්තක නිපාත)

කිපුණු තැනැත්තේ අර්ථය නොදනී. කිපුණු තැනැත්තේ ධර්මය නොදනී යනු එහි භාවය යි.

"කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං
සංයොජනං සබ්බ මතික්කමෙය්‍ය"

(ධම්මපද කොධවග්ග)

ක්‍රොධය දුරු කරන්නේ ය. මානය දුරුකරන්නේ ය. සියළු සංයොජනයන් ඉක්ම වන්නේ ය. යනු භාව යි.

"අනත්ථජනනො කොධො කොධො
චිත්තප්පකොපනො"

(සංයුත්ත)

ක්‍රොධය අනර්ථය උපදවන්නේ ය ක්‍රොධය සිත කොප කරන්නේ ය. යනු භාව යි.

"කොධස්ස විසමූලස්ස මධුරග්ගස්ස බ්‍රාහ්මණ"

(සංයුත්ත)

බමුණ, මුල විෂවූ අග මිහිරිවූ ක්‍රොධය යනු අර්ථ යි.

"කොධං ඡෙත්වා සුඛං සෙති කොධං
ඡෙත්වා න සොචති"

(සංයුත්ත)

ක්‍රොධය සිඳ සැපයේ සයනය කෙරෙයි. ක්‍රොධය සිඳ ශොක නොකෙරෙයි යනු අදහස යි.

"එකාපරාධං ඛම භූරිපඤ්ඤ
න පණ්ඩිතා කොධබලා භවන්ති"

(ජාතක පාළි)

භූරිප්‍රාඥය! එකම අපරාධය ඉවසනු මැනව. ප්‍රඥාවන්තයෝ ක්‍රොධය බලකොට ඇත්තාහු නොවෙති යනු භාව යි.

මේ ආදි ක්‍රමයෙන් ද්වෙෂයෙහි ආදීනවය හා ද්වෙෂය දුරුකිරීමෙහි අනුසස් සලකා පළමුකොට ම තදඞ්ගප්පහානාදි වශයෙන් හෙවත් ඒ ඒ කෙලෙසුන් එයට විරුද්ධවූ කරුණුවලින් ඒ ඒ කාලයෙහි දුරුකිරීමෙන් විදසුන් වඩා තුන්වන මාර්ගයෙන් (අනාගාමි මාර්ගයෙන්) සියලු අන්දමින් ද්වෙෂය දුරු කරව් යනු මෙයින් වදාළහ.

**දෙවන සූත්‍ර විවරණය යි.**

## 1 – 1 – 3

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං–

එකධම්මං භික්ඛවෙ පජහථ, අහං වො පාටිභොගො අනාගාමිතාය, කතමං එකධම්මං? මොහං භික්ඛවෙ එකධම්මං පජහථ, අහං වො පාටිභොගො අනාගාමිතායාති, එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

යෙන මොහෙන මූළ්හාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං මොහං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචනන්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

**අර්ථය**:–

පළමු වැනි සූත්‍රයට කී අයුරු යි. **මොහං එකධම්මං** මෝහයවූ එකම ධර්මය, **යෙන මොහෙන**, යම් මෝහයකින්, **මූළ්හාසෙ** මුළාවූ,

**භාවය**:– සුබොධ යි.

**ධර්මවිස්තර**:–

**මෝහය** තම් නොදැන්ම යි. එය දුකෙහි නොදැනීමය, දුඃඛ හේතුයෙහි නොදැනීමය, දුඃඛයාගේ අප්‍රවෘත්තියෙහි නොදැනීමය, දුඃඛය නිරුද්ධ කිරීමට පමුණුවන ප්‍රතිපදායෙහි නොදැනීමය යි, සතරාකාර වේ. මෙය සිත පිළිබඳ අන්ධ භාවය **ලක්ෂණ** කොට ඇත්තේය, නොහොත් නොදැනීම ලක්ෂණ කොට ඇත්තේය. අවබොධ නොකිරීම කෘත්‍ය කොට ඇත්තේය. අරමුණු සවභාවය වැසීම හෝ කෘත්‍ය කොට ඇත්තේය. මුළා සහිත පැවැත්ම ඵල කොට ඇත්තේය. අඳුර හෝ ඵල කොට ඇත්තේය. අනුවණින් මෙනෙහිකිරීම සම්පකාරණ කොට ඇත්තේය. සියලු අකුසලයන්ට ම මූලහෙතුවකැ යි දතයුතු යි.

“මූලෙහා අත්ථං න ජානාති මූලෙහා ධම්මං න පස්සති,
අන්ධංතමං තද, හොති යං මොහො සහතෙ නරං”

(ඉතිවුත්තක)

මුළාවූ තැනැත්තේ අර්ථය නොදනියි, මුළාවූ තැනැත්තේ ධර්මය නොදනී. මොහය තෙම යම් මිනිසකු මැඩගෙන සිටියි ද එකල්හි මහත් ගනඳුරෙක් වේ යනු භාව යි.

“අනත්ථජනනො මොහො මොහො චිත්තප්පකොපනො”

(ඉතිවුත්තක)

මොහයතෙම අනර්ථයක් උපදවන්නේය, සිත කෝප කරන්නේය යනු අදහස යි.

“අවිජ්ජා භික්ඛවෙ පුබ්බඞ්ගමා අකුසලානං ධම්මානං
එව සමාපත්තියා”

(ඉතිවුත්තක)

මහණෙනි, අකුසල ධර්මයන්ගේ රැස්කිරීම පිණිස අවිද්‍යාව (මොහය) පෙරදූරි වේ.

“මොහසම්බන්ධනො ලොකො භබ්බරූපොව දිස්සති”

(උදාන)

ලෝවැසි යම්කිසිවෙක් මාගීඵලයන්ගේ අධිගමයට සුදුස්සකු මෙන් පෙනේ ද, හෙතෙමේත් මොහය සම්බන්ධ කොට ඇත්තේය.

“මොහො නිදානං කම්මානං සමුදයාය”

(අංගුත්තර)

මොහය තෙම කර්මයන්ගේ හටගැනීමට හේතු වේ.

“මූලෙහා ඛො බ්‍රාහ්මණ මොහෙන අභිභූතො පරියාදින්න චිත්තො දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති සම්පරායිකම්පි භයං වෙරං පසවති”

(අංගුත්තර)

බ්‍රාහමණය! මූළා වූ තැනැත්තේ මෝහයෙන් මැඩුණේ මෝහයෙන් ක්‍ෂය කොට ගත් සිත් ඇත්තේ ඉහාත්මයෙහි භයජනකවූ වෛරය රැස් කෙරෙයි. පරලෙව්හි ද භයජනකවූ වෛරය රැස් කෙරෙයි.

"යො කොචි ධම්මො කාමච්ඡන්දාදි සඞ්කිලෙසෙහි ධම්මෙහි නිබ්බත්තෙතබ්බො අත්ථො සො මොහහෙතුකො"

යම් කිසි අකුශල ධර්මයෙක් කාමච්ඡන්දාදි සක්ලෙස් ධර්මයන් විසින් නිපදවිය යුතු ද කරුණු වශයෙන් එසියල්ල මෝහය හේතු කොට ඇත්තේ වේ,

මෙසේ මෝහයෙහි ආදීනවයත් මෝහය දුරුකිරීමෙහි අනුසස්න් සලකා කාමච්ඡන්දාදි නීවරණයන් දුරුකිරීම පූර්ව භාගයෙහි තදඞ්ගාදි වශයෙන් ද තුන්වන මාර්ගයෙහි කියන ලද ලෝභ ද්වේෂයන් සමග මෝහයත් සමුච්ඡේද වශයෙන් දුරුකරව්.

### තෙවන සූත්‍ර විවරණය යි

## 1 – 1 – 4

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

එකධම්මං භික්ඛවෙ පජහථ, අහං වො පාටිභොගො අනාගාමිතාය, කතමං එකධම්මං? කොධං භික්ඛවෙ එක ධම්මං පජහථ, අහං වො පාටිභොගො අනාගාමිතායාති, එත මත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

යෙන කොධෙන කුද්ධාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං කොධං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො.
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචනන්ති,

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉතිමෙ සුතන්ති.

**අර්ථය:-**

පළමු සූත්‍රයට කී අයුරු යි. **කොධං,** ක්‍රොධයවූ, **යෙන කොධෙන,** යම් ක්‍රොධයකින්; **කුද්ධාසෙ,** කිපියාවූ;

**භාවය:-** සුබොධ යි.

**ධර්ම විස්තර** = දෙවන සූත්‍රයෙහි කී දොෂයම කොධ නාමයෙන් ගෙන අවබොධ කරනු කැමති සත්ත්වයන්ගේ අදහස් වශයෙන් මෙසේ කියන ලදි. එහෙයින් ඒ කියන ලද ක්‍රමයෙන් මෙහි විස්තර දතයුතු යි. කිපීම **ලක්‍ෂණ** කොට ඇත්තේ ක්‍රොධය යි. වෛර කිරීම කෘත්‍ය කොට ඇත්තේය; සිත පිළිබඳ වීයවුල් බව ඵලයකොට ඇත්තේය. සිත පිළිබඳ කුණු බව ආසන්න කාරණ කොට ඇත්තේය.

## සතරවන සූත්‍ර විවරණය යි

## 1 - 1 - 5

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං**

එකධම්මං භික්ඛවෙ පජහථ අහං වො පාටිභොගො අනාගාමිතාය කතමං එකධම්මං? **මක්ඛං** භික්ඛවෙ එකධම්මං පජහථ අහං වො පාටිභොගො අනාගාමිතායාති

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.
යෙන මක්ඛෙන මක්ඛාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං මක්ඛං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචනන්ති,
අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

**අර්ථය:-**

පළමු සූත්‍රය මෙනි, **මක්ඛං,** අනුන්ගෙ ගුණ මැකීම නම්වූ; **එක ධම්මං** මේ එකම කාරණය, **යෙන මක්ඛෙන,** යම් ගුණ මැකීමෙකින්; **මක්ඛාසෙ** මකන්නාවූ;

**භාවය:-** සුගම යි.

**ධර්ම විස්තර:-**

**මක්ඛය** නම් අනුන් පිළිබඳ ගුණය මකා දැමීම යි. ඉදින් යමෙක් අසුචි පිඩක් ගෙන අනුන්ට ගසන කල්හි පළමු කොට තමන්ගේ අත අපිරිසුදු වේ ද එසේම අනුන්ගේ ගුණ මකන අදහසින් පවත්නා කෙලෙශය මක්ඛය යි කියනු ලැබේ. යම් සේ ස්නානය කොට ශරීරයෙහි ජලය පිසගත් කල්හි සරීරගත ජලය පිසගත් වස්ත්‍රයෙහි නැවරේ ද එමෙන් අනුන් විසින් කරන ලද මහත්වූ ද උපකාරයක් නමුත් පිසදමන හෙයින් විනාස කර දමන හෙයින් මක්ඛය යි කියනු ලැබේ. මෙය අනුන්ගේ ගුණ මැකීම **ලක්ෂණ** කොට ඇත්තේය. ඔවුන්ගේම විනාශය කෘත්‍ය කොට ඇත්තේය. ගුණයන් මැඩීමම ඵලය කොට ඇත්තේය. කරුණු වශයෙන් මෙය අනුන්ගේ ගුණ මැකීම් අයුරින් පවත්නා හෙයින් ද්වෙෂ සහගත චිත්තයට ඇතුළත්ව දෞර්මනස් සහගත අකුසල් සිත්හි උපදනේ යයි දතයුතු. ද්වෙෂයෙහි මෙන් මෙහි ආදීනවය දැන මෙයින් වැළකීමෙහි අනුසස් නුවණින් සලකා පූර්වභාගයෙහි තදඞ්ගාදි වසයෙන් ඉවත් කොට විදසුන් වඩා තුන්වන මාර්ගයෙන් සහමුලින් දුරු කරවි යතු යි.

**පස් වන සූත්‍ර විවරණය යි.**

## 1 – 1 – 6

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

එකධම්මං භික්ඛවෙ පජහථ, අහං වො පාටිභොගො අනාගාමිතාය, කතමං එකධම්මං? මානං භික්ඛවෙ එක ධම්මං පජහථ, අහං වො පාටිභොගො අනාගාමිතායාති, එත ම ත්‍ථං භගවා අවොච, තත්‍ථෙතං ඉති වුච්චති.

යෙන මානෙන මත්තාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං මානං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචනන්ති,

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති,

**අර්ථය**:–

පළමු සූත්‍රය මෙනි, **මානං**, මානය; **යෙන මානෙන**, යම් මානයෙකින්; **මත්තාසෙ**, මත්වූ,

**භාවය**:– සුගම යි.

**ධර්මවිස්තර**:–

**මානය** යනු ජාත්‍යාදීන් වස්තු කොට පවත්නා සිත පිළිබඳ උන්නති යයි. හේ වනාහි මම ශ්‍රෙෂ්ඨයෙක්මි, ශ්‍රෙෂ්ඨයාට සමානයෙක් වෙමි, ශ්‍රෙෂ්ඨයාට පහත් වූවෙක් වෙමි. සමානයාට ශ්‍රෙෂ්ඨයෙක් වෙමි, සමානයාට සමානයෙක් වෙමි, සමානයාට හීනයෙක් වෙමි. හීනයාට ශ්‍රෙෂ්ඨයෙක් වෙමි, හීනයාට සමානයෙක් වෙමි, හීනයාට හීනයෙක් වෙමි යි. මෙසේ නව වැදෑරුම් වූ මැනීම මානය යි කියනු ලැබේ. උසස්වීම මෙහි ලක්ෂණ ය යි. අහඞ්කාරය කෘත්‍ය ය යි. නොහොත් මනාකොට අල්වා ගැනීම කෘත්‍යයයි ඉදිමවන ගතිය ඵලය යි. දෘෂ්ටිවිප්‍රයුක්ත ලොභය ආසන්න කාරණය වේ.

අහඞ්කාරයෙන් යුත් පුද්ගලයා පිස්සකු මෙනැයි දත යුතු යි.

මෙය **දුරුකරව්** යයි කුමක් හෙයින් වදාළසේක් ද යත්? මානය තෙමේ තමන් උසස් කිරීමය යන අත්තුක්කංසනයට හා අනුන් හෙළා දැකීමය යන පරවම්භනයටත් හේතුවන හෙයින් ද ගරුකටයුත්තන් කෙරෙහි වැඳීමය, පිදීමය, හුනස්නෙන් නැගී සිටීමය, ගරු කිරීමය, වතාවත් කිරීමය යන මේ ආදි කටයුතු දැය නොකිරීමෙන් වන අවැඩට

හේතු වන හෙයින් ද ජාතිමද පුරිසමදාදි වසයෙන් සලකා ප්‍රමාදයට වැටෙන හෙයින් දූසි මෙතෙක් ආදීනවයන් හා නිරහඞ්කාරත්‍වයෙහි අනුසස් ද සලකා රාජසභාවට පැමිණි සැඬොලකු මෙන් සබ්‍රම්සරුන් කෙරෙහි යටත්ව පූර්‍වභාග-යෙහි තදඞ්ගාදි වශයෙන් දුරුකොට විදසුන් වඩා අනාගාමි මාර්‍ගයෙන් සහමුලින් සිඳදැමීම වැඩ දයක හෙයිනි

**සවන සූත්‍ර විවරණය යි**

## 1 – 1 – 7

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං**

සබ්බං භික්ඛවෙ අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය, සබ්බං ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං තත්ථ චිත්තං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

යො සබ්බං සබ්බතො ඤත්වා සබ්බත්ථෙසු න රජ්ජති
ස වෙ සබ්බ පරිඤ්ඤාසො සබ්බදුක්ඛමුපච්චගා

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

**අර්ථය**:–

**භික්ඛවෙ**, මහණෙනි! **සබ්බං**, සත්කාය සමිය; **අනභිජානං**, විශිෂ්ටඥානයෙන් නොදන්නේ; **අපරිජානං**, පිරිසිඳ නොදන්නේ; **තත්ථ**, එ දතයුතු ධර්‍ම විෂයෙහි; **චිත්තං**, සිත; **අවිරාජයං**, නො ඇලෙන්නේ; **අප්පජහං**, දුරු නො කරන්නේ; **දුක්ඛක්ඛයාය**, දුක් කෙළවර කිරීම පිණිස; **අභබ්බො**, නුසුදුස්සෙක් වේ, **භික්ඛවෙ**, මහණෙනි! **සබ්බං ච ඛො**, සියලු සත්කාය වනාහි; **අභිජානං**, විශෙෂයෙන් දන්නේ; **පරිජානං**, පිරිසිඳ දන්නේ, **තත්ථ**, එ දතයුතු ධර්‍ම විෂයෙහි; **චිත්තං**, සිත; **විරාජයං**, අලවන්නේ; **දුක්ඛක්ඛයාය**, දුක් කෙළවර කිරීම පිණිස; **භබ්බො**, යොග්‍යයෙක් වේ; **යො**, යමෙක්තෙම; **සබ්බං**, සත්කාය

සර්වය; **සබ්බතො,** සර්ව වශයෙන්: **ඤත්වා,** දැන; **සබ්බෙසු,** සියලු සත්කාය පර්‍යාපන්න ධර්මයන් කෙරෙහි; **න රජ්ජති,** නො ඇලේද; **වෙ,** ඒකාන්තයෙන්; **සො,** හෙතෙම; **සබ්බ පරිඤ්ඤා,** සියල්ල පිරිසිඳ දැනීමෙන්; **සබ්බදුක්ඛං,** සියලු දුක; **උපච්චගා,** ඉක්මවූයේය.

මෙහි නොදක්වනලද අර්ථය ප්‍රථම සූත්‍රයෙහි කී නයින් දතයුතු.

**භාවය:**

මහණෙනි! සත්කාය නම් ලද පඤ්චස්කන්ධ ධර්මයට ඇතුළත් වූ විදර්ශනාවට අරමුණු වූ සියලු ත්‍රෛභූමක ධර්මයන් අතර මොව්හු කුසලයෝය, මොව්හු අකුසලයෝය, මේ පඤ්චස්කන්ධය, මේ දොළොස් ආයතනය, මේ අටළොස් ධාතුය, මේ දුකය, මේ දුක් උපදවන හේතුය යනාදී වශයෙන් විශිෂ්ටවූ නුවණින් නොදන්නාවූ පිරිසිඳ නොදන්නාවූ දැනගතයුතු ධර්මයන් දැනීමෙහි සිත් නොඅලවන්නාවූ පුද්ගලතෙම දුක්කෙළවර කිරීමට සුදුස්සෙක් නොවේ. පඤ්චස්කන්ධය තත්වූ පරිද්දෙන් දන්නාවූ විදර්ශනා ප්‍රඥයෙන් වෙසෙසින් දක්නාවූ එසේ දැකීමෙහි සිත් අලවන්නාවූ කෙලෙසුන් දුරුකරන්නාවූ පුද්ගලතෙම දුක් කෙළවර කිරීම පිණිස භව්‍යයෙක් වේ.

යම් ආරබ්ධ විදර්ශක (විදර්ශනාවට පටන්ගත්) යොගාවචරයෙක් සියලු ත්‍රෛභූමක ධර්මසමූහය කුසලාදී වශයෙන් හා ස්කන්ධාදී වශයෙන් ද සර්වප්‍රකාරයෙන් දැන සියලු පඤ්චස්කන්ධ ධර්මයන් කෙරෙහි ආර්‍යමාර්ගාධිගමයෙන් නොඇලේ ද හෙතෙම ඒකාන්තයෙන් සියල්ල පිරිසිඳ දත් හෙයින් සියලු සංසාරදුක ඉක්මවූවෙක් වේ.

**ධර්මවිස්තර:-**

**සබ්බං** යන මේ වචනයෙහි තේරුම සියල්ල යනු යි. නිරවශෙෂ වාචකවූ මේ සබ්බ ශබ්දය යමක් යමක් හා සම්බන්ධ වේ ද ඒ ඒ පදයාගේ නිරවශෙෂත්වය (මුළුල්ලම)

ප්‍රකාශ කෙරෙයි. සියලු රූපය, සියලු වේදනාය යනාදී වශයෙනි. ඒ මේ සබ්බ ශබ්දය සප්පදෙස නිප්පදෙස වශයෙන් දෙවැදෑරුම් වේ. සර්වසර්වය, ප්‍රදෙශසර්වය, ආයතනසර්වය, සත්කායසර්වය යන මේ සතර අවස්ථාවන්හි ම දක්නාලද ප්‍රයෝග ඇත්තේ වේ. "සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථමාගච්ඡන්ති" යන ආදී තන්හි **"සර්වසර්ව"**යෙහි ආයේය. සියලු ධර්මයෝ සියලු ආකාරයෙන් භාග්‍යවත්වූ සම්‍යක් සම්බුද්ධන්ගේ ඥානයට ගොචර වෙත් යනු මෙහි අර්ථ යි.

සර්වඥයන් වහන්සේගේ නුවණට ගොචර නොවන දෑයක් ලෝකයෙහි නැත්තේය. දතයුතු සියලු දෑයම දත් හෙයිනි. මෙහි සබ්බ ශබ්දයෙන් ගැනෙනුයේ ඉතිරි නො කොට ම සියල්ල යි, එහෙයින් මෙය **නිප්පදෙස** නම් වේ.

"සබ්බෙසං වො සාරිපුත්ත සුභාසිතං පරියායෙන." යන්නෙන් දක්වන්නේ "**ප්‍රදේශ සර්ව**" යයි ශාරිපුත්‍රය, නුඹලා සියලු දෙනාගේ ම වචනය ක්‍රමයෙන් සුභාෂිත වේ යනු මෙහි අර්ථ යි. තවත් මෙහි සුභාෂිතත්වයෙන් ඉතිරි වූ කොටසක් ද ඇති බැව් පෙනෙන හෙයින් මේ සබ්බ ශබ්ද-යෙන් ගැනෙන්නේ කොටසෙකි. එහෙයින් මෙය **සප්පදෙස** නම් වේ. "සබ්බං වො භික්ඛවෙ දෙසෙස්සාමි චක්ඛුංචෙව රූපං ච—පෙ—මනඤ්ච ධම්මෙ ච" යන මෙහි **"ආයතන සර්වය"** ගැනෙයි. මහණෙනි! නුඹලාට සියලු ඇසත් රූපයත් —පෙ—සිතත් ධර්මයනුත් දෙසන්නෙමි යනු මෙහි අර්ථ යි. මෙහි චක්ඛායතන රූපායතන මනායතන ධම්මායතනයන් පිළිබඳ දතයුතුතාක් ධර්ම සමූහය නො පිරිහෙළා දක්වමි යි වදාළ වචනයෙන් ආයතන කොට්ඨාසයන් පිළිබඳ සප්‍රදේ-ශත්වය දක්වන හෙයින් "**ආයතනසර්ව**" නමැ යි කීහු. "සබ්බ ධම්ම මූලපරියායං වො භික්ඛවෙ දෙසෙස්සාමි" මහණෙනි! නුඹලාට සියලු ත්‍රෛභූමක ධර්මයන්ගේ මූල කාරණය කියන්නෙමි. යන මෙයින් **"සත්කාය සර්වය"** සප්‍රදෙශ

විෂය කොට දැක්වූහ. මේ සූත්‍රයෙහිදු විදර්ශනාවට අරමුණුවූ කාම රූපාරූප සංඛ්‍යාත සියලු ත්‍රෛභූමක ධර්මයෝ නිරවශෙෂයෙන් (ඉතිරි නොකොට) ම ගන්නා ලදහ.

**අනභිජානනය** = නොදැනීම නම් කුසලාකුසල සාවද්‍යනවද්‍ය සකන්ධ ධාතු ආයතන සත්‍යාදීන් පිළිබඳ විශෙෂයෙන් නොදැන්ම යි.

**අපරිජානනය** = පිරිසිඳ නොදැනීම නම් ත්‍රිවිධ පරිඥායෙන් නොදැන්ම යි. ඤාත පරිඥා, තීරණ පරිඥා පහාන පරිඥා යයි පරිඥාතොමෝ ත්‍රිවිධ වේ. මෙහි **ඤාත පරිඥා** නම් නාමරූප ධර්මයන් අතුරෙහි රූපය මෙතෙක, නාමය මෙතෙක, මෙයින් අධිකවූ රූපයෙක් හෝ නාමයෙක් නැතැයි භූත ප්‍රසාදාදි ප්‍රභේද වූ රූපය ද සපර්ශාදි ප්‍රභේදවූ නාමය ද ලක්‍ෂණ වශයෙන් කෘත්‍ය වශයෙන් ඵල වශයෙන් සමීප කාරණ වශයෙන් වෙන් කොට සලකා මේ සියල්ලට ම හේතුවූයේ කර්මය හා අවිද්‍යාවත් බව පිරිසිඳ දැනීම යි.

**තීරණ පරිඥා** නම්, මෙසේ දැන එ සියලු නාමරූපය ම අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන්දැයි මේ ආදීන් දෙසාළිස් ආකාරයෙන් නිශ්චය කිරීම යි.

**පහාන පරිඥා** නම් එසේ නිශ්චය කොට විදසුන් වඩා ආර්ය්‍ය මාර්ගඥානයෙන් දුරුකිරීමෙහි දැනීම යි. මෙසේ නොදැනීම අපරිජානනය යි.

**අවිරාජය** නම් විශිෂ්ටඥානයෙන් දතයුතු ධර්ම විෂයෙහි ද පිරිසිඳ දතයුතු ධර්ම විෂයෙහි ද තමන්ගේ චිත්ත සන්තානය නොඇලීමෙන් විරාගානුපස්සනාව නොඉපදවීම යි.

**සත්වන සූත්‍ර විවරණය යි.**

## 1 - 1 - 8

### **වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

**මානං** භික්ඛවෙ අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය, **මානං ච ඛො** භික්ඛවෙ අභිජානං පරිජානං තත්ථ චිත්තං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායාති,

**ඒත**මත්ථං භගවා අවොච, තත්ථේතංඉති වුච්චති —

**මා**නුපෙතා අයං පජා මානගන්ථා භවෙ රතා
මානං අපරිජානන්තා ආගන්තාරො පුනබ්භවං
යෙ ච මානං පහන්ත්වාන විමුත්තා මානසංඛයෙ
තෙ මානගන්ථාභිභුනො සබ්බදුක්ඛමුපච්චගුන්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

**අර්ථය:-**

පෙරසේ ය. **මානං ච ඛො**, මානය වනාහි; **අයං පජා,** මේ ප්‍රජාතොමෝ; **මානුපෙතා**, මානයෙන් යුක්ත වූවාහු; **මානගන්ථා**, මානයෙන් ගෙතිණි; භවෙ, කාමාදි භවයෙහි; **රතා**, ඇලුණිය; **මානං**, මානය; **අපරිජානන්තා**, පිරිසිඳ නොදත්තාහු; **පුනබ්භවං** පුනර්භවයට; **ආගන්තාරො,** පැමිණෙන්නාහුය; **යෙ**, යම් කෙනෙක්; **මානං**, මානය; **පහන්ත්වාන**, දුරුකොට; **මානසංඛයෙ**, අර්හත්ඵලයෙහි; **විමුත්තා**, කෙලෙසුන් කෙරෙන් මිදුණාහු වෙත් **ද**, **මානගන්ථාභිභුනො**, මානග්‍රන්ථයන් මැඩපැවැත්වූ; **තෙ**, ඔවුහු **සබ්බදුක්ඛං**, සියලු දුක; **උපච්චගුං** ඉක්මවූහ.

**භාවය:-**

කර්මක්ලේශයන් විසින් උපදවනලද හෙයින් ප්‍රජා නම්වූ මේ සත්වයෝ මැනීම් ලක්‍ෂණ මානයෙන් යුක්තවූවාහු පණ්ඩු ගැඩවිල් පළගැටි ආදි කුඩා අත්බැව්හිදු මානයෙන් ගෙතුනාහු මානසංයොජනයෙන් යුක්තවූවාහු බොහෝ කලක් පුරුදු

කරතල ද අහඞ්කාර වශයෙන් මමය මගේය යි සංස්කාරයන් ගිල අවසන් කොට ගත්තාහු එහි නිත්‍ය ධ්‍රැව සුභ සුඛ විපල්ලාසාදි වශයෙන් කාමාදි භවයන්හි ඇලුණාහු මානය පිරිසිඳ නොදන්නාහු යළිත් සංසාරයෙහි ඔබමොබ පෙරළීම් වශයෙන් පවත්නාහු භවයෙන් නොමිදෙත්

යම් කෙනෙක් අර්හත් මාර්ගඥානයෙන් සියලු අත්දමින් මානය දුරු කොට මානයාගේ නිරවශෙෂ ප්‍රහාණයවූ අභීත් ඵලයට හෝ නිවනට පැමිණ ඒ මානය හා සමග පවත්නාවූ අනික් කෙලෙසුන් සහිතව මිදුණාහු වෙත් ද, ක්‍ෂයකරන ලද භවබන්ධන ඇති එරහත්හු මානග්‍රන්ථය සහමුලින් සිඳ සියලු සසරදුක ඉක්මවූහ.

## අටවන සූත්‍ර විවරණය යි

## 1 - 1 - 9

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

ලොභං භික්ඛවෙ අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය, ලොභං ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං තත්ථ චිත්තං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායාති,

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

යෙන ලොභෙන ලුද්ධාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං ලොභං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචනන්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

**අර්ථය:-** පෙරසේම යි.

**භාවය:-** සුගම යි.

**ධම්මවිස්තර**:-

"නවම දසමෙසු අපුබ්බං නත්ථි, දෙසනා විලාසෙන; තථා බුජ්ඣනකානං වෙනෙය්‍යානං අජ්ඣාසයවසෙන වා තථා දෙසිතානීති දට්ඨබ්බං" යි **අට්ඨකථායෙහි** දැක්වූ බැවින් නවවන දසවන සූත්‍රයන්හි අපූරුවෙක් නැත. දේශනාවිලාශ වශයෙන් හෙවත් තථාගතයන් වහන්සේගේ ධර්මදේශනාව පවත්වන ආකාරය වසයෙන් ද ධර්මාවබොධය කරන වෛනෙය සත්වයන්ගේ අදහස් වශයෙන් ද එසේ දෙසන ලදැයි දතයුතු.

## නවවන සූත්‍ර විවරණය යි

## 1 – 1 – 10

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති** මෙ සුත්තං

**දොසං** භික්ඛවෙ අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයායාති, දොසඤ්ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං තත්ථ චිත්තං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායාති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

යෙන දොසෙන දුට්ඨාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං දොසං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචනන්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති

**පඨමො වග්ගො**

**අර්ථය**:- පෙරසේ ය.

**භාවය**:- සුගම යි.

**ධර්මවිස්තර**:-

අප තථාගත සම්මාසම්බුදුරජාණන් වහන්සේ ලොභ දෙස මොහ ක්‍රොධ මක්ඛ මාන යන කෙලෙසුන් සදෙන දුරු කරන්නහුට අනාගාමි භාවය පිණිස ඇපවෙන බව සූත්‍ර සයෙකින් ම වදාළසේක.

එහි අනාගාමීහු කවරහු ද යත්? ඔව්හු සතළිස් දෙනෙකි එනම්:– අවිහඝ අතප්පය සුදස්සය සුදස්සීය අකනිඨය යි අනාගාමීහු පස්දෙනෙකි. ඔවුන් අතුරෙහි අවිහ නම් බඹලොව උපන්නෝ අවිහ නම් වෙත්. ඔව්හු අන්තරාපරිනිබ්බායීය උපහච්චපරිනිබ්බායීය අසඞ්ඛාර පරිනිබ්බායීය සසඞ්ඛාර පරිනිබ්බායීය උද්ධංසොත අකනිට්ඨගාමී යයි පස්වැරුම් වෙත්. අතප්පය සුදස්සය සුදස්සීය යන මේ තුන් බඹලෙව්හි උපන්නෝත් එසේම පස් පස් වැදෑරුම් වෙත්. අකනිට්ඨා–යෙහි වනාහි උද්ධංසොත අනාගාමියෙක් නැත.

එහි යමෙක් අවිහාදියෙහි ඉපද අයුෂයාගේ අඩියකුදු නො ඉක්මවා රහත් වේ ද, මේ "අන්තරා පරිනිබ්බායී" නම් වේ. යමෙක් අවිහාදියෙහි ඉපද කල්ප පන්සියයක් ප්‍රභේද ඇති ආයුෂයාගේ අඩියක් ඉක්මවා රහත් වේ ද මෙතෙම "උපහච්චපරිනිබ්බායී" නම් වේ. යමෙක් අධික වීර්‍ය්‍ය නො කොට නිදුක් සේ රහත් වේ ද මෙතෙම "සසංඛාර පරිනිබ්බායී" නම් වේ. අවිහාදියෙහි ඉපිද රහත් වන්නට නොහැකි ව එහි ආයු ඇති තාක් සිට උත්පත්ති වශයෙන් අකනිට්ඨාවට යන තැනැත්තේ "අකනිට්ඨගාමී" නම් වේ. ඔහුගේ තෘෂ්ණාශ්‍රොතස හා වට්ටසොතසත් ශ්‍රොතසක් (සැඩපහරක්) මෙන් උඩට ගෙන යන ගතියෙන් යුත් හෙයින් උද්ධංසොත ය යි ද කියනු ලැබේ.

මේ පුද්ගලතෙම සියූ වැදෑරුම් වේ. කෙසේ ද යත්? අවිහ බඹලොව පටන් බඹලොව සතරෙක පිළිවෙළින් ඉපද අකනිට්ඨාවට ගොස් රහත්වන ආර්‍ය්‍යතෙම "උද්ධංසොත අකනිට්ඨගාමී" නම් වේ. යමෙක් අවිහය අතප්පය සුදස්සය යන තුන් බඹලොව ඉපද අකනිට්ඨාවට නො ගොසින්ම සුදස්සී බඹලෙව්හිදී රහත් වේ ද හෙතෙම "උද්ධංසොත න අකනිට්ඨගාමී" නම් වේ. යමෙක් අවිහ බඹලොවින් අකනිට්ඨා–වට ම ගොස් රහත් වේ ද හෙතෙම "න උද්ධංසොත අකනිට්ඨගාමී" නම් වේ. යමෙක් අවිහාදි යට බඹලෙව් සතරෙහි ඒ ඒ තන්හිදී ම පිරිනිවේ ද හෙතෙම "න උද්ධං සොත න අකනිට්ඨගාමී" නම් වේ.

(අවිහයෙහි ඉපද කල්පසියයෙකින් මතුයෙහි පිරිනිවෙන ආයශී පුද්ගලයෙක, කල්ප දෙසියයෙකින් මත්තෙහි පිරිනිවෙන ආයශීයෙක, කල්ප පන්සියයක් නො ඉක්මවන කල්හිම පිරිනිවෙන ආයශීයෙකැයි අනතරාපරිනිබ්බායීහු තුන්දෙනෙක. උපහච්චපරිනිබ්බායී එකෙක, උද්ධංසොත එකෙක)

ඔවුන් අතුරෙහි අසඞ්ඛාර පරිනිබ්බායී පස්දෙනෙක, සසඞ්ඛාර පරිනිබ්බායී පස්දෙනෙකැයි දසදෙනෙක් වෙත්. එසේම අතප්පය සුදස්සය සුදස්සීය යන තුන් බඹලෙව්හි දසය දසය බැගින් ගෙන සතළිසෙකි. අකනිට්ඨායෙහි (උද්ධංසොත ආයශීයකු නැති බැවින් අනතරා පරිනිබ්බායීහු තුන්දෙනෙක, උපහච්ච පරිනිබ්බායී එකෙක) අසඞ්ඛාර පරිනිබ්බායීහු සතර දෙනෙක සසඞ්ඛාර පරිබ්බායීහු සතර දෙනෙකැයි අට දෙනෙක් වෙති. මෙසේ අනාගාමීහු අටසාළිසෙක් වෙත්.

**දස වන සූත්‍ර විවරණය යි.**

ඉතිවුත්තක පාළියෙහි **ප්‍රථම වර්ගය** සමාප්ත යි.

---

## දෙවන වර්ගය

### 1 - 2 - 1

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

මොහං භික්ඛවෙ අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය, මොහඤ්ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං තත්ථ චිත්තං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායාති, එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

යෙන මොහෙන මූළ්හාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං මොහං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචනන්ති,

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති,

**අර්ථය**:– පෙර සේම යි. **භාවය**:– සුගම යි.

**ධර්මවිස්තර**:– පළමු කී අයුරු යි.

**පළමු වන සූත්‍ර විවරණය යි**

**1 – 2 – 2**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

**කොධඤ්ච** ඛො භික්ඛවෙ අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය, **කොධඤ්ච** ඛො භික්ඛවෙ අභිජානං පරිජානං තත්ථ චිත්තං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායාති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති
යෙන කොධෙන කුද්ධාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං කොධං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචනන්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති—

**අර්ථය**:– පෙර සේ ය. **භාවය**:– සුගමයි.

**ධර්ම විස්තර**:– පළමු කී අයුරු යි.

**දෙවෙනි සූත්‍ර විවරණය යි.**

**1 – 2 – 3**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

**මක්ඛං** භික්ඛවෙ අනභිජානං අපරිජානං තත්ථ චිත්තං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය, **මක්ඛං** ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං තත්ථ චිත්තං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායාති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

යෙන මොහෙන මූළ්හාසෙ සත්තා ගච්ඡන්ති දුග්ගතිං
තං මොහං සම්මදඤ්ඤාය පජහන්ති විපස්සිනො
පහාය න පුනායන්ති ඉමං ලොකං කුදාචනන්ති

**අර්ථය**:- පෙර සේ ය. **භාවය**:- සුගම යි.

**ධර්ම විස්තර**:- පළමු කී අයුරු යි.

**තුන්වන සූත්‍ර විවරණය යි.**

**1 - 2 - 4**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

නාහං භික්ඛවෙ අඤ්ඤං එකනීවරණම්පි සමනුපස්සාමි යෙන නීවරණෙන නිවුතා පජා දීඝරත්තං සන්ධාවන්ති සංසරන්ති, යථයිදං භික්ඛවෙ **අවිජ්ජානීවරණං**, අවිජ්ජා නීවරණෙන හි භික්ඛවෙ නිවුතා පජා දීඝරත්තං සන්ධාවන්ති සංසරන්තීති,

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති-

නත්ථඤ්ඤො එකධම්මොපි යෙනෙවං නිවුතා පජා
සංසරන්ති අහොරත්තං යථා මොහෙන ආවුතා
යෙ ච මොහං පහන්ත්වාන තමොක්ඛන්ධං පදාලයුං
න තෙ පුන සංසරන්ති හෙතු තෙසං න විජ්ජතී-ති

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

**අර්ථය**:-

**භගවතා**, භාග්‍යවත්හු විසින්; **එතං**, මේ දේශනාව; **වුත්තං හි**, වදාරනලද්දේම ය; **අරහතා**, අතීත් වූ තථාගතයන් වහන්සේ විසින්; **වුත්තං ඉති**, වදාරන ලද්දේ ය යනු; මෙ, මාගේ; **සුතං**, ඇසීම වේ; **භික්ඛවෙ**, මහණෙනි; **යෙන නීවරණෙන**, යම් නීවරණයෙකින්; **නිවුතා**, වැසුණා වූ; **පජා**, ප්‍රජාවෝ; **දීඝරත්තං**, බොහෝ කලක්; **සන්ධාවන්ති**,

සසරෙහි දිවෙත් ද; **සංසරන්ති**, හැසිරෙත් ද; (එබඳු වූ) **අඤ්ඤං එකනීවරණම්පි**, අනික් එක් නීවරණයකුදු; **න සමනුපස්සාමි**, නොදක්නෙමි; ඒ කවරේ ද යත්? **භික්ඛවෙ**, මහණෙනි; **යථා ඉදං**, යම් මේ; **අවිජ්ජානීවරණං**, අවිද්‍යා නීවරණය යි; **භික්ඛවෙ**, මහණෙනි; **අවිජ්ජා නීවරණෙන හි**, අවිද්‍යානීවරණයෙන් වනාහි; **නිවුතා**, වළඳනාලද; **පජා**, ප්‍රජාවෝ; **දීඝරත්තං**, බොහෝ කලක්; **සන්ධාවන්ති**, දිවෙත්; **සංසරන්ති**, හැසිරෙත් යයි වදාළසේක. **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **එතමත්ථං**, මේ කාරණය; **අවොච**, වදාළසේක; **තත්ථ**, එහි ලා **එතං ඉති**, එතං (මේ) යි; **වුච්චති**, කියනු ලැබේ.

**යෙන** ච, යම නීවරණයකින් ම; **නිවුතා**, ගෙතුණා වූ; **පජා**, ප්‍රජාවෝ; **යථා**, යම් සේ; **මොහෙන**, මෝහ නම් ලද අවිද්‍යායෙන්; **ආවුතා**, වළඳනා ලද්දාහු; **අහොරත්තං**, දිවා රෑ දෙක්හි; **සංසරන්ති**, හැසිරෙත් ද; එබඳු වූ; **අඤ්ඤො එකධම්මො** ච, (මේ හැර) අනික් එක ම ධර්මයෙක්; **නත්ථි**, නැත්තේ ය.

**යෙ ච**, යම් කෙනෙක්; **මොහං**, මෝහය; **පහන්ත්වාන**, නසා; **තමොක්ඛන්ධං**, මෝහසකන්ධය; **පදාලයුං**, සිත්දාහු ද; **තෙ**, ඔව්හු; **පුන**, නැවත; **න සංසරන්ති**, සසරෙහි නො හැසිරෙත්; **තෙසං**, ඔවුන්ට; **හෙතු**, සසර සැරිසැරීමට හේතුවක්; **න විජ්ජති**, විද්‍යමාන නො වේ.

**භගවතා**, භාග්‍යවත්හු විසින්; **අයම්පි අත්ථො**, මේ මතු කියනු ලබන දේශනාව ද, **වුත්තො ඉති**, වදාරනලද්දේ ය යනු; මෙ, මාගේ; **සුතං**, ඇසීම යි.

**භාවය**:-

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ දේශනාව මෙසේ වදාරනලදි. අතීත් වූ සම්‍යක් සම්බුද්ධයන් විසින් මෙසේ වදාරන ලදැයි මාගේ ඇසීම වේ. මහණෙනි! යම්

නීවරණයෙකින් වැසුණාවූ සත්‍වයෝ උපදිමින් මැරෙමින් බොහෝ කලක් සසර ගමන් කෙරෙත් ද, හැසිරෙත් ද, එබඳු වූ මේ මතු කියනු ලබන අවිද්‍යා නීවරණය හැර අන් කිසි එක ම නීවරණයකුදු මාගේ නුවණැසින් නො දක්නෙමි. මහණෙනි! හේ කවර නීවරණයෙක් ද? අවිද්‍යානීවරණය යි, මහණෙනි! අවිද්‍යානීවරණයෙන් ආවරණය වූ සත්‍වයෝ සසරෙහි සන්ධාවනය සංසරණය කෙරෙති. භාග්‍යවත්හු මේ කාරණය මෙසේ වදාළහ. එහි (අප විසින්) මේ යයි කියනු ලැබේ.

යම් නීවරණයෙකින් වළඳනා ලද සත්‍වයෝ යම් ප්‍රකාරයෙකින් අවිද්‍යානීවරණ සංඛ්‍යාත මෝහයෙන් යුක්ත වූවාහු සියලු කල්හි ම සසර හැසිරෙත් ද එයට හේතු වූ මේ අවිද්‍යාව හැර එබඳු වූ අන් කිසිදු කරුණක් නැත්තේ ය. යම් ආර්‍ය්‍ය ශ්‍රාවක කෙනෙක් පූර්‍වභාගයෙහි තදඞ්ගප්‍රහාණාදි වශයෙන් හෝ යට යට මාර්‍ගයෙන් හෝ මෝහය දුරු කොට අග්‍ර මාර්‍ග නම් වූ අර්‍හත් මාර්‍ගඥානයෙන් මොහ නම් ලද තමොරාශිය නිරවශෙෂයෙන් දුරු කළාහු ද ඒ ආර්‍ය්‍යයෝ නැවතත් මෙ සසරෙහි නො හැසිරෙත් ඔවුන්ට සසර හැසිරීමට හේතුවක් නැති හෙයිනි.

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ මතු කියනු ලබන දේශනාව ද වදාරන ලදැයි මා විසින් අසන ලදි.

**ධර්මවිස්තර**:–

**න සමනුපස්සාමි** – සමනුපස්සනා (දැකීම) තොමෝ දෙවැදෑරුම් වන්නී ය. දිට්ඨිසමනුපස්සනා ඤාණසමනුපස්සනා කියා යි. එහි "රූපං අත්තතො සමනුපස්සති" (රූපය ආත්ම වශයෙන් දකී) යන මේ ආදි ක්‍රමයෙන් සලකනු ලබන්නී **දිට්ඨිසමනුපස්සනා** නමු. "අනිච්චතො සමනුපස්සති නො නිච්චතො" (අනිත්‍ය වශයෙන් දකියි නිත්‍ය වශයෙන් නොදකී) යන ආදි ක්‍රමයෙන් සලකනු ලබන්නී **ඤාණසමනුපස්සනා** නමු. මෙහි ඤාණසමනුපස්සනාව ම අදහස් කරන

ලදී ඥාන නම් වූ සමන්තැසින් සියලු ධර්මයන් හස්තාමලකයක් මෙන් දක්නෙම් මේ හැර අනික් එක් නීවරණයකුදු නො දකිමි යනු මෙයින් පවසයි.

**නීවරණ** — සත්වයන්ගේ ස්වර්ග මෝක්ෂ දෙක ම අහුරන කෙලෙශය නීවරණ නම් වේ. නීවරණයෙන් යුත් පුද්ගලයකුහුගේ සන්තානයෙහි කිසි ම ගුණයෙක් නො රැඳෙන්නේ ය. අලු පෙරන පෙරහන දළ හෙයින් වතුර කළ සියයක් දහසක් නමුදු වත්කළ කල්හි දියත්තකුදු (දිය සවල්පයකුදු) නොරැඳෙන්නාක් මෙනි. නීවරණයෝ පසෙකි. කාමච්ඡන්දනීවරණය, ව්‍යාපාද නීවරණය, ථිනමිද්ධනීවරණය, උද්ධච්චකුක්කුච්චනීවරණය, විචිකිච්ඡානීවරණය කියා යි. අකුසල් රැසෙක, අකුසල් මුලෙකැයි යමක් සඳහා වදාරන ලද නම් එය මේ පඤ්ච නීවරණයන් සඳහා ම ය. "කෙවලො හයං භික්ඛවෙ අකුසලරාසි ඉමෙ පඤ්චනීවරණා' යනු වදාළ හෙයින් මේ පඤ්චනීවරණයෝ නම් තනිකර ම අකුසල් රැසෙකි.

**සන්ධාවන – සංසරණ** – නීවරණ ස්වභාවය ඇති හෙයින් ආර්‍ය්‍යමාර්ගී ප්‍රතිවේධය කිරීමෙහි අපොහොසත් වූ සත්වයෝ අනාදිමත් වූ සසරෙහි බොහෝ කල්පයන්හි කුඩා මහත් භවයන්හි ඔබමොබ උත්පත්ති වශයෙන් දිවීම හා හැසිරීම ද කෙරෙති. අරමුණු අතරෙහි ගමන් කිරීම් වශයෙන් පැවැත්ම සන්ධාවනය යි. භවයෙන් භවයෙහි හැසිරීම සංසරණය යි. කෙලෙසුන් ප්‍රබල බැවින් සන්ධාවනය ද, දුර්වල බැවින් සංසරණය ද, ඇසිල්ලෙන් ඇසිල්ලෙහි මැරීම් වශයෙන් එක් ජන්මයෙක්හි සන්ධාවනය ද, නොයෙක් ජන්මයන්හි ව්‍යවහාර මරණ වශයෙන් සංසරණය ද, "චිත්තමස්ස විධාවති" යනු වදාළ හෙයින් චිත්තපරම්පරා සම්බන්ධ වශයෙන් සන්ධාවනය ද, කාය වශයෙන් සංසරණය දැයි මෙසේ සංධාවන සංසරණයන්ගේ වෙනස දතයුතු,

**අවිජ්ජානීවරණය** — විඳින්ට නුසුදුසු හෙයින් කාය-දුශ්චරිතාදිය අවින්දිය නම වේ. ඒ නොවිඳිය යුත්ත විඳිනු යි

අවිද්‍යා නමු. මෙය ම විපයර්‍යාස වශයෙන් ගත්කල කාය සුචරිතාදිය විඳිය යුතු ධර්ම නම් වේ. ඒ විඳිය යුත්ත නො විඳිනු යි අවිද්‍යා නමු. ස්කන්ධයන්ගේ රාශ්‍යර්ථය, ආයතනයන් ගේ රැස් කිරීම් අර්ථය, ධාතූන්ගේ හිස් වූ අර්ථය, ඉන්ද්‍රියයන් ගේ ආධිපත්‍යර්ථය, සත්‍යයන්ගේ නොවෙනස් වූ අර්ථය, දුඃඛාදීන්ගේ පීඩාකිරීම් ආදි සිවුවැදෑරුම් අර්ථය නො දනීනු යි අවිද්‍යා නමු. සත්ත්වයන් සසරෙහි දිවවානුයි අවිද්‍යා නමු. පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන වූ ස්ත්‍රී පුරුෂාදීන් පවතී යයි හෝ විද්‍යමාන වූ ස්කන්ධාදීන් නො පවතී යයි සැලකීම් ද අවිද්‍යා නම් වේ. චක්ෂුර්විඥානාදි වස්තූන්ගේ හා ඔවුන්ට අරමුණු වන ධර්මයන්ගේ ද පටිච්චසමුප්පාද පටිච්චසමුප්පන්න නම් ලද හෙතු ඵල ධර්මයන්ගේ ද වැසීම කරන හෙයින් අවිද්‍යා නම් වේ. අවිද්‍යා තොමෝ ම නිවන අහුරන හෙයින් **අවිජ්ජා නීවරණ** නමැයි දතයුතු,

කුමක් හෙයින් මේ සූත්‍රයෙහි සෙසු නීවරණ ධර්මයන් නොගෙන අවිද්‍යා නීවරණය ම කියන ලද ද යත්? සියල්ලෙහි දෙස් වසන හෙයින් හා කාමච්ඡන්දාදි සෙසු නීවරණයන්ට විශෙෂයෙන් ද ප්‍රත්‍යය වන හෙයිනි, අවිද්‍යාවෙන් වසන ලද අරමුණෙහි කාමච්ඡන්දාදීහු පවතිත්.

## සතර වන සූත්‍ර විවරණය යි

## 1 – 2 – 5

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

නාහං භික්ඛවෙ අඤ්ඤං එකසංයොජනම්පි සමනුපස්සාමි යෙන සංයොජනෙන සංයුත්තා සත්තා දීඝරත්තං සන්ධාවන්ති සංසරන්ති, යථයිදං භික්ඛවෙ **තණ්හාසංයොජනං,** තණ්හාසංයොජනෙන භික්ඛවෙ සංයුත්තා සත්තා දීඝරත්තං සන්ධාවන්ති සංසරන්තීති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

තණ්හා දුතියො පුරිසො දීඝමද්ධානසංසරං
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති
එවමාදීනවං ඤත්වා තණ්හං දුක්ඛස්ස සම්භවං
වීතතණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙති,

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති,

**අර්ථය**:– පෙර සේ යි,

**එකසංයොජනම්පි,** එක සංයොජනයකුදු, **තණ්හා සංයොජනං**, තෘෂ්ණා සංයොජනයයි යනු වෙතසි. **තණ්හා දුතියො,** තෘෂ්ණාව සහාය කොට ඇති; **පුරිසො,** පුරුෂතෙම; **දීඝං අද්ධානං**, දීඝී වූ කාලයක්; **සංසරං**, හැසිරෙන්නේ; **ඉත්ථභාවඤ්ඤථාභාවං**, මනුෂ්‍යාත්මභාවය හා අවශෙෂ ආත්මභාව සඞ්ඛ්‍යාත ඉත්ථභාවඤ්ඤථාභාව නම් වූ; **සංසාරං**, සසර; **නාතිවත්තති**, නො ඉක්මවයි; **දුක්ඛස්ස සම්භවං**, දුක්ඛයාගේ හටගැනීම වූ; **තණ්හං**, තෘෂ්ණාව; **එවං ආදීනවං**, මෙබඳු ආදීනව ඇත්තේ යයි; **ඤත්වා**, දැන; **වීතතණ්හො**, පහවූ තෘෂ්ණා ඇති; **අනාදානො**, ගැනීම් රහිත වූ; **සතො**, සිහි ඇත්තා වූ; **භික්ඛු**, මහණතෙම; **පරිබ්බජෙ**, හැසිරෙන්නේ ය යනු ගාථාර්‍ථ යි.

**භාවය**:–

ගාථාවන්ගේ භාවය මෙසේ යි. තණ්හාව දෙවෙනි කොට නොහොත් භායඞ්ාව වශයෙන් යහළු කොට ඇතිව බොහෝ කලක් සසර හැසිරෙන තැනැත්තේ මේ ආත්ම භාවය හා අනාගත ආත්මභාව නම් වූ සසර නො ඉක්මවයි, දුක්ඛයාගේ හටගැනීම වූ තෘෂ්ණාව මෙබඳු දෙෂ ඇත්තී යයි නුවණින් දැන දුරුකළ තෘෂ්ණා ඇති උපාදාන රහිත වූ භික්ෂුතෙම සිහි ඇතිව හැසිරෙන්නේ ය.

**ධර්ම විස්තර**:–

**තණ්හාසංයොජන** = කර්ම විපාකයන් හේතුකොට ගෙන මේ සත්වයා සියලු සංසාර දුකෙහිත් සියලු සත්වාවාසයන්හිත් යොදනුයි සංයොජන නම් වේ, ආසක්තිරීම් අර්ථයෙන්

තණ්හා නම්. තෘෂ්ණා තොමෝ ම සංයොජන වූවා තණ්හාසංයොජන නම් වේ. අවිද්‍යායෙහි ම සංයෝජන භාවයත් තණ්හායෙහි ම නීවරණ භාවයත් ඇත ද, අවිද්‍යායෙන් වසන ලද අයුණු ඇති භවයෙහි තෘෂ්ණා තොමෝ සත්වයන් යොදවන්නීනු යි පළමු සූත්‍රයෙහි අවිද්‍යාව නීවරණයක් වශයෙන් ද, දෙවන සූත්‍රයෙහි තෘෂ්ණාව සංයෝජනයක් වශයෙන් ද, දක්වන ලදී. අවිද්‍යා තොමෝ නීවරණයක් වශයෙන් සියලු කෙලෙසුන්ට ප්‍රමුඛ වන්නී ය, තෘෂ්ණා තොමෝ සංයොජනයක් වශයෙන් කෙලෙසුන් යොදන්නීය. "අවිජ්ජා නිබ්බානමුඛං නිවාරෙතී'ති නීවරණං, තණ්හා සංසාරදුක්ඛෙන සත්තෙ සංයොජෙතී'ති සංයොජ-නං'ති දස්සනගමනන්තරායකරණතො වා විජ්ජාචරණ විපක්ඛතො ද්වයං ද්විධා වුත්තං" යනු අට්ඨකථායෙහි ආ බැවින් අවිද්‍යාව නිවන් ආවරණය කරන බැවින් නීවරණය යි ද, තණ්හාව සසර දුක හා සමග සත්වයන් යොදන හෙයින් සංයොජනය යි ද, මාර්ගාධිගමයෙන් නිවනට පැමිණවීමෙහි අන්තරායකර ධර්මයක් හෙයින් ද ප්‍රඥව හා සීල සමාධි නම් ලද විජ්ජාචරණ ධර්මයන්ට විරුද්ධ හෙයින් ද, දෙක දෙපරිද්දක් කොට දක්වන ලදී.

විශෙෂයෙන් සලකත් හොත් මූලාව බලවත් බැවින් අවිද්‍යාව සත්වයා පිළිබඳ අතීත අධ්ව (කාල) යට ද ප්‍රාර්ථනාව බලවත් බැවින් තණ්හාව අනාගත අධ්වයට ද ඇතුළත්. ඒ එසේ මැයි. අනුවණ ජනතෙමේ අතීතය පිළිබඳව ශොක කෙරෙයි. එසේ ම ඔහට අතීත හේතු වූ අවිද්‍යායෙන් වර්තමාන ඵලය වූ සංස්කාරයෝ ලැබෙති. එහෙයින් "අවිජ්ජා පච්චයා සඞ්ඛාරා" යනු වදාළහ. පැතීම බහුල කොට ඇති තැනැත්තේ නොපැමිණි දෙයක් ම පතයි. එසේ ම ඔහට සාමාන්‍ය ආසායෙන් බලවත් ආසාව හට ගනියි. එහෙයින් "තණ්හා පච්චයා උපාදානං"යි වදාළහ.

**තණ්හාදුතිය** = නිරුදකකාන්තාරයෙහි පවසින් පීඩිතව සත්තහුට මිරිඟුවෙන් උදකසංඥාව උපදවා සිත් අලවන්නාක් මෙන් තණ්හාතොමෝ ද සංස්කාර ධර්මයන් කෙරෙහි ආසාව උපදවමින් සහායකෘත්‍යය කරන්නී ය.

**ඉත්ථභාවඤ්ඤථාභාවං** = ඉත්ථභාවය නම් මිනිසත්බව යි. අඤ්ඤථාභාවය නම් සෙසු සත්ත්වාවාස යි. නොහොත් ඉත්ථභාවය නම් සත්ත්වයන්ගේ වර්තමාන ආත්මභාවය යි. අඤ්ඤථාභාවය නම් අනාගත ආත්මභාවය යි. සසර සැරිසරන්නා වූ යම්කිසි සත්ත්වයෙක් යම්තාක් මිනිසත් බව ම ලබා ද එය ඕහට ඉත්ථභාව නම් වේ. දෙව බ්‍රහ්මාදි වෙනස් වෙනස් අත්බැව් ලබා ද එය අඤ්ඤථාභාව නම් වේ යයි දතයුතු-

**පස්වන සූත්‍ර විවරණය යි**

## 1 - 2 - 6

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

සෙඛස්ස භික්ඛවෙ භික්ඛුනො අප්පත්තමානසස්ස අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානස්ස විහරතො අජ්ඣත්තිකං අඞ්ගන්ති කරිත්වා නාඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි එවං බහූපකාරං, යථයිදං භික්ඛවෙ **යොනිසො මනසිකාරො**, යොනිසො භික්ඛවෙ භික්ඛු මනසිකාරොන්තො අකුසලං පජහති කුසලං භාවෙතීති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

යොනිසො මනසිකාරො ධම්මො සෙඛස්ස භික්ඛුනො
නත්ථඤ්ඤො එවං බහුකාරො උත්තමත්ථස්ස පත්තියා
යොනිසො පදහං භික්ඛු ඛයං දුක්ඛස්ස පාපුණෙ'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත්තන්ති.

අර්ථය:-

**භික්ඛවෙ,** මහණෙනි; **අප්පත්තමානසස්ස,** නොපැමිණි අර්හත්වය ඇති; **අනුත්තරං,** උතුම් වූ; **යොගක්ඛෙමං,** අර්හත්වය; **පත්ථයමානස්ස,** පතමින්; **විහරතො,** වාසය කරන්නා වූ; **භික්ඛුනො,** මහණහට; **අජ්ඣත්තිකං,** තමාංසතන්හි වූ; **අඞ්ගං,** කාරණය; **ඉති,** මෙසේ; **කරිත්වා,** කොට; **එවං බහූපකාරං,** මෙසා බොහෝ උපකාර වූ; **අඤ්ඤං එකඞ්ගමපි,** අනික් එක් කාරණයකුදු; **න සමනුපස්සාමි,** නො දකිමි.

යේ කවරේ ද යත්? **භික්ඛවෙ,** මහණෙනි; **යථා ඉදං,** යම් මේ; **යොනිසො මනසිකාරො,** නුවණින් මෙනෙහිකිරීම වේ; **භික්ඛවෙ,** මහණෙනි, **යොනිසොමනසිකරොන්තො,** නුවණින් මෙනෙහි කරන්නාවූ; **භික්ඛු,** මහණතෙම; **අකුසලං,** අකුසලය; **පජහති,** දුරුකෙරෙයි; **කුසලං,** කුසලය; **භාවෙති,** වඩයි යනු යි. භගවා, භාග්‍යවත්තෙම; **එතං අත්ථං,** මේ කාරණය; **අවොච,** වදාළේය. **තත්ථ,** ඒ දේශනා-යෙහි; **එතං ඉති,** මේ යයි; **වුච්චති,** කියනු ලැබේ. **සෙඛස්ස භික්ඛුනො,** ශෛක්‍ෂ මහණහට; **උත්තමත්ථස්ස පත්තියා,** අර්හත්වයට පැමිණීම පිණිස; **යොනිසොමනසිකාරො ධම්මො,** නුවණින් මෙනෙහිකිරීම් සංඛ්‍යාත ධර්මයෙක් වේ ද; **එවං බහුකාරො,** මෙසා බොහෝ උපකාරවූ; **අඤ්ඤො,** අන් කිසි ධර්මයෙක්, **නත්ථි,** නැත්තේ ය. **යොනිසො,** නුවණින්; **පදහං,** වීර්‍යයකරන්නා වූ; **භික්ඛු,** මහණතෙම; **දුක්ඛස්ස** දුක්ඛයාගේ; **ඛයං,** ක්‍ෂයට හෙවත් නිර්වාණයට; **පාපුණෙ,** පැමිණෙන්නේ ය.

භාවය:-

මහණෙනි! නොපැමිණි අර්හත්වය ඇති උතුම් අර්හත්වය පතමින් වසන්නා වූ ත්‍රිවිධ ශික්‍ෂායෙහි හික්මෙන භික්‍ෂුවට තමා සතන්හි උපන් මෙසා මහත් උපකාර වූ අනික් එක කෙරුණකුදු නුවණින් නො දක්නෙමි. හේ කවර කරුණෙක් ද

යත්? මහණෙනි යම් මේ නුවණින් මෙනෙහි කිරීමෙක් වේ ද එය යි. මහණෙනි! නුවණින් මෙනෙහි කරන භික්ෂු තෙම අකුසල් දුරුකෙරෙයි. කුසල් වඩයි.

සෙඛමහණහට නිවනට පැමිණීම පිණිස යොනිසො මනස්කාර ධර්මය හැර මේසා මහත් උපකාර ඇති අනෙක් ධර්මයක් නැත්තේ ය. නුවණින් විසඳීකරන්නාවූ භික්ෂුතෙම නිවනට පැමිණෙන්නෙක් වේ යනු යි.

**ධර්ම විස්තර- සෙඛ**

ත්‍රිවිධ ශික්ෂායෙහි හික්මෙන භික්ෂුතෙම ශෛක්‍ෂ නම් වේ. අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥ යනු ත්‍රිවිධ ශික්ෂා යි. සම්‍යක්දෘෂ්ටි ආදි ආර්‍ය මාර්‍ගාඞ්ගයෙන් යුක්ත වේ නම් එපමණෙකිනුත් ශෛක්‍ෂ නම් වේ. ශ්‍රොතාපත්ති මාර්‍ගයෙහි පටන් පිළිවෙළින් මාර්‍ග සතර හා ඵල තුනකුත් සෙඛභූමිය යි කියනු ලැබේ. අර්හත්ඵලය අසෙඛභූමිය යි, යම්කිසි කල්‍යාණ පෘථග්-ජනයෙක් සීලයෙන් යුක්ත වේ ද ඉඳුරන් රක්නේ වේ ද වැළඳීමෙහි පමණ දන්නේ වේ ද නිදිවර්ජිත කිරීමෙහි යෙදුණේ වේ ද පෙරපසු රාත්‍රිවල බොධිපාක්ෂික ධර්මයන් වැඩීමෙහි යෙදී වෙසේ ද අද හෝ සෙට යම්කිසි මාර්‍ගඵලයකට පැමිණෙන තරම් ගුණසම්පන්නයෙක් වේ ද, හෙතෙමේත් ශෛක්‍ෂය යි කියනු ලැබේ.

**යොනිසොමනසිකාර**

සිත යම් කිසි අරමුණෙක යොදවන චෛතසිකය මනසිකාරය යි. අරමුණක් හා සිත යොදවන්නේ මේ චෛතසිකයාගේ බලයෙනි. "පුරිමමනතො විසදිසං මනං කරොතීති මනසිකාරො." පළමු පැවති සිතින් වෙනස් ගතියකට පමුණුවා නු යි. මනසිකාර නම්. "සො සාරණ ලක්ඛණො, සම්පයුත්තානං ආරම්මණෙ සංයොජනරසො, ආරම්මණාභිමුඛභාව පච්චුපට්ඨානො, ආරම්මණ පදට්ඨානො" හෙතෙම සිහිකරවීම ලක්ෂණ කොට ඇත්තේ ය. තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් අරමුණෙහි යෙදවීම කෘත්‍ය කොට ඇත්තේ ය. අරමුණට අභිමුඛවීම ඵලකොට ඇත්තේ ය.

අරමුණ සමීපකාරණ කොට ඇත්තේ ය. ලක්‍ෂණය මෙසේ වුවත් සතිය මනසිකාරය නොවේ. මනසිකාරය සතිය නො වේ. සති මනසිකාර දෙදෙනාගේ වෙනස නම් සතිය මුළානොවීම් වශයෙන් අරමුණක් ඉදිරිපත්කොට ගන්නා චෛතසිකයෙකි මනසිකාරය මුළාවීම් නොවීම් ප්‍රභේදයක් නැතිව ම අරමුණක් ඉදිරිපත්කර දෙන චෛතසිකයෙකි.

ආරම්මණපටිපාදකමනසිකාරය, වීථිපටිපාදකමනසිකාරය, ජවනපටිපාදකමනසිකාරය යි මෙය තුන්වැදෑරුම් වේ. අරමුණ පිළියෙළ කරවන්නා වූ මනසිකාර චෛතසිකය ආරම්මණපටිපාදකමනසිකාර නම්. චිත්තවීථිය පිළියෙළ කරන මනසිකාරය වීථිපටිපාදක මනසිකාරය යි, ජවනය පිළියෙළ කරන මනසිකාරය ජවනපටිපාදකමනසිකාරය යි. වීථිපටිපාදකමනසිකාරය පඤ්චද්වාරාවජ්ජනචිත්තය වශයෙන් ද ජවනය පිළියෙළ කරවන මනසිකාරය "මනොද්වාරාවජ්ජන" වශයෙන් ද සලකනු ලැබේ.

මේ තුන් වැදෑරුම් මනසිකාරයන් අතුරෙන් යම්කිසි අරමුණක් ම පිළියෙළ කරවන්නාවූ මනසිකාරය මෙහි මනසිකාර නමින් දතයුතු. යොනිසොමනසිකාරය නම් අනිත්‍යාදි ධර්මයන් අනිත්‍යාදි වශයෙන්ම මෙනෙහිකිරීම යි. උපායමනසිකාර, පථමනසිකාර නමුදු මෙය ම වේ. මේ දුඃඛාර්‍ය්‍ය සත්‍යය, මේ දුඃඛසමුදයාර්‍ය්‍ය සත්‍යය, මේ දුඃඛනිරොධාර්‍ය්‍ය සත්‍යය, මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යය යි සතර ආර්‍ය්‍යසත්‍ය ධර්මයන් කෙරෙහි නුවණින් මෙනෙහි කිරීම මෙහි යොනිසොමනසිකාර නමින් දක්වන ලදී.

මේ සූත්‍රය අවිශෙෂයෙන් සියලු සත්වැදෑරුම් ශෛක්‍ෂ පුද්ගලයන්ට සාධාරණය, එහෙයින් ඔවුන්ට සතර මාර්ගයන්ට සාධාරණ වශයෙන් චතුසච්චකම්මට්ඨානය මෙයින් දක්වන ලදැයි සැලකිය යුතු - චතුස්සත්‍යය කමටහනක් කොට ගෙන වඩනු කැමති යොගාවචරයා විසින් පළමු

කොට ගුරුවරයකු හමුවෙහි කමටහන උගත යුතු යි. පසුව විදර්ශනා මාර්ගයට බැස ත්‍රෛභූමක සංස්කාරයන් සලකා ගෙන 'මේ දුකය' යන ආදී වශයෙන් යොනිසොමනසිකාර යෙන් කල්පනා කටයුතු යි. විදර්ශනාතොමෝ ම මෙහි මනසිකාර ශීර්ෂයෙන් දක්වන ලදී. මෙසේ නුවණින් මෙනෙහි කරන යෝගාවචර භික්ෂුතෙම අකුසලය දුරු කෙරෙයි කුසලය වඩයි.

**අකුසලං පජහති,** යනුවෙන් දක් වූ දුරුකරන අකුසල් කවරහු ද යත්? "අකුසලෙසු ලොභමූලෙසු පඨමං කුසලෙ සම්පයුත්තා නාව නියතා සරූපෙන ආගතා තෙරස, යෙවාපනකා චත්තාරොති සත්තරස"යි කියන ලද බැවින් දොළොස් අකුසල චිත්තයන් අතුරෙහි ලොභමූලික පළමු වන අකුසල් සිතෙහි නියම වශයෙන් යෙදෙන ස්වරූප වශයෙන් ආ තෙළෙසෙක, යෙවාපනක සතරදෙන යයි මෙසේ සතළොසෙකි. ඔවුන් කෙරෙහි ස්පර්ශය, චෛතන්‍යය, විතර්කය, විචාරය, ප්‍රීතිය, වීර්‍ය්‍යය, ජීවිතින්ද්‍රියය, සමාධිය, අහිරිකය, අනපත්‍රපාය, ලොභය, මොහය, මිථ්‍යාදෘෂ්ටිය, යනු ඒ තෙළෙස යි. ඡන්දය, අධිමොක්ෂය, ඖද්ධත්‍යය, මනසි කාරය යනු සතර යෙවාපනකයෝ යි.

**කුසලං භාවෙති,** යනුවෙන් වදාළ වැඩෙන කුසල් කවරේ ද යත්? – නිරොධය සාක්ෂාත් ප්‍රතිවේධයෙන් හා මාර්ගය භාවනා වශයෙන් වැඩීමෙන් ද සියලු සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝ ම වැඩෙති, "යොනිසො මනසිකාර සම්පන්නස්සෙතං භික්ඛවෙ භික්ඛුනො පාටිකඞ්ඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සති" යනු වදාළ බැවින් විශෙෂයෙන් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩෙයි. මහණෙනි, නුවණින් මෙනෙහි කරන භික්ෂුව ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්නේ ය. ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය නැවත නැවත පුරුදු කරන්නේ ය යන මෙය කැමති විය යුතු ය යනු මෙහි අර්ථ යි.

**සවන සූත්‍ර විවරණය යි.**

## 1 - 2 - 7

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං,**

සෙඛස්ස භික්ඛවෙ භික්ඛුනො අප්පත්තමානසස්ස අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානස්ස විහරතො බාහිරං අඞ්ගන්ති කරිත්වා න අඤ්ඤං **එකඞ්ගම්පි** සමනුපස්සාමි එවං බහූපකාරං, යථයිදං භික්ඛවෙ **කල්‍යාණමිත්තතා,** කල්‍යාණ මිත්තො භික්ඛවෙ භික්ඛු අකුසලං පජහති කුසලං භාවෙතී ති

**එතමත්ථං** භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති

කල්‍යාණමිත්තො යො භික්ඛු සප්පතිස්සො සගාරවො
කරං මිත්තානවචනං සම්පජානො පතිස්සතො
පාපුණෙ අනුපුබ්බෙන සබ්බසංයොජනක්ඛයන්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

**අර්ථය** = සෙස්ස පෙර සේ ය.

**බාහිරං,** බාහිරවූවක්, **අඞ්ගන්ති කරිත්වා,** මෙසේ කාරණ කොට; **කල්‍යාණමිත්තතා,** කල්‍යාණ මිත්‍රයන් ඇති බව වේ. **සප්පතිස්සො,** සුවච වූ, **සගාරවො,** ගෞරව සහිත වූ; **කල්‍යාණමිත්තො,** කලණ මිතුරන් ඇති, **යො භික්ඛු,** යම් භික්ෂුවක් වේ ද, (හෙතෙම) **සම්පජානො,** නුවණ ඇත්තේ; **පතිස්සතො,** පිහිටි සිහි ඇත්තේ; **මිත්තානං** කල්‍යාණමිත්‍රයන්ගේ; **වචනං,** අවවාද වචනය; **කරං,** කරමින්; **අනුපුබ්බෙන,** පිළිවෙළින්; **සබ්බසංයොජනක්ඛයං,** සියලු සංයෝජනයන්ගේ ක්ෂයකිරීම් සඞ්ඛ්‍යාත අර්හත්වයට හෝ එයට අරමුණු වූ නිවනට; **පාපුණෙ,** පැමිණෙන්නේ ය.

**භාවය:**—

කලණමිතුරන්ගේ අවවාදයන් පිළිගෙන සුවච වූ නොහොත් අවවාද දෙන්නා වූ ගරුකටයුත්තන්ට ආදර බහුමාන සහිතව පවත්නා වූ සවැදෑරුම් ගෞරවයෙන් යුක්ත

වූ කල්‍යාණමිත්‍ර වූ භික්ෂුතෙම සිහිනුවණ ඇතිව සීල විසුද්ධි ආදි සප්ත විශුද්ධීන්ගේ පිළිවෙළින් සියලු සංයෝජන යන්ගේ ක්ෂයවීම් නම්වූ ආර්‍ය්‍ය මාර්ගයාගේ අවසානය වූ අර්හත්වයට හෝ එයට අරමුණු වූ නිවනට පැමිණෙන්නෙක් වන්නේ ය.

**ධර්මවිස්තර:-**

**කල්‍යාණමිත්තතා —**

කල්‍යාණමිත්‍රයා නම් පව් නසන්නා වූ හිත සලසන්නා වූ සියලු ආකාරයෙන් උපකාර වූ මිත්‍රතෙමේ යි. ඔහුගේ ගතිය කල්‍යාණමිත්තතා නම් වේ. කල්‍යාණමිත්‍රතෙමේ ස්වභාවයෙන් ශ්‍රද්ධාසම්පන්නයෙක් වේ. සීලසම්පන්නයෙක් ශ්‍රැතසම්පන්නයෙක් ත්‍යාගසම්පන්නයෙක් වීර්‍ය්‍යසම්පන්න යෙක් සමෘතිසම්පන්නයෙක් සමාධිසම්පන්නයෙක් ප්‍රඥා සම්පන්නයෙක් වේ. ඔහු පිළිබඳ ශ්‍රද්ධාසම්පපත්තිය හේතු කොට ගෙන තථාගතයන් වහන්සේගේ සතර මාර්ගඥානාදි බොධිගුණය හෝ නවලොකොත්තර ධර්ම සඞ්ඛ්‍යාත බොධිගුණය අදහන්නේ වේ.

එහෙයින් සම්‍යක් සම්බොධියට හේතු වූ සත්වයන් කෙරෙහි පැවැත්තයුතු හිතවත් භාවය අත්නොහරියි. සීලසම්පත්තිය හේතුකොට ගෙන බ්‍රහ්මචාරීන්ට ප්‍රියයෙක් වේ. ගරුකරන්නෙක් වේ. සිහිනුත් ගෞරවයෙන් පිළිගත යුත්තෙක් වේ. වරදෙහි චෝදනා කරන්නෙක් වේ. පව්වලට ගර්හා කරන්නෙක් වේ. කීමෙහි බිණීමෙහි දක්ෂ යෙක් වේ. අනුන්ගේ අවවාදයන් පිළිගන්නෙක් වේ. ශ්‍රැත සම්පත්තිය හෙතුකොට ගෙන ස්කන්ධ, ආයතන, සත්‍ය, ප්‍රතීත්‍ය සමුත්පාදාදි ගැඹර වූ කථාවන් කරන්නේ වේ. ත්‍යාග සම්පත්තිය හෙතු කොට ගෙන අල්පෙච්ඡයෙක් (කිසි දෑයක් ලැබීමෙහි කැමැත්ත නැත්තෙක්) වේ. ලද දෙයින් සතුටු වූවෙක් වේ. කාය චිත්ත විවේකයෙන් යුක්තවූවෙක් වේ. සමූහයා හා එක්ව වසනු කැමැත්තෙක් නොවේ. වීර්‍ය්‍ය

සම්පත්තියෙන් තමහටත් අනුන්ටත් හිතපිළිවෙත්හි ඇරඹූ වීර්‍ය්‍යී ඇත්තෙක් වේ. සමාධි සම්පත්තියෙන් එළඹ සිටි සිහිඇත්තෙක් වේ. උතුම් වූ සිහිනුවණින් යුක්තව බොහෝ කලකට පෙර කරනලද්ද කලකට පෙර කියන ලද්ද සිහි කරන්නෙක් වේ. නැවත නැවත සිහිකරන්නෙක් වේ. සමාධි සම්පත්තියෙන් නොකැළඹුණු සිත් ඇත්තෙක් වේ. සත්හුන් එකඟසිත් ඇත්තෙක් වේ ප්‍රඥාසම්පත්ති යෙන් අවිපරීතව දන්නෙක් වේ. හෙතෙම සිහියෙන් කුසලාකුසල ධර්මයන්ගේ ස්වභාවයන් පිරික්සමින් නුවණින් සත්‍වයන්ගේ හිතසැප තත්වූපරිද්දෙන් දැන සමාධියෙන් එකඟවූ සිත් ඇතිව වීර්‍ය්‍යියෙන් සත්‍වයන් අහිතයෙන් වළක්වා එකාන්ත හිතයෙහි යොදවන්නෙක් වේ. එහෙයින් කීහ.

"පියො ච ගරු භාවනීයො වත්තා ච වචනක්ඛමො
ගම්භීරඤ්ච කථං කත්තා නොචට්ඨානෙ නියොජයෙ"යි

තව ද කල්‍යාණමිත්‍රතෙම කල්‍යාණ මිත්‍රයකු ඇසුරු කොට කම්මස්සකත ඤාණය (= කම්පල ආදකීමේ නුවණ) උපදවයි, උපන් ශ්‍රද්ධාව දියුණු කෙරෙයි, සැදැහැයෙන් එළඹෙයි, එළඹ බණ අසයි, බණ අසා තෙරුවන් කෙරෙහි පහදියි එයින් ගිහි ගෙය හැර පැවිදි වෙයි. පැවිදිවූ තැන් පටන් චතුපාරිශුද්ධිශීලයෙහි සිට යථාශක්තියෙන් ධුතාඞ්ගයන් ගෙන පවතියි, දශකථාවස්තු ලාභියෙක් වේ. සියලු සසර දුකින් මිදින්නෙක් වේ.

## සත්වන සූත්‍ර විවරණය යි

## 1 – 2 – 8

**බුද්ධානං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං,**

එකධම්මො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනාහිතාය බහුජනාදුඛාය බහුනොජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං, කතමො එක

ධම්මො **සඞ්ඝභෙදො;** සඞ්ඝෙ ඛො පන භික්ඛවෙ භින්නෙ අඤ්ඤමඤ්ඤං භණ්ඩනානි චෙව හොන්ති, අඤ්ඤමඤ්ඤං පරිභාසා ච හොන්ති, අඤ්ඤමඤ්ඤං පරික්ඛෙපා ච හොන්ති, අඤ්ඤමඤ්ඤං පරිච්චජනා ච හොන්ති, තත්‍ථ අප්පසන්නා චෙව නප්පසීදන්ති, පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තං හොතී ති;

එතමත්‍ථං භගවා අවොච, තත්‍ථෙතං ඉති වුච්චති.

ආපායිකො නෙරයිකො කප්පට්ඨො සඞ්ඝභෙදකො
වග්ගාරාමො අධම්මට්ඨො යොගක්ඛෙමා විධංසති
සඞ්ඝං සමග්ගං භිත්වාන කප්පං නිරයම්හි පච්චති

අයම්පි අත්‍ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති

**අර්ථය**:-

**භික්ඛවෙ**, මහණෙනි!, **එකධම්මො**, මහාසාවද්‍යවූ එක් අකුසල ධර්මයෙක්; **ලොකෙ**, සත්වලොකයෙහි, **උප්පජ්ජමානො**, උපදිනු ලබන්නේ; **බහුජනාහිතාය**, බොහෝ දෙනාට අහිත පිණිස; **බහුජනාසුඛාය**, බොහෝ දෙනාට නොසැප පිණිස; **බහුනොජනස්ස**, බොහෝ දෙනාට; **අනත්‍ථාය**, අනර්ථ පිණිස; **දෙවමනුස්සානං**, දෙව් මිනිසුන්ට; **අහිතාය**, අහිත පිණිස; **දුක්ඛාය**, දුක් පිණිස; **උප්පජ්ජති**, උපදියි; **කතමො එකධම්මො**, කවර එක්ධර්මයෙක් ද යත්? **සඞ්ඝභෙදො**, සඞ්ඝභෙදය යි, **භික්ඛවෙ**, මහණෙනි! **සඞ්ඝෙ ඛො පන භින්නෙ**, සඞ්ඝයා බිඳුණු කල්හි; **අඤ්ඤමඤ්ඤං**, සෙසු පිරිසට අයත් ඔවුනොවුන්ගේ; **භණ්ඩනානි චෙව**, කලහ පූර්වභාගයෝ ද හෙවත් විවාදයෝ ද, **හොන්ති**, වෙත්; **අඤ්ඤමඤ්ඤං**, ඔවුනොවුන්ගේ; **පරිභාසාච**, තර්ජනයෝ ද; **හොන්ති**, වෙත්; **අඤ්ඤමඤ්ඤං**, ඔවුනොවුන්ගේ; **පරික්ඛෙපා ච**, දශ ආක්‍රොශවස්තුවෙන් පිරිහෙළීම් ද; **හොන්ති**, වෙත්; **අඤ්ඤමඤ්ඤං**, ඔවුනොවුන්ගේ; **පරිච්චජනා ච**, අත්හැරීම ද, **හොන්ති**, වෙත්; **තත්‍ථ**, එහි; **අප්පසන්නා චෙව**, ප්‍රසන්න නොවූවෝ ද; **නප්පසීදන්ති**, නො පහදිත්;

**පසන්නානඤ්ච**, ප්‍රසන්නාවූ ද; **එකච්චානං**, ඇතමුන්ගේ; **අඤ්ඤථත්තං**, අන්‍යථාභාවයෙක් හෙවත් වෙනස් බවෙක්; **හොතීති**, වේ ය යනු යි.

**භගවා**, භාග්‍යවත්තෙම; **එතං අත්ථං** මේ කාරණය; **අවොච**, වදාළේය; **තත්ථ**, එහි; **එතං ඉති**, එතං යි; **වුච්චති**, කියනු ලැබේ.

**ආපායිකො**, අපායෙහි ඉපදීමට සුදුසුවූ; **නෙරයිකො**, අවීචිමහානිරයෙහි උපදින සුලුවූ; **කප්පට්ඨො**, කපක් මුලුල්ලෙහි එහි සිටින්නාවූ; **වග්ගාරාමො**, වර්ගකිරීමෙහි ඇලුනාවූ; **අධම්මට්ඨො**, අධර්මයෙහි පිහිටියාවූ; **සඞ්ඝභෙදකො**, සඞ්ඝභෙද කර්මය කරන්නාවූ පුද්ගලතෙම; **යොගක්ඛෙමා** නිවනින්; **විද්ධංසති**, වෙසෙසින් පිරිහෙයි; **සමග්ගං සඞ්ඝං** සමගි සඞ්ඝයා; **භින්දාන**, බිඳ; **කප්පං**, කල්පයක්: **නිරයම්හි**, නරකයෙහි; **පච්චති**, පැසෙයි.

**භගවතා**, භාග්‍යවත්හු විසින්; **අයම්පි අත්ථො**, මේ අර්ථය ද; **වුත්තො ඉති**, වදාරන ලදැයි; **මෙ**, මා විසින්; **සුතං**, අසන ලදි.

**භාවය**:–

මහා සාවද්‍යවූ එක් අකුශල ධර්මයෙක් සර්වලොකයෙහි මහාජනයාගේ ධ්‍යානමාර්ගාදි සම්පත් වළක්වන හෙයින් අහිත පිණිස, සග සැපත් වළක්වන හෙයින් අසැප පිණිස, අපායෙහි උපදවන හෙයින් අවැඩ පිණිස, දෙවි මිනිසුන්ට අහිත පිණිස, දුක් පිණිස උපදියි. කවර එක් ධර්මයෙක් ද යත්? සඞ්ඝභෙදය යි. සඞ්ඝයා භේදවූ කල්හි සිවුපිරිසට අයත් වූවන් අතර ඔවුනොවුන්ගේ කලහයෝ ද, ඔවුනොවුන් අතර බිය උපදවන තර්ජන කථාවෝ ද, ඔවුනොවුන් අතර දශ ආක්‍රොශ වස්තුවෙන් පිරිහෙළීම ද, ඔවුනොවුන් අතර දඬුවම් කිරීමෙන් නෙරපා හැරීම ද වෙත්. එහි තුනුරුවන් ගුණ නොදැනීමෙන් නොපහන්වූවෝ නො පහදිත්, සවල්පයක් පහන්වූ පෘථග්ජනයන්ගේ ප්‍රසාදය ද වෙනස් වන්නේය.

අපායෙහි ඉපදීමට සුදුසු වන හෙයින් ආපායික වූ අවීචිමහානරකයෙහි උපදින හෙයින් නෙරයිකවූ කපක් මුළුල්ලෙහි ම දුක් විඳින හෙයින් කල්පස්ථවූ සඞ්ඝභෙදය යි කියනලද වර්‍ගකිරීමෙහි ඇලුණා වූ මෙබඳු වූ අධර්මයෙහි පිහිටියාවූ සඞ්ඝභෙදක තෙම නිවනින් පිරිහෙයි. සමගි සඞ්ඝයා බිඳ කල්පයක් නිරයෙහි පැසෙයි,

**ධර්‍මවිස්තර**:-

මෙහි සූත්‍ර නිඃක්‍ෂෙපය එළඹ සිටි කරුණක් නිසා දෙසනලද හෙයින් අත්ථුප්පත්තික නම් වේ. එහි මේ සංක්‍ෂෙප කථා යි. **දෙව්දත්තෙම අජාසත් රජු** දුර්ලබ්ධි ගන්වා ඔහු ලවා පියවූ **බිම්සර රජු** මැර වූ පමණෙකින් ද, බුදුනට ගල් පෙරළීමෙන් ලෙහිතුප්පාදක කම් සිදු කළ පමණෙකින් ද, මහාජනයා අතර ප්‍රකට නොවීය. නාලාගිරි ඇතු විහිදූ වූ දින ප්‍රකට විය. එකල මහජනතෙම මෙබඳු වූ පවිටකු ගෙන රජතෙම හැසිරෙන්නේ යයි මහත් කෝලාහල කරන්නට විය. එ අසා රජතෙම තමා විසින් දෙනු ලබන පන්සියක් බත්තලි නැවැත් විය. උවටැන් පිණිස ද නොඑළඹියේ ය.

නුවර වැස්සෝ ද ඒ ඒ දායක කුලයන් කරා පිඬු සිඟා එන දෙව්දත් පිරිසට කෙනිසි අහරකුදු නුදුන්හ.

හෙතෙම පිරිහුණු ලාභ සත්කාර ඇත්තේ කුහක කමින් ජීවත්වනු කැමතිව බුදුන් කරා එළඹ පඤ්චවස්තූන් යාච්ඤා කොට "දෙවදත්තය, එයින් කම් නැත, යමෙක් කැමති නම් හෙතෙම ආරඤ්ඤක වේවා" යි යන ආදීන් ප්‍රතික්‍ෂෙප කරන ලදුව ඒ පඤ්චවස්තුවෙන් කටුක පැවතුම් වලට පහන් වූ මූඪජනයාට තමාගේ සුසිල් බැව් හඟවමින් **පන්සියයක්** වජ්ජිපුත්‍රක භික්‍ෂූන් සලාක ගන්වා සඞ්ඝයා බිඳුවා ඔවුන් හා සමග ගයා ශීර්‍ෂයට පැමිණියේ ය. ඉක්බිති දෑගසව්වන් වහන්සේ බුදුන් වහන්සේගේ අණින් එහි ගොස් දහම් දෙසා ඔවුන් රහත් ඵලයෙහි පිහිටුවා ආපසු ගෙන ආවාහු ය.

යම් කෙනෙක් දෙව්දත් තෙරුන් හා සමග සඞ්ඝ භේදය පිණිස කැමැත්ත හඟවා ඒ සඳහා උත්සාහ කොට එයම තහවුරු කොට ගෙන සිටියාහු ද සඞ්ඝයා බිඳෙත් බිඳෙත් ම ඔවුහුත් ඒ පාපකර්මය අනුමෝදන් වූහ. එය ඔවුන්ට බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස ම විය. දෙවදත්ත ස්ථවිරයන් නොබෝ කලකින් රෝග ග්‍රස්තව දැඩි වූ ගිලන් ඇත්තෙක් ව මරණාවස්ථායෙහි බුදුන් දක වැඳ පුදා ගන්නෙමි යි සිවිකායෙකින් ගෙන එනු ලබන්නේ ම ජේතවන පොකුණු තෙරෙහි තබන ලදුව පොළොව පැළී අවීචියට ගෙන ගියේ ය. ඔහුගේ සිරුර යොදුන් සියයෙක. කල්පයක් නිරයෙහි පැසෙන්නේ ය. තල්කඳ පමණ වූ යහුලෙන් විදින ලද්දේ ය. ඔහුගේ ලබ්ධිය ගත්තෝ ද එ සේ ම නිරයෙහි උපන්හ. එක් දිනක් භික්ෂුහු දම් සභායෙහි කථාවක් ඇති කළහ. "ඇවැත්නි! සඞ්ඝයා බිඳුවනලද දෙව්දත්හු විසින් බැරෑරුම් කර්මයක් කරන ලද්දේය" යනු යි. ඉක්බිති සර්වඥයන් වහන්සේ දම්සභා මඩුවට එළඹ එපවත් විචාරා සඞ්ඝභේදයෙහි අයුණු දක්වමින් මේ සූත්‍රය වදාළසේක.

**සඞ්ඝභේදය:-**

පඤ්චානන්තරිය අකුසල කර්මයන් අතුරෙහි පස්වනු වූ අකුසලය වේ. එය සංඛ්‍යා නියමයෙන් පස්වනු වූයේ ද විපාකදානාවස්ථායෙහි පළමුවැනි ම වේ. සඞ්ඝභේද පාපකර්මය තෙමේ උපදිනු ලබන්නේ ය, උපදනේ ය, උපන්නේය යි අවස්ථා තුනෙකින් සැලකිය හැකි වේ. භේදය පිණිස පවත්නා වූ කෝලාහලාදිය සඞ්ඝයා අතර උපන් කල්හිදු ධර්මය අධර්මයයි දක්වීම් ආදි අටළොස් භේදකර වස්තූන් අතුරෙහි යම් කිසිවක් දක්වීම් වශයෙන් ව්‍යවහාර කරන කල්හිදු එහි කැමැත්ත උපදවනු පිණිස භික්ෂූන් අස්වන කල්හිදු අනුශ්‍රාවනය (ඇස්වීම) කොට සලාක (හුණ පතුරු හෝ ඉරටු ආදි යමක්) ගන්වන කල්හිදු සඞ්ඝභේදය උපදිනු ලබන්නේ වේ. සලාකගත් භික්ෂූන් අතුරෙහි සතර නමක් හෝ ඉන් වැඩි ගණනක් යම් කලෙක්හි වෙනස්ව පෙර

සඞ්ඝයා අතරෙහි පුරුදුව තුබූ පාමොක් උදෙසීම් හෝ සඞ්ඝකම් හෝ කෙරෙත් ද එකල්හි සඞ්ඝභෙදය උපදනේ නම් වේ. කොට අවසන් වූ කල්හි සඞ්ඝභෙදය උපන්නේ නම් වේ. හෙවත් සඞ්ඝභෙදය සිදු වූයේ නම් වේ

කම්ම ය – උද්දෙස ය – වොහාර ය – අනුසාවන ය – සලාක ගාහ ය – යන සඞ්ඝභෙදයට හේතු වූ මේ පස් කරුණු අතුරෙහි කර්‍මය හෝ උද්දෙසය පමණෙක් ම ප්‍රමාණ වේ. වොහාරානුසාවන සලාකගාහයෝ වනාහි එයට පළමුවෙන් සිදුවිය යුතු කාරණයෝ යි. මෙහි දක්වූ "කර්‍මය" නම් අපලොකන ආදි චතුර්විධ විනය කර්‍මය යි "උද්දෙසය නම්" පස් වැදෑරුම් පාතිමොක්ඛුද්දෙසයන් අතුරෙහි එක්තරා උදෙසීමෙකි. "වොහාරය" නම් අටළොස් භෙදකර වස්තූන් අතුරෙහි යමක් යමක් දක්වා කථා කිරීම යි අනුසාවනය නම්, කිම නුඹ වහන්සේ මා උසස් කුලයෙන් පැවිදි වූවකු බැව් නොම දන්නහු ද? බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තකු බැව්. නො දන්නහු ද? කිම මා වැන්නකු අධර්‍මයක් වූ අවිනයක් වූ ශාස්තෘ සාසනයක් ගන්නේයයි සිතීම පවා නුඹවහන්සේට යුතු ද? කිම මට අවීචිය නිලුපුල් වනයක් මෙන් සිහිල් ද? කිම මම අපාය දුකට බිය නො වෙම් දැ යි මෙසේ භික්ෂූන්ගේ කන්මුල වාග්භෙද කොට හෙවත් කථායෙන් ඇස්වීම යි. "සලාක ගාහය" නම් මෙසේ අනුසාවනය කොට භික්ෂූන්ගේ සිත් පොළඹවා නොහැවත්නා ගති ඇත්තවුන් කොට එ සේ වී නම් මේ සලාකයන් ගුණ පතුරු ඈ යමක් පිළිගනුව යි ගැන්වීම යි.

**අට වන සූත්‍ර විවරණය යි.**

## 1 – 2 – 9

### වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං

එකධම්මො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං, කතමො එකධම්මො? **සඞ්ඝ සාමග්ගී;** සඞ්ඝෙ ඛො පන භික්ඛවෙ

සමග්ගෙ න චෙව අඤ්ඤමඤ්ඤං භණ්ඩනානි හොන්ති, න ච අඤ්ඤමඤ්ඤං පරිභාසා හොන්ති, න ච අඤ්ඤමඤ්ඤං පරික්ඛෙපා හොන්ති, න ච අඤ්ඤමඤ්ඤං පරිච්චජනා හොන්ති. තත්ථ අප්පසන්නා චෙව පසීදන්ති. පසන්නානඤ්ච භීය්‍යොභාවො හොතීති.

එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති

සුඛා සඞ්ඝස්ස සාමග්ගී සමග්ගානඤ්චනුග්ගහො
සමග්ගරතො ධම්මට්ඨො යොගක්ඛෙමා න ධංසති
සඞ්ඝං සමග්ගං කත්වාන කප්පං සග්ගම්හි මොදති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

**අර්ථය**:–

පළමු සූත්‍රයට කී අයුරු සි ශොභන පක්ෂයෙහි ලා ගැන්ම පමණක් වෙනසි – **සඞ්ඝසාමග්ගී**, සඞ්ඝයාගේ සමගිය වේ. **සඞ්ඝස්ස**, සඞ්ඝයාගේ; **සාමග්ගී**, සාමග්‍රී තොමෝ; **සුඛා**, සැපයට හෙතුවන්නී ය; **සමග්ගානං**, සමගිවූවන්ට; **අනුග්ගහො** ච, අනුබලදීම ද; (සැපවේ) **සමග්ගරතො**, සමගියෙහි ඇලුණා වූ; **ධම්මට්ඨො**, ධර්මයෙහි පිහිටි පුද්ගල තෙම; **යොගක්ඛෙමා**, නිවනින්; **න ධංසති**, නොපිරිහෙයි; **සඞ්ඝං**, සඞ්ඝයා; **සමග්ගං කත්වාන**, සමගි කොට; **කප්පං**, කල්පයක්; **සග්ගම්හි**, දෙව්ලොවෙහි; **මොදති**, සතුටු වෙයි;

**භාවය**:–

සඞ්ඝයාගේ සමගිය සැපයට හේතු වේ. සමගි වූ සඞ්ඝයාගේ සමගිය අනුමෝදන්වීමෙන් අනුග්‍රහ කිරීම හෝ යම් සේ ඔවුහු සමගිය අත් නොහරිත් ද එපරිද්දෙන් ගැන්වීම හෝ පිහිටුවීම නැතහොත් සමගියට අනුබලදීම සැපයට හේතු වේ. සමගියෙහි ඇලුණු සමගියෙහි පිහිටි භික්ෂු තෙමේ යොගක්ඛෙම නම ලද අමාමහානිවනින් නොපිරිහෙයි බිඳුණාවූ සඞ්ඝයා සමගි කොට කල්පයක් කාමාවචර දිව්‍යලෝකයෙහි සෙසු දෙවියන් කරුණු දසයෙකින් මැඩ දෙව් සැපත් විඳිමින් සතුටු වෙයි.

**ධර්මවිස්තර:-**

**සඞ්ඝ සාමග්‍රී** – සඞ්ඝසාමග්‍රිය නම් සඞ්ඝයාගේ භෙදයක් නැති බව යි. එක්ව කරන සඞ්ඝකර්ම හා එක්ව කරන උදෙසීම් ඇති බව යි. ඉදින් යම්කිසි කරුණක් නිසා සඞ්ඝයා අතර විරුද්ධ වාදයක් ඇතිවූයේ නම් ධර්මයට කැමති පණ්ඩිතයා විසින් මෙසේ සැලකියයුතු යි. "මේ විවාදය තෙමේ සඞ්ඝ භෙදයට හේතු වන්නේ ය" කියා යි. එසේ නම් එයින් තමන් ඈත් විය යුතු යි තවද අන්‍යයන් විසින් හෝ ගන්නාලද්ද තමහට සංසිඳුවිය හැකි නම් එසේ කරලීමට උත්සාහවත් වියයුතු යි. යම් කිසි අවස්ථායෙක්හි තමහටත් එම අධිකරණය සන්සිඳුවාලිය නො හැකි නම් භේදය දියුණු වේ නම් සුදුසු වූ ශික්ෂාකාමී සබ්‍රම්සරුන් උත්සාහවත් කොට සන්සිඳුවන්නට මහන්සි ගතයුතු යි. මේ වනාහි සඞ්ඝසාමග්‍රී කර වූ එකම කුශලධර්මය වේ.

**නව වන සූත්‍ර විවරණය යි.**

## 1 – 2 – 10

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං,**

ඉධාහං භික්ඛවෙ එකච්චං පුග්ගලං පදුට්ඨචිත්තං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි, ඉමම්හිචායං සමයෙ පුග්ගලො කාලං කරෙය්‍ය, යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ, තංකිස්ස හෙතු? චිත්තං හිස්ස භික්ඛවෙ පදුට්ඨං, චෙතොපදොසහෙතු ඛො පන භික්ඛවෙ එවමිධෙකච්චෙ සත්තා කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති

පදුට්ඨ චිත්තං ඤත්වාන එකච්චං ඉධ පුග්ගලං
එතමත්ථං ච ව්‍යාකාසි බුද්ධො භික්ඛුන සන්තිකෙ
ඉමම්හිචායං සමයෙ කාලං කයිරාථ පුග්ගලො
නිරයං උපපජ්ජෙය්‍ය චිත්තං හිස්ස පදුසිතං
යථාහරිත්වා නික්ඛිපෙය්‍ය එවමෙව තථාවිධො
චෙතොපදොස හෙතු හි සත්තා ගච්ඡන්ති දුග්ගතිං

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති,

**අර්ථය:**–

**භගවතා**, භාග්‍යවත්හු විසින්; **එතං**, මේ දේශනාව; **වුත්තං හි**, වදාරන ලද්දේ ම ය; **අරහතා**, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් විසින්; **වුත්තං ඉති** වදාරන ලද්දේ ය යනු; **මෙ**, මාගේ; **සුතං** ඇසීම යි.

**භික්ඛවෙ**, මහණෙනි; **අහං**, මම; **ඉධ**, මේ ලෝකයෙහි; **පදුට්ඨචිත්තං**, ප්‍රදූෂිත සිත් ඇති; **එකච්චං පුග්ගලං**, ඇතැම් පුද්ගලයකු; **එවං**, මෙසේ; **චෙතසා**, තමාගේ සිතින්; **චෙතො**, ඒ පුද්ගලයාගේ සිත; **පරිච්ච**, පිරිසිඳ; **පජානාමි**, දනිමි; **අයං පුග්ගලො**, මේ පුද්ගල තෙමේ; **ඉමම්හි සමයෙ**, මේ කාලයෙහි; **කාලං කරෙය්‍ය**, කළුරිය කෙළේ නම්; **යථා භතං නික්ඛිත්තො**, ගෙනවුත් තබන ලද්දක් යම්සේ ද; **එවං**, එපරිද්දෙන්; **නිරයෙ**, නරකයෙහි වේ; **තං කිස්ස හෙතු?** එයට හේතු කවරේ ද? **භික්ඛවෙ**, මහණෙනි; **අස්ස**, මොහුගේ; **චිත්තං**, සිත; **හි**, යම් හෙයකින්; **පදුට්ඨං**, ප්‍රදූෂ්‍ය ද එහෙසිනි; **භික්ඛවෙ**, මහණෙනි; **චෙතොපදොසහෙතු ඛො පන**, සිත දූෂණයවීම හේතුකොටගෙන වනාහි; **එවං**, මෙසේ; **ඉධ**, මේ ලොකයෙහි; **එකච්චෙ සත්තා**, ඇතැම් සත්වයෝ; **කායස්ස භෙදා**, ශරීරයාගේ භේදයෙන්; **පරම්මරණා**, මරණින් මත්තෙහි; **අපායං**, සැප නැත්තාවූ; **දුග්ගතිං**, දුකට පිහිටවූ; **විනිපාතං**, විවසව පතිතවත්නාවූ; **නිරයං**, නරකයෙහි; **උපපජ්ජන්ති**, උපදිත්.

**භගවා**, භාග්‍යවත්තෙම; **එතං අත්ථං**, මේ කාරණය; **අවොච**, වදාළේ ය; **තත්ථ**, එහි; **එතං ඉති**, මේ යයි; **වුච්චති**, කියනු ලැබේ. **ඉධ**, මේ ලෝකයෙහි; **එකච්චං පුග්ගලං**, ඇතැම් පුද්ගලයකු; **පදුට්ඨචිත්තං**, ප්‍රදූෂ්‍ය සිත් ඇත්තහු, **ඤත්වාන**, දැන; **බුද්ධො**, සර්වඥතෙම; **භික්ඛූන සන්තිකෙ**, භික්ෂූන්ගේ සමීපයෙහි; **එතං අත්ථං**, මේ කාරණය; **ව්‍යාකාසි**, ප්‍රකාශ කෙළේ ය.

**ඉමම්හි සමයෙ**, මෙසමයෙහි, **අයං පුග්ගලො**, මේ පුද්ගලතෙම; **කාලං කයිරාථ**, කළුරිය කෙරේ ද; **නිරයං**, නරකයට; **උපපජ්ජෙය්‍ය**, පැමිණෙන්නේ ය; **අස්ස**, මොහුගේ, **චිත්තං**, සිත; **හි**, යම්හෙයකින්; **පදුට්ඨං**, වෙසෙසින් දූසිත වූයේ ද, එහෙයිනි.

**යථා**, යම්සේ, (යමක්) **හරිත්වා**, ගෙන ගොස්, **නික්ඛිපෙය්‍ය**, බහාතබන්නේ වේ ද, **තථාවිධො**, එබඳුවූ ඒ පුද්ගලතෙම; **එවමෙව**, මෙපරිද්දෙන් වේ; **සත්තා**, සත්ව යෝ; **චෙතොපදොසහෙතු හි** සිත දූෂ්‍යවීම හෙතුකොට ගෙන; **දුග්ගතිං**, දුගතියට; **ගච්ඡන්ති**, යෙත්.

**භගවතා**, භාග්‍යවත්හු විසින්; **අයම්පි අත්ථො**, මේ අර්ථය ද; **වුත්තො ඉති**, වදාරන ලද්දේය යනු; **මෙ**, මා විසින්; **සුතං** අසන ලදි.

**භාවය:-**

මහණෙනි, මේ ලෝකයෙහි රාගාදියෙන් දූසිත සිත් ඇති ඇතැම් පුද්ගලයකු මෙසේ මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දනිමි. මෙකල මේ පුද්ගල තෙම කලුරිය කෙළේ වී නම් ගෙනවුත් තබතලද්දක් පරිද්දෙන් නිරයෙහි උපදින්නෙක් වන්නේය, එයට කාරණා කිම් ද යත්? මහණෙනි! මොහුගේ සිත නොඑක් කෙලශ ධර්මයන්ගෙන් ප්‍රදූෂ්‍ය හෙයිනි. සිත කිලුටුවීම හෙතුකොට ගෙන මේ ලෝකයෙහි ඇතැම් සත්වයෝ ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සැපයක් නැති දුකට පිහිට වූ විවසව පතිතවන්නා වූ නරකයෙහි උපදිත්.

මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයකු කෙලෙසුන්ගෙන් දූෂිත වන්නහු දැන සර්වඥතෙම භික්ෂූන්ගේ සමීපයෙහි මේ අර්ථය ප්‍රකාශ කෙළේ ය.

මෙකල්හි මේ පුද්ගලතෙම කලුරිය කෙළේ වී නම් නිර යෙහි උපදනේ ය. ඔහුගේ සිත ප්‍රදුෂ්ට හෙයිනි.

ගෙනවුත් තබන ලද දෙයක් යම්සේ ද එපරිද්දෙන් එබඳු පුද්ගලයා ගැන දන්නේ ය, සත්ත්වයෝ සිත කිලුටුවීම හෙතුකොට ගෙන මරණින් මතු දුගතියට යෙති.

**ධර්මවිස්තර**:–

එක්දවසක් භික්ෂූහු දම්සභා මඩුවෙහි රැස්ව හිඳ මෙබඳු කථාවක් ඇතිකළහ. "ඇවැත්නි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් බොහෝ කොට පින්කම් කෙරෙයි. ඇතැම් පුද්ගලයෙක් බොහෝ කොට පව්කම් හෝ කෙරෙයි, ඇතැම් පුද්ගලයෙක් පින් පව් දෙක මිශ්‍රව කෙරෙයි, මෙසේ කරන්නහුට පරලොව විපාකය කෙසේදැ යි කියා යි. ඉක්බිති ශාස්තෲන් වහන්සේ ධම්සභා මණ්ඩපයට එළඹ පනවනලද බුද්ධාසනයෙහි වැඩහුන්සේක්. ඒ කථාව අසා මහණෙනි, මරණාසන්න කාලයෙහි කිළිටි සිත් ඇත්තහු විසින් දුගතිය කැමතිවිය යුත්තී ය යි දක්වනසේක් මෙය අට්ඨොත්පත්ති කොට මේ සූත්‍රය වදාළසේක. "අපාය" නම් නිරය යි. නිරයම සැපයෙන් වෙන්වූ හෙයින් අපාය නම් වේ. සගමොක් දෙකට හේතුවූ පුණ්‍ය සම්මත අයෙන් වෙන්වූයේනුයි ද අපාය නම් වේ. දුකට පිහිට හෙයින් "දුග්ගති" නම් වේ. නපුරුකම් කළෝ විවසව මෙහි වැටෙත්නු යි. "විනිපාත" නම් වේ. බිඳුණු අඟපසඟ ඇතිව මෙහි හෙත් නුයි හෝ, "විනිපාත" නම් වේ. මෙහි සැනසීම් හැඟීමක් නැත් නුයි ද "නිරය" නම් වේ. නැතහොත් අපාය ගැනීමෙන් තිරිසන් යෝනිය කියනු ලැබේ. තිරිසන් යෝනිය සැපයෙන් පහවූ හෙයින් අපාය නම් වන්නේය. මහෙශාක්‍ය නාරජුන්ගේ ද ලැබීම ඇති හෙයින් "දුගති" නමින් නො සලකනු ලැබේ. "දුග්ගති" නමින් ගන්නේ ප්‍රේතලොකය යි.

මෙය සුගතියෙන් වෙන්වූ හෙයින් ද දුකටම පිහිටවූ හෙයින් ද අපාය නමිනුදු දුග්ගති නමිනුදු සලකනු ලැබේ. විනිපාත වචනයෙන් අසුරකාය ගනු ලැබේ.

**දසවන සූත්‍ර විවරණය යි**

ඉතිවුත්තක පාළියෙහි **ප්‍රථම වර්ගය** සමාප්ත යි.

# තුන්වන වර්ගය

## 1 - 3 - 1

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතා ති මෙ සුතං**

ඉධාහං භික්ඛවෙ එකච්චං පුග්ගලං පසන්නචිත්තං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි, ඉමම්හි චායං සමයෙ පුග්ගලො කාලං කරෙය්‍ය යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ, තං කිස්ස හෙතු? චිත්තං හිස්ස භික්ඛවෙ පසන්නං, චෙතොපසාදහෙතු ඛො පන භික්ඛවෙ. එව මිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති,

පසන්නචිත්තං ඤත්වාන එකච්චං ඉධ පුග්ගලං
එතමත්ථං ච ව්‍යාකාසි බුද්ධො භික්ඛූන සන්තිකෙ
ඉමම්හි චායං සමයෙ කාලං කයිරාථ පුග්ගලො
සුගතිං උපපජ්ජෙය්‍ය චිත්තං හිස්ස පසාදිතං
යථා හරිත්වා නික්ඛිපෙය්‍ය එවමෙව තථාවිධො
චෙතොපසාදහෙතු හි සත්තා ගච්ඡන්ති සුගතිං

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

සෙස්ස සුගම යි.

**පළමුවන සූත්‍ර විවරණය යි**

## 1 - 3 - 2

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං,**

මා භික්ඛවෙ පුඤ්ඤානං භායිත්ථ, සුඛස්සෙතං භික්ඛවෙ අධිවචනං ඉට්ඨස්ස කන්තස්ස පියස්ස මනාපස්ස යදිදං පුඤ්ඤානි, අභිජානාමි ඛො පනාහං භික්ඛවෙ දීඝරත්තං කතානං පුඤ්ඤානං ඉට්ඨං කන්තං පියං මනාපං විපාකං පච්චනුභූතං, සත්තවස්සානි මෙත්ත චිත්තං භාවෙත්වා සත්ත

සංවට්ට විවට්ට කප්පෙ න'යිමං ලොකං පුනරාගමාසිං, සංවට්ටමානෙ සුදං භික්ඛවෙ කප්පෙ ආභස්සරූපගො හොමි, විවට්ටමානෙ කප්පෙ සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජාමි, තත්‍ර සුදං භික්ඛවෙ බ්‍රහ්මා හොමි මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථු දසො වසවත්ති, ඡත්තිංසක්ඛත්තුං ඛො පනාහං භික්ඛවෙ සක්කො අහොසිං දෙවානමින්දො, අනෙකසතක්ඛත්තුං රාජා අහොසිං චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතන සම්පන්නො, කො පන වාදො පදෙසරජ්ජස්ස? තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි, කිස්ස නු ඛො මෙ ඉදං කම්මස්ස ඵලං, කිස්ස කම්මස්ස විපාකො, යෙනාහං එතරහි එවං මහිද්ධිකො එවං මහානුභාවොති? තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි, තිණ්ණං ඛො මෙ ඉදං කම්මානං ඵලං, තිණ්ණං කම්මානං විපාකො, යෙනාහං එතරහි එවං මහිද්ධිකො එවං මහානුභාවො'ති. සෙය්‍යථීදං? **දානස්ස, දමස්ස, සඤ්ඤමස්සා'ති**.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

පුඤ්ඤමෙව සො සික්ඛෙය්‍ය ආයතග්ගං සුඛුද්‍රයං
දානඤ්ච සමචරියඤ්ච මෙත්තචිත්තඤ්ච භාවයෙ
එතෙ ධම්මෙ භාවයිත්වා තයො සුඛසමුද්දයෙ
අබ්‍යාපජ්ඣං සුඛං ලොකං පණ්ඩිතො උපපජ්ජති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති,

**අන්වය:–**

**භික්ඛවෙ**, මහණෙනි; **පුඤ්ඤානං**, කුසලයන්ට; **මා භායිත්ථ**, බිය නොවව්; **යදිදං පුඤ්ඤානි**, යම් මේ කුසලයෝ වෙත් ද; **එතං**, මේ කුසලය; **ඉට්ඨස්ස**, තමහට ඉෂ්ටවූ; **කන්තස්ස**, කැමැතිවූ; **පියස්ස**, ප්‍රියවූ; **මනාපස්ස**, මන වඩන්නා වූ; **සුඛස්ස**, සැපතට; **අධිවචනං**, නමෙකි; **අහං**, මම; **දීඝරත්තං**, බොහෝ කාලයක් මුළුල්ලෙහි; **කතානං පුඤ්ඤානං**, කළ කුසලයන්ගේ; **ඉට්ඨං**, ඉෂ්ට වූ;

**කන්තං**, කාන්ත වූ; **පියං**, ප්‍රිය වූ; **මනාපං**, මනවඩන්නා වූ; **විපාකං**, විපාකය; **පච්චනුභූතං**, විඳුනේය යන මේ කාරණය; **අභිජානාමි**, දනිමි; **සත්තවස්සානි**, සත් අවුරුද්දක්; **මෙත්තචිත්තං**, මෙත් සිත; **භාවෙත්වා**, වඩා, **සත්තසංවට්ටවිවට්ටකප්පෙ**; මහා කල්ප සතක්; **ඉමං ලොකං**, මේ කාම ලෝකයට; **පුන**, යළිත්; **න අගමාසිං**, නො පැමිණියෙමි. **කප්පෙ සංවට්ටමානෙ**, ලෝක විනාශය ඇතිවන කල්හි; (**සුදං** යනු නිපාත මාත්‍ර යි.) **ආභස්සරූපගො හොමි**; ආභස්සර නම් බඹලොව උපනිමි; **කප්පෙ විවට්ටමානෙ**, කල්පෝත්පත්තිය වූ කල්හි; **සුඤ්ඤං බ්‍රහ්මවිමානං**, හිස් වූ බඹ විමනෙක්හි; **උපපජ්ජාමි**, උපනිමි; **තත්‍ර සුදං**, එහි; **බ්‍රහ්මා**, බ්‍රහ්මයෙක් වීමි; **මහාබ්‍රහ්මා**, මහා බ්‍රහ්මයෙක් වීමි; **අභිභූ**, ගුණයෙන් සියල්ලන් මැඩපැවැත්වීමි; **අනභිභූතො**, කිසිවකු විසිනුත් නො මඩනා ලද්දෙක් වීමි; **අඤ්ඤදත්ථු**, ඒකාන්තයෙන්; **දසො**, තුන්කල් දක්නා නුවණ ඇත්තෙක් වීමි; **වසවත්ති හොමි**, තමාගේ ගුණයෙන් සෙසු බඹුන් වසඟකරගත්තෙමි; **ඡත්තිංසක්ඛත්තුං**, සතිස්වරක්, **දෙවානමින්දො**, දෙවේන්ද්‍ර වූ; **සක්කො අහොසිං**, ශක්‍රයෙක් වීමි; **අනෙකසතක්ඛත්තුං**, බොහෝවාරගණනක්; **චාතුරන්තො**, සතරමහත් දිවයින බබුළුවන; **විජිතාවී**, සියලු පසමිතුරු රජුන් දිනූ; **ජනපදත්ථාවරියප්පත්තො**, සියලු ජනපදයෙක්හි ස්ථිරබවට පැමිණි; **සත්තරතනසමන්නාගතො**, සප්තවිධ රත්නයෙන් යුක්තවූ; **ධම්මිකො**, ධාර්මික වූ; **ධම්මරාජා**, දශරාජධර්මයෙන් රාජ්‍යය කරන්නාවූ; **චක්කවත්තිරාජා අහොසිං**, සක්විති රජෙක් වූයෙමි, **දානස්ස**, පරිත්‍යාගයගේ ද; **දමස්ස**, ඉන්ද්‍රිය දමනයගේද; **සඤ්ඤමස්ස**, කායවාග් සංයමයාගේ ද;

**සො** තමහට වැඩකැමැති ඒ කුලපුත්‍රතෙම; **ආයතග්ගං**, ශ්‍රේෂ්ඨ විපාක ඇති; **සුඛුද්‍රයං**, සැප විපාක දෙන; **පුඤ්ඤමෙව**, පිනක්ම; **සික්ඛෙය්‍ය** රැස්කරන්නේ ය; **දානං ච**, පරිත්‍යාගය ද; **සමචරියං ච**, සමපැවැත්ම ද; **මෙත්තචිත්තං ච**, මෛත්‍රී සිත ද; **භාවයෙ**, වඩන්නේ ය.

**සුඛසමුද්දයෙ**, සුඛානිසංස ඵල ඇති; **එතෙ තයො ධම්මෙ**, මේ ගුණ දහම් තුන; **භාවයිත්වා**, වඩා; **පණ්ඩිතො**, ඥානවන්ත තැනැත්තේ; **අබ්‍යාපජ්ඣං**, නිදුක් වූ; **සුඛං ලොකං**, සැප වූ ලෝකයට; **උපපජ්ජති**, පැමිණෙයි;

භාවය:-

මහණෙනි, පින් කිරීමට බිය නොවව්, පින යනු සැපයට නමකි. මහණෙනි, මම දිගු කලක් කළ පින්වල විපාක වින්ද බව දනිමි. අවුරුදු 7 ක් මෙත් සිත වඩා මහා කල්ප 7 ක් මේ මිනිස් ලොවට නො ආයෙමි. කල්ප විනාශයෙහි ආභස්සර නම් බඹලොව උපන්නෙමි නැවත කල්පය හටගත් කල්හි හිස්වූ බඹවිමනෙක උපන්නෙමි. (කිසි සත්වයකු පහළ වන්නට පෙරාතුවම ප්‍රථමධ්‍යාන බඹතලයට අයත් බඹ විමනක උපන්නෙමි යනු යි.) එහි බ්‍රහ්මයෙක් වීමි. (බ්‍රහ්ම පාරිෂද්‍ය බ්‍රහ්මපුරෝහිත දෙකටත් වඩා උසස්වූ මහා බ්‍රහ්ම ලෝකයෙහි උපන්නෙමි යනුයි.) එහි වැසි සියල්ලන් තමාගේ ගුණයෙන් මැඩ පැවැත්වීමි. තමාව මැඩ පැවැත්වීමට සමර්ථයෙක් (එහි) නොවීය, 36 වාරයක් ශක්‍ර දේවේන්ද්‍රවූයෙමි. ඊටත් වඩා වැඩි බොහෝ වාර ගණනක් සක්විති රජවීමි. ප්‍රදේශ රාජ්‍ය සම්පත් ගැන කියනුම කවරේ ද? ඒ මට මෙසේ කල්පනා විය. යම් හෙයකින් මම මෙකල්හි මේසා මහත් ඍද්ධි ඇති මේසා මහත් ආනුභාව ඇති තැනැත්තෙක් වූයෙම් නම් මෙය මා විසින් කළ කවර කර්මයක විපාකයෙන් ද කියා යි. ඒ මට මෙසේ කල්පනා විය. යම් හෙයකින් මම මේසා මහත් ඍද්ධ්‍යානුභාව ඇත්තෙක් වූයේ වෙන කිසිවකින් නොව පරිත්‍යාගය, ඉන්ද්‍රියසංවර සීලය, කය වචන දෙක හික්මවා ගැනීමය යන මේ කරුණු තුන හැර වෙන කිසිවකින් නොවේය යනු යි. සෙස්ස සුගම යි

ධර්මවිස්තර:-

### මා භික්ඛවෙ පුඤ්ඤානං භායිත්ථ

**පින් නම් කය වචන දෙක බොහෝ කලක් හික්මවා ගැනීමේ පළපුරුද්ද ද, වත් පිළිවෙත් කිරීම ද, එකම**

අස්නත් එකලාව වැළඳීමත් හුදකලා සයනයත් ඉන්ද්‍රිය දමනයත් ධුතාංග වැඩීමත් සිහිනුවණින් යෙදීමත් කමටහන් වැඩීමෙහි උත්සාහයත් යන මේ ආදි භික්ෂුවක් විසින් හෝ භික්ෂුණියක් විසින් හෝ උවසු උවැසියක් විසින් හෝ නිතර පුරුදු කළයුතු කුසල් ය. මේවා කිරීමට භයවන තැනැත්තේ සැපයට බිය වන්නෙකි. සැපයෙහි හේතුව පින හෙයිනි.

මෙහි භාෂා ප්‍රයෝගය වශයෙන් සලකන කල මා ශබ්ද යෝගය ගැන මඳක් විමසා බැලියයුතු ය. මා යනු ප්‍රතිෂේධාර්ථයෙහි ප්‍රකට නිපාතයකි. මෙයින් වළක්වාලීමක් ප්‍රකාශ කෙරෙයි.

**මා යොගෙ සබ්බකාලෙ ච** යනු ඒ සඳහා දක්වූ රූපසිද්ධි සූත්‍ර යි. මා ශබ්ද යෝගය ඇති කල්හි හියත්තනී අජ්ජතනී යන විභක්තීහු වර්තමානාදි හැම කල්හිම යෙදෙත් එසේම පඤ්චමී විභක්තිය ද යෙදෙයි. **මා භවති** දැන් නොවේ. **මා භවා** පෙර නොවී, **මා භවිස්සති** මතු නොවේවා යනු කාලත්‍රයට උදාහරණ යි. මා භායිත්ථ යන්නෙහි හියත්තනී විභක්තිය හා මා ශබ්දය යෙදුණු අයුරු ය. ව්‍යාකරණානුසාරයෙන් මෙහි විස්තර දතයුතු යි.

**ඥාණභය සාරජ්ජනය —**

මෙයින් දෙවැදෑරුම් භය දතයුතු “ඇතැම් දෙවිකෙනෙක් තථාගතයන් වහන්සේගේ අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්මය අසා භයට තැතිගැනීමට සංවේගයට පැමිණෙත්” යන මේ තන්හි ඥානභය ප්‍රකාශ වෙයි. “අහුදෙව භයං, අහු ඡම්භිතත්තං, අහු ලොමහංසො” යනාදි තැන්හි තැතිගැන්ම ප්‍රකාශ කෙරෙයි. මෙහි **පුඤ්ඤානං** යනුවෙන් අපාදානාර්ථයෙහි ෂෂ්ඨී විභක්ති යෙදූ හෙයින් කාරක භේදයකි. පුණ්‍යක්‍රියාවලින් භය නොවව් යන අර්ථ යි. සැපයට හේතුවූ පිනට සැපය යි වදාළේ ඵලොපචාර වශයෙනි. ඵලෝපචාරය නම් ඵලය හා හේතුව යන දෙක නොවෙනස් කොට දැක්වීමේ න්‍යාය යයි. “සෙම්හො ගුළො”යි කී කල උක්සකුරු සෙම් වැඩීමට හේතු වේ. එහෙයින් උක් සකුරට සෙමය යි කිව ද වරදෙක් නොවේ.

**සත්තසංවට්ට විවට්ට කප්ප —**

මෙයින් මහාකල්ප සතක් ගැනෙයි. අන්තඃකල්ප ය අසංඛ්‍යකල්ප ය මහාකල්පය යි කල්පය තුන් ආකාර වේ.

මිනිසුන්ගේ දසහැවිරිදි කාලයෙහි පටන් ආයුෂය ක්‍රමයෙන් නැගී අසංඛ්‍යයට පැමිණ එතැන් සිට ක්‍රමයෙන් බැස දසහවුරුද්ද දක්වා පැවැති මේ අතරකාලය එක් අන්තඃ කල්පයෙකි. අන්තඃ කල්ප 20 ක් අසංඛ්‍ය කල්ප එක යි.

සංවර්තය, සංවර්තස්ථායිය, විවර්තය, විවර්තස්ථායි යයි මෙහිදු අවස්ථා සතරෙකි සංවර්තය නම් නැතිවන කාලය යි. සංවර්තස්ථායි නම් නැතිවෙමින් පවත්නා කාලය යි. විවර්තය නම් ඇතිවන කාලය යි. විවර්තස්ථායි නම් ඇතිව පවත්නා කාලය යි. මෙහි එක් සංවර්තයක් එක් අසංඛ්‍ය කල්පයකට අයත් වේ එබඳු අසංඛ්‍ය කල්ප සතරක් මහා කල්ප එකකි. මෙසේවූ මහා කල්ප සතක් ගැනෙයි **ධර්මප්‍රදීපිකායෙන්** මෙහි විස්තර බලා දතගත යුතු යි.

**සත්තවස්සානි මෙත්තචිත්තං භාවෙත්වා** යනුවෙන් පටන්ගෙන **අඤ්ඤදත්ථු දසො වසවත්ති** යන තැන දක්වා භාවය වශයෙන් ගත්කල එකල්හි අප බුදුහු බෝධිසත්ව අවස්ථායෙහිම සමාපත්ති ලාභීව බ්‍රහ්මපාරිෂද්‍යය, බ්‍රහ්ම පුරෝහිතය, මහාබ්‍රහ්මය යන ප්‍රථමධ්‍යාන තලය හා පරිත්තාභය අප්පමාණාභය ආභස්සරය යන ද්විතීය ධ්‍යාන තලයෙහි දූයි මෙසේ ධ්‍යාන භූමි දෙක්හි සැරිසැරීමෙන් රූපාවචර කුසල විපාකයන්ගේ මහත්වය දක්වා **ඡත්තිං සක්ඛත්තුං ඛො පනාහං භික්ඛවෙ සක්කො අහොසිං දෙවානමින්දො,** යනාදීන් කාමාවචර කුසලවිපාක මහත්වය ද දක්වූසේක.

**සත්තරතනසමන්නාගතො**

සක්විති රජකුට අයත් රත්න සතෙකි. චක්‍රරත්නය, හස්තිරත්නය, අශ්වරත්නය, මණිරත්නය, ස්ත්‍රීරත්නය, ගෘහපතිරත්නය, පරිනායකරත්නය යනු යි. **ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහ** ආදි සිංහල බණපොත් වලින් විස්තර දතහැකි යි.

### දාන දම සංයම

දියයුතු දෙයක් පරිත්‍යාගකිරීම දානය යි. චක්ඛුරාදි ඉන්ද්‍රියයන් හික්මවීම හා සීලසමාදානාදියෙන් රාගාදි කෙලෙසුන් දුරුකිරීම දම යයි. කාය වාග් ද්වාරයන්ගේ සංවරණය සංයම යයි. ඉන්ද්‍රියදමනය නොහොත් ක්ලෙශ දමනය භාවනාමය පිනකි. එය මෛත්‍රී බඹවිහරණ ගුණ ඇතිවම වැඩීමෙන් ප්‍රථමධ්‍යාන, ද්විතීයධ්‍යාන, කුසල් සිත් උපදවා ගත් හෙයින් බඹතල දෙක්හි අප මහබෝසතාණන්ගේ උත්පත්තිය ලැබිණ.

මෙසේ මේ සූත්‍ර දේශනාවෙන් භාග්‍යවත්හු තමන් වහන්සේ කායසාක්ෂි කොටගෙන රූපාවචර හා කාමාවචර කුසල විපාකයන්ගේ මහත්වය දක්වා "පුඤ්ඤමෙව සො සික්ඛෙය්‍ය" යන ආදීන් ගාථා වශයෙනුදු එය වදාළ සේක.

**දෙවන සූත්‍ර විවරණය යි.**

## 1 - 3 - 3

**වුත්තං හෙතං භගවතා වුත්ත'මරහතාති මෙ සුතං,**

එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො උභො අත්ථෙ සමධිගය්හ තිඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්ච, කතමො එකධම්මො? **අප්පමාදො කුසලෙසු ධම්මෙසු,** අයං ඛො භික්ඛවෙ එකධම්මො භාවිතො බහුලීකතො උභො අත්ථෙ සමධිගය්හ තිට්ඨති දිට්ඨධම්මිකඤ්චෙව අත්ථං සම්පරායිකඤ්චාති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"අප්පමාදං පසංසන්ති පුඤ්ඤකිරියාසු පණ්ඩිතා
අප්පමත්තො උභො අත්ථෙ අධිගණ්හාති පණ්ඩිතො
දිට්ඨෙවධම්මෙ යො අත්ථො යොචත්ථො සම්පරායිකො
අත්ථාභිසමයා ධීරො පණ්ඩිතොති පවුච්චති.

අයංපි අත්ථො වුත්තො, භගවතා ඉති මෙ සුතන්ති

**අර්ථය:-**

**උභො අත්‍ථෙ,** දෙවැදෑරුම් අර්ථයන්; **සමධිගය්හ,** මොනවට ගෙන නොහොත් අත් නොහැර; **දිට්ඨධම්මිකං-චෙව අත්‍ථං,** ඉහලෝකාර්ථය ද; **සම්පරායිකං ච අත්‍ථං,** පරලෝකාර්ථය ද, **අප්පමාදෙ,** ස්මෘති අවිප්‍රවාසය යි කියන ලද සිහියෙන් වෙන් නොවීම.

**පණ්ඩිතා,** බුද්ධාදි උත්තමයෝ; **පුඤ්ඤකිරියාසු,** පුණ්‍ය ක්‍රියා විෂයෙහි; **අප්පමාදං,** අප්‍රමාදය; **පසංසන්ති,** වර්ණනා කෙරෙත්; **අප්පමත්තො,** ප්‍රමාද නොවූ; **පණ්ඩිතො,** ඥාණ වන්ත පුද්ගලතෙම; **උභො අත්‍ථෙ,** දෙවැදෑරුම් අර්ථයන්; **අභිගණ්හාති,** වෙසෙසින් ගනී;

**දිට්ඨෙ ච ධම්මෙ,** මෙලෙව්හි; **යො අත්‍ථො,** යම් අර්ථයක් වේ ද, **යො ච අත්‍ථො,** යම් අර්ථයක්; **සම්පරායිකො,** පරලෙව්හි වේ ද; **අත්‍ථාභිසමයා,** මෙසේ දෙවැදෑරුම් අර්ථ ලාභයෙන්; **ධීරො,** ධෛර්‍ය්‍ය සම්පන්න නැනැත්තේ; **පණ්ඩිතො ඉති පවුච්චති,** පණ්ඩිත යයි කියනු ලැබේ.

**භාවය:-** සුගම යි.

**ධර්මවිස්තර:-**

**දිට්ඨධම්මිකං චෙව අත්‍ථං සම්පරායිකං ච —**

“දිට්ඨධම්මෙ භවං දිට්ඨධම්මිකං, සම්පරායෙ භවං සම්පරායිකං” යනු මෙහි විග්‍රහ යි. මෙලොව අර්ථ සිද්ධිය හා පරලොව අර්ථ සිද්ධියත් යන දෙකම දෘෂ්ටධාර්මික සාම්පරායික නම්වලින් පවසනු ලැබෙත්.

දෘෂ්ටධාර්මික අර්ථය නම් කවරේ ද යත්? ගෘහස්ථයන් පිළිබඳව නම්, උපභොග පරිභොග වස්තු සැපයීම, නිවැරදි කර්මාන්ත හා සෞඛ්‍ය කටයුතු සංවිධානය, අභ්‍යන්තර බාහිර වස්තූන් පිරිසිදුව තබාගැනීම, ක්‍රමානුකූල අන්දමින් පිළියෙළ කළ ශිල්පායතන, විද්‍යායතන හා ආශ්‍රිත පරිවාර ජනයාහට සංග්‍රහ කිරීම ද, යනාදි යයි.

පැවිද්දන්හට වනාහි කරදර නොවන අන්දමින් සිවුපස පරිභොගය සැලසීම, එය ප්‍රත්‍යවෙක්‍ෂාවෙන් ඇසුරු කිරීම හා දුරුකිරීම, ආධ්‍යාත්මික බාහිර වස්තූන් පිරිසිදුව තබාගැන්ම, අල්පෙච්ඡ බව හා ලද දෙයින් සතුටුවන බව, කාය චිත්ත විවේකය, ජනසමාජයෙහි නොඇලීම, යන මේ ආදි කරුණු යි.

පතිරූපදෙස වාසය, සත්පුරුෂාශ්‍රය, යොනිසො මනසිකාරය, යන මේ කරුණු ගිහි පැවිදි දෙපක්‍ෂයටම සාධාරණය.

**අප්පමාද —**

ප්‍රමාදයට විරුද්ධධර්මය අප්‍රමාදය යි. ප්‍රමාදය නම් දුසිරිතෙහි සිත යෙදවීම, පස්කම් සැපතෙහි සිත ඇලීම, කුශලධර්මයන් වැඩීමෙහි සිත පුරුදු නොකිරීම, එහි නිරතුරුව නොයෙදීම, එහි කෙළවරට නොපැමිණීම, සිතෙහි මැලිකම, කැමැත්තක් නැති බව, උත්සාහයක් නැතිකම, ගුණ දහම් නොවැඩීම හා ඒවා පුරුදු නොකිරීම, පුරුදු කරන්නටවත් සිතා නොගැනීම, එහි සිත නොයෙදවීම, මේ ආදි ගුණ විරෝධි කරුණු යි.

මෙහි තෘෂ්ණාමූලක ප්‍රමාදය, අවිද්‍යාමූලක ප්‍රමාදය යි ප්‍රමාදය දෙවැදෑරුම් වෙයි **අවිද්‍යා මූලකප්‍රමාදය,** නම් පඤ්චස්කන්ධයෝ උත්පාදව්‍යය සවභාව කොට ඇත්තාහ යි තත්වූ පරිදි නොසැලකීම හා නොදැනීම යි. **තෘෂ්ණා මූලක ප්‍රමාදය,** තුන්වැදෑරුම් වේ නූපන් වස්තුව උපදවා ගන්නට සිතීමෙන්, ලොභයෙන් හා මුළාවෙන් ද, ප්‍රමාදයට පැමිණේ. උපන් වස්තූන් ගැන පරීක්‍ෂණයන්, සංරක්‍ෂණයන්, සංවිධානයන්, ප්‍රයෝජන ගැනීමත් යන මේ කරුණු හේතුකොට ගෙන ප්‍රමාදය ඇති වේ. මෙසේ අවිද්‍යාමූලක ප්‍රමාදය හා තෘෂ්ණාමූලක ප්‍රමාදත්‍රයත් එක්වූ කල ප්‍රමාදය සිව්වැදෑරුම් වේ.

**භාවිත බහුලීකත —**

ප්‍රමාදය දුරුකළ යුතුය, අප්‍රමාදය වැඩිය යුතු යි. කෙසේ වැඩිය යුතු ද යත්? අප්‍රමාද භාවනාවෙනි. අප්‍රමාද භාවනාවය යන නමින් වෙනම භාවනාවක් නැතත් යම් කිසි පිනක් නිතර නිතර කෙරේ නම් එයම සිත්හි වඩා නම් එයම අප්‍රමාද භාවනාවය යි දතයුතු.

විශේෂයෙන් තිවන් පතා සරණ යාම, කායික චෛතසික සංවරය සලකා පුරුදු කරන සීලභාවනාව, සියලු සමාධි භාවනා හා සියලු ප්‍රඥා භාවනා, සියලු කුසල භාවනා හා සියලු නිරවද්‍ය භාවනා, අප්‍රමාද භාවනාවට ඇතුළත් වේ භාවනා යන්නෙන් අදහස් කරන්නේ සිත්වල ගුණදහම් වැඩීම යි. එසේම පුරුදු කිරීම යි.

**අප්පමාද —**

මහත්වූ අර්ථයක් ප්‍රකාශ කරන සියලු ධර්මස්කන්ධ යන් ඇතුළත් කොට ඇති ශ්‍රෙෂ්ඨ බණ පදයකි. සියලුම ත්‍රිපිටක බුද්ධ වචනය ගෙනහැර දක්වා අප්පමාද යන බණ පදය විස්තර කරන ධර්මකථික තෙමේ නොතොටින් ගහට බැස්සකු වැනිය යි නොසැලකිය යුතු ය.

කුමක් හෙයින් ද යත්?

**අප්පමාද** යන බුද්ධවචනය එතරම් ශ්‍රෙෂ්ඨ ද ප්‍රධාන ද වන හෙයිනි. ඒ එසේ මැයි. අප තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ කුසිණාරා නුවර යුග්ම සාලාන්තරයෙහි පරිනිර්වාණ සමයෙහි සැතැපුණුසේක් බුද්ධත්වයෙහි පටන් පිරිනිවීම තෙක් පන්සාළිස් වසක් මුලුල්ලෙහි තමන් වහන්සේ වදාළ සුවාසූ දහසක් ධර්මස්කන්ධය එක පදයකට ඇතුළත් කොට වදාරන සේක් — "අප්පමාදෙන සම්පාදෙථ" යයි භික්ෂූන්ට අවවාද කළ සේක.

එහෙයින් සියලු සතුන්ගේ පියවර ඇත් පියවරට ඇතුළත් කළ හැක්කාක් මෙන් සියලු කුසල ධර්මයන් අප්‍රමාද මූලක බැවින් අප්පමාදය ඔවුන් අතුරෙන් අග්‍ර යයි කියනු ලැබේ.

එහෙයින් වදාළහ; **මජ්ඣිමනිකායෙහි** මහා හත්ථිපදොපම සූත්‍රයෙහි – "සෙය්‍යථාපි භික්ඛවෙ යානි කානිචි ජඞ්ගමානං පාණානං පදජාතානි සබ්බානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති. හත්ථිපදං තෙසං අග්ගමක්ඛායති. යදිදං මහන්තත්තෙන, එවමෙව ඛො භික්ඛවෙ යෙකෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ අප්පමාදමූලකා, අප්පමාද සමොසරණා, අප්පමාදො තෙසං අග්ගමක්ඛායතී ති" එසේම **ධම්මපද පාළියෙහි** "අප්පමාදො අමතපදං" යන ආදි ගාථාවලින් ප්‍රකාශිත අප්‍රමාද වර්ගයෙන් ද මෙහි විස්තර දත යුතු.

**තුන් වන සූත්‍රවිවරණය යි.**

**1 – 3 – 4**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං**

එකපුග්ගලස්ස භික්ඛවෙ **කප්පං** සන්ධාවතො සංසරතො සියා එවං මහා අට්ඨිකඞ්කලො අට්ඨිපුඤ්ජො **අට්ඨිරාසි** යථායං වෙපුල්ලො පබ්බතො සචෙ සංහාරකො අස්ස, සම්භතඤ්ච න විනස්සෙය්‍යා'ති එත මත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති.

එකස්සෙකෙන කප්පෙන පුග්ගලස්සට්ඨිසඤ්චයො
සියා පබ්බත සමො රාසි ඉති වුත්තං මහෙසිනා
සො ඛො පනායං අක්ඛාතො වෙපුල්ලො පබ්බතො මහා
උත්තරො ගිජ්ඣකූටස්ස මගධානං ගිරිබ්බජෙ
යතො අරියසච්චානි සම්මප්පඤ්ඤාය පස්සති
දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං
සත්තක්ඛත්තුං පරමඤ්ච සන්ධාවිත්වාන පුග්ගලො
දුක්ඛස්සන්තකරො හොති සබ්බසංයොජනක්ඛයා'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති

අර්ථය:-

**කප්පං**, කල්පයක් මුළුල්ලෙහි; **සන්ධාවතො**, සසර ගමන් කරන්නාවූ; **එකපුග්ගලස්ස**, එක සත්වයෙකුගේ; **අට්ඨිකඞ්කලො**, ඇටරාශිය; **අට්ඨිපුඤ්ජො**, **අට්ඨිරාසි** යනු ද පර්‍යාය වචනයි. **සචෙ**, ඉදින්; **සංහාරකො අස්ස**, තො විසිරියදී එකතු කරන්නේ වේ නම්; **සම්භතඤ්ච**, රැස්කළ ඇට ගොඩත්; **න විනස්සෙය්‍ය**, විනාශ නොවේ නම්, **අයං වෙපුල්ලො පබ්බතො යථා**, මේ වේපුල්ල පර්වතය මෙනි.

**එකෙන කප්පෙන**, එක කල්පයකින්, **එකස්ස පුග්ගලස්ස**, එක පුද්ගලයකුගේ; **අට්ඨිසඤ්චයො**, ඇටගොඩ; **පබ්බතසමො**, පර්වතය හා සමානවූ; **රාසි සියා ඉති**, රැසක් වන්නේ යයි; **මහෙසිනා**, සර්වඥයන් වහන්සේ විසින්; **ඉති වුත්තං**, මෙසේ විදාරන ලදී.

**සො ඛො පන අක්ඛාතො**, ඒ කියන ලද; **මහා**, විශාලවූ; **අයං වෙපුල්ලො පබ්බතො**, මේ වේපුල්ල පර්වතය තෙම; **මගධානං**, මගධයන්ගේ; **ගිරිබ්බජෙ**, ගිරිව්‍රජ පුරයෙහි; නොහොත් රජගහනුවර සමීපයෙහි; **ගිජ්ඣකූටස්ස**, ගිජුකුළු පව්වට; **උත්තරො**, උතුරෙහි පිහිටියේය.

**යතො**, යම්හෙයකින්; **අරියසච්චානි**, චතුරාර්‍ය්‍ය සත්‍යයන්; **සම්මප්පඤ්ඤාය**, මනා නුවණින්; **පස්සති**, දකී ද; ඒ කෙසේ ද යත්? **දුක්ඛං**, දුකය; **දුක්ඛසමුප්පාදං**, දුකට හේතුවය; **දුක්ඛස්ස ච අතික්කමං**, දුක නැතිකිරීමය, **දුක්ඛූපසමගාමිනං**, දුක නැතිකිරීමට පමුණුවන; **අරියං අට්ඨඞ්ගිකං මග්ගං ච**, ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය ද යන මේ යි.

**පුග්ගලො**, ඒ මේ ආර්‍ය්‍ය පුද්ගල තෙම; **සත්තක්ඛත්තුං පරමං**, සත්වරක් සීමා කොට; **සන්ධාවිත්වාන**, සසර දුව ඇවිද; **සබ්බසංයොජනක්ඛයා**, සියලු භව බන්ධනයන් දුරු කිරීමෙන්; **දුක්ඛස්සන්තකරො හොති**, දුක් කෙළවර කරන්නේ වෙයි.

භාවය:-

එක මහා කල්පයක් මුළුල්ලෙහි සසර සැරි සරන සත්ත්වයකුගේ ඇට කටු ගොඩක් විනාශ නොවී පවතී නම් එය වෙපුල්ල පර්වතය මෙන් විශාල වන්නේය. මෙය මෘත ශරීර නිඃක්ෂෙපයක් නැති ඖපපාතික සත්ත්වයන්ගේ අස්ථි ශෙෂ නොවන බැවින් ඔවුන් හා කුඩා සරීර ඇති සත්ත්වයන් ද හැර සෙසු මහා සත්ත්වයන් ගැන නොහොත් මිනිසුන් සලකා වදාරන ලදි. දිව්‍යාත්මයෙන් චුතවන දෙවියන්ගේ මළසිරුරු අනාභාසිත වෙති. මෙසේ ඇට රැසක් එකතැන් වන හෙයින් සර්වඥතාඥානයෙන් පිරිසිඳ දැන සංසාරයෙහි දීර්ඝත්වය සලකා වදාරන ලදි.

ධර්මවිස්තර:-

**සම්මප්පඤ්ඤාය පස්සති** —

මෙයින් පවසන්නේ විදර්ශනා ප්‍රඥා සහිත මාර්ගප්‍රඥාව යි විදර්ශනාවෙන් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් දකී. මාර්ග ප්‍රඥාවෙන් පරිඤ්ඤා පහාණ සච්ඡිකිරිය භාවනා වශයෙන් දකියි.

දුක පිරිසිඳ දැනීම **පරිඥාභිසමය** යි. සමුදය දුරු කළ යුතු යයි දැනීම **ප්‍රහාණාභිසමය** යි. නිරෝධය ප්‍රත්‍යක්ෂ කළයුතු යයි දැනීම **සාක්ෂාත් කර්තව්‍යාභිසමය** යි. මාර්ගය වැඩිය යුතු යයි දැනීම **භාවනාභිසමය** යි. "දුක්ඛං දුක්ඛ සමුප්පාදං" යන ආදීන් ප්‍රකාශ වූයේ ආර්ය සත්‍යයන්ගේ ස්වරූපය දැක්වීම යි.

**සත්තක්ඛත්තුපරම** —

මෙසේ චතුස්සත්‍යාවබෝධය කරන පුද්ගලයා සෝවාන් වෙයි. සෝවාන් පුද්ගලයෝ තිදෙනෙකි. ඔවුන්ට එකබීජිය, කොලංකොලය, සත්තක්ඛත්තුපරමය යනුවෙන් නම් කෙරෙති. මොවුන් අතුරෙන් ශ්‍රද්ධාදි පඤ්චෙන්ද්‍රියයන් තියුණු අන්දමින් වැඩූ ආර්යපුද්ගල තෙමේ **එකබීජී** නම් වූ සෝතාපන්නයෙක් වේ. හෙතෙම මිනිස් ලොව හෝ

දෙව්ලොව එකවරක් ඉපද දුක් කෙළවර කෙරෙයි. තමන් විසින් මතු ලැබිය යුතු තුන් මාර්ග තුන්ඵලයන් පිළිබඳ විදර්ශනාව බලවත් හෙයිනි. මෙතෙම ජ්‍යෙෂ්ඨ සොවාන් ආර්‍ය පුද්ගලයා යයි සලකනු ලැබේ.

මධ්‍යම වශයෙන් වැඩූ ආර්‍ය පුද්ගල තෙමේ **කොලංකොල** නම්. මෙතෙම සෝවාන් මාර්ග ඵලයන් ප්‍රත්‍යක්ෂ කළ තැන් පටන් දෙව් මිනිස් දෙගතියෙහි දෙතුන්වරක් හෝ සවතවර දක්වා හෝ ඉපද සෙසු තුන්මාර්ග තුන් ඵලයන් ප්‍රත්‍යක්ෂ කොට දුක් කෙළවර කෙරෙයි. මොහු මධ්‍යම සොතාපන්නයා යි.

යමෙක් ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් මෘදු වශයෙන් වඩා සෝවාන් වී එතැන් පටන් දෙව් මිනිස් දෙගතියෙහි සත්වන වර දක්වා නොහොත් සත්වන වරත් මිශ්‍රව ඉපද සෙසු තුන්මාර්ග තුන් ඵලයන් ද ප්‍රත්‍යක්ෂ කොට දුක් කෙළවර කෙරේ ද මොහු **සත්තක්ඛත්තුපරම** නම්. මෙහි දක්වූයේ මේ කණිෂ්ඨ සෝවාන් ආර්‍යශ්‍රාවකයා සඳහා යි.

**සබ්බසංයොජනක්ඛයා** —

මොහු පිළිවෙළින් රහත්ඵලයට පැමිණ සියලු භව බන්ධන සඞ්ඛ්‍යාත සංයෝජනයන් දුරු කෙරේය යි අර්හත් ඵලයෙන් දේශනාව කෙළවර කළසේක.

**සතරවන සූත්‍ර විවරණය යි.**

**1 – 3 – 5**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති** මෙ සූත්‍රං,

එකං ධම්මං අතීතස්ස භික්ඛවෙ පුරිසපුග්ගලස්ස නාහං තස්ස කිඤ්චි පාපකම්මං අකරණීයන්ති වදාමි. කතමං එක ධම්මං? යදිදං භික්ඛවෙ **සම්පජාන මුසාවාදො'ති**

එත මත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

එකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස ජන්තුනො
විතිණ්ණ පරලොකස්ස නත්ථි පාපං අකාරියන්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

අර්ථය:-

**භික්ඛවෙ**, මහණෙනි; **අහං**, මම; **එකං ධම්මං අතීතස්ස**, වාක් සත්‍යය යි කියනලද එක ම ධර්මයක් ඉක්ම වූ; **තස්ස පුරිසපුග්ගලස්ස**, ඒ පුරුෂ පුද්ගලයා විසින්; **අකරණීයං**, නොකළ හැකි; **කිඤ්චි පාපකම්මං**, කිසියම් පවිකමක්; **න ඉති**, නැතැ යි; **වදාමි**, කියමි; **යදිදං**, යම් මේ; **සම්පජාන මුසාවාදො**, දැන දැන බොරු කීම යි;

**එකං ධම්මං අතීතස්ස**, එක ම වාක් සත්‍යධර්මය ඉක්ම වූ; **මුසාවාදිස්ස**, (දශ බසකින් එක බසකුදු සැබෑ නොවන හෙයින්) බොරු බොහෝ කොට කියන සුලු වූ; **විතිණ්ණපරලොකස්ස**, (දිව්‍ය මනුෂ්‍ය සම්පත්තියට හා නිර්වාණ සම්පත්තියටත් හිමි නොවන හෙයින් හරනාලද පරලෝ ඇති; **ජනතුනො**, මෙබඳු සත්වයා විසින්; **අකාරියං**, නොකටහැකි වූ; **පාපං**, අකුශලයෙක් නම්: **නත්ථි**, නැත. (ධම්මපද පුරාණ සන්නය)

**භාවය** – සුගම යි.

**බණ විස්තර:-**

**එකං ධම්මං අතීතස්ස** —

එකල්හි භාග්‍යවතුන් වහන්සේට හා උන්වහන්සේගේ ශ්‍රාවකයන්ටත් මහත් වූ ලාභ සත්කාරයක් උපණි. තීර්ථකයෝ ලාභසත්කාරයෙන් පිරිහුණාහු ය. එයින් හටගත් ඊර්ෂ්‍යා ඇති ඒ තීර්ථකයෝ **චිඤ්චමාණවිකා** නම් වූ ඔවුන්ගේ පරිව්‍රාජිකාවක් ශ්‍රමණභවත් ගෞතමයන්ට අසත්‍යයෙන් චෝදනා නගන ලෙස යෙදවූහ. ඈ එය පිළිගෙන භාග්‍යවතුන් දහම් දෙසද්දී එතැනට පැමිණ අසත්‍යයෙන් නින්දා පරිභව කළා ය. සක්දෙවිඳු විසින් එය හෙළි කරනලදුව මහාජනයාගෙන් නින්දා ලැබ පොළොව පළාගෙන අවීචියට ගියා ය. එතැන් පටන් තීර්ථකයන්ට ලාභ සත්කාර බොහෝ සෙයින් පිරිහුණේ ය.

භික්ෂූහු දම්සභා මණ්ඩපයෙහි රැස්ව මෙපුවත ගෙනහැර දක්වා කථා කළහ. බුදුහු එකරුණ නිසා මහණෙනි, චිඤ්චමාණවිකාව දැන් මතු ද නොවෙයි. පෙරත් මට අභූතයෙන් නින්දාපරිභව කොට මහා විනාශයකට පත්වූවා යයි **මහාපදුම ජාතකය** වදාරා එය අට්ඨොත්පත්ති කොටගෙන මේ සූත්‍රය වදාළසේක.

**අර්ථය හා භාවය**:- සුගම යි.

**ධර්ම විස්තර**:-

**අට්ඨ අනරිය වොහාර** —

1. අදිට්ඨං දිට්ඨං මෙ 2. අසුතං සුතං මෙ 3. අමුතං මුතං මෙ 4. අවිඤ්ඤාතං විඤ්ඤාතං මෙ 5. දිට්ඨං අදිට්ඨං මෙ 6. සුතං අසුතං මෙ 7. මුතං අමුතං මෙ 8. විඤ්ඤාතං අවිඤ්ඤාතං මෙ යනුවෙන් නරක චේතනාවෙන් ව්‍යවහාර කරන කථා අටෙකි. එය උතුමන්ගේ ව්‍යවහාර නොවන හෙයින් අනාර්ය ව්‍යවහාර යයි කියනු ලැබේ. 1. තමා නුදුටු දෙය දක්නා ලද යි කීම 2. නො ඇසූ දෙය අසන ලද යි කීම 3. නාසය දිව ශරීරය යන මේ ඉඳුරන්ගෙන් නොගත් දෙය ගන්නා ලද යි කීම 4. සිතින් නො ගත් අරමුණ ගතැ යි කීම යන මේ ආදී වශයෙනි.

**අට්ඨ අරිය වොහාර** —

1. අදිට්ඨෙ අදිට්ඨවාදිතා 2. අසුතෙ අසුත වාදිතා 3. අමුතෙ අමුතවාදිතා 4. අවිඤ්ඤාතෙ අවිඤ්ඤාත වාදිතා 5. දිට්ඨෙ දිට්ඨවාදිතා 6. සුතෙ සුතවාදිතා 7. මුතෙ මුත වාදිතා 8 විඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා යන අට යි.

**පස් වන සූත්‍ර විවරණය යි.**

## 1 - 3 - 6

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතා’ති මෙ සුතං,**

එවඤ්චෙ භික්ඛවෙ සත්තා ජානෙය්‍යුං **දානසංවිභාගස්ස විපාකං,** යථා ‘හං ජානාමි. න අදත්වා භුඤ්ජෙය්‍යුං; න ච

තෙසං මච්ඡේරමලං චිත්තං **පරියාදය** තිට්ඨෙය්‍ය, යොපි තෙසං **අස්ස** චරිමො **ආලොපො** චරිමං කබළං තතොපි න අසංවිභජිත්වා භුඤ්ජෙය්‍යුං, සචෙ **තෙසං** පටිග්ගාහකා අස්සු; යස්මා ච ඛො භික්ඛවෙ සත්තා න එවං ජානන්ති දානසංවිභාගස්ස විපාකං, යථා අහං ජානාමි; තස්මා **අදත්වා** භුඤ්ජන්ති. මච්ඡේරමලං ච තෙසං චිත්තං පරියාදය තිට්ඨතීති

එත'මත්ථං භගවා අවොච, තත්ථෙ'තං ඉති වුච්චති.

එවං චෙ සත්තා ජානෙය්‍යුං යථාවුත්තං මහෙසිනා
විපාකං සංවිභාගස්ස යථා හොති මහප්ඵලං
විනෙය්‍යුං මච්ඡේරමලං විප්පසන්නෙන චෙතසා
දජ්ජුං කාලෙන අරියෙසු යත්ථ දින්නං මහප්ඵලං
අන්නං ච දත්වා බහුනො දක්ඛිණෙය්‍යෙසු දක්ඛිණං
ඉතො චුතා මනුස්සත්තා සග්ගං ගච්ඡන්ති දායකා
තෙ ච සග්ගං ගතා තත්ථ මොදන්ති කාමකාමිනො
විපාකං සංවිභාගස්ස අනුභොන්ති අමච්ඡරා'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

**අර්ථය:**-

**භික්ඛවෙ**, මහණෙනි; **සත්තා**, සත්වයෝ; **දානසංවිභාගස්ස**, දීම ය බෙදීමය යන මේ කරුණු දෙක පිළිබඳව; **යථා**, යම්සේ; **අහං**, මම; **ජානාමි**, දනිම් ද; **චෙ**, ඉදින්; **එවං ජානෙය්‍යුං**, එසේ දනිත් නම්; **අදත්වා**, නොදී; **න භුඤ්ජෙය්‍යුං**, නො වළඳත්; **තෙසං චිත්තං**, මොවුන්ගේ සිත; **මච්ඡේරමලං**, මසුරු මලය තෙම; **පරියාදය**, වැළඳ ගෙන; **න තිට්ඨෙය්‍ය**, නොපවත්නේය; **තෙසං**, මොවුන් ගේ; **යොපි චරිමො ආලොපො අස්ස**, යම් අන්තිම බත් පිඩක් වේ ද; **චරිමං කබලං**, පශ්චිම ආහාර පිණ්ඩය වේ ද; **සචෙ**, ඉදින්; **තෙසං**, මොවුන්ගේ පිණ්ඩය; **පටිග්ගාහකා අස්සු**, පිළිගනු කැමැත්තෝ වෙත් නම්; **තතොපි**, එයිනුදු; **අසංවිභජිත්වා**, බෙදා නොදී; **න භුඤ්ජෙය්‍යුං**, නොවළඳත්; **යස්මා ච ඛො**, යම්හෙයකින් වනාහි; **දානසංවිභාගස්ස විපාකං**, දන් බෙදීමෙහි විපාකය; **යථා අහං ජානාමි**, මම

යම් සේ දනිම් නම්; **සත්තා,** සත්ත්වයෝ; **එවං,** එසේ; **න ජානන්ති,** නොදනිත් ද; **තස්මා,** එහෙයින්; **අදත්වා,** නොදී; **භුඤ්ජන්ති,** අනුභව කෙරෙත්; **මච්ඡෙරමලං,** මසුරු මලය තෙම; **තෙසං,** ඔවුන්ගේ; **චිත්තං,** සිත; **පරියාදය,** මැඩ ගෙන; **තිට්ඨති,** සිටී;

**මහෙසිනා,** මහර්ෂි වූ සම්බුදුන් වහන්සේ විසින්; **යථා වුත්තං,** වදාළ පරිද්දෙන්; **සංවිභාගස්ස,** දාන සංවිභාගයාගේ; **විපාකං,** විපාකය; **යථා මහප්ඵලං හොති,** යම් සේ මහත් ඵල වේ ද; **එවං,** එසේ; **සත්තා,** සත්ත්වයෝ; **චෙ,** ඉදින්; **ජානෙය්‍යුං** දනිත් ද;

**මච්ඡෙරමලං,** මසුරු මලය; **විනෙය්‍යුං,** දුරු කෙරෙත්; **යත්ථ,** යම් තැනෙක්හි; **දින්නං,** දෙනලද්ද; **මහප්ඵලං,** මහත් ඵල වේ ද; **විප්පසන්නෙන චෙතසා,** පහන් සිතින්; **කාලෙන,** සුදුසු කාලයෙහි; **අරියෙසු,** ආර්යයන් කෙරෙහි; **දජ්ජුං,** දෙන්නාහු ය;

**බහුනො,** බොහෝ ජනයාට; **අන්නං ච දත්වා,** ආහාරත් දී; **දක්ඛිණෙය්‍යෙසු,** දක්ෂිණාර්හයන් කෙරෙහි; **දක්ඛිණං,** දක්ෂිණාව හෙවත් දානයත් (දී) **දායකා,** දායකයෝ; **ඉතො–චුතා,** මෙයින් චුතව; **මනුස්සත්තං,** මිනිසත් බවට ද; **සග්ගං,** ස්වර්ගලෝකයට ද; **ගච්ඡන්ති,** යෙත්;

**තෙ ච,** ඔවුහු ද; **සග්ගං ගතා,** දෙව්ලොව ගියාහු; **තත්ථ** එහි; **කාමකාමිනො,** කැමැති කැමැති සම්පත් ඇත්තාහු; **මොදන්ති,** සතුටුවෙත්; **අමච්ඡරා,** නොමසුරුවූ ඔවුහු; **සංවිභාගස්ස,** දානසංවිභාගයාගේ; **විපාකං,** විපාකය; **අනු–භොන්ති,** විඳිත්;

**භාවය:–**

“මහණෙනි, ඉදින් සත්හු මා සේ මැ දානයෙහි ඵල දනිත් නම් නොදී නොවළඳති. මසුරුමල ඔවුන් සිත ඇවිළගෙන නො ද සිටී එක ආලෝපයකුදු ලද බෙදා දී වළඳ කෙරෙති. ඉදින් ගන්නා කෙනෙක් ඇත් නම්” යනු **ධම්මපදීපිකා** යි. සෙස්ස සුගම යි.

ධර්මවිස්තර:-

**දාන සංවිභාග —**

පරිත්‍යාග චේතනාවකින් ආහාර පාන වස්ත්‍ර ආදී දිය යුතු දෙය රැස් කොට අනුකම්පා අදහසින් හෝ පූජා අදහසින් අනුන්ට දෙනු ලැබේ නම් ඒ දානය යි. තමාගේ ප්‍රයෝජනයට ගත් දෙයින් කොටසක් බෙදා දේ නම් හේ **සංවිභාගය** යි.

මච්ඡරමලං —

තමාගේ සම්පත්තියෙන් අනුන් ප්‍රයෝජන ගැනීම නො ඉවසීම නිසා සිතෙහි පිරිසුදුබව නැති කරන සිත කෙලෙසන පාපය **මච්ඡරිය** නම් වේ.

දීමට අන්තරාය කරන චෙතත් ඊර්ෂ්‍යා, ලොභ, ද්වේෂ, මොහාදී කෙලෙස් මලයෙන් යුක්තවූ චිත්ත සන්තානයෙහි දාන චේතනාව නො පවත්නේ නමුදු අපිරිසුදු වූයේ නමුදු මසුරුමලය තරම් ඒ කිසිවක් බලගතු නොවේ. එහෙයින් දීමෙහි අනුසස් දත්නාවූ කවරෙක් නම් එයට ඉදුරාම බාධක වූ මාත්සර්‍ය්‍යයට සිත ඉඩ හරින්නේ ද? නොහරනේ මැ යි.

චරිමාලොපය —

තමහට යැපීමට ප්‍රමාණ වූ බත්පිඩු ගණනින් එකක් ඉතිරි කොට ගෙන සෙසු පිඩු ගණන යාචකයන්ට දීමෙන් ඉතිරි වූ තමා අයත් අන්තිම පිඩ **චරිමාලෝපය** යි. එයින් ද යැපෙන්නට කෙනෙක් ඇත් නම් දන්දීමෙහි අනුසස් දන්නෝ එයිනුදු බෙදා නොදී නොවළඳති යි දෙසූ අයුරු යි.

**සවන සූත්‍ර විවරණය යි.**

## 1 – 3 – 7

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං,**

යානි කානිචි භික්ඛවෙ ඔපධිකානි පුඤ්ඤකිරිය වත්ථූනි සබ්බානි තානි **මෙත්තාය චෙතොවිමුත්තියා** කලං නාග්ඝන්ති සොළසිං, මෙත්තායෙව තානි චෙතොවිමුත්ති, අධිගගහෙත්වා භාසතෙ ච තපතෙ ච විරොචති ච,

සෙය්‍යථාපි භික්ඛවෙ යා කාචි තාරකරූපානං පභා සබ්බා තා චන්දියා පභාය කලං නාග්ඝන්ති සොළසිං, චන්දප්පභායෙව තා අධිගහෙත්වා භාසතෙ ච තපතෙ ච විරොචති ච. එවං ඛො භික්ඛවෙ යානි කානිචි ඔපධිකානි පුඤ්ඤකිරියවත්ථූනි සබ්බානි තානි මෙත්තාය චෙතොවිමුත්තියා කලං නාග්ඝන්ති සොළසිං, මෙත්තායෙව තානි චෙතොවිමුත්ති අධිගහෙත්වා භාසතෙ ච තපතෙ ච විරොචති ච.

සෙය්‍යථාපි භික්ඛවෙ වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ විද්ධෙ විගතවලාහකෙ නභෙ ආදිච්චො නභං අබ්භුස්සක්කමානො සබ්බං ආකාසගතං තමගතං අභිවිහච්ච භාසතෙ ච තපතෙ ච විරොචති ච, එවමෙව ඛො භික්ඛවෙ යානි කානිචි ඔපධිකානි පුඤ්ඤකිරියවත්ථූනි සබ්බානි තානි මෙත්තාය චෙතොවිමුත්තියා කලං නාග්ඝන්ති සොළසිං, මෙත්තායෙව තානි චෙතොවිමුත්ති අධිගහෙත්වා භාසතෙ ච තපතෙ ච විරොචති ච.

සෙය්‍යථාපි භික්ඛවෙ රත්තියා පච්චූසසමයං ඔසධි තාරකා භාසතෙ ච තපතෙ ච විරොචති ච. එවමෙව ඛො භික්ඛවෙ යානි කානිචි ඔපධිකානි පුඤ්ඤකිරියවත්ථූනි සබ්බානි තානි මෙත්තාය චෙතොවිමුත්තියා කලං නාග්ඝන්ති සොළසිං, මෙත්තායෙව තානි චෙතොවිමුත්ති අධිගහෙත්වා භාසතෙ ච තපතෙ ච විරොචති ච.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"යො ච මෙත්තං භාවයති අප්පමාණං පතිස්සතො
තනූසංයොජනා හොන්ති පස්සතො උපධික්ඛයං
එකම්පි චෙ පාණ මදුට්ඨචිත්තො මෙත්තායති
කුසලො තෙන හොති.
සබ්බෙ ච පාණෙ මනසානුකම්පං පහූතමරියො
පකරොති පුඤ්ඤං.
යො සත්තසණ්ඩං පඨවිං විජිත්වා රාජීසයො
යජමානානුපරියගා
අස්සමෙධං පුරිසමෙධං සම්මාපාසං
වාජපෙය්‍යං නිරග්ගලං

මෙත්තස්ස චිත්තස්ස සුභාවිතස්ස
කලම්පි තෙ නා'නු භවන්ති සොළසිං
චන්දප්පභා තාරගණා ච සබ්බෙ

යො න හන්ති න ඝාතෙති න ජිනාති න ජාපයෙ
මෙත්තං සො සබ්බභූතෙසු වෙරං තස්ස න කෙනචීති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති.

**වග්ගො තතියො**

**1 – 3 – 7**

අර්ථය:-

**ඔපධිකානි පුඤ්ඤකිරියවත්ථූනි,** භවගාමී වූ පුණ්‍යක්‍රියා වස්තූහු වෙත් ද; **තානි සබ්බානි,** ඒ සියල්ල; **මෙත්තාය චෙතොවිමුත්තියා,** මෛත්‍රී චෙතො විමුක්තියගේ; **සොළසිං කලං,** සොළොස් වන කලාවෙන් කොටසකට වත්; **න අග්ඝන්ති,** නොඅගිත්; **මෙත්තා චෙතොවිමුත්තියෙව,** මෛත්‍රී චෙතො විමුක්තියම; **තානි,** ඒ සියලු පුණ්‍යක්‍රියා වස්තූන්; **අධිගහෙත්වා,** මැඩගෙන; **භාසතෙ ච,** උපක්ලේශ විශොධනයෙන් බබළන්නේද වෙයි; **තපතෙ ච,** සියලු කෙලෙසුන් තවන්නේ ද වෙයි; **විරොචති ච,** විශේෂයෙන් දීප්තිමත් වන්නේ ද වෙයි.

**සෙය්‍යථාපි,** යම්සේ; **වස්සානං,** වෂීයන් පිළිබඳ; **පච්ඡිමෙ මාසෙ,** පශ්චිම මාසයෙහි හෙවත් ඉල්මාසයෙහි; **සරදසමයෙ,** සරත් කාලයෙහි; **විද්ධෙ,** පහවූ වැසි ඇති; **විගත වලාහකෙ,** පහවූ වැසි වලාකුළු ඇති; **නභෙ,** අහසෙහි; **ආදිච්චො,** සූය්‍යී තෙම; **නභං,** අහසට; **අබ්භුස්සුක්කමානො,** උස්ව පැනනගින්නේ; **සබ්බං,** සියලු; **ආකාසගතං;** අහසෙහි වූ; **තමගතං,** අඳුර; **අභිවිහච්ච,** මැඩ නොහොත් විධ්වංසනය කොට; **සෙය්‍යථාපි,** යම්සේ; **රත්තියා,** රාත්‍රිය පිළිබඳවූ; **පච්චූසසමයෙ,** එළිවන යාමයෙහි, **ඔසධිතාරකා,** දවහන් තරුව;

**යො,** යමෙක්; **පතිස්සතො,** පිහිටි සිත් ඇත්තේ; **අප්පමාණං,** ප්‍රමාණ රහිතවූ; **මෙත්තං,** මෛත්‍රී සිත; **භාවයති,** වඩා ද; **උපධික්ඛයං,** නිවන; **පස්සතො,** දක්නාහට; **සංයොජනා,** කෙලෙස්; **තනූ හොන්ති,** තුනී වෙත්;

**අදුට්ඨචිත්තො,** අදූෂ්‍යවූ සිත් ඇති යමෙක්; **චෙ,** ඉදින්; **එකංපිපාණං,** එක සත්වයෙකුටත්; **මෙත්තායති,** මෛත්‍රී කෙරේ ද; **තෙන,** එයින්; **කුසලො හොති,** දක්ෂයෙක් වෙයි; **සබ්බෙ ච පාණෙ,** සියලු සත්වයන්ට; **මනසා,** සිතින්; **අනුකම්පං,** අනුකම්පා කරන්නාවූ; **අරියො,** පිරිසිදු සිත් ඇති පුද්ගල තෙම; **පහූතං පුඤ්ඤං,** බොහෝවූ කුසල්; **පකරොති,** කෙරෙයි.

**යො,** යමෙක්; **සත්තසණ්ඩං,** සත්ව සමූහයක් ඇති; **පඨවියං,** පොළොව, **විජිත්වා,** ජය ගෙන; **රාජීසයො,** රාජර්-ෂිහු; **යජමානා,** දන් දෙමින් නොහොත් යාග කෙරෙමින්; **අනුපරියගා,** හැසිරුණාහු ය, (ඔව්හු) **අස්සමෙධං,** අශ්ව මෙධය; **පුරිසමෙධං,** පුරුෂ මෙධය; **සම්මාපාසං,** සම්මාපාසය; **වාජපෙය්‍යං,** වාජපෙය්‍යය; **නිරග්ගලං,** නිරග්ගලය යන මේ පස්මහ යාගය (කළාහුය.)

**සුභාවිතස්ස,** මනාව වඩනා ලද; **මෙත්තස්ස චිත්තස්ස,** මෛත්‍රීචිත්තය පිළිබඳව; **තෙ,** ඒ යාගයෝ; **සොළසිංකලංඅපි,** සොළොස්වන කලාවටත්; **න අනුභවන්ති,** නො පැමිණෙත්; **සබ්බ තාරගණා** ච සියලු තරු සමූහයෝ ද, **චන්දප්පභා,** සඳ එළියෙන් (සොළොස් කලාවෙන් කලාවකටවත් නොපැමි-ණෙති යි සේයි.)

**යො,** යමෙක්; **න හන්ති,** සත්වහිංසා නොකෙරේ ද; **න ඝාතෙති,** නොමරවාද; **න ජිනාති,** නොපරදවා ද; **න ජාපයෙ,** වස්තුහානිය නොකරවාද; **සබ්බභූතෙසු,** සියලු සත්වයන් කෙරෙහි; **මෙත්තංසො,** සවල්පමාත්‍රවූත් මෛත්‍රීසිත් ඇත්තේ වේ ද; **තස්ස,** ඔහට; **කෙනචි,** කිසිවකුහාත් **වෙරං න,** වෛරයක් නැත්තේය.

භාවය:- සුගම යි.

**ධර්මවිස්තර:-**

**ඔපධිකානි පුඤ්ඤකිරියවත්ථූනි—**

උපධි යනු පඤ්චස්කන්ධයට නමකි. යම් තැනක පඤ්චස්කන්ධය වේ ද, එතැන ආත්මභාවය යි කියනු ලැබේ. යම් කුසලයකින් ඒ ඒ ආත්මභාවයන්හි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක ගෙන දේ නම් ඒ කාමාවචර කුසලයන්ට ඕපධික කුසල් යයි කියනු ලැබේ. එනම් දාන සීල භාවනා යන ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තුව යි.

**මෙත්තා චෙතො විමුත්ති —**

මෛත්‍රී භාවනාවෙන් ලබන ත්‍රික චතුෂ්කධ්‍යාන සමාපත්තීන්ට මෛත්‍රීචෙතොවිමුක්තිය යි කියනු ලැබේ. මෛත්‍රී ය යි කී කල්හි උපචාර අර්පණා දෙකම ගැනෙයි උපචාර නම් ධ්‍යාන සිත ඉපදීමට කලින් පඤ්චනීවරණයන්ගෙන් සිත සන්සුන්වන අවස්ථාව යි. අර්පණා නම් ධ්‍යාන සිත් ය, චෙතො විමුක්ති නමින් හඳුන්වනු ලබන්නේ තනිකර අර්පණා නම්වූ ධ්‍යානසිත් බව දතයුතු යි. ඒ අවස්ථායෙහි නීවරණයන්ගෙන් සිත මිදුණු හෙයින් චෙතොවිමුක්ති යයි සලකනු ලැබේ.

**කලං නාග්ඝන්ති සොළසිං —**

මෙයින් අදහස්කරන්නේ දානාදි ඕපධික පුණ්‍යක්‍රියා වස්තු මෛත්‍රීබ්‍රහ්මවිහරණය පිළිබඳ සොළොස්වන කලාවෙන් භාගයකුත් නොවටින් ය යනු යි. මෛත්‍රීචේතොවිමුක්තියෙහි යම් විපාකයක් වේ ද එය දහසය පංගුවකට බෙදා එයිනුදු කොටසක් ගත්කල ඒ සඳහා මෙය වහරනු ලැබේ. මෛත්‍රීයම සියලු කුසලයන් මැඩගෙන බබළන්නේ වෙයි.

චන්ද්‍රාලොකය සියලු තාරකාවන්ගේ ආලෝකය මැඩ බබළන්නාක් මෙන් ද සරත් ඍතුවෙහි පහවූ වැසි වළාකුළු ඇති අහසෙහි පායන සූර්යයා සියලු අඳුරු දුරු කොට බබළන්නාක් මෙන් ද, දවහත් තරුව අලුයමෙහි දීප්තිමත්ව පෙනෙන්නාක් මෙන් ද, සියලු ඔපධික පුණ්‍ය ක්‍රියාවන්ටම වඩා ඇසිල්ලක් වඩන මෛත්‍රිය ශ්‍රෙෂ්ඨ බව මෙසේ උපමා වශයෙන් වදාළහ.

**ඔසධී තාරකා —**

ඉතා ලක්ෂණ දීප්තියක් ඇති හෙයින් ද, ඖෂධ වර්ගවල ශක්තිය උපදවන හෙයින් ද, දවහත් තරුව ඔසධී තාරකා නමින් ප්‍රකාශ වෙයි.

කුමක් හෙයින් මෛත්‍රිය මෙසේ උසස් කොට වදාළේ ද යත්? නිර්දෙෂත්වයෙන් හා සියලු සත්වයන් කෙරෙහි ඇති කළයුතු සම්‍යක් ප්‍රතිපත්තියක් හෙයින් ද මෛත්‍රී ධ්‍යානය ශ්‍රෙෂ්ඨ වෙයි. යම් සේ බ්‍රහ්මයෝ ලෝකයෙහි ශ්‍රෙෂ්ඨ වෙත් ද, මෛත්‍රියෙන් යුත් යෝගාවචර තෙමේත් බ්‍රහ්මයාට සමාන වන්නේ ය. එහෙයින් මෛත්‍රිය බ්‍රහ්මවිහාර ගුණයෙක. සෙසු බ්‍රහ්මවිහාර ගුණයෝම මේ මෛත්‍රිය පදනම් කොට ඇත්තාහ. දානාදි සියලු කුසලයන් සම්පූර්ණ වන්නේ ද මෛත්‍රියෙනි.

සියල්ලන් කෙරෙහි හිතවත්කම මෙහි ලක්ෂණය යි. හිතවත්කම ඇතිකිරීම මෙහි කෘත්‍යය යි. වෛරය දුරු කිරීම ඵලය යි. ඉදින් සියලු සත්වයන් කෙරෙහි සීමා රහිතව වඩන මෙත් සිතින් කරුණා මුදිතා උපෙක්ෂාවන් ද සැපසේ වැඩිය හැකි හෙයින් ඒ සියලු බ්‍රහ්මවිහාර ගුණ යන්ට ද මෛත්‍රිය ම මුල් වෙයි.

මෙසේ සියලු ලෝකයාට හිත සැප කැමැති වූ බෝසත් වරයෝ මොහුට දියයුතු ය, මොහුට නොදියයුතුය යි විශේෂ විභාගයක් නොකොට සැපයට හේතුවූ දන් දෙත්. හිත සැප පිණිස ම සිල් සමාදන් වෙති. සිල් පිරීම සඳහා ම පැවිදි වෙති. මුළා නොවීම පිණිස නුවණ පිරිසුදු කෙරෙත්. වීර්‍ය වඩත්. අපරාධ ඉවසත්. සත්‍යවචන කියත්. ස්ථිර අධිෂ්ඨාන ඇතිවෙත්. මෛත්‍රී කෙරෙත්. මැදහත් සිත් ඇත්තෝ වෙත්.

සියලු ඖපධික කුසල් අතුරෙන් මෛත්‍රිය ම ශ්‍රෙෂ්ඨ බව වෙලාම සූත්‍රාදියෙන් පැහැදිලි වෙයි. බුදුපාමොක් දානයට වඩා සතර දිගින් වඩනා සංඝයාට ආවාස දානය ද, එයටත්

වඩා සරණ සීල සමාදානය ද, එයටත් වඩා පඤ්චසීලාදී ය ද, එයටත් වඩා ඇසිල්ලක් මෙත් වැඩීම ද, අතිශයින් මහත් ඵල වශයෙන් දක්වනු ලැබේ.

කාමාවචර කුසල නම් වූ දන්දීම් ආදිය එක් ප්‍රමාණය කට කරන පින්කම් විශේෂයක් හෙයින් එයට ප්‍රමාණ කෘත කර්මය යි කියනු ලැබේ. මෛත්‍රිය එසේ නොව ප්‍රමාණ යක් නැති සියලු සත්වයන් කෙරෙහි අනොධිස දිසාඵරණ වශයෙන් ප්‍රමාණය ඉක්මවා කළයුතු හෙයින් අප්පමාණකත කුසල කර්මයෙකි. මහද්ගත කුසල කර්මයෙකි. එහෙයින් මහද්ගත වූ අප්‍රමාණ වූ මෛත්‍රිය පරිත්ත කර්ම වූ කාමාවචර කුසලය මැඩගෙන සිටින්නේ දියත්තක් හෙවත් සුලු වතුරක් මැඩගෙන සිටින මහොසයක් මහා දියකඳක් මෙනි.

**අප්පමාණං:-**

මෛත්‍රීධ්‍යානය භාවනා වශයෙනුත් හෙවත් වැඩීම් වශයෙනුත් අරමුණු වශයෙනුත් අප්‍රමාණ නම් වන්නේ ය. අසුභභාවනාදියෙහි මෙන් අරමුණු කර ගැන්මෙහි එක් කොටසක් පමණක් නොගෙන අනොධිසො ඵරණ වශයෙන් හෙවත් සීමා රහිතව සියලු සත්වයන් කෙරෙහි පැතිරවීම් වශයෙන් "සබ්බෙ සත්තා අවෙරා හොන්තු, අබ්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු -පෙ- සබ්බෙ පාණා -පෙ- සබ්බෙ භූතා -පෙ- සබ්බෙ පුග්ගලා -පෙ- සබ්බෙ අත්තභාවපරියාපන්නා -පෙ- සුඛී අත්තානං පරිහරන්තු" යනුවෙන් පස් පරිද්දෙකින් සීමා රහිතව වැඩිය යුතු හෙයින් ද, අප්පමාණාරම්මණිකව ප්‍රගුණ කළයුතු හෙයින් ද අප්පමාණ නම් වෙයි.

**තනූ සංයොජනා හොන්ති:-**

මෛත්‍රීධ්‍යානය පාදක කොට ගෙන සම්මර්ශණය කෙරෙමින් යට යට ආයතීමාර්ගයන්ට පැමිණි යෝගාවචරයාහට පහසුවෙන්ම ප්‍රතිසංයෝජනාදිය දුරුවෙමින් තුනී වෙත්

**පඤ්චන්නං උපධික්ඛයං:-**

උපධි නම් ලද කෙලෙසුන්ගේ ක්ෂයවීම නම් නිවන යි. මාර්ගඥානාවබෝධයෙන් යෝගාවචරතෙම නිවන දකියි. තවද "තනූ සංයෝජනා හොන්ති" යන මෙයින් මෛත්‍රී ධ්‍යානය පාදක කොට ගෙන විදසුන් වැඩීමෙන් අනුක්‍රමයෙන් උපධික්ෂය නම් වූ අර්හත්වයට පැමිණ නිවන් දුටු අයම්පුද්ගල යාහට ප්‍රතිඝය පමණක් නොව ප්‍රතිඝසම්ප්‍රයුක්ත සියලු කෙලෙශයෝත් තුනී වෙත්, නොහොත් දුරුවෙත්.

**රාජිසයො යජමානානුපරියගා:-**

යම් රජෙක් සියලු සත්වයන් ඇති මහපොළව දැහැමින් දිනාගෙන විසී ද එබඳු ඒ ඍෂිවරයන් හා සමාන ශ්‍රෙෂ්ඨ රජදරුවෝ දන් දෙමින් හැසුරුණාහු ය.

**අස්සමෙධං:-**

පෞරාණික දැහැමි රජුන්ගේ කාලවල සස්සමෙධය, පුරිසමෙධය, සම්මාපාසය, වාජපෙය්‍ය ය නිරගගල යයි සංග්‍රහවස්තු සතරක් වූහ. මෙයින් ඒ රජවරු ලෝකයාට සංග්‍රහකළහ. රටේ නිපදවන කුඹුරු ගොවිතැනෙන් ලැබෙන අස්වැන්නෙන් දහයෙන් කොටසක් මහාජනයාට දීම **සස්සමෙධ** ය යි. දක්ෂ වූ මහායෝධයන්ට හමාසික වැටුප් දීම **පුරිසමෙධ** යයි. දුප්පත් මිනිසුන්ට පොළියක් නැතිව ලියුම් පිට තුන් අවුරුද්දක් මුදල් දීම **සම්මාපාස** යයි. ප්‍රිය වචනයෙන් මෘදු වචනයෙන් කථාකිරීම **වාජපෙය්‍ය** යයි. මෙයින් ශස්‍ය සම්පාදනය කැරවීමෙහි දක්ෂතාවයත්, මහාජන සංග්‍රහයෙහි දක්ෂතාවයත්, මහාජනයා තමහට වසඟ කරවා ගැනීමෙහි දක්ෂතාවයත්, ප්‍රියවචන කථා කිරීමෙන් හැම දෙනාගේම සිත් ඇදගැනීමේ දක්ෂතාවයත් ප්‍රකාශ වෙයි.

මෙකී සතර සංග්‍රහවස්තුවෙන් සංග්‍රහ සැලකිලි ලබන රට සමෘද්ධ වෙයි. ආහාර පාන සුලභ හෙයින් හැමදෙනා ම නිර්භය වෙයි. නොයෙක් අර්බුද හෝ මහාජනාපවාද දෙස් රහිත වෙයි. එහෙයින් මිනිස්සු සුඛිත මුදිතව

දරුවන් ළෙහි නටවමින් ගෙවල් දොරවල් අගුළු නොලා නිර්භයව ජීවත් වන හෙයින් නිරඟල යයි කියනු ලැබේ. පුරාතනයන්ගේ රාජ්‍යපාලනය මෙබඳු විය.

**සත්වන සූත්‍ර විවරණය නිමි**

**තුන්වන වර්ගය යි**

**එකක නිපාතය සමාප්ත යි**

---

# දුක නිපාතො

## 2 - 1 - 1

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං**

ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙ'ව ධම්මෙ දුක්ඛං විහරති සවිඝාතං සඋපායාසං සපරිළාහං, කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා, කතමෙහි ද්වීහි? **ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතාය ච භොජනෙ අමත්තඤ්ඤුතාය ච** ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙ'ව ධම්මෙ දුක්ඛං විහරති සවිඝාතං සඋපායාසං සපරිළාහං කායස්ස භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛාති එතමත්ථං භගවා අවොච, තත්ථෙ'තං ඉති වුච්චති.

'චක්ඛු සොතඤ්ච ඝානඤ්ච ජිව්හා කායො තථා මනො
එතානි යස්ස ද්වාරානි අගුත්තා'නීධ භික්ඛුනො
භොජනම්හි අමත්තඤ්ඤූ ඉන්ද්‍රියෙසු අසංවුතො
කායදුක්ඛං චෙතොදුක්ඛං දුක්ඛං සො අධිගච්ඡති'
ඩය්හමානෙන කායෙන ඩය්හමානෙන චෙතසා
දිවා වා යදිවා රත්තිං දුක්ඛං විහරති තාදිසො'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති,

# දුකනිපාතය

## 2 – 1 – 1

**පදාර්ථ:–**

**භික්ඛවෙ**, මහණෙනි; **ද්වීහි ධම්මෙහි**, අකුසල් දෙකකින්; **සමන්නාගතො**, යුක්තවූ; **භික්ඛු**, මහණතෙම; **දිට්ඨෙව ධම්මෙ**, මේ ආත්මයෙහි ම; **සවිඝාතං**, දුක් සහිතවූ; **සඋපායාසං**, බලවත් වෙහෙස සහිතවූ; **සපරිළාහං**, කෙලෙශ දාහ සහිත වූ; **දුක්ඛං විහරති**, දුක සේ වාසය කෙරෙයි; **කායස්ස භෙදා**, කරජකය බිඳීමෙන්; **මරණාපරං**, මරණින් මත්තෙහි; **දුග්ගති**, දුගතිය; **පාටිකඞ්ඛා**, කැමැතිවිය යුත්තී ය; **ඉන්ද්‍රියෙසු**, ඉන්ද්‍රියයන්හි; **අගුත්තද්වාරතාය**, නොරක්නාලද දොරටු ඇති බැවින් ද; **භොජනෙ**, වැළඳීමෙහි; **අමත්තඤ්ඤුතාය**, පමණ නොදැනීමෙන් ද යන දෙවිධියෙනි.

**චක්ඛු**, ඇසය; **සොතඤ්ච**, කන ය; **ඝාණඤ්ච**, නාසය; **ජිව්හා**, දිවය; **කායො**, ශරීරය; **තථා**, එසේ ම; **මනො**, සිතය යන; **එතානි ද්වාරානි**, මේ දොරටු; **ඉධ**, මේ ශාසනයෙහි; **යස්ස භික්ඛුනො**, යම් භික්ෂුවක්හට; **අගුත්තානි**, ගොපනය නොවෙත් ද; නොහොත් **යස්ස භික්ඛුනො**, යම් භික්ෂුවක් විසින්; **අගුත්තානි**, නොරක්නා ලද්දාහු ද;

**භොජනම්හි** වැළඳීමෙහි; **අමත්තඤ්ඤු**, පමණ නොදන්නේ ද; **ඉන්ද්‍රියෙසු**, චක්ෂුරාදි ඉන්ද්‍රියයන්හි; **අසංවුතො**, සංවර රහිත වේ ද; **සො**, ඒ මහණ තෙම; **කායදුක්ඛං**, කය පිළිබඳ දුකය; **චෙතොදුක්ඛං**, සිත පිළිබඳ දුකය යන; **දුක්ඛං**, දෙවැදෑරුම් දුකට; **අධිගච්ඡති**, පැමිණේ.

**තාදිසො**, එබඳු පුද්ගල තෙම; **ඩය්හමානෙන කායෙන**, දැවුණු ශරීරයෙන්; **ඩය්හමානෙන චෙතසා**, දැවුණු සිතින්; **දිවා වා**, දවහල් හෝ; **යදි වා**, නොහොත්; **රත්තිං වා**, රාත්‍රියෙහි හෝ; **දුක්ඛං**, දුක සේ; **විහරති**, වාසය කෙරේ;

**භාවය:–** සුගම යි.

**ධර්මවිස්තර:-**

### ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා

ඉන්ද්‍රිය නම් ඇස, කන, නාසය, දිව, ශරීරය, සිත යන මේ සදෙනා යි, චක්ෂු ප්‍රසාදය ඇති කල රූපය දකී යි, එසේ ද වුවත් එයින් සංවරයක් හෝ අසංවරයක් ඇති නොවේ.

කෙසේ නම් ඒ ඇතිවේ ද යත්? ඇසට රූපය හමුවූ කල භවාංග සිත දෙවරක් ඉපද නිරුද්ධ වෙයි. එයට අනතුරුව කිරියමනොධාතු සිතින් ආවර්ජන කෘත්‍යය සිදු කෙරෙයි. චක්ෂුර් විඥාන සිතින් දර්ශන කෘත්‍යය ද, විපාක මනොධාතු සිතින් සම්ප්‍රතීච්ඡන කෘත්‍යය ද, විපාකාහෙතුක මනොවිඥාන ධාතු සිතින් සන්තීරණ කෘත්‍යය ද, කිරියාහෙතුක මනොවිඥානධාතු නම් ලද සිතෙන් ව්‍යවස්ථාපන කෘත්‍යය ද සිදු කෙරෙමින් ඒ සිත් ද ඉපද නිරුද්ධ වෙයි. එයට අනතුරුව ජවන් සිත සත් වරක් දිවෙයි.

මෙහි පළමු දැක්වූ භවාංග අවස්ථාවේදී හෝ ආවර්ජන අවස්ථාවේදී හෝ දස්සන සම්පටිච්ඡන ආදි වීථි සිත් අවස්ථායෙහි හෝ සංවරයෙක් හෝ අසංවරයෙක් නැත. ජවනාවස්ථාවෙහි ම එය සිදුවෙයි. එසේ කල චක්ෂුර් ද්වාරය අසංවරය යි කියනු ලැබේ. එය අසංවර වූ කල භවාංගය හා සෙසු වීථි සිත් ද අසංවර ම වෙත්.

හේ කෙසේද යත්?

නගරයෙක ප්‍රධාන දොරටු සතරෙක් ඇත. එය නොවසා ඇතුළත සෙසු ගෙදොර වැසුව ද, ගෙතුළ ඇති බඩු සුරක්ෂිත නොවේ. නගරද්වාරයෙන් ඇතුල් වන සොර සතුරන්ට කැමැති දෙයක් කරගෙන යා හැකි වෙයි. නුවර දොර වැසූ කල්හි එසේ කළ නොහැකි ය. ද්වාර යන්හි සංවර අසංවර භාවය මෙසේ දතයුතු.

**භොජනෙ අමත්තඤ්ඤුතතා:-**

යමෙක් බොහෝ දෙය පිළිගැනීමෙහි පමණ නොදන්නේ වේ ද හෙතෙම මහෙච්ඡ නම් වෙයි. යම් සේ වනාහි කච්ඡපුට වෙළෙන්දෙක් අතිනුත් බඩු පොදියක් රැගෙන තවත් පොදියක් උරහිසිනුත් එල්ලාගෙන මහා ජනයාට අසවල් අසවල් බඩු ගනුව යි උද්ඝොෂණය කෙරේ ද, එපරිද්දෙන් තමන්ගේ සවල්පමාත්‍ර සීලයක් හෝ ඉගෙනීමක් හෝ ධූත ගුණයක් හෝ යටත්පිරිසෙයින් වනවාස බවක් හෝ මහාජනයාට හඟවා ගරු බුහුමන් ලබන්නට සිතමින් ගැල්වලින් ගෙනවුත් ගොඩ ගසන සිවු පස ප්‍රත්‍යය ප්‍රතික්‍ෂෙප නොකොට ම පිළිගන්ට කැමැති වේ ද, මේ මහෙච්ඡ පුද්ගලයාගේ ලක්‍ෂණය යි.

එහෙයින් කොපමණ දර දැමූවත් ගින්න ද, කොපමණ ජලය ලැබුණත් මහමුහුද ද, කොපමණ ප්‍රත්‍යය ලාභය ඇතත් මහෙච්ඡ පුද්ගලයා ද යන මේ තුන්දෙන තෘප්තියට පත් නොවන්නෝ ය. එසේ ම මහෙච්ඡ පුද්ගලතෙමේ වැදූ මවගේ පවා සිත ගන්නට අපොහොසත් වේ. එහෙයින් හෙතෙම නොඋපන් ලාභ නොඋපදවන්නේ ද උපන් ලාභයෙන් පිරිහෙන්නේ ද වෙයි. මේ ඔහුගේ පිළිගැනීමෙහි පමණ නොදැන්ම ය.

යමෙක් දැහැමෙන් සෙමෙන් ලද ආහාරය වුව ද එහි ගිජුව මුසපත්ව ගැලී අයුණු නොදකිමින් රස තෘෂ්ණා යෙන් මැඩුණු සිත් ඇතිව ආහරහත්ථකාදි බමුණන් මෙන් නුවණ නැතිව කුසෙහි නොඅල්ලන තරමට ම අනුභව කොට නින්දෙහි ඇලී වෙසේ ද, මේ ප්‍රයෝජන ගැනීමෙහි පමණ නොදැන්ම ය.

එසේ ම දියයුතු දේ බොහෝ ඇතත් දායකයා එයින් සවල්පයක් දෙන්ට කැමැති වේ නම් දායකයාගේ අදහසේ හැටියට සවල්පයක් ගැනීම ද, දියයුතු දේ සවල්ප නම් දායකයා වැඩියක් දෙනු කැමැති නම් දෙය ධර්මයේ ප්‍රමාණයට

සවල්පයක් ගැනීම ද, දෙය ධර්මයන් හුඟක් නම් දායකයාත් බොහොම දෙන්ට කැමැති නම් තමාගේ ප්‍රමාණය සලකා තමාට යැපෙන පමණ පිළිගැනීම ද, ප්‍රතිග්‍රහණමාත්‍රඥතා නම් වේ.

මෙසේ ප්‍රතිග්‍රහණමාත්‍රඥතා ඇති භික්‍ෂු තෙම "පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති. නෙව දවාය න මදාය" යනාදී ක්‍රමයෙන් ප්‍රත්‍යවෙක්‍ෂාඥනයෙන් සලකා ආහාරයෙහි ගිජු නොව පරිභොගයෙහි පමණ දැන ආහාරයෙන් ප්‍රයෝජන ගැනීම භොජනමාත්‍රඥතාව යි. මෙසේ භොජන මාත්‍රඥ-තාවය හා අමාත්‍රඥතාවයත් යන දෙක දතයුතු.

**ප්‍රථම සූත්‍ර විවරණය යි.**

## 2 – 1 – 2

### වුත්තං හෙතං භගවතා වුත්ත'මරහතාති මෙ සුතං

ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛං විහරති අවිඝාතං අනුපායාසං අපරිළාහං කායස්ස භෙදා පර'මමරණා සුගති පාටිකඞ්ඛා, කතමෙහි ද්වීහි? **ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය ච භොජනෙ මත්තඤ්ඤු-තාය ච.** ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙවධම්මෙ සුඛං විහරති අවිඝාතං අනුපායාසං අපරිළාහං කායස්ස භෙදා පර'මමරණා සුගති පාටිකඞ්ඛා'ති එතමත්ථං භගවා අවොච, තත්ථෙ'තං ඉති වුච්චති,

චක්ඛු සොතඤ්ච ඝාන'ඤ්ච ජිව්හා කායො අථො මනො
එතානි යස්ස ද්වාරානි සුගුත්තානී'ධ භික්ඛුනො
භොජනම්හි ච මත්තඤ්ඤු ඉන්ද්‍රියෙසු ච සංවුතො
කායසුඛං චෙතොසුඛං සුඛං සො අධිගච්ඡති,
අඩය්හමානෙන කායෙන අඩය්හමානෙන චෙතසා
දිවා වා යදිවා රත්තිං සුඛං විහරති තාදිසො'ති,

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

## 2 – 1 – 2

ප්‍රථම සූත්‍රයෙහි කියනලද ක්‍රමයට එයට විපර්යාස වශයෙන් මෙහි අර්ථය දතයුතු.

**දෙවන සූත්‍ර විවරණය යි.**

## 2 – 1 – 3

**වුත්තං හෙ'තං භගවතා වුත්ත'මරහතාති මෙ සුතං**

වෙමෙ භික්ඛවෙ ධම්මා තපනීයා, කතමෙ වෙ? ඉධ භික්ඛවෙ එකච්චො අකතකල්‍යාණො හොති අකතකුසලො අකතභීරුත්තාණො කතපාපො කතලුද්දො කතකිබ්බිසො, සො **අකතං** මෙ **කල්‍යාණංතිපි තපති කතං** මෙ **පාපනතිපි තපති** ඉමෙ බො භික්ඛවෙ වෙධම්මා තපනීයා

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති

කායදුච්චරිතං කත්වා වචීදුච්චරිතානි ච
මනොදුච්චරිතං කත්වා ය'ඤ්ච'ඤ්ඤං දොසසඤ්හිතං
අකත්වා කුසලං ධම්මං කත්වාන'කුසලං බහුං
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සො පපජ්ජති,

අයංපි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

## 2 – 1 – 3

**පදාර්ථ:-**

**තපනීයා ධම්මා**, පසුතැවිල්ලට හේතු වන කාරණයෝ; **අකතකල්‍යාණො**, නොකරනලද යහපත් කම් ඇත්තේ වේ ද; **අකත කුසලො**, යනු ද මෙසේමැ යි; **අකත භීරුත්තාණො**, සසර භයට නොකරන ලද පිහිට ඇත්තේ වේ ද; **කතපාපො**, කළ පව්කම් ඇත්තේ වේ ද; **කතලුද්දො**, කළ රෞද්‍ර ක්‍රියා ඇත්තේවේ ද; **කතකිබ්බිසො**, කළ දුසිල්කම් ඇත්තේවේ ද;

**කායදුච්චරිතං කත්වා**, කයින් දුසිරිත් කොට; **වචී දුච්චරිතානි ච** වාග් දුසිරිත් ද කොට; **මනො දුච්චරිතං කත්වා**, මනො දුච්චරිත ද කොට; **දොසසංහිතං**, වැරදි සහිත වූ; **යඤ්ච අඤ්ඤං**, යම් අනික් දෙය ද කොට;

**කුසලං ධම්මං අකත්වා**, කුසල් දහම් නොකොට; **බහුං අකුසලං කත්වාන**, බොහෝ අකුසල් කොට; **සො දුප්පඤ්ඤො**, ඒ අඥාන තැනැත්තේ; **කායස්ස භෙදා**, ශරීරයාගේ බිඳීමෙන්; **නිරයං උපපජ්ජති**, නරකයට පැමිණෙයි නොහොත් නිරයෙහි උපදී.

**භාවය**:- සුගම යි.

**ධර්මවිස්තර**:-

**තපනීයා ධම්මා** —

මෙලොව පරලොව දෙක්හි තැවීමට හේතුවන කරුණු තපනිය නම් වෙත්, "ඉධ භික්ඛවෙ එකච්චො අකත කල්‍යාණො හොති" යනාදීන් වදාළේ කරුණු වශයෙන් දක්වීමේ ධම්මාධිට්ඨාන දෙසනාවිලාසයෙනි. "සො අකතං මෙ කල්‍යාණන්ති තප්පති" යනාදීන් වදාළේ පුග්ගලාධිට්ඨාන දෙශනා වශයෙනි. කාය දුශ්චරිතයෙන් තැවෙන පුද්ගලයා කෙබඳු ද යනු නන්ද යක්ෂ, නන්ද මානවක, නන්ද ගොඝාතක, දෙවදත්ත යන මොවුන්ගේ චරිතවලින් හා ධම්මෝපාතික කථාවෙන් ද දතයුතු.

සහෝදරයෝ දෙදෙනෙක් එකතුව එළදෙනෙක් මරා මස් දෙකොටසකට බෙදූහ. බාල සොහොයුරා මගේ දරුවෝ බුහුග දෙනෙකි. එහෙයින් මට තව ටිකක් වැඩිපුර දෙන්ට යයි වැඩිමලාට කීය. ඔහු සියලු මස් දෙකොටසකට සමව බෙදූ කල තව තවත් වැඩිපුර ඉල්ලන්නේ කුමකටද යි හදිසි කෝපයෙන් ඔහුට ගසා මැරී ය. එතැන් පටන් ඔහු මවිසින් දරුණු අපරාධයක් කෙළේ යයි පසුතැවිලි විය. ශොකය ද බලවත් විය. උන්හිටිතැනදී තමන් කළ අපරාධය

සිහි කෙරෙයි. තමාගේ සිතෙහි සැනසිල්ලකුදු නැත. තමන් කන බොනදෑ ද ඇඟට නාල්ලයි. මෙසේ ඇටත් සමත් පමණක් ශෙෂ විය.

ඉක්බිති එක් මහාස්ථවිර නමක් ඔහු දුර්වලව සිටිනු දැක කිම? "තා විසින් නැවීමට සුදුසු වූ පාපකර්මයක් කරන ලද්දෑ යි" ඇසී ය. හෙතෙම සියලු පුවත් තෙරුන්ට කීය. තෙරුන් වහන්සේ ද එය බලවත් අපරාධයකැයි පිළිගත්හ. හෙතෙම ඒ අකුසල කර්මයෙන් කළුරිය කොට නරකයෙහි උපන්නේ ය.

එසේ ම වාග් දුශ්චරිතයෙන් සුප්‍රබුද්ධ ශාක්‍ය, කොකාලික චිඤ්චමානවිකාදීන්ට මෙන් සන්තාපය ඇති කරවන්නේය යි දතයුතු.

**තුන් වන සූත්‍ර විවරණය යි.**

**2 - 1 - 4**

**වුත්තං හෙ'තං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං**

ද්වෙ මෙ භික්ඛවෙ ධම්මා අතපනීයා කතමෙ ද්වෙ? ඉධ භික්ඛවෙ එකච්චො කතකල්‍යාණො හොති. කතකුසලො කතභීරුත්තාණො, අකතපාපො අකතලුද්දො අකතකිබ්බිසො, සො **කතං** මෙ **කල්‍යාණ'න්ති පි න තප්පති, අකතං මෙ පාපන්'පි න තප්පති,** ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මා අතපනීයානි එතමත්ථං භගවා අවොච, තත්ථෙ'තං ඉති වුච්චති.

කාය දුච්චරිතං හිත්වා වචීදුච්චරිතානි ච
මනො දුච්චරිතං හිත්වා යඤ්චඤ්ඤං දොසසඤ්හිතං
අකත්වාකුසලං කම්මං කත්වාන කුසලං බහුං
කායස්ස භෙදා සප්පඤ්ඤො සග්ගං සො උපපජ්ජති.

අය'ම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ **සුත**'න්ති.

## 2 - 1 - 4

තුන් වන සූත්‍රයට විපර්‍යාස වශයෙන් අරුත් දතයුතු.

**සතර වන සූත්‍ර විවරණය යි.**

## 2 - 1 - 5

**වුත්තං හෙ'තං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං**

ඩීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පුග්ගලො යථා'භතං නික්ඛිත්තො එවං නිරයෙ, කතමෙහි ඩීහි? **පාපකෙන ච සීලෙන පාපිකාය ච දිට්ඨියා** ඉමෙහි ඛො ඩීහි ධම්මෙහි සමන්නාගතො පුග්ගලො යථා'භතං නික්ඛිත්තො එවං නිරයෙ'ති එත'මත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

පාපකෙන ච සීලෙන පාපිකාය ච දිට්ඨියා
එතෙහි ඩීහි ධම්මෙහි යො සමන්නාගතො නරො
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සො උපපජ්ජති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති.

## 2 - 1 - 5

**අර්ථය:-**

**පාපකෙන ච සීලෙන,** පවිටු සීලයෙන් ද; **පාපිකාය ච දිට්ඨියා,** පවිටු දෘෂ්ටියෙන් ද;

**පාපිකෙන ච සීලෙන,** පවිටු සීලයෙන් ද; **පාපිකාය දිට්ඨියා ච,** පවිටු දෘෂ්ටියෙන් ද යන; **එතෙහි ඩීහි ධම්මෙහි,** මේ දෙකරුණෙන්; **යො නරො,** යම් මිනිසෙක්; **සමන්නාගතො,** යුක්තවූයේ වේ ද; **සො දුප්පඤ්ඤො,** ඒ දුෂ්ප්‍රාඥ තෙම; **කායස්ස භෙදා,** ශරීරයාගේ බිඳීමෙන්; **නිරයං,** නරකයට; **උපපජ්ජති,** පැමිණේ.

**භාවය:-** සුගම යි.

**ධර්ම විස්තර:-**

**පාපකෙන සීලෙන —**

පව්ටු සීලය නම් දෞශ්ශීල්‍යය මැයි. ශීල භේදය කරන අසංවරය මැයි. යම් සේ ලෝකයෙහි නුදුටු දෙය දක්නා ලද යි කියා හෝ සිල් නැත්තේ සිල්වතෙකැ යි කියා හෝ ව්‍යවහාර කෙරේ ද එහි ගුණයක් සලකා නොව ස්වභාවය සඳහාම ශීලය යි කියනු ලැබේ.

එහෙයින් "කතමෙ ච ගහපති අකුසලා සීලා, අකුසලං කායකම්මං, අකුසලං වචීකම්මං, පාපකො ආජීවො" යන මේ ආදි ධර්මපර්‍යායයන්හි අකුසලයන් කෙරෙහිදු ශීල නාමය ව්‍යවහාර වෙයි. එය ස්වාභාවික සිද්ධියක් වශයෙන් යමකුගේ ගති පැවතුම්වලට අනුව සීල යයි කියනු ලබන හෙයින් මෙහි ලාමක අකුසලයන්ගේ පැවැත්ම සඳහා "පාපකෙන සීලෙන" යනු කීහ.

**පාපිකාය දිට්ඨියා —**

සියලුම මිථ්‍යාදෘෂ්ටි පාපිකම වෙත්. විශේෂ වශයෙන් අහේතුක දෘෂ්ටිය, අක්‍රිය දෘෂ්ටිය, නාස්තික දෘෂ්ටිය, යන මේ තුන අතිශයින් පව්ටු දෘෂ්ටිහුම වෙති. මෙහි පාප සීලයෙන් යුත් තැනැත්තේ දුෂ්ප්‍රතිපන්නයෙක් වේ. පාප දෘෂ්ටියෙන් යුත් තැනැත්තේ නරක අදහස් ඇත්තෙක් වේ. එහෙයින් මේ කරුණු දෙකින්ම යුක්ත වූ පුද්ගල තෙම මරණින් මතු නරකයෙහි උපදී.

**පස් වන සූත්‍ර විවරණය යි.**

## 2 - 1 - 6

**වුත්තං හෙතං භගවතා වුත්ත'මරහතා'ති** මෙ සුතං

ඓහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථා'භතං නික්ඛිත්තො එවං සග්ගෙ, කතමෙහි ඓහි? **භද්දකෙන ච සීලෙන භද්දිකාය ච දිට්ඨියා** ඉමෙහි ඛො භික්ඛවෙ ඓහි

ධමෙමහි සමනනාගතො පුගගලො යථා'භතං නිකඛිතෙතා එවං සගෙග'ති. එතමත්ථං භගවා අවොච, තත්ථෙ'තං ඉති වුචචති,

‘‘භද්දකෙන ච සීලෙන භද්දිකාය ච දිට්ඨියා
එතෙහි ද්වීහි ධමෙමහි යො සමනනාගතො නරො
කායසස භෙදා සපපඤෙඤා සගගං සො උපපජජති.

අයමපි අතෙථා වුතෙතා භගවතා, ඉති මෙ සුත'නති.

## 2 – 1 – 6

පස් වන සූත්‍රයට විපය්‍යාස වශයෙන් මෙහි අර්ථ දතයුතු.

**භාවය:**- සුගම යි.

**ධර්මවිස්තර:**-

මෙහි **භද්‍රක ශීලය** යි කියන ලද්දේ චතුපාරිශුද්ධි ශීලය මැයි මෙය යහපත් හෙයින් ද සමථ විදර්ශනා ආදි ශ්‍රෙෂ්ඨ ගුණ එළවන හෙයින් ද භද්‍රක නම් වේ.

**භද්‍රක දෘෂ්ටිය** නම් කම්මස්සකත ඥානය හා කම්මපථ සම්මාදිට්ඨිය යි. කර්මස්වකෘත ඥානය නම් කර්ම විපාක සැලකීමේ නුවණ යි. කර්මපථ සම්‍යක්දෘෂ්ටිය නම් ඥාන සම්ප්‍රයුක්ත කුසල ජවන චේතනාව යි. මේ දෙකෙන් ප්‍රයොග සම්පත්තිය හා ආශය සම්පත්තිය ද කියවෙයි.

**සවන සූත්‍ර විවරණය යි.**

## 2 – 1 – 7

**වුතතං හෙතං භගවතා වුතත 'මරහතා'ති මෙ සුතං**

**අනාතාපී** භිකඛවෙ භිකඛු **අනොතතපපී** අභබබො සමෙබාධාය අභබබො නිබබානාය අභබබො අනුතතරසස යොගකෙඛමසස . අධිගමාය; **ආතාපී** ඛො භිකඛවෙ භිකඛු

**ඔත්තප්පී** භබ්බො සම්බොධාය භබ්බො නිබ්බානාය භබ්බො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමා'යාති එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

අනාතාපී අනොත්තප්පී කුසීතො හීනවීරියො
යො ථිනමිද්ධ බහුලො අහිරීකො අනාදරො
අභබ්බො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධි මුත්තමං.
යො ච සතිමා නිපකො ඣායී ආතාපී ඔත්තප්පී ච
අප්පමත්තො
සංයොජනං ජාති ජරාය ඡෙත්වා ඉධෙව සම්බොධි'
මනුත්තරං ඵුසෙ

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති-

## 2 - 1 - 7

**පදාර්ථ:-**

**අනාතාපී**, කෙලෙසුන් තවන වීර්‍ය නැති. **අනොත්තප්පී**, පවට බියක් නැති; **භික්ඛු**, මහණ තෙම; **සම්බොධාය**, ආර්‍ය මාර්ගඥානය පිණිස; **අභබ්බො**, නුසුදුස්සෙක් වේ; **නිබ්බානාය**, අමෘත මහා නිර්වාණය පිණිස; **අනුත්තරස්ස**, උතුම් වූ; **යොගක්ඛෙමස්ස**, අර්හත් ඵලයට; **අධිගමාය**, පැමිණීම පිණිස; **අභබ්බො**, සුදුස්සෙක් නොවේ; **ආතාපී**, කෙලෙසුන් තවන වීර්‍ය ඇති; **ඔත්තප්පී**, පවට බිය ඇති; **අනාතාපී**, වීර්‍ය නැති; **අනොත්තප්පී**, පවට බිය නැති; **කුසීතො**, මැලි වූ; **හීනවීරියො**, වීරිය නැති; **ථිනමිද්ධබහුලො**, සිත කය දෙක්හි අලස බහුල වූ; **අහිරිකො**, පාපයෙහි ලජ්ජා නැති; **අනාදරො**, ප්‍රතිපත්ති පූරණයෙහි ආදරයක් නැති; **තාදිසො යො භික්ඛු**, එබඳු යම් භික්ෂුවක් වේ ද; (හෙතෙම) **උත්තමං සම්බොධිං**, උතුම් වූ අර්හත්වය; **ඵුට්ඨුං**, සාක්ෂාත් කරන්නට; **අභබ්බො**, අයොග්‍යයෙක් වේ;

**යො ච**, යමෙක්; **සතිමා**, සිහි ඇත්තේ වේද; **ඣායී**, ධ්‍යාන ඇත්තේ වේද; **ආතාපී**, වීරිය ඇත්තේ වේ ද;

**ඔත්තප්පී,** බිය ඇත්තේ වේ ද; **අප්පමත්තො,** සිහි ඇත්තේ වේ ද; **ජාති ජරාය,** ජාති ජරා දෙක්හි; **සංයොජනං,** සත්වයන් යොදවන හෙයින් සංයෝජන නම් වූ කාමරාගාදිය; **ඡෙත්වා,** සිඳ; **ඉධ එව,** මේ ආත්මයෙහි ම; **අනුත්තරං; සම්බොධිං,** උතුම් වූ අභිඥාව; **ඵුසෙ,** ස්පර්ශ කරන්නේ ය; නොහොත් **අනුත්තරං සම්බොධිං,** උතුම් වූ අභිඥාවට; **ඵුසෙ** පැමිණෙන්නේ ය;

**භාවය:-** සුගම යි.

**ධර්මවිස්තර:-**

**ආතාපී ඔත්තප්පී** -

"කිලෙසානං ආතාපනට්ඨෙන ආතාපො (විරියං) සො එතස්ස අත්ථීති ආතාපී." යනු නිර්වචන හෙයින් කෙලෙසුන් තවන අර්ථයෙන් ආතාප නම් වේ, වීර්ය යි. හේ මෝහට ඇත්තු යි ආතාපී නම්. ඇරඹුණු වීර්ය ඇති භික්ෂු තෙමේ අකුසල් දුරුකිරීම සඳහාත් කුසල් රැස්කිරීම සඳහාත් ශක්ති සම්පන්නයෙක් වෙයි, දැඩි වීර්ය ඇත්තෙක් වේ.

අකුසල් කිරීමට භයවීම මොහුගේ ස්වභාවතු යි. ඔත්තප්පි නම් වේ. ඔත්තප්පය ගැනීමෙන් හිරිය ද ගතයුතු යි. හිරි ඔත්තප්ප දෙක යුගනද්ධ ධර්ම වශයෙන් එක්ව ලැබෙන හෙයිනි. අකුසල් කිරීමෙහි ලජ්ජා භය දෙකින් යුත් තැනැත්තේ ස්වල්පමාත්‍ර වූ ද වැරැද්දෙහි භය දක්නා සුලු හෙයින් ශීලයෙහි පරිපූර්ණ කාරිත්වය ඇත්තෙක් වෙයි. එයින් ඔහුගේ ශීල සම්පත්තිය දක්ව යි.

'ආතාපී' යන්නෙන් කෙලෙසුන් තවන බව දැක්වීමෙන් සමථ විදර්ශනා භාවනානුයෝගී බව දක්වන ලද්දේ වේ. ශ්‍රද්ධා, වීර්ය, ස්මෘති, සමාධි, ප්‍රඥා යන මෙයින් තොරව විමුක්ති පරිපාචනීය ධර්මයන් නොලැබෙන හෙයින් ශ්‍රද්ධා පඤ්චමක ඉන්ද්‍රියයෝ කියන ලද්දාහු ය. ඔවුන් ඇති කල්හි අනිත්‍ය සංඥා, දුඃඛ සංඥා, අනාත්ම සංඥා, ප්‍රහාණ සංඥා,

විරාග සංඥ, නිරෝධ සංඥ යන සවැදෑරුම් නිබ්බධභාගීය හෙවත් නිවන් අවබෝධ කිරීමෙහි කොටස් වූ සංඥවෝ සමෘද්ධ වෙත්.

මේ ආතාප ඔත්තප්ප යන ගුණ දෙකින් යුක්ත වූවහුට සීල සමාධි ප්‍රඥවන් පිළිබඳ ශික්ෂණය ඇති හෙයින් මාර්ග ඵල නිර්වාණාධිගමයෙහි භව්‍යතාවය දක්වමින් "ආතාපී ඛො භික්ඛවෙ —පෙ— අධිගමාය" යනු කීහ.

**සංයොජනං ජාතිජරාය ජෙත්වා —**

කාමරාග සංයෝජනාදි සංයෝජන දශයෙකි. මොවුහු ජාතිජරා මරණාදි දුක් ඉපදවීමෙන් මේ සත්ත්‍වයා සසර බැඳ තබන්නාහු ය. එය අනුසයත් නැතිව නැති කළ කල්හි සියලු දුක් කෙළවර වන හෙයින් මෙසේ වදාළහ.

**සත්වන සූත්‍ර විවරණය යි.**

**2 – 1 – 8**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

තයිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති ජනකුහනත්ථං ජනලපනත්ථං ලාභසක්කාරසිලොකානිසංසත්ථං ඉති මං ජනො ජානාතූ'ති අථ ඛො ඉදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති **සංවරත්ථං ච පහානත්ථඤ්චා** ති, එත'මත්ථං භගවා අවොච තත්ථෙ'තං ඉති වුච්චති

සංවරත්ථං පහානත්ථං බ්‍රහ්මචරියං අනීතිහං
අදෙසයි සො භගවා නිබ්බානොගධගාමිනං
එස මග්ගො මහන්තෙහි අනුයාතො මහෙසිහි
යෙ යෙ තං පටිපජ්ජන්ති යථා බුද්ධෙන දෙසිතං
දුක්ඛස්සන්තං කරිස්සන්ති සත්ථුසාසන කාරිනො'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

## 2 - 1 - 8

**අර්ථය:-**

**ජනකුහනත්ථං**, මහාජනයා විස්මයපත් කරවනු පිණිස; (පුදුමය, මේ ආර්ය තෙමේ සිල්වතෙක, වත් සම්පන්නයෙක, අල්පෙච්ඡයෙක, සන්තුෂ්ටියෙක, මහත් ඍද්ධි ඇත්තෙක, මහානුභාව ඇත්තෙකැ යි ජනයා විස්මය කරවන්නට ය යූ සේ යි.) **ජනලපනත්ථං**, මහාජනයා ලවා ගුණ කථනය කරවනු පිණිස; **ලාභ සක්කාර සිලොකානිසංසත්ථං**, ලාභ සත්කාර කීර්ති අනුසස් පිණිස; **ඉති**, මෙසේ; **ජනො**, මහජනතෙමේ; **මං**, මා; **ජානාතු ඉති**, දනිවා යි; **ඉදං බ්‍රහ්මචරියං**, මේ සීලය; **න වුස්සති**, නො පුරන්නේ ය; **අථ ඛො**, එසේ නම්; **සංවරත්ථඤ්ච**, සංවරය පිණිසත්; **පහානත්ථං ච**, කෙලෙසුන් දුරුකිරීම පිණිසත්; **ඉදං බ්‍රහ්මචරියං**, මේ සීලය; **වුස්සති**, පුරන්නේ ය.

**සො භගවා**, ඒ භාග්‍යවතුන් වහන්සේ; **නිබ්බානොගධ ගාමිනං**, නිවනට පමුණුවන්නාවූ; **අනීතිහං**, උවදුරු රහිත වූ; **බ්‍රහ්මචරියං**, සීලය; **සංවරත්ථං**, සංවරය පිණිස; **පහානත්ථං**, කෙලශප්‍රහාණය පිණිස; **අදෙසයි**, දෙසූ සේක.

**මහන්තෙහි**, උදාර අදහස් ඇති; **මහෙසිභි**, මහර්ෂීන් විසින්; **එසො මග්ගො**, මේ මාර්ගය තෙමේ; **අනුයාතො**, පිළිපන්නේ වේ; **යෙ යෙ**, යම් යම් කෙනෙක්; **යථා**, යම් සේ; **බුද්ධෙන දෙසිතං**, සර්වඥයන් වහන්සේ විසින් දෙසන ලද; **තං**, ඒ මාර්ගයට; **පටිපජ්ජන්ති**, පිළිපදිත් ද; **සත්ථු සාසන කාරිනො**, ශාස්තෲන් වහන්සේගේ අනුශාසනාව කරන්නා වූ; (ඔවුහු) **දුක්ඛස්ස**, සංසාර දුඃඛයාගේ; **අන්තං**, කෙළවර; **කරිස්සන්ති**, කරන්නාහු ය;

**භාවය:-** සුගම යි.

**ධර්ම විස්තර:-**

**නයිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති —**

සිල් රැකීමෙහි බොහෝ අනුසස් ඇති බව **මජ්ඣිම නිකායෙහි** ආකඞ්ඛෙය්‍ය සූත්‍රයෙන් පැහැදිලි වෙයි. "ආකඞ්ඛෙය්‍ය වෙ භික්ඛවෙ භික්ඛු ලාභී අස්සං චීවර පිණ්ඩපාත සේනාසන ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරානන්ති සීලෙස්වෙවස්ස පරිපූරකාරී" යනු යි. යම් භික්ෂුවක් ලෝකයාගෙන් සිවුපසය ලබන්නට කැමැති වේ නම් චතුපාරිශුද්ධි සීලයෙහි සම්පූර්ණකාරී වන්නේ ය යනු එහි අදහස යි.

මේ සිවුපස ලාභය ඉහාත්ම භාවයෙහි ම සීලයෙන් ලැබෙන එක් අනුසසෙක. ලෝකයාගෙන් ලැබෙන සිවුපසය පමණක් නොව ඔවුන්ගෙන් ලැබෙන ආදර ගෞරව බුහුමන් සත්කාර සම්මානනාදියත්; අසවල් භික්ෂුතෙම සිල්වත් ය, බහුශ්‍රැත ය, ධර්මධර ය, වීර්‍ය සම්පන්න ය යන ආදි වශයෙන් ලෝකයා අතර ඇති වන ගෞරවය හා කීර්තියත් දෘෂ්ටධාර්මික එක් අනුසසෙක; එසේ ද වුවත් තමන්ගේ ගුණ දහම් රකෙන අන්දමින් සිල් පිරීමෙහි අනුසස් මෙසේ ස්වයං සිද්ධ නමුදු තමාගේ සීලය අනුන්ට හඟවා ගෞරව ලාභ සත්කාර ලබන්නට කල්පනා කිරීම යුතු නොවේ.

ඇතැම් කෙනෙක් බොහෝ ලාභ ලබනු කැමැත්තෙන් තුන් වැදෑරුම් කුහක වස්තුවලින් ජනයා විස්මය පත්කර වීම සඳහා **ජනකුහනත්‍ථං** යනු කීයේ ය. ප්‍රත්‍යය ලබා ගනු සඳහා කරනු ලබන ප්‍රයෝග කථා ද, මෙබන්දකුට දෙන දානය මහත්ඵලය මහානිශංසය යි අනුන් ලවා කිය වීම සඳහා ද **ජනලපනත්‍ථං** යනු කීයේ ය. පවිටු අදහස් ඇති පුද්ගලයා විසින් තමා තුළ නැති ගුණ හැඟවීමෙන්

මහාජනතෙමේ මා ගුණවතකු ලෙස සිල්වතකු ලෙස දැන ගනීවා යි යන මේ ලාමක අදහසින් සිල් නොරැකිය යුතු බව "ඉති මං ජනො ජානාතු" යන්නෙන් දැක්වූ අයුරු යි.

**සංවරත්‍ථං පහානත්‍ථං —**

සංවරය නම් ප්‍රාතිමොක්‍ෂ සංවරය, ස්මෘති සංවරය, ඥාන සංවරය, ක්‍ෂාන්ති සංවරය, වීර්‍ය සංවරය යන පස් වැදෑරුම් සංවරය යි. සියලු ම සීලසංවරය ප්‍රාතිමොක්‍ෂ සංවර නමින් හඳුන්වනු ලැබේ; ප්‍රාණඝාතාදි දුශ්චරිතයන් ගෙන් වළකිනු කැමැත්තහුගේ චේතනාවත් වත් පිළිවෙත් පුරන්නහුගේ චේතනාවත් විරතිත්‍රයත් යන මේ චේතනා සීල චෛතසික සීල දෙක ම රැකීම සීලසංවරය යි. මෙහි විස්තර **විශුද්ධි මාර්ගය** ඇසුරු කොට දතයුතු යි. **පඤ්චවිධ ප්‍රහාණය** මෙහි පළමු කොට විස්තර කරන ලදි සංවරයෙන් චිත්තසන්තානයෙහි කෙලෙසුන් වැද්ද නොගැනීම හා ප්‍රහාණයෙන් ඇතුල් වූ නීවරණයන්ගේ නැසීමත් ප්‍රකාශ වේ.

**අනීතිහං —**

ඊති නම් මෙලොව පරලොව දෙක්හි ඇතිවන උවදුරු යි. ඔවුන් දුරු කෙරේනු යි ඊතිහ නම් වේ. ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව හා මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවත් මෙයින් ප්‍රකාශ වෙයි. අනර්ථ කරවූ තෘෂ්ණාදි කෙලෙසුන් විනාශ කරන හෙයින් ද ඊතිහ නම් වේ මෙහි ඊතිහ නම් වූ කෙලෙස් නැත්තු යි අනීතිහ නම් වේ. තීර්ථකයන්ගේ සමය හෝ ඊතිහ යි. එයට ප්‍රතිපක්‍ෂ හෙයින් අනීතිහ නම් වේ. ධර්මාර්ථයන්හි අවිනිශ්චිත වූ සැකය ඊතිහ යි. බුද්ධධර්මයට අනුව පිළිපදනහුට නිර්වාණාවබෝධයෙහි සැකයක් නැති හෙයින් අනීතිහ නම් වේ. "පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි, අතක්කාවචරො" යන මේ පදයන්ගේ අර්ථය අනීතිහ පද යෙන් ගාථාවට නැගූ අයුරු යි.

**නිබ්බානොගධ ගාමිනං —**

නිවනට පමුණුවන හෙයින් නිබ්බානොගධගාමිනී නම් වේ. නිබ්බානොගධ යනු ආර්‍ය්‍යමාර්ගය යි. **එයින් වෙන්ව** නිවනට ඇතුළත් විය නොහැකි හෙයින් ද මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යය නම් වූ ආර්‍ය්‍යමාර්ගය නිවන් අරමුණු කොට ගෙන එයට ඇතුළත්ව පවත්නා හෙයින් ද **නිබ්බානොගධගාමිනී** නම් වේ.

**අටවන සූත්‍ර විවරණය යි**

**2 – 1 – 9**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

නයි'දං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති ජනකුහනත්ථං ජනලපනත්ථං ලාභසක්කාර සිලොකානිසංසත්ථං ඉති මං ජනො ජානාතූති අථඛො ඉදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති **අභිඤ්ඤත්ථඤ්චෙව පරිඤ්ඤත්ථඤ්චාති,** එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති

"අභිඤ්ඤත්ථං පරිඤ්ඤත්ථං බ්‍රහ්මචරියං අනීතිහං
අදෙසයි සො භගවා නිබ්බානොගධගාමිනං
එස මග්ගො මහන්තෙහි අනුයාතො මහෙසිහි
යෙ යෙ තං පටිපජ්ජන්ති යථා බුද්ධෙන දෙසිතං
දුක්ඛස්සන්තං කරිස්සන්ති සත්ථුසාසනකාරිනො, ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති

**2 – 1 – 9**

**අර්ථය:-**

**අභිඤ්ඤත්ථං,** සියලු ධර්මයන් සක්‍න්ධාදි විභාග වශයෙන් විශිෂ්ටඥානයෙන් දැනීම පිණිස ද; **පරිඤ්ඤත්ථං,** සියලු ත්‍රෛභූමික ධර්මයන් මේ දුකය යනාදි වශයෙන් චතුස්සත්‍යඥානයෙන් පිරිසිඳ දැනීම පිණිස ද; සෙස්ස සුගම යි.

**නවවන සූත්‍ර විවරණය යි**

## 2 - 1 - 10

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතා’ති මෙ සුතං

ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛසොමනස්සබහුලො විහරති යොනිසො ආරද්ධො හොති ආසවානං ඛයාය, කතමෙහි ද්වීහි? **සංවෙජනීයෙසු ඨානෙසු සංවෙජනෙන සංවෙගස්ස** ච **යොනිසො පධානෙන** ඉමෙහි ඛො භික්ඛවෙ ද්වීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙවධම්මෙ සුඛසොමනස්ස බහුලො විහරති. යොනිසො ආරද්ධො හොති ආසවානං ඛයායාති. එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

“සංවෙජනීයට්ඨානෙසු සංවිජ්ජතෙව පණ්ඩිතො
ආතාපී නිපකො භික්ඛු පඤ්ඤාය සමවෙක්ඛිය
එවං විහාරී ආතාපී සන්තවුත්ති අනුද්ධතො
චෙතොසමථ මනුයුත්තො ඛයං දුක්ඛස්ස පාපුණෙති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති,

## වග්ගො පඨමො

**තස්සුද්දානං:-**

වෙ ච භික්ඛූ තපනීයා තපනීයා පරත්ථෙ’ති
වෙ ආතාපි නකුහනා ච සොමනස්සෙන තෙ දස’ති

## 2 - 1 - 10

**අර්ථය:-**

ද්විහි **ධම්මෙහි**, කරුණු දෙකකින්; **සමන්නාගතො**, යුක්ත වූ; **භික්ඛු**, මහණතෙම; **දිට්ඨෙවධම්මෙ**, ඉහාත්මයෙහිම; **සුඛ සොමනස්ස බහුලො**, කායික මානසික සැප බහුල කොට ඇත්තේ වේ. **අස්ස**, මොහු විසින්; **ආසවානං ඛයාය**, කෙලෙසුන් දුරු කිරීම පිණිස; **යොනිසො**, නුවණින්;

**ආරද්ධා, හොති** පටන් ගන්නා ලද්දේ වේ. නොහොත් **අස්ස,** ඔහු විසින්; **ආසවානං ඛයාය,** කෙලෙස් නැසීම පිණිස; **යොනි ච,** කාරණය ද; **ආරද්ධා හොති,** අරඹන ලද්දී වේ; **සංවෙජනියෙසු ඨානෙසු,** සංවේගයට හේතු වූ වස්තූන් කෙරෙහි; **සංවෙජනෙන,** කළ කිරීමෙන් ද; **සංවිග්ගස්ස,** කළ කිරුණු දේ පිළිබඳව; **යොනිසො පධානෙන,** නුවණින් උත්සාහ කිරීමෙන් ද නොහොත් සම්‍යක් ව්‍යායාමයෙන් ද යන දෙකරුණෙනි;

**පණ්ඩිතො,** ඥානවන්ත වූ; **ආතාපී,** කෙලෙසුන් තවන වීර්‍ය ඇති; **නිපකො,** ප්‍රාඥවූ; **භික්ඛු,** මහණතෙම; **පඤ්ඤාය** නුවණින්; **සම්මවෙක්ඛිය,** සලකා; **සංවෙජනියට්ඨානෙසු,** සංවේගයට හේතු වූ කරුණු කෙරෙහි; **සංවිජ්ජෙථෙව** සංවේගය ඇති කරන්නේ ම ය;

**එවං විහාරී,** මෙසේ වාසය කරන සුලු වූ; **ආතාපී,** කෙලෙසුන් තවන වීර්‍ය ඇති; **සන්තවුත්ති,** ශාන්ත පැවතුම් ඇති; **අනුද්ධතො,** උඩඟු නොවූ; **චෙතොසමථ මනුයුත්තො,** චිත්ත සමථයෙහි යෙදුණා වූ භික්ෂුතෙම; **දුක්ඛස්ස,** සංසාර දුඃඛයාගේ; **ඛයං,** දුරු කිරීමට; **පාපුණෙ,** පැමිණෙන්නේ ය; **භාවිය,** සුගම යි.

**ධර්මවිස්තර:–**

**ආසවානං ඛයාය –**

චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, මන යන සදෙරින් කෙලෙස් වැගිරෙත්නු යි **ආසව** නම්. ලෞකික ධර්මයන්ගේ සීමා වශයෙන් ගොත්‍රභූ සිත දක්වාත් ලෝකධාතුවෙහි සීමා වශයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය නම් වූ භවාග්‍රය දක්වාත් වැගිරෙත්නු යි **ආසව** නම් වේ. බොහෝ කලක් පෙරා පල් කිරීමෙන් සුරාවක් වැනිනු යි කෙලෙසුන්ගේ පාරම්පරිකව පවත්නා ලාමක ගතිය **ආසව** නමින් හඳුන්වනු ලැබේ.

අවිද්‍යාවට මුල්වූයේ ද ආශ්‍රවයෝ යි. එහෙයින් සියලු කෙලෙසුන්ට ද ආශ්‍රවය යි කිවහැකි ය. සසර දුක් රැස් කෙරේනු යි ආශ්‍රව නම් වේ. කෙලෙසුන්ට පමණක් නොව ලෝකයෙහි නොයෙක් උවදුරුවලට ද ආශ්‍රව යයි කියනු ලැබේ.

"චත්තාරො ආසවා, කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො" යනුවෙන් අභිධර්මයෙහි කාමාශ්‍රවය භවාශ්‍රවය දෘෂ්ටි ආශ්‍රවය අවිද්‍යාශ්‍රවය යි ආශ්‍රව සතරක් දක්වා ඇත. "නාහං චුන්ද දිට්ඨධම්මිකානංයෙව ආසවානං සංවරාය ධම්මං දෙසෙමි" යන තන්හි විවාද මූලක වූ කෙලෙසුන්ට ආසව යයි කියනු ලැබේ.

"යෙන දෙවූපපත්‍යස්ස ගන්ධබ්බො වා විහඞ්ගමො යක්ඛත්තං යෙන ගච්ඡෙය්‍යං මනුස්සත්තං ච අබ්බජෙ, තෙ මය්හං ආසවා ඛීණා විද්ධස්තා විනලීකතා" යන මෙහි ත්‍රෛභූමක කර්ම හා අවශෙෂ අකුසල් ද ආසව නමින් සලකනු ලැබේ.

යම් ආශ්‍රවයන් කරණකොටගෙන දිව්‍යලෝකෝත්පත්තිය වේ නම් ගන්ධර්වයෙක් හෝ අහස හැසිරෙන දේව විශේෂයක් වේ නම් යක්ෂබවට හෝ යේ නම් මිනිසත්බවට හෝ යේ නම් මා විසින් ඒ ආශ්‍රවයෝ ක්ෂය කරනලද්දාහු ය, විනසනලද්දාහු ය, බැමි සිඳිනලද්දාහු ය. යනු මෙහි අදහස යි.

"දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකානං ආසවානං පටිඝාතාය" යන මෙහි පරාපවාද හෝ පරූපඝාත විපිළිසර වධ බන්ධනාදි මෙලොව විඳින දුක් ද, නානාප්‍රකාර උවදුරු හා සතර අපාය දුක් ද ආසව නමින් දක්වනු ලැබේ. මේ ආශ්‍රවයෝ විනයෙහි දෘෂ්ටධාර්මික ආශ්‍රවය, සාම්පරායික ආශ්‍රව යයි දෙපරිද්දෙකින් සඳහන් වෙත්. සළායතන සූත්‍ර

යෙහි කාමාසව භවාසව අවිජ්ජාසව යයි ආශ්‍රව තුනක් කියන ලදහ. දිට්ඨාසවයත් සමග සතරක් කොට දක්වූහ.

නිරයට පමුණුවන ආශ්‍රවය, තිරිසන් යෝනියට පමුණුවන ආශ්‍රවය, ප්‍රෙත විෂයයට පමුණුවන ආශ්‍රවය, මිනිස් ලොවට පමුණුවන ආශ්‍රවය, දෙව්ලොවට පමුණුවන ආශ්‍රව යයි පස් පරිද්දෙකින්ද සඳහන් කරනලදහ. **අංගුත්තර නිකාය** ඡක්ක නිපාතයෙහි "අත්ථි භික්ඛවෙ ආසවා සංවරා පහාතබ්බා" යන ආදීන් සපරිද්දෙකින් ද, **මජ්ඣිමනිකාය** සබ්බාසව සංවර පරියායෙහි දර්ශනප්‍රහාතව්‍යය ධර්මයන් සමග සත් පරිද්දකින් ද දක්වනලදහ. මෙහි අභිධර්ම පරියායෙන් ආශ්‍රව සතරක් දක්වූ බව සැලකිය යුතු ය.

තන් තන් ධර්ම පර්‍යායයන්හි අර්හත් මාර්ගඥානයට හා අර්හත් ඵලයටත් ආශ්‍රවක්‍ෂය යයි කියනු ලැබේ. "ජානතො අහං භික්ඛවෙ පස්සතො ආසවානං ඛයං වදාමි" යන මේ **සබ්බාසව සංවර පරියාය** දෙශනාවෙහි යොනිසො මනසිකාරයෙන් නොහොත් යථාභූත ඥානදර්ශන නම් වූ නුවණින් නාමරූප ධර්මයන්ගේ තතු දන්නාහට දක්නාහට ආශ්‍රවයන්ගේ ක්‍ෂය කිරීම දෙශනා කරනලදී.

"සෙඛස්ස සික්ඛමානස්ස - උජුමග්ගානුසාරිනො
ඛයස්මිං පඨමං ඤාණං - තතො අඤ්ඤා අනන්තරා"

ත්‍රිවිධ ශික්‍ෂායෙහි හික්මෙන ඍජුවූ මාර්ගසෙහි ගමන් කරන ශෛක්‍ෂ පුද්ගලයා හට කෙලෙසුන් දුරු කිරීමෙහි පළමුවන නුවණ ද එයට අනතුරුව අර්හත්ඵලය ද වේයි යනු මෙහි අදහස යි.

**සංවෙජනීයෙසු ඨානෙසු —**

ජාති දුක ජරාදුක ආදි අෂ්ටසංවේග වස්තු මෙහි ඇතුළත් වේ.

පාවද

2. උපනීයති ලොකො අද්ධුවො"

ලෝකය ජරාව විසින් මරණය කරා ගෙන යනු ලැබේ. එහෙයින් අස්ථිර ය.

3. "අතාණො ලොකො අනභිස්සරො"

ලෝකය අනාරක්‍ෂිත ය. අස්වැසීමට සභායකයෙක් නැත්තේ ය.

4. අස්සකො ලොකො සබ්බං පහාය ගමනීයං"

ලෝකය තමා අයත් නොවේ. එහෙයින් සියල්ල අත්හැර පරලොව යායුතු යි.

5. "ඌනො ලොකො අතිත්තො තණ්හාදාසො"

ලෝකය සැමදාමත් අසම්පූර්ණ ය. අඩුපාඩු ඇත්තේ ය. එහෙයින් ලෝකයා ද තෘප්තියට (සෑහීමට) පත් නො වේ. මහජන තෙමේ තෘෂ්ණාවට දාස වෙයි. යන ආදී වශයෙන් ද සංවේගයට හේතු කරුණු දතයුතු යි.

**යොනිසො පධානෙන —**

උපායඥනයෙන් උපදවන වීර්‍යයෙන් හෙවත් සම්‍යක් ව්‍යායාමයෙන් යන අර්‍ථ යි. යම් වීර්‍යයෙකින් අකුසල් දුරු වෙත් ද, කුසල් වැඩෙත් ද, එබඳු උත්තමාර්ථය සිදුකරන හෙයින් ප්‍රධන් වීර්‍යය යි කියනු ලැබේ. සසර කලකිරීමෙන් එහි කිසි පිහිටක් නොදක්නා වූ යෝගාවචර තෙමේ සසරෙහි නොඇලී නොලැගී එයින් වෙන්වූ හැගීම් ඇතිව ඒකාන්තයෙන් නිවනට නැඹුරුවූ නිවනට නැමුණු නිවනට බර වූ සිත් ඇත්තෙක් වේ.

**දස වන සූත්‍ර විවරණය යි**

**ප්‍රථම වර්ගය නිමි.**

## 2 – 2 – 1

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං

තථාගතං භික්ඛවෙ අරහන්තං සම්මාසම්බුද්ධං ද්වෙ විතක්කා බහුලං සමුදාචරන්ති. **ඛෙමො ච විතක්කො පවිවෙකො ච** අබ්‍යාපජ්ඣාරාමො භික්ඛවෙ තථාගතො අබ්‍යාපජ්ඣරතො ත'මෙනං භික්ඛවෙ තථාගතං අබ්‍යාපජ්ඣාරාමං අබ්‍යාපජ්ඣරතං එසෙව විතක්කො බහුලං සමුදාචරති. ඉමායා'හං ඉරියාය න කිඤ්චි ව්‍යාබාධෙමි. තසං වා ථාවරං වා'ති.

පවිවෙකාරාමො භික්ඛවෙ තථාගතො පවිවෙකරතො ත'මෙ'නං භික්ඛවෙ තථාගතං පවිවෙකාරාමං පවිවෙකරතං එසෙ'ව විතක්කො බහුලං සමුදාචරති. යං අකුසලං තං පහීනන්ති. තස්මා තිහ භික්ඛවෙ තුම්හෙ පි අබ්‍යාපජ්ඣාරාමා විහරථ අබ්‍යාපජ්ඣරතා තෙසං වො භික්ඛවෙ තුම්හාකං අබ්‍යාපජ්ඣාරාමානං විහරතං අබ්‍යාපජ්ඣරතානං එසෙව විතක්කො බහුලං සමුදාචරිස්සති. ඉමාය මයං ඉරියාය න කිඤ්චි ව්‍යාබාධෙම තසං වා ථාවරං වා'ති.

පවිවෙකාරාමා භික්ඛවෙ විහරථ. පවිවෙකරතා තෙසං වො භික්ඛවෙ තුම්හාකං පවිවෙකාරාමානං පවිවෙකරතානං එසෙව විතක්කො බහුලං සමුදාචරිස්සති. කිං අකුසලං කිං අප්පහීනං කිං පජහාමාති. එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

“තථාගතං බුද්ධ මසය්හසාහිනං
ද්වෙ විතක්කා සමුදාචරන්ති නං
ඛෙමො විතක්කො පඨමො උදීරිතො
තතො විවෙකො දුතියො පකාසිතො

තමොනුදං පාරගතං මහෙසිං
තං පත්තිපත්තං වසිමං අනාසවං
වෙසන්තරං තණ්හක්ඛයෙ විමුත්තං
තං වෙ මුනිං අන්තිම දෙහධාරිං
මානං ජහං බ්‍රෑමි ජරාය පාරගුං

සෙලෙ යථා පබ්බතමුද්ධනි’ට්ඨිතො
යථාපි පස්සෙ ජනතං සමන්තතො
තථූපමං ධම්මමයං සුමෙධ
පාසාදමාරුය්හ සමන්තචක්ඛු
සොකාවතිණ්ණං ජනතමපෙතසොකො
අවෙක්ඛස්සු ජාතිජරාභිභූත’න්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත’න්ති

## 2 - 2 - 1

**අර්ථය**:-

**තථාගතං**, තථාගත වූ; **අරහන්තං**, අර්හත් වූ; **සම්මා සම්බුද්ධං**, සම්‍යක් සම්බුදුන්ට; **ද්වෙ විතක්කා**, විතර්කයෝ දෙදෙනෙක්; **බහුලං**, නිතර; **සමුදාචරන්ති**, පවතිත්; **ඛෙමො ච විතක්කො**, ක්ෂෙම වූ විතර්කය; **පවිවෙකො ච**, ප්‍රවිවේක වූ විතර්කය යන දෙක යි; **අබ්‍යාපජ්ජාරාමො**, අව්‍යාපාද සිත්හි ඇලුණේ ය; අබ්‍යාපජ්ජරතො යනු ද මේ අර්ථයමැ යි. **අබ්‍යාපජ්ජාරාමං**, අව්‍යාපාදයෙහි ඇලුණු; අබ්‍යාපජ්ජරතං යනු ද මේ අර්ථ මැ යි. **තං එතං තථාගතං**, ඒ මේ තථාගතයන් වහන්සේට; **එසො විතක්කො එව**, මේ ක්ෂෙම විතර්කය ම; **බහුලං**, නිතර; **සමුදාචරති**, පවති යි. **අහං**, මම; **ඉමාය ඉරියාය**, මේ පැවැත්මෙන්; **තසං වා**, තෘෂ්ණා සහිත භය සහිත හෙයින් ත්‍රස වූ හෝ; **ථාවරං වා**, තණ්හාව දුරුකළ හෙයින් ස්ථාවර වූ හෝ; **කිඤ්චි**, කිසි සත්ත්වයකුත්; **න ව්‍යාබාධෙමි**, නොපෙළමි;

**සං අකුසලං**, යම් කෙලෙශයක් වේ ද; **තං**, ඒ; **පහීනං ඉති**, දුරුකරන ලද්දේය කියා යි. **කිං අකුසලං**, අකුසලය නම් කුමක් ද; **කිං අප්පහීනං**, කුමන අකුසලයක් දුරු නොකෙළේ ද; **කිං පජහාම ඉති**, කුමක් දුරු කෙරෙමු ද යනුයි; **එසො එව විතක්කො**, මේ ප්‍රවිවේක විතර්කයම; **බහුලං**, බහෝ කොට; **සමුදාචරිස්සති**, සිත්හි පවත්නේය.

**අසය්හසාහිනං**, පස්මරුන් දිනූ හෙයින් අසය්හසාහිවූ; **තථාගතං**, තථාගත වූ; **බුද්ධං** සර්ඥයන් වහන්සේට; **ද්වෙ විතක්කා**, දෙවැදෑරුම් විතර්කයෝ; **සමුදාචරන්ති**, නිරතුරුව පවතිත්; **නං**, යනු නිපාතමාත්‍ර යි; නැතහොත් "තං තථාගතං" යි සම්බන්ධ කරනු; **පඨමො**, පළමුවැනි වූ; **ඛෙමො විතක්කො**, ක්‍ෂෙම වූ විතර්කය; **උදීරිතො**, කියන ලදී; **තතො**, ඉක්බිති; **දුතියො විවෙකො**, දෙවන විවේකය; **පකාසිතො**, ප්‍රකාශ කරන ලද්දේ ය.

**තමොනුදං**, මොහාන්ධකාරය දුරු කළා වූ; **පාරගතං**, නිවන් අවබෝධ කළා වූ; **මහෙසිං**, මහර්ෂි වූ; **පත්තිපත්තං**, සියලු බුදුවරුන් විසින් පැමිණියයුතු කරුණා ප්‍රඥා ගුණ සන්ට පැමිණියා වූ; **වසිමං**, චිත්තාවශීභාවය ඇති; **අනාසවං**, ආශ්‍රව රහිත වූ; **වෙස්සන්තරං**, සියලු කෙලෙසුන් තරණය කළා වූ; **තණ්හක්ඛයෙ**, අභීත් එල සංඛ්‍යාත නිවන් අරමුණු කොට; **විමුත්තං**, කෙලෙසුන්ගෙන් මිදුණා වූ; **අන්තිම දෙහධාරිං**, (පුනරුත්පත්තියක් නැති හෙයින්) පශ්චිම ශරීරය දරන්නා වූ; **මානජහං**, මානය දුරුකළාවූ; නොහොත් මාරජහං; කෙලශ මාරාදීන් දුරු කළාවූ; **ජරාය පාරගුං**, ජරාදුකෙන් පරතෙරට ගියා වූ; **තං**, උන්වහන්සේ; **මුනිං**, සම්‍යක් සම්බුද්ධය යි **බ්‍රෑමි**, කියමි.

**යථා**, යම් සේ; **සෙලෙ**, ශෛලමය වූ; **පබ්බතමුද්ධනි**, එකඝන පර්වතයක්හුගේ මස්තකයෙහි; **ඨිතො**, සිටියා වූ (ඇස් ඇති) පුරුෂයෙක්; **සමන්තතො**, හාත්පසින් සිටින්නා වූ; **ජනතං**, ජන සමූහයා; **පස්සෙ**, දකී ද; **සමන්තචක්ඛු**,

සමතැස් ඇති; හෙවත් සම්ඥතාඥාන ඇති; **සුමෙධ,** ප්‍රාඥයන් වහන්ස!; **තථූපමං,** පළමු උපමාවෙන් දැක්වූ පරිදි; **ධම්මමයං පාසාදං,** ධර්මමය ප්‍රාසාදයට නොහොත් ප්‍රඥ ප්‍රාසාදයට; **ආරුය්හ,** නැඟී; **අපෙතසොකො,** තෙමේ ශෝක නැත්තෙක් ව; **සොකාවතිණ්ණං,** ශෝකයට බැසගත්; **ජරාභිභූතං,** ජාති ජරාවලින් මැඩුණා වූ; **ජනතං,** සත්ත්ව සමූහය; **අවෙක්ඛති,** සලකා බල යි.

**භාවය:-** සුගම යි:-

**ධර්මවිස්තර:-**

**තථාගතං —**

මෙහි තථාගත ශබ්දය තෙමේ සත්ත්ව ව්‍යවහාරය, සම්‍යක් සම්බුද්ධය. යන අර්ථයන්හි වැටේ. "තථාගතො ජිනො සත්ථා" යනු **අභිධානප්පදීපිකා**යි, "හොති තථාගතො පරම්මරණා" යනාදි තන්හි සත්ත්වව්‍යවහාරයෙහි වැටේ. "තථාගතං දෙවමනුස්ස පූජිතං බුද්ධං නමස්සාම සුවත්ථි හොතු" යන තන්හි බුද්ධරත්නය කෙරෙහි වැටෙයි. තථාගතං දෙවමනුස්ස පූජිතං ධම්මං නමස්සාම සුවත්ථි හොතු" යන තන්හි ධර්මරත්නයෙහි ද "තථාගතං දෙව මනුස්ස පූජිතං සඞ්ඝං නමස්සාම සුවත්ථි හොතු" යන තන්හි සඞ්ඝරත්නය කෙරෙහි ද තථාගත ශබ්දය යෙදෙ යි. මෙහි තථාගත ශබ්දය සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ කෙරෙහි වැටෙ යි

අට කරුණෙකින් බුදුහු තථාගත නම් වනසේක.

(1) "තථා ආගතොති තථාගතො" පෙර බුදුවරයන් සෙයින් පෙරුම් පුරා පස් මහා පරිත්‍යාගයන් කොට බුද්ධත්වයට පැමිණියේනු යි **තථාගත** නම් වෙයි.

(2) "තථා ගතො'ති තථාගතො" පෙර බුදුවරයන් මෙන් උපන් කෙණෙහි ම පොළොවෙහි පිහිටා උතුරුදිගට අභිමුඛව සත් පියවරක් වැඩ අභීතනාදය කළ හෙයින් ද **තථාගත** නම් වෙයි.

(3) "තථලක්ඛණං ආගතොති තථාගතො" නාම රූප ධර්මයන්ගේ නොවෙනස් වූ ස්වභාව ලක්‍ෂණය අවබෝධ කළ හෙයින් ද **තථාගත** නම් වේ.

(4) "තථධම්මෙ යථාවතො අභිසම්බුද්ධො'ති තථාගතො" චතුරාර්‍ය්‍යසත්‍යධර්මයන් තත්වූපරිදි අවබෝධ කළ හෙයින් ද **තථාගත** නම් වෙයි.

(5) "තථ දස්සිතාය තථාගතො" දෙව් මිනිසුන් සහිත අප්‍රමාණ ලොකධාතුවල සත්‍වයන් තම තමන්ගේ චක්‍ෂුර් ද්වාරාදියෙන් ගන්නා රූපාදි අරමුණුවල තත්‍වය මේ මේ සැටිය යි දත් හෙයින් ද **තථාගත** නම් වෙයි.

මෙතුන්තන්හි ම ගමනාර්ථ වූ ගත ශබ්දය අවබොධාර්ථයෙහි යෙදෙන බැව් දත යුතුයි.

(6) "තථාවාදිතාය තථාගතො" යම් වෙසක පුණු පොහෝ දින රෑ අලුයම්හි බුදු වූ සේක් ද, එබදු වූ දින යම් රැයක පිරිනිවි සේක් ද, මේ දෙ අතර පන්සාලිස් වසක් මුළුල්ලෙහි යම් ධර්මස්කන්ධයක් දෙසූ සේක් ද, ඒ සියල්ල එකිනෙකට අවිරුද්ධව ස්වාක්ඛාත ලක්‍ෂණයෙන් ප්‍රතිමණ්ඩිත කොට නිවන් කැළගන්වා දෙසූ හෙයින් ද **තථාගත** නම් වේ.

මෙහි ගත ශබ්දය නිරුක්ති නයින් ගත් කල ගද ශබ්දයෙහි අරුත් ඇත්තේය. **ගද වියත්ති යං වාචායං** ධාතු යි "ආගදනං ආගදො, වචනංති අත්ථො, තථො අවිපරීතො ආගදො, අස්සාති දකාරස්ස තකාරං කත්වා තථාගතොති එවමෙත්ථ පදසිද්ධි වෙදිතබ්බා" යනු අටුවා යි. වචනයට ආගද යයි කියනු ලැබේ. නොවෙනස් වූ ස්ථිර වූ වචනය මුන් වහන්සේට ඇත් නුයි යන අර්ථ විසින් දකාරයහට තකාර කොට තථාගත ශබ්දයාගේ පදසිද්ධිය දත යුතුය යනු මෙහි අදහස යි.

(7) "තථාකාරිතාය තථාගතො" භාග්‍යවතුන් වහන්සේ ගේ වචනයට කය අනුකූල හෙයින් ද, කයට වචනය අනුකූල හෙයින් ද, තථාකාරිත්වයෙන් **තථාගත** නම් වේ. මෙහි කරණාර්ථ ධාතුවෙන් නිපන් කත යන කෘදන්තයා ගේ කකාරයට ගකාරාදේශ වූ තැති.

එහෙයින් "යථාවාදී භික්ඛවෙ තථාගතො තථාකාරී, යථා කාරී තථාවාදී, ඉති යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී, තස්මා තථාගතොති වුච්චති" යනු දේශනා හෙයින් වචන ක්‍රියා දෙකින් ම නොවෙනස් භාවයක් ඇති හෙයින් **තථාගත** නම් වේ.

(8) "අභිභවනට්ඨෙන තථාගතො" භවාග්‍රයේ පටන් අවීචිය දක්වා සරසින් අප්‍රමාණ ලොකධාතුවෙහි සියලු සත්ත්වයන් ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්ති ඥානදර්ශන සංඛ්‍යාත ලොකොත්තර ගුණයන්ගෙන් මැඩ පවත්වන හෙයින් **තථාගත** නම් වේ. මෙහි තවත් විස්තර අර්ථ කථා ආශ්‍රයෙන් දතයුතු.

**ෙව විතක්කා බහුලං සමුදාචරිස්සන්ති** —

විතර්කය නම් අරමුණෙහි සිත නවත්වන චෛතසික යෙකි. යම්කිසි භාවනාවක ධ්‍යාන සිත නැංවීම මෙහි ලක්ෂණය වේ. ක්ෂෙමවිතර්කය, ප්‍රවිවේක විතර්කය යි විතර්කය දෙවැදෑරුම් වේ. එහි **ක්ෂෙමවිතර්කය** භාග්‍යවතුන් වහන්සේගේ කරුණාගුණය හා යෙදුණකි. මෙත්තා මුදිතා දෙක හා ද ලැබෙයි. එහෙයින් එය මහාකරුණාසමාපත්තියට හා මෛත්‍රී සමාපත්තියට ද පෙරදැරි වන්නේ ය.

**ප්‍රවිවේක විතර්කය** ඵලසමාපත්තියට පෙරදැරි වෙයි. දිව්‍යවිහාර ආර්‍යවිහාර වසයෙනුදු ලැබේ. කරුණාවට විෂය වන්නේ සියලු සත්ත්වයන් කෙරෙහි සැපය එළවීම යි. මෙත්සිත ඇති කිරීම යි. එහෙයින් අව්‍යාපාද අවිහිංසා විතර්කයෝ ක්ෂෙම විතර්කයට ඇතුළත් වෙති. ප්‍රවිවේක

විතර්කය නම් නෛෂ්ක්‍රම්‍ය සංකල්පනාව ම ය. එහෙයින් කාමවිතර්කාදිය දුරු කිරීමෙන් ලබන අතිවිශුද්ධ නෛෂ්ක්‍රම්‍ය විතර්කයාගේ ආනුභාවයෙන් කායවිවේක චිත්තවිවේක උපධි විවේක සංඛ්‍යාත ත්‍රිවිධ විවේකය පමණක් නොව තදංග වික්ඛම්භන සමුච්ඡේද පටිප්පස්සද්ධි නිස්සරණ යන පඤ්චවිධ විවේකයම සම්පූර්ණ වෙයි.

භාග්‍යවතුන් වහන්සේ දවසක් පාසාම විසිහතර කෝටි ලක්ෂවාරයක් කරුණාසමාපත්තිවලට සමවදනාසේක. එයින් අළුයම දෙලොස් කෙළ ලක්ෂයක් ද, සවස දෙලොස්කෙළ ලක්ෂයක්දැයි මෙසේ සමවදනා සූවිසි කෙළලක්ෂයක් සමා-පත්තීන්ට "සූවිසිකෙළලක්සමාපත්නැණ" යයි කාව්‍ය-ශේඛරයෙහි සඳහන් කරනුලැබේ. එයින් ක්ෂෙමවිතර්කය හා ප්‍රවිවේක විතර්කයාගේ බහුලප්‍රවෘත්තිය දතයුතු.

අප භාග්‍යවතුන් වහන්සේ යම් පිරිසක ධර්මදේශනා කෙරෙත් ද ඒ පිරිස සක්වළ සීමා කොට ඇති විශාල පිරිසක් වුව ද එහිදු සමාපත්ති බහුලව ම වැඩ වෙසෙති. යම් ඇසිල්ලක පිරිස සාධුකාර පවත්වා ද, ඇසූ ධර්මය ගැන කල්පනා කෙරේ ද, එකෙණෙහි කාලය සලකා එල සමවතට සමවදිති. සාධුකාර ශබ්දය අවසන් වනවිට ම සමවතින් නැගිට නැවැත්වූ තැන් පටන් ධර්මදේශනා කරනසේක. භාග්‍යවතුන් වහන්සේගේ භවාංගපරිවාසය හෙවත් භවාංග සිතෙහි පෙරළීම සැහැල්ලු ය. ආශ්වාසවාරයෙහිදු ප්‍රශ්වාසවාරයෙහිදු සමාපත්තිවලට සමවදිති. මෙසේක් ඛෙමවිතක්ක, පවිවේක විතක්ක දෙදෙනාගේ බහුල ප්‍රවෘත්තිය දතයුතු.

බුදුහු සමවත් සමවැදීමෙහි දක්ෂයහ. මෙතෙක් වේලා සමවත් සමවදිමි යි සමවත් කාලය අවසන් වූ විගස ම එයින් නැගිටීමෙහි ද දක්ෂයහ. සමාධියෙන් ලත් චිත්ත

විවේකයෙන් සිත පිනවන්නට දක්‍ෂයහ. සමාධියට ගොචර වන ධර්‍මයන් වෙන් කොට සැලකීමෙහිදු දක්‍ෂයහ. මතු මත්තෙහි සමවැදිය යුතු සමාපත්තීන් සලකා යට යට සමාධි අත්හැරීමෙහි ද දක්‍ෂයහ. "සො පඨමජ්ඣානා උට්ඨාය දුතියජ්ඣානං සමාපජ්ජති, දුතියජ්ඣානා උට්ඨාය තතියජ්ඣානං සමාපජ්ජති, තතියජ්ඣානා උට්ඨාය චතුත්ථජ්ඣානං සමාපජ්ජති" යි වදාළහ.

මේ බෙම, පවිවෙක විතක්ක දෙදෙනා වෙන් වෙන්ව බෙදුවත් ඔවුනොවුන්ට උපකාර වන හෙයින් අන්‍යොන්‍යොපනිශ්‍රය වෙති. විසභාග නොවෙති. ප්‍රවිවේක විතර්‍කය තෙම ක්‍ෂෙම විතර්‍කයට උපකාර වන්නේ තමාගේ සිතෙහි නො උපන් අව්‍යාපාද අවිහිංසා සංකල්පනාවන් ඉපදවීමටත්, උපන් සංකල්පනා දියුණු කරලීමටත් නෛෂ්ක්‍රම්‍යය ඕනෑ කරන හෙයිනි. එසේ ම ප්‍රවිවේක විතර්‍කයට ක්‍ෂෙමවිතර්‍කය උපකාර වන්නේ අව්‍යාපාද අවිහිංසා සංකල්පනා ඇත්තවුන්ට ම නෛෂ්ක්‍රම්‍යය සම්පූර්‍ණ වන හෙයිනි. මෙදෙක්හි අන්‍යොන්‍ය සම්බන්ධතාවය ධම්මපද පාළියෙහිදු මෙසේ පෙනෙයි.

"ඛන්ති පරමං තපො තිතික්ඛා – නිබ්බානං
පරමං වදන්ති බුද්ධා
න හි පබ්බජිතො පරූපඝාතී – සමණො හොති
පරං විහෙඨයන්තො"

යනු හෙයින් පරාපකාර පරාපවාද ඉවසීම ය යන යම් මේ අධිවාසනා ක්‍ෂාන්තියක් ඇද්ද ඕතොමෝ සීලාදි ගුණධර්‍මයන්ට ප්‍රතිපක්‍ෂ වූ අකුසලයන් තවන හෙයින් මේ ශාසනයෙහි උතුම් වූ තපසෙක, බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ අනුබුද්ධ ශ්‍රාවකයෝ ක්‍ෂාන්ති ලක්‍ෂණ වූ නිර්වාණය ශාන්ත ප්‍රණීතාදි සර්‍වාකාරයෙන් උතුම් යයි කියති. පරහට හිංසා කරන සුලු වූයේ නොහොත් අනුන් දිවි නසන සුලු වූයේ "පබ්බාජයන්තානො

මලං, තස්මා පබ්බජිතොති වුච්චති” යන ප්‍රව්‍රජිත ලක්‍ෂණ නැති හෙයින් පැවිදි නම් නොවෙයි. පාණි ප්‍රහාරාදියෙන් අනුන්ට වෙහෙස දෙන්නේ ද “සමිතත්තා හි පාපානං සමණොති පවුච්චති” යන ශ්‍රමණලක්‍ෂණ නැති හෙයින් මහණ නම් නොවන්නේ ය යනු මෙහි අදහසයි.

එහෙයින් සවාසනා සකල කෙලශයන් දුරු කළ අප භාග්‍යවතුන් වහන්සේගේ ඛෙමවිතක්කය හා පවිවෙක විතක්කය යන දෙක උන්වහන්සේගේ ආශ්වාසකරණ මාත්‍රයෙහිදු ලෝකයාට හිත සැප එළවන්නේ ය. ප්‍රශ්වාස කරණ මාත්‍රයෙහිදු හිත සැප එළවන්නේමැ යි. එහෙයින් උන්වහන්සේ අබ්‍යාපජ්ජාරාම – අබ්‍යාපජ්ජරත” නම් වන සේක. අබ්‍යාපජ්ඣාරාමො අබ්‍යාපජ්ඣරතො කිව ද මේ අර්‍ථය මැයි.

“තථාගතං අරහන්තං සම්මාසම්බුද්ධං” යන්නෙහි තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස යි අර්‍ථ ගත යුතු. ෂෂ්ඨ්‍යර්ථයෙහි ද්විතියා හෙයින.

“තථාගතං බුද්ධමසය්හසාහිනං
දුවෙ විතක්කා සමුදාචරන්ති නං”

යනුවෙන් විතර්ක ද්වය දක්වා තමොනුදං යනාදි දෙවන ගාථායෙන් පවිවෙක විතක්කය දක්වූ නියා යි.

බෝසත්වරයකුට මිස අනිකකු විසින් ඉසිලිය නොහැකි සියලු බෝධිසම්භාර ධර්‍මයන් හා මහා කරුණා සමාපත්ති යන් උසුලන හෙයින් බුදුහු අසය්හසාහී නම් වන සේක. එසේ ම අනිකකු විසින් මැඩලිය නොහැකි පස්මරුන් මැඩලූ හෙයින් ද බුදුහු අසය්හසාහී නම් වන සේක. වෛනෙයජනයන්ගේ ආසයානුසය චරිතාධිමුක්ති ආදි තතු දැන ඔවුන්ට අනුශාසනා කිරීම් සඞ්ඛ්‍යාත බුදු කිස

උසුලන හෙයින් හා එය කරුණා ප්‍රඥා දෙකෙන් යුක්තව දරන හෙයින් ද බුදුහු **අසයහසාහී** නම් වනසේ කැයි දත යුතු.

තව ද මෙහි තෙවැනි වූ "සෙලෙ යථා පබ්බත මුද්ධනිට්ඨිතො" යන ආදි ගයින් ක්ෂේම විතර්කය දක්වූ අයුරු ද සැලකිය යුතුය.

**පළමුවන සූත්‍ර විවරණය යි.**

## 2 – 2 – 2

**වුත්තං හෙතං භගවතා වුත්ත'මරහතා'ති මෙ සුතං**

තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස වෙ ධම්මදෙසනා පරියායෙන භවන්ති, කතමා වෙ? **පාපං පාපකතො පස්සථා** ති අයං **පඨමා ධම්මදෙසනා**, පාපං පාපකතො දිස්වා තත්ථ නිබ්බින්දථ විරජ්ජථ විමුච්චථා'ති අයං **දුතියා ධම්මදෙසනා**, තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස ඉමා ද්වෙ ධම්මදෙසනා පරියායෙන භවන්තී'ති එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"තථාගතස්ස බුද්ධස්ස සබ්බභූතානුකම්පිනො
පරියායවචනං පස්ස ද්වෙ ච ධම්මා පකාසිතා
පාපකං පස්සථචෙ'තං තත්ථ චාපි විරජ්ජථ
තතො විරත්තචිත්තාසෙ දුක්ඛස්ස'න්තං කරිස්සථා'ති

අය'මපි අත්ථො වුත්තො භගවතා, ඉතිමෙ සුත'න්ති

## 2 – 2 – 2

**අර්ථය:–**

**පරියායෙන**, ක්‍රමානුකූල වශයෙන්; නොහොත් අවස්ථා වශයෙන්; **පාපං**, පව්; **පාපකතො**, පව වශයෙන්; **පස්සථ**, බලව්; **නිබ්බින්දථ**, කළකිරෙව්; **විරජ්ජථ**, නොඇලෙව්; **විමුච්චථ**, මිදෙව්;

**සබ්බභූතානුකම්පිනො**, සියලු සත්වයන් කෙරෙහි අනුකම්පා කරන්නාවූ; **තථාගතස්ස බුද්ධස්ස**, තථාගත සම්මා සම්බුදුන්ගේ; **පරියාය වචනං**, පරියායදෙසනාව; **පස්ස**, බලව; **ද්වෙ ධම්මා**, කරුණු දෙකක්; **පකාසිතා**, ප්‍රකාශ කරන ලදහ;

**පාපකං**, පව; **පස්සථ**, ලාමක වශයෙන් දකිව් යනු; **එකං**, එකෙක; **තතො ච අපි**, එහිදු; **විරජ්ජථ**, නොඇලෙව් යනු එකෙක; **තතො**, එයින්; **විරත්ත චිත්තාසෙ**, වැළකුණු සිත් ඇත්තෙක් වේ; **දුක්ඛස්ස**, සංසාර දුඃඛයාගේ; **අන්තං**, කෙළවර; **කරිස්සථ**, කරව්;

භාවය — සුගම යි.

**ධර්මවිස්තර**:-

**පාපං පාපකතො පස්සථ** —

සකාරණ වශයෙන් දහම් දෙසන බුදුරජාණන් වහන්සේ සියලු අකුසල් මෙලොව පරලොව දෙක්හි ම දුක් එළවන හෙයින් ලාමක වශයෙන් බලව් යැයි වදාළේ වෛනෙය ජනයන්ගේ අදහස්වලට අනුරූප වශයෙනි. මේ උන් වහන්සේගේ පළමුවන ධර්ම පර්‍යායය යි.

**නිබ්බින්දථ විරජ්ජථ විමුච්චථ** —

පව් නම් අතිශයින් ලාමක ය. අදක්ෂ හෙයින් **අකුසල** **නමුදු** වේ. ස්වභාවයෙන් පිරිසුදු සිත අපිරිසිදු කරන හෙයින් **සංකිලෙසික** නමැ යි ද, නැවත නැවතත් සසර දුක් උපදවන හෙයින් **පොනොභවික** යැ යි ද, සිතෙහි දැවිලි තැවිලි ඇති කරන හෙයින් **සදරථ** යයි ද, දුක් විපාක ගෙන දෙන හෙයින් **දුක්ඛවිපාකය** යි ද, බොහෝ කලක් මතු සසර ඉපදීම හා ජරාවත් මරණයත් උපද වන හෙයින් **ජාති ජරා මරණීය** යයි ද මෙසේ නොයෙක් ක්‍රමයෙන් අයුණු දක්නා වූ යෝගාවචරයෝ ඒ දුරුකිරීමෙහි අනුසස් නුවණින් දකිමින් කළකිරීම උපදවා ගනිති එම

සංවේගය විදසුන් වඩා ආර්‍ය මාර්‍ගාධිගමයට උපනිශ්‍රය වන හෙයින් "විරජ්ජථ විමුච්චථ" යි වදාළහ. මෙයින් අර්හත් මාර්‍ගඥානයෙන් රාගය දුරු කිරීමෙන් විරාගයත් අර්හත් ඵලයෙන් සියලු කෙලෙසුන් සංසිඳීමෙන් විමුක්තියත් දෙක වදාළහ. මේ දෙවන පර්‍යාය යයි.

## දෙවන සූත්‍ර විවරණය යි.

## 2 - 2 - 3

**වුත්තං හේතං භගවතා වුත්තමරහතාති මෙ සුතං,**

අවිජ්ජා භික්ඛවෙ පුබ්බඞ්ගමා අකුසලානං ධම්මානං සමාපත්තියා, අන්වදෙව **අහිරිකං අනොත්තප්පං** විජ්ජා ච ඛො භික්ඛවෙ පුබ්බඞ්ගමා කුසලානං ධම්මානං සමාපත්තියා, අන්වදෙව **හිරොත්තප්ප'න්ති** එත මත්ථං භගවා අවොච, තත්ථෙ'තං ඉති වුච්චති.

"යා කාචිමා දුග්ගතියො අස්මිං ලොකෙ පරම්හි ච
අවිජ්ජාමූලකා සබ්බා ඉච්ඡාලොභසමුස්සයා
යතො හොති පාපිච්ඡො අහිරිකො අනාදරො
තතො පාපං පසවති අපායං තෙන ගච්ඡති
තස්මා ඡන්දඤ්ච ලොභඤ්ච අවිජ්ජඤ්ච විරාජයං
විජ්ජං උප්පාදයං භික්ඛු සබ්බා දුග්ගතියො ජහෙ'ති.

අය'ම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

## පඨම භාණවාරං

## 2 - 2 - 3

**අර්ථය:-**

**අකුසලානං ධම්මානං**, අකුසල ධර්‍මයන්; **සමාපත්තියා**, රැස්කිරීම පිණිස; **අවිජ්ජා**, අවිද්‍යා තොමෝ; **පුබ්බංගමා**, පෙරදූරි වන්නීය; **අන්වදෙව**, එයට අනුව ම; **අහිරිකං**,

පාපයෙහි ලජ්ජා නැතිකම; **අනොත්තප්පං**, පවට බිය නැති කම (යන දෙක ය) **විජ්ජා**, අභීන්මාගී ප්‍රඥව; සෙස්ස සුබෝධ යි.

**අස්මිං ලොකෙ**, මෙලෙව්හි ද; **පරම්හි** ච, පරලෙව්හි ද; **යා කාචි ඉමා දුග්ගතියො**, යම් මේ දුගීතිහු වෙත් ද; **සබ්බා**, ඒ සියල්ල; **අවිජ්ජාමූලකා**, නොදැනීම මුල් කොට ඇත්තාහු ය; **ඉච්ඡාලොභ සමුස්සයා**, ඊර්ෂ්‍යාවෙන් හා ලෝභයෙන් ද රැස්වත්තාහු ය;

**යතො** ච, යම් අවිද්‍යා හේතුවකින්; **පාපිච්ඡො හොති**, පාපිෂ්ටයෙක් වෙයි ද; **අහිරිකො**, ලජ්ජා නැත්තෙක් වේ ද; **අනාදරො**, සබ්‍රම්සරුන් කෙරෙහි බියක් නැති බැවින් ආදර රහිත වේ ද; **තතො**, ඒ (අවිද්‍යා පාපිෂ්ටතා අහ්‍රික අනපත්‍රපා යන) අකුසලයන් හේතුකොට ගෙන; **පාපං පසවති**, පව් රැස් කෙරෙයි; **තෙන**, ඒ හේතුවෙන්; **අපායං**, නිරයට; **ගච්ඡති**, යේ;

**තස්මා**, එහෙයින්; **ඉච්ඡා** ච, කැමැත්තත්; **ලොභං ච**, ලෝභයත්; **අවිජ්ජා** ච, අවිද්‍යාවත්; **විරාජයං**, දුරු කෙරෙමින්; **විජ්ජං**, විද්‍යාව; **උප්පාදයං**, උපදවන්නාවූ; **භික්ඛු**, මහණ තෙම; **සබ්බා දුග්ගතියො**; සියලු දුෂ්චරිත සඞ්ඛ්‍යාත දුර්ගති; **ජහෙ**, දුරු කරන්නේ ය;

**භාවය**:- සුගම යි.

**ධර්‍ම විස්තර**:-

**අවිජ්ජා පුබ්බඞ්ගමා** —

සහජාත වශයෙන් හා උපනිඃශ්‍රය වශයෙන් ද යි මේ දෙයාකාරයෙන් ම අවිද්‍යාව අකුසල් රැස්කිරීමට මුල්වෙයි. අවිද්‍යායෙන් හෙවත් නොදැනීමෙන් තොරව අකුසලයක් නොඋපදී. කුසල් අකුසල් දෙකම රැස්කිරීමට අවිද්‍යාව ප්‍රධාන වන හෙයින් "අවිජ්ජා පච්චයා සඞ්ඛාරා" යි වදාළහ.

අවිද්‍යාව යම් තැනෙක නම් අහිරික අනොත්තප්ප ආදි අකුසල් ද ඒ හා සමගම ඇතිවීම සහජාත වශයෙන් සිදු වන්නකි. බලවත් ලෙසින් උපකාර වන ධර්මයට උපනිඃශ්‍රය යයි කියනු ලැබේ.

**තුන් වන සූත්‍ර විවරණය යි.**

## 2 – 2 – 4

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති** මෙ සුතං.

තෙ භික්ඛවෙ සත්තා සුපරිහීනා, යෙ **අරියාය පඤ්ඤාය පරිහීනා;** තෙ දිට්ඨෙව ධම්මෙ දුක්ඛං විහරන්ති සවිඝාතං සඋපායාසං සපරිළාහං කායස්සභෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා, තෙ භික්ඛවෙ සත්තා අපරිහීනා යෙ අරියාය පඤ්ඤාය **අපරිහීනා;** තෙ දිට්ඨෙවධම්මෙ සුඛං විහරන්ති අවිඝාතං අනුපායාසං අපරිළාහං; කායස්ස භෙදා පරම්මරණා සුගති පාටිකඞ්ඛාති,

එතමත්ථං භගවා අවොච, තත්ථේතං ඉති වුච්චති.

"පඤ්ඤාය පරිහානෙන පස්ස ලොකං සදෙවකං
නිවිට්ඨං නාමරූපස්මිං ඉදං සච්චන්ති මඤ්ඤති,

පඤ්ඤා හි සෙට්ඨා ලොකස්මිං යා'යං නිබ්බෙධගාමිනී
යාය සම්මා පජානාති ජාති භව පරික්ඛයං
තෙසං දෙවා මනුස්සා ච සම්බුද්ධානං සතීමතං
පිහයන්ති හාසපඤ්ඤානං සරීරන්තිමධාරින'න්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

## 2 – 2 – 4

**අර්ථය:–**

යෙ, යම්කෙනෙක්; **අරියාය පඤ්ඤාය,** ආර්‍යවූ ප්‍රඥයෙන්; **පරිහීනා,** පිරිහුණාහු ද; **තෙ සත්තා,** ඒ සත්වයෝ; **සුපරිහීනා,** හොඳටම පිරිහුණාහු ය; **තෙ,** ඔවුහු; **දිට්ඨෙවධම්මෙ,**

ඉහාත්මයෙහිම; **සවිඝාතං**, දුක් සහිත වූ; **සඋපායාසං**, බලවත් වෙහෙස සහිත වූ; **සපරිළාහං**, දැවිලි සහිත වූ; **දුක්ඛං විහරන්ති**, දුක සේ වෙසෙත්; **දුග්ගති**, දුගති තොමෝ;

**පඤ්ඤාය**, විදර්ශනාප්‍රඥා මාර්ගප්‍රඥා යන දෙදෙනාගේ; **පරිහානෙන**, පිරිහීමෙන් යුක්තවූ, **නාමරූපස්මිං**, නාම රූ දෙක්හි; **නිවිට්ඨං**, මමය මාගේ යයි (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) ගැලුණු; **සදෙවකං ලොකං**, දෙවියන් සහිත ලෝකය; **පස්ස**, බලව; **ඉදං සච්චං ඉති**, මෙය ම ඇත්තය යි; **මඤ්ඤති**, හඟී යි;

**යා අයං පඤ්ඤා**, යම් මේ ප්‍රඥාවක්; **නිබ්බෙධගාමිනී**, නිවනට පමුණුවන්නී ද; **පඤ්ඤා**, ඒ ප්‍රඥා තොමෝ; **ලොකස්මිං**, ලෝකයෙහි; **සෙට්ඨා හි**, ශ්‍රෙෂ්ඨ වන්නීම ය; **යාය**, යම් ප්‍රඥාවකින්; **සම්මා**, මනාකොට; **ජාති භව පරික්ඛයං**, ජාති සංසාරයාගේ අවසානය වූ නිවන; **පජානාති**, දනී ද එහෙයිනි;

**සතිමතං**, සිහියෙන් යුක්තවූ; **හාසපඤ්ඤානං**, ප්‍රඥා බහුලත්වයට පැමිණි; **සරිරන්තිමධාරිනං**, පශ්චිම ශරීරය දරන්නාවූ; **සම්බුද්ධානං**, චතුස්සත්‍යාවබෝධය කළ; **තෙසං**, ඒ ක්ෂීණාශ්‍රවයන්ට; **දෙවා**, දෙවියෝ ද; **මනුස්සා ච**, මනුෂ්‍යයෝ ද; **පිහයන්ති**, කැමැතිවෙත්;

භාවය:- සුගම යි.

**ධර්ම විස්තර**:-

**අරියාය පඤ්ඤාය පරිහීනා** —

යම් කෙනෙක් විදර්ශනා ප්‍රඥාවෙන් හා මාර්ග ප්‍රඥාවෙන් පිරිහෙත් නම් ඔවුහු පඤ්චස්කන්ධයෙහි ඇතිවීම හා නැතිවීමත් දෙක නොදන්නා හෙයින් අන්තිමට ම පිරිහෙන්නෝ වෙත්.

චතුස්සත්‍යාවබෝධයෙන් තොර බැවින් කෙලෙසුන්ගෙන් ද දුරු නොවෙත්. ලෞකික ලොකොත්තර සම්පත්තියෙන් අතිශයින් ම පිරිහෙත්.

ඔවුහු කවරහු ද යත්? කර්මාවරණයෙන් යුක්තවූවෝ යි. කම්මාවරණ කිලෙසාවරණ විපාකාවරණ යයි ආවරණයෝ තිදෙනෙකි. පඤ්චානන්තර්‍ය්‍ය කර්මය කළෝ කර්මාවරණයෙන් යුක්තවූවෝ ය. නියත මිථ්‍යාදෘෂ්ටිකයෝ කිලෙසාවරණයෙන් යුක්තවූවෝ ය. අහේතුක ප්‍රතිසන්ධිය ලැබූවෝ විපාකාවරණයෙන් යුක්තවූවෝ ය. මේ තුන් පක්ෂය ම ආර්‍ය්‍ය ප්‍රඥායෙන් පිරිහුණු බැවින් මාර්‍ගඵලාවබෝධයක් ඔවුනට නැත. ඔවුහු මරණින් මතු දුගතියෙහි උපදනා බැවින් "දුග්ගති පාටිකංඛා" යි වදාළහ.

**ඉදං සච්චන්ති මඤ්ඤන්ති** —

නාමරූප දෙක්හි තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් ත්‍රිවිධ මඤ්ඤනායෙන් යුක්ත පුද්ගලයෝ "ඉදමෙව සච්චං, මොඝ මඤ්ඤං" ඇත්ත මෙයම ය, අනික් සියල්ල හිස්වූ ප්‍රලාප යයි සිතති.

**නිබ්බෙධගාමිනී පඤ්ඤා** —

ආර්‍ය්‍ය මාර්‍ගාධිගමයට හේතු වූ ප්‍රඥාව මෙනමින් හඳුන්වනු ලැබේ. ලොභ, ද්වෙෂ, මොහ සංඛ්‍යාත අකුසලයන් විනාශ කරන හෙයින් ආර්‍ය්‍යමාර්‍ගයට, නිබ්බෙධ ය යි කියනුලැබේ. විදර්‍ශනායෙහි නාමරූප ධර්‍මයන් කෙරෙහි කලකිරීම ඇති කරවන අර්හත්ඵල විමුක්තියට උපනිඃශ්‍රය වූ නිබ්බිදා සහගත සංඥා මනස්කාරයන්ගේ පැවැත්මෙන් නිවන කරා පමුණුවන ප්‍රඥාවට **නිබ්බෙධගාමිනී පඤ්ඤා** යයි කියනු ලැබේ.

**සතර වන සූත්‍ර විවරණය යි.**

## 2 - 2 - 5

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං

වෙමෙ භික්ඛවෙ සුක්කා ධම්මා ලොකං පාලෙන්ති, කතමෙ වෙ? හිරි ච ඔත්තප්පං ච ඉමෙ වෙ භික්ඛවෙ සුක්කා ධම්මා ලොකං න පාලෙය්‍යුං, නයිධ පඤ්ඤායෙථ මාතාති වා මාතුච්ඡාති වා මාතුලානීති වා ආචරියභරියාති වා ගරූනං දාරාති වා සම්භෙදං ලොකො අගමිස්ස; යථා අජෙළකා කුක්කුටසූකරා සොණසිඟාලා යස්මා ච ඛො භික්ඛවෙ ඉමෙ වෙ සුක්කා ධම්මා ලොකං පාලෙන්ති, තස්මා පඤ්ඤායති මාතාති වා මාතුච්ඡාති වා මාතුලානීති වා ආචරියභරියාති වා ගරූනං දාරානි'වා'ති එතමත්ථං භගවා අවොච, තත්ථෙ'තං ඉති වුච්චති.

"යෙසං වෙ හිරිඔත්තප්පං සබ්බදා ච න විජ්ජති
වොක්කන්තා සුක්කමූලා තෙ ජාති මරණ ගාමිනො
යෙසං වෙ හිරිඔත්තප්පං සදා සම්මා උපට්ඨිතා
විරූළ්හ බ්‍රහ්මචරියා තෙ සන්තො ඛීණා පුනබ්භවා'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

## 2 - 2 - 5

**අර්ථය:-**

**ඉමෙ ද්වෙ සුක්කා ධම්මා**, මේ ශුක්ලධර්මයෝ දෙදෙන; **ලොකං පාලෙන්ති**; ලොව රකිත්; **හිරි ච**, පාපයෙහි ලජ්ජාව ද; **ඔත්තප්පං**, පාපයෙහි භය ද යන දෙක යි. **ලොකං න පාලෙය්‍යුං**, ලොව නොරකිත් නම්; **ඉධ**, මේ ලෝකයෙහි; **මාතා ඉති වා**, මේ මව යයි කියා හෝ; **මාතුච්ඡා**, මේ සුළු මව යයි කියා හෝ; **මාතුලානීති වා**, මේ නැන්දණියයි කියා හෝ; **ආචරිය භරියා ඉති වා**, ගුරුවරයාගේ භාර්‍ය්‍යාව කියා හෝ; **ගරූනං දාරා ඉති වා**, ගරු කටයුත්තන්ගේ භාර්‍ය්‍යාවෝ යයි කියා හෝ; **න පඤ්ඤායෙථ**, නොපෙනෙන්නේ ය; **ලොකො**, ලෝ වැසි තෙම; **අජෙළකා**; එළුවන් හා

තිරෙළුවෝ ද; **කුක්කුටසූකරා**, කුකුළන් හා ඌරෝ ද; **සොණසිගාලා**, බල්ලන් හා සිවල්ලු ද; **සඨා**, යම් සේ ද; එපරිද්දෙන්; **සම්භෙදං**, සංකරයට නොහොත් මර්‍යාදාභෙ-දයට; **අගමිංසු**, පැමිණෙන්නේ ය; **යස්මා ච ඛො**, යම් හෙයකින් වනාහි-පෙ-**පඤ්ඤායන්ති**, පෙනේ.

භාවය:- සුගම යි.

**ධර්මවිස්තර**:-

**සුක්කා ධම්මා** —

මෙහි ශුක්ලත්වය ගණන් ගත යුත්තේ වර්ණ වශයෙන් නොව චිත්තපාරිශුද්ධිය වශයෙනි. සියලු කුශල ධර්මයෝ සිත පිරිසුදු කරන හෙයින් ද, සිත බබුලුවන හෙයින් ද, පාප නම් වූ කෘෂ්ණත්වයට ප්‍රතිපක්ෂ හෙයින් ද, ශුක්ල නම් වෙත්.

**හිරි ඔත්තප්පං** —

අකුසල් කිරීමෙහි උපදනා ලජ්ජාව හිරිය යි. භය ඔත්තප්පය යි. තමා ගැන සිතීමෙන් හිරියත් ලෝකය ගැන සිතීමෙන් බියත් ඇතිකර ගත යුතු යි. හ්‍රීය හෙවත් ලජ්ජාව ආත්මාධිපති ධර්මයකි. අපත්‍රපාව හෙවත් ඔත්තප්පය ලෝකාධිපති ධර්මයකි. ලජ්ජා ගතිය හිරිය යි. බිය ගතිය ඔත්තප්පය යි.

හිරිය සතර කාරණයකින් උපදවා ගත යුතුය. ජාතිය ගැන සැලකීමෙන් හෝ වයස ගැන සැලකීමෙන් හෝ දක්ෂ කම ගැන සැලකීමෙන් හෝ බහුශ්‍රැත කම නැතහොත් උගත්කම ගැන සැලකීමෙන් ඇතිකර ගත යුතුය. පව් කම් කිරීම නම් හීන ජාතිකයන්ට මුත් ජාති සම්පන්නයන්ට අයත් වැඩක් නොවේ ය යි ද, කොල්ලන්ට මුත් වැඩිහිටියන්ට අයත් වැඩක් නොවේ ය යි ද, දුර්වලයන්ට මුත් දක්ෂයන්ට අයත් වැඩක් නොවේ ය යි ද, අනුවණයන්ට මුත් නුවණ

ඇත්තන්ට අයත් වැඩක් නොවේ ය යි ද මෙසේ කල්පනා කොට පව් කිරීමෙහි ලජ්ජාව ඇතිකර ගත යුතු හෙයින හිරිය අජ්ඣත්ත සමුට්ඨාන හෙවත් තමන් සලකා නැගෙන ගුණයකි. මෙසේ ආත්මාධිපතිත්වය සලකා අකුසල් දුරු කෙරෙයි. කුසල් වඩයි. වැරදි වූ දේ දුරු කෙරෙයි. නිවරද වූ දේ වඩයි. තෙමේ පිරිසිදු වූ ජීවිතයක් ගත කෙරෙයි.

ඔත්තප්පය ලෝකාධිපති ධර්මයකි. ලෝකයා ගැන සලකා තෙමේ පව් නොකෙරෙයි. මේ මහත් වූ ලෝක සන්නිවාසයෙහි දිවැස් ඇති පරසිත් දන්නා සෘද්ධිමත් මහණ බමුණන් ද ඇත. ඔවුහු දුර සිටම තමාව දකිත්. ළංව සිටින ඔවුහු තම හට නො පෙනෙත්. ඔවුන්ගේ සිත් වලින් තමාගේ සිතිවිලි දනිත් යයි මෙසේ ලෝකය ගැන සලකා අකුසල් දුරු කරන හෙයින් ඔත්තප්පය ලොකාධි-පතිය වේ. පව් කිරීමෙහි ස්වභාවයෙන් පිහිටි ලජ්ජාවත් අපායභය ගැන සැලකීමත් යන මේ කරුණු දෙකම පව් දුරු කිරීමෙහි ඉවහල් වෙත්.

මෙයට උපමාවක් නම් යගුළි දෙකක් ගැන සැලකූ කල එකක් සිහිල් ය. එහෙත් අසූචියෙන් වැකුණේ ය. එකක් ගිනි ගෙන දිළියෙන යවටෙකි. මෙයින් නුවණ ඇත්තේ අසූචියෙන් තැවරුණු හෙයින් සිහිල් වූ යගුළිය ද නො අල්ලයි. දැවට බියෙන් අනික් යගුළිය ද නො ගනියි. මෙසේ ඥණවන්ත පුද්ගල තෙම ලජ්ජාවෙන් පිළිකුල් කෙරෙමින් ද පව් නො කෙරෙයි. අපාබියෙනුදු පව් නො කෙරෙ යි.

ඇතැම් පුද්ගලයෙක් ජාති මහත්ව ප්‍රත්‍යවෙක්ෂායෙන් හෙවත් තමන්ගේ ජාති කුල පුත්‍ර භාවය හෝ ආචාර කුල පුත්‍ර භාවය ගැන සැලකීමෙන් හෝ ශාස්තෘන් වහන්සේගේ ගුණ මහත්වය ගැන සැලකීමෙන් හෝ තමන්ට ලැබුණු ශාසනදායාද නම්වූ සප්තාර්‍ය්‍යධන දායාදය ගැන සැලකීමෙන්

හෝ දුර්ලභ වූ පැවිද්දෙහි උතුම් ලාභය ගැන සැලකීමෙන් හෝ නැතහොත් තමාගේ සිල්වත් ගුණවත් ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් ගැන ද සෙසු සිල්වතුන් ගැන ද සැලකීමෙන් හෝ මෙසේ මේ කරුණුවලින් ලජ්ජාව උපදවා ගෙන පව් නොකෙරෙයි.

ඇතැම් පුද්ගලයෙක් **අත්තානුවාද** භය හෙවත් තමා ගැනම තමන් විවේකව සිතන කල තමන් වරදක් කළ කෙනෙකැයි තමාගේ සිතට තමා විසින් ම චෝදනා කරනු ලැබීමෙන් තමාට ඇතිවන බිය, අාත්මානුවාද බියනම් වේ.

**පරානුවාද** භය, නම් තමා කළ වරද දැනගත් ලෝකයාගෙන් තමාට ලැබෙන නින්දා අපහාස කථා හේතුකොට ගෙන ඇතිවන බිය යි **දණ්ඩ** භය, නම් වරද කළවුන්ට ලැබෙන දඬුවම් දැක තමනුත් එසේ දඬුවම් ලැබීමට සුදුස්සෙකැ යි සිතීමෙන් ඇතිවන බිය යි **දුග්ගති** භය, නම් මරණින් මතු තමාට ලැබෙන සතර අපායාදී දුක් ගැන සැලකීමෙන් ඇතිවන බිය යි මෙකී කරුණු වලින් පව් කිරීමෙහි භය උපදවා ගැන්ම නුවණැත්තන් අයත් යුතුකමෙකි.

සැකෙවින් කියතොත් තමාගේ ම වරද නිසා තමාට ම ඇතිවන බිය **අත්තානුවාද භය** නමින් ද, තමාගේ වරද නිසා ලෝකයාගේ අවඥයෙන් හෙවත් අවමන් කිරීමෙන් ඇතිවන බිය **පරානුවාද භය** නමින් ද, දණ්ඩණයෙන් හා තර්ජනයෙන් ඇතිවන බිය **දණ්ඩභය** නමින් ද, මරණින් මතු ලැබෙන දුගතිය ගැන සැලකීමෙන් ඇතිවන බිය **දුගීති** භය නමින් ද සැලකිය යුතු යි.

තුන් වන සූත්‍රයෙන් දැක්වූ අහිරිකය නම් පාපයෙහි ලජ්ජා නැති බව හා අනොත්තප්පය නම් පවට භය නැති බවය යි මේ සූත්‍රයෙහි කෘෂ්ණපක්ෂ ධර්ම වශයෙන් සැලකිය යුතු.

**පස් වන සූත්‍ර විවරණය යි**

## 2 - 2 - 6

**වුත්තං හෙතං භගවතා වුත්ත'මරහතානි මෙ සුතං**

අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසඞ්ඛතං; **නො** චෙදං භික්ඛවෙ අභවිස්ස අජාතං අභූතං අකතං අසංඛතං; නයිධ ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස **නිස්සරණං** පඤ්ඤායෙථ, යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි අජාතං අභූතං අකතං අසඞ්ඛතං තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස **නිස්සරණං** පඤ්ඤායතීති. එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"ජාතං භූතං සමුප්පන්නං කතං සඞ්ඛත මද්ධුවං
ජරා මරණ සඞ්ඝාතං රොගනිඩ්ඩං පභඞ්ගුරං
ආහාර නෙත්තිප්පභවං නාලං තදභිනන්දිතුං
තස්ස නිස්සරණං සන්තං අතක්කාවචරං ධුවං
අජාතං අසමුප්පන්නං අසොකං විරජං පදං
නිරොධො දුක්ඛධම්මානං සඞ්ඛාරූපසමො සුඛො"

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

## 2 - 2 - 6

**අර්ථය:-**

**අජාතං**, හෙතුප්‍රත්‍යය ආදී ප්‍රත්‍යය සමවායයෙන් නූපන්; අභූතං, අකතං, අසඞ්ඛතං, යනු ද පර්‍යාය වචන යි. (වස්තුවක් මෙන් පහළ නොවූ කිසිහෙතුවකින් නොකරන ලද නාමරූපයන් මෙන් සකස් නොවූ යන අර්‍ථයි) නිවනක්; අත්ථි ඇත. **එතං**, යනු, **අජාතං අභූතං අකතං අසඞ්ඛතං**, යන පදයන් හා සම්බන්ධ කටයුතුයි, මේ නිවනක්; **නො චෙ අභවිස්ස**, ඉදින් නොවන්නේ නම්; **ඉධ**, මේ ලෝකයෙහි; **ජාතස්ස**, හෙතුප්‍රත්‍යයෙන් හට ගත්තා වූ; **භූතස්ස**, **කතස්ස**, **සඞ්ඛතස්ස**, යනු ද පර්‍යාය වචන යි. **නිස්සරණං**, අපගමයක් නොහොත් නොපැවැත්මක් **න පඤ්ඤායෙථ**, නො පෙනෙන්නේය. සෙස්ස සුගම යි.

**ජාතං,** උපන්නා වූ; **භූතං,** හටගත්තා වූ; **සමුප්පන්නං,** උපන්නා වූ; **කතං,** ප්‍රත්‍යයන් විසින් කරන ලද; **සඞ්ඛතං,** ඔවුන් විසින්ම සකස් කරන ලද; **අද්ධුවං,** අස්ථිර වූ; **ජරාමරණසඞ්ඝාතං,** ජරා මරණයන්ගෙන් උපදනා වූ; **රොගනිඩ්ඩං,** නානාවිධ රෝගයන්ට වාසස්ථානයක් වූ; **පභඞ්ගුරං,** බිඳෙනසුලු වූ;

**ආහාරනෙත්තිප්පභවං,** චතුර්විධ ආහාරයන්ගෙන් හා තෘෂ්ණා සඞ්ඛ්‍යාත නෙත්තියෙන් පහළ වූ; **තං,** ඒ උපාදනස්කන්ධ පඤ්චකය; **අභිනන්දිතුං,** තෘෂ්ණා දෘෂ්ටි දෙකෙන් අස්වාද කරන්ට; **න අලං,** සුදුසු නොවේ. **තස්ස,** ඒ පඤ්චස්කන්ධයාගේ; **නිස්සරණං,** නිර්ගමය වූ; **සන්තං,** ශාන්ත වූ; **අතක්කාවචරං,** තර්ක ඥානයෙන් බැසගත නොහැකි වූ; **ධුවං,** ස්ථිර වූ;

**අජාතං,** හට නොගත්තා වූ; **අසමුප්පන්නං,** නූපන්නාවූ; **අසොකං,** ශෝක හේතූන් නැත්තා වූ; **විරජං,** රාගාදි කෙලෙස් රජස් නැති, **පදං,** සසර දුක් නැති කරගනු කැමැත්තවුන් විසින් පිළිපැදිය යුතු වූ; **දුක්ඛධම්මානං,** දුඃඛස්වභාවයන්ගේ; **නිරොධො,** වැලැක්ම වූ; **සඞ්ඛාරූපසමො,** සංස්කාරයන්ගේ සංසිඳීම් සඞ්ඛ්‍යාත වූ නිවන; **සුඛො,** සැපවේ.

**භාවය:–** සුගම යි.

**ධර්මවිස්තර:–**

**අජාතං අභූතං අකතං අසඞ්ඛතං,**

එක් දවසක් අප භාග්‍යවතුන් වහන්සේ නොයෙක් පරිද්දෙන් සසර දෙස් වදාරා නිවන් ඇසුරු කොට දෙසූ ධර්මකථායෙහි භික්ෂූන්ට මෙබඳු අදහසක් ඇති විය. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සංසාර ප්‍රවෘත්තිය අවිද්‍යාදි හෙතුඵල ධර්මයන් ගෙනහැර දක්වමින් සකාරණව වදාරන ලද්දේය. සංස්කාරයන්ගේ සංසිඳීමවූ නිවන ගැන

කිසිවක් නොවදාරන ලද්දේය. අහේතුක වූ ඒ මේ නිවන සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් කෙසේ ලැබෙන්නේ ද යන මේ පරිවිතර්කය යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ගේ විමතිය දුරු කිරීම පිණිසත්, නිවනය නිවනය යනු වචන මාත්‍රයෙක. එය නොලැබෙන සවභාවය ඇති ධර්මයක් හෙයින් පරමාර්ථ වශයෙන් නිවනක් නැතැයි වරදවා සලකන්නවුන්ගේ මිථ්‍යාමතයන් ඛණ්ඩනය කිරීම පිණිසත්, පරමාර්ථ වශයෙන් නිවනක් ඇති බව දක්වනු පිණිසත්, කාමාදි කෙලෙශයන්ගේ නිශ්‍රීමය එහි සත්‍යය බවත් ප්‍රීතිවේගයෙන් ප්‍රකාශ කරනු පිණිස මේ සූත්‍රය වදාළ සේක.

"අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසඞ්ඛතං" යන මේ වචනවලින් පරමාර්ථ වශයෙන් නිවනක් ඇති බව වදාරා "නොචෙතං භික්ඛවෙ" යන ආදීන් එයට හෙතු දක්වූහ. සැකෙවින් එහි අදහස මෙසේයි. අජාතාදි සවභාව ඇති අසඞ්ඛත ධාතුවක් හෙවත් නිවනක් නැත් නම් මේ ලෝකයෙහි ඉපදීම් සවභාවය ඇති සංස්කාරස්කන්ධයාගේ නිරුද්ධවීමක් නොලැබේ. නිවන් අරමුණු කොට ගෙන පවත්නාවූ සම්මාදිට්ඨි ආදි ආර්‍යමාර්ගාඞ්ග ධර්මයන් සර්වප්‍රකාර යෙන් කෙලෙසුන් විනාශ කරන හෙයින් සියලු සංසාර දුඃඛයාගේ අප්‍රවෘත්ති නම් වූ නිවනක් ඇති බව එයින් පෙනේ.

යම්හෙයකින් අප්‍රත්‍යය ධර්ම අසංස්කෘත ධර්ම ඇද්ද එහෙයින් "අත්ථි භික්ඛවෙ තදායතනං. යත්ථ නෙව පඨවි" — "ඉදංපි ඛො ඨානං දුද්දසං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො" — "අසඞ්ඛතං ච වො භික්ඛවෙ ධම්මං දෙසෙස්සාමි අසඞ්ඛතගාමිණිං ච පටිපදං" යන ආදි නොයෙක් සූත්‍ර කොටස් වලින් ද "අත්ථි භික්ඛවෙ අජාතං" යනාදි මේ සූත්‍රයෙන් ද පරමාර්ථ වශයෙන් නොහොත් නිත්‍ය වශයෙන් නිර්වාණ ධාතුවක් ඇතිබව සර්වඥයන් වහන්සේ විසින් වදාරන ලදී. එහෙයින් නිවනක් නැතැයි ප්‍රතික්ෂෙප නොකළ යුතු යි.

අප්‍රත්‍යක්‍ෂවූ නිවන ඇති පෘථග්ජන ඥානවන්තයන්ට පවා නිවනෙහි සැකයක් හෝ විමතියක් නැත. යම් අබුද්ධි මත් පුද්ගලයෝ වෙත් නම් ඔවුන්ගේ විමති විනෝදනය සඳහා මේ විනිශ්චය කරනු ලැබේ. කාමයන් මධුර කොට පිළිගැනීමේ ආස්වාදයක් ඇත. එය සුඛ සෞමනස්‍ය දෙදෙනා අයත් වේ. රූපාදි අරමුණු ඉෂ්ට වශයෙන් සලකනු ලබන්නේ මේ නිසා ය. එසේම කාමයන්ගේ ආදීනවයකුදු ඇත. එහෙයින් කාමයෝ අනිත්‍යයහ, දුක්හ, වෙනස්වන ගතියෙන් යුක්තයහ. එසේ නම් කාමයන්ගේ නිර්ගමයකුදු හෙවත් ප්‍රහාණයකුදු ඇතිවිය යුතුය. ඒ නම් ආර්‍ය්‍යමාර්ගයෙන් ප්‍රත්‍යක්‍ෂ කළයුතු නිවන යි. මෙයට අසඞ්ඛත ධාතුයයි ද කියනු ලැබේ.

සංස්කාරයන් අරමුණු කොට උපදනා විදර්ශනා ඥානය ද එහි කෙළවර වූ අනුලෝමඥානය ද කෙලෙසුන් සහමුලින්ම නැතිකිරීමෙහි නොපොහොසත් වෙති. එසේම සම්මුති සත්‍යය වූ පෘථිව්‍යාදි අරමුණු ඇසුරු කොට උපදනා ප්‍රථම ධ්‍යානාදි කුසල් සිත් ද විෂ්කම්භන වශයෙන් කෙලෙසුන් මැඩලීම මුත් සමුච්ඡේද වශයෙන් කෙලෙසුන් නැති කිරීමෙහි අසමර්ථ වෙත්. මේ දෙකටම වෙනස් වූ ආර්‍ය්‍යමාර්ගඥානයෙන් ම කෙලෙසුන්ගේ සමුච්ඡේද ප්‍රහාණය හෙවත් සහමුලින්ම සංසිඳවීම ඇතිවිය යුතුය.

ඒ ආර්‍ය්‍යමාර්ගඥානයන්ට අරමුණු වූ අසඞ්ඛත ධාතුව නිවන යයි කියනු ලැබේ. එහෙයින් "අත්‍ථි භික්ඛවෙ අජාතං" යනාදියෙන් පරමාර්ථ වශයෙන් නිර්වාණයාගේ අස්තිත්වය ප්‍රකාශ කරන ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් යමක් වදාරන ලද නම් එහි වෙනස් නොවන අර්ථය පරමාර්ථ නම් වේ. **උදාන පාළියෙහිද** මේ සූත්‍රය මෙසේ ම ආයේ ය.

**සවන සූත්‍ර විවරණය යි**

## 2 - 2 - 7

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

ද්වෙමා භික්ඛවෙ නිබ්බානධාතුයො කතමා ද්වෙ? **සඋපාදිසෙසා ච නිබ්බානධාතු අනුපාදිසෙසා ච නිබ්බානධාතු** කතමා ච භික්ඛවෙ සඋපාදිසෙසා නිබ්බානධාතු? ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො තස්ස තිට්ඨන්තෙව පඤ්චින්ද්‍රියානි; යෙසං අවිඝාතත්තා මනාපා මනාපං පච්චනුභොති; සුඛං දුක්ඛං පටිසංවෙදෙති; තස්ස යො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො; අයං වුච්චති භික්ඛවෙ සඋපාදිසෙසා නිබ්බානධාතු.

කතමා ච භික්ඛවෙ අනුපාදිසෙසා නිබ්බාන ධාතු? ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තස'දත්ථො පරික්ඛීණ භවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො තස්ස ඉධෙව භික්ඛවෙ සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීති භවිස්සන්ති. අයං වුච්චති භික්ඛවෙ අනුපාදිසෙසා නිබ්බානධාතු එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"දුවෙ ඉමා චක්ඛුමතා පකාසිතා
නිබ්බානධාතු අනිස්සිතෙන තාදිනා
එකා හි ධාතු ඉධ දිට්ඨධම්මිකා
සඋපාදිසෙසා භවනෙත්ති සඞ්ඛයා
අනුපාදිසෙසා පන සම්පරායිකා
යම්හි නිරුජ්ඣන්ති භවානි සබ්බසො,
යෙ එතදඤ්ඤාය පදං අසඞ්ඛතං
විමුත්තචිත්තා භවනෙත්තිසඞ්ඛයා
තෙ ධම්මසාරාධිගමා ඛයෙ රතා
පහංසු තෙ සබ්බ භවානි තාදිනො"ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

## 2 - 2 - 7

අර්ථය:-

**නිබ්බාන ධාතුයො**, නිර්වාණ ධාතූහු; **ඉමා ද්වෙ**, මොහු දෙදෙනෙකි. **සඋපාදිසෙසා ච නිබ්බානධාතු**, පඤ්චස්කන්ධය සෙස ව තිබියදී කෙලෙසුන් පමණක් දුරුකිරීමෙන් ලබන නිවන ය. **අනුපාදිසෙසා ච නිබ්බානධාතු**, උපාදි සෙස නොවූ නිවනය යන දෙක යි. **අරහං හොති**, රහත් වේ ද; **ඛීණාසවො**, දුරු කරනලද කෙලෙස් ඇත්තේ ද; **වුසිතවා**, වැස නිමවූ වස් ඇත්තේ ද; **කතකරණීයො**, සතර මාර්ගයෙන් කරනලද කටයුතු ඇත්තේවේ ද; **ඔහිතභාරො**, බහාතබනලද කෙලෙස්බර ඇත්තේ ද; **අනුප්පත්ත සදත්ථො**, පැමිණි ස්වාර්ථය ඇත්තේ වේ ද; **පරික්ඛීණභව සංයොජනො**, ක්ෂයකරනලද භවබන්ධන ඇත්තේ වේ ද; **සම්මදඤ්ඤා විමුත්තො**, මනාකොට දැන කෙලෙසුන්ගෙන් මිදුනේ වේ ද; **තස්ස**, ඒ රහතන් වහන්සේට; **පංචින්ද්‍රියානි**, චක්ෂුරාදී පඤ්චෙන්ද්‍රියයෝ; **තිට්ඨන්ති එව**, පවතිත්ම ය. **යෙසං**, යම් ඉන්ද්‍රියයන්; **අවිඝාතත්තා**, විනාස නොවූ බැවින් නොහොත් නිරුද්ධ නො වූ බැවින්; **මනාපාමනාපං**, ඉෂ්ටවූ ද අනිෂ්ටවූ ද; **සුඛදුක්ඛං**, සැප දුක; **පච්චනුභොති**, විඳී නොහොත් ලබයි. **පටිසංවෙදෙති**, යනු ද මේ අර්ථමැයි. **තස්ස**, ඒ රහතන් වහන්සේගේ; **යො රාගක්ඛයො**, යම් රාගය දුරුකිරීමෙක් වේ ද; **දොසක්ඛයො**, ද්වේෂය දුරු කිරීමක් වේ ද; **මොහක්ඛයො**, මෝහය දුරු කිරීමක් වේ ද; **තස්ස**, ඒ රහත්හුගේ; **ඉධ එව**, මේ ආත්මභාවයෙහිම; **සබ්බවෙදයිතානි**, සියලු අව්‍යාකෘත වේදනාවෝ; **අනභිනන්දිතානි**, තෘෂ්ණාදියෙන් ප්‍රීණිත නොවූවාහු; **සීතිභවිස්සන්ති**, සිහිල් වෙත්. නොහොත් අප්‍රතිසඞ්ඛ්‍යා නිරෝධයෙන් නිරුද්ධ වෙත්.

**චක්ඛුමතා**, පසැස් ඇති; **අනිස්සිතෙන**, තෘෂ්ණා දෘෂ්ටි දෙක ඇසුරු නොකළාවූ; **තාදිනා**, තාදී ගුණයෙන් සපිරවූ තථාගතයන් වහන්සේ විසින්; **ඉමා ද්වෙ නිබ්බානධාතු**,

මේ නිර්වාණධාතු දෙකක්; **පකාසිතා**, ප්‍රකාශ කරන ලද්දාහුය. **එකා හි ධාතු**, එක නිර්වාණධාතුවක්; **ඉධ දිට්ඨධම්මිකා**, මේ අත්බැව්හි වන්නී ය. **භවනෙත්තිසංඛයා**, තණ්හාව දුරු කිරීමෙන්; **සඋපාදිසෙසා**, සඋපාදිසෙස නම් වන්නීය. **යම්හි**, යම් නිවනෙක්හි; **සම්පරායිකා**, මත්තෙහි වූ; **භවානි**, භවයෝ; **සබ්බසො**, සර්වාකාරයෙන්; **නිරුජ්ඣන්ති**, නිරුද්ධ වෙත් ද; (ඕතොමෝ) **අනුපාදිසෙසා**, අනුපාදිශෙෂ නම් වන්නී ය.

**යෙ**, යම් කෙනෙක්; **එතං අසංඛතං පදං**, මේ නිර්වාණ පදය; **අඤ්ඤාය**, දැන; **භවනෙත්තිසඞ්ඛයා**, තෘෂ්ණාව දුරු කිරීමෙන්; **විමුත්තචිත්තා**, කෙලෙසුන්ගෙන් මිදුණු සිත් ඇත්තෝ වෙත් ද; **ධම්මසාරාධිගමා**, අවබොධ කළ අර්හත්වය ඇති; **ඛයෙ**, නිවනෙහි; **රතා**, ඇලුණාවූ; **තාදිනො**, ස්ථිර ගුණ ඇති; **තෙ**, ඔව්හු; **සබ්බභවානි**, සියලු භවයෝ; **පහංසු**, දුරුකළාහු ය. **පහංසු තෙ**, යන තන්හි; **තෙ**, යනු නිපාත මාත්‍ර යි.

**භාවය**:– සුගම **යි**.

**ධර්මවිස්තර**:–

**සඋපාදිසෙස – අනුපාදිසෙස නිබ්බානධාතු**

"චතූහි උපාදානෙහි උපාදියතීති **උපාදි**, පඤ්චක්ඛන්ධ-ස්සෙතං අධිවචනං, උපාදියෙව සෙසො කිලෙසෙහීති උපාදිසෙසො, සහ උපාදිසෙසෙන වත්තතීති සඋපාදිසෙසා, සා එව නිබ්බාන ධාතූති සඋපාදිසෙසා නිබ්බානධාතු, නත්ථි උපාදිසෙසො එතිස්සාති අනුපාදිසෙසා – සා එව නිබ්බාන ධාතූති අනුපාදිසෙසා නිබ්බානධාතු" යනු විග්‍රහ යි.

කාමුපාදානාදි සතර උපාදානයන්ගෙන් ගනු ලැබේ නු යි උපාදි නම්වේ. පඤ්චස්කන්ධයට මේ නමෙකි. කෙලෙසුන් කෙරෙන් උපාදියම ශෙෂවූයේ උපාදිසෙස යි. උපාදිසෙසය හා සමග පවත්නී නු යි සඋපාදිසෙස නමි. ඕ තොමෝ

නිර්වාණධාතුව වූයේ නුයි සඋපාදිසෙස නිබ්බානධාතු නම්වේ. මේ නිර්වාණ ධාතුවට උපාදිශෙෂයක් නැත් නු යි. අනුපාදිශෙෂ නම්. ඕතොමෝම නිර්වාණධාතු වූයේ නු යි අනුපාදිසෙස නිබ්බානධාතු නම් වේ.

පඤ්චස්කන්ධය ශෙෂව තිබියදී කෙලශපරිනිර්වාණයට හේතු වූයේ සොපාදිසෙස නිබ්බාධාතු නමැයි ද ස්කන්ධශෙෂය නොතබාම පිරිනිවීම රහතුන් වහන්සේලාගේ පරිනිර්වාණය නුයි අනුපාදිසෙස නිබ්බානධාතු නමැයි ද සැලකිය යුතුයි.

“වානං වුච්චති තණ්හා, නික්ඛන්තං වානතො, නත්ථි වා එත්ථ වානං, ඉමස්මිං වා අධිගතෙ වානස්ස අභාවොති නිබ්බානං, තදෙව නිස්සත්ත නිජ්ජීවට්ඨෙන සභාව ධාරණ-ට්ඨෙන ච ධාතු ති නිබ්බානධාතු, යනු අටුවා හෙයින් තණ්හාවට වාන යයි කියනු ලැබේ. එයින් නික්මුණේනු යි ද මෙහි තණ්හාවක් නැත්නු යි ද නිවන් අවබොධ වූ කල්හි තණ්හාව නැතිවන හෙයින් ද නිබ්බාන නම් වේ. එයම නිස්සත්ව නිජ්ජීවාර්ථයෙන් හෙවත් සත්ත්ව පුද්ගල වශයෙන් ගැන්මක් නැති හෙයින් හා ස්වභාවයෙන් දැරීම් අර්ථයක් ඇති හෙයින් ද ධාතු වූයේනු යි නිබ්බානධාතු නම්.

ඒ නිවනෙහි පරමාර්ථ වශයෙන් භෙදයක් වෙනසක් නැතත් ව්‍යවහාර කිරීම් වශයෙන් වෙනසක් ඇතිබව දක්වනු සඳහා “ද්වෙමා භික්ඛවෙ නිබ්බානධාතුයො” යී වදාළහ.

කෙලෙසුන් දුරුකළ හෙයින් **අර්හත්** යී ද; කාමාදි චතුරාශ්‍රවයන් දුරුකළ හෙයින් **ඛීණාසව** යයි ද, ගරුකට යුත්තන් හා එක්ව විසීමෙහි ද ආර්‍ය්‍ය මාර්ගයෙහි හා දස ආර්‍ය්‍ය වාසයන්හි පරිචිත ගුණ ඇති හෙයින් **වුසිතවන්ත** යයි ද, කල්‍යාණ පෘථග්ජනයාගේ පටන් සත්වැදෑරුම් ශෛක්‍ෂ පුද්ගලයන් සතර මාර්ගයෙන් කළයුතු දෙය අවසන් නොවූව ද රහතන් වහන්සේ ඒ සියලු කටයුතු අවසන් කළ හෙයින් දුක නැති කිරීම පිණිස මත්තෙහි ඉපදවිය යුතු මාර්ග

එලයක් උන්වහන්සේට නැති හෙයින් **කතකරණීය** යයි ද ස්කන්ධභාර ක්ලේශභාර අභිසංස්කාරභාර යන ත්‍රිවිධභාරයන් බහා තබන ලද හෙයින් **ඔහිතභාර** යයි ද, සදර්ථය නොහොත් ස්වාර්ථයවූ අර්හත්වය තමා විසින් උපදවා ගතයුතු පරමාර්ථය වශයෙන් සලකා අවබෝධ කළ හෙයින් **අනුප්පත්ත සදත්ථ** යයි ද, කාමරාග සංයෝජනාදි භවසංයෝජනයන් දුරුකළ හෙයින් **පරික්ඛීණභවසංයොජන** යයි ද, ස්කන්ධයන්ගේ රාශ්‍යර්ථය ආයතනයන්ගේ රැස්කිරීම් අර්ථය ධාතූන්ගේ ශූන්‍යාර්ථය දුඃඛයාගේ පීඩනාර්ථය සමුදයාගේ ප්‍රභවාර්ථය නිරෝධයාගේ ශාන්ත්‍යර්ථය මාර්ගයාගේ දර්ශනාර්ථය හා සියලු සංස්කාර ධර්මයෝ ඇතිව නැතිවන හෙයින් අනිත්‍යයහයි තීරණ පරිඥයෙන් පිරිසිඳ දැන සියලු කෙලෙසුන්ගෙන් මිදුණු හෙයින් චිත්තවිමුක්තියෙන් හා නිර්වාණ විමුක්ති-යෙන් ද යුක්ත හෙයින් **සම්මදඤ්ඤාවිමුත්ත** යයි ද කියනු ලැබේ.

**තිටඨනෙනව පඤ්චින්ද්‍රියානි**:–

පශ්චිම භවයෙහි උත්පත්තියට හේතුවූ කර්මය නොගෙවෙන තාක් චක්ෂුරාදි පංචඉන්ද්‍රියයෝ රහතුන්ට ද විද්‍යමාන වෙති. එසේ ද වුවත් ඉෂ්ටානිෂ්ට අරමුණු ගැන්ම දුරුකළ හෙයින් ඔව්හු විප්‍රසන්නම වෙත්. චිත්තොප ක්ලේශයන් දුරුකිරීමම උපාදිශේෂ පරිනිර්වාණයෙහි විශේෂ ලක්ෂණය වේ.

**සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතිභවිස්සන්ති**:–

රහතන් වහන්සේ කුසලාකුසල වේදනාවන් රහත් මඟින්ම දුරුකළ හෙයින් උන්වහන්සේලා කෙරෙහි පවත්නේ අව්‍යාකෘත වේදනාව පමණෙකි. උන්වහන්සේ සංස්කාරදරථයන් සංසිඳුවූ හෙයින් සිහිල් ගුණ ඇතිසේක. එසේම නැවත පිළිසිඳීමක් නොමැතිව කළුරිය කළ හෙයින් එයට අප්පටිසඞ්ඛානිරෝධයයි ද කියනු ලැබේ. මේ **අනුපාදිශේෂ පරිනිර්වාණ යයි**.

**සත්වන සූත්‍ර විවරණය යි**.

## 2 - 2 - 8

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

පටිසල්ලානාරාමා භික්ඛවෙ විහරථ පටිසල්ලානරතා අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තා අනිරාකතජ්ඣානා විපස්සනාය සමන්නාගතා බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං, පටිසල්ලානාරාමානං භික්ඛවෙ විහරතං පටිසල්ලානරතානං අජ්ඣත්තං චෙතොසමථ මනුයුත්තානං අනිරාකතජ්ඣා-නානං විපස්සනාය සමන්නාගතානං බ්‍රෑහෙතානං සුඤ්ඤ-ගාරානං ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං, **දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා ති**

එතමත්ථං භගවා අවොච, තත්ථේතං ඉති වුච්චති.

"යෙ සන්තචිත්තා නිපකා සතිමන්තො ච ඣායිනො
සම්මා ධම්මං විපස්සන්ති කාමෙසු අනපෙක්ඛිනො
අප්පමාදරතා සන්තා පමාදෙ භයදස්සිනො
අභබ්බා පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙ'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

## 2 - 2 - 8

**අර්ථය:-**

**පටිසල්ලානාරාමා**, කායවිවේකයෙහි ඇලුණු සිත් ඇති ව; පටිසල්ලානරතා යනු ද මේ අර්ථය මැ යි. **විහරථ**, වාසය කරව්; **අජ්ඣත්තං**, තමාගේ; **චෙතොසමථමනුයුත්තා**, චිත්ත සමථයෙහි යෙදුණාහු; **අනිරාකතජ්ඣානා**, නොනසන ලද ධ්‍යාන ඇත්තාහු; නොහොත් සත්වැදෑරුම් අනුපස්සනා වත්ගෙන් යුක්තවූවාහු; **සුඤ්ඤාගාරානං**, ශූන්‍යාගාර සේනාසනයන්; **බ්‍රෑහෙතා**, වඩන්නාහු; විහරථ යනු හා සම්බන්ධ යි. සෙසු අර්ථ සුගම යි. **ද්වින්නං ඵලානං**, දෙවැදෑරුම් ඵලයන් අතුරෙන්; **අඤ්ඤතරං ඵලං**, එක්තරා ඵලයක්; **පාටිකඞ්ඛං**, කැමැතිවිය යුතුයි. **දිට්ඨෙවධම්මෙ**,

ඉහාතමයෙහි ම; **අඤ්ඤා**, රහත්ඵලය හෝ; **උපාදි සෙසෙ සති**, නවත් කෙලෙසුන් ඉතිරිව ඇති කල්හි; **අනාගාමිතා**, අනාගාමි ඵලය වේ.

**යෙ**. යම් යෝගාවචර කෙනෙක්; **සන්තචිත්තා**, තදඞ්ග වශයෙන් හෝ විෂ්කම්භන වශයෙන් සන්හුන් සිත් ඇත්තාහු ද; **නිපකා**, කමටහන් පුරුදු කරන ප්‍රඥාවෙන් යුක්තවූවාහු ද; **සතිමන්තො** ච, ස්ථාන නිෂද්‍යාදි ඉරියව්වල කමටහන අත්නොහරින සිහියෙන් යුක්ත වූවාහු ද; **ඣායිනො**, ආලම්බනොපනිධ්‍යාන ලක්ෂණූපනිධ්‍යානයන් ගෙන් ධ්‍යායීහු වෙත් ද; **කාමෙසු අනපෙක්ඛිනො**, කාම යන්හි අපෙක්ෂා රහිත වූ ඔවුහු; **සම්මා**, මනාකොට, **ධම්මං**, පඤ්චස්කන්ධ කොට්ඨාශය; **විපස්සන්ති**, අනිත්‍යාදි වශයෙන් භාවනා කෙරෙත්;

**අප්පමාදරතා**, උක්තප්‍රකාර සමථවිදර්ශනා භාවනාවන්හි අප්‍රමාදව ඇලුණාවූ; **සන්තා**, ශාන්ත වූ නොහොත් "අප්පමාදරතා සන්තා" යි එකටගෙන අප්‍රමාදව ඇලුණා වූ යි ද අර්ථ ගත හැකි ය. **පමාදෙ භයදස්සිනො**, නිරයෙහි උපද වන ප්‍රමාදයෙහි භය දක්නාවූ ඔවුහු; **පරිහානාය**, සමථ විදර්ශනා වශයෙන් හෝ මාර්ගඵල වශයෙන් පිරිහීමට **අභබ්බා**, නුසුදුසු වෙත්; **නිබ්බානස්ස**, අනුපාදා පරිනිර්වාණ යාගේ; **සන්තිකෙ එව**, සමීපයෙහි ම වේ.

**භාවය** — සුගම යි.

**ධර්මවිස්තර**:-

**පටිසල්ලානාරාමා පටිසල්ලානරතා**:-

ඵලසමවතෙහි සිත ඇලීම පටිසල්ලානාරාම නම් වේ. පටිසල්ලානරත යනු ද මෙය ම ය. මෙය ගණසඞ්ගනිකා යෙන් වෙන්ව හෙවත් සමූහයා හා එක්ව විසීමෙන් වෙන්ව තමන් එකලාව විසියයුතු ය. විවේකව හිඳීමට සුදුසු සෙනසුනක් පිළියෙළ කරගැනීම සුදුසු ය. කායවිවේකය මෙයින් ඇති වෙයි.

ජාගරියානුයෝගය හෙවත් නිදිවර්ජිත කිරීම ය; සීල සංවරය, ඉන්ද්‍රියයන් ගොපනය කරගැනීම ය, වැළඳීමෙහි පමණ දැනීම ය, සතිසම්පජඤ්ඤයෙන් හෙවත් සිහි නුවණින් යුක්ත වීම ය. යන මේ කරුණුවලින් වෙන්ව පටිසල්ලාන යෙහි නොයෙදිය හැකි ය. ඒ ඒ මාර්ගඵල ලාභී ආර්‍ය්‍යයන් තම තමන් ලත් ඵලසමාපත්තියට සමවැදීම ද මෙහි ම ඇතුළත් වෙයි.

**බ්‍රෑහෙතාරො සුඤ්ඤාගාරානං:-**

මෙහි ශුන්‍යාගාර නම් යොගාවචරයාහට සිත එකඟ කොට ගෙන භාවනාකිරීමට සුදුසු විවේකස්ථානයෝ ය. "සො විවිත්තං සෙනාසනං භජති, අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං" යනුවෙන් වදාළ පරිදි භාවනානුයොගීන්ට සුදුසු සෙනසුන් නවයෙකි. වනාන්තරය, ගස්මුල්ය, පර්වතය, කඳුරැළිය, ගල්ගෙවල්ය, සොහොනය, වනපත්ථය, හෙවත් ගමින් ඉතා දුරවූ සෙනසුනය. (මෙය ග්‍රාමාන්තය ඉක්ම වූ මනුෂ්‍යොපචාරය නැති හෙවත් මිනිසුන් නොහැසිරෙන තැන සඳහා කියන ලදි.) අභ්‍යවකාශය හෙවත් එළිමහන් තැනය. පිදුරුබිස්සය යන මේ ස්ථාන නවය යි.

එක්මහල් දෙමහල් ප්‍රාසාදයන්හි හෝ හිඳ සමථ විදර්ශනා වශයෙන් කමටහන් ගෙන භාවනානුයොගයෙහි යෙදෙන යොගාවචරයෝ ද ශුන්‍යාගාර නම් වූ විවේක සෙනසුන් ඇසුරුකොට ධ්‍යාන විදසුන් වඩන්නෝ වෙති යි සැලකිය යුතු යි.

මෙහි "පටිසල්ලානාරාමා භික්ඛවෙ විහරථ පටිසල්ලාන රතා" යනුවෙන් දක්වනලද පටිසල්ලානාරාමය පිරිසිදු සිල් ඇත්තහුට මිස දුසිල්හට නොවේ. හෙතෙම ඉෂ්ට වූ රූපාදි අරමුණු දැකත් එහි සිත නො අලවන හෙයින් ඔහුගේ සීලවිසුද්ධිය මෙයින් ප්‍රකාශ වේ. "අජ්ඣත්තං චෙතො

සමථමනුයුත්තා අනිරාකතජ්ඣානා" යන මේ පද දෙකෙන් සමාධිභාවනාව ද "විපස්සනාය සමන්නාගතා" යන මෙයින් ප්‍රඥාභාවනාව ද කියනලදනු යි ලෞකික ත්‍රිවිධ ශික්‍ෂාවම දක්වනලදී.

මේ යොගාවචරයා මේ ලොකයේදීම රහත්ඵලය හෝ මුළුමනින්ම ක්ලේශප්‍රහාණය නොකොළොත් අනාගාමි ඵලය හෝ ලබනබව "ද්වින්නං ඵලානං–පෙ–සති වා උපාදිසෙසෙ අනාගාමිතා" යන්නෙන් ප්‍රකාශ වේ.

**අටවෙනි සූත්‍ර විවරණය යි.**

## 2 – 2 – 9

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

සික්ඛානිසංසා භික්ඛවෙ විහරථ පඤ්ඤුත්තරා විමුත්තිසාරා සතාධිපතෙය්‍යා, සික්ඛානිසංසානං භික්ඛවෙ විහරතං පඤ්ඤුත්තරානං විමුත්තිසාරානං සතාධිපතෙය්‍යානං ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං **දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා සති වා උපාදිසෙසෙ අනාගාමි'තා'ති**.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති,

"පරිපුණ්ණසෙඛං අපහානධම්මං
පඤ්ඤුත්තරං ජාතිඛයන්තදස්සිං
තං වෙ මුනිං අන්තිමදෙහධාරිං
මානංජහං බ්‍රෑමි ජරාය පාරගුං

තස්මා සදා ඣානරතා සමාහිතා
ආතාපිනො ජාතිඛයන්ත දස්සිනො
මාරං සසෙනං අභිභුය්‍ය භික්ඛවො
භවත්ථ ජාතිමරණස්ස පාරගා'ති.

අයංපි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

**අර්ථය:-**

**සික්ඛානිසංසා,** ත්‍රිවිධ ශික්‍ෂාවෙහි අනුසස් දත්තාහු; **පඤ්ඤුත්තරා,** අධිප්‍රඥශික්‍ෂා සඞ්ඛ්‍යාත ප්‍රඥව ප්‍රධාන කොට ඇත්තාහු; **විමුත්තිසාරා,** අර්හත්ඵල සඞ්ඛ්‍යාත විමුක්තිය සාර වශයෙන් සලකත්තාහු; **සතාධිපතෙය්‍යා,** සතර සතිපට්ඨානයෙහි පිහිටුවා ගත් සිහි ඇත්තාහු; **විහරථ,** වාසය කරව්. සෙස්ස සුගම යි.

**පරිපුණ්ණ සික්ඛං,** රහත්ඵලයට පැමිණීම සඳහා පිරි පුන් ශික්‍ෂා ඇති; **අපහානධම්මං,** නොපිරිහුණු ගුණදහම් ඇති; **පඤ්ඤුත්තරං,** විශිෂ්ට ප්‍රඥ ඇති, **ජාතික්ඛයන්ත දස්සිං,** උත්පත්තියගේ කෙළවර වූ නිවන දක්තාවූ; **අන්තිමදෙහ ධාරිං,** පශ්චිම ශරීරය දරන්තාවූ; **මානංජහං,** නවවිධ මානය දුරුකළාවූ; **ජරාය පාරගුං,** ජරාවගේ කෙළවරවූ නිවනට පැමිණියා වූ; **තං,** ඔහු; **වෙ,** එකාන්තයෙන්; **මුනිං,** මුනිය යි; **බ්‍රෑමි,** කියමි.

**තස්මා,** එහෙයින්; **සදා,** හැමකල්හි; **ඣානරතා;** ධ්‍යානයෙහි ඇලුණු; **සමාහිතා,** එකග වූ සිත් ඇති, **ආතාපිනො,** කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇති; **ජාතික්ඛයන්ත දස්සිනො,** නිවන් දක්නා කැමැත්තාවූ; **භික්ඛවො,** භික්‍ෂූහු; **සසෙනං මාරං,** කෙලෙස් මර සෙනග; **අභිභුය්‍ය,** මැඩ; **ජාතිමරණස්ස,** උත්පත්ති මරණයාගේ; **පාරගා භවථ,** පරතෙරට නොහොත් නිවනට පැමිණෙත්තෝ වව්.

**භාවය:-** සුගම යි.

**ධර්මවිස්තර:-**

**සික්ඛානිසංසා,**

හික්මවියයුතු හෙයින් ශික්‍ෂා නමු එය අධිසීල, අධිචිත්ත, අධිප්‍රඥ වශයෙන් තුන්වැදෑරුම් වේ. මෙයින් ලාභ සත්කාර කීර්ති ප්‍රසංශාදිය ලැබීම මෙහි මුඛ්‍යවූ අනුසස නොවේ.

**පඤ්ඤුත්තරා විමුත්තිසාරා සතාධිපතෙය්‍යා** යනුවෙන් දැක්වූයේ ශික්ෂානෘශංසයෝ යි. ඒ ත්‍රිවිධ ශික්ෂාවන් අතුරෙහි අධිප්‍රඥා ශික්ෂා සංඛ්‍යාත විදර්ශනා මාර්ගඵල ප්‍රඥාවෝම අග්‍රයහ. අර්හත්ඵල සංඛ්‍යාත විමුක්තියම සාරත්වයෙන් ගෙන සිටිය හෙයිනි.

සතර සතිපට්ඨානයන්හි පිහිටුවාගත් සිහිය සමථ විදර්ශනා භාවනාවන් වැඩීමට උපකාර වේ. **ජෙට්ඨකරණට්ඨෙන** සති අධිපතෙය්‍යං එතෙසන්ති සතාධිපතෙය්‍යා, අධිපතියෙව ආධිපතෙය්‍යන්ති කත්වා, චතූසු සතිපට්ඨානෙසු පතිට්ඨිතචිත්තා කායානුපස්සනාදිමුඛෙන සමථ විපස්සනා භාවනානුයුත්තාති අත්ථො” යනු **අටුවා** යි.

**මාරං සසෙනං අභිභුය්‍යා:**

ස්කන්ධමාර, ක්ලේශමාර, මෘත්‍යුමාර, අභිසංස්කාර මාර යයි මාරයෝ සතර දෙනෙකි. අනුන්ගේ ගුණ නැසීමෙහි සියලුම කෙලෙස් දෙවපුත්‍රමාරයාට ද සහාය වන බැවින් මෙහි දෙවපුත්‍ර මාරයාත් සමග මරහු පස්දෙනෙකි අනන්ත වූ නානා ප්‍රකාර රෝගාබාධයෝ මෘත්‍යුමාරයාගේ යහළුවෝ ය.

එහෙයින්,

“කාමා තෙ පඨමා සෙනා – දුතියා අරති වුච්චති
තතියා ඛුප්පිපාසා තෙ – චතුත්ථි තණ්හා පවුච්චති

පඤ්චමී ථිනමිද්ධං තෙ – ඡට්ඨා භීරූ පවුච්චති
සත්තමී විචිකිච්ඡා තෙ – මක්ඛොථම්භො ච අට්ඨමො

ලාභො සිලොකො සක්කාරො–මිච්ඡාලද්ධො ච යො යසො
සො චත්තානං සමුක්කංසෙ – පරෙ ච අවජානති

එසා නමුචි තෙ සෙනා – කණ්හස්සාභිප්පහාරිනී
න තං අසූරො ජිනාති – ජෙත්වා ච ලභතෙ සුඛං”

පළමුවන සේනාව පඤ්චකාමයෝය. දෙවැන්න අරති නම් වූ භාවනායෙහි නො ඇල්මය; තෙවැන්න බඩගින්න හා පිපාසය; සතර වැන්න තෘෂ්ණාවය; පස්වැන්න ථීන මිද්ධය හෙවත් සිත්හි පසුබටකම හා ශරීරයෙහි ගිලන් බවය; සවැන්න යමකට නැති ගැන්මය; සත්වැන්න විචිකිච්ඡාව නම් වූ සැකය; අටවැන්න ගුණමකුකම හා සිත්හි තද ගතිය; නවවැන්න මිථ්‍යාමාර්‍ගී වලින් ලබන ලාභ, කීර්ති සත්කාර, ප්‍රශංසාය; දසවැන්න අත්තුක්කංසන (තමා උසස් කොට පෙන්වීම හා) පරවම්භන (අනුන් පිරිහෙළීම) යන මොහු යි. මේ සෙනඟ පාපයට අනුබල දෙන්නාහු වෙති. අදක්ෂයකුට නම් මොවුන් පැරදවිය නොහැකිය. දක්ෂ තැනැත්තේ කෙලෙසුන් පරදවා සැප ලබන්නෙක් වෙයි.

එහෙයින්,

අජ්ජෙව කිච්චමාතප්පං – කො ජඤ්ඤා මරණං සුවෙ
නහි නො සංගරං තෙන – මහාසෙනෙන මච්චුනා

අද අදම කටයුතු කළ යුතුයි. හෙට තමාට මරණය සිදු වේ දැ යි කවරෙක් දනී ද? ඒ මහාසෙනගක් ඇති මාරයා හා අපගේ හාදකමක් නැත යනු භාව යි.

**නවවෙනි සූත්‍ර විවරණය යි.**

## 2 – 2 – 10

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

ජාගරො චස්ස භික්ඛවෙ භික්ඛු විහරෙය්‍ය. සතො සම්පජානො සමාහිතො පමුදිතො විප්පසන්නො ච; තත්ථ කාලවිපස්සී ච කුසලෙසු ධම්මෙසු, ජාගරස්ස භික්ඛවෙ භික්ඛුනො විහරතො සතස්ස සම්පජානස්ස පමුදිතස්ස විප්පසන්නස්ස තත්ථ කාලවිපස්සිනො කුසලෙසු ධම්මෙසු ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං **දිට්ඨෙ'ව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා'ති** එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"ජාගරන්තා සුණාථෙතං යෙ සුත්තා තෙ පබුජ්ඣථ
සුත්තා ජාගරිතං සෙය්‍යෝ 'නත්ථි ජාගරතො භයං

යො ජාගරො ච සතිමා සම්පජානො
සමාහිතො මුදිතො විප්පසන්නො ච,
කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො
එකොදිභූතො විහනෙ තමං සො

තස්මා හවෙ ජාගරියං භජෙථ
ආතාපි භික්ඛු නිපකො ඣානලාභී
සංයොජනං ජාති ජරාය ඡෙත්වා
ඉධෙව සම්බොධි' මනුත්තරං ඵුසෙ'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සු'ත'න්ති

## 2 - 2 - 10

අර්ථය:

**භික්ඛු**, මහණතෙම; **ජාගරො අස්ස**, නිදි දුරු කරන්නෙක් ම වන්නේය. **සතො**, සිහි ඇතිව; **සම්පජානො**, නුවණ ඇතිව; **සමාහිතො**, එකඟසිත් ඇතිව; **පමුදිතො**, සතුටු සිත් ඇතිව; **විප්පසන්නො**, පහන් සිත් ඇතිව, **විහරෙය්‍ය**, වාසය කරන්නේය; **තත්ථ**, එකල්හි නොහොත් ඒ කර්මස්ථානානුයොගයෙහි; **කුසලෙසු ධම්මෙසු**, නිරවද්‍ය වූ බොධ්‍යඞ්ග ධර්මයන් කෙරෙහි; **කාල විපස්සිච හොති**, කාලානුරූප විදර්ශකයෙක් වන්නේය. (මෙහි සෙසු අර්ථ සටහාව මෙයට අනුරූප වශයෙන් ගත යුතුයි.)

**එතං** (මාගේ) මේ වචනය; **ජාගරන්තා**, (ප්‍රමාද නිද්‍රාවෙන් හා අවිද්‍යා නිද්‍රාවෙන්) නිදි වර්ජිත කිරීමෙහි යෙදුණාවූ තෙපි; **සුණාථ**, අසව්; **යෙ**, යම් කෙනෙක්; **සුත්තා**, නිද්‍රොපගත වූහු නම්; **තෙ**, ඒ (තෙපි); **පබුජ්ඣථ**, අවදිවව්; **සුත්තා**, නින්දට වඩා; **ජාගරනං**, නිදි වර්ජිත කිරීම; **සෙය්‍යො**, උතුම් වේ; **ජාගරිතං**, ජාගර්‍යානුයොගයෙහි යෙදෙන්නහුට, **භයං**, ආත්මානුවාද බියක්; **නත්ථි**, නැත්තේ ය;

**යො** යමෙක්; **ජාගරො** ච, නිදි වර්ජිත කිරීමෙහි යෙදුණේ වේ ද; **සතිමා**, සිහි ඇත්තේ වේ ද; **සම්පජානො**, නුවණ ඇත්තේ වේ ද; **සමාහිතො**, එකඟ වූ සිත් ඇත්තේ වේ ද; මුදිතො, ප්‍රතිපත්තියෙහි අනුසස් රැකීමෙන් සතුටු වේ ද; **විප්පසන්නො**, (ත්‍රිවිධ ශික්ෂායෙහි හා ප්‍රතිපත්තිදෙශක ශාස්තෲන් වහන්සේ කෙරෙහිද්‍ද ශ්‍රද්ධා බහුලත්වයෙන්) පහන් සිත් ඇත්තේ වේ ද; **කාලෙන**, සුදුසු කාලයෙහි; (සො යනු නිපාත යි) **ධම්මං**, විදර්ශනාවට අරමුණු වූ; ත්‍රෛභූමක සංස්කාරය; **සම්මා**, නිබ්බිදා විරාග සංඛ්‍යාත යහපත් නුවණින්; **පරිවීමංසමානො**, විදසුන් නුවණින් මොනවට විමසන්නා වූ, **එකොදිභූතො**, මාර්ග සමාධියෙන් එකඟ වූ සිත් ඇති; **සො**, ඒ ආර්‍යශ්‍රාවක තෙම; **තමං**, අවිද්‍යාන්ධකාරය; **විහනෙ**, (අර්හත්මාර්ග ඥානයෙන්) දුරු කරන්නේ ය;

**තස්මා**, එහෙයින්; **ආතාපී**, කෙලෙසුන් තවන වීර්‍ය ඇති; **නිපකො**, නුවණ ඇති; **ඣානලාභී**, ධ්‍යානගුණලාභී; **භික්ඛු**, මහණතෙම; **භවෙ**, ඒකාන්තයෙන්; **ජාගරියං**, ජාගර්යය හෙවත් නිදි වර්ජිත කිරීම; **භජෙථ**, සෙවුණේ ය; **ජාති ජරාය**, ජාති ජරා දුක් දුරු කරනු සඳහා; **සංයොජනං**, දශවිධ සංයෝජනය; **ඡෙත්වා**, සිඳ; **ඉධ එව**, මේ ලෝක-යෙහිදී ම; **අනුත්තරං සම්බොධිං**, උතුම් වූ සම්බෝධිය හෙවත් අර්හත් ඵලය; **ඵුසෙ**, ස්පර්ශ කරන්නේ ය, නොහොත් අර්හත් ඵලයට පැමිණෙන්නේ ය;

**භාවය**:- සුගම යි.

**ධර්මවිස්තර**:-

**ජාගරො**:-

රෑ දවල් දෙක්හි නිදි දුරු කොට කමටහන් වැඩීමෙහි යෙදෙන යෝගාවචර තෙම ජාගර්යයෙහි යෙදුණු තැනැත්තෙක් වෙයි.

"කථඤ්ච භික්ඛවෙ භික්ඛු පුබ්බරත්තාපරරත්තං ජාගරියානුයොගමනුයුත්තො හොති" යනාදීන් ජාගර්යානු යෝගය **අටුවාවෙහි** මෙසේ විස්තර වේ යි.

දවල් කාලය සක්මන් කිරීමෙන් හා හිඳීමෙන් ද, රාත්‍රියෙහි ප්‍රථමයාමයත් එසේ ම ද, මධ්‍යම යාමයෙහි දකුණැලයට හැරී දකුණුපයෙහි වම් පය මඳක් මෑත් කොට තබා සිහි නුවණින් යෙදී උත්ථාන සංඥව මෙනෙහි කොට සැතපීම ද, රාත්‍රි පශ්චිම යාමයෙහි අවදිව සක්මන් කිරීමෙන් හා හිඳීමෙන් නීවරණයන්ගෙන් සිත පිරිසුදු කොට ගෙන විසීම ද, ජාගර්යානුයෝග නම් වෙයි. "සතො සම්පජානො" යන ආදි වචනවලින් සතර සතිපට්ඨාන ගත සිහිය හා අභික්කන්තාදි සත් තැනක යෙදෙන චතුර්විධ සම්ප්‍රජන්‍යයෙන් යුක්ත බව ප්‍රකාශ වෙයි.

**කාලවිපස්සී ච කුසලෙසු ධම්මෙසු:**

කමටහන් වැඩීමෙහි යෙදුණු යෝගාවචර තෙමේ කාලය සලකා විදසුන් වැඩිය යුතුය. **විසුද්ධි මාර්ගයෙහි** විස්තර වූ පරිදි නාම රූප ධර්මයන් කලාප කලාප වශයෙන් නුවණින් සලකන යෝගාවචර තෙමේ ආවාසාදි සත් වැදෑරුම් අගෝචර සෙනසුන් දුරු කොට ගොචර සෙනසුන් ඇසුරු කෙරෙමින් අතරෙහි නො නවත්වා කමටහනෙහි යෙදූ සිත් ඇතිව සිතෙහි ඇතිවන එකඟබව සලකමින් අනිච්චානුපස්සනාදිය වැඩිය යුතුයි.

යම් කලෙක්හි විදර්ශනා චිත්තයෙහි හටගත් මැලිකමක් වේ නම් එකල ධම්මවිචය විරිය පීති යන බොජ්ඣඞ්ග තුනෙන් එකක් ද, සිතෙහි නොසන්සුන් බවක් වේ නම් පස්සද්ධි සමාධි උපෙක්ඛා යන බොධ්‍යඞ්ගත්‍රයෙන් එකක් ද යි මෙසේ කාලානුරූපව වැඩිය යුතුයි. සතිය සෑම තන්හි ම ප්‍රයෝජනවත් වේ.

**ජාගරස්ස භික්ඛවෙ භික්ඛුනො:–**

නින්ද දුරු කොට සිහි නුවණින් යෙදුණු භික්ෂුව සිතේ සතුට හා ශ්‍රද්ධාවත් උපදවන්නේය. තරුණ විපස්සනාව ඉක්මවා බලවත්විපස්සනා අවස්ථාවට පැමිණිය හැකි ද වෙයි. එසේ මුහුකුරා ගිය විදර්ශනාවට කාලවිපස්සනා නමැ යි කියනු ලැබේ. මෙසේ දශවිධ විදර්ශනොපක්ලේශයන් ගෙන් මිදුණු විදර්ශනා වීථියට පිළිපන් තියුණු කාල විදර්ශකයාහට උදාර වූ චිත්තප්‍රමොදයක් හටගනියි.

එහෙයින්:–

“යතො යතො සම්මසති-ඛන්ධානං උදයබ්බයං
ලභතෙ පීති පාමොජ්ජං – අමතං තං විජානතං
පාමොජ්ජබහුලො භික්ඛු – පසන්නො බුද්ධසාසනෙ
අධිගච්ඡෙ පදං සන්තං – සඞ්ඛාරූපසමං සුඛං”

“යම් යම් කලෙක්හි (හෙවත් අටතිස් අරමුණෙන් එක්තරා අරමුණෙක්හි පිරියම් කරන මහණතෙම පෙරවරු පස්වරු ආදි වූ යම්කිසි කලෙක්හි) රූපාදි පඤ්චස්කන්ධයන් ගේ (අවිජ්ජා සමුදයා රූපසමුදයො යනාදි පස්විසි ආකාරයකින්) උදය ද, (අවිජ්ජා නිරොධා රූපනිරොධො යන ආදි පස්විසි ආකාරයකින්) ව්‍යය ද, සම්මර්ශනය කෙරේ ද හෙවත් සලකා ද, එකල්හි (මෙසේ සමපනස් ආකාරයෙන් ස්කන්ධයන්ගේ උදය ව්‍යය සලකන මහණ) යම් ධර්මප්‍රීතියක් ධර්මප්‍රමෝදයක් ලබා ද නාමරූප ධර්මයන් ප්‍රකට ව වැටහෙන කල්හි උපන්නා වූ ඒ ප්‍රීති ප්‍රමොදය නුවණැත්තවුන් අමෘත මහා නිර්වාණයට පමුණුවන හෙයින් අමෘත නම් වේ.

පියෙවින් ම බුදුන් වහන්සේ කෙරෙහි සන්තෝෂ බහුල වූ බුදුන්ගේ අනුශාසනායෙහි ප්‍රසන්න වූ මහණ තෙම සියලු සංස්කාරයන් සන්සිඳු වන්නා වූ එහෙයින් ම ඒකාන්ත සුවවූ අත්‍යන්ත ශාන්ත වූ නිර්වාණයට පැමිණෙන්නේ” යි යනු **ධම්මපද පුරාණ සන්න සි.**

**සම්මා ධම්මං පරිවීමංසමානො - එකොදිභූතො:-**

විදර්ශනාවට අරමුණුවූ ත්‍රෛභූමක ධර්මයන් කෙරෙහි නිර්බ්බිදනය හෙවත් කළකිරීම ය, විරාගය හෙවත් නො ඇලීම ය, යන මේ අවස්ථාවන් පහළවනතුරු නුවණින් සැලකීම මෙයින් අභිප්‍රෙත යි. යම් ගුණයක් ශ්‍රෙෂ්ඨව පහළ වේ නම් ඒ සමාධියට එකොදිය යි කියනු ලැබේ. ඒ එකොදිය මොහුට ඇත්තු යි එකොදිභූත නම්.

"එකො සෙට්ඨො හුත්වා උදෙතීති එකොදි, සමාධි; සො එකොදි භූතො ජාතො උප්පන්නො එතස්සාති එකොදි භූතො" යනු විග්‍රහ යි.

"ආහිතො අග්ගි යෙන සො ආහිතග්ගි"[1]

යන මේ සමාස වාක්‍යයෙහි ආහිත ශබ්දය පරවිශෙෂණත්වයෙන් ගෙන අග්‍යාහිතො යනු සිද්ධවූවාක් මෙනි.

"එකොදිං වා භූතො පත්තොති එකොදිභූතො" යනු ද විග්‍රහ හෙයින් සමාධිගත වූයේනු යි ද එකොදිභූත නම්. මෙහි "එකොදි" යන්නෙන් මාර්ග සමාධිය දක්ව යි. "සමාහිතො" යන්නෙන් පාදකධ්‍යාන සමාධි නම් වූ චතුර්ථධ්‍යාන සමාධිය සමග විපස්සනා සමාධිය ප්‍රකාශිත ය. "කාලෙන" යන්නෙන් මාර්ග ප්‍රතිවෙධ කාලය දක්ව යි. "සම්මා ධම්මං පරිවීමංසමානො" යනු පරිඥ අභිසමයාදි වශයෙන් මනාකොට චතුස්සත්‍යය විමසමින් යන අර්ථ යි. 'එකොදි'යන්නෙන් සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යය කියැවෙ යි. එසේකල "සො එකොදිභූතො ජාතොති එකොදිභූතො" යනුවෙන් වාක්‍ය ගතයුතු.

**දහවෙනි සූත්‍ර විවරණය යි.**

## 2 - 2 - 11

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

ද්වෙ මෙ භික්ඛවෙ ආපායිකා නෙරයිකා ඉදමප්පහාය කතමෙ ද්වෙ? යො **අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරී පටිඤ්ඤො**, යො ච පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරන්තං **අමූලකෙන අබ්‍රහ්මචරියෙන අනුද්ධංසෙති** ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ අපායිකා නෙරයිකා ඉදමප්පහායාති එතමත්ථං භගවා අවොච තත්ථේ'තං ඉති වුච්චති.

අභූතවාදී නිරයං උපෙති යොචාපි කත්වා නකරොමි චාහ
උභොපි තෙ පෙච්ච සමා භවන්ති
නිහීනකම්මා මනුජා පරත්ථ

කාසාවකණ්ඨා බහවො පාපධම්මා අසඤ්ඤතා
පාපා පාපෙහි කම්මෙහි නිරයං තෙ උපපජ්ජරෙ
සෙය්‍යො අයො ගුළො භුත්තො තත්තො අග්ගිසිඛූපමො
යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො රට්ඨපිණ්ඩං අසඤ්ඤතො'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති,

## 2 - 2 - 11

**අර්ථය**:-

**ඉදං අප්පහාය**, මේ මතු කියනු ලබන දෙවැදෑරුම් පාපසමාචාරය අත් නොහැර; **ඉමෙ ද්වෙ**, මේ දෙකරුණ; **ආපායිකා**, අපායට පමුණුවන්නාහු ය; **නෙරයිකා**, නිරයට පමුණුවන්නාහු ය; **යො**, යමෙක්; **අබ්‍රහ්මචාරී**, ශ්‍රෙෂ්ඨ පැවතුම් ඇත්තේ; **බ්‍රහ්මචාරී පටිඤ්ඤො**, මම බ්‍රහ්ම-චාරීයෙමි යි ප්‍රතිඥා ඇත්තේ වේ ද; **යොච**, යමෙක්; **පරිපුණ්ණං**, සම්පූර්ණ වූ; **පරිසුද්ධං**, පිරිසුදු වූ; **බ්‍රහ්මචරියං**, බඹසරවස; **චරන්තං**, පුරන්නහුට; **අමූලකෙන**; අහෙ-තුක වූ; **අබ්‍රහ්මචරියෙන**, අබ්‍රහ්මචරිය චෝදනාවෙන්; **අනුද්ධංසෙති**, චෝදනා කෙරේ ද නොහොත් ආක්‍රෝශ කෙරේ ද;

**අභූතවාදී**, මෙරමාගේ දොෂයක් නොදුක නොඅසා ම පරහට අභ්‍යාඛ්‍යානය කරනු පිණිස නොකී නොකළ දෙය කී කළ හයි බොරු කියන පුද්ගල තෙම; **නිරයං උපෙති**, නරකයට යන්නේ යි. **අපි**, නැවත; **යො**, යමෙක්; **කත්වා**, පවුකම් කොට; **න කරොමීතිචාහ**, නොකළෙමි යි කියා ද හෙද නරකයට යන්නේ ය; **නිහීනකම්මා**, ලාමකවූ ක්‍රියා ඇති; **තෙ උභොපි මනුජා**, ඒ මිනිස්සු දෙදෙන ම; **පෙච්ච**, මෙයින් මිය; **පරත්ථ**, පරලොව දී; **සමා භවන්ති**, නරකයෙහි උත්පත්තිය හේතුකොටගෙන (ගති වශයෙන් සමාන වන්නාහු යි. ගති වශයෙන් මෙ දෙදෙන සම වුව ද, විපාකානුභව වශයෙන් වෙනස ඇති බැවින් යමෙක්හු විසින් බොහෝ පව්කම් කරන ලද්දේ වී නම් බොහෝ කලක් නරකයෙහි පැසෙයි. යමෙක්හු විසින් මඳක් පව් කරන ලද්දේ වී නම් ඒ මඳ කලක් පැසෙයි යනු මොවුන්ගේ වෙනසි) **කාසාවකණ්ඨා**, කාෂාය වස්ත්‍රයෙන් වෙළන ලද ග්‍රීවා ඇති හෙවත් දසරුවෙහි ලූ කසා කඩ ඇති; **පාපධම්මා**, මහණ පිළිවෙතැ නොයෙදුණු හෙයින් ලාමක ස්වරූප ඇති; **අසඤ්ඤතා**, කාය වාක් අසඤ්ඤත වූ පුද්ගලයෝ; **බහවො**, බොහෝ ය; **තෙ පාපා**, ඒ ලාමක පුද්ගලයෝ; **පාපෙහි කම්මෙහි**, තමන් විසින් කරන ලද පාප කර්මයෙන්; **නිරයං**, නරකයෙහි; **උපපජ්ජරෙ**, උපදනාහු ය;

**දුස්සීලො**, හීනාශීල හෙයින් සිල් නැත්තා වූ; **අසඤ්ඤ-තො**, කායවාක් සංයම රහිත වූ පුද්ගල තෙම; **රට්ඨපිණ්ඩං**, රටවැස්සන් විසින් සැදැහැයෙන් දෙන ලද ආහාර; **චෙ** ඉදින්; **භුඤ්ජෙය්‍ය**, මමත් ශ්‍රමණයෙමි යි ප්‍රතිඥා කොට වළඳන්නේ වේ ද එයට වඩා; **තත්තො**, දිලිසුණාවූ; **අග්ගි-සිඛූපමො**, ගිනි සිළක් වැනිවූ; **අයොගුළො**, යවට; **භුත්තො**, වළඳනාලද්දේ; **සෙය්‍යො**, උත්තම යි, (කුමක් හෙයින් ද යත්? ලෝගුළි ගිලූ පසයෙන් එක ම අත්බවෙකැ දන්නේ යි.

දුශ්ශීලයා වනාහි ශ්‍රද්ධාදෙය වූ අහර වළඳා නොයෙක් ජාති ශත සහස්‍රයෙහි නරකයෙහි පැසෙන්නේය එහෙයිනි.) යනු **ධම්මපද පුරාණ සන්න යි.**

භාවය — සුගම යි.

**ධර්මවිස්තර:-**

අභූතවාදී යනාදි ගාථාව නැති දෙය් කියන ඇති දෙය් වසන පාපීන්ගේ මුසාවාදයෙහි විපාක දක්වනු පිණිස ද, දෙවන තුන්වන ගාථා එතන්හි හුන් පාප භික්ෂූන්ගේ දුසිරිත්කම්වල විපාක පෙන්වීමෙන් කළකිරවීම පිණිස ද වදාළහ. සෙස්ස සුගම යි.

**එකොළොස්වෙනි සූත්‍ර විවරණය යි**

**2 - 2 - 12**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

ද්වීහි භික්ඛවෙ දිට්ඨිගතෙහි පරියුට්ඨිතා දෙවමනුස්සා **ඔලීයන්ති එකෙ, අතිධාවන්ති එකෙ,** චක්ඛුමන්තො ච **පස්සන්ති.**

කථඤ්ච භික්ඛවෙ ඔලීයන්ති. එකෙ? භවාරාමා භික්ඛවෙ දෙවමනුස්සා භවරතා භවසම්මුදිතා, තෙසං භව නිරොධාය ධම්මෙ දෙසියමානෙ න චිත්තං පක්ඛන්දති, න පසීදති න සන්තිට්ඨති, නාධිමුච්චති එවං ඛො භික්ඛවෙ ඔලීයන්ති එකෙ.

කථඤ්ච භික්ඛවෙ අතිධාවන්ති එකෙ? භවෙනෙව ඛො පනෙ'කෙ අට්ටීයමානා හරායමානා ජිගුච්ඡමානා විභවං අභිනන්දන්ති. යතො කිර භො අයං සත්තො කායස්ස භෙදා පරම්මරණා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා; එතං සන්තං එතං පණීතං එතං යාථාවන්ති, එවං ඛො භික්ඛවෙ අතිධාවන්ති එකෙ

කථඤ්ච භික්ඛවෙ චක්ඛුමන්තො පස්සන්ති? ඉධ භික්ඛු භූතං භූතතො පස්සති, භූතං භූතතො දිස්වා භූතස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති එවං ඛො භික්ඛවෙ චක්ඛුමන්තො ච පස්සන්තී ති. එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

යෙ භූතං භූතතො දිස්වා භූතස්ස ච අතික්කමං
යථාභූතෙ විමුච්චන්ති භවතණ්හා පරික්ඛයා
ස වෙ භූතපරිඤ්ඤො සො වීතතණ්හො භවාභවෙ
භූතස්ස විභවා භික්ඛු නාගච්ඡති පුනබ්භව'න්ති,

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති.

## වග්ගො දුතියො

**තස්සුද්දානං**:-

ද්වෙ ඉන්ද්‍රියා ද්වෙ තපනීයා සීලෙන අපරෙ දුවෙ
අනොත්තප්පී කුහනා ද්වෙ ච සංවෙජනීයෙන තෙ දස
විතක්කා දෙසනා විජ්ජා පඤ්ඤා ධම්මෙන පඤ්චමං
අජාතං ධාතු සල්ලානං සික්ඛාජාගරියෙන ච
අපාය දිට්ඨියා චෙව බාවීසති පකාසිතාති.

## දුකනිපාතො නිට්ඨිතො

**අර්ථය**:-

ද්විහි **දිට්ඨිගතෙහි**, දෙවැදෑරුම් දෘෂ්ටීන් ගෙන්; **පරියුට්ඨිතා**, මඩනාලද නොහොත් වළඳනාලද; **එකෙ දෙවමනුස්සා**, ඇතැම් දෙව් මිනිස්හු; **ඔලීයන්ති**, සංකෝචයට හෙවත් හැකිලීමට පැමිණෙත්. **අතිධාවන්ති**, සීමාව ඉක්මවා අතිධාවනය කෙරෙත්; **චක්ඛුමන්තො ච පස්සන්ති**, නුවණැස් ඇත්තෝ දකිත්; **භවාරාමා**, භවයෙහි ඇලුණාහු ය; **භවරතා**, යනු ද මෙම අර්ථය මැ යි; **භවසම්මුදිතා**, භවයෙහි සතුටු වෙත්; **තෙසං**, ඔවුන්ට; **භවනිරොධාය**, භවය දුරුකිරීම පිණිස; **ධම්මෙ දෙසියමානෙ**, දහම් දෙසන කල්හි; **චිත්තං**, සිතට; **න පක්ඛන්දති**, වැද්ද නොගනී යි

**න පසීදති**, සිත නොපහදී; **න සන්තිට්ඨති**, එහි නොසිටියි; **න අධිමුච්චති**, නොපිහිට යි; **භවෙන එව ඛො පන**, භව දුඃඛයෙන් ම වනාහි; **එකෙ**, ඇතැම් කෙනෙක්; **අට්ටීයමානා**, පීඩා විඳින්නාහු; **හරායමානා**, ලජ්ජා වන්නාහු; **ජිගුච්ඡමානා**, පිළිකුල් කරන්නාහු; **විභවං**, උච්ඡේදය හෙවත් විනාශය; **අභිනන්දන්ති**, කැමති වෙත්; **යතො**, යම් කලෙක් හි; **අයං සත්තො**, මේ සත්වතෙම; **කායස්ස භෙදා**, ශරීරයාගේ භේදයෙන්; **පරම්මරණා**, මරණින් මත්තෙහි; **උච්ඡිජ්ජති**, සිඳෙයි ද; **විනස්සති**, අභාවයට යේ ද; **පරම්මරණා**, මරණින් මතු; **න හොති**, නො වේ ද; **එතං**, මේ අවස්ථාව; **සන්තං**, ශාන්තය; **එතං**, මෙය; **පණීතං**, ප්‍රණීතය; **එතං**, මෙය; **යාථාවං**, යථාතත්ත්වය වේ; **ඉධ**, මෙසස්නෙහි; **භික්ඛු**, මහණතෙම; **භූතං**, ස්කන්ධ පඤ්චකය; **භූතතො**, ඇත්ත වශයෙන්; **පස්සති**, දකී ද; සෙස්ස සුගමයි.

**යෙ**, යම් ආර්‍යශ්‍රාවක කෙනෙක්; **භූතං**, පඤ්චස්කන්ධය; **භූතතො**, අවිපරීත ස්වභාවයෙන්; **දිස්වා**, දැක; **භූතස්ස**, පඤ්චස්කන්ධයාගේ; **අතික්කමං ච**, ඉක්මවීම ද (දැක); **භවතණ්හා පරික්ඛයා**, භව තෘෂ්ණාව සිඳීමෙන්; **යථාභූතෙ**, අවිපරීතසත්‍ය ස්වභාවය වූ නිවන් අරමුණු කොට; **අධිමුච්චන්ති**, කෙලෙසුන්ගෙන් මිදෙත්;

**භූත පරිඤ්ඤාතො**, පඤ්චස්කන්ධයෙහි තතු පිරිසිඳ දත්තාවූ; **භවාභවෙ**, කුඩා මහත් භවයෙහි; **වීත තණ්හො**, දුරු කරන ලද තෘෂ්ණා ඇති; **සො භික්ඛු**, ඒ මහණ තෙම; **භූතස්ස විභවා**, උපාදානස්කන්ධ සංඛ්‍යාත ආත්මභාවය නැති කිරීමෙන්; **පුනබ්භවං**, පුනරුත්පත්තියට; **න ආගච්ඡති**, නොපැමිණේ යි;

**භාවය**:—

දෙව් මිනිස් දෙකොටස ම දෘෂ්ටි දෙකකින් මැඩුණාහු වෙති. ඇතැම් දිව්‍යමනුෂ්‍යයෝ ආත්මය හා ලෝකයත් සදාකාලිකය යි සලකමින් ශාස්වත දෘෂ්ටියට බැස තෘෂ්ණා දෘෂ්ටි දෙකෙන් ම භවයෙහි ගැලෙත්. ඇතැම් කෙනෙක්

මරණින් මතු ආත්මයත් ලෝකයත් විනාශ වේ ය යි අතිධාවනය කොට සලකමින් උච්ඡේද දෘෂ්ටිගතික වෙති. පෙර පෙර ආත්මභාවයන්හි දී භාවනා කිරීමෙන් පළ පුරුදු කරගත් මුහුකුරා ගිය නුවණ ඇති දෙව් මිනිස්සු ප්‍රඥාචක්ෂුසින් දැක ශාස්වත උච්ඡේද නම් වූ අන්තද්වයට නොපැමිණ මධ්‍යමප්‍රතිපදාවබෝධයෙන් යථාතත්ත්වය ප්‍රත්‍යක්ෂ කෙරෙති. මෙය නම් හේතු ප්‍රත්‍යයෙන් හටගත් නාමරූප මාත්‍රයෙකි, එහෙයින් සත්ත්වයා සදාකාලිකත් නොවේ. හේතු ඵල ධර්මයන්ගේ සම්බන්ධය ඇති තාක් නොනැසෙන්නේත් නොවේය යි තත්වූ පරිද්දෙන් සලකති. ඔලීයනාදි පුද්ගලයන්ගේ තත්ත්වය දක්වනු සඳහා "කථඤ්ච භික්ඛවෙ" යනාදිය වදාරන ලදී.

භවයෙහි ඇලුණු භවයෙහි සතුටු වූ දිව්‍යමනුෂ්‍යයෝ භවනිරොධය පිණිස දහම් දෙසන කල්හි එය නො පිළිගනිත්. මෙසේ ඔවුන්ගේ ඔලීයනය වෙයි. අතිධාවනය කෙසේ ද යත්? භවයෙහි ඇති ජරා රෝග මරණ වධ බන්ධන ඡේදනාදි කම්කටොළු දැක කලකිරුණු දිව්‍ය මනුෂ්‍යයෝ මේ සත්වයා මරණින් මතු නො උපදී නම් එය ම ශාන්ත ය. එය ම ප්‍රණීත ය. යථාතත්වය එය ම ය යි විභවය හෙවත් උච්ඡේදය විනාශය කැමැති වෙත්.

චක්ෂුස්මත්හු කෙසේ දකිත් ද යත්? මෙසස්නෙහි යෝගාවචර තෙම සකන්ධපඤ්චකය තත්වූ පරිද්දෙන් දකී ද එසේ දැක පඤ්චසකන්ධයෙහි කලකිරීමට එහි නොඇලීමට එය නිරුද්ධ කිරීමට පිළිපන්නේ වේ ද. මෙසේ විදර්ශනා ප්‍රඥාචක්ෂුස් ඇත්තෝ දකිත්.

**ධර්මවිස්තර;**

**භවාරාමා**

කාමභවය, රූපභවය, අරූපභවය, සංඥීභවය, අසංඥීභවය, නෛවසංඥීනාසංඥීභවය, එකවොකාර භවය, චතුවොකාරභවය, පඤ්චවොකාරභවය යි මෙසේ භවය ත්‍රිවිධ ත්‍රිවිධ ම වේ.

කාමතෘෂ්ණාව බල පවත්වන තැන් වශයෙන් සලකන සටින් අවීචියත් උඩින් බ්‍රහමපාරිෂද්‍යයත් සරසින් අනන්තා පරිමාණ ලෝකධාතුවත් **කාමභව** නම් වේ. රූප තෘෂ්ණාව බලපවත්වන යටින් බ්‍රහ්මපාරිෂද්‍යය හා උඩින් අකනිට්ඨකයත් සරසින් අනන්තා පරිමාණ ලෝක ධාතුවත් **රූපභවය** වේ. අරූප තෘෂ්ණාව බලපවත්වන යටින් ආකාසානඤ්චායතනයත් උඩින් භවාග්‍රයත් සරසින් අනන්තා පරිමාණ ලෝකධාතුවත් **අරූපභවය** වේ. යම් භවයෙක්හි ඖදාරික සංඥාව පවත්නී ද හේ **සංඥීභව** නම් වේ. එය නැත්තේ **අසංඥීභව** නමි. ඖදාරික සංඥාවක් නැත ද සියුම් සංඥාවක් ඇත්තේ වී නම් ඒ භවය **නෛවසංඥී නාසංඥීභව** නමි. චතුර්ථධ්‍යාන තලයෙන් කොටසෙක කය පමණක් පවත්නා අසංඥසත්ව බඹලොව **එක වොකාරභව** යයි ද, අකනිට්ඨයෙන් උඩ භවාග්‍රය තෙක් සිත පමණක් පවත්නා අරූපී බඹලොව **චතුවොකාරභවය** යි ද, අකනිට්ඨා-වෙන් යට අවීචිය තෙක් පඤ්චස්කන්ධය ඇති සත්වලෝකය **පඤ්චවොකාරභව** යයි ද දතයුතු.

**චක්ඛුමන්තො ච පස්සන්ති:-**

පෙර පෙර ආත්මභාවවල භාවනාවන්හි යෙදීමෙන් මුහුකුරා ගිය නුවණ ඇති දිව්‍යමනුෂ්‍යයෝ ඒ ප්‍රඥා චක්ෂුසින් ශාස්වත උච්ඡෙද යන අන්තද්වයට නොපැමිණ මධ්‍යමප්‍රතිපදා දර්ශනයෙන් නාමරූපයන්ගේ තත්ත්වය ප්‍රත්‍යක්ෂ කෙරෙති. ඔවුහු මේ නාමරූපය හේතු ප්‍රත්‍යයෙන් හටගත් හෙයින් සදාකාලික ද නොවේ. විනාශත් නොවේය යි තත්වූපරිද්දෙන් සලකත්.

**භූතං භූතතො පස්සන්ති:-**

පරමාර්ථ වශයෙන් විද්‍යමාන හෙයින් ද, හේතු ප්‍රත්‍යයාදි-යෙන් හටගත් හෙයින් ද, පඤ්චස්කන්ධයට භූතය යි කියනු ලැබේ. මෙය නාමරූප මාත්‍රයෙක, එහි පෘථිව්‍යාදිධර්ම රූප ස්කන්ධය වේ. ස්පර්ශාදිධර්ම නාමය වේ. මේ මේ දේ ඔවුන්ගේ

ලක්‍ෂණයෝ යි. අවිද්‍යාදීහු ඔවුන්ට ප්‍රත්‍යයෝ වෙති යි මෙසේ සප්‍රත්‍යය නාමරූප දර්ශන වශයෙන් මේ සියලු දෙය නැතිව ඇතිවෙත්. ඇතිව නැතිවෙත්. එහෙයින් අනිත්‍යයහ. අනිත්‍ය හෙයින් ම දුක්ඛයහ, දුක් හෙයින් ම අනාත්මහ යි මෙසේ අනිත්‍යානුදර්ශන වශයෙන් දකිත්.

මෙසේ සත්‍යවශයෙන් නොවෙනස් වන යථාතත්ත්වය ස්වභාවලක්‍ෂණ සාමාන්‍යලක්‍ෂණ වශයෙන් තත්වූ පරිදි දැකීමෙන් තරුණ විදර්ශනාව කෙළවර කොට ඇති විදර්ශනා භූමිය දක්වන ලද්දේ ය. මෙහි **තරුණ විපස්සනාව** නම් සඞ්ඛාරපරිච්ඡෙද, කඞ්ඛාවිතරණ, සම්මසන, මග්ගාමග්ග යන **ඤාණ සතර** යි. මෙය බලවවිපස්සනාවට හේතු වේ.

**නිබ්බිදාය විරාගාය නිරොධාය:-**

‘නිබ්බිදාය’ යන්නෙන් නාමරූපයන් කෙරෙහි කලකිරීම දැක්වීමෙන් බලවත් විදර්ශනාව පවස යි. **බලව විපස්සනාව** නම් භයතුපට්ඨාන, ආදීනවානුපස්සනා, මුඤ්චිතුකම්‍යතා, සඞ්ඛාරුපෙක්ඛා යන සතර ඤාණයෝ යි. ‘‘විරාගාය’’ යන්නෙන් මාර්ගය ද, ‘‘නිරොධාය’’ යන්නෙන් මාර්ගය පමණක් නොව පටිප්පස්සද්ධි නිරොධය හා සමග අනුපාදිසෙස පරිනිබ්බාණය ද දක්ව යි. මෙසේ නුවණැස් ඇත්තෝ මාර්ගප්‍රඥා චක්‍ෂුසින් චතුස්සත්‍ය ධර්මය අවබොධ කෙරෙත්.

**දොළොස්වෙනි සූත්‍ර විවරණය යි**

**දෙවෙනි වර්ගය යි**

**දුකනිපාතය සමාප්ත යි.**

# තික නිපාතො

## පඨමො වග්ගො

### 3 - 1 - 1

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං,**

තීණිමානි භික්ඛවෙ අකුසලමූලානි, කතමානි තීණි? **ලොභො** අකුසල මූලං; **දොසො** අකුසල මූලං, **මොහො** අකුසල මූලං, ඉමානි ඛො භික්ඛවෙ තීණි අකුසලමූලානීති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති.

ලොභො දොසො ච මොහො ච – පුරිසං පාපචෙතසං
හිංසන්ති අත්තසම්භූතා – තචසාරංව සම්ඵලන්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

## පළමුවන වර්ගය

අර්ථය:-

**අකුසල මූලානි**, අකුශල හේතූහු; **ඉමානි තීණි**, මේ තුන් නිදෙනෙකි; **පාපචෙතසං**, ලාමක සිත් ඇති; **පුරිසං**, පුරුෂයා; **ලොභො**, ලෝභය; **දොසො ච**, ද්වේෂය; **මොහො ච**, මෝහය ද යි යන; **අත්තසම්භූතා**, තමා කෙරෙහි හටගත්තා වූ මේ අකුශල මූලයෝ; **තචසාරං**, හුණගස, **සම්ඵලං ඉව**, තමාගේ ඵලය විනාශ කරගත්තාක් මෙන්; **හිංසන්ති**, විපාක දීමේදී පීඩා කෙරෙත්;

භාවය:-

කිහිරි ඇට්ටේරිය වැනි හරයක් නැති හුණ ගස තමාගේ ඵලය නැති කර ගත්තාක් මෙන් අභ්‍යන්තරයෙහි ශීලාදි සාරගුණ රහිත වූ ලාමක සිත් ඇති පුද්ගලයා තමාගේ සිතේ හටගත්තා වූ ලොභ ද්වේෂ මොහ සංඛ්‍යාත අකුශල මූලයන් විනාශ කෙරෙයි.

**ධර්මවිස්තර:-**

**අකුසල මූල:-**

අකුසලයන්ට හේතු වූයේ අකුශල මූල නම් වේ.

“තයො කුසලා හෙතු, තයො අකුසලා හෙතු” යි **ධම්මසඞ්ගණි පෙළෙහි** කුසල හේතු තුනක් හා අකුසල හේතු තුනක් ද දක්වා ඇත. කුසල හේතු තුන නම් අලොභ අදෙස අමොහ යනු යි. අකුසලහේතු තුන නම් ලොභ දෙස මොහ යනු යි. මේ සූත්‍රයෙහි දැක්වූයේ අකුසලහේතු ත්‍රිකය යි. හේ මූල නාමයෙන් මෙහි ප්‍රකාශිතය. “අකුසලානි ච තානි මූලානිචාති අකුසලමූලානි” යනු විග්‍රහ හෙයින් අකුසල් වූහුත් ඔහුමය, මුල්වූහුත් ඔහුම නුයි අකුසල මූල නම් වෙත්.

හේතු කාරණ නිදාන සම්භව පභව පච්චය ජනක සමුට්ඨාපක නිබ්බත්තක යන මේ පර්‍යාය වචන සමූහයෙන් දක්වනු ලබන්නේ ද මේ මූලයම යි. ව්‍යඤ්ජන වශයෙන් වෙනස් වුවත් අර්ථ වශයෙන් එකෙක්ම ය. එනම් මූලය හේතුය කාරණය යන අර්ථ යි. ගොයම් හටගැනීමට බිය හේතුවන්නාක් මෙන් අකුසලයන් කර්මපථබවට හෙවත් විපාකදීමේ චේතනාශක්තිය ඇතිකිරීමට ප්‍රතිෂ්ඨාධාරවූයේ ලොභාදි අකුසලමූලයෝ යි.

“හෙතු හෙතු සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානං ච රූපානං හෙතුපච්චයෙන පච්චයො” යනුවෙන් මේ ත්‍රිවිධ අකුසල හේතුහු තමා හා එක්ව යෙදුණු සෙසු සියලු චෛතසිකයන්ට හා ප්‍රතිසන්ධික්ෂණයෙහි හටගන්නා කර්මජ රූපයන්ට ද ප්‍රවෘත්ති කාලයෙහි හටගන්නා චිත්තජ රූපයන්ට ද යි මෙසේ ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති දෙක්හිම සියලු චිත්ත චෛතසික ධර්මයන් මනාකොට පිහිටා සිටීම සඳහා ගසට මුල් මෙන් උපකාර වන හෙයින් **අකුසල මූල** නම් වෙත්. භවගාමී අකුසලයන් රැස්කිරීමට මොවුහු හේතු වෙති යි දැක්වූ අයුරු යි. අයොනිසොමනසිකාරය

අකුසලයන්ට හේතු වේ. අකුසල් මුල් අකුසලයන්ට උපකාර වන හෙයින් මූලයෙන් මුක්ත වූ අකුසල චිත්තොත්පාදයෙක් නැත්තේය. එහෙයින් සියලු අකුසල රාසිය මේ මූලත්‍රයෙහි සංග්‍රහ කොට දක්වන ලදැ යි සැලකිය යුතු ලොභ දෙස මොහ යනු ඔවුන් සවරූප වශයෙන් දක්වූ අයුරු යි.

**ලොභ දෙස මොහ:-**

"ලුබ්භන්ති තෙන, සයං වා ලුබ්භති, ලුබ්භනමත්තං මෙවෙ තන්ති ලොභො, සො ආරම්මණග්ගහන ලක්ඛණො මක්කටා-ලෙපො විය, අභිසඞ්ගරසො තත්තකපාලෙ ඛිත්ත මංසපෙසි විය, අපරිච්චාග පච්චුපට්ඨානො තෙලඤ්ජන රාගො විය, සංයොජනීයෙසු ධම්මෙසු අස්සාදදස්සන පදට්ඨානො" යනු **අට්ඨශාලිනියෙහි** දක්වූ අයුරු යි.

ඒ කරණකොට ගෙන හෙවත් අයොනිසො මනසිකාර යෙන් අරමුණුරසය විඳිනු කැමැත්තෙන් ඇලෙත්නුයි ද, තෙමේ හෝ ඇලේනුයි ද, ඇලීම්මාත්‍රය ම වේ නුයි ද ලොභ නම්. එය ලාටුවෙහි ඇලුණු වඳුරකු සෙයින් අරමුණ අල්වා ගැනීම ලක්ෂණ (සවභාව) කොට ඇත්තේය. රත්වූ කබලෙක ඇලුණු මස් වැදැල්ලක් මෙන් අරමුණෙහි වෙසෙසින් ඇලීම රසය (කෘත්‍යය) කොට ඇත්තේය. තෙල් මුසු කළු අඳුන මෙන් අත්නොහැරීම පච්චුපට්ඨාන (ඵලය) කොට ඇත්තේය කාමරාග සංයොජනයට හිත වූ ධර්‍මයන් මධුරා-කාරයෙන් දැකීම පදට්ඨාන (සමීප කාරණ) කොට ඇත්තේය. තියුණු සැඩ පහර ඇති තෘෂ්ණා ගඞ්ගාවක් මෙන් වැඩෙන්නා වූ ඒ ලොභය අපාය මහාසමුද්‍රය කරාම ගෙන යන්නේයැයි දතයුතු.

"දුස්සන්ති තෙන, සයං වා දුස්සති, දුස්සනමත්තං මෙ වෙතන්ති දොසො, සො චණ්ඩික්කලක්ඛණො, පහටාසි-විසො විය, විසප්පනරසො විසනිපාතො විය, අත්තනො

නිස්සයදහනරසො වා දවග්ගි විය, දුස්සනපච්චුපට්ඨානො ලද්ධොකාසො විය සපත්තො, ආඝාතවත්ථු පදට්ඨානො විසසංසට්ඨපූතිමුත්තං විය දට්ඨබ්බො''

අත්ථසාලිනී

ඒ හේතුකොට ගෙන දූෂණය වේත් නු යි ද, තෙමේ හෝ දූෂණය වේ නුයි ද, දූෂණමාත්‍රයම හෝ වේනුයි ද, ද්වේෂ නම් වේ. එය දණ්ඩෙන් ගැසූ සර්පයකු මෙන් චණ්ඩ බව ලක්ෂණ කොට ඇත්තේය. විස වැටුනාක් මෙන් සැලීම කෘත්‍යය කොට ඇත්තේය. ලැව් ගින්නක් මෙන් තමාගේ පපුව දැවිල්ල හෝ කෘත්‍ය කොට ඇත්තේය. අවකාශයක් ලත් සතුරකු මෙන් දූස්සනය (දුෂ්ටගතිය) නොහොත් දූෂණය (හිත නරක්වීම) ඵලය කොට ඇත්තේය. විෂමිශ්‍ර ගොමූත්‍රය මෙන් නවවැදෑරුම් ආඝාත වස්තුව පදස්ථාන කොට ඇත්තේය.

''මුය්හන්ති තෙන සයං වා මුය්හති, මුය්හනමත්තමෙවෙ තන්ති මොහො, සො චිත්තස්ස අන්ධභාවලක්ඛණො, අඤ්ඤාණ ලක්ඛණො වා; අසම්පටිවෙධරසො, ආරම්මණ සභාවච්ඡාදන රසො වා; අසම්මාපටිපත්ති පච්චුපට්ඨානො, අන්ධකාරපච්චු- පට්ඨානො වා; අයොනිසොමනසිකාර පදට්ඨානො, සබ්බා කුසලානං මූලන්ති දට්ඨබ්බං''

අත්ථසාලිනී

අනුවණකම හේතුකොටගෙන මූළාවෙත් නු යි හෝ තෙමේ මූළාවේ නු යි හෝ අරමුණෙහි මූළාවීම් මාත්‍ර ඇත්තේ නු යි හෝ මෝහ නම්. එය සිත්හි අන්ධබව සවභාව කොට ඇත්තේ හෝ නොදැනීම සවභාවකොට ඇත්තේය. ධර්මයන්ගේ යථාතත්ත්වය නොවැටහීම කෘත්‍ය කොට ඇත්තේ හෝ ආරම්මණයන්ගේ සවභාවය වැසීම කෘත්‍ය කොට ඇත්තේය දුෂ්ප්‍රතිපත්තිය ඵල කොට ඇත්තේ හෝ මෝහාන්ධකාරය ඵල කොට ඇත්තේය. අනුවණින්

මෙනෙහිකිරීම ආසන්නකාරණ කොට ඇත්තේය. මෝහය සියලු අකුසලයන්ට මුල්වන හෙයින් සබ්බාකුසල සාධාරණ චෛතසිකයෙකැ යි දතයුතු.

**පළමුවන සූත්‍ර විවරණය යි.**

**3 - 1 - 2**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතා 'ති මෙ සුතං**

තිස්සො ඉමා භික්ඛවෙ ධාතුයො, කතමා තිස්සො? **රූපධාතු අරූපධාතු නිරොධධාතු** ඉමා ඛො භික්ඛවෙ තිස්සො ධාතුයො 'ති එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති,

රූපධාතු පරිඤ්ඤාය අරූපෙසු අසණ්ඨිතා
නිරොධෙ යෙ විමුච්චන්ති තෙ ජනා මච්චුහායිනො
කායෙන අමතං ධාතුං ඵුසයිත්වා නිරූපධිං
උපධිප්පටිනිස්සග්ගං සච්ඡිකත්වා අනාසවො
දෙසෙති සම්මාසම්බුද්ධො අසොකං විරජං පද'න්ති,

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

**3 - 1 - 2**

**අර්ථය:-**

**රූපධාතු**, රූපභවය; **අරූපධාතු**, අරූප භවය; **නිරොධධාතු**, නිවන ය;

**රූපධාතුං**, රූප ප්‍රතිබද්ධ ධර්ම ප්‍රවෘත්තිය; **පරිඤ්ඤාය**, ත්‍රිවිධ පරිඥයෙන් පිරිසිඳ දැන; **අරූපෙසු**, අරූපාවචර ධර්මයන් කෙරෙහි; **අසණ්ඨිතා**, නොපිහිටියාවූ; **යෙ**, යම් කෙනෙක්; **නිරොධෙ**, නිවන් අරමුණු කොට; **විමුච්චන්ති**, සියලු කෙලෙසුන්ගෙන් මිදෙත් ද; **තෙ ජනා**, ඒ ක්ෂීණා ශ්‍රවයෝ; **මච්චුහායිනො**, මරණය ඉක්ම වූහ.

**නිරූපධිං**, උපධි රහිතවූ; **උපධිපටිනිස්සග්ගං**, උපධීන් දුරුකළාවූ; **අමතං ධාතුං**, නිර්වාණධාතුව; **කායෙන**, නාම කයින්; **ඵුසයිත්වාන**, ස්පර්ශ කොට; **සච්ඡිකත්වා**, ඵලසමාපත්ති වලට සමවැදීමෙන් ප්‍රත්‍යක්ෂ කොට; **අනාසවො**, ආශ්‍රව රහිත වූ; **සම්මාසම්බුද්ධො**, සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ; **අසොකං**, ශොකරහිතවූ; **විරජං පදං**, නිර්වාණ පදය; **දෙසෙති**, දෙශනා කරන සේක.

**භාවය**:- සුගම යි.

**ධර්මවිස්තර**:-

**රූපධාතු** ---

මෙහි ධාතු නාමයෙන් දැක්වූයේ දෙශනා විලාස වශයෙන් භවය ම ය. ඒ ඒ තැනට යෝග්‍ය වශයෙන් ධාතුනාමයෙන් හෝ භව නාමයෙන් දැක්වීම දෙශනාක්‍රමය යි.

එහෙයින්:-

"කතමෙ ධම්මා රූපාවචරා? හෙට්ඨතො බ්‍රහ්මලොකං පරියන්තං කත්වා උපරිතො අකනිට්ඨකෙ දෙවෙ අන්තො කරිත්වා එත්ථාවචරා එත්ථ පරියාපන්නා ඛන්ධධාතු ආයතනා ඉමෙ ධම්මා රූපාවචරා."

"කතමෙ ධම්මා අරූපාවචරා? හෙට්ඨතො ආකාසා-නඤ්චායතනූපගෙ දෙවෙ අන්තො කරිත්වා උපරිතො නෙව සඤ්ඤානාසඤ්ඤායතනූපගෙ දෙවෙ අන්තො කරිත්වා එත්ථාව චරා එත්ථ පරියාපන්නා ඛන්ධ ධාතු ආයතනා ඉමෙ ධම්මා අරූපාවචරා,"

මෙසේ කියනලද රූපාවචරධර්ම රූපධාතු නොහොත් රූපභවයයි ද දතයුතු.

තවත් ක්‍රමයෙකින් රූප සහිතවූ රූප ප්‍රතිබද්ධවූ ධර්මයන්ගේ පැවැත්ම රූපධාතුය යි ගත්කල පඤ්චවොකාර භවය හා එකවොකාර භවය ද ගැනීමෙන් සියලු කාමභවය

හා රූපභවයත් සංග්‍රහ කරනලද්දේ වෙයි. රූප රහිතවූ ධර්‍ම ප්‍රවෘත්තිය අරූපධාතු යයි ගත්කල චතුවොකාර භවය ගැනීමෙන් අරූපභවය සංග්‍රහ කරනලද්දේ වෙයි. මේ දෙපදයෙන් ම කාම, රූප, අරූප යන භවත්‍රය ම සංග්‍රහ කිරීමෙන් සියලු සංසාර ප්‍රවෘත්තිය කියන ලදී. රූප තෘෂ්ණාවට විෂය වූ ධර්‍ම **රූපධාතු** නමැයි ද අරූප තෘෂ්ණාවට විෂය ධර්‍ම **අරූපධාතු** නමැ යි ද අර්‍ථකථාචාර්‍ය්‍ය වරයෝ කියත්.

මෙහි විස්තර දුක නිපාතයෙහි දෙවෙනි වර්‍ගයෙහි දෙලොස්වැනි සූත්‍රයට ලියූ අයුරින් දතයුතු.

දෙවන සූත්‍ර විවරණය යි

### 3 - 1 - 3

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා කතමා තිස්සො? **සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා,** ඉමා **ඛො** භික්ඛවෙ **තිස්සො** වෙදනාති එත මත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති,

"සමාහිතො සම්පජානො සතො බුද්ධස්ස සාවකො
වෙදනා ච පජානාති වෙදනානඤ්ච සම්භවං
යත්ථ චෙතා නිරුජ්ඣන්ති මග්ගඤ්ච ඛයගාමිනං
වෙදනානං ඛයා භික්ඛු නිච්ඡාතො පරිනිබ්බුතො'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති,

### 3 - 1 - 3

**අර්ථය:-**

**වෙදනා,** අරමුණු රසය විඳීම ලක්‍ෂණ කොට ඇති; වේදනාවෝ; **ඉමා තිස්සො,** මොහු තිදෙනෙකි; **සුඛා වෙදනා,** ඉෂ්ටානුභවන ලක්‍ෂණ වූ සැප වේදනාව ය; **දුක්ඛා වෙදනා,**

අනිෂ්ටානුභවනලක්‍ෂණ වූ දුක්ඛවේදනාව ය; **අදුක්ඛමසුඛා වෙදනා,** එ දෙකට ම වෙනස් වූ විඳීම ලක්‍ෂණ කොට ඇති උපෙක්‍ෂා වේදනාවය යන තුන යි.

**සමාහිතො,** එකඟ වූ සිත් ඇති නොහොත් උපචාර අර්පණා ප්‍රභේදයෙන් සමථභාවනායෙහි යෙදුණා වූ; **සම්පජානො,** චතුර්විධ සම්ප්‍රජන්‍යයෙන් යහපත් නුවණ ඇති නොහොත් විදර්ශනායෙහි යෙදුණා වූ; **සතො,** සිහි ඇති; **බුද්ධස්ස සාවකො,** බුදු ශ්‍රාවක තෙම; **වෙදනා ච පජානාති,** වෙදනාවන් (දනී ද) **වෙදනානඤ්ච සම්භවං,** වෙදනාවන්ගේ හටගැන්මත් දනී ද;

**යත්ථ,** මේ වේදනාවෝ; **යත්ථ,** යම් තැනෙක්හි; **නිරුජ්ඣන්ති,** නිරුද්ධ වෙත් ද; **ඛයගාමිනං,** වෙදනාවන් දුරුකිරීමට පමුණුවන; **මග්ගං ච,** ආර්‍ය්‍යමාර්ගයත් (දනී ද) **වෙදනානං ඛයා,** සියලු වෙදනාවන් දුරු කිරීමෙන්; **භික්ඛු,** මහණතෙම; **නිච්ඡාතො,** තෘෂ්ණාරහිතව; **පරිනිබ්බුතො,** ක්ලේශ පරිනිර්වාණයෙන් හා ස්කන්ධ පරිනිර්වාණයෙන් ද පිරිනිවියේ වෙයි.

භාවය — සුගම යි.

**ධර්මවිස්තර**:-

**සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා,**

"අනුභවනලක්ඛණා වෙදනා, විසයරසසම්භොගරසා, සුඛ දුක්ඛ පච්චුපට්ඨානා, ඵස්ස පදට්ඨානා."

යනු හෙයින් ඇස් කන් ආදි ඉඳුරන්ගෙන් රූප ශබ්දාදී අරමුණුවල රසවිඳීම වේදනාවගේ ලක්‍ෂණය වේ. එය මධුරාකාරයෙන් ආස්වාද කිරීම එහි රසය හෝ කෘත්‍යය වෙයි. එයින් ඇති වන සැප දුක දෙක සම්පත්තිය හෝ ඵලය වෙයි. ස්පර්ශය වේදනාවන්ට ළංවූ ධර්මය වේ.

තමහට කැමැතිවූ ඉෂ්ටවූ අරමුණෙක රසය විඳීම සැප වේදනාවෙහි ලක්‍ෂණය වේ. අනිෂ්ටවූ අරමුණක් විඳීම

දුක්ඛවේදනායෙහි ලක්ෂණය වෙයි, එ දෙකෙන් ම වෙනස් වූ විඳීම උපෙක්ෂා වේදනායෙහි ලක්ෂණය වෙයි. එහෙයින් සැප දුක් වේදනාවන්ගේ උත්පත්තිය ප්‍රකට ව දත හැකි ය. උපෙක්ෂා වේදනාව එසේ නොදත හැකි ය. අඳුරෙහි තබන ලද ද්‍රව්‍යයක් මෙන් අප්‍රකාශ ද වෙයි. එහෙයින් මෙය නයග්‍රාහ්‍ය ය; හෙවත් නය වශයෙන් දතයුතු ය. මිහමිග ගෙවා යන්නකුට මැණිකක් දුටු කල සිතට ඇතිවන්නේ සැප වේදනාවකි. අමෙධ්‍යයක් හෙවත් අපවිත්‍රවූ දෙයක් දුටුකල සිතට ඇතිවන්නේ දුක්ඛවේදනාවකි. ගල්තලාවක් මතුයෙන් පැන යන මුවකුගේ අඩි සටහන එහි දෙපසින්ම දක්නට ලැබේ. ගල්තලාවෙහි පමණක් දක්නට නොලැබේ. එසේ ද වුවත් ඒ මුවා දෙපස අඩි සටහනින් ගල්තලාව මතුයෙන් ම පැන ගියේයැයි සලකනු ලැබේ ද, එපරිද්දෙන් සැප වේදනාව හා දුක් වේදනාවක් ඇතිකල උපෙක්ෂා වේදනාව ද ඇති විය යුතු බව සලකාගත හැකි ය. යම් අරමුණකින් ලෝභයක් හෝ ක්‍රෝධයක් සිතට නොනැගේ නම් ඒ අවස්ථායෙහි ඇතිවන්නේ උපෙක්ෂාවේදනාව යි.

මෙසේ වේදනාව තුන් පරිද්දක් කොට දක්වූව ද "ද්වෙපි මයා ආනන්ද වෙදනා වුත්තා පරියායෙන, සුඛා වෙදනා දුක්ඛා වෙදනා" යන දෙශනා නයින් ගත්කල සැප දුක් වශයෙන් වේදනාව දෙවැදෑරුම් කොට වදාළහ. "උපෙක්ඛා පන සන්තතා සුඛමිච්චෙව භාසිතා" යන ධර්මය ලෙස උපෙක්ෂාව ශාන්ත ගුණයක් බැවින් එය සැප වේදනාවට ම ඇතුළත් වේ. මේ සුඛ උපෙක්ෂා වේදනා දෙක්හි විශේෂ යෙන් දුකෙක් නැත. "සඞ්ඛාරානිච්චතං ආනන්ද මයා සන්ධාය භාසිතං, සඞ්ඛාරවිපරිනාමතං, යංකිඤ්චි වෙදයිතං සබ්බං තං දුක්ඛස්මිංති වදාමි" යන දෙශනායෙහි සංස්කාර යන්ගේ අනිත්‍යත්වය හා විපරිණාමත්වය සලකා විඳිනා යමක් වේ නම් ඒ සියල්ල දුක යයි වදාළහ. එය වෛනෙය පුද්ගලයන්ගේ අදහස්වලට අනුව කිසිදු අරමුණෙක ඡන්දරාගය නො උපදවනු සඳහා සාමාන්‍යයෙන් දෙශිත ය.

මෙසේ වේදනාව තුන් පරිද්දක් කොට වදාළේ විපස්සනා කම්මික යෝගාවචරයන්ට වේදනාද්වාරයෙන් අරූප කම්ඨානය දක්වනු සඳහා ය. රූප කම්ඨානය, අරූප කම්ඨානය යි කම්ඨානය දෙවැදෑරුම් වේ. **රූප කම්ඨානය** වදාරන භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් හෝ විස්තරයෙන් හෝ චතුධාතු වවත්ථාන වශයෙන් හෝ දේශනා කෙරෙති. **අරූප කම්ඨානය** ස්පර්ශ වශයෙන් හෝ වේදනා වශයෙන් හෝ චිත්ත වශයෙන් හෝ දේශනා කෙරෙති.

යම්කිසි අරමුණක් අවදනා ඇතැම් යෝගාවචර කෙනකුන්ට එහි උපදනා චිත්ත චෛතසිකයන් පළමු කොට ගැටීමේදී සිතට ස්පර්ශයක් උපදී. එය, අරමුණ ස්පර්ශ කෙරෙමින් උපදනා හෙයින් ප්‍රකට ය. ඇතැම් කෙනකුන්ට අරමුණුරසය විඳිමින් උපදනා වේදනාව ප්‍රකට ය. ඇතැම් කෙනකුන්ට ඒ අරමුණු දනිමින් උපදනා විඤ්ඤාණය ප්‍රකට ය. මෙසේ ඒ ඒ පුද්ගලයන්ගේ අදහස් වලට අනුව ඵස්ස වෙදනා චිත්ත වශයෙන් තුන් පරිද්දෙකින් අරූප කම්ඨානය දක්වා වදාළහ, එහි යමකුට ස්පර්ශය ප්‍රකට වේ ද, එමතු නොව ඒ සමග ඒ අරමුණ විඳින වේදනාව ද, අරමුණ හැඳිනගන්නා සංඥාව ද, අරමුණ සලකන චේතනාව ද, අරමුණ දැනගන්නා විඤ්ඤාණය ද, උපදීනුයි මෙසේ ස්පර්ශ පඤ්චමක ධර්මයන් ම ලැබේ. සෙස්සෙහිදු මෙසේ මැ යි.

ඒ යෝගාවචර තෙම මේ ඵස්සපඤ්චමක ධර්මයන් කුමක් ඇසුරු කොට ගෙන උපදින්නේදැ යි සලකන කල වස්තුරූපය හෙවත් කරජකාය ඇසුරුකොට උපදීයයි දනී. හේ වනාහි භූත උපාදාය වශයෙන් දෙපරිදිවූ රූපස්කන්ධය යයි ද, ඵස්ස පඤ්චකය නාම යයි ද මෙසේ නාමරූප වශයෙන් **සලකයි.** **නාමරූප** දෙකෙන් වෙන්වූ පඤ්චස්කන්ධයක් හෝ පඤ්චස්කන්ධයෙන් වෙන්වූ නාමරූපයක් හෝ නැතැයි **දනී.** මේ නාමරූපයෝ කවර හේතුවකින් හටගනිත්දැයි සලකන්නේ අවිද්‍යාදි හේතුවෙන් යැයි දනී. මෙසේ මේ

**පඤ්චස්කන්ධය** – ප්‍රත්‍යය, ප්‍රත්‍යයෝත්පන්න ධර්ම මාත්‍රයක් මිස මෙයින් අන්‍යවූ සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැතැයි ද, මෙය ශුද්ධ සංස්කාර පුඤ්ජමාත්‍රයක් ම යයි ද, සලකමින් ත්‍රිලක්ෂණෙහි සිත නංවා අනිත්‍යය දුඃඛය අනාත්මය යි විදර්ශනා පිළිවෙළින් භාවනා කෙරෙයි

ඒ මේ යෝගාවචර තෙම අද අද ම මාර්ග ඵලාවබෝධය කරනු කැමැත්තෙන් ඍතු සැපය, පුද්ගල සැපය, භොජන සැපය, ධර්මශ්‍රවණ සැපය යන සතර සත්ප්‍රාය යන් ලැබ එක ම ඊර්ය්‍යාපථයෙකින් වැඩ හිඳිමින් ම විදර්ශනාව මස්තක ප්‍රාප්ත කොට රහත් වෙයි මෙසේ මේ පිළිවෙළින් ස්පර්ශ වශයෙන් හෝ වේදනා වශයෙන් හෝ චිත්ත වශයෙන් හෝ නිවන් අවබෝධ කරගනු කැමැති යෝගාවචරයන්ගේ අදහස් පරිදි කොටස් තුනකට බෙදිය හැකි වුව ද මේ සූත්‍රයෙහි අරූප කර්මස්ථානය වේදනා වශයෙන් කොටස් තුනකට බෙද වදාළසේක.

තව ද මෙහි :–

> “ලක්ඛණං ච අධිට්ඨානං – උප්පත්ති අනුසයො තථා
> ඨානං පවත්ති කාලො ච – ඉන්ද්‍රියඤ්ච ද්විධාදිනා”

යනුවෙන් **ලක්ෂණය**, ආධාරය, උත්පත්තිකාරණය, අනුසය ය, ස්ථානය, පවත්නා කාලය, ඉන්ද්‍රියය, දෙපරිදි ආදි භෙදය, යනුවෙන් විස්තර දතයුතු. “අනුභවන ලක්ඛණා වේදනා” යනුවෙන් මේ වේදනාවන්ගේ ලක්ෂණය පළමු කොට කියන ලදි.

**අධිෂ්ඨානය** නම්, “ඵස්ස පච්චයා වේදනා” යනුවෙන් ප්‍රතීත්‍යසමුත්පාදයෙහි දැක්වූ ක්‍රමයෙන් වේදනාවට ආධාර වූයේ ස්පර්ශය යි. ඵලදෙතකගේ සම ගැලවුණු තැනෙක ඇටමැස්සකු පිදිනා කල ඒ දෙනට දුක්ඛවේදනාව දනෙයි දුක්ඛවේදනාවට හේතු වූ ස්පර්ශය දුක්ඛ වේදනාවට ප්‍රත්‍යයවූ හෙයිනි. මෙසේ ම සුඛ වෙදනීය වූ ස්පර්ශය සැප වේදනාවට ද

උපෙක්‍ෂාවෙදනීය වූ සපශීය උපෙක්‍ෂාවෙදනාවට ද ප්‍රත්‍යය වේ. වේදනාව කුමකට පදසථාන හෙවත් ළංවූ කාරණය වේ ද යත්? "වෙදනා පච්චයා තණ්හා" යනු හෙයින් තෘෂ්ණාවට පදසථාන වෙයි. සැප වේදනාව තණ්හාවට පදසථානවීම පැහැදිලි වුව ද දුක්ඛ උපෙක්ඛා වේදනා දෙක තණ්හාවට කෙසේ පදසථාන වේ ද යත්? සැප විඳිනා තැනැත්තේ මතු මත්තෙහිදු සැප විඳින්නට ම කැමැති වෙයි. දුකෙන් මැඩුණු තැනැත්තේ සැපය කැමැති වෙයි. උපෙක්‍ෂාව ශාන්ත ගුණයක් හෙයින් සැපයට ම බර වේ. එහෙයින් ත්‍රිවිධ වේදනාව ම තෘෂ්ණාවට පදසථාන වේ යයි දතයුතු.

එහෙයින් **විශුද්ධිමාර්ගයෙහි;**

> "දුක්ඛී සුඛං පත්ථයති - සුඛී භියොපි ඉච්ඡති
> උපෙක්ඛා පන සන්තත්තා සුඛ මිච්චෙව භාසිතා
> තණ්හාය පච්චයා තස්මා හොන්ති තිස්සොපි වෙදනා
> වෙදනා පච්චයා තණ්හා - ඉති වුත්තා මහෙසිනා"

යනු කීහ.

**උත්පත්ති කාරණය** නම්, ඉෂ්ටාරම්මණවූ සත්ව සංස්කාරයෝ සැප වේදනාවට ද, අනිෂ්ටාරම්මණවූ සත්ව සංස්කාරයෝ දුක්ඛවෙදනාවට ද, මධ්‍යස්ථාරම්මණ වූ සත්ව සංස්කාරයෝ උපෙක්‍ෂා වේදනාවට ද, උත්පත්ති හේතුහු වෙත්. විපාක වශයෙන් හා සැලකීම් වශයෙනුදු මෙහි ඉෂ්ටානිෂ්ටභාවය දතයුතු. එකකුට ඉෂ්ටවූ දෙය අනිකකුට අනිෂ්ට විය හැකි යි. එකකුට අනිෂ්ටවූ දෙය තව එකකුට ඉෂ්ටවිය හැකි යි. විපරිණාම ලෝකසවභාවය මෙසේ යි.

**අනුසය** නම්, කෙලශ විශේෂයකි. මාර්ගඥානයෙන් දුරු නොකළ කෙලෙස් සිත තුළ යටපත්ව තිබී යම්කිසි සුදුසු කරුණක් එළඹ සිටි කල මතු වෙයි. එතෙක් ඒ කෙලෙස් සිත තුළ සයනය කළවුන් වැනිව පවතී. එහෙයින් "අනු අනු සන්තානෙ සෙන්තීති අනුසයා, කාරණලාභෙ සති උප්පජ්ජනාරහා මූසිකවිසං විය" යනු කීහ.

මෙනමින් දක්වන කෙලෙස් සතෙකි. එනම් කාම-රාගානුසය, භවරාගානුසය, පටිඝානුසය, මානානුසය, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය අවිජ්ජානුසය යනු යි.

ලෝකයෙහි යම් රූපයක් සමකුට ප්‍රිය නම් මිහිරි නම් එහි **කාමරාගානුසය** උපදී. යම් රූපයක් අප්‍රිය නම් අමිහිරි නම් එහි **පටිඝානුසය** උපදී. මෙදෙක්හි **අවිජ්ජානුසය** ඇතුළත් වේ. එයට **මානානුසය, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය,** යන තුනම සම්බන්ධ වෙත්. කාමරාගානුසය මෙන් ම රූපාරූප භවයන්හි ඇලීම **භවරාගානුසය,** නම් වේ.

**එහෙයින් වදාළහ විභංග ප්‍රකරණයෙහි** "යං ලොකෙ පියරූපං, සාතරූපං, එත්ථ සත්තානං කාමරාගානුසයො අනුසෙති, යං ලොකෙ අප්පියරූපං, අසාතරූපං, එත්ථ සත්තානං පටිඝානුසයො අනුසෙති, ඉති ඉමෙසු ද්විසු ධම්මෙසු අවිජ්ජානුපතිතා තදෙකට්ඨො මානො ච දිට්ඨි ච විචිකිච්ඡා ච දට්ඨබ්බා" යි.

ත්‍රිවිධ වේදනාවන් අතුරෙහි සැප වේදනායෙහි කාමරාගානුසයත්, දුක්ඛවෙදනායෙහි පටිඝානුසයත්, උපේක්ෂාවේදනායෙහි අවිජ්ජානුසයත් උපදින්නට ඉඩ ඇත්තේ ය. දිට්ඨානුසය හා මානානුසයත් රාගපාක්ෂිම වෙත්. එහෙයින් සැපයෙහි අභිනන්දනවූ හෙවත් සතුටුවූ දෘෂ්ටිගතිකයෝ සත්වයා සදාකාලිකය යි සනාතය දෘෂ්ටියෙහි බැස ගනිත්. මාන සවභාවය ඇත්තෝ මම අසවලාට වඩා ශ්‍රෙෂ්ඨයෙමි යි යනාදි වශයෙන් ජල්පනය කෙරෙත්. වචිකිච්ඡානුසය අවිජ්ජානුසයට ම පක්ෂපාත වේ. එහෙයින් **පටිච්චසමුප්පාද විභංගයෙහි** "වෙදනා පච්චයා විචිකිච්ඡා"යි වදාළහ. **ස්ථානය** නම් කය හා සිත යි. මෙදෙක වේදනාවන්ගේ පැවැත්මට ස්ථානයෝ වෙති. යම් කලෙක්හි කායික සැපයත් කායසස්පර්ශයෙන් වූ සැපයත් මිහිරක් වේ නම් ඕ කායිකවේදනා නමැ යි ද සිත්හි හටගත් චිත්ත

ස්පර්ශයෙන් නිපන් මිහිරක් සැපයක් වේ නම් ඒ චෛතසික වේදනාය යි ද දතයුතු. එහෙයින් "යං තස්මිං සමයෙ කායිකං සුඛං, කායසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං - යං තස්මිං සමයෙ චෙතසිකං සුඛං, චෙතො සම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං" යි වදාළහ.

**ප්‍රවෘත්ති කාලය** නම්, සැප දුක් දෙදෙනාගේ පවත්නා කාලය යි. සැප වේදනාවෙහි- පවත්නා කාලය පමණක් සැප යයි ද පෙරළෙන කාලය දුකය යි ද, දුඃඛවේදනාශෙහි- පවත්නා කාලය දුකය යි ද, පෙරළෙන කාලය සැපය යි ද, සැප වේදනායෙහි- ඇති බව සැපය යි ද, නැති බව දුක ය යි ද, දුඃඛවේදනායෙහි- ඇති බව දුකය යි ද, නැතිබව සැපය යි ද, උපෙක්ෂා වේදනායෙහි- දැනීම සැපය යි ද, නොදැනීම දුකය යි ද දතයුතු.

එහෙයින් මජ්ඣිමනිකායෙහි **චූළවෙදල්ල සූත්‍රයෙහි** "සුඛා ඛො ආවුසො විසාඛ වෙදනා ඨිති සුඛා විපරිනාම දුක්ඛා, දුක්ඛා ඛො ආවුසො විසාඛ වෙදනා ඨිති දුක්ඛා, විපරිණාම සුඛා, අදුක්ඛමසුඛා ඛො ආවුසො විසාඛා වෙදනා ඤාණ සුඛා, අඤ්ඤාණ දුක්ඛා" යි වදාළහ.

**ඉන්ද්‍රිය** නම් මේ ත්‍රිවිධ වේදනාවෝ ඉන්ද්‍රිය දේශනාවට පැමිණ සුඛින්ද්‍රිය දුක්ඛින්ද්‍රිය සොමනස්සින්ද්‍රිය දොමනස්සින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය යි පස් පරිද්දෙකින් යොදන ලදහ අධිපති හෙයින් ඉන්ද්‍රිය නම් වේ. කායික සැපය සුඛින්ද්‍රිය යයි ද, දුක දුක්ඛින්ද්‍රිය යි ද, මානසික සැපය සොමනස්සින්ද්‍රිය යි ද, දුක දොමනස්සින්ද්‍රිය යි ද, එදෙකට ම මධ්‍යස්ථ වූ ධර්මය උපෙක්ඛින්ද්‍රිය යි ද දතයුතු තවද කායික චෛතසික සැප දුක් වේදනා දෙක ම සුඛින්ද්‍රිය සොමනස්සින්ද්‍රිය දුක්ඛින්ද්‍රිය දොමනස්සින්ද්‍රිය යි කොටස් කරන ලද නමුත් උපෙක්ඛින්ද්‍රියයෙහි ප්‍රභේදයක් කළ නොහැකි ය.

**ඕඝාදි** වශයෙන් වනාහි සියලු වේදනාවෝ විඳීම් අර්ථයෙන් එක් පරිදි වුව ද ඇසුරු කිරීම් වශයෙන් කය ඇසුරු කළ වේදනාවන් කායික නමින් ද, සිත ඇසුරු

කල වේදනාවන් චෛතසික නමින් ද, දක්වනු ලැබේ. සුඛ, දුක්ඛ, උපෙක්ඛා වශයෙන් ත්‍රිවිධ වෙයි. සතර යෝනි වශයෙන් චතුර්විධ වේ. ඉන්ද්‍රිය වශයෙන් හා ගති වශයෙන් ද පඤ්චවිධ වේ. ද්වාර වශයෙන් හා අරමුණු වශයෙන් ද ෂඩ්විධ වේ. සප්ත විඥානධාතු වශයෙන් සප්තවිධ වේ. අෂ්ට ලෝකධර්ම වශයෙන් අෂ්ටවිධ වේ. අතීත අනාගත පච්චුප්පන්න අජ්ඣත්ත බහිද්ධා ඔළාරික සුඛුම හීන පණීත දූර සන්තික වශයෙන් නව වැදෑරුම් වේ. එය ම අධ්‍යාත්මික බාහිර වශයෙන් අෂ්ටාදශවිධ වේ. එසේ ම රූපාදි ෂඩාරම්මණයන්හි එකෙකෙහි තුනක් තුනක් බැගින් ගෙන අටළොස් මනොපවිචාරයන්ගේ වශයෙන් දහ අටෙක් වේ.

එහෙයින් :-

"චක්ඛුනා රූපං දිස්වා සොමනස්සට්ඨානියං රූපං උපවිචරති, දොමනස්සට්ඨානියං, — උපෙක්ඛාට්ඨානියං රූපං උපවිචරති, — පෙ — උපෙක්ඛාට්ඨානියං ධම්මං උපවිචරති" යි වදාළහ.

එසේ ම ගෙහසිත සොමනස්ස සයය, ගෙහසිත දොමනස්ස සයය, ගෙහසිත උපෙක්ඛා සය යයි මෙසේ වේදනා දහඅටෙකි. නෙක්ඛම්මසිත වේදනා ද දහ අටෙකැයි මෙසේ සතිසෙකි අතීතයෙහි සතිසෙක, අනාගතයෙහි සතිසෙක, වර්තමානයෙහි සතිසෙකැයි අෂ්ටෝත්තර ශතයෙක් හෙවත් තණ්හාව මෙන් ම වේදනාවන්ගේ ද එකසිය අටක් ප්‍රභෙදයෝ වෙත්.

**තුන්වන සූත්‍ර විවරණය යි.**

## 3 - 1 - 4

**වුත්තං හේතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා, කතමා තිස්සො? **සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා** සුඛා භික්ඛවෙ වෙදනා දුක්ඛතො දට්ඨබ්බා, දුක්ඛා වෙදනා සල්ලතො

දට්ඨබ්බා, අදුක්ඛමසුඛා වෙදනා අනිච්චතො දට්ඨබ්බා, යතො ඛො භික්ඛවෙ භික්ඛුනො සුඛා වෙදනා දුක්ඛතො දිට්ඨා හොති, දුක්ඛා වෙදනා සල්ලතො දිට්ඨා හොති, අදුක්ඛමසුඛා වෙදනා අනිච්චතො දිට්ඨා හොති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරියො සම්මද්දසො, අච්ඡෙච්ඡි තණ්හං, වාවත්තයි සංයොජනං, සම්මා මානාභිසමයා අන්ත මකාසි දුක්ඛස්සා'ති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

යො සුඛං දුක්ඛතොද්දක්ඛි දුක්ඛමද්දක්ඛි සල්ලතො
අදුක්ඛමසුඛං සන්තං අද්දක්ඛි නං අනිච්චතො.
ස වෙ සම්මද්දසො භික්ඛු යතො තත්ථ විමුච්චති
අභිඤ්ඤ වොසිතො සන්තො ස'වෙ යොගාතිගො මුනි,

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති

## 3 - 1 - 4

**අර්ථය:-**

**සුඛා වෙදනා**, සැප වේදනාව; **දුක්ඛතො**, විපරිණාම දුක්ඛ වශයෙන්; **දට්ඨබ්බා**, දැක්ක යුත්තී ය; **සල්ලතො**, ශල්‍ය දුකක් වශයෙන්; **අනිච්චතො**, අනිත්‍ය වශයෙන්; **අරියො**, කෙලෙසුන් දුරුකළ හෙයින් ආර්‍ය්‍ය යයි ද; **සම්මද්දසො**, සියලු වේදනාවන් හෝ චතුස්සත්‍යධර්මයන් ඇත්වූ පරිදි අවබෝධ කළ තැනැත්තෙකැ යි ද; (සච්චද්දසො යි ද පාඨ යි) **තණ්හං**, වේදනා මූලක තෘෂ්ණාව; **අච්ඡෙච්ඡි**, අර්හත්මාර්ග ඥානයෙන් සින්දේ ය; **සංයොජනං**, දශ සංයෝජනය; **වාවත්තයි**, පෙරළා හැරියේ ය; **සම්මා**, මනා හේතුවෙන්; **මානාභිසමයා**, නවවිධ මානයාගේ දුරලීමෙන්; **දුක්ඛස්ස**, සංසාර දුඃඛයාගේ; **අන්තං අකාසි**, කෙළවර කෙළේ යැ යි; **වුච්චති**, කියනු ලැබේ.

**යො**, යම් ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක්; **සුඛං**, සැප වේදනාව; **දුක්ඛතො**, දුක් වශයෙන්; **අද්දක්ඛි**, දුටුයේ වේ ද; **දුක්ඛං**, දුක්ඛවේදනාව; **සල්ලතො**, ශල්‍යයක් මෙන්; **අද්දක්ඛි**, දුටුයේ

වේ ද; **සන්තං**, ශාන්ත වූ; **තං අදුක්ඛමසුඛං**, ඒ උපෙක්ෂා වේදනාව; **අනිච්චතො**, අනිත්‍ය වශයෙන්; **අද්දක්ඛි**, දුටුයේ වේ ද;

**සම්මද්දසො**, ඒ ත්‍රිවිධ වේදනාවන් නුවණින් දක්නා වූ; **සො භික්ඛු**, ඒ යෝගාවචර තෙම; **යතො**, යම්හෙයකින් නොහොත් ත්‍රිවිධ ද්වාරයෙන් සංයතවූ සිත් ඇතිව; **තත්ථ**, ඒ වේදනායෙහි; **විමුච්චති**, (වේදනාවන් පිළිබඳ ඡන්දරාගය දුරුකිරීමෙන්) සමුච්ඡෙද විමුක්ති වශයෙන් මිදේ ද; **අභිඤ්ඤාවොසිතො**, ෂට් අභිඥයෙන් නිමවනලද කෘත්‍ය ඇති; **සන්තො**, ශාන්තවූ; **සො මුනි**, ඒ ක්ෂීණාශ්‍රව මුනිතෙම; **වෙ**, ඒකාන්තයෙන්; **යොගාතිගො**, කාමයොගාදි සතර යෝගයන් ඉක්මවූවෙක් වෙයි.

භාවය :- සුගම යි.

**ධර්ම විස්තර**:-

> **දුක්ඛතො දක්ඛබ්බා, සල්ලතො දට්ඨබ්බා,**
> **අනිච්චතො දට්ඨබ්බා,**

සැප වේදනාව විපරිණාම දුක වශයෙන් දුකය යි නුවණින් දතයුතු යි. යම් සේ ශරීරයෙහි ඇනුණු උලක් ඉවතට ඇදදැමීම දුෂ්කර හෙයින් බලවත් වේදනා උපදවා ද එමෙන් දුක්ඛවේදනාව ශල්‍යයක් මෙන් දතයුතු ය. උපෙක්ෂා වේදනාව ඇතිව නැතිවන හෙයින් ද තාවකාලික හෙයින් ද නිත්‍ය නො වන හෙයින් ද අනිත්‍යය යි දත යුතු යි.

එසේද වුවත් මේ හැම වේදනාවක් ම අනිත්‍යය යි සැලකීම වේදනා කර්මස්ථානය වඩන යොගාවචරයාහට නිර්වාණගාමිනී ප්‍රතිපදාව වන්නේය යි සැලකිය යුතු යි. පෘථග් ජනයන් සැප ම සොයන හෙයින් සැපයෙහි කලකිරවනු පිණිසත් දුඃඛ දර්ශනය විරාගයට හේතුවක් වන හෙයිනුත් ''සුඛා වෙදනා දුක්ඛතො දට්ඨබ්බා, දුක්ඛා වෙදනා සල්ලතො දට්ඨබ්බා''යි වදාළහ. සියලු වේදනාවන් අනිත්‍යය යි සැලකූ

කල අනිත්‍ය දර්ශනය වේදනාවන් පිළිබඳ දුඃඛපදර්ශය පිළිබිඹු කරවන හෙයින් "යදනිච්චං තං දුක්ඛං" යමක් අනිත්‍ය නම් හේ දුකය යි සැලකීමෙන් "යංකිඤ්චි වෙදයිතං සබ්බං තං දුක්ඛස්මින්ති වදාමි" යන වේදනාවන් පිළිබඳ නිෂ්පර්යාය දේශනාව ස්ඵුට කෙරෙ යි.

එක් එක් වේදනාවක් සම්මර්ශනය කිරීමේ ප්‍රතිඵල වෙන් වෙන් කොට සැලකීමේ දී සැප වේදනාව සැපය යි සැලකීමෙන් රාගානුසය ද, දුක්ඛවේදනාව දුක යයි සැලකීමෙන් පටිඝානුසය ද, උපෙක්ෂා වේදනාව අනිත්‍ය වශයෙන් සැලකීමෙන් අවිජ්ජානුසය ද දුරු කළ හැකි බැවින් මේ වේදනා ත්‍රය භාවනාවක් වශයෙන් වැඩීමෙන් රාග ද්වෙෂ මෝහ යන් නැති කළහැකි වෙ යි.

එසේ ම පළමුවැන්නෙන් සුඛාශ්වාදයට හේතු වන තෘෂ්ණා සංක්ලෙශ ප්‍රහාණය ද, දෙවැන්නෙන් දුක නො දන්නවුන් දුසිරිත් කරන හෙයින් එයින් වළකනු සඳහා දුශ්චරිත සංක්ලෙශ ප්‍රහාණය ද, තෙවැන්නෙන් සියලු දෘෂ්ටීන්ට මුල් වන අවිද්‍යාව දුරලීමෙන් දෘෂ්ටිසංක්ලෙශ ප්‍රහාණය ද දක්වයි.

එසේම පළමුවැන්නෙන් සැප වේදනාව පෙරළුනු කල දුක්ඛොත්පත්තියට හේතුවන බැව් සැලකීමෙන් විපරිණාම දුඃඛපරිඥාව ද, දෙවැන්නෙන් සියලු කායික චෛතසික දුක්ඛවේදනාවන් ස්වභාවයෙන් ම දුකබව සැලකීමෙන් දුක්ඛදුක්ඛපරිඥාව ද, තුන්වැන්නෙන් සියලු ත්‍රෛභූමක සංස්කාරයන් ම සංස්කාරදුකට ඇතුළත් වන බැව් සැලකීමෙන් සංස්කාරදුඃඛ පරිඥාව ද ඇතිකරගතහැකි වේ.

එසේ ම පළමුවැන්නෙන් ඉෂ්ටාරම්මණයෙහි යොනිසොමනසිකාරයෙන් පිරිසිඳ දැනීම ද, දෙවැන්නෙන් අනිෂ්ටාරම්මණයෙහි පිරිසිඳ දැනීම ද, තුන්වැන්නෙන් මධ්‍යස්ථාරම්මණයෙහි පිරිසිඳ දැනීමදැ යි ත්‍රිවිධ පරිඥාව ඇතිකර ගත හැකි වෙයි.

එසේ ම පළමුවැනි සැපවේදනාව දුක් වශයෙන් සැලකීමෙන් උපදවන දුක්ඛානුපස්සනායෙන් **අප්‍රණිහිත** විමොක්ෂය ද, දෙවැනි වූ ද්වේෂ ප්‍රහාණයට හේතුවූ අධිමාත්‍ර දුඃඛ සංඥයෙන් උපදවන අනිච්චානුපස්සනායෙන් **අනිමිත්ත විමොක්ෂය** ද, තෙවැන්නෙන් අවිද්‍යාව නැසීමෙන් උපදවන අනත්තානුපස්සනායෙන් **සුඤ්ඤත** විමොක්ෂය ද දක්වන ලද්දේ ය. මෙසේ ත්‍රිවිධ වේදනායෙන් අනිත්‍ය, දුඃඛ, අනාත්මයන් සැලකීම වේදනා කම්ස්ථානය වඩන යෝගාවචරයාහට විමොක්ෂද්වාර හෙවත් නිවනෙහි දොරටු තම් වන්නේ ය යි දතයුතු යි.

**සතර වන සූත්‍ර විවරණය යි.**

## 3 - 1 - 5

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

තිස්සො ඉමා භික්ඛවෙ එසනා, කතමා තිස්සො? **කාමෙසනා**, **භවෙසනා**, **බ්‍රහ්මචරියෙසනා**, ඉමා ඛො භික්ඛවෙ තිස්සො එසනාති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති,

"සමාහිතො සම්පජානො සතො බුද්ධස්ස සාවකො
එසනා ච පජානාති එසනානඤ්ච සම්භවං
යත්ථ චෙතා නිරුජ්ඣන්ති මග්ගඤ්ච ඛයගාමිනං
එසනානං ඛයා භික්ඛු නිච්ඡාතො පරිනිබ්බුතො ති,

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

## 3 - 1 - 5

අර්ථය:-

**එසනා**, සෙවීම්; **ඉමා තිස්සො**, මොවුහු තිදෙනෙක; **කාමෙසනා**, කාමයන් පිළිබඳ පයෙෂණය; **භවෙසනා**, භවයන් **පිළිබඳ** **ගවේෂණය**; **බ්‍රහ්මචරියෙසනා**, දෘෂ්ටීන් **පිළිබඳ** අන්වෙෂණය හෙවත් සෙවීමය යන තුන යි;

**සෙස්ස**:- සුගම යි.

**ධර්ම විස්තර:-**

**කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා,**

කාමයන් පිළිබඳ වූ සෙවීම නොහොත් කාමනම්වූ සෙවීම **කාමෙසනාව** යි. කාමච්ඡන්ද කාමරාග ආදි නම් වලින්ද ප්‍රකාශ වන්නේ මෙය මැ යි. **භවෙසනා** යනු රූපාරූපභවයන් පැතීම යි. භවරාග යනුදු මෙයම ය. බ්‍රහ්මචර්‍ය්‍යාගේ එෂණය **බ්‍රහ්මචරියෙසනා** නමි. ලෝකය නොහොත් ආත්මය සදා කාලික ශ්‍රෙහෝ යි නැද්ශ්‍රෙහෝ යි යන ආදීන් දැක්වූ මිථ්‍යා දෘෂ්ටිය යි. දෘෂ්ටිය යි සම්මතවූ බ්‍රහ්මචර්‍ය්‍යාව නොහොත් රාගදෘෂ්ටීන් සෙවීම **බ්‍රහ්මචරියෙසනා** නමින් දක්වනු ලැබේ. එමතූනොවැ ඒ හා එකතු වූ කර්මයන් මෙහි ගණන් ගනු ලැබේ. සෙස්සෙහිදු මෙසේ මැ යි.

**එහෙයින් විභංග ප්‍රකරණයෙහි:-**

“තත්ථ කතමා **කාමෙසනා**, කාමරාගො, තදෙකට්ඨං අකුසලං කායකම්මං, වචීකම්මං, මනොකම්මං, අයං වුච්චති කාමෙසනා - තත්ථ කතමා **භවෙසනා** භවරාගො, තදෙකට්ඨං අකුසලං -පෙ- මනොකම්මං, අයං වුච්චති භවෙසනා තත්ථ කතමා **බ්‍රහ්මචරියෙසනා** අන්තග්ගාහිකා දිට්ඨි, තදෙකට්ඨං අකුසලං -පෙ- බ්‍රහ්මචරියෙසනා” යනු වදාළහ.

මොවුන්ගේ උපැද්මට හේතුවූයේ අවිද්‍යා තෘෂ්ණා දෙක යි. බ්‍රහ්මචරියෙසනාව සෝවාන්මාර්ගඥනයෙන් ද, කාමෙසනාව අනාගාමි මාර්ගඥනයෙන් ද, භවෙසනාව අර්හත්මාර්ගයෙන් ද නිරුද්ධ වෙයි.

**පස්වන සූත්‍ර විවරණය යි**

## 3 - 1 - 6

### වුත්තං හෙතං භගවතා වුත්ත මරහතා'ති මෙ සුතං

තිස්සො ඉමා භික්ඛවෙ **එසනා**, කතමා තිස්සො? **කාමෙසනා**, භවෙසනා, **බ්‍රහ්මචරියෙසනා**, ඉමා ඛො භික්ඛවෙ තිස්සො **එසනා**ති එත මත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා සහ
ඉති සච්චපරාමාසො දිට්ඨිට්ඨානා සමුස්සයා
සබ්බරාග විරත්තස්ස තණ්හක්ඛය විමුත්තිනො
එසනා පටිනිස්සට්ඨා දිට්ඨිට්ඨානා සමූහතා
එසනානං ඛයා භික්ඛු නිරාසො අකථංකථී'ති,

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

## 3 - 1 - 6

**අර්ථය:-**

**බ්‍රහ්මචරියෙසනා සහ**, බ්‍රහ්මචර්‍ය්‍යෙෂණාව සමග; බ්‍රහ්මචරියෙසනාය සහ යන මෙහි විභක්ති ලෝප යි. (කරණාර්ථයෙහි හෝ ප්‍රථමා යි) **කාමෙසනා**, කාමෙසනාව ය; **භවෙසනා**, භවෙසනාව ය යි (එසනාවෝ තිදෙනෙකි) **ඉතිසච්චපරාමාසො**, මෙය ම සත්‍යය, සෙස්ස අසත්‍යය යි (දෘෂ්ටියට හේතුවූ හෙයින් ම කෙලෙස් උපදවන්නාවූ) **දිට්ඨිට්ඨානා**, මිථ්‍යාදෘෂ්ටීන්ට හේතුවූ; **සමුස්සයා**, ලෝභාදි කෙලෙස් උපදවන්නාවූ; (බ්‍රහ්මචරියෙසනා සහ යන්න හා සම්බන්ධ කරනු) **සබ්බරාග විමුත්තස්ස**, සියලු කාමරාග භවරාගයන්ගෙන් වෙන්වූ; **තණ්හක්ඛයවිමුත්තිනො**, තෘෂ්ණාක්ෂය සංඛ්‍යාත නිවන් අරමුණු කොට කෙලෙසුන්ගෙන් මිදුණාවූ අහීත්හු විසින්; **එසනා**, ත්‍රිවිධ එසනාවෝ; **පටිනිස්සට්ඨා**, දුරුකරන ලද්දාහු ය. **දිට්ඨිට්ඨානා**, දෘෂ්ටිහේතුහු; **සමූහතා**, දුරුකරන ලද්දාහු ය; **එසනානං ඛයා**, එසනාවන්ගේ දුරුකිරීමෙන්; **භික්ඛු**, මහණතෙම; **නිරාසො**, ආශා නැත්තෙකැ යි ද **අකථංකථී**, (දෘෂ්ටිය හා එකාබද්ධවූ) සැකය දුරුකෙළේ ය යි ද කියනු ලැබේ. භාවය හා ධර්මවිස්තර ද සුගම යි.

**සවන සූත්‍ර විවරණය යි**

## 3 - 1 - 7

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං**

තයො මෙ භික්ඛවෙ ආසවා, කතමෙ තයො? **කාමාසවො,** භවාසවො, **අවිජ්ජාසවො,** ඉමෙ ඛො භික්ඛවෙ **තයො ආසවාති,** එතමත්ථං භගවා ආවොච, තත්ථේතං ඉති වුච්චති

"සමාහිතො සම්පජානො සතො බුද්ධස්ස සාවකො
ආසවෙ ච පජානාති ආසවානඤ්ච සම්භවං
යත්ථ චෙතා නිරුජ්ඣන්ති මග්ගඤ්ච ඛයගාමිනං
ආසවානං ඛයා භික්ඛු නිච්ඡාතො පරිනිබ්බුතො"ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

## 3 - 1 - 7

**අර්ථය:-**

**කාමාසවො,** කාමාශ්‍රවය; **භවාසවො,** භවාශ්‍රවය; **අවිජ්ජාසවො,** අවිද්‍යාශ්‍රවය; සෙස්ස සුගම යි.

**ධර්ම විස්තර:-**

කාම ලොකයෙහි පවත්නා රූපාදි අරමුණුවල ඇලීම **කාමාශ්‍රවය** යි. රූපා රූප භවයන්හි ඇලීම හා ධ්‍යාන-යන් පිළිබඳ සතුටත් ශාසවත දෘෂ්ටි සහගත රාගය හා සම්බන්ධ වූ භව ප්‍රාර්ථනාවත් භවාසව නම් වෙයි. නොදැනීම අවිද්‍යාශ්‍රව නම් වෙයි.

**ආසවානඤ්ච සම්භවං:-**

අයොනිසො මනසිකාරය හා අවිද්‍යාදි කෙලෙශයෝත් ආශ්‍රවයන් උපදවන්නාහු වෙති. අකුසල් රැස් කිරීමට අවිද්‍යාව පෙරදැරි වූකල එයට අනුව එහි ලජ්ජා භය දෙක නැතිකම හේතු වෙයි.

එහෙයින්:-

"අයොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා-චෙව ආසවා උප්පජ්ජන්ති, උප්පන්නා ච ආසවා පවඩ්ඪන්ති"-

"අවිජ්ජා භික්ඛවෙ පුබ්බඞ්ගමා අකුසලානං ධම්මානං සමාපත්තියා, අන්වදෙව අහිරිකං අනොත්තප්පං" යනු වදාළහ. මෙහි කාමාශ්‍රවය අනාගාමි මාර්‍ගයෙන් හා භවාශ්‍රව, අවිද්‍යාශ්‍රව දෙක අර්හත් මාර්‍ගයෙන් ද දුරුවෙත්.

**සත්වන සූත්‍ර විවරණය යි**

**3 - 1 - 8**

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං**

තයො මෙ භික්ඛවෙ **ආසවා** කතමෙ තයො? **කාමාසවො, භවාසවො, අවිජ්ජාසවො,** ඉමෙ ඛො භික්ඛවෙ තයො **ආසවාති** එත මත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති

"යස්ස කාමාසවො ඛීණො අවිජ්ජා ච විරාජිතා
භවාසවො පරික්ඛීණො විප්පමුත්තො නිරූපධි
ධාරෙති අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහනන්ති"

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති,

**3 - 1 - 8**

**අර්ථය:-**

**යස්ස,** යම් ආර්‍ය ශ්‍රාවකයකු විසින්; **කාමාසවො,** කාමාශ්‍රවය තෙමේ; **ඛීණො,** ක්‍ෂය කරන ලද ද; **අවිජ්ජා ච,** අවිද්‍යා තොමෝත්; **විරාජිතා,** දුරු කරන ලද්දී ද; **භවාසවො,** භවාශ්‍රවයත්; **පරික්ඛීණො,** දුරු කරන ලද්දේ ද; **විප්පමුත්තො,** එහෙයින් ම කෙලෙසුන් කෙරෙන් මිදුණේ වේ ද; **නිරූපධි,** කෙලෙස් රහිත ද; **සවාහනං මාරං,** කෙලෙස් පිරිවර සහිත මාරයා; **ජෙත්වා,** සිඳ; **අන්තිමං දෙහං,** පශ්චිම ශරීරය; **ධාරෙති,** දරයි;

**සෙස්ස** සුගම යි.

**අටවන සූත්‍ර විවරණය යි**

### 3 - 1 - 9

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

**තිස්සො ඉමා භික්ඛවෙ තණ්හා කතමා තිස්සො? කාම තණ්හා භවතණ්හා විභවතණ්හා** ඉමා ඛො භික්ඛවෙ තිස්සො තණ්හාති. එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.—

"තණ්හායොගෙන සංයුත්තා රත්තචිත්තා භවාභවෙ
තෙ යොගයුත්තා මාරස්ස අයොගක්ඛෙමිනො ජනා
සත්තා ගච්ඡන්ති සංසාරං ජාතිමරණගාමිනො
යෙ ච තණ්හං පහන්ත්වාන වීතතණ්හා ච භවාභවෙ
තෙ ච පාරංගතා ලොකෙ යෙ පත්තා ආසවක්ඛයන්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත්තන්ති.

### 3 - 1 - 9

අර්ථ :-

**කාමතණ්හා**, පඤ්චකාම ගුණික රාගය; **භවතණ්හා**, ශාස්වත දෘෂ්ටිය හා සමග පැවැති රාගය හා රූපාරූප භවයන්හි ඡන්දරාගය; **විභවතණ්හා**, උච්ඡෙද දෘෂ්ටි සහගත රාගය.

**තණ්හායොගෙන**, තෘෂ්ණා සම්බන්ධයෙන්; **සංයුත්තා**, යෙදුණාවූ; **භවාභවෙ**, කුඩා මහත් භවයෙහි; **රත්තචිත්තා**, ඇලුණු සිත් ඇති; **අයොගක්ඛෙමිනො**, නිවන් නොදුටු; **තෙජනා**, ඒ ජනයෝ; **මාරස්ස**, මාරයාගේ; **යොගයුත්තා**, පාපයෝගයෙහි බැඳුනාහු වෙත්.

**ජාතිමරණගාමිනො**, උත්පත්ති මරණ දෙකට යන සුළු වූ; **සත්තා**, ඒ සත්වයෝ; **සංසාරං**, සසරට; **ගච්ඡන්ති**, යෙත්; **යෙ ච**, යම් කෙනෙක්; **තණ්හං පහත්වාන**, තණ්හාව දුරුකොට; **භවාභවෙ**, කුදු මහත් භවයෙහි; **නිතතණ්හා**, තෘෂ්ණා රහිත වෙත් ද; **යෙ සත්තා**, යම් සත්ව කෙනෙක්;

**ආසවක්ඛයං**, කෙලෙසුන් නැති කිරීමට (පැමිණියාහු **ද**) **තෙ**, ඔවුහු; **ලොකෙ**, ලෝකයෙහි; **පාරංගතා**, පරතෙරට පැමිණියාහු **වෙත්;**

**භාවය** - සුගම යි.

**ධර්ම විස්තර:-**

**කාමතණ්හා භවතණ්හා විභවතණ්හා**

ශාස්වත දෘෂ්ටියත් සමග යෙදුණු ඇල්ම රූපාරූප භව **දෙක්හි පවත්නා කල** ඕතොමෝ **භවතණ්හා** නමැයි **ද**, **උච්ඡෙද දෘෂ්ටි** සහගියාවූ රාගය, **විභවතණ්හා** නමැයි **ද** **මෙදෙක හැර සෙසු** සියල්ල ම **කාමතණ්හා** නමැයි **ද** සලකනු **ලැබේ.**

"තත්‍ථ කතමා **භවතණ්හා**, සස්සත දිට්ඨි සහගතො රාගො, සාරාගො, චිත්තස්ස සාරාගො, අයං වුච්චති භව **තණ්හා**"

"**තත්‍ථ කතමා විභවතණ්හා**; උච්ඡෙද දිට්ඨිසහගතො රාගො, සාරාගො, චිත්තස්ස සාරාගො, අයං වුච්චති **විභව තණ්හා**, අවසෙසා තණ්හා **කාමතණ්හා**" යනු **අට්ඨකථා යෙහි** සඳහන්වූ අයුරු යි.

**මේ** ත්‍රිවිධ තෘෂ්ණාවෝ රූපතණ්හා -පෙ- ධම්මතණ්හා යි අරමුණු භෙදයෙන් වෙන් කොට ගත් කල්හි **දහඅටෙකි.** ආධ්‍යාත්මික අරමුණුවල දහඅටෙක. බාහිර අරමුණුවල දහ අටෙකැයි සතිසෙක. අතීත අනාගත වර්තමාන වශයෙන් ගත් කල **එකසිය අටෙකි.** කාලත්‍රයට නොබෙදූ කල්හි සතිසෙකි. ආධ්‍යාත්මික බාහිර වශයෙන් නොගත් කල දහඅටෙක. රූපාදි අරමුණුවලට බෙදීමෙන් පමණක් ගත් කල සදෙතෙකි. ආරම්මණ විභාගයක් නොකළ කල්හි **තිදෙතෙක් ම** වෙති යි දතයුතු යි.

**නව වන සූත්‍ර විවරණය යි.**

## 3 - 1 - 10

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අතික්කම්ම මාරධෙය්‍යං ආදිච්චොව විරොචති, කතමෙහි තීහි? ඉධ භික්ඛවෙ භික්ඛු **අසෙඛෙන සීලක්ඛන්ධෙන** සමන්නාගතො හොති, **අසෙඛෙන සමාධික්ඛන්ධෙන** සමන්නාගතො හොති, **අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන** සමන්නාගතො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අතික්කම්ම මාරධෙය්‍යං ආදිච්චොව විරොචතීති. **එතමත්ථං** භගවා අවොච තත්ථේ'තං ඉති වුච්චති.

''සීලං සමාධි පඤ්ඤා ච යස්ස එතෙ සුභාවිතා
අතික්කම්ම මාරධෙය්‍යං ආදිච්චොව විරොචතීති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති-

**වග්ගො පඨමො**

**තස්සුද්දානං**

මූල ධාතු අථ වෙදනා ද්වෙ එසනා ච ද්වෙ ආසවා ද්වෙ
තණ්හාතො ච අථ මාරධෙය්‍යතො වග්ගමාහු පඨමන්ති
මුත්තමන්ති.

## 3 - 1 - 10

**අර්ථය:-**

**මාරධෙය්‍යං**, මාර විෂය; **අතික්කම්ම**, ඉක්මු; **ආදිච්චො ඉව**, හිරු මෙන්; **විරොචති**, බබලයි; **අසෙඛෙන සීලක්ඛන්ධෙන**, අශෛක්‍ෂ වූ ශීල ගුණයෙන්; සෙස්ස සුගම යි.

**යස්ස**, යම් ආර්‍ය්‍ය ශ්‍රාවකයකු විසින්; **සීලං**, සීලය; **සමාධි**, සමාධිය; **පඤ්ඤා ච**, ප්‍රඥාව ද යන; **එතෙ**, මේ ගුණධර්මයෝ; **සුභාවිතා**, මොනවට වඩනාලද්දූ හු ද; (හෙතෙම) **මාරධෙය්‍යං**, මාරවිෂය; **අතික්කම්ම**, ඉක්මවා; **ආදිච්චො ඉව**, සූර්‍ය්‍යයා මෙන්; **විරොචති**, බබලයි;

**භාවය:-** සුගම යි.

**ධම්මවිස්තර:-**

**අසෙඛ සීලක්ඛන්ධ, සමාධික්ඛන්ධ, පඤ්ඤක්ඛන්ධ**

එක් දවසක් තථාගතයන් වහන්සේ ත්‍රිවිධ ශික්ෂායෙහි හික්මෙනු කැමැති භික්ෂු පිරිසක් පිරිවරා වැඩහුන්සේක් ඔවුන්ගේ අදහස් දැන මත්තෙහි විශේෂාධිගමය සඳහා අසෙඛ භූමිය වර්ණනාකරනසේක් මේ දේශනාව වදාළසේක.

ත්‍රිවිධ ශික්ෂායෙහි හික්මෙන ආර්‍යයෝ ශෛක්ෂයෝ යි. ඔවුහු නම් ලෝකෝත්තර සතරමාර්ගයට හා ඵලත්‍රයටත් පැමිණි ආර්‍යපුද්ගලයෝ සත්දෙනා වෙති. රහත් ඵලයට පැමිණි ආර්‍යපුද්ගලයා අසෙඛ නම් වෙයි. කුමක් හෙයින් ද යත්? අර්හත්ඵලාවබෝධයෙහිදී ඔහුගේ ශික්ෂණය කෙළවර වූ හෙයිනි. අශෛක්ෂධර්මයන් ස්කන්ධ වශයෙන් කොටස් තුනකට බෙදා දේශනාකෙළේ රහතන් වහන්සේගේ ගුණවිශේෂය දක්වනු සඳහා ය.

අර්හත්ඵල සිතෙහි එක්ව උපදනා සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව යන විරතිත්‍රය **අසෙඛ සීලක්ඛන්ධ** නම් වේ. සම්මාසමාධිය හා එයට උපකාරවූ සම්මාවායාම සම්මාසති යන දෙදෙන **අසෙඛසමාධිස්කන්ධයට** ඇතුළත් වෙති. එසේ ම සම්මාදිට්ඨිය හා එයට උපකාරවූ සම්මාසඞ්කප්පය ද **ප්‍රඥාස්කන්ධයෙහි** ඇතුළත් වෙයි. මෙසේ මේ අර්හත්ඵල සිතෙහි උපදනා මාර්ගාඞ්ග ධර්මයන් ස්කන්ධත්‍රයට ඇතුළත් කොට වදාළහ.

**දහවෙනි සූත්‍ර විවරණ යි.**

**පළමුවන වර්ගය නිමි.**

## 3 - 2 - 1

## දුතියො වග්ගො

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

තීණිමානි භික්ඛවෙ පුඤ්ඤකිරියවත්ථූනි කතමානි තීණි? දානමයං පුඤ්ඤකිරියවත්ථු, සීලමයං පුඤ්ඤකිරියවත්ථු, භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු, ඉමානි ඛො භික්ඛවෙ තීණි පුඤ්ඤකිරියවත්ථූනීති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

පුඤ්ඤමෙව සො සික්ඛෙය්‍ය ආයතග්ගං සුඛුද්‍රයං
දානඤ්ච සමචරියඤ්ච මෙත්තචිත්තඤ්ච භාවයෙ
එතෙ ධම්මෙ භාවයිත්වා තයො සුඛ සමුද්දයෙ
අබ්‍යාපජ්ඣං සුඛං ලොකං පණ්ඩිතො උපපජ්ජතී ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

## 3 - 2 - 1

## දෙවෙනි වර්ගය

**අර්ථය :**

**පුඤ්ඤකිරිය වත්ථූනි**, පුණ්‍යක්‍රියාවස්තූහු; **ඉමානි තීණි**, මොවුහු තිදෙනෙකි; **දානමයං පුඤ්ඤකිරියවත්ථු**, දානමය පුණ්‍යක්‍රියාවස්තුව ය; **සීලමයං පුඤ්ඤකිරියවත්ථු**, සීලමය පුණ්‍යක්‍රියාවස්තුව ය; **භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු**, භාව-නාමය පුණ්‍යක්‍රියාවස්තුව ය යන තුන යි.

ගාථාවන්ගේ අර්ථය එකක නිපාත තුන් වැනි වර්ගයෙහි දෙවෙනි සූත්‍රයට ලියූ අයුරෙන් දතයුතු ය.

**භාවය:-** සුගම යි.

**ධර්මවිස්තර:-**

**දානමයං පුඤ්ඤකිරියවත්ථු:-**

පූජා වශයෙන් හෝ අනුග්‍රහ වශයෙන් හෝ තමා සතු දෙය අන්‍යයන්ට පරිත්‍යාග කිරීමේ චේතනාව දානය යි. සිවු පසයන් අතුරෙහි හෝ ආහාර පාන ගෘහ වස්ත්‍ර ආදි

දශදාන වස්තූන් අතුරෙහි හෝ රූපාදි සවැදෑරුම් අරමුණු විෂයෙහි හෝ ඒ ඒ වස්තුවක් දීම සඳහා ඒ ඒ දෑය නිපද වීමෙහි පටන් පූර්වභාගයෙහි ද හෙවත් මුල් අවස්ථායෙහි ද, එය පරිත්‍යාග කරන කාලයෙහි ද හෙවත් මැද අවස්ථා යෙහි ද, දීමනාවෙන් පසු එය සතුටින් මෙනෙහි කරන කාලයෙහි ද හෙවත් අග අවස්ථායෙහි දැ යි මෙසේ පුබ්බ චෙතනා, මුඤ්චන චෙතනා, අපර චෙතනාවන්ගේ වශයෙන් තුන් කාලයෙහි පැවති චේතනාව දානමය පුණ්‍යක්‍රියාවස්තු නම් වේ.

එහෙයින් කීහ ධම්මපදට්ඨකථායෙහි:—

"පුබ්බෙව දානා සුමනො - දදං චිත්තං පසාදයෙ
දත්වා අත්තමනො හොති, එසා යඤ්ඤස්ස සම්පදා"යි.

"දන් දෙනුවන් විසින් දානයෙන් පූර්වභාගයෙහි තුෂ්ටවූව මැනව, දෙමින් චිත්තප්‍රසාද කළ මැනව, දී සොමනස් වූව මැනව, මෙය දාන සම්පත් නම්"යි.

"තං තං දෙන්තස්ස තෙසං තෙසං උප්පාදනතො පට්ඨාය පුබ්බභාගෙ, පරිච්චාගකාලෙ, පච්ඡා සොමනස්සචිත්තෙන අනුස්සරණකාලෙ චාති තීසු කාලෙසු පවත්තචෙතනා **දානමයං පුඤ්ඤකිරියවත්ථු** නාම" යනු **අට්ඨසාලිනී යි**.

එසේම දානමය පුණ්‍යක්‍රියා වස්තුව වනාහි දානක් දෙන්නෙම් යි සිතන්නහුට උපදී. දෙමි, දින්මි යි සිතන්නහුට උපදී. මවිසින් දානක් දෙනලදැ යි දුන් පසු නුවණින් සලකන්නහුට උපදී. මෙසේ පුබ්බචෙතනා, මුඤ්ච චෙතනා අපර චෙතනා යන ත්‍රිවිධ චෙතනාවන් එකතු කොට ගත් කල **දානමය පුණ්‍යක්‍රියා** වස්තු නම් වේ

එහෙයින් කීහ **අට්ඨසාලිනියෙහි**:—

"දානමයං තාව දානං දස්සාමීති චින්තෙන්තස්ස උප්පජ්ජති, දානං දදතො උප්පජ්ජති, දින්නං මෙති පච්චවෙක්ඛන්තස්ස උප්පජ්ජති එවම්පි පුබ්බචෙතනා, මුඤ්චනචෙතනා, අපර චෙතනාති තිස්සොපි චෙතනා එකතො කත්වා දානමයං පුඤ්ඤකිරිය වත්ථු නාම"යි.

දනක් දෙන්නෙමි යි සිතන තැනැත්තේ කාමාවචර කුසල් සිත් අටෙන් එක්තරා සිතකින් සිතයි. දෙනු ලබමින් ද එසේ ම සිත යි. දුන් පසු ද මවිසින් දනක් දෙන ලදැ යි සලකන්නහුටත් එයින් ම එක්තරා සිතකින් සැලකිය හැකිවෙ යි.

එහෙයින් කීහ අට්ඨසාලිනියෙහි:—

"දානං දස්සාමීති චින්තෙන්තො අට්ඨන්නං කාමාවචර කුසලචිත්තානං අඤ්ඤතරෙන චින්තෙති, දදමානොපි තෙසං යෙව අඤ්ඤතරෙන දෙති, දානං මෙ දින්නන්ති පච්චවෙක්ඛ න්තොපි තෙසං යෙව අඤ්ඤතරෙන පච්චවෙක්ඛති"යි.

මෙහි කුශලධර්මයාගේ රැස්වීම සවැදෑරුම් ය. තමා විසින්ම කල්පනා කොට කරන පින් ද ඇත. අනුන් ලවා කරවන පින් ද ඇත. තමාගේ සිය තින් කරන පින් ද ඇත. අනුන් ලවා කරවන පින් ද ඇත. විපාක සලකා දැනගෙන කරන පින් ද ඇත. නොදැන කරන පින් ද ඇත. මෙසේ කුසලයන්ගේ සවැදෑරුම් ප්‍රභේද ද දතයුතු.

එහෙයින් කීහ අට්ඨසාලිනියෙහි.

"ඉමස්මිං ඨානෙ ඡබ්බිධෙන පුඤ්ඤායූහනං නාම ගහිතං, පුඤ්ඤං හි අත්ථි සයංකාරං, අත්ථි පරංකාරං, අත්ථි සාහත්ථිකං, අත්ථි ආණත්තිකං, අත්ථි සම්පජානකතං, අත්ථි අසම්පජාන කතං"යි.

මෙහි දක්ඛිණා විසුද්ධි ද සතරෙකි. තමන් දනය සඳහා රැස් කරන ප්‍රත්‍යයයන්ගේ ධාර්මික බව, අලෝභ අද්වෙෂ අමෝහ යන කුශල චේතනාවන්ගේ මහත් බව, වස්තු සම්පත්තිය හා ප්‍රතිග්‍රාහකයන්ගේ ගුණ මහත්වය ද යන මේ යි

එහෙයින් කීහ අට්ඨසාලිනියෙහි:—

"ඉමස්මිං ඨානෙ චතස්සො දක්ඛිණා විසුද්ධියො ගහිතා පච්චයානං ධම්මිකතා, චෙතනාමහත්තං, වත්ථුසම්පත්ති, ගුණාතිරෙකතා"යි.

**සීලමයං පුඤ්ඤකිරිය වත්ථු:-**

නිත්‍ය ශීල වශයෙන් හෝ උපෝසථ නියමාදි වශයෙන් හෝ පන්සිල් අටසිල් දසසිල් සමාදන් වන්නහුට ද, සිල් ගැනීම සඳහා පිටත්ව විහාරයට යන්නහුට ද, පැවිදි වන්නහුට ද, පැවිද්ද ලැබීමෙන් තමාගේ මනදොළ මුදුන් පමුණුවා ගෙන මම මේ සස්නෙහි දුලභවූ පැවිද්ද ලැබුයෙමි. අනේ එය යහපතැ යි සලකන්නහුට ද, සැදැහැයෙන් ප්‍රාතිමෝක්ෂ සංවර සීලය පුරන්නහුට ද, නුවණින් සිවුපසය ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුට ද, සදොරින් ගන්නා රූපාදි අරමුණුවල සිහියෙන් ඉන්ද්‍රිය සංවරය ඇත්තාහට ද, වීර්‍යයෙන් ආජීවය පිරිසිදු කරන්නහුට ද, පැවති කුශල චේතනාව තුන්දොර හික්මවන හෙයින් **සීලමය පුණ්‍යක්‍රියා** වස්තු නම් වේ.

**භාවනාමය පුඤ්ඤකිරිය වත්ථු**

**පටිසම්භිදායෙහි** කියන ලද අයුරෙන් ඇස අනිත්‍යය දුක්ඛය අනාත්මය යි විදසුන් වඩන්නාහට ද, කන, නාසය, දිව, ශරීරය, සිත, රූප ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම අනිත්‍යය දුක්ඛය අනාත්ම ය යි සලන්න්නහුට ද, චක්ෂුර් විඥානය -පෙ- මනොවිඥානය චක්ෂුසංස්පර්ශය -පෙ- මනඃ සංස්පර්ශය - චක්ෂුසංස්පර්ශජ වේදනාව -පෙ- මනඃ සංස්පර්ශජ වේදනාව - රූපසංඥාව -පෙ- ධර්ම සංඥාව අනිත්‍යය දුක්ඛය අනාත්ම ය යි සලකන්නහුට ද ජරා මරණය අනිත්‍යය දුක්ඛය අනාත්මය යි සලකන්නහුට ද ඇතිවන චේතනාව භාවනාමය පුණ්‍යක්‍රියා වස්තු නම් වේ.

එසේ ම පඨවිකසිණාදි අරමුණුවල පවත්නා ධ්‍යාන චේතනාව ද, නිරවද්‍යශිල්ප කර්මාන්ත විද්‍යා ශාස්ත්‍රයන් පුරුදු පුහුණු කිරීමේ දී ඇතිවන කුශල චේතනාවද යි යන මේ සියල්ල භාවනාමය පුණ්‍යක්‍රියා නම් වේ.

මෙහි දැක්වූ අටතිස් අරමුණ නම්, පඨවි කසිණ, ආපො කසිණ, තෙජො කසිණ, වායො කසිණ, නීල කසිණ, පීත කසිණ, ලොහිත කසිණ, ඔදාත කසිණ යන අෂ්ට කසිණය ද උද්ධුමාතක, විනීලක, විපුබ්බක, විච්ඡිද්දක, වික්ඛායිතක, හතවික්ඛිත්තක, ලොහිතක, පුලවක, අට්ඨික යන දශ අසුභය ද, බුද්ධානුස්සති, ධම්මානුස්සති, සඞ්ඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති, උපසමානුස්සති, යන සප්තානුස්මෘති ද - කායගතාසති. මරණසති, ආනාපාන සති යන ත්‍රිවිධ ස්මෘති ද - මෙත්තා කරුණා, මුදිතා උපෙක්ඛා යන බ්‍රහ්මවිහරණ ද - ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන සතර අරූපාවචර ධර්ම ද - චතුධාතුවවත්ථානය හා ආහාර පටික්කූලසඤ්ඤාව යන මේ දෙක ද යි මෙසේ අෂ්ට ත්‍රිංශත් ප්‍රභේද වූ අරමුණු යි.

තෙමේ විවේකස්ථානයක හිඳ තමාගේ කය හොඳ හැටි පිහිටුවාගෙන භාවනා කරන්නහුට ඔහුගේ භාවනාව කාය කර්ම වන්නේය යි ද, වචනයෙන් කිය කියා භාවනා කරන්නහුට වාක්කර්ම වන්නේය යි ද, සිතින් සිතන්නහුට මනෝ කර්ම වන්නේය යි ද දතයුතු.

ආහාර ආදි යම් කිසිවක් දෙන කල්හි දෙමි යි කියා සිතමින් හෝ බෝධිසත්ත්වවරයන්ගේ දාන පාරමිතාව සලකා ගෙන හෝ දෙන කල්හිදු **දානමය** පුණ්‍ය ක්‍රියා වස්තු නම් වේ. දන් දීම බෞද්ධ චාරිත්‍රයක් යයි සලකා දීම **සීලමය** පුණ්‍යක්‍රියා වස්තුවට අයත් වේ. මේ දෙන සියල්ලම නැති වන සුලුය. ගෙවී යන සුලුය. විනාශ වන සුලුය යි එහි අනිත්‍යතාදිය සලකා දෙන්නහුට **භාවනාමය** පුණ්‍ය ක්‍රියා වස්තුව සිද්ධ වන්නේ ය.

තවත් පින්කිරියවත් සතෙකි. එනම් සිල්වතුන්ට ගුණවතුන්ට පිදීමේ පින්කිරිය වතය, වතාවත් කිරීම, පින්දීම, පින් අනුමෝදන්වීම, බණකීම, බණඇසීම, නිවරදවූ දෘෂ්ටිය ඇතිකර ගැනීම යන මොහු යි. සරණ ගමනයත් **දිට්ඨිජ්ජු කම්මයට** ඇතුළත් වේ.

මේ පිළිබඳ සාමාන්‍ය හැඳින්වීම මෙසේ ය: වැඩි මහල්ලකු දැක පෙර ගමන් කොට ඔහුගේ පාසිවුරු පිළිගැනීම ය, වැඳුම් පිදුම් කිරීමය යන මෙය **අපචායන** පුණ්‍ය ක්‍රියා වස්තුවට අයත් වේ. ඔවුන්ට වතාවත් කිරීම් වශයෙන් ගමෙහි පිඬු පිණිස හැසිරෙන භික්ෂුවක් දැක තමන් පාත්‍රය ඉල්වා ගෙන ගෙවලින් භික්ෂාව සපයාගෙන වුත් ඒ භික්ෂුව අතට දීම **වෙයාවච්ච** පුණ්‍ය ක්‍රියාව වේ. තෙරුවන් පුදා හෝ එබඳු වෙනත් පිනක් කොට හෝ සියලු සත්වයන්ට මේ පින ලැබේවා යි කළ පින් අනුමෝදන් කරවීම **ප්‍රාප්තිදානමය** පුණ්‍ය ක්‍රියා වස්තුව යි. අනුන් දෙන පින් තමනුත් සාදු සාදු කියා අනුමෝදන් වීම **පත්තානුමොදනා** නම් පුණ්‍ය ක්‍රියාව වේ.

යම්කිසි වස්තුවක් ගැන නොතකමින් තමා පුරුදු පුහුණු කළ ධර්මය කරුණා මෛත්‍රී පූර්වක හිතාධ්‍යාශයෙන් අනුන්ට කීම **දේශනාමය** පුණ්‍යක්‍රියා වස්තු නම් වේ. තමන්ගේ ධර්මකථිකත්වය අනුන්ට හැඟැවීමෙන් තමා උසස් කොටත්, අනුන් පහත් කොටත් පවසමින් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාදිය සලකා දහම් දෙසන්නහුට එම දේශනාව මහත්ඵල නොවේ. ධර්මශ්‍රවණය තමහටත් අනුන්ටත් හිතවැඩ පිණිස පවත්නේ යයි නුවණින් සලකා ගෙන මෘදුසිතින් බණ අසන්නවුන්ට **ශ්‍රවණමය** පුණ්‍යක්‍රියාව වෙයි. යමෙක් මාගේ මේ බණ ඇසීමෙන් අන්‍යයෝ මා සැදැහැවතකු ලෙස පිළිගනිත්වා යි සලකමින් බණ අසයි ද ඔහුගේ ඒ ඇසීම මහත්ඵල නොවේ.

දන් දීමෙන් ඵලවිපාක ඇතැ යි කම්පල ඇදහීමේ සම්‍යක් දර්ශනය **දිට්ඨිජ්ජුකම්ම** ය යි. මෙය දන්දෙන කාලයෙහි ඥාන සම්ප්‍රයුක්ත ම වියයුතු ය. එහෙයින් මෙය කම්මස්සකත ඥානය හා සම්බන්ධ වූ කර්මපථ සම්‍යක් දෘෂ්ටියට ඇතුළත් වෙයි. යම්කිසි පිනක් කරන්නහුට එහි තමාගේ දෘෂ්ටිය ඇද නැති කර ගැනීමෙන් ඒ පින මහත්ඵල මහානිසංස වෙයි.

මේ සත් පින් කිරිය වත දන සීල භාවනා යන තුන් පින් කිරිය වතෙහි සංග්‍රහවන සැටි මෙසේ දතයුතු යි. අපචිති වෙයයාවච්ච දෙක **සීලමය** පුණ්‍යක්‍රියා වස්තුවට ද, පත්තිදාන පත්තානුමෝදනා දෙක **දානමය** පුණ්‍ය ක්‍රියා වස්තුවට ද, ධර්මදේශනා ධර්මශ්‍රවණ දෙක **භාවනාමය** පුණ්‍ය ක්‍රියා වස්තුවට ද ඇතුළත් වෙයි. දෘෂ්ටයාර්ජව කර්මය (දිට්ඨිජ්ජු කම්මය) තුන් පුණ්‍යක්‍රියා වස්තුවට ම ඇතුළත් වේ. සාමාන්‍යයෙන් මෙහි කාමාවචර කුසල් සිත් අට ම ලැබෙන්නේ ය.

තමහට සමථ විපස්සනා භාවනා දෙකෙන් යමක් වැඩිපුර පුහුණු නම් එහි යෙදෙන යෝගාවචරයාහට අතරින් පතර තමාගේ භාවනා මනසිකාරය ඥානවිප්‍රයුක්ත වුව ද, එහි නිරතුරුව යෙදීමෙන් බොහෝ කොට ඇතිවූ කුශල චේතනාවන්ගේ මහත්වයෙන් **භාවනාමය** පුණ්‍යක්‍රියා වස්තුව වේ.

## පළමුවන සූත්‍ර විවරණය යි

## 3 – 2 – 2

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං**

තීණිමානි භික්ඛවෙ චක්ඛූනි; කතමානි තීණි? **මංස චක්ඛු දිබ්බ චක්ඛු පඤ්ඤාචක්ඛු** ඉමානි ඛො භික්ඛවෙ තීණි චක්ඛූනීති, එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

මංසචක්ඛු දිබ්බචක්ඛු පඤ්ඤාචක්ඛු අනුත්තරං
එතානි තීණි චක්ඛූනි අක්ඛාසි පුරිසුත්තමො
මංසචක්ඛුස්ස උප්පාදො මග්ගො දිබ්බස්ස චක්ඛුනො
යතො ඤාණං උදපාදි පඤ්ඤාචක්ඛු අනුත්තරං
තස්ස චක්ඛුස්ස පටිලාභා සබ්බදුක්ඛා පමුච්චතී'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති–

**3 - 2 - 2**

අර්ථය:-

**චක්ඛූනි**, ඇස්; **මංස චක්ඛු**, මැස ය; **දිබ්බචක්ඛු**, දිවැස ය **පඤ්ඤාචක්ඛු**, පැනැසය;

**පුරිසුත්තමො**, පුරුෂෝත්තම වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ; **මංසචක්ඛු**, මසැස ය; **දිබ්බචක්ඛු**, දිවැස ය; **අනුත්තරං**, උතුම් වූ; **පඤ්ඤාචක්ඛු**, පැනැස ය යන; **එතානි තීනි චක්ඛූනි**, මේ චක්‍ෂුත්‍රය; **අක්ඛාසි**, වදාළ සේක.

**මංසචක්ඛුස්ස**, මාංස චක්‍ෂුසයාගේ; **උප්පාදො**, ඉපදීම; **දිබ්බස්ස චක්ඛුනො**, දිවැස් ලැබීමට; **මග්ගො**, උපාය වේ (ප්‍රකෘති ඇස් ඇත්තහුට ම දිවැස් ඉපද විය හැකි වෙයි යම් හෙයකින් කසිණාලෝකය දියුණු කොට දිවැස් ඉපදවීම කසිණ මණ්ඩලයෙහි උද්ග්‍රහ නිමිත්තෙන් තොරව නොහැකි ද එහෙයිනි) **යතො**, යම් කලෙක්හි; **අනුත්තරං පඤ්ඤාචක්ඛුං**, උතුම් ප්‍රඥා චක්‍ෂුස වූ; **ඤාණං**, ආශ්‍රවක්‍ෂයකරඥානය; **උදපාදි**, පහළ විද; **තස්ස චක්ඛුස්ස පටිලාභා**, ඒ ප්‍රඥා චක්‍ෂුස්හුගේ ලැබීමෙන්; නොහොත්; **තස්ස**, ඒ ආර්‍යශ්‍රාවකයාගේ; **චක්ඛුස්ස පටිලාභා**, ප්‍රඥාචක්‍ෂුස පහළවීමෙන්; **සබ්බදුක්ඛා**, සියලු සංසාරදුකෙන්; **පමුච්චති**, මිදෙයි;

**භාවය** – සුගම යි.

**ධර්ම විස්තර**:-

**මංසචක්ඛු, දිබ්බචක්ඛු, පඤ්ඤාචක්ඛු**

“චක්ඛතීති චක්ඛු” යනු විග්‍රහ හෙයින් සම විසම තැන් ප්‍රකාශ කෙරෙමින් මෙන් පවත්නා හෙයින් චක්‍ෂුස් නම් වෙයි. “අථවා චක්ඛතයේත චක්ඛු” නොහොත් චක්‍ෂනාර්ථයෙන් චක්‍ෂුස් නම් වෙයි. චක්‍ෂනය නම් රස විඳීම යි. ඇස අරමුණු රසය විඳීමට උපකාර වන හෙයින් චක්ඛු නම් වේ.

පිඬු කොට ගත් කල්හි මසැසය, පැනස යයි ඇස් දෙකෙකි. පැනැස දිබ්බචක්ඛු පඤ්ඤචක්ඛු යනුවෙන් මෙහි දෙවැදෑරුම් කොට දක්විය.

පෙර පිනෙන් උපන් දෙවියන්ට පිත් සෙම් ලේ ආදි-යෙන් කරදරයක් නොවන ලෙස උපක්ලේශයන්ගෙන් මිදුණු බැවින් ඇතිනුදු අරමුණු ගැනීමට සමත් වූ දිව්‍යවූ ද ප්‍රසාද චක්ෂුසෙක් වේ. මෙය නම් වීර්‍ය භාවනා බලයෙන් උපන් ඥානචක්ෂුසම ය. දිව්‍යවිහාරයන් ඇසුරු කිරීම් වශයෙන් ලැබූ හෙයින් ද, මහත් ආලෝකයෙන් බබළන හෙයින් ද, බිත්තියෙන් ආවරණය වූ රූපයන් පවා දක්නට සමර්ථ වූ මහත් පැවැත්මක් ඇති හෙයින් ද, ‘දිබ්බ’ නම් වේ. දක්නා හෙයින් චක්ඛු නම් වේ. දිව්‍යවූයේත් ඇස වූයේත් හේම නු යි **දිබ්බචක්ඛු** නමි.

චතුස්සත්‍යය විශිෂ්ටඥානයෙන් අවබෝධ කරන හෙයින් ප්‍රඥා නම් වේ. පැනවීම් අර්ථයෙන් ද ප්‍රඥාව යැයි ගත්කල අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් පැනවූ හෙයිනුදු ප්‍රඥා නම් වේ. මෙහි විශේෂයෙන් ආශ්‍රවක්ෂයකර ඥාන සංඛ්‍යාත ප්‍රඥාව චතුස්සත්‍යාවබෝධයෙන් ම ඇතිවන හෙයින් **පඤ්ඤ-චක්ඛු** යයි කියනු ලැබේ. “චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි” යි වදාළේ එහෙයිනි.

මාංශචක්ෂුස කාමාවචරය, දිව්‍යචක්ෂුස රූපාවචරය, ප්‍රඥාචක්ෂුස ලොකොත්තරය, එසේ ම මසැස රූපයකි, දිවැස හා පැනසත් අරූප ය, මසැස හා දිවැසත් ලෞකික ය, කෙලෙස් සහිත ය, රූපයක් ගොචර කොට පවත්නේ ය, පැනැස ලොකොත්තර ය, කෙලෙස් රහිත ය, චතුස්සත්‍යය විෂය කොට පවත්නේ ය. මසැස අව්‍යාකෘත ය, හෙවත් කුසල විපාකයට අයත් ය. දිවැස හා පැනැස යන දෙක කුශල ද අව්‍යාකෘත ද වියහැකි ය.

**දෙවන සූත්‍ර විවරණය යි**

## 3 - 2 - 3

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

තීණිමානි භික්ඛවෙ **ඉන්ද්‍රියානි** කතමානි තීනි? **අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං** ඉමානි ඛො භික්ඛවෙ තීණි ඉන්ද්‍රියානීති. එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉතිවුච්චති

"සෙඛස්ස සික්ඛමානස්ස උජුමග්ගානුසාරිනො
ඛයස්මිං පඨමං ඤාණං තතො අඤ්ඤා අනන්තරා
තතො අඤ්ඤා විමුත්තස්ස ඤාණං වෙ හොති තාදිනො
අකුප්පා මෙ විමුත්තීති භවසංයොජනක්ඛයා
ස'වෙ ඉන්ද්‍රියසම්පන්නො සන්තො සන්තිපදෙ රතො
ධාරෙති අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහන"න්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති-

## 3 - 2 - 3

**අර්ථය:-**

**ඉන්ද්‍රියානි,** ඉන්ද්‍රියයෝ:-

**සික්ඛමානස්ස,** ත්‍රිවිධ ශික්ෂායෙහි හික්මෙන්නා වූ; **උජුමග්ගානුසාරිනො,** (අන්තද්වයෙන් තොර වූ හෙයින්) ඍජු වූ ආර්‍ය්‍යමාර්ගයෙහි ගමන් කරන්නා වූ; **සෙඛස්ස,** ශෛක්ෂ පුද්ගලයාහට; **ඛයස්මිං,** ආශ්‍රවයන් ක්ෂය කිරීමෙහි හෙවත් කෙලෙසුන් දුරු කිරීමෙහි; **පඨමං ඤාණං,** පළමුවන ඤාණ ය හෙවත් සෝවාන්මාර්ගඥානය (උපදී) **තතො අනන්තරා,** එයට පසුව; **අඤ්ඤා,** අර්හත්වය වේ.

නොහොත් **උජුමග්ගානුසාරිනො,** ඍජු වූ මාර්ගයෙහි ගමන් කරන්නා වූ; **සික්ඛමානස්ස,** ත්‍රිවිධ ශික්ෂායෙහි හික්මෙන්නා වූ; **සෙඛස්ස,** ශෛක්ෂ පුද්ගලයාහට; **ඛයස්මිං,** සෝවාන්මාර්ගයෙහි; **පඨමං ඤාණං,** ප්‍රථමඥානය වූ අනඤ්ඤාතඤ්ඤස්සාමීතීන්ද්‍රිය (උපදී) **තතො අනන්තරා,** ඒ පළමුවන මාර්ගඥානයට අනතුරුව පටන් (රහත්මග දක්වා) **අඤ්ඤා,**

අඤ්ඤින්ද්‍රිය වෙයි; **තතො අඤ්ඤා,** ඒ අර්හත්මාර්ගඥානයට අනතුරුව; **විමුත්තස්ස,** (අර්හත්ඵල සඞ්ඛ්‍යාත ප්‍රඥා විමුක්තියෙන් නොහොත් අඤ්ඤාතාවීන්ද්‍රියෙන්) සියලු කෙලෙසුන් කෙරෙන් මිදුණා වූ; **තාදිනො,** ඉෂ්ටානිෂ්ට ආරම්මණයන්හි නො වෙනස් වූ (රහත් ඵලයට පැමිණි අශෛක්ෂ පුද්ගලයාහට) **භව සංයොජනක්ඛයා,** භවබන්ධනයන් දුරුකිරීමෙන්; **මෙ,** මාගේ; **විමුත්ති,** අර්හත්ඵල විමුක්තිය; **අකුප්පා ඉති,** කොප්‍ය නොවන්නේය යි; **වෙ,** ඒකාන්තයෙන්; **ඤාණං හොති,** ප්‍රත්‍යවෙක්ෂාඥානය වේ.

**ඉන්ද්‍රියසම්පන්නො,** යථොක්ත ත්‍රිවිධ ලොකොත්තර ඉන්ද්‍රියයන්ගෙන් යුක්ත වූ; **සන්තිපදෙ රතො,** නිවනෙහි ඇලුණා වූ; **සන්තො,** ශාන්ත වූ ඉදුරන් ඇති; **සො,** ඒ ආර්ය පුද්ගල තෙම; **සවාහනං මාරං,** කෙලෙස් මර සෙනඟ සහිත වූ මාරයා; **ජෙත්වා,** ජයගෙන; **අන්තිමං දෙහං,** පශ්චිම ශරීරය; **ධාරෙති** දර යි;

ධර්ම විස්තරයෙන්ම මෙහි **භාවය** ද ස්පෂ්ට වෙයි.

**අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය – අඤ්ඤින්ද්‍රිය අඤ්ඤාතාවීන්ද්‍රිය.**

ඉන්ද්‍රිය දේශනාවට බැස ඉන්ද්‍රිය විභාගය දක්වන තථාගතයන් වහන්සේ ලෞකික ලොකොත්තර මිශ්‍රක නය වශයෙන් දෙවිසි ඉන්ද්‍රිය ධර්මයන් දෙශිතයහ. එයින් මෙහි දක්වූයේ ලොකොත්තර ඉන්ද්‍රිය ත්‍රිකය යි.

**ඉන්ද්‍රිය** නම්, අධිපති බවයි. චිත්ත චෛතසිකයන් අතරෙහි ඒ ඒ කරුණුවලින් ඒ ඒ අවස්ථාවන්හි ප්‍රධාන වූ කාර්යයෙහි යෙදෙන ධර්මවිශෙෂයන්ට ඉන්ද්‍රිය යයි කියනු ලැබේ. මෙය ''ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියානි'' යන විග්‍රහයට අනුව ඉන්ද්‍රිය ශබ්දයෙහි අදහස යි.

'ඉන්ද' යනු භාග්‍යවතුන් වහන්සේට නමෙකි. උන් වහන්සේගේ බුද්ධිඥානයෙන් දුටු හෙයින් ද, ප්‍රකාශකළ හෙයින් ද "ඉන්දදිට්ඨට්ඨො ඉන්ද්‍රියට්ඨො, ඉන්දදෙසිතට්ඨො ඉන්ද්‍රියට්ඨො" යන විග්‍රහයන්ට අනුකූලව ඉන්ද්‍රිය යන්නෙහි අදහස් ය. කර්මානුරූපව හටගත් ඉන්ද්‍රියයන් කුශලාකුශල කර්මයන් හා හැනී ගැටී පවත්නේනු යි "ඉන්ද ලිඞ්ගට්ඨෙන ඉන්ද සිට්ඨට්ඨෙන ඉන්ද්‍රියානි" යන විග්‍රහයෙහි ඉන්ද්‍රියශබ්දයෙහි අදහස යි. ඇතැම් ඉන්ද්‍රියයෝ ඒ ඒ අරමුණු විෂයකොට ද, ඇතැම්හු විදග්ධතාව අරමුණු කොට ද, පවතිත්නු යි "ඉන්ද ජුට්ඨට්ඨෙන ඉන්ද්‍රියානි" යනු වේ.

අනවරාග්‍රවූ සංසාරයෙහි සැරිසැරූනාක් නොදන්නාලද නොදක්නාලද නිවන නොහොත් චතුස්සත්‍යධර්මය පළමු කොට තමා විසින් අවබෝධ කරනලද යි පූර්වභාග වශයෙන් තමහට උපන් ඉන්ද්‍රිය අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය වේ. එනම් සෝතාපත්තිමග්ගඤාණය යි.

එහි ම ඵලය වශයෙන් හා ඒ අයුරෙන් ම චතුස්සත්‍යාවබෝධය කරන ආර්‍යපුද්ගලයා විසින් උපදවනු ලබන ප්‍රඥාව අඤ්ඤින්ද්‍රිය නම් වෙයි. සෝවාන් ඵලයෙහි පටන් අර්හත්මාර්ගය කෙළවර කොට සතැනෙක පහළවන ප්‍රඥාවට මේ නමෙකි.

චතුරාර්‍යසත්‍යධර්ම විෂයෙහි නිමාවට පැමිණි ඥානකෘත්‍ය ඇති හෙයින් ද, මත්තෙහි අවබෝධ කළයුතු චතුස්සත්‍ය යක් හෝ නිවනක් නැති හෙයින් ද, අර්හත්ඵලයට පැමිණි අර්හයන් වහන්සේගේ ප්‍රඥාව අඤ්ඤාතාවින්ද්‍රිය නම් වෙයි. මේ ඉන්ද්‍රියත්‍රයෙන් ප්‍රථම මාර්ගය හා සතරවන ඵලයත් ඒ අතරෙහි වූ සෙසු මාර්ගඵල සයත් ගෙන අටවැදෑරුම් ලෝකෝත්තර මාර්ගඵල සිත් එක්තැන් කොට වදාළ අයුරු දතයුතු.

එහෙයින් අභිධර්මාර්ථසංග්‍රහයෙහි:-

“ඉන්ද්‍රියෙසු පනෙත්ථ සොතාපත්තිමග්ග ඤාණං අනඤ්ඤඤ්ඤස්සාමීතින්ද්‍රියං, අරහත්තඵලෙ ඤාණං අඤ්ඤාතාවින්ද්‍රියං, මජ්ඣෙ ඡ ඤාණානි අඤ්ඤින්ද්‍රියානීති වුච්චන්ති” යනු කීහ.

## උජුමග්ගානුසාරිනො

අන්තද්වයට ඇතුළත් නොවූ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය ඍජුවූමාර්ගය නම් වන්නේ ය. එසේම සිතෙහි මැලිබව ය, නොසන්සුන් බවය යන අවස්ථා දෙක හෝ සසර සයුරෙහි පිහිටා සිටීම ය, සසර සැඩපහරෙහි ගලාගෙන යන කර්මයන් රැස්කිරීම ය, යන අවස්ථා දෙක ම දුරුකොට සමථ විපස්සනා දෙක උදවුකොට ගෙන භාවනා වශයෙන් පැවැති පූර්වභාග ප්‍රතිපදා මාර්ගයෙහි ගමන් කරන යෝගාවචරයාහට ගොත්‍රභූ සිතට අනතුරුව සත්කායදෘෂ්ටි, විචිකිත්සා, ශීලව්‍රතපරාමර්ශ යයි කියනලද ත්‍රිවිධ කෙලශයන් දුරුකළ හැකි හෙයින් “ඛයසම්මං පඨමං ඤාණං” යනුවෙන් දක්වන ලද අයුරෙන් කෙලෙසුන් දුරුකිරීමෙහි ලා පළමුවැනිවූ සෝවාන් මාර්ගඥානය හෙවත් අනඤ්ඤඤ්ඤස්සාමීතීන්ද්‍රිය උපදින බව මෙයින් දක්වයි.

එයට අනතුරුව එහි ඵලය වූ සෝවාන් ඵල සිත පටන් අර්හත්මාර්ග සිත දක්වා පිළිවෙළින් දියුණු කොට අඤ්ඤාතාවීන්ද්‍රිය නම් වූ අර්හත්ඵල ප්‍රඥා විමුක්තියෙන් මිදුණු තාදී ගුණ ඇති උත්තමයන්සේට “අනුප්පාදෙ ඤාණං” යනුවෙන් දම් සඟුණු මෑ පෙළෙහි කියනලද ප්‍රත්‍යවෙක්ෂාඥානය මෙසේ උපදනේ ය.

“අකුප්පා මෙ චෙතොවිමුත්ති, අයමන්තිමා ජාති, නත්ථි දානි පුනබ්භවො” යනුවෙන් ද “ඛීණා ජාති, වුසිතං බ්‍රහ්ම චරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තාය” යනුවෙන්ද, ප්‍රත්‍යවෙක්ෂාඥාන මනසිකාරය හා එහි උදාන ය ද දතයුතු.

තෙවන සූත්‍ර විවරණය යි

## 3 - 2 - 4

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

තයො මෙ භික්ඛවෙ අද්ධා කතමෙ තයො? **අතීතො අද්ධා, අනාගතො අද්ධා, පච්චුප්පන්නො අද්ධා**, ඉමෙ ඛො භික්ඛවෙ තයො අද්ධාති

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති

"අක්ඛෙය්‍යසඤ්ඤිනො සත්තා අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා
අක්ඛෙය්‍යං අපරිඤ්ඤාය යොගමායන්ති මච්චුනො
අක්ඛෙය්‍යං ච පරිඤ්ඤාය අක්ඛාතාරං න මඤ්ඤති
ඵුට්ඨො විමොක්ඛො මනසා සන්තිපදමනුත්තරං
ස වෙ අක්ඛෙය්‍යසම්පන්නො සන්තො සන්තිපදෙ රතො
සඞ්ඛායසෙවී ධම්මට්ඨො සඞ්ඛ්‍යං නොපෙති වෙදගූති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

## 3 - 2 - 4

**අර්ථය**:–

**අද්ධා**, කාලයෝ; **ඉමෙ තයො**, මොවුහු තිදෙනෙකි; **අතීතො අද්ධා**, අතීත කාලය; **අනාගතො අද්ධා**, අනාගත කාලය; **පච්චුප්පන්නො අද්ධා**, වර්තමාන කාලය;

**සත්තා**, සත්වයෝ; **අක්ඛෙය්‍යසඤ්ඤිනො**, අක්ඛෙය්‍ය නම් වූ ස්කන්ධපඤ්චකයෙහි මමය මගේ ය යන හැඟීම් ඇත්තාහු වෙත්; **අක්ඛෙය්‍යස්මිං**, පඤ්ච උපාදානස්කන්ධයෙහි; **පතිට්ඨිතා**, පිහිටියාහු ය; **අක්ඛෙය්‍යං**, පඤ්චස්කන්ධය නො හොත් පඤ්ච උපාදානස්කන්ධය; **අපරිඤ්ඤාය**, පිරිසිඳ නො දැන; **මච්චුනො**, මාරයාගේ; **යොගං** සම්බන්ධයට නොහොත් වසඟයට; **ආයන්ති**, පැමිණෙත්;

**අක්ඛෙය්‍යං**, ආඛ්‍යෙය ය; **පරිඤ්ඤාය**, පිරිසිඳ දැන; **අක්ඛාතාරං**, ආඛ්‍යාතෘහු හෙවත් ආඛ්‍යාතව්‍ය (කියයුතු) පුද්ගලයකු; **න මඤ්ඤති**, නොහඟී යි නොහොත් නොදනී (නොහොත්)

**අක්ඛාතාරං**, මවන්හකු; **න මජ්ජති**, නො පතයි; කුමක් හෙයින් ද යත්? **අනුත්තරං සන්තිපදං**, උතුම් වූ නිවන; **මනසා**, මාර්ග සිතින්; **ඵුට්ඨො**, ස්පර්ශ කරනලදුව; **විමොක්ඛො**, සියලු සංස්කාරයන්ගෙන් මිදුණේ ද; එහෙයිනි.

වෙ, ඒකාන්තයෙන්; **අසෙඛස්ස සම්පන්නො**, පඤ්චස්කන්ධය නොහොත් පසුව උපදනස්කන්ධය පිරිසිඳ දැනීමෙන් යුක්තවූ; **සන්තො**, ශාන්තවූ; **සන්තිපදෙ**, නිවනෙහි; **රතො**, ඇලුණාවූ; **සඞ්ඛායසෙවී**, නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට සිවුපසය සෙවුණාවූ; **ධම්මට්ඨො**, අසෙඛ ධර්මයෙහි පිහිටියාවූ; **සො වෙදගූ**, චතුස්සත්‍යය අවබෝධ කළාවූ ඒ ක්ෂීණාශ්‍රව තෙම; **සඞ්ඛ්‍යං න උපෙති**, (සසර පුනරුත්පත්තියක් නැති හෙයින් දෙවියෙකැයි කියා හෝ මිනිසෙකැයි හෝ) ගණන් ගැනීමකට නොපැමිණේ.

ධර්මවිස්තරයෙන් ම මෙහි භාවය ද පැහැදිලි වෙයි.

**අතීතො අද්ධා, අනාගතො අද්ධා,**
**පච්චුප්පන්නො අද්ධා**

මෙහි සූත්‍රාන්ත පර්‍යායයෙන් හා අභිධර්ම පර්‍යායයෙන් ද, අධ්වත්‍රය සැලකිය යුතු යි. සූත්‍රාන්තික ක්‍රමයෙන් ප්‍රතිසන්ධියෙන් පෙර අතීත කාලය යි ද, චුතියෙන් පසු අනාගත කාලය යි ද, චුති ප්‍රතිසන්ධි දෙකට අතර වර්තමානකාලය යි ද සලකනු ලැබේ.

අභිධර්ම ක්‍රමයෙන් උත්පාදස්ථිතිභංග වශයෙන් ක්ෂණත්‍රයට පැමිණ නිරුද්ධවූ නාමධර්ම අතීතය යි ද, ක්ෂණත්‍රයට නොපැමිණියාහු අනාගතය යි ද, ක්ෂණත්‍රයට පැමිණියේ වර්තමානය යි ද, සලකනු ලැබේ. ප්‍රතිසන්ධි සිත ඇති වූ කාලයෙහි පටන් උපදනා ඍතුජරූප හා ශරීරයෙහි රසඕජාව පැතිරෙන කාලයෙහි පටන් ඇතිවන ආහාරජ-රූපත් වර්තමාන වශයෙන් ගත් කල එයින් පෙර පසු පවත්තේ අතීත හෝ අනාගත ය යි ද, එක චිත්තවීථියක

එක ජවනවාරයෙක එක සමාපත්තිවාර යෙක උපදනා චිත්තජරූප වර්තමානය යි ද, එයින් පෙර අතීත ය යි ද, එයින් පසු අනාගත ය යි ද කියනු ලැබේ.

එසේ ම එක් ඇසිල්ලක හෝ පෙරවරු පස්වරු රෑ දවල් යන කාලවල ඒ ඒ අවස්ථාවන්හි පවත්නා රූපාරූපධර්ම වර්තමාන ය යි ද, එයින් පෙර අතීත ය යි ද, එයින් පසු අනාගත ය යි ද, මෙසේත් නාමරූපයන් පිළිබඳ කාලත්‍රය දතයුතු.

**අක්ඛෙය්‍ය සඤ්ඤිනො සත්තා:-**

දිව්‍ය මනුෂ්‍ය ගෘහස්ථ ප්‍රව්‍රජිත සත්ව පුද්ගලාදි වශයෙන් ලෝකයා විසින් කරනු ලබන කථාව්‍යවහාරයන්ට වස්තුවූ පඤ්චස්කන්ධයට අක්ඛෙය්‍ය ය යි කියනු ලැබේ. එහෙයින් සත්වයෝ පඤ්චස්කන්ධය කෙරෙහි එබඳු සත්ව පුද්ගලාදි හැඟීම් ඇත්තාහු ය. යනු භාව යි.

'සඤ්ඤා තෙසං අත්ථීති සඤ්ඤිනො, අක්ඛෙය්‍යෙසුයෙව සඤ්ඤිනොති අක්ඛෙය්‍යසඤ්ඤිනො'' යනු විග්‍රහ යි.

**අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා:-**

ලෝකයා පඤ්චස්කන්ධය කෙරෙහි අට ආකාරයකින් පිහිටා සිටී; රාගයෙන් රත් වූ තැනැත්තේ රාග වශයෙන් ද, ද්වේෂයෙන් දුෂ්ට වූ තැනැත්තේ ද්වේෂ වශයෙන් ද, මූළා වූ තැනැත්තේ මෝහ වශයෙන් ද, දෘඪග්‍රාහ ඇත්තේ දෘෂ්ටිවශයෙන් ද, තම සිත්හි කෙලෙසුන් තහවුරු කොට ඇත්තේ අනුසය වශයෙන් ද, බැඳුණු තැනැත්තේ මාන වශයෙන් ද, අස්ථිර තැනැත්තේ විචිකිච්ඡා වශයෙන් ද, කැලඹුණු සිත් ඇති තැනැත්තේ උද්ධච්ච වශයෙන් ද යි මෙසේ රාග, දෙස, මොහ, දිට්ඨි, අනුසය, මාන, විචිකිච්ඡා, උද්ධච්ච යන මේ අටවැදෑරුම් කෙලෙසුන්ගේ වශයෙනි.

**අකොප්‍යනං ච පජානාති:-**

මෙයින් ත්‍රිවිධ පරිඥයෙන් දුක පිරිසිඳ දැනීමෙන් යෝගාවචරයාගේ ක්ලේශප්‍රහාණය දක්වයි ත්‍රිවිධපරිඥව නම්:- ඤාතපරිඤ්ඤා, තීරණපරිඤ්ඤා, පහාණපරිඤ්ඤා යන තුන යි. **ඤාතපරිඥා** නම්, ස්කන්ධ ධාතු ආයතනාදීන් පිළිබඳව ලක්ෂණාදි විභාග වශයෙන් දැකීම යි. **තීරණපරිඤ්ඤා** නම්, ඔවුන් අනිත්‍යාදි වශයෙන් තීරණය කරගැනීම යි. **ප්‍රහාණපරිඥා** නම්, අග්‍රමාර්ගඥානයෙන් එහි ඡන්දරාගය දුරුකිරීම යි. නාමරූප ධර්මයන් වෙන් කොට සැලකීම ද ඤාතපරිඤ්ඤා නම්. ඔවුන්ගේ කලාපසම්මර්ශනාදි වශයෙන් සැලකීම තීරණපරිඥා නම් වේ. ආර්‍යමාර්ගයෙන් සියලු කෙලෙසුන් දුරලීම ප්‍රහාණපරිඥා නම් වේ. මෙසේ පඤ්චස්කන්ධයන් ත්‍රිවිධපරිඥයෙන් පිරිසිඳ දත් ක්ෂීණාශ්‍රව තෙම සත්ව පුද්ගල සංඥා නැත්තාහු හෙයින් **අක්ඛාතාරං න මඤ්ඤති** යනු වදාළහ.

මෙහි දුක්ඛසත්‍යය පිරිසිඳ දැනීමත්, සමුදයසත්‍යය දුරුකිරීමත්, "ඵුට්ඨො විමොක්ඛො මනසා, සන්තිපදමනුත්තරං" යන්නෙන් මාර්ග නිරෝධ සත්‍ය දෙක භාවනායෙන් හා ප්‍රත්‍යක්ෂකිරීම් වශයෙන් අවබෝධ කොට කෙලෙසුන්ගෙන් මිදී නිවන් ප්‍රත්‍යක්ෂ කිරීමත් ප්‍රකාශ වෙයි මෙබඳු ගුණ ඇති රහතන් වහන්සේලා අනුපාදා පරිනිර්වාණයෙන් දෙවිමිනිසුන් අතුරෙහි අප්‍රඥප්තිකභාවයට පැමිණෙන බව දක්වා දේශනාව කෙළවර කළසේක.

**සතර වන සූත්‍ර විවරණය යි.**

## 3 - 2 - 5

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

තීණිමානි භික්ඛවෙ **දුච්චරිතානි**, කතමානි තීණි? **කායදුච්චරිතං, වචීදුච්චරිතං, මනොදුච්චරිතං**, ඉමානි ඛො භික්ඛවෙ තීණි දුච්චරිතානී'ති එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"කායදුච්චරිතං කත්වා වචීදුච්චරිතානි ච
මනොදුච්චරිතං කත්වා යඤ්චඤ්ඤං දොසසඤ්හිතං
අකත්වා කුසලං කම්මං කත්වානාකුසලං බහුං
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සො උපපජ්ජතී'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති

## 3 - 2 - 5

අර්ථ:-

දුච්චරිතානි, දුශ්චරිතයෝ; කායදුච්චරිතං කත්වා, කයින් දුසිරිත් කොට; වචී දුච්චරිතානි ච, වාග් දුශ්චරිත ද කොට; මනො දුච්චරිතං කත්වා, මනො දුශ්චරිත කොට; දොස සඤ්හිතං, ද්වේෂයෙන් යුක්ත වූ; යඤ්ච අඤ්ඤං, යම් අනික් පවක් ද කොට;

කුසලං කම්මං අකත්වා, පින්කම් නො කොට; බහුං අකුසලං කත්වාන, බොහෝ පව්කම් කොට; සො දුප්පඤ්ඤො, ඒ දුෂ්ප්‍රාඥ තෙමේ; කායස්ස භෙදා, ශරීරයාගේ බිඳීමෙන්; නිරයං, නරකයට; උපපජ්ජති, පැමිණේ;

භාවය:- සුගම යි.

ධර්ම විස්තර:-

කාය දුච්චරිතං, වචී දුච්චරිතං, මනො දුච්චරිතං, කායද්වාරයෙන් සිදු වන දුශ්චරිතය කායදුශ්චරිත නම් වේ. සෙස්ස ද එසේ ය. මේ ත්‍රිවිධ දුශ්චරිතයන් ප්‍රඥප්ති වශයෙන් හෝ කර්මපථ වශයෙන් ද දතයුතු. කායද්වාරය ප්‍රධාන කොට පනවනලද ශික්ෂාව්‍යතික්‍රමණය හෙවත් සිකපද කැඩීම කායදුශ්චරිත නම් වේ. වාග්ද්වාරය පිළිබඳ කොට පනවනලද ශික්ෂාපද කැඩීම වාග්දුශ්චරිත නම් වේ. මේ ද්වාර දෙක්හි ම පැන වූ ශික්ෂාපද උල්ලංඝනය කිරීම මනොදුශ්චරිත නම් වේ. මේ ප්‍රඥප්ති කථා යි.

කායද්වාරයෙහි උපදනා ප්‍රාණඝාතාදි ත්‍රිවිධ දුශ්චරිතයන් කිරීමෙහි අකුශල චේතනාව කායදුශ්චරිත ය යි ද,

එසේ ම වාග්ද්වාරයෙහි පවත්නා මෘෂාවාදාදි චතුර්විධ දුශ්චරිතයන් කිරීමෙහි අකුශල චේතනාව වාග් දුශ්චරිතය යි ද, අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි යන ත්‍රිවිධ චේතනා සම්ප්‍රයුක්ත ධර්මයන් මනො දුශ්චරිතය යි ද සැලකීම **කර්මපථ** වශයෙන් ගණන් ගැනීම යි.

## **පස්වන සූත්‍ර විවරණය යි**

## **3 – 26**

### **වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

තීණිමානි භික්ඛවෙ **සුචරිතානි**, කතමානි තීණි? **කාය සුචරිතං වචීසුචරිතං මනො සුචරිතං** ඉමානි ඛො භික්ඛවෙ තීණි සුචරිතානීති එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"කායදුච්චරිතං හිත්වා වචීදුච්චරිතානි ච
මනොදුච්චරිතං හිත්වා යඤ්චඤ්ඤං දොසසඤ්හිතං
අකත්වා කුසලංකම්මං කත්වාන කුසලං බහුං
කායස්ස භෙදා සප්පඤ්ඤො සග්ගං සො උපපජ්ජතී'ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති.

## **3 – 2 – 6**

**අර්ථය**:–

**සුචරිතානි**, සුචරිතයෝ; සෙස්ස සුගම යි.

**ධර්ම විස්තර**:–

### **කායසුචරිතං, වචීසුචරිතං, මනොසුචරිතං**

මෙහි විස්තර කථාව ද ප්‍රඥප්ති කර්මපථ වශයෙන් දෙවැදෑරුම් වෙයි. කායද්වාරයෙහි පනවනලද ශික්ෂාපද නොකැඩීම කායසුචරිත ය යි. සෙස්ස ද මෙසේ යි. මේ **ප්‍රඥප්තිකථා** යි.

ප්‍රාණඝාතාදියෙන් වළක්නහුට උපන් විරති චේතනාත්‍රය කායසුචරිත නමැ යි ද, මුසාවාදාදියෙන් වළක්නහුට උපදනා විරති චේතනා චතුෂ්කය වාක්සුචරිත නමැ යි ද, අනභිධ්‍යා අව්‍යාපාද සම්‍යග්දෘෂ්ටි නම් වූ චේතනාසම්ප්‍රයුක්ත ධර්ම තුන මනොසුචරිත නමැ යි ද දතයුතු. මේ **කාව්‍යාර්ථය** යි. සෙස්ස සුගම යි.

**සවන සූත්‍ර විවරණය යි**

**3 - 2 - 7**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

තීණිමානි භික්ඛවෙ **සොචෙය්‍යානි**, කතමානි තීණි? **කායසොචෙය්‍යං වචීසොචෙය්‍යං මනොසොචෙය්‍යං** ඉමානි ඛො භික්ඛවෙ තීණි සොචෙය්‍යානීති. එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

''කායසුචිං වාචාසුචිං චෙතොසුචිං මනාසවං
සුචිසොචෙය්‍යසම්පන්නං ආහු සබ්බප්පහායිනන්'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්'ති

**3 - 2 - 7**

**අර්ථය:**—

**සොචෙය්‍යානි**, සුචිභාවයෝ හෙවත් පවිත්‍රකම්;

**කායසුචිං**, කයින් පවිත්‍රවීමය; **වාචාසුචිං**, වචනයෙන් පවිත්‍රවීම ය; **චෙතොසුචිං**, සිතින් පවිත්‍රවීමය යන; **සුචිසොචෙය්‍ය සම්පන්නං**, සුපිරිසුදු වූ පවිත්‍ර සම්පත්තියෙන් යුක්තවූවහු; **සබ්බප්පහායිනං**, සියලු කෙලෙසුන් දුරු කළාවූ; **අනාසවං**, ක්ෂීණාශ්‍රව යයි; **ආහු**, කීහු; සෙස්ස සුගම යි.

**සත්වන සූත්‍ර විවරණය යි**

## 3 - 2 - 8

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං**

තීණිමානි භික්ඛවෙ මොනෙය්‍යානි, කතමානි තීණි? **කායමොනෙය්‍යං වචීමොනෙය්‍යං මනොමොනෙය්‍යං** ඉමානි ඛො භික්ඛවෙ තීණි මොනෙය්‍යානීති එතමත්ථං භගවා අවොච, තත්ථේතං ඉති වුච්චති.

"කායමුනිං වාචාමුනිං මනොමුනිං මනාසවං
මුනිං මොනෙය්‍ය සම්පන්නං ආහු නින්හාතපාපක'න්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුත'න්ති

**අර්ථය:-**

**මොනෙය්‍යානි**, මුනිභාවය කරන ධර්මයෝ; **කාය-මොනෙය්‍යං**, කායපිළිබඳ දැනීම ය;

සෙස්ස ද මෙසේ යි:

**කායමුනිං**, කය පිළිබඳ දැනීම ය; **වාචාමුනිං**, වචනය පිළිබඳ දැනීම ය; **මනොමුනිං**, සිත පිළිබඳ දැනීම ය; **මුනිං මොනෙය්‍ය සම්පන්නං**, මෙසේ අතිශ්‍රෙෂ්ඨ මුනිභාවයෙන් යුක්ත වූ; **නින්හාතපාපකං**, අෂ්ටාංග මාර්ගඵලයෙන් සෝදා හරින ලද පාප මල ඇති; (නිද්ධොත පාපකං යි ද පාඨ යි;) **අනාසවං**, ක්ෂීණාශ්‍රව ය යි **ආහු**, කීහු;

**භාවය:-** සුගම යි.

**ධර්ම විස්තර:-**

### මොනෙය්‍ය පටිපදා

මෙලොව පරලොව දෙකත් අහිතහිත පටිසන්ධි පරහිත පටිපත්ති දෙකත් දන්නා යි මුනි නම්. ඔහුගේ පැවැත්ම මුනිභාවය යි. කල්‍යාණ පෘථග්ජනයන් සමග සත් වැදෑරුම් ශෛක්ෂයන් හා රහත්ඵලයට පැමිණි ආර්යයන් වහන්සේ ද මෙයින් දක්ව යි. රහත්හුගේ කාය වචී මනොසමාචාරයෝ මොනෙය්‍ය ගුණයෝ වෙත්.

තව ද ත්‍රිවිධ කායදුශ්චරිතයෙන් වැළකීම 'කාය මොනෙය්‍ය' නම්. කය අරමුණු කොට උපදනා විදර්ශනා ඥානයට උපකාරවූ පඤ්චස්කන්ධ ශරීරය පිළිබඳ මනාව දැනීම හා භාවනාමාර්ගය ද, ශරීරයෙහි ඡන්දරාගය දුරු කිරීම ද, කායසංස්කාර නම් වූ ආශ්වාස ප්‍රශ්වාස දෙදෙනාගේ නිරෝධයෙන් පහළ වන චතුර්ථධ්‍යාන සමාපත්තිය ද, **කායමොනෙය්‍ය** නම්.

එසේ ම චතුර්විධ වාග්දුශ්චරිතයෙන් දුරුව වාක් සුචරිතය පිරීම, වචනය ගැන මනා දැනීම; වාක්පරිඥා සහගත වූ මාර්ගය, වචනයෙහි ඡන්දරාගය දුරුකිරීම, විතර්ක විචාර නම් වූ වාක්සංස්කාරයාගේ නිරෝධයෙන් ලබන ද්විතීයධ්‍යාන සමාපත්තිය '**වචී මොනෙය්‍ය**' නම් වේ.

මෙසේ ම චිත්තප්‍රතිබද්ධවූ වේදනා සංඥාවන්ගේ නිරෝධයෙන් සඤ්ඤාවේදයිත නිරොධයට පැමිණීම හෙවත් නිරෝධ සමාපත්තියට සමවැදීම '**මනො මොනෙය්‍ය**' නම් වේ. ''අථවා මුනිභාවකරා මොනෙය්‍යපටිපදා ධම්මා මොනෙය්‍යානි'' යනු **අර්ථකථායෙහි** එන බැවින් **මොනෙය්‍ය පටිපදාව** යනු කුමක්දැ යි දතගත යුතු ය.

මේ ශාසනයෙහි **මොනෙය්‍ය** නම් වූ ප්‍රතිපදාවෙකු දු ඇත. එය හිමිවිය යුත්තේ සස්නෙහි පැවිදි වූ එක ම ශ්‍රාවකයකුට පමණි. එක සස්නෙක මොනෙය්‍ය පිළිවෙත් පුරන දෙනමක් නොලැබෙ යි. අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි වැඩ සිටියේ "**නාළක**" නම් රහතන් වහන්සේ යි. නාළක තෙරුන් විසින් පිරූ ප්‍රති-පත්තිය හෙයින් මෙයට '**නාළකපටිපදා**' යයි ද කියනු ලැබේ.

මේ නාළක තෙමේ කාලදේවල තාපසයන්ගේ සහෝදරියගේ පුත්‍රයෙක. අප මහා බෝසතාණන් වහන්සේ උපන් දින ම තමහට වැන්දවීම පිණිස ළඟට ගෙන ආ බෝසතාණන්ගේ පය පෙරළී තමාගේ හිස මත පිහිටි

කල්හි තාපස තෙමේ හුනස්නෙන් නැගිට ඇඳිලි බැඳ ගෞරවාචාර පවත්වා දිවැසින් බලනුයේ "මේ කුමාර තෙමේ අනාගතයෙහි බුදු වන්නේ ය. බුදුවූ පසු මොහු මට දක්නට නොලැබෙයි. මගේ බෑනණුවූ නාලකට නම් දක්නට ලැබෙන්නේ යයි සලකමින් සිටි කල්හි එතැනට පැමිණි නාලක කුමරුවා තමන් ළඟට කැඳවා මෙසේ කී ය.

දරුව, නාලකය! "සුදොවුන් මහරදුණන්ගේ පුත් වූ සිදුහත් කුමර තෙමේ මෙතැන් සිට පන්තිස් හවුරුද්දක් ගියකල බුදු වන්නේ ය. ඔබට මොහු දක්නට ලැබෙන්නේ ය. එහෙයින් අද ම පැවිදි වෙව" යි නියම කෙළේ ය. සත්අසූ කෙළක් ධනය ඇති මහාසාර කුලයක උපන් නාලක කුමර තෙමේ "මාගේ මයිලණුවෝ මා අවැඩක නො යොද- වන්නාහ" යි සලකා සල්පිළෙන් කාෂායවස්ත්‍රයන් හා මැටි පාත්‍රයක් ද ගෙන්වා හිසකේ දැළිරැවුලු කපා හැර "යො ලොකෙ උත්තමපුග්ගලො අභවිස්ස, තං උද්දිස්ස මය්හං පබ්බජ්ජා" යනුවෙන් යමෙක් ලෝකයෙහි උතුම් පුද්ගල යෙක් වන්නේ නම් මාගේ පැවිද්ද ඔහු උදෙසා වේ වා යි බෝසතාණන් ඉදිරියෙහි පසඟ පිහිටුවා වැඳ කසාවත් හැඳ පාත්‍රය පසුම්බියෙහි ලා උරහිසෙහි එල්වාගෙන හිමාලයවනයට පිවිස මහණදම් පිරුවේ ය.

අප මහ බෝසත්හු බුදුවූ බැව් ඇසූ **නාලක** ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ **මෞනෙය්‍ය ප්‍රතිපදාව** නම් කුමක්දැ යි විචාළහ. භාග්‍යවතුන් වහන්සේ නාලක තෙරුන්ට අභීෂ්ටය කුළු ගන්වා දහම් දෙසීමෙන් මෞනෙය්‍ය ප්‍රතිපදාව ද විස්තර කොට වදාළසේක. ඒ ඇසූ නාලක ස්ථවිරයන් වහන්සේ දර්ශනය, ශ්‍රවණය, ප්‍රශ්න කිරීම ය යන මේ තුන් අවස්ථායෙහි ම අල්පේච්ඡ වූහ.

නාලක ස්ථවිරයන් වහන්සේ දම් දෙසුම් කෙළවර පහන් සිත් ඇති ව බුදුන් වැඳ හිමාලයවනයට පිවිස "නැවතත් මට බුදුන් දක්නට ඇත් නම් මැනව" යි

ආශාවක් නො ඉපදවූ සේක. මෙය උන්වහන්සේගේ බුද්ධදර්ශනයෙහි ඇති අල්පේච්ඡතාවය යි. නැවතත් බණක් අසන්නට ඇත් නම් හොඳය යි නොසිතූසේක. මේ ශ්‍රවණයෙහි අලෝපච්ඡතාව ය යි. එසේ ම "නැවතත් මෞනෙය්‍ය ප්‍රතිපදාව විචාරන්නෙමි" යි අදහසක් පහළ නො කළසේක. මේ පෘච්ඡායෙහි අලෝපච්ඡතාව ය යි.

මෙසේ තුන්පරිද්දෙන් ම අලෝපච්ඡ වූ හෙවත් කිසිවක් නො පතන්නාවූ නාලක ස්ථවිරයන් වහන්සේ එතැන් පටන් එක වනලැහැබෙක්හි දෙදවසක් නොවිසූසේක. එක ගහක් මුල දෙදවසක් නොවිසූ සේක. එක ගමෙක දෙදවසක් පිඬුසිඟා නො වැඩි සේක. මෙසේ කැලයෙන් කැලයට ගස්මුලෙන් ගස්මුලට ගමින් ගමට ඇවිදිමින් සසරන් පෙරුම් පුරා ලබනලද මේ මෞනෙය්‍ය ප්‍රතිපදායෙහි පිළිපැද භාවනා කොට රහත් වූ සේක.

යමෙක් මේ මෞනෙය්‍ය ප්‍රතිපදාව උත්කෘෂ්ට වශයෙන් පිරුයේ නම් හෙතෙම ජීවත්වන්නේ සත්මසෙකි. යමෙක් මධ්‍යම වශයෙන් පුරා නම් ඔහු ජීවත් වන්නේ සත්අවුරුද්දකි. යමෙක් ඉතා අඩුතරමින් යථාලාභ වශයෙන් පුරා නම් ඔහු ජීවත්වන්නේ දහසය අවුරුද්-දෙකි.

නාලක ස්ථවිරයන් වහන්සේ උසස් ලෙස මෞනෙය්‍ය ප්‍රතිපදාව පිරූ හෙයින් සත්මසෙකින් තමන් වහන්සේ පිරිනිවන්පානාබව දත්සේක්, එදින ස්නානයෙන් ශරීරය පිරිසුදු කොට අඳනය හැඳ ඒ මත්තෙහි පටිය බැඳ තනිපටසිවුර හා දෙපටසිවුරත් සකස් කොට පෙරවා හෙවත් තුන් සිවුරෙන් ම යුක්තව භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ පසඟ පිහිටුවා වැඳ පිරිනිවීමට අවසර ඉල්වාගෙන ස්වර්ණපර්වතයක් ඇසුරු කොට සිටිසේක් ම අනුපාදිශෙෂ පරිනිර්වාණයෙන් පිරිනිවිසේක.

භාග්‍යවතුන් වහන්සේ ඒ බව දැන වදාරා භික්ෂුසංඝයා වහන්සේ සහිතව එහි වැඩ ආදාහනය කරවා ධාතු ගෙන චෛත්‍යයක් කරවූසේක. එය **නාළකචෛත්‍යය** නම් විය. මේ මොනෙය්‍යප්‍රතිපදාව පුරන්නට කැමැති භික්ෂුතෙම පෘථග්ජන කාලයෙහි පටන් කිලිටි සිතක් නොඋපදවා පිරිසුදු සිතින් තුන්දොර පවිත්‍ර කරගතයුතු හෙයින් ඉතා දුෂ්කර වූ නිර්වාණගාමිනී ප්‍රතිපදාවෙකැ යි දතයුතු.

## අටවන සූත්‍ර විවරණය යි.

## 3 - 2 - 9

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

යස්ස කස්සචි භික්ඛවෙ **රාගො** අප්පහීනො **දොසො** අප්පහීනො **මොහො** අප්පහීනො, අයං වුච්චති භික්ඛවෙ බද්ධො මාරස්ස, පටිමුක්කස්ස මාරපාසො, යථාකාමකරණීයො ච පාපිමතො, යස්ස කස්සචි භික්ඛවෙ රාගො පහීනො, දොසො පහීනො, මොහො පහීනො, අයං වුච්චති. භික්ඛවෙ අබද්ධො මාරස්ස, ඔමුක්කස්ස මාරපාසො, න යථාකාමකරණීයො පාපිමතො’ති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.
යස්ස රාගො ච දොසො ච අවිජ්ජා ච විරාජිතා
තං භාවිතත්තඤ්ඤතරං බ්‍රහ්මභූතං තථාගතං
බුද්ධං වෙරභයාතීතං ආහු සබ්බප්පහායින‘න්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත’න්ති

## 3 - 2 - 9

**අර්ථය:**

**යස්ස කස්සචි,** (ගිහි හෝ පැවිදි) යමකිසි පුද්ගලයකු විසින්; **රාගො,** රාගයතෙම; **අප්පහීනො,** ප්‍රහීණ නො කරන ලද්ද; -පෙ- **අයං,** මෙතෙම; **මාරස්ස,** කෙලශ

මාරයා විසින්; **බද්ධො**, බඳනා ලද්දේ ය යි ද; **අස්ස**, මොහු විසින්; **මාරපාසො**, මාරපාසය; **පටිමුක්කො**, ඇතුල් කරන ලද්දේ ය; **පාපිමතො**, මාරයාහට; **යථාකාම කරණීයො**, කැමැති පරිදි කටයුතු කරන්නෙක් ය යි; **වුච්චති**, කියනු ලැබේ **අස්ස**, මොහු විසින්; **මාරපාසො**, මලපුඩුව; **ඔමුක්කො**, මුදන ලද්දේ වෙයි;

**යස්ස**, යම් ආයසී පුද්ගලයකු විසින්; **රාගො ච**, රාගයත්; **දොසො ච**, ද්වෙෂයත්; **මොහො ච**, මෝහයත්; **අවිජ්ජා ච**, අවිද්‍යාවත්; **විරාජිතා**, දුරු කරන ලද්දේ ද; **භාවිතත්තානඤ්ඤතරං**, භාවනා වශයෙන් පුරුදු කරනලද සිත් ඇති රහතුන් අතරෙහි එක්තරා පුද්ගලයකු වූ; **බ්‍රහ්මභූතං**, ශ්‍රෙෂ්ඨ වූ අර්හත් ඵලයට පැමිණි; **තථාගතං**, සෙසු රහතුන් මෙන් නිවන් අවබෝධ කළා වූ; **බුද්ධං**, චතුස්සත්‍ය බුද්ධවූ; **වෙරභයාතීතං**, වෛර භය දුරු කළාවූ; **තං**, ඔහු; **සබ්බප්පහායිනං**, සියලු ක්ලෙශ අභිසංස්කාරාදීන් දුරු කළ තැනැත්තකු යි; **ආහු**, කියත්;

ධර්ම විස්තරයෙන් ම **භාවය ද** සුගම වෙයි.

**රාගො අප්පහීනො:-**

මාර්ගඥනයෙන් සමුච්ඡෙද වශයෙන් රාගය දුරු නොකෙළේ ද යනු මෙයින් ප්‍රකාශ කෙරෙයි. ද්වෙෂ මොහයන්හිදු මෙසේ මැ යි. සතර අපායට පමුණුවන රාග ද්වෙෂ මෝහයන් ප්‍රථම මාර්ගයෙන් ද, ඖදාරික කාම රාග ද්වෙෂයන් දෙවැනි මාර්ගයෙන් හා සියුම් වූ ඔවුහු ම තුන්වන මාර්ගයෙන් ද, භවරාග හා අවිද්‍යාවත් සතරවන මාර්ගයෙන් ද ප්‍රහීන වෙත්. මෙසේ මොවුන් දුරු කළ කල්හි ඒ හා සම්බන්ධ වූ සියලු කෙලෙස් දුරුවෙත්.

මේ කෙලෙස් දුරු නොකළ තැනැත්තේ මාරපාසයෙහි බැඳුණේ වේ. මොහු විසින් මාරපාස නම් වූ ක්ලෙශය තමාගේ සිතෙහි ඇතුළත් කරනලද්දේ වේ. රාගාදි

කෙලෙසුන් දුරු කළ තැනැත්තේ මාරපාසයෙහි නො බැඳුණේ ය යි ද, ඔහු විසින් මාරපාසය මුදනලද්දේ ය යි ද, මාරයාට කැමැත්තක් කරගත නො හැක්කේ ය යි ද කියනු ලැබේ. සෙස්ස සුගම යි.

## නවවන සූත්‍ර විවරණය යි.

## 3 - 2 - 10

වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුණියා වා **රාගො** අප්පහීනො **දොසො** අප්පහීනො **මොහො** අප්පහීනො අයං වුච්චති භික්ඛවෙ න අතරි සමුද්දං සඌම්මිං සවීචිං සාවට්ටං සගහං සරක්ඛසං යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුණියා වා රාගො පහීනො දොසො පහීනො මොහො පහීනො අයං වුච්චති භික්ඛවෙ අතරි සමුද්දං සඌම්මිං සවීචිං සාවට්ටං සගහං සරක්ඛසං තිණ්ණො පාරඞ්ගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො'ති එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

1 යස්ස රාගො ච දොසො ච අවිජ්ජා ච විරාජිතා
සොමං සමුද්දං සගහං සරක්ඛසං
ඌම්මිභයං දුත්තර 'මච්චතාරි
සඞ්ගාතිගො මච්චුජහො නිරූපධි
පහාසි දුක්ඛං අපුනබ්භවාය
අත්ථංගතො සො නපමාණ මෙති
අමොහයි මච්චුරාජනති බ්‍රෑමි 'ති,

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

## දුතියො වග්ගො

**තස්සුද්දානං:-**

පුඤ්ඤං චක්ඛු අථ ඉන්ද්‍රියානි අද්ධා චරියං දුවෙ සොචි මුනො අථ රාග දුවෙ පුන වග්ගමාහු දුතිය මුත්තම'න්ති

## 3 – 2 – 10

**අර්ථය:–**

**අයං,** මේ තෙම; **ස ඌමිං,** රළ සහිත වූ; **සවීචිං,** යනු ද මෙසේ යි. **සාවට්ටං,** සුළි සහිත වූ; **සගහං,** චණ්ඩ සතුන් ඇති; **සරක්ඛසං,** රකුසන් ඇති; **සමුද්දං,** සංසාර සමුද්‍රය; **න අතරි,** තරණය නො කළේ යයි; **වුච්චති,** කියනු ලැබේ; **තිණ්ණො,** තරණය කළේ යයි ද; **පාරංගතො,** පරතෙරට ගියේ යයි ද; **බ්‍රාහ්මණො,** බැහැරකළ පව් ඇති ක්ෂීණාශ්‍රව තෙම; **ථලෙ,** පරතෙරෙහි නොහොත් ගොඩෙහි; **තිට්ඨති,** සිටියි;

**යස්ස,** යමකු විසින්; **රාගො ච,** රාගයත්, **දොසො ච,** ද්වේෂයත්; **අවිජ්ජා ච,** මෝහයත්; **විරාජිතා,** දුරු කරන ලද්දාහු ද; **සො,** හෙතෙම; **සගහං,** චණ්ඩ සතුන් ඇති; **සරක්ඛසං,** රකුසන් ඇති; **ඌමිභයං,** රළ බිය ඇති; **දුත්තරං,** තරණය නො කළ හැකි; **සමුද්දං,** සංසාර සමුද්‍රය නොහොත් චක්ඛායතනාදි ආයතන සමුද්‍රය; **අච්චතාරි,** ඉක්මවූයේ ය; **සඞ්ගාතිගො,** රාගාදි කෙලශ සඞ්ගයන් ඉක්මවූයේ ය; **මච්චුජහො,** මරණය දුරු කළේ ය; **නිරූපධි,** කෙලෙස් රහිත ය; **අපුනබ්භවාය,** පුනරුත්පත්තිය නැති කරනු පිණිස; **දුක්ඛං,** සංසාර දුක; **පහාසි,** දුරු කෙළේ ය; **අත්ථං ගතො,** රාගාදි කෙලෙසුන් දුරු කළාවූ; **සො,** ඒ ක්ෂීණාශ්‍රව තෙම; **පමාණං,** ප්‍රමාණයකට; **න එති,** නො පැමිණේ යි; **මච්චුරාජං,** මෘත්‍යුරාජයා; **අමොහයි,** මුළා කළේ යයි; **බ්‍රෑමි,** කියමි;

ධර්ම විස්තරයෙන් භාවය සුගම වෙයි.

මෙහි **සමුද්‍රය:–** සංසාරය හෝ චක්ඛායතනාදිය යි. සමුද්‍රය හා ආයතනත් යන දෙකම තෘප්තියට පැමිණ විය නොහැකි ය. ඌමි හෝ වීචි නමින් දැක්වූයේ ක්‍රෝධය හා උපායාස නම්වූ බද්ධවෛරයක් යන දෙකයි. 'සාවට්ට' නම් පස්කම් ගුණයෙන් කරකැවෙන සුළිය යි. 'සගහ' නම් තමා

වශයට පැමිණියවුන්ට අහිතක් නපුරක් ම කරන හෙයින් චණ්ඩසතුන් වැනි විසභාග පුද්ගලයන්ගෙන් යුක්තවූයේ ය යනු යි. 'රක්ඛස' යනු සත්‍රීන් සඳහා කියනලදී. මොවුන් රකුසන් වැනිනු යි සරක්ඛස නම්, "ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො" යනුවෙන් දක්වූයේ සංසාර මහොඝය ඉක්මවා නිවන් නමැති ගොඩබිමෙහි පිහිටි රහතන් වහන්සේ යි.

**අත්ථංගතො සො න පමාණමෙති**

මෙබඳුවූ ඒ ක්ෂීණාශ්‍රව තෙම රාගාදි ප්‍රමාණකර කෙලෙශ ධර්මයන් දුරු කළ හෙයින් සීල සමාධි ප්‍රඥා යන ගුණ වලින් මෙතරම් යයි නොමිණිය හැකි වෙයි නොහොත් මෙනම් ගති ඇත්තෙක, මෙබඳු නම් ගොත් ඇත්තෙකැ යි ප්‍රමාණ කිරීමකට නො පැමිණෙයි. අනුපාදිශෙෂ නිර්වාණ ධාතුව මෙයින් ප්‍රකාශ වේ

**දසවන සූත්‍ර විවරණය යි.**

**දෙවෙනි වර්ගය නිමි**

---

**තතියො වග්ගො**

**3 - 3 1**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං**

දිට්ඨා මයා භික්ඛවෙ සත්තා **කාය දුච්චරිතෙන** සමන්නා ගතා, **වචීදුච්චරිතෙන** සමන්නාගතා, **මනොදුච්චරිතෙන** සමන්නාගතා, අරියානං උපවාදකා, මිච්ඡදිට්ඨිකා මිච්ඡාදිට්ඨි කම්ම සමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණ අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා තං ඛො පනාහං භික්ඛවෙ නාඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සුත්වා වදාමි

දිට්ඨා මයා භික්ඛවෙ සත්තා කායදුච්චරිතෙන සමන්නා ගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨි

සම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා, අපි ච භික්ඛවෙ යදෙව සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං තදෙවාහං වදමි.

දිට්ඨා මයා භික්ඛවෙ සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා, වචීදුච්චරිතෙන සමන්නාගතා, මනොදුච්චරිතෙන සමන්නාගතා, අරියානං උපවාදකා, මිච්ඡාදිට්ඨිකා, මිච්ඡාදිට්ඨි කම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නාති. එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"මිච්ඡාමනං පණිධාය මිච්ඡාවාචං අභාසිය
මිච්ඡාකම්මානි කත්වාන කායෙන ඉධ පුග්ගලො

"අප්පස්සුතො 'පුඤ්ඤකාරො අප්පස්මිං ඉධ ජීවිතෙ
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සො උපපජ්ජතී ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති.

## 3 - 3 - 1

**අර්ථය:-**

**දිට්ඨා,** (මාගේ සර්වඥතාඥානයෙන් හා දිබ්බචක්ඛුඤාණ-යෙන් ද) දක්නා ලද්දේ ය; **අරියානං උපවාදකා,** බුද්ධාදි ආර්‍යයන්ට යටත් පිරිසෙයින් ගෘහස්ථ සෝවාන් පුද්ගලයකුට වුව ද අභූතයෙන් ගරහන්නෝ; **යං එව,** යමක් ම; **සාමං ඤාතං,** තමන් වහන්සේ විසින් ම දන්නා ලද ද; **සාමං දිට්ඨං,** තමන් වහන්සේ විසින් ම දක්නා ලද ද; **විදිතං,** ප්‍රකටව දන්නා ලද ද;

**ඉධ,** මේ ලෝකයෙහි; **පුග්ගලො,** පුද්ගල තෙමේ; **මිච්ඡාමනං පණිධාය,** නුනුවණින් සිත පිහිටුවා; **මිච්ඡාවාචං,** මිථ්‍යා වචනයක්; **අභාසිය,** කියා; **කායෙන,** කයින්; **මිච්ඡාකම්මානි,** මිථ්‍යා කර්මාන්තයන්; **කත්වාන,** කොට;

**ඉධ**, මේ මිනිස් ලෙව්හි; **ජීවිතෙ**, ජීවිතය; **අප්පසමිං**, සවල්ප කල්හි; **අප්පඤ්ඤනො**, පුන විරහිතවූ; **අපුඤ්ඤකාරො**, පව් කරන්නාවූ; **සො දුප්පඤ්ඤො**, ඒ දුෂ්ප්‍රාඥ තෙම; **නිරයං**, නරකයට; **උපපජ්ජති**, පැමිණේ.

භාවය:-

පව්කොට නරකාදියෙහි උපදින්නවුන් තමන් වහන්සේගේ බුද්ධඥානයෙන් දැක ප්‍රකාශ කරනු මිස ඒ කාරණය අනිත් මහණ බමුණකුගෙන් අසා දැනගෙන නො වදරන බව මෙහින් වදාළහ.

**පළමුවන සූත්‍ර විවරණය යි**

**3 - 3 - 2**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

දිට්ඨා මයා භික්ඛවෙ සත්තා කායසුචරිතෙන සමන්නාගතා, වචීසුචරිතෙන සමන්නාගතා, මනොසුචරිතෙන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා තංඛොපනාහං භික්ඛවෙ නාඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහමණස්ස වා සුත්වා වදාමි.

දිට්ඨා මයා භික්ඛවෙ සත්තා කායසුචරිතෙන සමන්නාගතා, වචීසුචරිතෙන සමන්නාගතා, මනොසුචරිතෙන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා, අපිච භික්ඛවෙ යදෙව සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං තදෙවාහං වදාමි.

දිට්ඨා මයා භික්ඛවෙ සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති. එත මත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති.

"සම්මා මනං පණිධාය සම්මා වාචං අභාසිය
සම්මා කම්මානි කත්වාන කායෙන ඉධ පුග්ගලො
බහුස්සුතො පුඤ්ඤකරො අප්පස්මිං ඉධ ජීවිතෙ
කායස්ස භෙදා සප්පඤ්ඤො සග්ගං සො උපපජ්ජතී ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති

### 3 - 3 - 2

පළමු සූත්‍රයට විපය්‍යාස වශයෙන් මෙහි අර්ථය දතයුතු.

**දෙවන සූත්‍ර විවරණය යි**

### 3 - 3 - 3

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

තිස්සො ඉමා භික්ඛවෙ **නිස්සරණියා ධාතුයො** කතමා **තිස්සො**? කාමාන මෙතං නිස්සරණං යදිදං **නෙක්ඛම්මං**, රූපාන මෙතං නිස්සරණං යදිදං **ආරුප්පං**, යං ඛො පන කිඤ්චි භූතං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං, **නිරොධො** තස්ස **නිස්සරණං**, ඉමා ඛො භික්ඛවෙ තිස්සො නිස්සරණියා ධාතුයොති එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"කාමනිස්සරණං ඤත්වා රූපානඤ්ච අතික්කමං.
සබ්බසඞ්ඛාරසමථං ඵුසං ආතාපි සබ්බදා
ස වෙ සම්මද්දසො භික්ඛු යතො තත්ථ විමුච්චති
අභිඤ්ඤාවොසිතො සන්තො ස වෙ යොගාතිගො මුනී'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

### 3 - 3 - 3

**අර්ථය**:–

**නිස්සරණියා**, නිවන ඇසුරු කළා වූ; **ධාතුයො**, ධාතූහු; **යදිදං**, යම් මේ; **නෙක්ඛම්මං**, ප්‍රථමධ්‍යානය වේ ද; **එතං**, මෙය; **කාමානං**, වස්තුකාම ක්ලේශ කාමයන්ගේ; **නිස්සරණං**, නිගීමය වේ; **ආරුප්පං**, අරූපාවචර ධ්‍යානය යන යමක්

ඇද්ද; **එතං**, මෙය; **රූපානං**, රූපයන්ගේ; **නිස්සරණං**, අපගමය හෙවත් දුරුකිරීම වේ; **භූතං**, හටගත්; **සඞ්ඛතං** සකස් කරන ලද; **පටිච්චසමුප්පන්නං**, හේතු ප්‍රත්‍යයෙන් උපන්; **යං ඛො පන කිඤ්චි**, යම් කිසිවක් වේ ද; **නිරොධො** නිවන; **තස්ස නිස්සරණං**, ඔහුගේ අපගමය වේ.

**කාමනිස්සරණං**, කාමයන්ගේ දුරලීම; **ඤත්වා**, දැන, **සබ්බසඞ්ඛාරසමථං**, සියලු සංස්කාරයන්ගේ සන්සිඳීම නම් වූ නිවන; **ඵුසං**, ස්පර්ශ කරන්නා වූ; **සබ්බදා**, හැම කල්හි; **ආතාපී**, කෙලෙසුන් තවන වීර්‍ය ඇති;

**සම්මද්දසො**, සම්‍යග් දර්ශනය ඇති; **සො භික්ඛු**, ඒ මහණ තෙම; **යතො**, යම් භාවනාවක් හේතු කොටගෙන, **තත්ථ**, එහි; **විමුච්චති**, කෙලෙසුන්ගෙන් මිදේ ද; **අභිඤ්ඤාවොසිතො**, චතුරාර්‍ය සත්‍යය අවබොධ කළා වූ; **සන්තො**, ශාන්ත වූ; **සො මුනි**, ඒ භික්ෂු තෙම; **වෙ**, ඒකාන්තයෙන්; **යොගාතිගො**, සංසාරොත්පත්තිය ඉක්මවූවෙක් වෙයි;

සෙස්ස සුගම යි.

**තෙවනි සූත්‍ර විවරණය යි**

## 3 - 3 - 4

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

**රූපෙහි** භික්ඛවෙ **අරූපා** සන්තතරා අරූපෙහි **නිරොධො** සන්තතරොති. එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"යෙ ච රූපූපගා සත්තා යෙ ච ආරුප්පට්ඨිනො
නිරොධං අප්පජානන්තා ආගන්තාරො පුනබ්භවං
යෙ ච රූපෙ පරිඤ්ඤාය අරූපෙසු අසණ්ඨිතා
නිරොධෙ යෙ විමුච්චන්ති තෙ ජනා මච්චුහායිනො
කායෙන අමතං ධාතුං ඵුසයිත්වා නිරූපධිං
උපධිප්පටිනිස්සග්ගං සච්ඡිකත්වා අනාසවො
දෙසෙති සම්මාසම්බුද්ධො අසොකං විරජං පදන්ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

## 3 - 3 - 4

**අර්ථය**:-

**රූපෙහි**, රූපාවචර ධර්මයන්ට වඩා; **අරූපා**, අරූපාවචරයෝ; **සන්තතරා**, අතිශයින් ශාන්ත වෙත්; **අරූපෙහි**, අරූපාවචරයන්ට වඩා; **නිරොධො**, නිවන; **සන්තතරො**, අතිශයින් ශාන්තවේ;

**රූපූපගා**, රූපභවයෙහි උපන්නා වූ; **යෙ ච සත්තා**, යම් සත්ව කෙනෙක්; **ආරුප්පට්ඨායිනො** අරූපාවචර වෙත් ද; **නිරොධං අප්පජානන්තා**, නිවන නොදත්තා වූ (ඔවුහු) **පුනබ්භවං**, පුනරුත්පත්තියට; **ආගන්තාරො**, පැමිණෙන්නාහු ය;

**යෙ**, යම් කෙනෙක්; **රූපෙ**, රූපභවයන්; **පරිඤ්ඤාය**, පිරිසිඳ දැන; **අරූපෙසු**, අරූප භවයන්හි; **අසණ්ඨිතා**, නො පිහිටියාහු; (**යෙ** යනු නිපාත මාත්‍ර යි) **නිරොධෙ නිවනෙහි**; **විමුච්චන්ති**, මිදෙත් ද; **තෙ ජනා**, ඒ ජනයෝ; **මච්චුහායිනො**, මරණය දුරු කළාහු වෙත්.

**කායෙන**, නාම කයින්; **නිරූපධිං**, කෙලෙස් රහිතවූ; **අමතං ධාතුං**, නිවන; **ඵුසයිත්වා**, ස්පර්ශ කොට; **උපධි පටිනිස්සග්ගං**, උපධීන්ගේ දුරලීම නම් වූ අර්හත්වය; **සච්ඡිකත්වා**, ප්‍රත්‍යක්ෂ කොට; **අනාසවො**, කෙලෙස් රහිත වූ; **සම්මා සම්බුද්ධො**, සම්‍යක් සම්බුද්ධ තෙම; **පජං**, සත්වප්‍රජාවට; **අසොකං**, සොක රහිත වූ; **විරජං**, රාගාදි කෙලෙස් රජස් නැති (ධර්මය) **දෙසෙති**, දේශනා කෙරෙයි.

**ධර්මවිස්තර**:-

රූපාවචර ධර්මයන්ට වඩා අරූපාවචර ධර්ම අතිශයින් ම ශාන්තය. කුමක් හෙයින් ද යත්? රූපාවචරධර්ම ශාන්ත වන්නේ කෙලෙසුන් මැඩ පවත්නා හෙයින් ද, විතර්ක විචාරාදි ඖදාරික අඞ්ගයන් ක්‍රමයෙන් දුරු වන හෙයින් ද, සමාධියට භූමි වන හෙයින් ද යි යන මේ කාරණත්‍රයෙනි.

අරූපාවචර ධර්ම එයටත් වඩා ශාන්ත වූ උපෙක්ෂා එකාග්‍රතා නම්වූ අඞ්ගයෙන් හා ශාන්තවූ අරමුණෙන් අතිශයින් ශාන්තපැවතුම් ඇති හෙයින් ද ශාන්තතරයහ.

කුමක්හෙයින් ද යත්? චිත්ත චෛතසික ධර්මයන් සියුම් වන හෙයින් ද, කෙලෙසුන්ගෙන් ඇති වන වෙහෙස සන්සිඳුවන හෙයින් ද, නිවන් අරමුණු කරන හෙයින් ද වේ. සතරවන අරූපධ්‍යානයට වඩා නොහොත් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට වඩා ඵලසමාපත්තියම අතිශයින් ශාන්ත වන්නේ ය. සර්වසංස්කාරයන්ගේ සමථය වූ අග්‍රීන් ඵලය ගැන කියනුම කවරේ ද? යෙ යනු නිපාතමාත්‍ර යි.

**සතර වන සූත්‍රවිවරණය යි.**

**3 - 3 - 5**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං.**

තයො මෙ භික්ඛවෙ **පුත්තා** සන්තො සංවිජ්ජමානා **ලොකස්මිං**, කතමෙ තයො? **අතිජාතො අනුජාතො අවජාතොති**.

කථඤ්ච භික්ඛවෙ පුත්තො අතිජාතො හොති? ඉධ භික්ඛවෙ පුත්තස්ස මාතාපිතරො හොන්ති; න බුද්ධං සරණං ගතා, න ධම්මං සරණං ගතා, න සඞ්ඝං සරණං ගතා, පාණාතිපාතා අප්පටිවිරතා, අදින්නාදානා අප්පටිවිරතා, කාමෙසුමිච්ඡාචාරා අප්පටිවිරතා, මුසාවාදා අප්පටිවිරතා, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා අප්පටිවිරතා, දුස්සීලා, පාපධම්මා, පුත්තො ච නෙසං හොති බුද්ධං සරණං ගතො, ධම්මං සරණං ගතො, සඞ්ඝං සරණං ගතො, පාණාතිපාතා පටිවිරතො, අදින්නාදානා පටිවිරතො, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො, මුසාවාදා පටිවිරතො, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො, සීලවා, කල්‍යාණධම්මො, එවං ඛො භික්ඛවෙ පුත්තො **අතිජාතො** හොති

කථඤ්ච භික්ඛවෙ පුත්තො **අනුජාතො** හොති? ඉධ භික්ඛවෙ පුත්තස්ස මාතාපිතරො හොන්ති බුද්ධං සරණං ගතා, ධම්මං සරණං ගතා, සඞ්ඝං සරණං ගතා, පාණාතිපාතා පටිවිරතා, අදින්නාදානා පටිවිරතා, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා, මුසාවාදා පටිවිරතා, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතා, සීලවන්තො, කල්‍යාණධම්මා, පුත්තො ච නෙසං හොති බුද්ධං සරණං ගතො, ධම්මං සරණං ගතො, සඞ්ඝං සරණං ගතො, පාණාතිපාතා පටිවිරතො, අදින්නාදානා පටිවිරතො, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො, මුසාවාදා පටිවිරතො, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො, සීලවා, කල්‍යාණධම්මො, එවං ඛො භික්ඛවෙ පුත්තො **අනුජාතො** හොති.

කථඤ්ච භික්ඛවෙ පුත්තො **අවජාතො** හොති? ඉධ භික්ඛවෙ පුත්තස්ස මාතාපිතරො හොන්ති බුද්ධං සරණං ගතා, ධම්මං සරණං ගතා, සඞ්ඝං සරණං ගතා, පාණාතිපාතා පටිවිරතා, අදින්නාදානා පටිවිරතා, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා, මුසාවාදා පටිවිරතා, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතා, සීලවන්තො, කල්‍යාණධම්මා, පුත්තො ච නෙසං හොති න බුද්ධං සරණං ගතො, න ධම්මං සරණං ගතො, න සඞ්ඝං සරණං ගතො, පාණාතිපාතා අප්පටිවිරතො, අදින්නාදානා අප්පටිවිරතො, කාමෙසු මිච්ඡාචාරා අප්පටිවි-රතො, මුසාවාදා අප්පටිවිරතො, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා අප්පටිවිරතො, දුස්සීලො, පාපධම්මො, එවං ඛො භික්ඛවෙ පුත්තො **අවජාතො** හොති.

ඉමෙ ඛො භික්ඛවෙ තයො පුත්තා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"අතිජාතං අනුජාතං පුත්තමිච්ඡන්ති පණ්ඩිතා
අවජාතං න ඉච්ඡන්ති යො හොති කුලගන්ධනො
එතෙ ඛො පුත්තා ලොකස්මිං යෙ භවන්ති උපාසකා
සද්ධා සීලෙන සම්පන්නා වදඤ්ඤූ වීතමච්ඡරා
චන්දො අබ්භඝනා මුත්තො පරිසාසු විරොචරෙ'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

**අර්ථය:-**

**අතිජාතො**, මව් පියන්ට වඩා අධික ගුණ ඇති පුත්‍රයා ය; **අනුජාතො**, මව් පියන්ට සමාන ගති ගුණ ඇති පුත්‍රයා ය; **අවජාතො**, මව් පියන්ට වඩා පහත් ගුණ ඇති පුත්‍රයා ය; සෙස්ස සුගම යි.

**අතිජාතං**, අතිජාත ය; **අනුජාතං**, අනුජාත ය; යන **පුත්තං**, පුත්‍රයා; **පණ්ඩිතා**, නුවණවන්තයෝ; **ඉච්ඡන්ති**, කැමැති වෙත්; **යො**, යමෙක්; **කුලගන්ධනො හොති**, කුලය වනසන්නේ ද; **අවජාතං**, ඒ අවජාත පුත්‍රයා; **න ඉච්ඡන්ති**, කැමැති නොවෙත්;

**ලොකස්මිං**, ලෝකයෙහි; **එතෙ ඛො**, මොවුහු ම; **පුත්තා**, පුත්‍රයෝ වෙත්; **යෙ**, යම් කෙනෙක්; **සද්ධාසීලෙන සම්පන්නා**, ශ්‍රද්ධා ශීල දෙකින් යුක්ත වූ; **වදඤ්ඤූ**, දුප්පතුන්ගේ වචන දන්නා වූ; **වීතමච්ඡරා**, පහවූ මසුරුමල ඇති; **උපාසකා භවන්ති**, උපාසකයෝ වෙත් ද (ඔවුහු) **අබ්භඝනා**, වලාකුළෙන්; **මුත්තො**, මිදුණා වූ; **චන්දො ඉව**, චන්ද්‍රයා මෙන්; **පරිසාසු**, පිරිස් අතරෙහි; **විරොචරෙ**, බබළත්; සෙස්ස සුගම යි.

**පස්වෙනි සූත්‍ර විවරණය යි.**

## 3 - 3 - 6

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

තයො මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං, කතමෙ තයො? **අවුට්ඨිකසමො**, **පදෙසවස්සී**, **සබ්බත්ථාභිවස්සී**, කථඤ්ච භික්ඛවෙ පුග්ගලො **අවුට්ඨිකසමො** හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සබ්බෙසඤ්ඤෙව න දාතා හොති සමණබ්‍රාහ්මණකපණද්ධිකවණිබ්බකයාචකානං අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං, එවං ඛො භික්ඛවෙ පුග්ගලො **අවුට්ඨිකසමො** හොති.

කථං ච භික්ඛවෙ පුග්ගලො **පදෙසවස්සී** හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො එකච්චානං දාතා හොති, එකච්චානං න දාතා හොති. සමණබ්‍රාහ්මණකපණද්ධික වණිබ්බකයාචකානං අන්නං පානං වත්ථං යානං මාලා ගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං, එවං ඛො භික්ඛවෙ පුග්ගලො **පදෙසවස්සී** හොති.

කථඤ්ච භික්ඛවෙ පුග්ගලො **සබ්බත්ථාභිවස්සී** හොති? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සබ්බෙසං ච දෙති සමණ බ්‍රාහ්මණ කපණද්ධික වණිබ්බකයාචකානං අන්නං පානං වත්ථං යානං මාලා ගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං, එවං ඛො භික්ඛවෙ පුග්ගලො **සබ්බත්ථාභිවස්සී** හොති.

ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මින්ති. එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"න සමණෙ න බ්‍රාහ්මණෙ කපණද්ධික වණිබ්බකෙ
ලද්ධාන සංවිභජති අන්නං පානඤ්ච භොජනං
තං වෙ අවුට්ඨිකසමොති ආහු තං පුරිසාධමං
එකච්චානං න දදාති එකච්චානං පවෙච්ඡති
තං වෙ පදෙසවස්සීති ආහු මෙධාවිනො ජනා
සුභික්ඛවාචො පුරිසො සබ්බභූතානුකම්පකො
ආමොදමානො පකිරෙති දෙථ දෙථාති භාසති
යථාපි මෙඝො ථනයිත්වා ගජ්ජයිත්වා පවස්සති
ථලං නින්නඤ්ච පූරෙති අභිසන්දන්තො ච වාරිනා
එවමෙව ඉධෙකච්චො පුග්ගලො හොති තාදිසො
ධම්මෙන සංහරිත්වාන උට්ඨානාධිගතං ධනං
තප්පෙති අන්නපානෙන සම්මා පත්තෙ වණිබ්බකෙති"

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති

**අර්ථය**:–

**අවුට්ඨිකසමො**, වැසි නැති වලාකුළක් බඳු පුද්ගලයා ය; **පදෙසවස්සී**, ප්‍රදේශ වර්‍ෂාවක් බඳු පුද්ගලයා ය; **සබ්බත්ථාභිවස්සී**, සැමතැනට ම වහින වැස්සක් බඳු පුද්ගලයා ය;

**සමණෙ**, ශ්‍රමණයකු කෙරෙහිත්; **න**, නොදේ ද; **බ්‍රාහ්මණෙ**, බමුණකු කෙරෙහිත්; **න**, නොදේ ද; **කපණද්ධිකවනිබ්බකෙ**, දුගී මඟී යාචකයන් කෙරෙහිත්; **න**, නොදේද; **අන්නං**, ආහාරය; **පානං**, පාන වර්‍ගය; **භොජනං ච**, භොජනය ද; **ලද්ධා**, ලැබ; **න සංවිභජති**, බෙදා නොදේ ද; **පුරිසාධමං**, අධමපුරිසයකු වූ; **තං**, එබඳු නදමපුරා; **අවුට්ඨිකසමො ඉති**, නො වැස්සක් බඳු යයි; **ආහු**, කීහු;

**එකච්චානං**, සමහරුන්ට; **න දදාති**, නොදෙයි; **එකච්චානං**, ඇතැම් කෙනකුන්ට; **පවෙච්ඡති**, දෙ යි; **මෙධාවිනො ජනා**, පණ්ඩිතයෝ; **තං**, ඔහු; **පදෙසවස්සී**, **ඉති**, ප්‍රදේශවර්ෂී ය යි; **ආහු**, කීහු.

**සුභික්ඛවාචො**, සුලභවූ භික්‍ෂාව සඳහා කියන වචන ඇති; **සබ්බභූතානුකම්පකො**, සියලු සත්වයන් කෙරෙහි අනුකම්පා කරන්නාවූ, **පුරිසො**, පුරිස තෙම; **ආමොදමානො**, සතුටු සිත් ඇතිව; **පකිරෙති**, දියයුතු දෙය විසුරුව යි; **දෙථ දෙථ ඉති**, දෙව යි දෙව යි කියා; **භාසති**, කිය යි;

**යථාපි**, යම් සේ; **මෙඝො**, වැස්ස; **ථනයිත්වා**, ගන්තම් නාදකොට; **ගජ්ජයිත්වා**, නැවත ගජිනා කොට; **පවස්සති**, වසී ද; **අභිනන්දෙන්තො ඉව**, ගලා බසින්නාක් මෙන්; **වාරිනා**, ජලයෙන්; **ථලං නින්නං ච**, ගොඩ වල දෙකත්; **පූරෙති**, පුරා ද;

**එවමෙව**, එපරිද්දෙන්; **ඉධ**, මේ ලෝකයෙහි; **තාදිසො**, එබඳු වූ; **එකච්චො පුග්ගලො**, ඇතැම් පුද්ගලයෙක්; **හොති**, වෙයි; (හෙතෙම) **උට්ඨානාධිගතං**, උත්‍ථාන වීර්‍යයෙන් උපදවනලද; **ධනං**, ධනය; **ධම්මෙන සංහරිත්වාන**, දැහැමින්

රැස්කොට; **වණිබ්බකෙ**, වනීවකයන්; **අන්නපානෙන**, ආහාර පානයෙන්; **සම්මා**, මනාකොට; **තප්පෙති**, සංතර්පණය කෙරෙයි;

සෙස්ස සුගම යි

## සත්වන සූත්‍ර විවරණය යි

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

**තීණිමානි** භික්ඛවෙ සුඛානි පත්ථයමානො සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතො, කතමානි තීණි? **පසංසා මෙ ආගච්ඡතූති** සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතො, **භොගා මෙ උප්පජ්ජන්තූති** සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතො, කායස්ස භෙදා පරම්මරණා **සුගතිං සග්ගං ලොකං උප්පජ්ජිස්සාමීති** සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතො, ඉමානි ඛො භික්ඛවෙ තීණි සුඛානි පත්ථයමානො සීලං රක්ඛෙය්‍ය පණ්ඩිතො'ති, එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති

"සීලං රක්ඛෙය්‍ය මෙධාවී පත්ථයානො තයො සුඛෙ
පසංසං විත්තලාභඤ්ච පෙච්ච සග්ගෙ පමොදනං
අකරොන්තොපි චෙ පාපං කරොන්ත මුපසෙවති
සඞ්කියො හොති පාපස්මිං අවණ්ණො චස්ස රූහති

යාදිසං කුරුතෙ මිත්තං යාදිසං චූපසෙවති
ස වෙ තාදිසකො හොති සහවාසොපි තාදිසො
සෙවමානො සෙවමානං සම්ඵුට්ඨො සම්ඵුසං පරං
සරො දිද්ධො කලාපංව අලිත්තමුපලිම්පති.

උපලෙපභයා ධීරො නෙවපාපසඛා සියා-
පූතිමච්ඡං කුසග්ගෙන යො නරො උපනය්හති
කුසාපි පූතිවායන්ති එවං බාලූපසෙවනා
තගරඤ්ච පලාසෙන යො නරො උපනය්හති
පත්තාපි සුරභිවායන්ති එවංධීරූපසෙවනා--
තස්මා පත්තපුටස්සෙව ඤත්වා සම්පාකමත්තනො
අසන්තෙනුපසෙවෙය්‍ය සන්තෙ සෙවෙය්‍ය පණ්ඩිතො
අසන්තො නිරයං නෙන්ති සන්තො පාපෙන්ති සුග්ගතිං'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

**3 - 3 - 7**

අර්ථය

**පසංසා මෙ ආගච්ඡතු ඉති,** කීර්තියක් හෝ ප්‍රශංසා-වක් මට පැමිණේවා යි; **භොගා මෙ උප්පජ්ජන්තු ඉති,** මට උපභොග පරිභොග වස්තු උපදින්වා යි;

**මෙධාවී,** ප්‍රාඥ තෙමේ; **තයො සුඛෙ,** සැප තුනක්; **පත්ථයානො,** පතමින්; **සීලං රක්ඛෙය්‍ය,** සිල් රකින්නේ ය; **පසංසං,** ප්‍රශංසාව ද; **විත්තලාභං ච,** වස්තු ලාභය ද; **පෙච්ච,** පරලෙව්හි; **සග්ගෙ,** දෙව්ලොව; **පමොදනං,** සතුට ද යන තුන යි.

**චෙ,** ඉදින්; **පාපං,** පවක්; **අකරොන්තො අපි,** තෙමේ නොකරන්නෙක් වුව ද; **කරොන්තං,** පව්කම් කරන්නකු; **උපසෙවති,** ඇසුරු කෙරේ ද; (හෙතෙම) **පාපස්මිං,** පාප යෙහි; **සඞ්කියො හොති,** සැක කළ යුත්තෙක් වෙයි; **අස්ස,** ඔහුගේ; **අවණ්ණො ච,** අපකීර්තියත්; **රූහති,** වැඩෙයි.

**යාදිසං මිත්තං,** යම් බඳු මිත්‍රයකු; **කුරුතෙ,** (යමෙක්) ඇසුරු කෙරේ ද; **යාදිසං,** යම් බඳු මිත්‍රයකු; **උපසෙවති,** සෙවුණේ ද; **සො,** හෙතෙම; **වෙ,** ඒකාන්තයෙන්; **තාදිසකො හොති,** එබන්දෙක් වේ; **සහවාසො අපි,** ඔහු හා එක්ව විසීම ද; **තාදිසො,** එබඳු වේ;

**සෙවමානං,** කලින් කල තමා ඇසුරු කරන්නාවූ; **පරං,** ස්වභාවයෙන් පවිත්‍රවූ උතුම් පුද්ගලයකු; **සෙවමානො,** සෙවුනා ලබන; පාපී, පුද්ගලතෙම; (සිල්වතුන් ඇසුරු කරන පාපී පුද්ගලතෙමේ ය යු සේ යි) **සම්ඵුට්ඨො,** ප්‍රකෘතියෙන් පිරිසුදු පුද්ගලයා විසින් ස්පර්ශ කරනලද පාපී පුද්ගලතෙමේ ද; **සම්ඵුසං,** ඔහු (ඒ සිල්වතා) ස්පර්ශ කරන්නේ; (පව්ටත් නොහොත් දුසිලුන් ඇසුරු කරන සිල්වතාය යු සේ යි) **දිද්ධො සරො,** විෂ පෙවූ ඊය; **අලිත්තං කලාපං ඉව,** විෂ නොතැවරුණු ඊම්විය මෙන්; **උපලිම්පති,** දුශ්චරිතයෙන්

තවරයි; (එහෙයින්) **උපලෙපභයා**, පව් තැවරීමේ බියෙන්; **ධීරො**, ප්‍රාඥ තෙම; **නෙවපාපසඛා සියා**, පවිටන් හා මිත්‍ර නොවන්නේ ය;

සිල්වතකු ඇසුරු කරන දුස්සීලයන් හා දුස්සීලයකු ඇසුරු කරන සිල්වතුන් ද යන මේ දෙපක්‍ෂය ම විෂ පෙවූ ඊතලයක් සෙසු ඊතල මිටිය හා එකට දැමීමෙන් සෙසු ඊතල ද විෂයෙන් තැවරෙන්නාක් මෙන් දුසිරිත්වලින් තැවරෙයි. එහෙයින් ඤාණවන්ත පුද්ගල තෙම තමන්ගේ ඇඟෙහි ද පව් තැවරේය යන බියෙන් පවිටන් හා මිත්‍ර නොවන්නේ ය යනු මෙහි භාවය යි. මේ සඳහා ධම්මප්‍රදීපිකායෙහි 179 වැනි පිටේ 'සමපනාභිනීහාරො' යන්නෙහි පරිකථාව හා සසඳා බැලීම ප්‍රයෝජනවත් වෙයි.

**යො නරො**, යම් මිනිසෙක්; **පූතිමච්ඡං**, කුණු වී ගිය දියමසක්; **කුසග්ගෙන**, කුස තණගින්; **උපනය්හති**, බඳී ද; **කුසාපි**, කුස තණ ද නොහොත් පිදුරු ද; **පූතී වායන්ති**, කුණුගඳ වහනය කෙරෙත්; **බාලූපසෙවනං**, අසත්පුරුෂ ආශ්‍රය ද; **එවං**, මෙසේ ය;

**යො නරො**, යම් මිනිසෙක්; **පලාසෙන**, පලාස පත්‍ර පුටයෙන් නොහොත් කොළපත් ගොටුවෙන්; **තගරං**, තුවරලා (එනම් සුගන්ධ ද්‍රව්‍යය නොහොත් කට්ට කුමඤ්ජල්) **උපනය්හති**, බඳී ද; **පත්තාපි**, පත්‍රයෝ ද; **සුරභිවායන්ති**, සුගන්ධ වහනය කෙරෙත්; **ධීරූපසෙවනා**, ප්‍රාඥයන්ගේ සමාගමය ද; **එවං**, එසේ ය;

**තස්මා**, එහෙයින්; **පත්තපුටස්සෙව**, තගරගන්ධපරිමල පලාසපත්‍රපුටයක් සෙයින්; **අත්තනො**, තමහට (සිදුවන) **පරිපාකං**, ඵල නිෂ්පත්තිය; **ඤත්වා**, දැන; **අසන්තෙ**, අසත් පුරුෂයන්; **න උපසෙවෙය්‍ය**, ඇසුරු නොකරන්නේ ය; **පණ්ඩිතො**, ඤාණවන්ත තැනැත්තේ; **සන්තෙ**, සත් පුරුෂයන්, **සෙවෙය්‍ය**, ඇසුරු කරන්නේ ය; **අසන්තො**, අසත්

පුරුෂයෝ; **නිරයං**, (ඇසුරු කළ තැනැත්තහු) නරකයට; **නෙනති**, පමුණුවත්; **සන්තො**, සත්පුරුෂයෝ; **සුගතිං**, සුගතියට; පාපෙනති, පමුණුවත්;

**සෙසස** සුගම යි.

## සත්වන සූත්‍ර විවරණය යි

### 3 – 3 – 8

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං**

භිදුරායං භික්ඛවෙ **කායො**, **විඤ්ඤාණං** විරාගධම්මං, සබ්බෙ **උපධී** අනිච්චා දුක්ඛා විපරිණාමධම්මාති එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

කායං ච භින්දනං ඤත්වා විඤ්ඤාණඤ්ච විරාගිනං
උපධීසු භයං දිස්වා ජාතිමරණමච්චගො
සම්පත්වා පරමං සන්තිං කාලං කඞ්ඛති භාවිතත්තොති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

### 3 – 3 – 8

**අර්ථය:–**

**අයං කායො**, මේ සතර මහා භූතයන්ගෙන් හටගත් ශරීරය; **භිදුරො**, බිඳීම සවභාකොට ඇත්තේ ය; **විඤ්ඤාණං**, ත්‍රෛභූමක කුශලා'කුශල චිත්තය; **විරාගධම්මං**, නො ඇලෙන සවභාවය ඇත්තේ ය; නොහොත් විනාශ වන සවභාව ඇත්තේය; **සබ්බෙ උපධී**, සියලු උපධීහු; **අනිච්චා**, අනිත්‍යයහ; **දුක්ඛා**, දුඃඛයහ; **විපරිණාම ධම්මා**, පෙරළෙන සවභාව ඇත්තාහු ය;

**කායං ච**, ශරීරය ද; **භින්නනං ඤත්වා**, බිඳෙනු දැන; **විඤ්ඤාණං ච**, සිත ද; **විරාගිනං**, විරාග ඇත්තක් සේ නොහොත් විනාශ වන සවභාවය ඇත්තක් සේ; (දැන) **උපධීසු**, උපධීන් කෙරෙහි; **භයං දිස්වා**, බිය දැක; **ජාති මරණ මච්චගො**, ජාති මරණ දෙක ඉක්මවූ; **භාවිතත්තො**,

වඩන ලද සිත් ඇති යෝගාවචර තෙම; **පරමං සන්තිං**, උතුම් වූ නිවනට; **සම්පජ්ජා**, පැමිණ; **කාලං කඞ්ඛති** කාලය පමණක් කැමැති වෙයි;

භාවය සුගම යි.

**ධර්මවිස්තර:-**

**කායවිඤ්ඤාණ--**

මෙහි කාය යන පදයෙන් රූප කය දැක්වීමෙන් රූප කර්මස්ථානය ද, විඤ්ඤාණ පදයෙන් අරූප කර්මස්ථානය දැයි මෙසේ රූපාරූප කර්මස්ථාන ද්වය දක්වා නැවත සියලු ත්‍රෛභූමක ධර්මයන් උපධි යන පදයෙන් එකතු කොට අනිත්‍ය දුඃඛ අනුපස්සනා වශයෙන් නිර්වාණාවබෝධය කරන්නවුන්ගේ අධ්‍යාශයානුකූලව සම්මර්ශනය කළයුතු ආකාරය දක්වන ලදී.

හෙ මෙසේ යි:-

මේ යෝගාවචර තෙම තමාගේ රූපකය ගැන සිතමින් "මාගේ මේ ශරීරය සතර මහාභූතයන්ගෙන් හටගත්තේ ය. ශුක්‍ර ශ්‍රොණිත දෙකින් උපන්නේ ය, ආහාරයෙන් වැඩුණේ ය, ඒ සතර මහාභූතයන් නිසා උපාදාය රූපයෝ ද හටගනිත්. රූපස්කන්ධය නම් මෙපමණ ය, මෙයට වඩා යමක් නැතැ යි එහි ලක්ෂණාදි විභාග වශයෙන් සලකා විඥානශීර්ෂයෙන් නාමය ද වෙන්කොට ගෙන මේ රූපය, මේ නාම යයි නාම රූප වශයෙන් සම්මර්ශනය කෙරෙයි. මෙය නාම රූප මාත්‍රයක් මිස අනික් සත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැතැ යි සලකා අවිද්‍යාදි හේතුප්‍රත්‍යය ධර්මයන්ට අනුව සිතමින් "භිදුරායං කායො විඤ්ඤාණං විරාගධම්මං" යනුවෙන් අනිත්‍ය ලක්ෂණය මෙනෙහි කොට විදසුන් වඩා රහත් වෙයි.

**උපධි** නම්:- ඛන්ධූපධි කිලෙසූපධි අභිසඞ්ඛාරූපධි පඤ්චකාමගුණූපධි යන සතරයි. **ඛන්ධූපධි** නම්:- පඤ්ච උපාදානස්කන්ධයෝ යි. **කිලෙසූපධි** නම්:- ලොභ, දෙස,

මොහ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන දශ වැදෑරුම් කෙලශයෝ යි. **අභිසංඛාරූපධි** නම්:- ත්‍රෛභූමක කුශලාකුශල චේතනාවෝ යි. මේ කොටස් දෙකම සංස්කාර ස්කන්ධයට ඇතුළත් වෙයි. **පඤ්චකාමගුණූපධි** නම්:- පස්කම් සැපය යි. මේ සියලු උපධිහු ම ස්කන්ධපංචකයට ඇතුළත් වෙති. එහි රූප ස්කන්ධය රූපය යි ද, සෙසු සතර අරූප ස්කන්ධය නාම යයි ද සලකමින් නාමරූප ව්‍යවස්ථානය කොට අවිද්‍යාදි ප්‍රත්‍යය ධර්මයන් එයට සම්බන්ධ කොට "සබ්බෙ උපධි අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා" යනුවෙන් අනිත්‍ය දුඃඛ ලක්ෂණද්වයෙහි සිත නංවා විදසුන් පිළිවෙළින් වඩා රහත් වෙයි.

මේ සූත්‍රයෙහි අනිත්‍ය දුඃඛ ලක්ෂණද්වය පමණක් සඳහන් වුව ද "යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා" යනු වදාළ හෙයින් අනිත්‍යලක්ෂණයෙන් දුඃඛලක්ෂණයත් දුක්ඛ ලක්ෂණයෙන් අනාත්මලක්ෂණයත් දක්වනලදැ යි සැලකිය යුතු.

**කාලං කඞ්ඛති**—

"කාලය සලකයි" යනුවෙන් ප්‍රකාශවූයේ මෙසේ භාවනා කොට නිවන් අවබෝධ කළ රහතන් වහන්සේ තමන්ගේ ස්කන්ධ පරිනිර්වාණ කාලය පමණක් සලකනබව යි. මෙය රහත්ඵලය සඳහා භාවනා කරන යෝගාවචරයාහට විදසුන් වැඩීමෙහිදී සංස්කාරොපෙක්ෂාඥානයෙහිදීම භාවිත වෙයි. එහෙයින් උන්වහන්සේ ඉක්මනින් පිරිනිවීමට හෝ කලක් ජීවත්වීමට හෝ කැමැති නොවෙති. කර්ම ශක්තියෙන් ලැබූ ආයුෂ කාලය පමණක් සලකති. මෙහෙ කරන්නෙක් තමන්ට නියමිත වේතනය පමණක් බලාපොරොත්තු වන්නාක් මෙනි.

දම් සෙනෙවි සැරියුත් මහරහතන් වහන්සේ විසිනුදු මේ කාරණය මෙසේ වදාරනලදි. "පරවැඩ කිරීමෙහිදී කුලිය බලාපොරොත්තුව හිඳින මෙහෙකරුවෙක් යම්සේ ද, එමෙන් මම මරණයටත් සතුටු නොවෙමි. ජීවත්ව ඉඳීමටත් සතුටු නොවෙමි. ආයුෂ කාලය පමණක්ම කැමැත්තෙමි."

කුලියට මෙහෙ කරන්නා දවසකට තමන්ට ලැබෙන්නේ රුපියලක් නම් රුපියල පමණ මිස එකක් වැඩි කොට රුපියල්දෙකක් ගැන්මට හෝ ශත විසිපහක් අඩු කොට ශත හැත්තෑපහක් හෝ ලබන්නට නොසිතයි. තමහට නියම වැටුප පමණක් බලාපොරොත්තු වෙයි. රහතන් වහන්සේ ද එසේ ය

"තවද අර්ථානර්ථ දැනගන්නා සම්පජාන ප්‍රඥාවෙන් යුක්තවූ එසේ ම සිහියෙන් යුක්තවූ මම මරණයටත් සතුටු නොවෙමි. ජීවත්වීමටත් සතුටු නොවෙමි. ආයුෂය ගෙවී යන කාලයම කැමැත්තෙමි"යි වදාළ මේ ශ්‍රාවක ගාථා දක්වාලූ සේක.

"නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං
කාලං ච පතිකඞ්ඛාමි නිබ්බිසං භතකො යථා
නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං
කාලං ච පතිකඞ්ඛාමි සම්පජානො පතිස්සතො" යනු යි.

**අටවන සූත්‍ර විවරණය යි.**

## 3 – 3 – 9

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

ධාතුසො භික්ඛවෙ සත්තා සත්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති, හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙහි සත්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති, කල්‍යාණාධිමුත්තිකා සත්තා කල්‍යාණාධිමුත්තිකෙහි සත්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති.

**අතීතම්පි** භික්ඛවෙ **අද්ධානං** ධාතුසො සත්තා සත්තෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු, හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු, කල්‍යාණාධිමුත්තිකා-සත්තා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දිංසු සමිංසු,

**අනාගතම්පි** භික්ඛවෙ **අද්ධානං** ධාතුසො සත්තා සත්තෙහි සද්ධිං සංසන්දිස්සන්ති සමිස්සන්ති, හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙහි සත්තෙහි සද්ධිං සංසන්දිස්සන්ති සමිස්සන්ති, කල්‍යාණාධිමුත්තිකා සත්තා කල්‍යාණාධිමුත්ති-කෙහි සත්තෙහි සද්ධිං සංසන්දිස්සන්ති සමිස්සන්ති,

එතරහිපි භික්ඛවෙ **පච්චුප්පන්නං අද්ධානං** ධාතුසොව සත්තා සත්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති, හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙහි සත්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති, කල්‍යාණාධිමුත්තිකා සත්තා කල්‍යාණාධිමුත්තිකෙහි සත්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්තී'ති එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති

"සංසග්ගා වනථො ජාතො අසංසග්ගෙන ඡිජ්ජති
පරිත්තං දාරු මාරුය්හ යථා සීදෙ මහණ්ණවෙ
එවං කුසීතමාගම්ම සාධුජීවීපි සීදති
තස්මා තං පරිවජ්ජෙය්‍ය කුසීතං හීනවීරියං
පවිවිත්තෙහි අරියෙහි පහිතත්තෙහි ඣායිහි
නිච්චං ආරද්ධවිරියෙහි පණ්ඩිතෙහි සහාවසෙ'ති
අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති

**3 – 3 – 9**

**අර්ථය**:–

**ධාතුසො**, ධාතු වශයෙන් නොහොත් අදහස් වශයෙන්; (අධිමුත්ති යනු ද මෙයටම කියනු ලැබේ. මෙහි ධාතු ශබ්ද ද අධිමුත්ති ශබ්ද ද අධ්‍යාශය වාචකයයි දතයුතු) **සංසන්දන්ති**, ඇලෙත්; **සමෙන්ති**, එකතුවෙත්; (ඔවුනොවුන් සමාන අදහස් ඇත්තවුන් හෙයිනුත් රුචියට කැමැත්තට ගතියට පිළිගැනීමට අනුව දෙදෙනාගේ ම සිත් එකමුතු හෙයිනුත් සංසන්දනය හා සමානාධ්‍යාශය ඇත්තේ ය යු සේ යි.) **හීනාධිමුත්තිකා සත්තා**, පහත් අදහස් ඇත්තෝ; **හීනාධිමුත්තිකෙහි සත්තෙහි**, හීනාධ්‍යාශය ඇත්තවුන් හා; **කල්‍යාණාධිමුත්තිකා සත්තා**, කලණ අදහස් ඇත්තෝ; **අතීතම්පි අද්ධානං**, අතීත කාලයෙහිදු; **එතරහිපි**, දැනුත්; **පච්චුප්පන්නං අද්ධානං**, වර්තමාන කාලයෙහිත්.

**සංසග්ගා**, සංසර්ගයෙන්; **වනථො**, කෙලශය තෙමේ; **ජාතො**, හටගත්තේ වේ; **අසංසග්ගෙන**, එකතු නොවීමෙන්; **ඡිජ්ජති**, සිඳෙයි හෙවත් නැතිවෙයි; **පරිත්තං දාරුං**, කුඩා ලීපුවරුවකට; **ආරුය්හ**, නැගී; **මහණ්ණවෙ**, මහා සාගර යෙහි; **යථා සීදෙ**, යම් සේ ගැළෙන්නේ ද එමෙනි.

**එවං**, එපරිද්දෙන්; **කුසීතං**, **ආගම්ම**, කම්මැලි පුද්ගලයා නිසා; **සාධු ජීවී අපි**, (ඔහු ඇසුරු කරන) පිරිසිදු ජිවිකාව ඇත්තා පවා; **සීදති**, විපතෙහි ගැලෙයි; **තස්මා**, එහෙයින්; **කුසීතං**, මැළිවූ; **හීනවීරියං**. වීර්‍ය නැති; **තං**, එබඳු පුද්ගලයා; **පරිවජ්ජයෙ**, දුරුකරන්නේය.

**පවිවිත්තෙහි**, විවේකයෙන් යුක්තවූ; **අරියෙහි**, ආර්‍යවූ; **පහිතත්තෙහි**, සමථවිදර්ශනා දෙක්හි යවනලද සිත් ඇති; **නිච්චං**, සැමකල්හි; **ආරද්ධවීරියෙහි**, ඇරඹූ වීර්‍ය ඇති; **ඣායීහි**, සිත එකඟකොට වසන්නාවූ; **පණ්ඩිතෙහි**, පණ්ඩිතයන් හා; **සහාවසෙ**, එක්ව වාසය කරන්නේ ය;

**භාවය** – සුගම යි.

**ධර්‍ම විස්තරඃ**-

**හීනාධිමුත්තිකා – කල්‍යාණාධිමුත්තිකා**

පවිටුඅදහස් ඇති පවිටුචරිත ඇති ශ්‍රද්ධාව නැති කුශලච්ඡන්දයක් නැති පස්කම් සැපයෙහි ගිජුවූවෝ 'හීනාධි මුත්තිකයෝ'යි. කලණඅදහස් ඇති යහපත් චරිතයක් ඇති නෛෂ්ක්‍රම්‍යය, ප්‍රථමධ්‍යානාදි ධ්‍යානගුණ ලැබීම ය, සමථ විපස්සනා භාවනාවන්හි යෙදීම ය, යන ආදී කුශලා ධ්‍යාශය නොහොත් ප්‍රණීතාධ්‍යාශය ඇත්තෝ 'කල්‍යාණාධි මුත්තිකයෝ'යි.

මෙසේ ඔවුනොවුන්ගේ චරිතවලට අදහස්වලට ගැලපෙන අන්දමින් ඔවුනොවුන් ඇසුරු කරන්නට සැරසීම හැමකල්හි ම ලෝකයාගේ සිරිත ය. මජ්ඣිමනිකායෙහි **මහාගොසිඞ්ග** සූත්‍රය මෙයට සාධකයකි. තවත් නිදසුනක් නම්:– "**අමරවතී** නුවර මනුෂ්‍යයෝ තමන්සේ මැ හීනාධ්‍යාශය ඇති සම්කාමානුභවකරන ජනයන් හා එක් වූහ. මහාපුරුෂයා (අප මහා බෝධිසත්ත්වයන් වහන්සේ) හා ගිය එක්කෙනකුනුදු නැතිවූහ. මහාපුරුෂ හීනාධ්‍යාශය සත්වයන් පියා ගොස් තමාසේ මැ කල්‍යාණාධ්‍යාශය ඇති බුදුන් (දීපංකර සම්බුදුයන් වහන්සේ) දැක ඔවුන් දුටු

විගසම ජීවිත පරිත්‍යාග කෙළේ, යම්සේ එබුදුහු සත්ත්වකරුණා යෙන් දශපාරමිතා පුරා සම්‍යක්සම්බොධියට ප්‍රාප්තවූහු ද එසෙයින් මැ මහාපුරුෂ ද දශ පාරමිතා පුරා සම්‍යක් සම්බොධියට ප්‍රාප්තවූව මැනවැ යි සිතීය. එහෙයින් බුදුන් හා සමානාධ්‍යාශය වී.

මෙසෙයින් හීනාධ්‍යාශය ඇති සත්ත්වයෝ හීනාධ්‍යාශය ඇති සත්ත්වයන් හා එක්වෙති. කල්‍යාණාධ්‍යාශය ඇති සත්ත්වයෝ කල්‍යාණාධ්‍යාශය ඇති සත්ත්වයන් හා එක්වෙත්. අතීතයෙහිදු, අනාගතයෙහුදු වර්තමානයෙහිදු එතෙක්මැ''යි යනු **ධර්මප්‍රදීපිකා** යි.

## නවවන සූත්‍ර විවරණය යි.

## 3 - 3 - 10

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

තයො මෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති, කතමෙ තයො? ඉධ භික්ඛවෙ සෙඛො භික්ඛු **කම්මාරාමො** හොති කම්මරතො කම්මාරාමත මනුයුත්තො, **භස්සාරාමො** හොති භස්සරතො භස්සාරාමත මනුයුත්තො, **නිද්දාරාමො** හොති නිද්දාරතො නිද්දාරාමත මනුයුත්තො, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා සෙඛස්ස භික්ඛුනො පරිහානාය සංවත්තන්ති.

තයො මෙ භික්ඛවෙ ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහා-නාය සංවත්තන්ති. කතමෙ තයො? ඉධ භික්ඛවෙ සෙඛො භික්ඛු **න කම්මාරාමො** හොති න කම්මරතො න කම්මාරාමත මනුයුත්තො, **න භස්සාරාමො** හොති න භස්සරතො න භස්සාරාමතමනුයුත්තො. **න නිද්දාරාමො** හොති න නිද්දාරතො න නිද්දාරාමතමනුයුත්තො, ඉමෙ ඛො තයො ධම්මා සෙඛස්ස භික්ඛුනො අපරිහානාය සංවත්තන්ති. එත මත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති

"කම්මාරාමො භස්සරතො නිද්දාරාමො ච උද්ධතො
අභබ්බො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධි මුත්තමං
තස්මා හි අප්පකිච්චස්ස අප්පමිද්ධො අනුද්ධතො
භබ්බො සො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධිමුත්තමන්ති
අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති

## තතියො වග්ගො

තස්සුද්දානං

චෙ දිට්ඨි නිස්සරණං රූපං පුත්තො අවුට්ඨිකෙන ච
සුඛා ච භින්දනා ධාතු පරිහානෙන තෙ දසාති.

## 3 - 3 - 10

**අර්ථය**:-

**සෙඛස්ස භික්ඛුනො**, ශෛක්ෂ මහණහට; **පරිහානාය**, පිරිහීම පිණිස (මාර්ගඵලාධිගමයට හානි පිණිස; උවදුරු පිණිස යු සේ යි.)

**කම්මාරාමො හොති**, නව කර්මාන්තයෙහි ඇලුණේ වේ ද; **කම්මාරාමතං**, නවකර්මයන්හි ඇලීමෙහි; **අනුයුත්තො**, යෙදුණේ වේ ද; **භස්සාරාමො හොති භස්සරතො**, භාෂ්‍යයෙහි නොහොත් අල්ලාප සල්ලාප කථාවන්හි ඇලුණේ වේ ද; **නිද්දාරාමො**, නින්දෙහි ඇලුණේ වේ ද; **නිද්දාරාමතං**, නිද්‍රාරාමතායෙහි; **අනුයුත්තො හොති**, යෙදුණේ වේ ද;

**සෙස්ස** සුගම යි.

**කම්මාරාමො**, නවකර්මයෙහි ඇලුණාවූ; **භස්සරතො**, කථායෙහි ඇලුණාවූ; **නිද්දාරාමො**, නින්දෙහි ඇලුණු; **උද්ධතො**, නොසන්සුන් සිත් ඇති; **තාදිසො භික්ඛු**, එබඳු මහණතෙම, **උත්තමං සම්බොධිං**, උතුම්වූ නිවන; **ඵුට්ඨුං**, ස්පර්ශ කරන්නට; **අභබ්බො**, නුසුදුස්සෙක් වේ.

**තස්මා හි**, එහෙයින් ම; **අප්පකිච්චස්ස**, අල්පකෘත්‍ය ඇත්තෙක් වන්නේ ය; **අප්පමිද්ධො**, ජාගර්‍යානුයෝගය ඇත්තෙක් වන්නේ ය; **අනුද්ධතො**, උඩඟු නොවන්නේ ය;

**සො තාදිසො භික්ඛු**, ඒ එබඳු මහණතෙමේ; **උත්තමං සම්බොධිං**, උතුම්වූ නිවන; **ඵුට්ඨුං**, ස්පර්ශ කරන්නට; **භබ්බො**, සුදුස්සෙක් වේ.

**භාවය**:- ස්ඵුට යි.

**ධර්මවිස්තර**:-

**කම්මාරාම**—

භික්ෂූන්ට යෝග්‍යවූ කටයුතු ද ඇත. එනම් සිවුරු කඩකැපීම්, මැසීම්, පත්තත්ථවික (පාත්‍රපසුම්බි) අංසබන්ධන (අංශකඩ) කායබන්ධන (පටිය) ධම්මකරක ඩබරාව) ආධාරක (පාත්‍රාදරණුව) පාදකඨලික (පාපුවරුව) සම්මජ්ජනී (මුසුන් බැඳීම) මේ ආදි වැඩ යි.

එසේ ද වුවත් ඉගෙනීම කරන වෙලාව, පිරිත් කියන වෙලාව, විහාර සෑ බෝමලු ඇමදීන වෙලාව, භාවනා කරන වෙලාව, යන මේ කාලයන්හි එය නො කොට පූර්වොක්ත කර්මයන්හි හෝ භණ්ඩුල්ල පටිසඞ්ඛරණයෙහි (කැඩුම් බිඳුම් හරිගැස්සීමෙහි) හෝ රෑ දවල් නොබලා නිතර යෙදීම කම්මාරාම නම් යි සැලකිය යුතු "යානි ඛො පන තානි සබ්‍රහ්මචාරිනං උච්චාවචානි කරණීයානි, තත්ථ දක්ඛො හොති අනලසො, තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො, අලං කාතුං අලං සංවිධාතුං" යනු මේ සඳහා ශාස්තෘහුගේ අනුඥාතකරණය යි.

**භස්සාරාමො**:-

දැහැමි කථායෙන් තොරව කෙලෙසුන් වැඩීමට හේතුවූ රාජකථාදි දෙතිස් කථාවන්හි නොහොත් වැඩකට නැති කථාවන්හි ඇලීම අකුසල සංකල්පයන් දියුණුවීමට හේතු වෙ යි.

එහෙයින්

"සන්නිපතිතානං වො භික්ඛවෙ ද්වයං කරණීයං වදාමි, ධම්මී වා කථා, අරියො වා තුණ්හීභාවො" යනු තථාගතනියමය යි.

**නිද්දාරාමො;-**

අධික වශයෙන් නින්දෙහි ඇලීම යි. හිඳිනා සිටිනා සෑමතැනකදී ම ථිනමිද්ධ නිවරණයෙන් මැඩීම සුදුසු නොවේ. යමකුට තමාගේ ශරීරයෙහි ඇති ගිලන් කමක් නිසා සිත අරමුණෙක නොයෙදවියහැකි බැවින් නිදන්නේ ද එය නිද්‍රාරාමතාව නොවේ.

එහෙයින් වදාළහ:-

"අභිජානාමි ඛො පනාහං අග්ගිවෙස්සන, ගිම්හානං පච්ඡිමෙ මාසෙ පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො චතුග්ගුණං සංඝාටිං පඤ්ඤපෙත්වා දක්ඛිණෙන පස්සෙන සතො සම්පජානො නිද්දං ඔක්කමිතා" යි.

**දහවැනි සූත්‍ර විවරණය යි.**

**තුන්වන වර්ගය සමාප්ත යි.**

---

## සතර වන වර්ගය

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

තයො මෙ භික්ඛවෙ **අකුසල විතක්කා, කතමෙ තයො? අනවඤ්ඤත්ති පටිසංයුත්තො විතක්කො, ලාභසක්කාරසිලොක පටිසංයුත්තො විතක්කො, පරානුද්දයතා පටිසංයුත්තො විතක්කො,** ඉමෙ ඛො භික්ඛවෙ තයො අකුසල විතක්කා'ති. එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"අනවඤ්ඤත්ති සංයුත්තො ලාභසක්කාරගාරවො
සහනන්දි අමච්චෙහි ආරා සංයොජනක්ඛයා
යො ච පුත්තපසුං හිත්වා විවාහෙ සංහරානි ච
භබ්බො සො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධිමුත්තමං"

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

අර්ථය:–

**3 – 4 – 1**

**අකුසල විතක්කා,** අකුශල විතර්කයෝ; **අනවඤ්ඤත්ති පටිසංයුත්තො විතක්කො,** ප්‍රසිද්ධියට කැමැතිව උපදනා විතර්කය; **ලාභසක්කාර සිලොක පටිසංයුත්තො විතක්කො,** ලාභ සත්කාර කීර්තිය අරමුණුකොටගෙන උපදනා විතර්කය; **පරානුද්දයතාපටිසංයුත්තො විතක්කො,** අනුන් කෙරෙහි ගෙහසිතප්‍රෙමය වශයෙන් උපදනා විතර්කය;

**අනවඤ්ඤත්තිසංයුත්තො,** ස්වසම්භාවනාපෙක්ෂායෙන් යුක්ත පුද්ගලතෙමේ ද; **ලාභසක්කාරගාරවො,** ලාභ සත්කාර ගෞරව ලබනුකැමැත්තේ ද; **අමච්චෙහි සහනන්දී,** ඇමැතියන් හා ගෙහසිතප්‍රේමයෙන් සම්බන්ධවනු කැමැති පුද්ගල තෙමේ ද යන මේ තිදෙන; **සංයොජනක්ඛයා,** (භවබන්ධනයන් සිඳීමෙන් ලබන) අර්හත්වයෙන්; **ආරා,** දුරෙහි වෙත්;

**යො,** යමෙක්; **පුත්තපසුං,** අඹුදරුවන් හා අශ්ව ගො මහිස කෙත්වත් ආදිය; **හිත්වා,** හැර; **විවාහෙ,** විවාහයන් ද; **සඞ්ගහානි ච,** නානාවිධ සංග්‍රහයන් ද (**හිත්වා,** හැර;) **තාදිසො සො භික්ඛු,** එබඳු ඒ භික්ෂු තෙම; **උත්තමං සම්බොධිං;** උතුම්වූ නිවන; **ඵුට්ඨුං,** ස්පර්ශ කරන්නට; **භබ්බො,** සුදුස්සෙක් වේ;

**ධර්මවිස්තර:–**

**අනවඤ්ඤත්තිපටිසංයුත්තො විතක්කො,**

ජාති, ගෝත්‍ර, වර්ණ, සෞන්දර්යය, ධනය, ඉගෙනීම, ශිල්ප, කර්මාන්ත, උගත්කම හා බහුශ්‍රැතභාවය, ධාරණප්‍රඥාව යන ආදි කරුණෙකින් කිසිවෙක් මට අවමන් නොකෙරේවා යි ආත්මසම්භාවනාව කැමැත්තෙන් ගෙහසිතව හෙවත් තෘෂ්ණා සම්බන්ධයෙන් කරන පාපකල්පනා යි.

එහෙයින් කිහ **විභඞ්ගප්පකරණයෙහි**:– ''තත්ථ කතමො **අනවඤ්ඤත්තිපටිසංයුත්තො විතක්කො?** ඉධෙකච්චො ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණ

පොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා මං මං පරෙ අවජානිංසූති යො තත්ථ ගෙහසිතො තක්කො විතක්කො විචාරො සංකප්පො අයං වුච්චති අනවඤ්ඤත්තිපටිසංයුත්තො විතක්කො" යි.

## ලාභසක්කාරසිලොකපටිසංයුත්තො විතක්කො

තමහට ලාභ සත්කාර කීර්ති යන මේ ආත්මාර්ථයක් සලකා තෘෂ්ණානිශ්‍රිතව කරන මිථ්‍යාකල්පනා යි.

එහෙයින් විභංගයෙහි:–

"තත්ථ කතමො **ලාභසක්කාරසිලොකපටිසංයුත්තො විතක්කො?** ලාභසක්කාරසිලොකං ආරබ්භ ගෙහසිතො තක්කො විතක්කො මිච්ඡාසඞ්කප්පො අයං වුච්චති ලාභසක්කාරසිලොකපටිසංයුත්තො විතක්කො" යි.

## පරානුද්දයතාපටිසංයුත්තො විතක්කො

'පරානුද්දයතා' යනු අනුන්ට අනුකම්පා කිරීමයි. එය කරුණායෙන් හා මෛත්‍රියෙන් ද බලාපොරොත්තු රහිතව කළ යුත්තකි. යමෙක් ආත්මාර්ථය සලකා බලාපොරොත්තුවෙන් රාජ රාජමහාමාත්‍ය බ්‍රාහ්මණ ගෘහපති තීර්ථක තීර්ථක ශ්‍රාවකයන් හා හැති ගැටී ඔවුන්ගේ ප්‍රීතියෙහි ප්‍රීතිවෙමින් ශොකයෙහි ශොකවෙමින් සැපයෙහි සැපවත්ව දුකෙහි දුක්ව ඔවුන්ගේ වැඩ කටයුතුවල මෙහෙකරුවන් මෙන් නියැලී කටයුතු කිරීමෙහි උපදනා පවිටුකල්පනාව පරානුද්දයතා පටිසංයුත්ත විතක්ක ය යි.

එහෙයින් කීහ **විභංගයෙහි:** "තත්ථ කතමො **පරානුද්දයතාපටිසංයුත්තො විතක්කො?** ඉධෙකච්චො ගිහිසංසට්ඨො විහරති රාජූහි රාජමහාමත්තෙහි බ්‍රාහ්මණෙහි ගහපතිකෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි සහනන්දී සහසොකී සුඛිතෙසු සුඛිතො දුක්ඛිතෙසු දුක්ඛිතො උප්පන්නෙසු

කිච්චකරණීයෙසු අත්තනා වොයොගං ආපජ්ජති යො තත්‍ථ ගෙහසිතො තක්කො විතක්කො මිච්ඡාසංකප්පො අයං වුච්චති පරානුද්දයතා පටිසංයුත්තො විතක්කො" යි.

**පළමුවන සූත්‍ර විවරණය යි.**

**3 – 4 – 2**

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතා ති මෙ සුතං**

දිට්ඨා මයා භික්ඛවෙ සත්තා **සක්කාරෙන අභිභූතා** පරියාදින්නචිත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා, දිට්ඨා මයා භික්ඛවෙ සත්තා **අසක්කාරෙන අභිභූතා** පරියාදින්නචිත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා, දිට්ඨා මයා භික්ඛවෙ සත්තා **සක්කාරෙන ච අසක්කාරෙන ච තදුභයෙන අභිභූතා** පරියාදින්නචිත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා.

තං ඛො පනාහං භික්ඛවෙ නාඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සුත්වා වදාමි, අපිච භික්ඛවෙ යදෙව මෙ සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං තදෙවාහං වදාමි; දිට්ඨා මයා භික්ඛවෙ සත්තා සක්කාරෙන අභිභූතා පරියාදින්නචිත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. දිට්ඨා මයා භික්ඛවෙ සත්තා අසක්කාරෙන අභිභූතා පරියාදින්නචිත්තා කායස්ස භෙදා පරම්මරණා, අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා, දිට්ඨා මයා භික්ඛවෙ සත්තා සක්කාරෙන ච අසක්කාරෙන ච තදුභයෙන අභිභූතා පරියාදින්නචිත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා'ති—

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති

"යස්ස සක්කරිය මානස්ස අසක්කාරෙනචූභයං
සමාධි න විකම්පති අප්පමාද විහාරිනො
තං ඣායිනං සාතතිකං සුඛුමදිට්ඨි විපස්සකං
උපාදානක්ඛයාරාමං ආහු සප්පුරිසො ඉති'ති

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතං ති

### 3 - 4 - 2

අර්ථය:-

**සක්කාරෙන**, සත්කාරය හේතුකොටගෙන; **අභිභූතා**, මඩනාලද; **පරියාදින්නචිත්තා**, ක්ෂයකොට ගන්නාලද සිත් ඇති;

සෙස්ස සුගම යි.

**සක්කරියමානස්ස**, සත්කාර කරනු ලබන්නාවූ; **යස්ස**, යමකුගේ සත්කාරයෙන් හා; **අසක්කාරෙන**, අසත්කාරයෙන් ද යන; **උභයං**, දෙකාරණයෙන්; **අප්පමාදවිහාරිනො**, අප්‍රමාදව වාසයකරන්නහුගේ; **සමාධි**, සමාධිය; **න විකම්පති**, නො සැලෙයි;

**ඣායිනං**, (රූපාරූප අෂ්ටසමාපත්ති සඞ්ඛ්‍යාත ආලම්බනූපනිජ්ඣානය, විදර්ශනා මාර්ග ඵල සඞ්ඛ්‍යාත ලක්ෂණොපනිධ්‍යානය යන ද්විප්‍රකාරධ්‍යානයෙන්) ධ්‍යානයීවූ; (සමථ විදර්ශනා භාවනායෙහි යුක්ත ප්‍රයුක්තවූය යු සේ යි) **සාතතිකා** (අභිනිෂ්ක්‍රමණයෙහි පටන් අර්හත්මාර්ග ප්‍රතිලාභය දක්වා) සතතයෙන් ප්‍රයුක්තවූ කායික චෛතසික වීර්‍ය්‍යය ඇති; **සුඛුමදිට්ඨිවිපස්සකං**, සියුම් නුවණින් පවත්නා විදසුන් ඇති; **උපාදානක්ඛයාරාමං**, චතුර්විධ උපාදානයන් දුරුකිරීමෙහි ඇලුණාවූ; (රහත්ඵලයෙහි ඇලුණාවූය යු සේ යි) **තං**, ඔහු; **සප්පුරිසො ඉති**, සත්පුරුෂයකැ යි; **ආහු**, කිහු;

**සෙස්ස** සුගම යි.

**දෙවන සූත්‍ර විවරණය යි.**

### 3 - 4 - 3

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

තයොමෙ භික්ඛවේ දෙවෙසු දෙවසද්දා නිච්ඡරන්ති සමයාසමයං උපාදාය, කතමෙ තයො? යස්මිං භික්ඛවෙ සමයෙ අරියසාවකො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය චෙතෙති; තස්මිං සමයෙ දෙවෙසු දෙවසද්දො නිච්ඡරති;

එසො අරියසාවකො මාරෙන සද්ධිං සඞ්ගාමාය චෙතෙතී'ති අයං බො භික්ඛවෙ **පඨමො** දෙවෙසු **දෙවසද්දො** නිච්ඡරති සමයාසමයං උපාදාය.

පුනචපරං භික්ඛවෙ යස්මිං සමයෙ අරියසාවකො සත්තන්නං බොධිපක්ඛියානං ධම්මානං භාවනානුයොග මනුයුත්තො විහරති, තස්මිං භික්ඛවෙ සමයෙ දෙවෙසු දෙවසද්දො නිච්ඡරති; එසො අරියසාවකො මාරෙන සද්ධිං සඞ්ගාමෙතීති. අයං බො භික්ඛවෙ **දුතියො** දෙවෙසු **දෙවසද්දො** නිච්ඡරති සමයාසමයං උපාදාය.

පුනචපරං භික්ඛවෙ යස්මිං සමයෙ අරියසාවකො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති තස්මිං භික්ඛවෙ සමයෙ දෙවෙසු දෙවසද්දො නිච්ඡරති එසො අරියසාවකො විජිතසඞ්ගාමො තමෙව සඞ්ගාමසීසං අභිවිජිය අජ්ඣාවසතී'ති අයං බො භික්ඛවෙ **තතියො** දෙවෙසු **දෙවසද්දො** නිච්ඡරති සමයාසමයං උපාදාය, ඉමෙ බො භික්ඛවෙ තයො දෙවෙසු දෙවසද්දා නිච්ඡරන්ති සමයාසමයං උපාදායා'ති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

‘‘දිස්වා විජිතසඞ්ගාමං සම්මාසම්බුද්ධසාවකං
දෙවතාපි නමස්සන්ති මහන්තං වීතසාරදං
නමො තෙ පුරිසාජඤ්ඤ යො ත්වං දුජ්ජය මජ්ඣගු
ජෙත්වාන මච්චුනො සෙනං විමොක්ඛෙන අනාවරං
ඉතිහෙතං නමස්සන්ති දෙවතා පත්තමානසා
තඤ්හි තස්ස න පස්සන්ති යෙන මච්චුවසං වජෙ’ති

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතං.

**3 - 4 - 3**

**අර්ථය:—**

**දෙවෙසු**, දෙවියන් අතරෙහි; (අරූපාවචර දෙවියන් හා අසඤ්ඤසත්ත දෙවියන් හැර සෙසු දෙවියන් අතරෙහි ය යුසේ යි) **දෙවසද්දා**, ප්‍රීති ප්‍රකාශක ශබ්දයෝ; **නිච්ඡරන්ති**

නික්මෙත්; **සමයාසමයං උපාදය**, කාලයෙන් කාලය සලකා (යම් කලෙක දෙවියෝ තමන්ට අභිමතවූ කාලය සලකා ලොව බලත් ද ඒ කාලයෙහි අරමුණු වන්නාවූ පුද්ගලයා සලකාගෙන ය යුසේ යි) **යස්මිං සමයෙ**, යම් කලෙක්හි; (කාමයන්ගේ ආදීනවය හා ගෘහවාසයෙහි සම්බාධයත් පැවිද්දෙහි අනුසස්සත් සලකා යමකුගේ සිත පැවිද්දකෙරෙහි නැමේ ද එකල්හි ය යනුයි) **මාරනා**, කෙලශමාරයා හා; **සඞ්ගාමාය**, යුද කිරීමට; **වෙදනති**, සිතයි; **චෙතොවිමුත්තිං**, අර්හත්ඵල සමාධිය; **පඤ්ඤාවිමුත්තිං**, අර්හත්ඵල ප්‍රඥව; **විජිතසඞ්ගාමො**, ජයගත් කෙලශ සංග්‍රාමය ඇති; **තං එව සඞ්ගාමසීසං**, ඒ දිනූ සංග්‍රාම සංඛ්‍යාත ආර්‍ය්‍යමාර්ගයාගේ ශීර්ෂය වූ අර්හත්ඵලය; **අභිවිජිය**, ජයගෙන; **අජ්ඣාවසති**, ඵලසමාපත්ති සැපයට පැමිණ වෙසෙයි;

**මහන්තං**, (සීලාදි ගුණයෙන්) මහත්වූ; **වීතසාරදං**, විශාරදවූ; **විජිතසංගාමං**, ජයගත් කෙලශසංග්‍රාම ඇති; **සම්මාසම්බුද්ධසාවකං**, බුද්ධ ශ්‍රාවකයා; **දිස්වා**, දැක; **දෙවතා අපි**, දෙවියෝ පවා; **නමස්සන්ති**, වඳිත්;

**යො ත්වං**, යම් බඳුවූ නුඹවහන්සේ; **දුජ්ජයං**, පැරදවිය නො හැකිවූ; **අනාවරං**, අනිකකු විසින් නොවැළැක්විය හැකි හෙයින් අනාවරවූ; (තුන්ලොව පතළ යෙළදහසක් කෙලෙ සුන්ගෙන් මහත්වූ බැවින්) **මච්චුනො සෙනං**, කෙලෙස් මර සෙනඟ; **විමොක්ඛෙන**, ආර්‍ය්‍යමාර්ගයෙන්; **පරාජෙසි**, පරදවා; **අජ්ජෙසි**, දිනූසේක් ද; **පුරිසාජඤ්ඤ**, (එබඳුවූ) පුරුෂ ශ්‍රෙෂ්ඨය; **තෙ**, ඔබට; **නමො**, නමස්කාරය වේවා;

**ඉති**, මේ උක්තප්‍රකාරයෙන්; (හි යනු නිපාත මාත්‍රයි) **පත්තමානසං**, අවබොධ කරනලද අර්හත්වය ඇති; **එතං**, මුන්වහන්සේට; **දෙවතා**, දෙවියෝ; **නමස්සන්ති**, වඳිත්; නොහොත් **ඉති**, මේ කරුණෙන් (කෙලෙස් මරසෙනඟ පැරදවීමෙන් ලබනලද අර්හත්වය ඇති හෙයින්) **එතං**, තෙල ඔබට; **දෙවතා නමස්සන්ති**, දෙවියෝ වඳිත්; **යෙන**, යම්

හෙයකින් (හෙතෙම) **මච්චුධෙය්‍යං** මාරයාගේ වසඟයට; **වජෙ**, පැමිණෙන්නේ ය (යන ඒ කාරණය) **න පස්සන්ති,** නොදකිත් ද; **හි,** එහෙයින්; **තස්ස,** ඔහට; දෙවියෝ වඳිත් යනු යි.

“තං හි තස්ස නමස්සන්ති යෙන මච්චුවසං වජෙ” යනු ද පාඨ යි.

යම්හෙයකින් ඒ ක්ෂීණාශ්‍රවයාව සොයන දෙවියෝ යම් කෙලෙශයක් කරණකොටගෙන ඔහු මාරයාගේ වසනයට පැමිණෙත් ද එසේවීමට හේතුවක් නොදක්නා හෙයින් ඒ රහතන්වහන්සේට වඳිත් යනු භාවයි.

**සෙස්ස** සුගම යි.

**තුන්වනසූත්‍ර විවරණය යි.**

## 3-4-4

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං.**

යදා භික්ඛවෙ දෙවො දෙවකායා චවනධම්මො හොති පඤ්චස්ස පුබ්බනිමිත්තානි පාතුභවන්ති. මාලා මිලායන්ති, වත්ථානි කිලිස්සන්ති, කච්ඡෙහි සෙදා මුච්චන්ති, කායෙ දුබ්බණ්ණියං ඔක්කමති, සකෙ දෙවො දෙවාසනෙ නාභිර-මතීති. තමෙනං භික්ඛවෙ දෙවා චවනධම්මො අයං දෙවපුත්තොති ඉති විදිත්වා තීහි වාචාහි අනුමොදන්ති; **ඉතො භො සුගතිං ගච්ඡ, සුගතිං ගන්ත්වා සුලද්ධලාභං ලභ සුලද්ධ ලාභං ලභිත්වා සුප්පතිට්ඨිතො භවාහීති.**

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච, කිංනුඛො භනෙත දෙවානං සුගතිගමනසඞ්ඛාතං, කිංනු භනෙත දෙවානං සුලද්ධ ලාභසඞ්ඛාතං, කිම්පන භනෙත දෙවානං සුප්පතිට්ඨිතසඞ්ඛාතනන්ති?

මනුස්සත්තං ඛො භික්ඛු දෙවානං සුගතිගමනසඞ්ඛාතං; යං මනුස්සභූතො සමානො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ සද්ධං පටිලභති. ඉදං ඛො පන භික්ඛවෙ දෙවානං සුලද්ධ

ලාභ සඞ්ඛාතං, සා ඛො පනස්ස සද්ධා නිවිට්ඨා හොති මූල ජාතා පතිට්ඨිතා දළ්හා අසංහාරියා සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං, ඉදං ඛො භික්ඛවෙ දෙවානං සුප්පතිට්ඨිත සඞ්ඛාතනන්ති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"යදා දෙවො දෙවකායා චවති ආයුසඞ්ඛයා
තයො සද්දා නිච්ඡරන්ති දෙවානං අනුමොදතං
ඉතො භො සුගතිං ගච්ඡ මනුස්සානං සහබ්‍යතං
මනුස්සභූතො සද්ධම්මෙ ලභ සද්ධං අනුත්තරං
සා තෙ සද්ධා නිවිට්ඨස්ස මූලජාතා පතිට්ඨිතා
යාවජීවං අසංහීරා සද්ධම්මෙ සුප්පවෙදිතෙ
කායදුච්චරිතං හිත්වා වචීදුච්චරිතානි ච
මනොදුච්චරිතං හිත්වා යඤ්චඤ්ඤං දොසසඤ්හිතං
කායෙන කුසලං කත්වා වාචාය කුසලං බහුං
මනසා කුසලං කත්වා අප්පමාණං නිරූපධිං
තතො ඔපධිකං පුඤ්ඤං කත්වා දානෙන තං බහුං
අඤ්ඤෙපි මච්චෙ සද්ධම්මෙ බ්‍රහ්මචරියෙ නිවෙසයෙ
ඉමාය අනුකම්පාය දෙවා දෙවං යදා විදූ
චවන්තං අනුමොදන්ති එහි දෙව පුනප්පුනන්ති.

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති."

### 3-4-4

අර්ථය:-

දෙවො, උත්පත්තියෙන් ම දෙවියෙක්; (සිව් මහරජ-යෙහි පටන් උපරිම දෙව්ලොව දෙවියෙක් ය යූ සේ යි) **දෙවකායා**, දිව්‍යසමූහයා කෙරෙන්; (දෙව්ලොවින් යූ සේ යි) **චවනධම්මො හොති**, චුතවන සවභාවය ඇත්තේ වේ ද; (ආයුෂය ගෙවීමෙන් හෝ හීනවීමෙන් හෝ එළඹි සිව් මරණය ඇත්තේ ය යූ සේ යි) **අස්ස**, ඔහට; **පඤ්ච පුබ්බ නිමිත්තානි**, පෙර නිමිති පසක්; **පාතුභවන්ති**, පහළ වෙත්; **මාලා මිලායන්ති**, පළඳනාලද මල් පරවෙත්; **වත්ථානි**

**කිලිස්සන්ති,** දිවසළු කිලිටි වෙත්; **කච්ඡෙහි සෙදා මුච්චන්ති,** කිසිලි වලින් දහඩිය දහර වැගිරෙත් (මුළු ශරීරයෙන් ම වැගිරෙතැයි කියති. **කායෙ දුබ්බණ්ණියං ඔක්කමති,** ශරීරයෙහි දුර්වර්ණත්වය පහළ වෙයි. (එක් යොදුන දෙයොදුන පටන් දෙලොස් යොදුන දක්වා ශරීරාලෝකය පැතිරවිය හැකි, කැඩුම් බිඳුම් හා රැලිනැගීම් කෙස්පැසීම් නැති, දිව්‍යශරීරය දුර්වර්ණ වෙයි. මෙහි දෙවඟනක් සොළොස් හැවිරිදි වයස් ඇත්තියක්ව ද, දිව්‍යපුත්‍රයෙක් විසිහැවිරිදි වයස් ඇත්තෙක්ව ද, පහළවීම දෙවියන්ගේ උත්පත්තිය වෙයි. මවුකුස මෙන් පිළිසිඳ ගැන්මෙක් ඔවුන්ගේ නැත. මෙයට ඖපපාතික උත්පත්තිය යි කියනු ලැබේ.) **දෙවො,** දෙවිතෙම; **සකා දෙවාසනා,** සවකීය දිව්‍යආසනයෙහි; **නාභිරමති,** සිත් නො අලව යි; **චවනධම්මො ඉති,** චුත වන සවභාව ඇත්තේ ය යි; **තීහි වාචාහි,** වචන තුනකින්; **අනුමොදන්ති,** සතුටු කරවත් (අවවාද කෙරෙත් ය යි ද ආචාර්‍ය්‍ය මතයෙකි.)

භො පින්වත; **ඉතො,** මේ දෙව්ලොවින් චුතව; **සුගතිං,** සුගතියට; (මිනිස්ලොව සඳහා මෙහි සුගති යයි කියේ යි) **සුලද්ධලාභං,** ඉතා හොඳින් ලබනලද ලාභයක්; **ලභ,** ලබව; **සුප්පතිට්ඨිතො භවාහි,** ඒ ලාභයෙහි හොඳින් පිහිටියෙක් වෙව; **අඤ්ඤතරො භික්ඛු,** එක්තරා භික්‍ෂුවක්; (නාමගොත්‍ර වශයෙන් අප්‍රසිද්ධ වූ අනුසන්ධිකුශල වූ එක්තරා භික්‍ෂු නමක් දූ සේ යි) **කින්නුඛො,** කුමක් හෙයින්; **සුගතිගමන සඞ්ඛාතං,** සුගති ගමනය යි සලකන ලද්දේ ද; **සුලද්ධලාභ සඞ්ඛාතං,** සුලබ්ධාලාභය යි සලකන ලද්දේ; **කිංච,** කුමක් ද; **සුප්පතිට්ඨිත සංඛාතං,** මනාකොට පිහිටා සිටීම යයි කියන ලද්දේ; **මනුස්සත්තං,** මිනිසත්බව; **සුගතිගමනසංඛාතං,** සුගතිගමන යයි කියනලදි. **මනුස්සභූතො සමානො,** මනුෂ්‍යයෙක් වූයේ; **යං සද්ධං,** යම් ශ්‍රද්ධාවක්; **නිවිට්ඨා හොති,** සිතෙහි පිහිටියාවේ ද; **මූලජාතා,** මුල් බැසගත්තී ද; **පතිට්ඨිතා,** පිහිටියා ද; **දළ්හා’** ස්ථිර ද; **අසංහාරියා,** කිසිවකු හටත් විනාශකළ නොහැකි ද;

**යදා**, යම් කාලෙක්හි; **දෙවො**, දෙව් තෙම; **ආයුසඞ්ඛයා**, ආයුෂ ගෙවීමෙන්; **දෙවකායා**, දෙව්ලොවින්; **චවති**, චුත වේ ද; **අනුමොදතං**, අස්වසන්නා වූ නොහොත් සතුටු කරන්නාවූ; **දෙවානං**, දෙවියන්ගේ; **තයො සද්දා** ශබ්ද තුනක්; **නිච්ඡරන්ති**, නික්මෙත්;

**භො**, පින්වත; **ඉතො**, මෙයින් චුතව; **මනුස්සානං සහබ්‍යතං**, මනුෂ්‍යයන් හා සහභාවය ඇති; **සුගතිං**, සුගතියට; **ගච්ඡ**, යව; **මනුස්සභූතො සමානො**, මනුෂ්‍යවූයේ; **සද්ධම්මෙ**, සද්ධර්මයෙහි; **අනුත්තරං සද්ධං**, උතුම් වූ ශ්‍රද්ධාව: **ලභ**, ලබව;

**තෙ**, තාගේ; **සා සද්ධා**, ඒ ශ්‍රද්ධා තොමෝ; **නිවිට්ඨා අස්ස**, සිත්හි පිහිටා සිටිනී ද; **මූලජාතා**, හටගත් මුල් ඇත්තී ද; **පතිට්ඨිතා**, සපිරව පිහිටියා ද; **සුප්පවෙදිතෙ**, මනාකොට දේශනාකරනලද; **සද්ධම්මෙ**, සද්ධර්මයෙහි; **යාවජීවං**, ජීවිතාන්තය දක්වා; **අසංහීරා**, විනාශ නොව පවත්නී ද;

(එහෙයින්) **කායදුච්චරිතං හිත්වා**, කයින් දුසිරිත් හැර; **වචීදුච්චරිතානි ච**, වාග්දුශ්චරිතයන් ද (හැර) **මනොදුච්චරිතං හිත්වා**, මනොදුශ්චරිතයන්ද හැර; **දොසසංහිතං**, රාගාදි කෙලශදෙෂයන්ගෙන් යුක්තවූ; **යං ච අඤ්ඤං**, යම් අනෙක් අකුශලයක් වේ නම් (එය ද අත්හැර)

**කායෙන කුසලං කත්වා**, කයින් කුසල් කොට; **වාචාය**, වචනයෙන්; **බහුං කුසලං කත්වා**, බොහෝ කුසල් කොට; **මනසා**, සිතින්; **අප්පමාණං**, අපමණවූ; **නිරූපධිං**, නිර්මල වූ; **කුසලං කත්වා**, කුසල් කොට;

**තතො**, ඉක්බිති; **දානෙන**, දානයෙන්; **ඔපධිකං**, සියලු භවසම්පත් ගෙනදෙන්නා වූ; **බහුං තං පුඤ්ඤං කත්වා**, බොහෝවූ ඒ පින් කොට; **අඤ්ඤෙ මච්චෙ**, සෙසු මිනිසුන්, **සද්ධම්මෙ**, (දශකුශලකර්මපථ සංඛ්‍යාත) සත්පුරුෂ ධර්මයෙහි ද; **බ්‍රහ්මචරියෙ අපි**, ධර්මදානයෙහි ද; (මෙහි 'අපි' ශබ්දය සමුච්චයාර්ථ හෙයින් සෙසු කුශලයන් ද, ගැනේ)

**නිවෙසයෙ**, පිහිටුවමන්නේය; **යදා**, යම් **කලෙක්හි**; **දෙවා**, දෙවියෝ; **චවනනං**, චුතවන්නාවූ; **දෙවං**, දෙවියකු; **විදූ**, දනිත් ද; **දෙව, එම්බල** දෙවතාව! **පුනප්පුනං**, නැවත නැවතත්; **එහි ඉති**, අපගේ දෙව්ලොවට ම එව යි; **ඉමාය අනුකම්පාය**, මේ යථොක්ත අනුකම්පා සහගත වචනයෙන්; **අනුමොදනති**, සතුටු කෙරෙත්;

**භාවය**:- සුගම යි.

**ධර්මවිස්තර**:-

**සංඝා දෙවාසනෙ නාභිරමති**-

දෙව්ලොවින් චුතවන දෙවියකුට මිනිස්ගණනින් සත් දවසෙකින් මරණය සිදුවන්නේ ය යන බව හැඟවීම සඳහා මේ පෙරනිමිනිපස පහළවෙයි. මිනිස්ගණනින් සතිය දෙවියන්ට ක්ෂණයකි. එහෙයින් හෙතෙම බලවත් ශොක-යෙන් මැඩුණේ වෙයි. සිරුරෙහි දාහයෙක් හටගනියි. එහෙයින් මුළුශරීරයෙන් දහඩිය ගලයි. ඉතා බොහෝ කලක් දුකක් නුපුරුදු වූ මේ දේවතාවා ඒ ඉවසාගත නොහැකිව දමි දමි යි විලාප කියමින් කිසිතැනෙකත් සැනසිලි රහිතව ඒ ඒ තැන ඇවිදියි. ඇතැම් දේවතාවෙක් සිහිය උපදවාගෙන කයින් හෝ වචනයෙන් හෝ කිසිදු විකාරයක් නොකොට ප්‍රියවිප්‍රයෝග දුක පමණක් නොඉවසමින් හැසිරෙයි.

මේ පෙරනිමිති රාජ රාජමහාමාත්‍යාදී මහ පිනැතියන්ට පවා වල්ගාතරුපැයීම් භූමිකම්පා චන්ද්‍රග්‍රහණ සූර්‍ය්‍යග්‍රහණ ආදී ලකුණු වශයෙන් පෙනේ. මහෙශාක්‍ය දෙවියන්ට ද එසේම පෙනේ. මෙසේ පහළවන පෙරනිමිති ඇතැම් කෙනෙක් දකිති. හැමදෙනාම නොදකිත්. සුළු පිනෙකින් උපන් දෙවියෙක් දැන් මම චුතවන්නෙමි. කොතන්හි උපදී දෝ යි බියවෙයි. යම් දෙවියෙක් බොහෝ පින් කොට උපන්නේ වී නම් මවිසින් බොහෝ කොට දන් දෙන ලද්දේ ය, සිල් රක්නා ලද්දේ ය. නොයෙකුත් පින් කරන ලද යි සිතමින් මෙයින් චුතවන මට සුගතියක් ම ලැබෙය යි බියනොවෙ යි.

මෙසේ මරණය සඳහා පෙරනිමිති පහළවූ දෙවියන් සෙසු දෙවියෝ නන්දනවනයට කැඳවාගෙන යත්. සෑම දිව්‍යලෝකයක ම නන්දනවනයක් ඇත්තේ ය.

**තීහි වාචාහි අනුමොදන්ති—**

"ඉතො භො සුගතිං ගච්ඡ" යන ආදීන් කරුණු තුනකින් අනුමෝදන් කෙරෙති යි තථාගතයන් වහන්සේ වදාරා නැවතුණු කල්හි දන් මෙයින් මේ ධර්මදේශනාව නවතින්නේ යයි සැලකූ අනුසන්ධිකුශල වූ එක්තරා භික්ෂු නමක් ඒ කරුණු තුන කුමක්ද යි විස්තර කරවනු පිණිස නැවතත් ප්‍රශ්න කෙළේ ය.

**තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ—**

ධර්මවිනය නම් තථාගතයන් වහන්සේ විසින් වදළ ශික්ෂාත්‍රයට ඇතුළත් ශාසනය යි. එය ධර්මයෙන් වෙන් නොවූවකි. වෛනෙය පුද්ගලයන් හික්මවන හෙයින් විනයෙන් ද වෙන් නොවේ නු යි **ධම්මවිනය** නමි. උපනිශ්‍රය සම්පත්තියෙන් නොහොත් නිවනට උපකාර වන කරුණු දක්වීමෙන් අපායදුකෙන් රක්නා නිසා ද ධර්ම නම් ද, කෙලෙස් අඩු සත්‍වයන් හික්මවන හෙයින් විනය නම් ද වේනු යි **ධම්මවිනය** නමි. ධර්මයෙන් හික්මවීම මුත් කඩු කිරිච්චි දඬු මුගුරු ආදියෙන් නොවේනු යි **ධම්මවිනය** නමි. මග පල නිවන් පිණිස ධර්මයෙන් හික්මවානු යි ද **ධම්මවිනය** නමි. මහාකරුණාඥනය හා සර්වඥතාඥනාදි ධර්මයෙන් ද පවත්නා විනය හෙයින් ද **ධම්මවිනය** නමි. ධාර්මිකවූ ධර්මරාජන් වූ ධර්මකේතුවූ ධර්මාධිපතිවූ ධර්මකායවූ ධර්මස්වාමීවූ තථාගතයන් වහන්සේගේ විනය නු යි ද **ධම්මවිනය** නම් වේ. මග ඵල නිවන් ලැබීමට හේතුනු යි ද **ධම්මවිනය** නම් වේ ය යි දතයුතු.

**සුලද්ධලාභසංඛාතං—**

ශ්‍රද්ධාව මිනිසකු විසින් ලැබියයුතු ඉතාම හොඳ ලාභයකි. රන් රිදී මුතු මැණික් වතු පිටි කුඹුරු මිල

මුදල් ආදී වස්තු ලැබීමෙන් උපභොග පරිභොග සැප සැලසෙන්නාක් මෙන් ලෞකික ලොකොත්තර ශ්‍රද්ධාව ද ලෞකික ලොකොත්තර සැප සලසයි. එහෙයින්ම ශ්‍රද්ධාව සුලබ්ධලාභයෙකි. සැදැහැඇත්තේම දානාදි පින්කම් කොට දෙව්මිනිස් දෙගතියෙහි සැප ලබයි. එහෙයින් සද්ධා බන්ධති පාථෙය්‍යං" යන තන්හි ශ්‍රද්ධාව මාර්ගෝප කරණයක් ලෙස ද, "සද්ධා දුතියා පුරිසස්ස හොති" යන තන්හි ශ්‍රද්ධාව තමහට දෙවැන්නකු නොහොත් භාර්‍යාවක් ලෙස ද, "සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං" යන තන්හි ශ්‍රද්ධාව වස්තුවක් ලෙස ද, "සද්ධාහත්ථො මහානාගො" යන තන්හි ශ්‍රද්ධාව අතක් ලෙස ද, "සද්ධා බීජං තපො වුට්ඨි" යන තන්හි ශ්‍රද්ධාව බිජුවටක් ලෙස ද, සද්ධෙසිකො නිකාවෙ අරියසාවකො, සද්ධාය තරතී ඔඝං" යන ආදී නොයෙක් තන්හි ශ්‍රද්ධාව සංසාරෞඝය තරණය කරනු පිණිස නෞකාවක් වැනි ය යි ද, මෙසේ නොයෙක් උපමාවලින් නොයෙක් කරුණු වලින් වර්ණිත ය.

"නිවිට්ඨා, මූලජාතා, පතිට්ඨිතා, දළ්හා, අසංහාරියා" යන වචනවලින් සෝවාන් ආර්‍ය්‍යපුද්ගලයාගේ ලොකොත්තර ශ්‍රද්ධාව ප්‍රකාශවෙයි. සත්පුරුෂසේවනය, ධර්මශ්‍රවණය, යොනිසොමනසිකාරය, ධර්මානුධර්මප්‍රතිපත්තිය යන මේ කරුණු සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගබව ප්‍රකාශ කරන ලදහ.

**මනුස්සභූතො සමානො—**

මෙයින් මිනිසුන් අතරෙහි මනුෂ්‍යධර්මයෙහි පිහිටි පරමාර්ථමනුෂ්‍යයා දක්වයි; යමෙක් මිනිසෙක්ව ඉපිද දුසිරිත් හා අපරාධ කොට මෙලොවත් පරලොවත් දුක් විඳී ද, හෙතෙම **මනුෂ්‍යනෛරයික** නම් වේ. කැද බත් ආදියක් නොලබනතරම් සාපිපාසා දෙකින් මැඩුණු සිරුරු ඇත්තෙක්ව කිසිවකුගේත් පිහිටක් නො ලැබ හැසිරේ ද හෙතෙම **මනුෂ්‍යප්‍රේත** නම් වේ. යමෙක් අනුන්ගේ බර උසුලමින් නොයෙක් දුසිරිත් කොට මරණභයින් පීඩිතව හොඳනරක දෙක තේරුම් නොගනිමින් ලජ්ජාභය දෙකම

නැතිව වෙසේ ද, මෙතෙම **මනුෂ්‍යතිරශ්චීන** නම් වේ. යමෙක් හොඳනරක තේරුම් ගෙන හොඳනොහොඳ දෙක්හි ඉෂ්ටවූත් අනිෂ්ටවූත් විපාක සලකමින් ලජ්ජාභය දෙක ඇතිව දශ අකුසල් දුරුකොට දශ කුශලයෙහි හැසිරෙමින් පින්කිරියවත් පුරා ද මේ මනුෂ්‍යධර්මයෙහි පිහිටි **පරමාර්ථ මනුෂ්‍ය**තෙමේ යි. දෙවියන් මිනිසත්බව සුගතියන් ලෙස සලකනලද්දේ මේ නිසා ය.

**අප්පමාණං නිරූපධිං**—

මෙසේ දුසිරිත් හැර සුසිරිත් පිරූ තැනැත්තේ ආර්ය මාර්ගයෙන් උපදවාගත් ලොකොත්තර ශ්‍රද්ධාව ඇත්තෙක් වෙයි. එහෙයින් මේ ආර්ය පුද්ගලයාහට පළමුවන දෙවන මාර්ග දෙක උපදවාගතහැකි වෙයි. එයින් සතර අපායෙන් වැළකී දිව්‍යලොකොත්පත්තිය ලැබියහැකි වෙයි. එහෙයින් "අප්පමාණං නිරූපධිං" යනු කීයේ ය.

**ඔපධිකං පුඤ්ඤං**—

යම් පිනෙකින් දෙව්මිනිස් දෙගතියෙහි උපදවා ශරීර සම්පත්තිය හා භොගසම්පත්තිය ලබාදියහැකි වේ නම් එය **ඔපධිකකුශලය** යි. එය නම් – අභයදාන, ජීවිතදාන, ආමිසදානාදි පින් ය. මෙය සීලයට ද හේතු වේ. දන් නොදෙන කෙනකුට සිල් නොරැකිය හැකි ය. මේ පින් එක්වරක් දෙවරක් නොව නැවත නැවතත් බොහෝ වාරවල කළ යුතු ය. යන්තමින් විතරක් නොව නැහැමින් හුහක්ම කළයුතු ය. එය දේවකායපරිපූරකත්වයට හේතු වේ යි.

එයට තවත් උපායක් වශයෙන් "අඤ්ඤෙනාපි මච්චෙ සද්ධම්මෙ බ්‍රහ්මචරියෙ නිවෙසයෙ" යනුවෙන් ධර්මදානයෙහි ශ්‍රේෂ්ඨත්වය හා අනුන් යහපත් ගුණධර්මයන්හි යෙදවීමෙහි අනුසස් ද දක්වූහ. පින් කිරීමෙන් ලබන උපධිසම්පත්තිය පාපකර්මවිපාක පවා ප්‍රතිබාහනය කිරීමෙහි සමත්බව "අපෙකච්චානි පාපකානි කම්මසමාදානානි උපධිසම්පත්ති පටිබාළ්හානි න විපච්චන්ති" යනුවෙන් කර්මවිභාගයෙහිදී වදාළහ.

මෙහි **බ්‍රහ්මචරිය** යන පදය ධර්මයෙහි අවස්ථා රාශියක නොයෙක් අර්ථයන් ප්‍රකාශ කෙරෙයි. දානය, වෛයාවච්චය, ශික්ෂාපදය, බ්‍රහ්මවිහාරය, ධර්මදේශනාය, මෛථුන විරතිය, ස්වදාරසන්තොෂය, උපොසථය, ආර්‍ය්‍යමාර්ගය, ශාස්තෘ ශාසනය, අධ්‍යාශය, වීර්‍ය්‍යය යන මේ අවස්ථා යි.

"නමෙමං වතං තං පන බ්‍රහ්මචරියං
තස්ස සුචිණ්ණස්ස අයං විපාකො"

යන මේ **පුණ්ණක** ජාතකයෙහි එන **බ්‍රහ්මචරිය** ශබ්දය **දානය** සඳහා යෙදුණේ ය.

"තෙන පාණි කාමදදො තෙන පාණි මධුස්සවො
තෙන මෙ **බ්‍රහ්මචරියෙන** පුඤ්ඤං පාණිමහි ඉජ්ඣති"

යන මේ **අංකුර** ප්‍රේතවස්තුවෙහි **වතාවත් කිරීමෙහි** යෙදුණේ ය. "ඉදං ඛො තං භික්ඛවෙ තිත්තිරියං නාම **බ්‍රහ්මචරියං** අහොසි" යන මේ **තිත්තිර** ජාතකයෙහි **පඤ්චශික්ෂාපදයන්** සඳහා කියනලදී. "තං ඛො පන පඤ්චසිඛ **බ්‍රහ්මචරියං** නෙව නිබ්බිදාය න විරාගාය, යාවදෙව බ්‍රහ්මලොකූපපත්තියා"යි **මහාගොවින්ද** සූත්‍රයෙහි **බ්‍රහ්මවිහාරයන්** සඳහා කියනලදි, "එකස්මිං **බ්‍රහ්මචරියස්මිං** සහස්සං මච්චුහායිනො" යන මෙහි **ධර්මදේශනාව** සඳහා කියේ ය. "පරෙ අබ්‍රහ්මචාරී භවිස්සන්ති මයමෙත්ථ බ්‍රහ්මචාරිනො භවිස්සාම" යන **සල්ලෙඛ** සූත්‍රයෙහි **මෛථුන විරතිය** සඳහා කියනලදි.

"මයඤ්ච භරියා නාතික්කමාම – අම්හෙ ච භරියා
නාතික්කමන්ති
අඤ්ඤත්‍ර තාහි **බ්‍රහ්මචරියං** චරාම - තස්මා හි
අම්හං **දහරා** න මීයරෙ"

යන **මහාධම්මපාල** ජාතකයෙහි **ස්වදාරසන්තොෂය** සඳහා කියනලදි.

"හීනෙන **බ්‍රහ්මචරියෙන** ඛත්තියෙ උපපජ්ජති
මජ්ඣිමෙන ච දෙවත්තං උත්තමෙන විසුජ්ඣති"

යන **නිමි** ජාතකයෙහි **අෂ්ටාංගික උපොසථය** සඳහා කියනලදි. "ඉදං ඛො පන පඤ්චසිඛ **බ්‍රහ්මචරියං** එකන්ත නිබ්බිදාය විරාගාය =පෙ= අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො" යන **මහාගොවින්ද** සූත්‍රයෙහි **ආර්‍ය්‍යමාර්‍ගය** සඳහා කියනලදි. "තයිදං **බ්‍රහ්මචරියං** ඉද්ධංචෙව ඵීතං ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාවදෙව මනුස්සෙහි සුප්පකාසිතං" යන **පාසාදික** සූත්‍රයෙහි ශික්‍ෂාත්‍රය සංග්‍රහිත **සකල ශාසනය** සඳහා කියනලදි.

"අපි අතරමානානං - ඵලාසාව සමිජ්ඣති
විපක්ක බ්‍රහ්මචරියොසමි - එවං ජානාහි ගාමිණි"

යන මෙහි **අධ්‍යාශය** සඳහා කියනලදි. "අභිජානාමි ඛො පනාහං සාරිපුත්ත චතුරඞ්ගසමන්නාගතං **බ්‍රහ්මචරියං** චරිතා" යන **මහාසීහනාද** සූත්‍රයෙහි වීර්‍ය්‍යය සඳහා කියනලදි. මේ ඉතිවුත්තක දෙවාවචන සූත්‍රයෙහි ධර්‍මදේශනය සඳහා කියනලද්ද යි සැලකියයුතු.

**ධර්‍මදේශනය** නම්- මේ කුසල් ය. මේ අකුසල් ය. මේ වරද ය, මේ නිවරද ය යනාදි වශයෙන් කුශලාකුශල කර්‍මයන් හා එයින් ලබන විපාක ද පෙන්වා අකුසල්වලින් වළක්වා කුසලයෙහි පිහිටුවනු සඳහා කරුණායෙන් කරනුලබන අවවාද අනුශාසනා යි.

චතුස්සත්‍යය ගෙන හැර දක්වා අමෘතාධිගමය පිණිස ප්‍රතිපත්තිය පෙන්වා කරන අනුශාසනය සියලු අනර්‍ථයන් වළක්වා සසරදුක ඉක්මවන හෙයින් **ශිඛාප්‍රාප්ත ධර්‍මදේශනා** යයි කියනු ලැබේ. **අනුශාසනය** ද ධර්‍මදේශනයටම ඇතුළත් වේ.

**සතර වන සූත්‍ර විවරණය යි**

## 3 – 4 – 5

### වුත්තං හෙතං භගවතා වුත්තං මරහතාති මෙ සුතං

තයො මෙ භික්ඛවෙ පුග්ගලා ලොකෙ උප්පජ්ජමානා උප්පජ්ජන්ති බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං,

කතමෙ තයො? ඉධ භික්ඛවෙ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා, සො ධම්මං දෙසෙති; ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති, අයං භික්ඛවෙ **පඨමො පුග්ගලො** ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

පුනචපරං භික්ඛවෙ තස්සෙව සත්ථුසාවකො අරහං හොති; ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො; සො ධම්මං දෙසෙති; ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සබ්‍යජනං කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති, අයං භික්ඛවෙ **දුතියො පුග්ගලො** ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං.

පුනචපරං භික්ඛවෙ තස්සෙව සත්ථුසාවකො සෙඛො හොති පාටිපදො, බහුස්සුතො සීලවතූපපන්නො; සොපි ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සබ්‍යංජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. අයං භික්ඛවෙ **තතියො පුග්ගලො** ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සාන'න්ති-

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

‘‘සත්ථා හි ලොකෙ පඨමො මහෙසී
තස්සන්වයො සාවකො භාවිතත්තො
අථාපරො පාටිපදොපි සෙඛො
බහුස්සුතො සීලවතූපපන්නො

එතෙ තයො දෙවමනුස්සසෙට්ඨා පභඞ්කරා ධම්මමුදීරයන්තා අපාපුරන්ති අමතස්ස ද්වාරං යොගා පමුච්චන්ති බහුජ්ජනන්තෙ

යෙ සත්ථවාහෙන අනුත්තරෙන
සුදෙසිතං මග්ග'මනුයන්ති
ඉධෙව දුක්ඛස්ස කරොන්ති අන්තං
යෙ අප්පමත්තා සුගතස්ස සාසනෙ"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

## 3 - 4 - 5.

අර්ථ:-

**ඛීණාසවො**, දුරුකරනලද චතුරාශ්‍රවයන් ඇති; **වුසිතවා**, විසූ වස් ඇති නොහොත් පුරුදු කරනලද ශීලාදි ආර්‍ය්‍යගුණ ඇති; **කතකරණීයො**, සතරමාර්ගයෙන් කරනලද කෘත්‍යය ඇති; **ඔහිතභාරො**, බහාතබනලද ස්කන්ධ ක්ලේශ අභිසංස්කාර සංඛ්‍යාත ත්‍රිවිධභාරයන් ඇති; **අනුප්පත්තසදත්ථො**, පැමිණි ස්වාර්ථය වූ අර්හත්වය ඇති; **පරික්ඛීණභවසංයොජනො**, දුරුකරනලද භවබන්ධන ඇති; **සම්මා අඤ්ඤාය**, තත්වූපරිද්දෙන් (ස්කන්ධ ධාතු ආයතනාදීන්ගේ ස්වභාවය) දැන; **විමුත්තො**, සියලු කෙලෙසුන්ගෙන් මිදුණාවූ; **අරහං හොති**, අර්හත් වේ ද; **ආදිකල්‍යාණං**, මුල යහපත්වූ; **මජ්ඣෙකල්‍යාණං**, මැද යහපත්වූ; **පරියොසානකල්‍යාණං**, අග යහපත්වූ; **සාත්ථං**, අර්ථසහිතවූ; **සබ්‍යඤ්ජනං**, අක්ෂර සහිතවූ; **කෙවලපරිපුණ්ණං**, සියල්ලෙන් සම්පූර්ණවූ; **පරිසුද්ධං**, පිරිසුදුවූ; **බ්‍රහ්මචරියං**, ශ්‍රෙෂ්ඨචර්‍ය්‍යාව; **පකාසෙති**, ප්‍රකාශ කෙරෙයි; **පාටිපදො**, (ප්‍රතිපද සංඛ්‍යාත ආර්‍ය්‍යමාර්ග-යෙන් ආර්‍ය්‍යජාතියෙහි උපන්නේ වේ ද; **බහුස්සුතො**, සූත්‍රගෙය්‍යාදි පර්‍ය්‍යාප්තිධර්මය බොහෝ කොට ඇසුයේ වේ ද; **සීලවතූපපන්නො**, ප්‍රාතිමොක්ෂසංවරාදි සීලයෙන් හා ආරණ්‍යකාදි ධුතාංගව්‍රතයන්හි යෙදුණේ වේ ද;

**ලොකෙ**, ලෝකයෙහි; **පඨමො මහෙසී**, පළමුවන මහර්ෂි වූයේ; **සත්ථා හි**, ශාස්තෲන්වහන්සේ ම ය. **තස්සන්වයො**,

උන්වහන්සේගේ අනුජාතවූ හෙවත් ශාසනානුප්‍රතිපත්තිය අනුගමනය කරන්නාවූ; **භාවිතත්තො**, භාවනාවෙන් වැඩුණු සිත් ඇති; **සාවකො**, බුද්ධශ්‍රාවක තෙමේ ය; **අථ**, ඉක්බිති; **අපරො**, නවත්; **පාටිපදො**, පිළිපදින්නාවූ; **බහුස්සුතො**, බහුශ්‍රැතවූ; **සීලවතූපපන්නො**, ශීලව්‍රතාදෙකින් යුක්තවූ; **සෙඛො අපි**, ශෛක්ෂ පුද්ගල තෙමේ ද යන තිදෙනා යි.

**එතෙ තයො**, මේ තිදෙන; **දෙවමනුස්සසෙට්ඨා**, දෙව්මිනිසුන් අතුරෙහි ශ්‍රෙෂ්ඨයෝ වෙත්; **පභඞ්කරා**, ධර්මාලෝකයෙන් ප්‍රභාවය ඇතිකරන්නාහු ය; **ධම්මං**, ධර්මය; **උදීරයන්තා**, කියන්නාහු ය; **තෙ**, ඔවුහු, **අමතස්ස ද්වාරං**, නිවන් දොරටුව; **අපාපුරන්ති**, විවෘත කෙරෙත්; **බහුජ්ජනං**, බොහෝදෙනා; **යොගා**, කාමයෝගාදි සතර යෝගයෙන්; **පමොචෙන්ති**, මුදත්; (යොගා පමුජ්ජන්ති යි ද පාඨ යි.)

**යෙ**, යම්කෙනෙක්; **අනුත්තරෙන සත්ථවාහෙන**, (වෛනෙය සත්ත්වයන් සසරකතරින් එතර කරන හෙයින්) උතුම්වූ සාර්ථවාහයකවූ භාග්‍යවතුන්වහන්සේ විසින්; **සුදෙසිතං**, මනාව දෙසනලද; **මග්ගං**, ආර්ය්‍යාර්ගය; **අනුගච්ඡන්ති**, අනුගමනය කෙරෙත් ද; **යෙ**, යම්කෙනෙක්; **සුගතසාසනෙ**, සර්වඥශාසනයෙහි; **අප්පමත්තා**, අප්‍රමාදව වෙසෙත් ද (ඔවුහු) **ඉධ එව**, මේ ආත්මයෙහිදී ම; **දුක්ඛස්ස**, සංසාර දුඃඛයාගේ; **අන්තං කරොන්ති**, කෙළවර කෙරෙත්;

**භාවය**:- සුගම යි.

**ධර්මවිස්තර**:

**ආදිකල්‍යාණං, මජ්ඣෙකල්‍යාණං, පරියොසානකල්‍යාණං**:-

අප භාග්‍යවතුන්වහන්සේ සවල්පවශයෙන් හෝ වේවයි බොහෝවශයෙන් හෝ වේව යි ධර්මය දේශනා කරනසේක් නම්, ආදිකල්‍යාණාදි ත්‍රිවිධ ගුණයන්ගෙන් යුක්තව ම දෙසති. එක ගාථාවක් නමුදු සමන්තභද්‍ර හෙයින් එහි ප්‍රථමපාදයෙන්

**ආදිකල්‍යාණත්වය ද**, දෙවන තුන්වන පාදවලින් **මධ්‍යකල්‍යාණත්වය ද**, අවසාන පාදයෙන් **පර්‍යවසාන කල්‍යාණත්වය ද** ප්‍රකාශ වෙයි.

එක අනුසන්ධියක් ඇති සූත්‍රයක් වේ නම් එහි නිදානයෙන් **ආදි කල්‍යාණත්වය ද**, නිගමනයෙන් **පර්‍යවසාන කල්‍යාණත්වය ද**. මැද කොටසින් **මධ්‍යකල්‍යාණත්වය ද** ප්‍රකාශ වෙයි. නොයෙක් අනුසන්ධි ඇති නොයෙක් කොටස් ඇති සූත්‍රයක් වේ නම් එහි ප්‍රථමානුසන්ධියෙන් **ආදිකල්‍යාණය ද**, අවසානයෙන් **පර්‍යවසානකල්‍යාණය ද**, සෙස්සෙන් **මධ්‍යකල්‍යාණය ද** දතයුතු.

එසේ ම ශීලයෙන් **ආදිකල්‍යාණය ද**, සමථ විපස්සනා මාර්‍ගඵලයන්ගෙන් **මධ්‍යකල්‍යාණය ද**, නිවනෙන් **පර්‍යවසාන කල්‍යාණය ද**, ශීලසමාධි දෙකෙන් ම **ආදිකල්‍යාණය ද**, විදර්ශනා මාර්‍ගයෙන් **මධ්‍යකල්‍යාණය ද**, ඵල නිර්‍වාණ දෙකින් **පර්‍යවසානකල්‍යාණය ද** යන මේ ආදි වශයෙන් ත්‍රිවිධ කල්‍යාණත්වය දතයුතු.

එසේ ම අර්‍ථසම්පත්තියෙන් **සාර්‍ථකත්වය ද**, අක්‍ෂර සම්පත්තියෙන් **සව්‍යඤ්ජනකත්වය ද**, **සංකාසන** (සැකෙවින් දැක්වීම ය) **පකාසන** (පළමුකොට දැක්වීම ය) **විවරණ** (විස්තරකිරීම ය) **විභජන** (බෙද දැක්වීම ය) **උත්තානීකරණ** (නොගැඹුරු අන්දමින් ප්‍රකටකිරීම ය) **පඤ්ඤත්ති** (පැනවීම ය) යන අර්‍ථසම්‍යෝගයෙන් **සාර්‍ථ** නම් වෙයි. **අක්‍ෂරය**:- (විභක්ත්‍යන්තයට නොපැමිණි ශබ්දස්වරූපයට පැමිණි අක්‍ෂර ය යුසේ යි) **පදය**:- නාමාඛ්‍යාත උපසර්‍ග නිපාතවිසින් චතුර්විධපදය යි) **ව්‍යඤ්ජනය**:- (පද සමුදායාත්මක වාක්‍යය යි) **ආකාරය** (වාක්‍යයාගේ සෙදීම යි) **නිරුක්ති** (ශබ්දලක්‍ෂණ වූ නිර්වචනය යි;) **නිද්දෙස** (විස්තර වශයෙන් කරුණු දැක්වීම ය යන මේ සම්පත්තියෙන් සව්‍යඤ්ජනත්වය ද) අර්‍ථගාම්භීර්‍ය ප්‍රතිවෙධගාම්භීර්‍ය වශයෙන් **සාර්‍ථ** බව ද, ධර්‍මගාම්භීර්‍ය දේශනාගාම්භීර්‍ය වශයෙන් **සව්‍යඤ්ජනත්වය ද**, අර්‍ථ, පටිභාන පටිසම්භිදා වශයෙන්

**සාත්ථකත්වය ද**, ධම් නිරුක්ති ප්‍රතිසම්භිදා වශයෙන් **සබ්‍යඤ්ජනත්වය ද**, ඥානවන්තයන්ගේ ප්‍රසාදයට හේතුවන හෙයින් **සබ්‍යඤ්ජනත්වය ද**, ගැඹුරු අදහස් ඇති බැවින් **සාත්ථකත්වයද**, නොගැඹුරුවචන යෙදීමෙන් **සබ්‍යඤ්ජනත්වය ද** දතයුතු. එහෙයින් ම කෙවලපරිපූර්ණ ද පිරිසිදු ද වේ.

**පස්වන සූත්‍ර විවරණය යි**

**3 – 4 – 6**

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං**

**අසුභානුපස්සී** භික්ඛවෙ කායස්මිං විහරථ, **ආනාපාන සති** ච වො අජ්ඣත්තං පරිමුඛං සූපට්ඨිතා හොතු, සබ්බ සඞ්ඛාරෙසු **අනිච්චානුපස්සිනො** විහරථ, අසුභානුපස්සිනං භික්ඛවෙ කායස්මිං විහරතං යො සුභාය ධාතුයා රාගානුසයො සො පහීයති. ආනාපානසතියා අජ්ඣත්තං පරිමුඛං සූපට්ඨිතාය යෙ බාහිරා විතක්කාසයා විඝාතපක්ඛිකා තෙ න හොන්ති, සබ්බසඞ්ඛාරෙසු අනිච්චානුපස්සිනං විහරතං යා අවිජ්ජා සා පහීයති, යා විජ්ජා සා උප්පජ්ජතීති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

‘‘අසුභානුපස්සී කායස්මිං ආනාපානෙ පතිස්සතො
සබ්බසඞ්ඛාරසමථං පස්සං ආතාපි සබ්බදා
ස වෙ සම්මද්දසො භික්ඛු යතො තත්ථ විමුච්චති
අභිඤ්ඤාවොසිතො සන්තො ස වෙ යොගාතිගො මුනී’’ති

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතං ති

**3 – 4 – 6**

අර්ථය:-

**කායස්මිං** ශරීරයෙහි; **අසුභානුපස්සී**, අසුභවශයෙන් සැලකීම් ඇතිව; **ආනාපානසති**, ආන අපාන දෙක අරභයා පවත්නා ස්මෘතිය; **වො**, තොපට; **අජ්ඣත්තං**, තමා සතන්හි; **පරිමුඛං**, අභිමුඛව; **සූපට්ඨිතා හොතු**, කම්සථාන

හිමුඛව එළඹ සිටිවා; **අසුභානුපස්සීනං**, අසුභය අනුව බලමින්; **විහරතං**, වාසයකරන්නවුන්ට; **සුභාය ධාතුයා**. සුභ නිමිත්තෙහි; **රාගානුසයො**, යම් කාමරාගානුසයෙක් වේ ද; **විඝාතපක්ඛිකා**, දුකට අයත් වූ; **බාහිරා**, බැහැර වූ; **යෙ විතක්කාසයා**, යම් කාමසංකල්පනාදි මිථ්‍යා විතර්කයෝ වෙත් ද;

**කායස්මිං**, ශරීරයෙහි; **අසුභානුපස්සී**, අසුභය අනුව බලමින්; **ආනාපානෙ**, ආශ්වාස ප්‍රශ්වාසදෙක්හි; **පතිස්සතො**, පිහිටි සිත් ඇතිව; **සබ්බදා**, හැමකල්හි; **ආතාපී**, කෙලෙසුන් තවන වීර්‍ය ඇතිව; **සබ්බසඞ්ඛාරසමථං**, සියලු සංස්කාර යන්ගේ සමථය වූ නිර්වාණය; **පස්සං**, නුවණින් දක්නා වූ; **සම්මද්දසො**, සම්‍යක්දර්ශනය ඇති; **සො භික්ඛු**, ඒ මහණ තෙම; **යතො**, උත්සාහවත්ව; **තත්‍ථ**, ඒ සර්වසංස්කාර සමථ නම්වූ නිවනෙහි; **විමුච්චති**, අර්හත්ඵල විමුක්තියෙන් මිදුණේ වේ ද; **අභිඤ්ඤාවොසිතො**, ෂඩ් අභිඥයෙන් නිම වනලද කෘත්‍ය ඇති; **සන්තො**, ශාන්ත වූ; **සො මුනි**, ඒ භික්ෂු තෙම; **වෙ**, ඒකාන්තයෙන්; **යොගාතිගො**, චතුර් යෝගය ඉක්මවූවෙක් වෙයි;

**ධර්මවිස්තරයෙන්** භාවය ද පැහැදිලි වෙයි.

සර්වක්ලේශ විමුක්තිය පිණිස අනුපස්සනා තුනක් මෙයින් වදාළහ එනම්:- අසුභානුපස්සනා, ආනාපානසති අනුපස්සනා, අනිච්චානුපස්සනා යන තුන යි. ශරීරයෙහි ද්වත්‍රිංශාකාර වශයෙන් අසුභය සැලකීම අසුභානුපස්සනාවයි. මෙහි සාංදෘෂ්ටික ප්‍රතිඵලය නම්:- යම්කිසි රූපාදි අරමුණක් ඉෂ්ට වශයෙන් සැලකීමේ දී උපදනා කාමරාගානුසය දුරුවීමයි.

දෙවන කාරණය නම්:- ආනාපානසතිය ගැන සැලකීමයි. එයින් බාහිර වශයෙන් පවත්නා කාම සංකල්පනා ආදි මිථ්‍යාවිතර්කයෝ ඇති නොවෙත්.

තුන්වන කාරණය නම්:- සියලු සංස්කාරයන් අනිත්‍ය වශයෙන් සැලකීමයි. එයින් අවිද්‍යාව දුරුවෙයි. මෙහි අනිච්චානුපස්සනාව පිළිබඳ චතුෂ්කයෙක් ඇත, ඇතිව

නැතිවනබව සැලකීම ද, උදයව්‍යය හෙවත් උත්පත්තියත් විනාශයත් දෙක හා සම්බන්ධ කොට පවත්නාබව සැලකීම ද තාවකාලිකබව සැලකීම ද නිත්‍යයට විරුද්ධබව සැලකීම ද යන සතරයි.

මෙසේ අනිත්‍යලක්‍ෂණය අරභයා පවත්නා විපස්සනාව අනිච්චානුපස්සනා නම් වේ විදර්ශකතෙමේ අනිච්චානුපස්සී නමි. මේ අනිච්චානුපස්සනා අසුභානුපස්සනා දෙකම අන්‍යොන්‍ය සම්බන්ධතාවයෙන් පවත්නාහු ය.

**ආනාපානසති**—

ආශ්වාස ප්‍රශ්වාස දෙක්හි පවත්වන සිහිය **ආනාපාන සතියයි**. විවේකීව හිඳ ආශ්වාසප්‍රශ්වාසදෙකින් බැහැරට සිතට යන්නට ඉඩ නොදී එහිම සිත පිහිටුවා ඒ සිහිය දියුණු කිරීම **ආනාපානසතිභාවනා** නම් වේ. එසේ කරන්නහුට ඒ සිහිය අනුව එය හා බැඳී සමාධිය ද දියුණු වේ. ඒ සමාධියට **ආනාපානසති සමාධිය** යි කියනු ලැබේ. එය බොහෝ අනුසස් ඇති උසස් සමාධියකි.

එහෙයින් වදාළහ:

"අයම්පි ඛො භික්ඛවෙ **ආනාපානසතිසමාධි** භාවිතො බහුලීකතො සන්තො චෙව පණීතො ච, අසෙචනකො ච, සුඛො ච විහාරො, උප්පන්නුප්පන්නෙ ච, අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති වූපසමෙති"යි.

මහණෙනි, වඩනාලද නැවත නැවත වඩනාලද මේ ආනාපානසති සමාධිය ඖදාරික වූ ද ප්‍රතිකකූල වූ ද කෙශාදි ආරම්මණයකින් තනාගන්නාලද්දක් නොවී සියුම් වූ ද අප්‍රතිකකූල වූ ද ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තියෙන් තනා ගන්නාලද්දක් වීමෙන් ශාන්ත ද ප්‍රණීත ද වේ ස්වභාව යෙන් ම මිහිරිද වේ එයට සමවන කල්හි කායික චෛතසික සුඛයන් ඇති වන බැවින් සැපවිහරණය ඇති කරන් නකි ඒ ආනාපානසති සමාධිය උපනුපන් අකුශල ධර්මයන් සැණෙකින් අතුරුදහන් කරවයි සන්සිඳුවයි යනු මෙහි

අදහසයි. "සබ්බබොධිසත්තානං හි ආනාපානචතුත්ථජ්ඣානතො වුට්ඨාය පච්චයාකාරෙ ඤාණං ඔතාරෙත්වා තං අනුලොම පටිලොමං සම්මසිත්වා බුද්ධා හොන්ති"

(සංයුත්තනිකායට්ඨකථා බුද්ධවග්ග)

යනුවෙන් සකල බොධිසත්ත්වවරයන් ම අනාපාන චතුර්ථ ධ්‍යානයෙන් නැගී ප්‍රත්‍යයාකාරයට ඥානය යවා එය අනු-ලොම ප්‍රතිලොම වශයෙන් සම්මර්ශනය කොට ලොවුතුරා බුදුබවට පත්වනබව දක්වා තිබීමෙන් ම ආනාපානසතියේ උසස්බව දත හැකිය

මේ ආනාපානසතිය වඩන යෝගාවචරයා සමහරවිට භාවනාව පටන්ගත් පළමුවන දිනයේ පළමුවන හිඳගැනීමේ දීම සව්කෙලෙසුන් නසා රහත් වෙයි. සමහරවිට මුළුජීවිත කාලයේම භාවනා කොට රහත් නොවිය හැකි වූ යෝගා-වචරයා මරණකාලයේ දී සමසීසී පුද්ගලයකු වශයෙන් රහත් වෙයි යමකුගේ රහත්වීම හා පරිනිර්වාණය එකවිටම සිදු වේ නම් ඒ රහතන් වහන්සේට **සමසීසිය** යි කියනු ලැබේ

ඒ හෙයින් පුද්ගලප්‍රඥප්තිප්‍රකරණයෙහි: "කතමො ච පුග්ගලො සමසීසී? යස්ස පුග්ගලස්ස අපුබ්බං අචරිමං ආසව පරියාදානඤ්ච හොති: ජීවිතපරියාදානඤ්ච, අයං වුච්චති පුග්ගලො **සමසීසී**" යනු වදාළහ.

ජීවිතාවසානයේ දී රහත්නොවියහැකි වේ නම් අනාගාමී හෝ වෙයි එසේ ද නො වී නම් මරණින් මතු දෙව්ලොව ඉපද ධර්මකථික දිව්‍ය පුත්‍රයකුගෙන් බණ අසා හෝ රහත් වෙයි. අපට ඇත්තේ පරම්පරා බොහෝ ගණනක් අතින් අතට ආ බණ ය බුදුරජාණන් වහන්සේ ගෙන් දහම් ඇසූවකුගෙන් අපට බණ අසන්නට නො ලැබේ. බුදුන් වහන්සේගෙන් බණ අසා මගපල ලැබූවන්ගෙන් වැඩිදෙනෙක් දිව්‍ය බ්‍රහ්මයෝ ය. ඔවුහු අදත් ජීවත් වෙති ඔවුහු දෙව්ලොව අදත් දහම් දෙසති. බුදුන් වහන්සේ-ගෙන්ම ඇසූ සැටියට දෙසන ඔවුන්ගේ බණ අපේ බණ

වලට වඩා යහපත් වියයුතු ය. මෙහිදී **ආනාපානසතිය** වඩා රහත් නොවූ යෝගවචරයෝ සමහරවිට ඒ දෙවියන්ගේ බණ අසා රහත් වෙති

දෙව්ලොවදීත් රහත් නොවිය හැකි වූ යෝගාවචරයාට සමහරවිට අබුද්ධොත්පාදයේදී පසේබුදු වියහැකි ය. එසේත් නො හැකි වූ යෝගාවචරයාහට බුදුකෙනකුන් හමුවූ විටෙකදී බාහ්‍යසථවිරාදීන්ට මෙන් ක්ෂිප්‍රාභිඥ රහත් නමක් විය හැකිය මෙසේ **ආනාපානසති භාවනාව** මහත්ඵල මහානිසංස ඇත්තේ ය.

එහෙයින් **මහාකප්පින** මහරහතන් වහන්සේ මෙසේ වදාළහ:

"**ආනාපානසති** යස්ස පරිපුණ්ණා සුභාවිතා,
අනුපුබ්බං පරිචිතා යථාබුද්ධෙන දෙසිතා,
සොමං ලොකං පභාසෙති අබ්භාමුත්තොව චන්දිමා"
(මහාකප්පින ථෙරගාථා)

බුදුරජාණන් වහන්සේ විසින් වදාළ පරිද්දෙන් යම් යෝගාවචරයකු විසින් ආනාපානසතිය ක්‍රමානුකූලව සම්පූර්ණ කොට පුරුදුකරන ලද්දේ ද, හෙතෙම වළාකුළින් මිදුණු සඳමඬල මෙන් මේ ලෝකය බබුළුවයි යනු මෙහි අදහසයි.

**සො සතොව අස්සසති, සතො පස්සසති** යනුවෙන් **ආනාපානසති** භාවනානුයොගී යොගාවචරතෙම මෙසේ සිහිය පිහිටුවා ඒ අත් නො හරිමින් සිහිය ඇතිවම ආශ්වාස කෙරෙයි. සිහිය ඇතිවම ප්‍රශ්වාස කෙරෙයි ඔහුගේ හිඳීම හා සිහිය පිහිටුවීමත් කෙසේ වියයුතු ද යනු **ගිරිමානන්ද සූත්‍රයෙහි** "ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූල ගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා" යනු-වෙන් ප්‍රකාශවූ අයුරින් දතයුතු.

**ආනාපානසති** භාවනාවට උත්කෘෂ්ට වශයෙන් යොග්‍යවූ සෙනසුන නම් අරණ්‍යය හෝ වෘක්ෂමූලය හෝ

සූන්‍යාගාරය හෝ යන මේ තුනෙන් එකකි. එහි හිඳීම නො පසුබටවූත් සත්පුරුෂවූත් ශාන්තවූත් විශිෂ්ටඥානයෙන් වියයුතු ය. සපිරව පිහිටා හිඳීම ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ මනාපැවැත්මටත් අරමුණ තදින් අල්ලා ගැනීමටත් උපායක් වන හෙයින් බද්ධපර්‍ය්‍යඞ්කයෙන් හිඳීම ඉතා ප්‍රසස්ත බව දක්වනු පිණිස "පල්ලඞ්කං ආභුජිත්වා" යනු වදාළහ. ඌර්ධ්ව කය හෙවත් ඉඟටියෙන් උඩ ශරීරය පිටකටුවෙහි දහඅටක් කොඳු ඇට නො නැමෙන සෙයින් කෙළින් පිහිටුවා ගත යුතු හෙයින් "උජුං කායං පණිධාය" යි වදාළහ. මෙසේ හිඳින්නකුට සම් මස් නහර නැමීමෙන් ඇසිල්ලෙන් උපදනා වේදනාවක් නො දැනෙන බැවින් සිත එකඟ කරගත හැකිවෙයි. සිහිය කර්මස්ථානාභිමුඛ වෙයි.

එහෙයින් විභඞ්ගයෙහි හෙවත් විස්තර වශයෙන් ප්‍රකාශ කිරීමෙහි "අයං සති උපට්ඨිතා වා හොති සූපට්ඨිතා, නාසිකග්ගෙ වා මුඛනිමිත්තෙ වා, තෙන වුච්චති පරිමුඛං සතිං උපට්ඨපෙත්වා" යි කීහ. මෙයින් නාසිකාග්‍රය හෝ මුඛය හෝ හොඳින් සිහියේ තබාගත යුතු බව දක්වයි. මෙසේ සිහි ඇතිවම ආශ්වාස කිරීමත් සිහි ඇතිවම ප්‍රශ්වාස කිරීමත් දෙතිස් ආකාරයකින් කළයුතු බව දක්වනු පිණිස "දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති, දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති; රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති; පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති" යනු වදාළහ.

දික් කොට නාසිකාවාතය අදනේ දික් කොට අදිමි යි දනී. දික් කොට හෝ ප්‍රශ්වාස කරන්නේ හෙවත් හුස්ම පහතට හෙළන්නේ දික් කොට ප්‍රශ්වාස කරමි යි දනියි. ලුහුඬුව හෙවත් කෙටිව ආශ්වාස කරන්නේ කෙටිව ආශ්වාස කෙරෙමි යි දනියි. කෙටිව ප්‍රශ්වාස කරන්නේ කෙටිව ප්‍රශ්වාස කෙරෙමි යි දනියි -පෙ- කෙලෙසුන්ගෙන් මිදීම දක්නෙමි ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. මිදීම දක්නෙමි ප්‍රශ්වාස

කෙරෙමි යි හික්මෙයි යනුවෙන් අප විසින් ගිරිමානන්ද සූත්‍රයට ව්‍යාඛ්‍යා ලියනලද **පාළි සිංහල සිරිත්** පොතින් අරුත් දතයුතු.

ඉතා **දක්‍ෂවූ** ලියනවඩුවෙක් ලොකු දැව භාණ්ඩයක් ගෙන ලියනපට්ටලයෙහි ලා ලියන කල්හි සිහි ඇතිවම දික් කොට අදනේ වේ ද, සිහි ඇතිවම ලුහුඬු කොට කෙටි කොට අදනේ වේ ද, එමෙන් භාවනානුයෝගීවූ යොගාවචර තෙමේ ද විවේකව හිඳ සිහි එළවා ආශ්වාස ද කෙරෙයි ප්‍රශ්වාස ද කෙරෙයි යන ආදි **මහාසතිපට්ඨාන** සූත්‍රයෙන් **ආනාපානසතිය** උපමා වශයෙන් වදාළ අයුරු දතයුතු.

"අස්සාසොති බහිනික්ඛමණවාතො, පස්සාසොති අන්තොපවිසනවාතො" යනුවෙන් ආශ්වාසය නම් පිටතට නික්මෙන වාතයයි ද, ප්‍රශ්වාසය නම් ඇතුළට වදනා වාත යයි ද, **විනයට්ඨකථා**වෙහි කියනලදී. **සූත්‍රාන්තට්ඨ කථාවල** එය උපිළිවෙළින් ගෙන ආශ්වාසය නම් ඇතුළට ගන්නා නාසිකාවාතය යි ද ප්‍රශ්වාසය නම් ඇතුළින් පිටතට හෙළන නාසිකාවාත යයි ද කියනලදී. විනයඅටුවා මතය ස්ඵුට කරනු සඳහා ගැබහෝනා දරුවකු මවුකුසින් බිහිවන කල්හි පළමුකොට දරුවාගේ අභ්‍යන්තර වාතය පිටතට නික්මෙයි පිටත පවත්නා බාහිර වාතය සියුම් දූවිලිත් සමග ඇතුළතට වදිමින් නැතිවෙයි. මෙසේ ආශ්වාස ප්‍රශ්වාස දෙක දතයුතුය යි කීහ. මෙහි අප විසින් සලකන ලද්දේ **සූත්‍රාන්තික** ක්‍රමය යි.

මෙහි ඇතුළත්වූ දෙතිස චතුෂ්ක සතරකින් සොළස වස්තුක කොට ගත්කල්හි පූර්වචතුෂ්කතුන සමථ විපස්සනා වශයෙන් ද, සතරවන චතුෂ්කය සුද්ධ විදර්ශනා වශයෙන් ද ප්‍රකාශිත ය ඒ චතුෂ්ක සතර නම් සබ්බකාය චතුෂ්කය, ප්‍රීති චතුෂ්කය, චිත්ත චතුෂ්කය, අනිත්‍ය චතුෂ්කය යන සතරයි. "යස්මා පනෙත්ථ ඉදමෙව පුරිම චතුක්කං ආදිකම්මිකස්ස කම්මට්ඨානවසෙන වුත්තං, ඉතරානි පන තීණි චතුක්කානි එත්ථ පත්තජ්ඣානස්ස වෙදනා චිත්ත ධම්මානු- පස්සනාවසෙන වුත්තානි." යනු අටුවා හෙයින් මෙහි

සංඝිකාය චතුෂ්කය ආදිකර්මිකයාට කම්සථාන වශයෙන් ද ඉතිරි චතුෂ්කත්‍රය ධ්‍යානලාභීහට වෙදනා චිත්ත ධම්මානු-පස්සනා වශයෙන් ද, දක්වූ හෙයින් **"ආනාපානසති භික්ඛවෙ භාවිතා බහුලීකතා චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙනි"** යන දේශනානයින් අස්සාස පස්සාස කායානු පස්සනාව ඉතිරි අනුපස්සනාවන්ට ද උපනිශ්‍රය වේ යයි දතයුතු.

මේ **ආනාපානසති** කම්සථානය නියමිත පරිද්දෙන් වඩන යොගාවචරයාහට ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථ පඤ්චම යන ධ්‍යානයන් පිළිවෙළින් උපදවාගත හැකි වෙයි. සතර වැනි හෝ පස්වෙනි ධ්‍යානය හා සම්ප්‍රයුක්ත වූ සිත ක්‍ෂය ව්‍යය වශයෙන් සලකමින් අනිච්චානුපස්සනා විරාගානුපස්සනා නිරොධානුපස්සනා පටිනිස්සගානුපස්සනා යන ශුද්ධවිදර්ශනා ඥාන පිළිවෙළින් මාර්ග ඵල උපදවා නිවන් ප්‍රත්‍යක්‍ෂ කරගත හැකිවෙයි. රහත්ඵලය අවබෝධ කරගත හැකිවෙයි.

මෙයින් අවසෙසවූ කම්සථානයන් වැඩීමෙන් අර්හත් ඵලාවබොධයට පැමිණි රහතන්වහන්සේට වඩා **ආනාපාන සති** භාවනාවෙන් රහත්වූ උතුමන්ගේ විශෙෂයක් ඇති බව **ද**ක්වන තථාගතයන්වහන්සේ "එවං භාවිතාය ඛො රාහුල ආනාපානසතියා එවං බහුලීකතාය යෙපි තෙ චරිමකා අස්සාසපස්සාසා තෙපි විදිතාව නිරුජ්ඣනති, නො අවිදිතා" යනු වදාළහ. මෙසේ වඩනාලද නැවත නැවත පුරුදුකරනලද ආනාපානසතිය හේතුකොට ගෙන යම් ඒ කෙළවර වූ ආශ්වාස ප්‍රශ්වාස කෙනෙක් ඇද්ද ඔවුහු තමහට ප්‍රකටව දැනීමෙන්ම නිරුද්ධ වෙත්. තමහට නොදැනීමෙන් නිරුද්ධ නොවෙත් යනු **රාහුල** සථවිරයන් වහන්සේට දේශනා කළ අයුරුයි.

එහි නිරුද්ධවීම් වශයෙන් භවචරිමකය, ධ්‍යානචරිමකය, චුතිචරිමකයයි කෙළවර වන්නෝ තිදෙනෙකි. භවයන් අතුරෙහි කාමභවයෙහි ආශ්වාස ප්‍රශ්වාසයෝ ඇත්තාහ. රූපාරූප භව වල නැත්තාහ. එහෙයින් ඔවුහු **භවචරිමකා** නම් වෙත්. ධ්‍යානයන් කෙරෙහිදු පළමුවන දෙවන

තුන්වන ධ්‍යානයන්හි ආශ්වාස ප්‍රශ්වාසයෝ පවතිත්. සතරවන පස්වන ධ්‍යානයන්හි නො පවතිත්. එහෙයින් මෙතෙම **ධ්‍යානචරිමක** නම් වේ. යම් ආශ්වාස ප්‍රශ්වාස කෙනෙක් යමෙකුට චුතිචිත්තයෙන් යට සොළොස්වන චිත්තක්‍ෂණය හා ඉපද චුතිසිත හා සමගම නිරුද්ධ වෙත් ද මොවුහු **චුතිචරිමක** නම් වෙති.

මේ කමටහනෙහි යොගාවචරයාහට ආනාපානාරම්මණය මනාව පුරුදු බැවින් තමාගේ චුතිසිතෙන් පළමු සොළොස් වැනි චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි උපන් ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ ඉපදීම ද, ඔවුන්ගේම පැවැත්ම ද, ඔවුන්ගේ බිඳීම ද යන උත්පාද ස්ථිති භඞ්ගයන් මනාව ප්‍රකට වෙයි. මේ **ආනාපානසති** කමටහන හැර අන්කිසි කමටහනක් වඩා රහත්වූ ආර්‍ය්‍ය පුද්ගලයාගේ ජීවිතය පවත්නා කාලසීමාව තමහට පිරිසිඳ දැන ගත හැක්කේ හෝ නො හැක්කේ ද වෙයි

මේ **ආනාපානසති** භාවනාවෙන් රහත්වූ ආර්‍ය්‍යයන් වහන්සේට ජීවිතකාලය සීමාසහිත ව වැටහෙයි. උන් වහන්සේ මාගේ ජීවිතෙන්ද්‍රිය හෙවත් ආයුෂය පවත්නේ මෙපමණ කල් ය. මෙයින් මත්තෙහි නැතැයි සලකා තමාගේ ස්වභාවගතියෙන්ම සිරුරු පිළිදැගීම් හැඳීම් පෙරවීම් ආදි සියලු පූර්වකෘත්‍යයන් කොට සෙනස්නෙහි සකස්ව වැදහෙව දෙඇස් පියාගන්නේ යි. කොටපබ්බත විහාරවාසී **තිස්ස** තෙරුන්ගේ හා මහකරඳ නම් වෙහෙර වැසි **මහාතිස්ස** තෙරුන්ගේ ද, දෙව්පුත් රට **පිණ්ඩපාතික** තෙරුන්ගේ ද, සිතුල්පව් වැසි සහෝදර **තෙරුන් දෙනමගේ** ද චරිතාපදානයන් මෙයට නිදර්‍ශනයි.

එයින් අසිරිමත් එක කථාවස්තුවක් මෙසේ යි. සිතුල්පව් වෙහෙර වැසි **වේ ..තිස්ස** නම් එක්තෙරනමක් පසළොස්වක් පොහෝදින රැයිම්හි පාමොක් දෙසා තමන්වහන්සේ වසන තැනට වැඩ සක්මන් මළුවෙහි සඳකැලුම් බලා වැඩ සිටිමින් තමන්වහන්සේගේ ආයුසංස්කාරය ගැන සලකන

සේක් (චන්ද්‍රමණ්ඩලය කලාපූර්ණිය සඳපහන හාත්පසින් නැමූ ක්ෂීරධාරාවක් බඳුය, අහස ද රිදී පටක් බඳුය, වැලිතලා ඇති බිම්පෙදෙස ද ඉතාරම්‍යය. කෙතෙක් කල් මේ දුක්ඛභාරය ඉසිලියයුතු ද්දෝ හෝ යි ආයුෂකාලය සලකමින් ය යන අභිප්‍රාය යි.) එය ඉතා ඉක්මනින් සිදුවනබව මනාකොට දත භික්ෂූන් අමතා "ඇවැත්නි, තොප කෙසේ පිරිනිවෙන භික්ෂූන් දුටුවිරැද්ද"යි ඇසූහ.

සමහර කෙනෙක් අපි අස්නෙහි හිඳගෙනම පිරිනිවන් පාන භික්ෂූන් දුටුවෙමු යි කීහ. ඇතැම් කෙනෙක් අපි අහසෙහි පලක් බැඳ වැඩහිඳ පිරිනිවන් පාන භික්ෂූන් දුටුයෙමු යි ද, මෙසේ මෙසේ පිරිනිවෙන පරිදි කීහ. තෙරුන්වහන්සේ "එසේ වී නම් මම දැන් තොපට සක්මන් කෙරෙමින් පිරිනිවන්පාන්නකු පෙන්වම්දැ"යි ඇසූහ.

ඉක්බිති එසේය ස්වාමීනි යි ඒ භික්ෂූන් සැලකළ කල්හි තෙරුන්වහන්සේ සක්මන්මළු කෙළවරෙහි ඉරක් ඇඳ "මම මේ සක්මන් කෙළවර සිට අනික් කෙළවරට ගොස් ආපසු මේ රේඛාවට පැමිණ නැවතී පිරිවන්පාම්"යි ප්‍රකාශ කොට තමන් වහන්සේ සක්මනට බැස ක්‍රමයෙන් ඉදිරි සක්මනෙහි වැඩ ආපසු හැරී අවුත් එක් පියවරෙකින් රේඛාව ඇක්ම ගත් කෙණෙහිම පිරිනිවිසේක. **ආනාපානසති** කම්ස්ථානය මෙසෙයින ආශ්චර්‍ය ද අද්භූත ද වන්නේය.

මේ කම්ස්ථානය වනාහි බුදු පසේබුදු මහරහත් මහා-ප්‍රඥයන්ටම ගෝචර වන්නේය. මෙය ඉතා ගැඹුරු ද සියුම් ද වෙයි. අබුද්ධොත්පාද කාලයෙහි මෙහි නාමමාත්‍රයකුදු නො ලැබෙයි. එහෙයින් සෙසු සියලු කම්ස්ථානයන් අතුරෙහි මෙයම ගරු වන්නේය. මේසා ගරු භාවනාවකුදු නැත්තේය.

ආර්‍ය නම්වූ බුදු පසේබුදු මහරහතන්වහන්සේලාගේ විහරණය **ආර්‍යවිහාර** නම් වේ රාගාදි සියලු කෙලෙසුන් දුරු කළ හෙයින් බුද්ධාදි උත්තමයෝ ආර්‍ය නම් වෙති. උන්වහන්සේලාගේ වාසය ආර්‍යවිහාර නම් වතුදු

"සදෙවකෙ භික්ඛවෙ ලොකෙ තථාගතො අරියොති වුච්චති" යනු දේශනා හෙයින් දෙවියන් සහිත ලෝකයෙහි තථාගතයන්වහන්සේම ආය්‍ර්‍ය නම් වන සේක. උන් වහන්සේගේ විහරණයම ආය්‍ර්‍යවිහාර නමැ යි මෙහි ලා විශේෂයෙන් සැලකියයුතු. විහාර යනු පාරිභාෂික ශබ්දයක් වශයෙන් සලකන කල භික්ෂූන් වසන ආශ්‍රමයටත් විහාර යයි කියනු ලැබේ. සම්බුදුයන්වහන්සේගේ වාසභවනය වූ ගන්ධකුටියටත් විහාරයයි ව්‍යවහාර කෙරේ. මෙහි යෙදුනු විහාර ශබ්දයෙන් ඒ දෙකම නොව වාසය හෙවත් විසීම් අර්ථය පවසනබව දතයුතු ය

මෙය සෙඛවිහාර අසෙඛවිහාර යයි දෙවැදෑරුම් කොට ගත් කල්හි ශෛක්ෂයෝ නම්: ශ්‍රොතාපත්ති මාර්‍ගඥනයේ පටන් අර්හත් මාර්‍ගඥනය දක්වා සත්මග පල දත් ආය්‍ර්‍ය පුද්ගල කොටසකි අශෛක්ෂ නම්: රහත්ඵලයට පැමිණි ආය්‍ර්‍ය යන වහන්සේ යි මුන්වහන්සේලා ද ආය්‍ර්‍ය වන නමුත් මෙහි ලා ගැනෙන ආය්‍ර්‍යවිහාරය තථාගතයන්වහන්සේ පිළිබඳවූ අසෙඛ විහරණය බැව් දතයුතු. "යං හි තං භික්ඛවෙ සම්මාවදමානො වදෙය්‍ය අරියවිහාරො ඉතිපි, බ්‍රහ්මවිහාරො ඉතිපි, තථාගත විහාරො ඉතිපි, **ආනාපානසති සමාධිං**යෙව සම්මා වදමානො වදෙය්‍ය" යනුවෙන් මහණෙනි, මනාව දැන හොඳහැටි කියන්නෙක් ආය්‍ර්‍යවිහාර යයි කියා හෝ බ්‍රහ්ම විහාර යයි කියා හෝ තථාගතවිහාර යයි කියා හෝ ප්‍රකාශ කෙරේ නම් **ආනාපානසති සමාධිය** සඳහාම කිවයුතුය යි වදාළහ බ්‍රහ්මවිහාර නමින් බ්‍රහ්මයන්ගේ මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ඛා යන සිවුබඹ විහරණය ප්‍රකට නමුත් "බ්‍රහ්මාති ඛො භික්ඛවෙ තථාගතස්සෙතං අධිවචනං" යන දේශනාවට අනුව සලකන කල බ්‍රහ්ම යනු තථාගතයන් වහන්සේට ද නමක් වන බැවින් තථාගත විහරණයම මෙහි ලා **බ්‍රහ්මවිහාර** නමින් සලකනු ලැබේ.

මේ **ආනාපානසති** සමාධි භාවනාව පොදු වශයෙන් සලකන කල භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවුවනක් පිරිසගේ විශේෂ අධිගමය පිණිසත් බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ

මහාශ්‍රාවක තදන්‍යශ්‍රාවකයන්ගේ දිට්ඨධම්ම සුඛවිහාරය හෙවත් ඉහාත්ම සැපවිහරණය පිණිසත් හේතුවන විශේෂ ගුණයෙකි.

එක් අවස්ථාවක අප භාග්‍යවතුන්වහන්සේ **ඉච්ඡානඞ්ගල** නම් නියම්ගම ඇසුරු කොට එක්තරා වනලැහැබෙක්හි වූ අසපුවෙක තෙමසක් විවේකයෙන් වැඩවසනු කැමතිව තමන්වහන්සේට පිණ්ඩපාතය රැගෙන එන භික්‍ෂුනම හැර අන්කිසිවකුටත් එහි නො පැමිණෙන සේ නියම කොට වැඩ විසූහ. තෙමසකින් විවේක සුවයෙන් නැගිටි භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂූන් අමතා මෙසේ වදාළහ. "මහණෙනි, යම්කිසි අන්‍යතීර්ථක පරිබ්‍රාජකයකු පැමිණ ශ්‍රමණ භවත් ගෞතම තෙමේ මේ වස් තෙමස තුළ කිනම් විහරණයකින් විසූයේදැ යි විචාළහොත් **ආනාපානසති සමාධියෙන්** යුක්තව විසූ බව ප්‍රකාශකරව"යි වදාළහ.

සම්‍යක්සම්බොධියට පැමිණි පසු තථාගතයන් වහන්සේගේ මේ **ආනාපානසති** සමාධි විහරණය කවර ආශ්චර්‍ය්‍යයක් ද? බුදුවන්නට පළමු බොධිසත්ව අවස්ථාවේදීම "මම බොහෝ සෙයින් මේ විහරණයෙන්ම විසූයෙමියි" තමන්වහන්සේ භික්‍ෂූන්ට වදාළහ. ඒබව බුදුවන්නට පළමුව **සිද්ධාර්ථකුමාර** අවස්ථායෙහිම තම පියාණන්වූ සුදොවුන් මහරජුගේ වප් මඟුල් දිනයෙහි කෙත් අබියස හෙවත් කුඹුරු පෙදෙස්හි එළිමහන්තැනෙක දඹරුක් සෙවනෙහි හිඳිනට සලස්වා උඩුවියන් බැඳ වටතිර ඇද වැඩහුන් කල්හි **ආනාපානසතිය** වඩා ප්‍රථමධ්‍යානය උපදවා පෙළහර පෑ බව **අමාවතුර** සවසනතාන දමන පරිච්ඡෙදයෙහි සඳහන්වෙයි. "අහම්පි සුදං භික්ඛවෙ පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධො බොධිසත්තොව සමානො ඉමිනා විහාරෙන බහුලං විහරාමි" යනුවෙන් මහණෙනි, බුදුවන්නට පළමුත් බොධිසත්වූයෙම් මම බොහෝ කොට මේ විහරණයෙන් විසුයෙමි යි වදාළේ එහෙයිනි.

එසේම තම ශ්‍රාවකයන්හට ද **ආනාපානසතිය** වැඩීමෙහි ගුණ වදාරා භික්‍ෂූන් එහි යෙදවූසේක. එමතු නොව **මහා**

**රාහුලොවාද** සූත්‍රයෙහි සවකීය පුත්‍රවූ රාහුලභද්‍රයන්ට "ආනාපානසතිං රාහුල භාවනං භාවෙහි" යනුවෙන් රාහුලය, ආනාපානසති භාවනාව කරව යි නියම කොට එය පුහුණු කරවා රහත්වීමට මග පෙන්වා **ආනාපානසති** භාවනාවෙහි අනුසස් සතක් ද වදාළහ.

ශේ කවරේද යත්: **ආනාපානසතිය** වඩන භික්ෂුතෙම පළමුකොටම රහත් වෙයි. නැතහොත් කළුරියකරන මොහොතෙහි රහත්වෙයි. සමසිසී නමින් දක්වා ඇත්තේ මෙතෙමේ යි. එසේ නොවෙතොත් පස්වැදෑරුම් ඕරම්භාගීය සංයොජනයන් එනම් සත්කාය දෘෂ්ටිය (ආත්මයයි සැලකීම) විචිකිත්සාව (බුද්ධාදි අටතැනෙක්හි සැකය) ශීලව්‍රත පරාමර්ශය (අන්‍යශාස්තෘවරයන්ගේ තපොගුණ හා ව්‍රත සමාදානයන් පිළිගැනීම) කාමරාග (පඤ්චකාමයන්හි ඇලීම) ප්‍රතිඝ (ක්‍රෝධය) යන මේ කාමලෝකයෙහි බැඳුම් පස නැති කොට **අන්තරා පරිනිබ්බායී** නම් අනාගාමී ආයඹී පුද්ගලයෙක් වේ.

හැම කම්ටහනක්ම කම්සථානදායක කල්‍යාණමිත්‍රයකු ඇසුරුකොට ගෙන ම ඔහුගෙන් උපදෙස් ලැබ වැඩිය යුතුය ආනාපානසතිය වැඩීමෙහි ක්‍රමය අනික් හැම කම්සථානයකටත් වඩා සියුම් ද ගැඹුරුද වේ. මෙහි දක්-යේ වැඩියයුතු ක්‍රමය නොව එයට පිළිපෙළවිය යුතු අන්දමත් එයින් ලැබිය හැකි අනුසස් සවල්පයකුත් පමණෙකි. මෙහි විස්තර විභාග: විනයට්ඨකථා, චතුභාණවාරට්ඨකථා, මජ්ඣිමනිකායට්ඨකථා, පටිසම්භිදාමග්ගට්ඨකථා, විසුද්ධිමග්ගට්ඨකථා ආදියෙන් දතයුතු. මෙහි ලා විශේෂයෙන් සැලකියයුතු කරුණක් නම්: දීඝනිකායෙහි එන **මහාසතිපට්ඨාන** සූත්‍රයෙහි ආනාපානසතිය ලුහුඬින් දක්වීමයි. එය විස්තර වශයෙන් දක්වා තිබෙන්නේ මජ්ඣිමනිකායෙහි මහා රාහුලොවාද සූත්‍රය, කායගතාසති සූත්‍රය, ආනාපානසති සූත්‍රය හා ගිරිමානන්ද සූත්‍රයෙහිත් ය.

**සවන සූත්‍ර විවරණය යි.**

## 3 – 4 – 7

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

ධම්මානුධම්ම පටිපන්නස්ස භික්ඛුනො අයමනුධම්මො හොති වෙය්‍යාකරණාය, ධම්මානුධම්මපටිපන්නොයන්ති භාසමානො **ධම්මඤ්ඤෙව භාසති නො අධම්මං, විතක්කයමානො වා ධම්මවිතක්කඤ්ඤෙව විතක්කෙති නො අධම්මවිතක්කං,** තදුභයං අභිනිවජ්ජෙත්වා **උපෙක්ඛකො විහරති** සතො සම්පජානොති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති

ධම්මාරාමො ධම්මරතො ධම්මං අනුවිචින්තයං
ධම්මං අනුස්සරං භික්ඛු සද්ධම්මා න පරිහායති
චරං වා යදි වා තිට්ඨං නිසින්නො උද වා සයං
අජ්ඣත්තං සමයං චිත්තං සන්තිමෙවාධිගච්ඡතී'ති.

අයං හි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතංති

## 3 – 4 – 7

**අර්ථ:-**

**අනුධම්මො හොති,** අනුකූල ප්‍රතිපදාව වේ **වෙය්‍යාකරණාය,** ප්‍රකාශකිරීම පිණිස:

**ධම්මාරාමො,** සමථ විදර්ශනා ධර්මය වාසස්ථාන කොට ඇති; **ධම්මරතො,** ඒ සමථ විදර්ශනායෙහි ඇලුණාවූ; **ධම්මං අනුවිචින්තයං,** ඒ සමථ විදර්ශනා ධර්මය නැවත නැවත මෙනෙහි කරන්නාවූ; **ධම්මං අනුස්සරං,** එය නැවත නැවත සිහි කරන්නාවූ; **භික්ඛු,** මහණතෙම; **සද්ධම්මා න පරිහායති,** (සත්තිස් බෝධිපාක්ෂික නවලෝකොත්තරධර්මය යි කියන ලද) සද්ධර්මයෙන් නොපිරිහෙන්නේ'යි (ධ: පු: ස)

**චරං වා,** භික්ෂාචාර වශයෙන් හෝ සක්මන් කිරීම් වශයෙන් හැසිරෙමින් හෝ; **යදි වා,** නොහොත්; **තිට්ඨං,** සිටිමින් හෝ; **උදවා,** නොහොත්; **සයං,** සයනය කෙරෙමින් හෝ; **අජ්ඣත්තං,** යථොක්ත කර්මස්ථාන සංඛ්‍යාත

ගොචරජ්ඣත්තයෙහි; **චිත්තං,** තමාගේ සිත; **සමයං,** කෙලෙසුන් දුරු කිරීමෙන් සන්සිඳුවන්නාවූ යෝගාවචර තෙම; **සන්තිං එව,** අත්‍යන්ත ශාන්ත වූ නිවනට ම; **අධිගච්ඡති,** පැමිණෙයි.

භාවය සුගම යි.

**ධර්මවිස්තර:-**

**ධම්මානුධම්මපටිපන්න:-**

මෙහි 'ධර්මය' නම් නවලොකොත්තර ධර්මය යි. 'අනුධම්මය' නම් ඒ සඳහා පිළිපැදියයුතු ශීලවිශුද්ධි ආදි පූර්වභාගප්‍රතිපදා ධර්ම යි

**භාසමානො ධම්මං එව භාසෙය්‍ය:-**

ඉදින් කථාවක් කරන්නේ නම් දශකථාවස්තු නිශ්‍රිත වූ කථාවක් ම කරන්නේ ය, එයට විරුද්ධ කථාවක් නො කරන්නේ ය, යනු මෙයින් දක්වයි දශකථාව නම් **මජ්ඣිමනිකායෙහි** රථවිනීත සූත්‍රයෙහි සවිස්තරව සඳහන් වූ අප්පිච්ඡකථා, සන්තුට්ඨිකථා, පවිවෙකකථා, ආදි දශයයි. ධර්මයක් ම කීම, ධර්මවිතර්කයක් ඇතිව ම විසීම, මතුමත්තෙහි සීලාදි ගුණධර්මයන් පිරීමෙහි උත්සාහය තියුණුවනු පමණක් නොව විශෙෂභාගීය, නිබ්බෙධභාගීය ගුණයන්ට ද හේතු වන්නේ ය.

**සත්වන සූත්‍ර විවරණය යි**

## 3 – 4 – 8

**වුත්තං හෙතං භගවතා වුත්තං අරහතා ති මෙ සුතං**

තයො මෙ භික්ඛවෙ අකුසලවිතක්කා අන්ධකරණා අචක්ඛුකරණා අඤ්ඤාණකරණා පඤ්ඤානිරොධිකා විඝාතපක්ඛිකා අනිබ්බානසංවත්තනිකා.

කතමෙ තයො? **කාමවිතක්කො** භික්ඛවෙ අන්ධකරණො අචක්ඛුකරණො අඤ්ඤාණකරණො පඤ්ඤානිරොධිකො

විඝාතපක්ඛිකො අනිබ්බානසංවත්තනිකො, **ව්‍යාපාද-විතක්කො** භික්ඛවෙ අන්ධකරණො අචක්ඛුකරණො අඤ්ඤාණකරණො පඤ්ඤානිරොධිකො විඝාතපක්ඛිකො අනිබ්බානසංවත්තනිකො, **විහිංසාවිතක්කො** භික්ඛවෙ අන්ධකරණො අචක්ඛුකරණො අඤ්ඤාණකරණො පඤ්ඤානිරොධිකො විඝාතපක්ඛිකො අනිබ්බානසංවත්තනිකො, ඉමෙ ඛො භික්ඛවෙ තයො අකුසලවිතක්කා අන්ධකරණා අචක්ඛුකරණා අඤ්ඤාණකරණා පඤ්ඤානිරොධිකා විඝාතපක්ඛිකා අනිබ්බානසංවත්තනිකා.

තයො මෙ භික්ඛවෙ කුසලවිතක්කා අනන්ධකරණා චක්ඛුකරණා ඤාණකරණා පඤ්ඤාවුද්ධිකා අවිඝාතපක්ඛිකා නිබ්බාන සංවත්තනිකා.

කතමෙ තයො? **නෙක්ඛම්මවිතක්කො** භික්ඛවෙ අනන්ධකරණො චක්ඛුකරණො ඤාණකරණොපඤ්ඤාවුද්ධිකො අවි-ඝාතපක්ඛිකො නිබ්බානසංවත්තනිකො, **අව්‍යාපාදවිතක්කො** භික්ඛවෙ අනන්ධකරණො චක්ඛුකරණො ඤාණකරණො පඤ්ඤාකරණො පඤ්ඤාවුද්ධිකො අවිඝාතපක්ඛිකො නිබ්බාන සංවත්තනිකො, **අවිහිංසා විතක්කො** භික්ඛවෙ අනන්ධකරණො චක්ඛුකරණො ඤාණකරණො පඤ්ඤාවුද්ධිකො අවිඝාතපක්ඛිකො නිබ්බානසංවත්තනිකො, ඉමෙ ඛො භික්ඛවෙ තයො අකුසලවිතක්කා අනන්ධකරණා චක්ඛුකරණා ඤාණකරණා පඤ්ඤාවුද්ධිකා අවිඝාතපක්ඛිකා නිබ්බාන සංවත්තනිකා'ති –

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"තයො විතක්කෙ කුසලෙ විතක්කයෙ
තයො පන අකුසලෙ නිරාකරෙ
ස වෙ විතක්කානි විචාරිතානි
සමෙති වුට්ඨීව රජං සමූහතං
ස වෙ විතක්කූපසමෙන චෙතසා
ඉධෙව සො සන්තිපදං සමජ්ඣගා'ති.

## 3 - 4 - 8.

අයං හි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතං'ති.

අර්ථය:-

**අන්ධකරණා,** (තත්වඥානය වළක්වන හෙයින්) අන්ධබව ඇතිකරන්නාවූ; **අචක්ඛුකරණා,** ප්‍රඥාචක්ෂුස නැති කරන්නාවූ; **අඤ්ඤාණකරණා,** අඥානබව ඇතිකරන්නාවූ; **පඤ්ඤානිරොධිකා,** ප්‍රඥාව නැති කරන්නාවූ; (කම්මස්සකත, ඣාන, විපස්සනා සඞ්ඛ්‍යාත ත්‍රිවිධ ප්‍රඥාවන්ය යු සේ යි.) **විඝාතපක්ඛිකා,** දුඃඛ පක්ෂයෙහිවූ; **අනිබ්බානසංවත්තනිකා,** කෙලෙසුන් නිවීමට හේතු නොවූ; **ඉමෙ තයො අකුසල විතක්කා,** මේ අකුශල විතර්කයෝ තිදෙනෙකි; **කාම විතක්කො,** කාමප්‍රතිසංයුක්ත විතර්කය; (කෙලශකාමසහිතව වස්තුකාමයන්හි පවත්නා අයහපත් කල්පනාවය යු සේ යි;) **නෙක්ඛම්ම විතක්කො,** නෛෂ්ක්‍රම්‍ය විතර්කය;

සෙස්ස:- සුගම යි

**තයො කුසලෙ විතක්කෙ,** තුන් කුශලවිතර්කයන්; **විතක්කයෙ,** විතර්කණය කරන්නේ ය; **තයො අකුසලෙ පන,** තුන් අකුසල විතර්කයන් වනාහි; **නිරාකරෙ,** දුරු කරන්නේ ය; **සො,** ඒ යෝගාවචර තෙම; **වෙ,** ඒකාන්ත යෙන්; **විතක්කානි,** මිථ්‍යා විතර්කයන් ද; **විචාරිතානි,** තත් සම්ප්‍රයුක්ත විචාරයන් ද; **සමූහතං,** උඩට නැංගාවූ; **රජං,** ධූලිය; **වුට්ඨි,** වර්ෂාජලය; **සමෙති ඉව,** සන්සිඳුවන්නාක් මෙන් නැති කෙරේ ද (යම්සේ ග්‍රීෂ්මඍතුව පිළිබඳ පශ්චිම මාසයෙහි පොළොවෙහි නැංග දූවිල්ල මහත්වූ නොකල් වැස්සකින් නැති කෙරේ ද, එපරිද්දෙන් යොගාවචර තෙම මිථ්‍යාවිතර්ක මිථ්‍යාවිචාරයන් දුරුකෙරෙයි යනු ප්‍රකාශ කළ අයුරු යි) **සො,** හෙතෙම; **වෙ,** ඒකාන්ත යෙන්; **විතක්කූපසමෙන** මිථ්‍යා විතර්කයන් සන්සිඳුවන්නාවූ **චෙතසා,** ආර්‍යමාර්ගී චිත්තයෙන්; **ඉධ එව,** මේ ආත්මභාව යෙහිදීම; **සන්තිපදං,** නිර්වාණපදයට; **සමජ්ඣගා,** පැමිණියේ වෙයි; (නිවන් අවබෝධ කෙළේ ය යු සේ යි)

භාවය:- සුගම යි.

**ධම්මවිස්තර**:-

**කාමවිතක්ක - ව්‍යාපාදවිතක්ක - විහිංසාවිතක්ක**

**කාම විතර්කය** තෙමේ ප්‍රියමනාප සත්වසංස්කාරයන් අරමුණු කොටගෙන උපදී **ව්‍යාපාද විතර්කය** අප්‍රිය අමනාප සත්වසංස්කාරයන් කෙරෙහි කෝපය ඇතිනාක් පවතියි. **විහිංසා විතර්කය**, සත්වයන් කෙරෙහිමුත් සංස්කාරයන් කෙරෙහි නූපදියි. "මේ සත්වයෝ නැසෙත්වා! වධයට, විනාශයට යෙත්වා" යි දුෂ්ටසිතින් සිතන කල්හි සත්වයන් අරමුණු කොට ගෙන ඇති වෙයි.

එහෙයින් අතින් හෝ ගලෙකින් හෝ දඬු මුගුරු ආදි යමකින් හෝ සත්වයන් වෙහෙසීමට හෝ දුකට පැමිණ වීමෙහිදී විහිංසාවිතර්කය වෙයි. කාමධාතුව ගත්කල්හි අනික් දෙකත් එයට ගැනෙන නමුත් මෙහි වෙන් කොට තුනක් කියනලද්දේ සියල්ලම ඇතුළත් කිරීම් වශයෙනි.

**නෙක්ඛම්ම විතක්ක - අව්‍යාපාද - අවිහිංසා විතක්ක**

**නෛෂ්ක්‍රම්‍යය** වනාහි ප්‍රථමධ්‍යානය, ප්‍රව්‍රජ්‍යාය, විමුක්තිය, විදර්ශනාය, සියලු කුශලධර්මය යන මෙතෙක් අර්ථයන් හි යෙදේ යි. නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිසංයුක්ත විතර්කය අසුභභාවනාවගේ පූර්වභාග අවස්ථායෙහි කාමාවචර ද, අසුභධ්‍යානයෙහි රූපාවචර ද, එය පාදක කොට උපදනා මාර්ගඵලාවස්ථායෙහි ලොකොත්තර ද වන්නේ ය එසේ ම **අව්‍යාපාදවිතර්කය** මෛත්‍රිධ්‍යානයට පූර්වභාගයෙහි කාමාවචර ද, මෛත්‍රී ධ්‍යානාවස්ථානයෙහි රූපාවචර ද, එය පාදක කොට උපදනා මාර්ගඵලාවස්ථායෙහි ලොකොත්තර ද, වේ. **අවිහිංසාවිතර්කය** කරුණාභාවනාවගේ පූර්වභාගයෙහි කාමාවචර ද, කරුණාධ්‍යානයෙහි රූපාවචර ද, එය උදවු කොටගෙන උපදනා මාර්ගඵලාවස්ථායෙහි ලොකොත්තර ද වේ.

**අටවන සූත්‍ර විවරණය සී**

## 3 - 4 - 9

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

තයො මෙ භික්ඛවෙ අන්තරා මලා, අන්තරා අමිත්තා, අන්තරා සපත්තා, අන්තරා වධකා, අන්තරා පච්චත්ථිකා,

කතමෙ තයො? **ලොභො** භික්ඛවෙ අන්තරා මලො, අන්තරා අමිත්තො, අන්තරා සපත්තො, අන්තරා වධකො, අන්තරා පච්චත්ථිකො. **දොසො** භික්ඛවෙ අන්තරා මලො, අන්තරා අමිත්තො, අන්තරා සපත්තො, අන්තරා වධකො, අන්තරා පච්චත්ථිකො. **මොහො** භික්ඛවෙ අන්තරා මලො, අන්තරා අමිත්තො, අන්තරා සපත්තො, අන්තරා වධකො, අන්තරා පච්චත්ථිකො. ඉමෙ ඛො භික්ඛවෙ තයො අන්තරා මලා, අන්තරා අමිත්තා, අන්තරා සපත්තා, අන්තරා වධකා, අන්තරා පච්චත්ථිකා'ති

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති

“අනත්ථජනනො ලොභො ලොභො චිත්තප්පකොපනො
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති
ලුද්ධො අත්ථං න ජානාති ලුද්ධො ධම්මං න පස්සති
අන්ධන්තමං තදා හොති යං ලොභො සහතෙ නරං
යො ච ලොභං පහන්ත්වාන ලොභනෙය්‍යෙ න ලුබ්භති
ලොභො පහීයතෙ තම්හා උදබින්දුව පොක්ඛරා
අනත්ථජනනො දොසො දොසො චිත්තප්පකොපනො
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති
දුට්ඨො අත්ථං න ජානාති දුට්ඨො ධම්මං න පස්සති
අන්ධන්තමං තදා හොති යං දොසො සහතෙ නරං
යො ච දොසං පහන්ත්වාන දොසනෙය්‍යෙ න දුස්සති
දොසො පහීයතෙ තම්හා තාලපක්කංව බන්ධනා
අනත්ථජනනො මොහො මොහො චිත්තප්පකොපනො
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති
මූළ්හො අත්ථං න ජානාති මූළ්හො ධම්මං න පස්සති

අන්ධංතමං තදා හොති යං මොහො සහතෙ නරං
යො ච මොහං පහන්ත්වාන මොහනෙය්‍යෙ න මුය්හති
මොහං විහන්ති සො සබ්බං ආදිච්චොවුදයං තම'න්ති

අයං පි අත්‍ථො වුත්තො භගවතා ඉති මෙ සුත්තං ති

3 – 4 – 9.

**අර්ථය :–**

**අන්තරා මලා,** අභ්‍යන්තර මලයෝ; **අමිත්තා,** අමිත්‍රයෝ; **සපත්තා,** සතුරෝ; **වධකා,** වධකරන්නෝ; **පච්චත්‍ථිකා,** විරුද්ධකාරයෝ;

**ලොභො,** ලෝභය තෙම; **අනත්‍ථජනනො,** අනර්ථය උපදවන්නේ ය; **ලොභො,** ලොභය තෙම; **චිත්තපකොපනො,** සිත කලඹ වන්නේ ය; **අන්තරතො ජාතං,** ඇතුළත උපන්නාවූ; **තං භයං,** ඒ බියට හේතුව; **ජනො,** අඥාන මහාජන තෙමේ; **න අවබුජ්ඣති,** නොදනී;

**ලුද්ධො,** ලොභී පුද්ගල තෙම; **අත්‍ථං න ජානාති,** අර්ථය නොදනී; **ලුද්ධො,** ලොභී පුද්ගල තෙම; **ධම්මං න පස්සති**, ධර්මය නොදකී; **ලොභො,** ලොභය තෙම; **යං නරං,** යම් මිනිසකු; **සහතෙ,** මඩී ද; **තදා,** එකල්හි; **අන්ධංතමං හොති,** අන්ධකාරාත්මක වේ

**යො,** යමෙක්; **ලොභං,** ලොභය; **පහන්ත්වාන**, දුරු කොට; **ලොභනෙය්‍යෙ,** ලොභ කටයුතු දෙයෙහි; **නලුබ්භති,** නො ඇලේ ද; **පොක්ඛරා,** නෙළුම් කොළයෙන්; **උදබින්දු ඉව** දියබිඳුවක් මෙන්; **තම්හා,** ඔහු කෙරෙන්; **ලොභො,** ලොභය තෙම; **පහීයතෙ,** දුරුවෙයි;

**බන්ධනා තාලපක්කං ඉව,** නටුවෙන් ගැලවුණු තල් ගෙඩියක් මෙන්; **උදයං,** උදාවන්නාවූ; **ආදිච්චො,** හිරු; **තමං ඉව,** අඳුර දුරු කරන්නාක් මෙනි:

**සෙස්සං:–** සුගම යි.

**නවවන සූත්‍ර විවරණය යි.**

## 3 - 4 - 10

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

තීහි භික්ඛවෙ අසද්ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

කතමෙහි තීහි? **පාපිච්ඡතාය** භික්ඛවෙ අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො, **පාපමිත්තතාය** භික්ඛවෙ අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො, සති ඛො පන උත්තරිකරණීයෙ ඔරමත්තකෙන විසෙසාධිගමෙන **අන්තරා වොසානං ආපාදිති** ඉමෙහි ඛො භික්ඛවෙ තීහි අසද්ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡොති

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"මා ජාතු කොචි ලොකස්මිං පාපිච්ඡො උපපජ්ජතු
තදමිනාපි ජානාථ පාපිච්ඡානං යථාගති
පණ්ඩිතොති සමඤ්ඤාතො භාවිතත්තො'ති සම්මතො
ජලංව යසසා අට්ඨා දෙවදත්තො'ති මෙ සුතං
සො සමාන මනුචිණ්ණො ආසජ්ජ නං තථාගතං
අවීචිනිරයං පත්තො චතුද්වාරං භයානකං
අදුට්ඨස්ස හි යො දුබ්භෙ පාපකම්මං අකුබ්බතො
තමෙව පාපං ඵුසති දුට්ඨචිත්තං අනාදරං
සමුද්දං විසකුම්භෙන යො මඤ්ඤෙය්‍ය පදූසිතුං
න සො තෙන පදූසෙය්‍ය තස්මා හි උදධී මහා
එවමෙව තථාගතං යො වාදෙන විහිංසති
සම්මග්ගතං සන්තචිත්තං වාදො තම්හි න රූහති
තාදිසං මිත්තං කුබ්බෙථ තඤ්ච සෙවෙය්‍ය පණ්ඩිතො
යස්ස මග්ගානුගො භික්ඛු ඛයං දුක්ඛස්ස පාපුණෙති.

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතං'න්ති

**චතුත්ථො වග්ගො**

තස්සුද්දානං

විතක්කා සක්කාර සද්ද චවමාන ලොකෙ
අසුභධම්ම අන්ධකාරමලං දෙවදත්තොති තෙ දසාති

## 3 - 4 - 10

**අර්ථය:-**

**තීහි අසද්ධම්මෙහි,** තුන් අසත්පුරුෂ කාරණයන් හේතු කොටගෙන; **අතෙකිච්ඡො,** පිළියම් නොකළ හැකි; **පාපිච්ඡතාය,** පාපිෂ්ට බැවින්; **පාපමිත්තතාය,** පවිටු මිතුරන් ඇති බැවින්; **උත්තරිං කරණීයෙ,** මත්තෙහි කටයුතු වූ දෙය; **සති එව,** ඇති කල්හි ම; (තමන් ලැබූ ධ්‍යානාභිඥාවන්ගෙන් මත්තෙහිදු ලැබියයුතු මාර්ගඵලාධිගමය ඇති කල්හිදු එයට නො පැමිණ ම යූ සේ යි) **ඔරමත්තකො,** ස්වල්පමාත්‍ර වූ, **විසෙසාධිගමෙන** උත්තරිමනුෂ්‍ය ධර්මාධිගමයෙන් (ධ්‍යානාභිඥමාත්‍රයෙන් ම යනු යි) **අන්තරා,** අතරතුර; **වොසානං ආපාදි,** අවසානයට පැමිණියේ ය; (කෘතකෘත්‍ය නැත්තෙක්ව ම ශාසන කටයුතු අවසන් කෙළේ යයි සිතූ දෙවදත්තස්ථවිර තෙමේ ශ්‍රමණධර්මයෙන් පිරිහුණේ ය යනු මෙයින් ප්‍රකාශ කෙරේ යි)

**ලොකස්මිං,** ලෝකයෙහි; **ජාතු,** කිසිකලෙකත්; **කොචි පාපිච්ඡො,** කිසිම පාපිෂ්ටයෙක්; **මා උපපජ්ජතු,** නො උපදීවා; **පාපිච්ඡානං,** පාපිෂ්ටයන්ගේ; **යථාගති,** යම් බඳු ගතියක් වේ ද; **තං,** එය; **ඉමිනාපි,** (දෙවදත්ත ස්ථවිරයන් නිදර්ශනය කොට ගත්) මේ කාරණයෙනුදු; **ජානාථ,** දනිව්; **පණ්ඩිතො ඉති සමඤ්ඤාතො,** (පර්‍යාප්ති බහුශ්‍රුතත්වයෙන්) පණ්ඩිතයෙක් යයි ප්‍රසිද්ධ වූ; **භාවිතත්තො ඉති,** (ධ්‍යානාභිඥා ගුණ වලින්) වැඩූ සිත් ඇත්තෙකැ යි; **සම්මතො,** පිළිගත්; **දෙවදත්තො,** දෙවදත්ත ස්ථවිරතෙම; **යසසා,** කීර්තියෙන්; **ජලං ඉව,** දීප්තිමත්වූවකු මෙන්; **අට්ඨා ඉති,** සිටියේ යයි; **මෙ සුතං,** මවිසින් අසන ලදී; (පෙර දම්සෙනෙවි සැරියුත් මහරහතන් වහන්සේ විසිනුදු දෙවදත්ත ස්ථවිරතෙමේ මහත් සෘද්ධි ඇත්තෙක, මහත් ආනුභාව ඇත්තෙකැ යි ප්‍රශංසා කරන ලද්දේ ය යනු දක්වූ අයුරු යි.)

**සො**, හෙතෙම; **සමානමනුවිඤ්ඤා**, (භාග්‍යවතුන් වහන්සේ හා මම ද සමාන වෙමි යි යන) මානාධ්‍යාශය පුරුදු කරන ලද්දේ; **තං තථාගතං**, ඒ තථාගතයන් වහන්සේට; **ආසජ්ජ**, සටා; (නොහොත් ඒ තථාගතයන් වහන්සේ වෙහෙසට පමුණුවා ය යුසේ යි **චතුද්වාරං**, සතර දෙරටුවක් ඇති; **භයානකං**, බිහිසුණු වූ, **අවීචිනිරයං**, අවීචිමහානරකයට; **පතෙතා**, පැමිණියේ ය; (පමාද මනු- විඤ්ඤා යි ද පාඨ යි.)

**යො**, යමෙක්; **අදුට්ඨස්ස**, දූෂිත නොවූ සිත් ඇති; **පාපකම්මං අකුබ්බතො**, පව්කම් නො කරන්නකුට; **දුබ්භෙ**, ද්‍රෝහී වන්නේ ද; **දුට්ඨචිත්තං**, නපුරු සිත් ඇති; **අනාදරං**, දයාවක් නැති; **තං එව**, ඒ ද්‍රොහී පුද්ගලයා ම; **පාපං**, තමන් කළ පාපකර්මය; **ඵුසති**, සපශී කෙරෙයි

**යො**, යමෙක්; **විසකුම්භෙන**, විෂ පිරූ කළයකින්; **සමුද්දං**, මුහුද; **පදූසිතුං**, දූෂණය කරන්ට; **මඤ්ඤෙය්‍ය**, සිතන්නේ වේ ද; **සො**, ඒ සාගරය තෙමේ; **තෙන**, එයින්; **න පදූසෙය්‍ය**, දූෂණය නොවන්නේ ය; **හි**, යම් හෙයකින්; **උදධි**, සාගරය; **මහා**, මහත් වූයේ ද; **තස්මා**, එහෙයිනි.

**එවමෙව**, මෙපරිද්දෙන් ම; **යො**, යමෙක්; **තථාගතං**, තථාගතයන් වහන්සේ; **වාදෙන**, වෛරයෙන්; **විහිංසති**, මඩී ද; **වාදො**, (ඔහුගේ) ඒ වාදය තෙම; **සම්මග්ගතං**, යහපත් මාර්ගයෙහි ගමන් කළා වූ; **සන්තචිත්තං**, ශාන්තවූ සිත් ඇති; **තම්හි**, උන්වහන්සේ කෙරෙහි; **න රූහති**, නොවැඩෙ යි නොහොත් පිහිටා නො සිටි යි;

**යො භික්ඛු**, යම් භික්ෂුවක් තෙම; **මග්ගානුගො අස්ස**, ධර්මානුධර්ම ප්‍රතිපත්ති මාර්ගයෙහි ගමන් කරන්නේ වේ ද; **තාදිසං**, එබන්දකු; **මිත්තං කුබ්බෙථ**; මිත්‍රයකු කරන්නේය; **පණ්ඩිතො**, ඥානවන්ත තැනැත්තේ; **තං**, එබන්දකු; **සෙවෙය්‍ය**, ඇසුරු කරන්නේ ය; (හෙතෙම) **දුක්ඛස්ස**, සංසාර දුඃඛයාගේ; **ඛයං**, විනාශයට; **පාපුණෙ**, පැමිණෙන්නේ ය;

**භාවය:-** සුගම යි

**ධම්විස්තර:-**

මෙය අට්ඨුප්පත්තික දේශනාවකි. කරුණක් එළඹ සිටි තැන දෙශනා කරන ධර්මය අට්ඨුප්පත්තික නම් වේ. මෙසේ පව්කම් කළ දෙව්දත්හු අවීචිමහානරකයට පිවිසි කල්හි දෙවදත්ත පාක්ෂිකයෝත් අන්‍ය තීර්ථකයෝත් ශ්‍රමණ භවත් ගෞතමයා විසින් ශාප කරන ලද දෙව්දත් තෙම පොළොව පළාගෙන අවීචියට ගෙන ගියේ ය යි දෙෂාරොපණ කථාවක් ඇතිකළහ. ඒ ඇසූ බුදුසස්නෙහි නො පහන් මිනිස්සු මොවුන් කියන කථාව ඇත්තක් ද නැත්තක් දැ යි සැක ඉපදවූහ. භික්ෂූහු එපවත් භාග්‍යවතුන් වහන්සේට සැලකළහ.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මහණෙනි! බුදුවරයෝ නම් කිසිවකුටත් ශාප නොකෙරෙති. එහෙයින් මවිසින් දෙව්දත් තෙරුණුවන්ට ශාප නොකරන ලද්දේ ය. තමා විසින් ම තමාට ශාප කරගනු ලැබ කළ පාපකර්මයෙන් නිරයට ගියේ ය යි වදාරා ඒ මිනිසුන්ගේ මිථ්‍යාග්‍රාහය දුරු කරනු සඳහා මේ සූත්‍රය වදාළ සේක.

**සො සමානමනුචිණ්ණො :-**

දෙව්දත්හුගේ මානසහගත කල්පනාව මෙබඳු විය. බුදුනුත් ශාක්‍ය පුත්‍රයෙක, මම ද ශාක්‍ය පුත්‍රයෙක් වෙමි. බුදුනුත් සෘද්ධි ඇත්තෙක, මම ද සෘද්ධි ඇත්තෙක් වෙමි. බුදුනුත් දිවැස් ඇත්තෙක, මම ද දිවැස් ඇත්තෙක්මි. බුදුනුත් දිව්‍යශ්‍රොත්‍රයක් ඇත්තෙක, මම ද දිවකණ ඇත්තෙක් වෙමි. බුදුනුත් අනුන්ගේ සිත් දන්නා නුවණ ඇත්තෙක, මම ද අනුන්ගේ සිත් දන්නා නුවණ ඇත්තෙක් වෙමි. බුදුනුත් තුන්කල් දන්නෙක. මම ද තෙකල් දනිමි. මෙසේ තමන්ගේ පමණ නොදන්න තෙමේ භාග්‍යවතුන්වහන්සේ හා සමත්වයෙන් සලකමින් දැන් මම බුදුවන්නෙමි, එසේවූ මට භික්ෂුසංඝයා ද පරිහරණය කළහැකි යයි අභිමාන පරවශව සර්වඥයන් වහන්සේ කෙරෙහි උපදවා ගත් බද්ධවෛරයෙන් ධ්‍යානාභිඥවන්ගෙන් ද පිරිහී අවීචිමහානරකයට ගියේ ය.

**දසවන සූත්‍ර විවරණය යි**

**සතරවන වර්ගය නිමි**

## පඤ්චමො වග්ගො

### 3 - 5 - 1

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

තයො මෙ භික්ඛවෙ අග්ගප්පසාදා, කතමෙ තයො? යාවතා භික්ඛවෙ සත්තා අපදා වා ද්විපදා වා චතුප්පාදා වා බහුප්පදා වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤි නාසඤ්ඤිනො වා තථාගතො තෙසං අග්ගමක්ඛායති යදිදං අරහං සම්මාසම්බුද්ධො, යෙ භික්ඛවෙ **බුද්ධෙ පසන්නා** අග්ගෙ තෙ පසන්නා, අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.

යාවතා භික්ඛවෙ ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා විරාගො තෙසං අග්ගමක්ඛායති; යදිදං මදනිම්මදනො පිපාස විනයො ආලයසමුග්ඝාතො වට්ටූපච්ඡෙදො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං, යෙ භික්ඛවෙ **විරාගෙ ධම්මෙ** පසන්නා; අග්ගෙ තෙ පසන්නා, අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති

යාවතා භික්ඛවෙ සඞ්ඝා වා ගණා වා තථාගතසාවක සඞ්ඝො තෙසං අග්ගමක්ඛායති; යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨපුරිසපුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලි කරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස, යෙ භික්ඛවෙ **සඞ්ඝෙ පසන්නා** අග්ගෙ තෙ පසන්නා; අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති ඉමෙ ඛො භික්ඛවෙ තයො අග්ගප්පසාදාති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති-

"අග්ගතො වෙ පසන්නානං අග්ගං ධම්මං විජානතං
අග්ගෙ බුද්ධෙ පසන්නානං දක්ඛිණෙය්‍යෙ අනුත්තරෙ
අග්ගෙ ධම්මෙ පසන්නානං විරාගූපසමෙ සුඛෙ
අග්ගෙ සඞ්ඝෙ පසන්නානං පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ

අග්ගස්මිං දානං දදතං අග්ගං පුඤ්ඤං පවඩ්ඪති
අග්ගං ආයු ච වණ්ණො ච යසො කිත්ති සුඛං බලං
අග්ගස්ස දාතා මෙධාවී අග්ගධම්ම සමාහිතො
දෙවභූතො මනුස්සො වා අග්ගප්පත්තො පමොදතී'ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති

**පස් වෙනි වර්ගය.**

**3 - 5 - 1.**

අර්ථය :-

**අග්ගප්පසාදා,** අග්‍රවූ ප්‍රසාදයෝ; **අපදා වා,** පා නැත්තාවූ හෝ; **ද්විපදා වා,** දෙපා ඇත්තාවූ හෝ; **රූපිනො වා,** රූප වත්වූ හෝ; **අරූපිනො වා,** අරූපීවූ හෝ; **සඤ්ඤිනො වා,** සංඥා ඇත්තාවූ හෝ; **අසඤ්ඤිනො වා,** සංඥා නැත්තාවූ හෝ; **නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා,** නෛවසංඥා නාසංඥා ඇත්තාවූ හෝ; **යාවතා සත්තා,** යම්පමණ සත්වයෝ වෙත් ද, **මදනිම්මදනො,** මදයන් දුරුකරන්නාවූ; **පිපාසවිනයො,** කාමපිපාසාදීන් දුරු කරන්නාවූ; **ආලය සමුග්ඝාතො,** තණ්හාව නසන්නාවූ; **වට්ටූපච්ඡෙදො,** සසර පැවැත්ම නැති කරන්නාවූ; **තණ්හක්ඛයො,** තෘෂ්ණාක්ෂයවූ; **විරාගො,** නො ඇල්ම ඇතිකරන්නාවූ; **නිරොධො,** තෘෂ්ණා නිරෝධයවූ; (මේ සියල්ල ම නිවනට පර්‍යාය වචන යි.)

**චත්තාරි පුරිසයුගානි,** පුරුෂයුගල වශයෙන් සතරක්වූ **අට්ඨපුරිස පුග්ගලා,** පුරුෂ පුද්ගල වශයෙන් අටක්වූ; **ආහුණෙය්‍යා,** ඈත සිට නමුත් ගෙනවුත් පිළිගන්වන ප්‍රත්‍යය ලැබීමට සුදුසු ය; **පාහුණෙය්‍යා,** නානා දිසාභාග වලින් අවුත් පුදන ප්‍රත්‍යය ලැබීමට සුදුසු ය; **දක්ඛිණෙය්‍යා,** පරලොව අදහා දෙන දක්ෂිණා පිළිගැනීමට සුදුසු ය; **අඤ්ජලිකරණීයො,** දෑත් ඔසවා වැඳීමට සුදුසු ය; **ලොකස්ස,** ලෝවැස්සාට; **අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං,** උතුම් පින් කෙතක් වේ;

**වෙ**, ඒකාන්තයෙන්; **අග්ගතො**, අග්‍රවූ රත්නත්‍රය කෙරෙහි; **පසන්නානං**, පහන්වූ; **අග්ගං ධම්මං**, අග්‍රවූ ස්වාක්ඛාතතාදි ධර්මය; **විජානතං**, දන්නවුන්ට; **දක්ඛිණෙය්‍යෙ**, දක්ෂිණාර්හවූ; **අනුත්තරෙ**, උතුම්වූ; **අග්ගෙ බුද්ධෙ**, ලොකොත්තමවූ තථාගතයන් වහන්සේ කෙරෙහි; **පසන්නානං**, පහන්වූවන්ට;

**විරාගුපසමෙ**, විරාග උපසම දෙකට හේතුවූ; ('විරාගය' නම් තණ්හාව දුරුකිරීම යි. 'උපසමය' නම් සියලු කෙලෙසුන් සන්සිඳුවීම යි) **සුඛෙ**, සැපවූ; **අග්ගෙ ධම්මෙ**, අග්‍රවූ නිර්වාණධර්මය කෙරෙහි; **පසන්නානං**, පහන්වූවන්ට; **පුඤ්ඤක්ඛෙත්තෙ**, පින්කෙතක්වූ; **අනුත්තරෙ**, උතුම්වූ; **අග්ගෙ සඞ්ඝෙ** ආර්‍ය්‍ය සංඝයා කෙරෙහි; **පසන්නානං**, පහන් වූවන්ට; (අග්‍රවූ විපාකයෙක් වේ යනු යි)

**අග්ගස්මිං**, අග්‍රවූ රත්නත්‍රය කෙරෙහි; **දානං දදතං**, දන් දෙන්නවුන්ට; **අග්ගං පුඤ්ඤං**, අග්‍රවූ පිනක්; **පවඩ්ඪති**, වැඩෙයි; **අග්ගං**, අග්‍රවූ; **ආයු ච**, ආයුෂය ද; **වණ්ණො ච**, වර්ණය ද; **යසො**, යසස ද; **කිත්ති**, කීර්තිය ද; **සුඛං**, සැපය ද; **බලං**, ශක්තිය ද; (යන මේ සියල්ලත් වැඩේ)

**අග්ගධම්මසමාහිතො**, අග්‍රවූ ශ්‍රද්ධා ශීලාදි ගුණධර්මයෙන් යුක්තවූ; **අග්ගස්ස**, අග්‍රවූ රත්නත්‍රයට; **දාතා**, පරිත්‍යාග කරන්නාවූ; **මෙධාවී**, ඥානවන්තතෙම; **දෙවභූතො**, දෙවි යෙක් වූයේ හෝ; **මනුස්සො වා**, මිනිසෙක් වූයේ හෝ; **අග්ගප්පත්තො**, (යම් යම්තැනෙක උපන්නේ වී නම් ඒ ඒ ආත්මභාවයන්හි) අග්‍රබවට පැමිණියේ; **පමොදති**, (දෙවි මිනිසුන් අතරෙහි) සතුටුවෙයි. නොහොත් **අග්ගප්පත්තො** ලොකොත්තර මාර්ගඵලාධිගමයට පැමිණියේ; **පමොදති**, වෙසෙසින් සතුටුවෙයි.

**භාවය:–** සුගම යි.

**ධර්මවිස්තර :-**

**අඟ්ගස්මිං දානං දදතං,**

අග්‍රවූ රත්නත්‍රය කෙරෙහි දෙය ධර්මය කෙසේ පරිත්‍යාග කෙරේ ද යත්? භාග්‍යවත්හු ජීවමාන කල්හි ම සිවුපසයෙන් උපස්ථානකිරීම ය. පිරිනිවිකල්හිදු සධාතුක චෛත්‍යයන්ට පිදීම ය. යන මේ වශයෙන් **බුද්ධනට පූජා** කෙළේ නම් වේ. ධර්මධර ධර්මකථික බහුශ්‍රැත භික්ෂූන්ට පිදීම හා ධර්මය චිරස්ථායිව පවත්නා පරිද්දෙන් බණපොත් ලියවීමද, ධර්මදානය වශයෙන් බණ පොත් විසුරුවා හැරීම ද, **ධර්මපූජා** නම් වේ. ආර්‍ය සංඝරත්නයට සිවුපසයෙන් පිදීම හා ආර්‍ය සංඝරත්න යෙහි ගුණ සලකා ආර්‍ය භාවය සඳහා පිළිවෙත් පුරන සම්මුති සංඝයාට පිදීම ද **සංඝපූජා** නම් වේ යයි දතයුතු.

**පළමුවන සූත්‍ර විවරණය යි.**

## 3 – 5 – 2

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං**

අන්තමිදං භික්ඛවෙ ජීවිකානං යදිදං පිණ්ඩොල්‍යං, අභිසාපොයං භික්ඛවෙ ලොකස්මිං පිණ්ඩොලො විචරසි පත්තපාණීති, තඤ්ච ඛො එතං භික්ඛවෙ කුලපුත්තා උපෙන්ති අත්ථවසිකා අත්ථවසං පටිච්ච, නෙව රාජාභිනීතා න චොරාභිනීතා න ඉණට්ටා න භයට්ටා න ආජීවිකපකතා. අපිච ඛො ඔතිණ්ණම්හා ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි දුක්ඛො තිණ්ණා දුක්ඛපරෙතො, අප්පෙවනාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථාති.

එවං පබ්බජිතො චායං භික්ඛවෙ කුලපුත්තො හොති; අභිජ්ඣාලු කාමෙසු තිබ්බසාරාගො බ්‍යාපන්නචිත්තො පදුට්ඨමනසංකප්පො මුට්ඨස්සති අසම්පජානො අසමාහිතො විබ්භන්තචිත්තො පාකතින්ද්‍රියො, සෙය්‍යථාපි භික්ඛවෙ ඡවාලාතං උභතො පදිත්තං මජ්ඣෙ ගූථගතං නෙව ගාමෙ

**කටඨත්ථං** එරති න අරඤ්ඤෙ, තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි; **ගිහිභොගා ච පරිහීනො සාමඤ්ඤත්ථඤ්ච න පරිපූරෙති ති**.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති

"ගිහිභොගා ච පරිහීනො සාමඤ්ඤත්ථඤ්ච දුබ්භගො
පරිධංසමානො පකිරෙති ඡවාලාතංව නස්සති
සෙය්‍යා අයොගුළො භුත්තො තත්තො අග්ගිසිඛූපමො
යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො රට්ඨපිණ්ඩං අසඤ්ඤතොති

අයං පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතං ති

## 3 – 5 – 2.

**අර්ථය :—**

**යදිදං,** යම් මේ; **පිණ්ඩොලෙ‍ය්‍යං,** පිණ්ඩපයෙෂණයෙන් කරනු ලබන ජීවිකාවෘත්තියක් වේ ද; **ඉදං,** මෙය; **ජීවිකානං,** ජීවිකාවන් අතුරෙන්; **අන්තං,** ලාමක ය; **ලොකස්මිං,** ලෝක යෙහි; **පිණ්ඩොලො,** පිඬුසිඟනු කැමැතිව; **පත්තපාණි,** පාත්‍රයක් ගත් අත් ඇති ව; **විචරසි ඉති,** හැසිරෙන්නෙහි යයි; **අභිසාපො,** (මේ කිපුණු සිත් ඇති මිනිසුන්ගේ) ආක්‍රොශයෙකි; **තඤ්ච ඛො එතං,** (නින්දිත මිනිසුන්ගේ පරිභවයට පාත්‍රවූ) ඒ මේ පිණ්ඩොල්‍යය; **අත්ථවසිකා,** ලෞකික ලොකොත්තර අර්ථසිද්ධිය අපෙක්ෂා කරන්නාවූ; **කුලපුත්තා,** ශාසනික කුලපුත්‍රයෝ; **අත්ථවසං පටිච්ච,** එම උභයාර්ථය සඳහා; **උපෙන්ති,** පැමිණෙත්; (අත්තවසිකා අත්තවසං පටිච්ච'යි ද පාඨයි) **නෙව රාජාභිනීතා,** රජුන් විසින් බන්ධනාගාරයට පමුණුවන ලද්දෝ නොවෙති; **න චොරාභිනීතා,** සොරුන් විසින් මරණයට පමුණුවනු ලද්දෝ නොවෙති; **න ඉණට්ටා,** ණයෙහි බැඳී සිටින්නෝ නොවෙති; **න භයට්ටා,** බියගැනිවූවෝ නොවෙති; **න ආජීවිකාපකතා,** දිවිපැවැත්ම පමණක් සලකන්නෝ නොවෙති; **දුක්ඛොතිණ්ණා,** දුකෙහි ගැලුණමෝ; (දුක්ඛාභිකිණ්ණා යනු ද පාඨ යි) **දුක්ඛපරෙතා,** දුකින් පෙළුණමෝ;

**ඔතිණ්ණම්හා**, සසරදුකෙහි අවතීර්ණවූවෝ වෙමු; **අභිජ්ඣාලූ**, විෂමලෝභ බහුල කොට ඇතිව; **තිබ්බසාරාගො**, බහල රාගය ඇතිව; **ව්‍යාපන්නචිත්තො**, ක්‍රෝධයෙන් මැඩුණු සිත් ඇතිව; **පදුට්ඨමනසංකප්පො**, ප්‍රදුෂ්‍ය සිත් ඇතිව; **මුට්ඨස්සති**, හරනාලද සිහි ඇතිව; **අසම්පජානො**, නුවණ නැතිව; **අසමාහිතො**, එකඟවූ සිත් නැතිව; **විබ්භන්තචිත්තො**, භ්‍රාන්තවූ සිත් ඇතිව; **පාකතින්ද්‍රියො**, අසංවරවූ ඉන්ද්‍රිය ඇතිව; **එවං පබ්බජිතො හොති**, මෙසේ පැවිද්දෙක් වූයේ ද; **උභතො පදිත්තං**, දෙකොණෙහි ගිනි ඇවිලුණු; **මජ්ඣෙ ගූථගතං**, මැද අශුචි තැවරුණු; **ඡවාලාතං**, ගිනි පෙනෙල්ලක්; **සෙය්‍යථාපි**, යම් සේ; **ගාමෙ**, ගමෙහි; **කට්ඨත්ථං**, කාෂ්ටයක් පිණිස; **නෙව ඵරති**, යොදනු නොහැකි වේ ද; **අරඤ්ඤෙ**, වනයෙහි; **න**, නොහැකි වේ ද; **තදූපමං**, එබඳු ය යි; **ගිහිභොගා ච**, ගිහි සැපතින් ද; **පරිහීනො**, පිරිහුණේ ය; **සාමඤ්ඤත්ථං ච**, ශ්‍රාමණ්‍යඵලය ද; **න පරිපූරෙති**, සම්පූර්ණ නොකෙරෙයි.

**ගිහිභොගා ච**, ගිහි සැපතින් ද; **පරිහීනො**, පිරිහුණා වූ; **සාමඤ්ඤත්ථං ච**, ශ්‍රමණගුණධර්ම පිරිහීම සඳහා ද; **දුබ්භගො**, අභාග්‍ය සම්පන්න වූ; (ඒ පුද්ගල තෙම) **පරිධංසමානො**, ගුණවිනාශ ඇත්තෙක්ව; **පකිරෙති**, වැනසෙයි; **ඡවාලාතං ඉව**, යථොක්ත ගිනිපෙනෙල්ල මෙන්; **නස්සති**, නසියි;

"**දුස්සීලො**, හීනසීල හෙයින් සිල් නැත්තාවූ; **අසඤ්ඤතො**, කාය වාක් සංයම රහිතවූ පුද්ගල තෙම; **රට්ඨපිණ්ඩං**, රටවැස්සන් විසින් සැදැහැයෙන් දෙනලද ආහාර; **ච**, ඉදින්; **භුඤ්ජෙය්‍ය**, (මමත් ශ්‍රමණයෙමි යි ප්‍රතිඥා කොට) වළඳන්නේ වේ ද; (එයට වඩා) **තත්තො**, දිලිසුණාවූ; **අග්ගිසිඛූපමො**, ගිනිසිළක් වැනිවූ; **අයොගුළො**, යවට; **භුත්තො**, වළඳනාලද්දේ; **සෙය්‍යො**, උත්තම යි; (කුමක් හෙයින් ද යත්? ලෝගුළි ගිලූ පසයෙන් එකම අත්බැවෙකැ දන්නේ යැ. දුශ්ශීලයා වනාහි ශ්‍රද්ධාදෙයවූ අහර වළඳා නොයෙක් ජාති ශතසහස්‍රයෙහි නරකයෙහි පැසෙන්නේ යැ. එහෙයිනි" ධ: පු: ස:)

**ධම්මවිත්‍ථාරයෙන්** භාවය ද, පැහැදිලි වෙයි.

මෙය ද අට්ඨුප්පත්තික දේශනාවකි. අප භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පුර සමීපයෙහි **නිග්‍රෝධාරාමයෙහි** වැඩ වසනකල්හි නේවාසිකභික්ෂූන් ආගන්තුකව පැමිණි භික්ෂූන්ට සෙනසුන් පිළියෙළ කරමින් ඔවුන්ගේ සිවුරු පිරිකර තැන්පත් කරමින් ආගන්තුක වත් කරනකල්හි සාමණේර වහන්දෑ සංඝයාට ලැබුණු ලාභ බෙදන තැනට රැස්ව එහි පැමිණියාවූ ද නොපැමිණියාවූ ද භික්ෂූන්ට අයත් ලාභ ගනිමින් මහත් හඬ නගමින් නොසන්සුන්ව ක්‍රියාකළහ. භාග්‍යවතුන් වහන්සේ ඒ කෝලාහලය අසා ඒ භික්ෂූන් එතැනින් නෙරපාලූසේක ඒ සියල්ලෝ ම අලුත පැවිදිවූ සාමණේර භික්ෂූහු ය. එය දත් මහාබ්‍රහ්මතෙම වහා එතැනට පැමිණ "භාග්‍යවතුන් වහන්ස ! නුඹවහන්සේ භික්ෂුසංඝයා පිළිගනිත්වා ! නෙරපූ භික්ෂූන්ට සමාව ද දෙනසේක්වා" යි යාඥා කෙළේ ය. බුදුහු ඔහුගේ කථාවට ඉඩදුන් සේක.

ඉක්බිති බ්‍රහ්මතෙම භාග්‍යවතුන් වහන්සේ මට ඉඩක් දෙනලද්දැ යි වැඳ පැදකුණුකොට ගියේ ය. බුදුහු භික්ෂූන්ගේ ආපසු පැමිණීමට කැමැත්ත ඇති බව ආනන්ද ස්ථවිරයන් වහන්සේට හැඟවූහ. ආනන්දමහතෙරුන් විසින් කැඳවන ලද ඒ භික්ෂූහු බුදුන් වහන්සේ කරා එළඹ තැතිගත් සවභාවය ඇතිව එකත්පසෙක හුන්හ.

භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට ප්‍රයෝජනවත් ධර්මය කුමක්දැ යි බුදුනැණින් විමසනසේක් මේ භික්ෂූහු මවිසින් නෙරපා හරනලද්දේ හුදෙක් ආමිෂය හේතුකොටගෙන ඇතිකළ අරගලය නිසා ය. එහෙයින් පිණ්ඩියාලෝප ධම්දෙශනාවක් පැවැත්වීම ඔවුන්ගේ ගුණධර්ම දියුණුවට මහත් උපකාරයක් වේ ය යි මහාකරුණාඥනයෙන් සලකා වදාරා "අන්තමිදං භික්ඛවෙ" යන ආදි ධම්දේශනාව වදාළසේක.

**යදිදං පිණ්ඩොල්‍යං:-**

පිණ්ඩපයේෂණයෙන් ජීවිකාව කරන්නහුගේ භික්‍ෂාටන කර්මය **පිණ්ඩොල්‍ය යි.** "පිණ්ඩාය උලතීති පිණ්ඩොලො, තස්ස කම්මං පිණ්ඩොල්‍යං," යනු විග්‍රහ යි උල-ගමනෙ යන ධාතු යි මේ ජීවනෝපායයන් අතුරෙන් නිකෘෂ්ටවූ ලාමකවූ නිහීනවූ අන්තවූ ජීවිකා වෘත්තියක් බව දක්වනු සඳහා "අන්තමිදං භික්ඛවෙ ජීවිකානං" යනු වදාළහ.

මේ සඳහා කුපිතවූ මනුෂ්‍යයෝ කහ රෙදිකඩක් හැඳ කබලක් ගත් අත් ඇතිව බත් සොයමින් හැසිරෙති යි ඔවුන්ට ආක්‍රෝශ පරිභව කෙරෙති. තමහට හරිහම්බ කරගෙන කෑමට ශක්තිය ඇති කල්හිත් සිරිඔනප් දෙක නැතිව පාත්‍රයක් ගත් අත් ඇතිව දුගියන් මෙන් හැසිරෙන්නාහුය යි මෙසේත් ආක්‍රොශ පරිභව කෙරෙති, මෙසේ නොදත් මහාජනයා නින්‍දා පරිභව කළත් මාගේ සස්නෙහි පැවිදිවූ ජාතිකුලපුත්‍ර ආචාරකුලපුත්‍ර යන දෙපක්‍ෂ ය ම යම්කිසි පරමාර්ථයක් අනුව හෙවත් සියලු දුකින් මිදී නිවන් පසක් කරනු සඳහා ඒ මේ **පිණ්ඩොල්‍යය** කෙරෙති.

මේ ලෝකයෙහි රජුන් අයත් දෙය බලහත්කාරයෙන් ප්‍රයෝජනයට ගෙන රාජද්‍රෝහීව ක්‍රියාකරන්නවුන් බන්ධනාගාරයට අසුව එයින් ද පැන ගොස් පැවිදි වන හෙයින් ඔවුන්ට '**රාජාභිනීත**' යයි කියනු ලැබේ.

වනයෙහි සොරුන් විසින් අල්වා ගනු ලැබූ ඇතැම්හු මරණභයින් බියපත්ව "අපට ජීවිතදානය දුන මැනව, අපි මෙතැනින් නික්ම ගොස් ගෙවල නොවැස පැවිදි වී **පින්**දහම් කොට ඔබට පින් දෙමු" යි ඇවිටිලි බස් කියා මරුමුවෙන් බේරී ගොස් පැවිදි වන හෙයින් ඔවුන්ට '**චෝරාභිනීත**' යයි කියනුලැබේ යම් කෙනෙක් අනුන්ගෙන් ණය ගෙන නිදහස් කරගත නොහැකි හෙයින් ණය හිමියන්ගෙන් බේරී ගොස් පැවිදි වන හෙයින් ඔවුන්ට '**ඉණට්ට**' යයි කියනුලැබේ. තමාගේ ජීවිකාව කෙසේවත්

කරගත නොහැකි හෙයින් ද ඇතැම් කෙනෙක් පැවිදි වෙති. ඔවුන්ට '**ආජීවපකතා**' යයි කියනුලැබේ. නොපගේ පැවිද්ද එසේ නොවේ.

වැලි කුමක් සඳහා ද යත්? අපි ජාති ජරා මරණ සොක පරිදෙව දුක් දොම්නස් උපායාසය ගෙන් දුකට බටුයෙමු. දුකින් පීඩිතයෝ වෙමු. එහෙයින් මේ සියලු සංසාර දුඃඛයාගේ දුරුකිරීමක් පෙනේ නම් ඉතා යෙහෙක යන අදහසිනි. මෙසේ සලකා පැවිදිවූ කුලපුත්‍ර තෙම විෂමලෝභ බහුල කොට ඇත්තෙක්ව බලවත් ඇලීම් ඇතිව ක්‍රෝධසිත් ඇතිව දුෂ්ටඅදහස් ඇතිව බත් ගොඩක් දැමූ කපුටුවන් සෙයින් ද, මස්වැදැල්ලක් දැමූ බල්ලකු සෙයින් ද, සිහි නුවණ නැතිව මුහුදු සැඩ පහරෙහි ගැට ගැසූ නැවක් මෙන් නොපිහිටි සිත් ඇතිව මහා මාර්ගයට බට මුවකු සෙයින් භ්‍රාන්තවූ සිත් ඇතිව අසංවරවූ ඉඳුරන් ඇතිව වෙසේ නම්, ඔහු දෙකොණෙන් ගිනිදැල්වූ මැද අසූචියෙන් තැවරුණු ප්‍රමාණයෙන් අටඟුල් පමණවූ ගිනිපෙනෙල්ල ගෙදරදොර විය නඟුල් ආදි වැඩකට හෝ ගමෙහි දැවදණ්ඩක් පිණිස හෝ කෙත්කුටියෙහි හෙවත් ගේන්පැලෙහි ඇඳකකුලකට හෝ වනයෙහි දරකඩක් පිණිස හෝ යෙදිය නොහැකිවාක් මෙන් මේ පැවිද්ද ද ගිහිසම්පත්තියෙන් නොහොත් කාමසුඛොපභොගයෙන් ද පිරිහුණෙක් වෙයි. ආචාර්ය උපාධ්‍යාය ආදීන්ගේ අවවාදයක නොපිහිටන හෙයින් පර්‍ය්‍යාප්ති ප්‍රතිවෙධ වශයෙන් පැමිණිය යුතු ශ්‍රාමණ්‍යඵලය ද සම්පූර්ණ නොකරන්නෙක් වෙයි යනු යි.

**දෙවනසූත්‍ර විවරණය යි.**

## 3 – 5 – 3

## වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

සඞ්ඝාටිකණ්ණෙ චෙපි භික්ඛවෙ භික්ඛු ගහෙත්වා පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධො අස්ස පාදෙ පාදං නික්ඛිපන්තො, සො ච හොති අභිජ්ඣාලු කාමෙසු තිබ්බසාරාගො

බ්‍යාපන්නචිත්තො පදුට්ඨමනසංකප්පො මුට්ඨස්සති අසම්පජා නො අසමාහිතො විබ්භන්තචිත්තො පාකතින්ද්‍රියො, අථඛො සො ආරකාව මය්හං, අහං ච තස්ස, තං කිස්ස හෙතු? ධම්මං හි සො භික්ඛවෙ භික්ඛු **න පස්සති**, ධම්මං අපස්සන්තො න මං පස්සති.

යොජනසතෙචෙපි සො භික්ඛවෙ භික්ඛු විහරෙය්‍ය, සො ච හොති අනභිජ්ඣාලු කාමෙසු න තිබ්බසාරාගො අබ්‍යාපන්නචිත්තො අප්පදුට්ඨමනසංකප්පො උපට්ඨිතසති සම්පජානො සමාහිතො එකග්ගචිත්තො සංවුතින්ද්‍රියො; අථඛො සො සන්තිකෙව මය්හං, අහං ච තස්ස, තං කිස්ස හෙතු? ධම්මං හි සො භික්ඛවෙ භික්ඛු **පස්සති**, ධම්මං පස්සන්තො මං පස්සතී'ති,

"අනුබද්ධොපි චෙ අස්ස මහිච්ඡො ච විඝාතවා
එජානුගො අනෙජස්ස නිබ්බුතස්ස අනිබ්බුතො
ගිද්ධො සො වීතගෙධස්ස පස්ස යාවඤ්ච ආරකා
යො ච ධම්ම'මභිඤ්ඤාය ධම්මමඤ්ඤාය පණ්ඩිතො
රහදොව නිවාතෙ ච අනෙජො වූපසම්මති
අනෙජො සො අනෙජස්ස නිබ්බුතස්ස ච සනිබ්බුතො
අගිද්ධො සො වීතගෙධස්ස පස්ස යාවඤ්ච සන්ති'කෙති.

අයං පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

**3 – 5 – 3**

අර්ථය:-

**භික්ඛු**, යම්කිසි මහණෙක්; **සඞ්ඝාටිකණ්ණෙ**, සිවුරු කොණ; **ගහෙත්වා**, අල්වාගෙන; **පිට්ඨිතො පිට්ඨිතො**, පසුපසින්; **පාදෙ**, පියවරෙහි; **පාදං**, පියවර; **නික්ඛිපන්තො**, තබමින්; **අනුබන්ධො අස්ස**, අනුගමනය කරන්නේ වේ ද; **සො ච**, හෙතෙමේත්; **අභිජ්ඣාලු, හොති**, අභිධ්‍යාව බහුල කොට ඇත්තේ වේ ද; **අථඛො**, එසේ ද වුවත්; **සො**, ඒ මහණතෙම; **මය්හං**, මාගේ; **ආරකා එව**, දුරෙහිම වේ; **අහං ච** මම ද **තස්ස**, ඔහුගේ; (දුරෙහි ම වෙමි.)

**සෙස්ස**:- සුගම යි.

**මහිච්ඡො**, මහෙච්ඡ වූ; **විඝාතවා**, දූෂිතවූ සිත් ඇති; **එජානුගො**, තෘෂ්ණාදසයකු වශයෙන් අනුගමනය කරන්නා වූ; **අනිබ්බුතො**, කෙලෙසුන්ගෙන් නොනිවුණා වූ; **ගිද්ධො**, ප්‍රත්‍යයෙහි ගිජු වූ; **සො**, ඒ අන්‍ධබාල පෘථග්ජන තෙම; **වීතගෙධස්ස**, පහවූ තෘෂ්ණාගෙධ ඇති; **අනෙජස්ස**; තෘෂ්ණාරහිත වූ, **නිබ්බුතස්ස**, කෙලෙසුන් දුරුකළා වූ; (සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට) **යාවකඤ්ච ආරකා**, යම් ප්‍රමාණයකට ඈත් වේ; **පස්ස**, (ඔහුගේ ඒ ඈත්වීම) බලව; (කීමට ද දුෂ්කරය යි සේ යි, **සො ච**, හෙතෙමේත්; **ධම්මං අභිඤ්ඤාය**, චතුස්සත්‍යධර්මය ත්‍රිවිධපරිඥායෙන් පිරිසිඳ දැන; **ධම්මංඅඤ්ඤාය**, ඒ චතුස්සත්‍යධර්මය මාර්ගඥානයෙන් අවබෝධ කොට; **පණ්ඩිතො**, ධම්මෝජස්ඥායෙන් යුක්ත වේ ද; (ප්‍රතිවෙධ බහුශ්‍රැතත්වයෙන් පණ්ඩිතවේ ද යු සේ යි) **නිවාතො**, සුළං නො හමන තැන්හි; **රහදො ඉව**, විලක් මෙන්; **අනෙජො**, තෘෂ්ණා නැත්තෙක්ව; **වූපසම්මති**, සන් සිඳීමට පැමිණෙයි; **අනෙජො**, තෘෂ්ණා රහිත වූ **සො**, හෙතෙම; **සනිබ්බුතො**, නිවීම ඇත්තෙක් වේ; (අනිබ්බුතො යි ද මුද්‍රිතපෙළෙහි ඇත) **අගිද්ධො**, ගිජු නොවූ, **සො**, හෙතෙම; **අනෙජස්ස**, තෘෂ්ණා රහිත වූ; **නිබ්බුතස්ස** කෙලශ පරිනිර්වාණයෙන් පිරිනිවියා වූ; **වීතගෙධස්ස**, පහවූ ආශා ඇති සම්‍යක්සම්බුදුන්ගේ; **යාවකඤ්ච සන්තිකෙ**, යම්තාක් සමීපයෙහි වේ ද; **පස්ස**, ඔහුගේ ඒ අදූරභාවය බලව

**භාවය:**–

කෙලෙසුන් දුරුකළ රහත් තෙමේ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට යොදුන් ගණනකින් ඈත්ව සිටිය ද ඔහු ධර්ම සවභාව වශයෙන් ළඟ ම සිටින්නෙක් වේ කෙලෙස් දුරු නොකළ අන්‍ධබාලපෘථග්ජනයා බුදුන්වහන්සේගේ සිවුරු කොණ අල්වාගෙන මෙන් ළඟ ම සිටියත් එසේ ම උන් වහන්සේගේ පියවර ඔස්සෙහි පිටිපස ගමන්කරමින් හැම ඉරියව්වෙහිදී ම හැමකල්හි ම උන වහන්සේව අත නොහැර ළඟම සිටියත් ධර්මතත්වයෙන් ඈත් වේ. එහුගේ ඒ දූරත්වය කිව නොහැකි තරම් ය.

තමාගේ මසැසින් බුදුන්වහන්සේගේ රූපකාය සම්පත්තිය පමණක් දැකීම බුදුන් දැකීම නොවේ. තමන් වහන්සේගේ ධර්මකාය සම්පත්තිය දැකීම ම හෙවත් නව ලොකොත්තර ධර්මය නුවණින් දැකීම ම බුදුන් දැකීම වන්නේ ය. එය දූෂිත සිතින් නො කළහැකි ය භාග්‍යවතුන් වහන්සේගේ රූපකාය දැකීමෙහි ලොල් වූ **වක්කලි** ස්ථවිරයන්ට "කිං තෙ වක්කලි ඉමිනා පූතිකායෙන දිට්ඨෙන, යො ඛො වක්කලි ධම්මං පස්සති, සො මං පස්සති, යො මං පස්සති සො ධම්මං පස්සති" යනු වදාළේ එහෙයිනි. යනු මෙහි භාව යි.

**තෙවන සූත්‍ර විවරණය යි.**

## 3 - 5 - 4

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං**

තයොමෙ භික්ඛවෙ අග්ගි, කතමෙ තයො? **රාගග්ගි දොසග්ගි මොහග්ගි**, ඉමෙ ඛො භික්ඛවෙ තයො අග්ගී'ති.

"රාගග්ගි දහති මච්චෙ රත්තෙ කාමෙසු මුච්ඡිතෙ
දොසග්ගි පන බ්‍යාපන්නෙ නරෙ පාණාතිපාතිනො
මොහග්ගි පන සම්මූළ්හෙ අරියධම්මෙ අකොවිදෙ
එතෙ අග්ගී අජානන්තා සක්කායාභිරතා පජා
තෙ වඩ්ඪයන්ති නිරයං තිරච්ඡානඤ්ච යොනියො
අසුරං පෙත්තිවිසයං අමුත්තා මාරබන්ධනා
යෙ ච රත්තින්දිවා යුත්තා සම්මාසම්බුද්ධසාසනෙ
තෙ නිබ්බාපෙන්ති රාගග්ගිං නිච්චං අසුභසඤ්ඤිනො
දොසග්ගිං පන මෙත්තාය නිබ්බාපෙන්ති නරුත්තමා
මොහග්ගිං පන පඤ්ඤාය යා යං නිබ්බෙධගාමිනී
තෙ නිබ්බාපෙත්වා නිපකා රත්තින්දිව මතන්දිතා
අසෙසං පරිනිබ්බන්ති අසෙසං දුක්ඛමච්චගුං
අරියද්දසා වෙදගුනො සම්මදඤ්ඤාය පණ්ඩිතා
ජාතික්ඛය මභිඤ්ඤාය නාගච්ඡන්ති පුනබ්භව'න්ති

3 – 5 – 4

අර්ථය:–

**රාගග්ගි**, ඇතුළත දවන හෙයින් රාග නමැති ගින්නය; **දොසග්ගි** ද්වේෂාග්නිය; **මොහග්ගි**, මෝහාග්නිය;

**රාගග්ගි** රාගාග්නිය තෙම; **කාමෙසු**, කාමයන්හි මුසපත්වූ; **රත්තෙ**, රාගයෙන් රත් වූ; **මච්චෙ**, මිනිසුන්; **දහති**, දවයි; **දොසග්ගි පන**, ද්වේෂාග්නිය වනාහි; **බ්‍යාපන්නෙ**, දුෂ්ට සිත් ඇති; **පාණාතිපාතිනො**, ප්‍රාණඝාත කරන්නා වූ; **නරෙ**, මිනිසුන්; (දවයි)

**මොහග්ගි පන**, මෝහාග්නිය වනාහි; **සම්මූළ්හෙ**, මුළා වූ; **අරියධම්මෙ**; ආර්‍ය්‍යධර්මයෙහි; **අකොවිදෙ**, අදක්ෂ වූ අඥබාල පෘථග්ජනයන් (දවයි)

**මොහග්ගි පන**, මෝහාග්නිය වනාහි; **සම්මූළ්හෙ**, මුළා වූ; **අරියධම්මෙ**, ආර්‍ය්‍යධර්මයෙහි; **අකොවිදෙ**, අදක්ෂ වූ අඥබාල පෘථග්ජනයන් (දවයි) **එතෙ අග්ගී**, මේ ගිනි; **අජානන්තා**, නොදන්නා වූ; **සක්කායාභිරතා**, සත්කායෙහි ඇලුණා වූ, **මාරබන්ධනා**, මාරපාශයෙන්; **අමුත්තා**, නොමිදුණා වූ; **පජා**; ප්‍රජාවෝ වෙද්ද; **තෙ**, ඔවුහු; **නිරයං**; නරකය (අටමහා නරකය, සොළොස් වැදෑරුම් ඔසුපත් නිරය යනු යි) **තිරච්ඡානං ච යොනියො**, තිරිසන් යෝනිය; **අසුරං**, අසුර කායය; **පෙත්තිවිසයං**, ප්‍රේතලෝකය; **වඩ්ඪයන්ති**, නැවත නැවත ඉපදීම් වශයෙන් වඩත්;

**යෙ ච**, යම් කෙනෙක්; **රත්තිංදිවා**, රෑ දවල් දෙක්හි ම; **යුත්තා**, යෙදුණාහු ද; **නිච්චං**, නිරන්තරයෙන්; **අසුභසඤ්ඤිනො**, අසුභසංඥා ඇති; **තෙ**, ඔවුහු; **රාගග්ගිං**, රාග නමැති ගින්න; **නිබ්බාපෙන්ති** නිවත්;

**නරුත්තමා**, උතුම් මිනිස්සු; **දොසග්ගිං**, ද්වේෂාග්නිය; **මෙත්තාය**, මෛත්‍රියෙන්; **නිබ්බාපෙන්ති**, නිවත් **යා යං නිබ්බෙධගාමිනී**, යම් මේ නිර්වාණ ගාමිනී ප්‍රතිපදාවක් වේ ද; **පඤ්ඤාය**, ඒ ප්‍රඥායෙන්; **මොහග්ගිං** මෝහාග්නිය (නිවත්)

**රත්තිං දිවං**, දිවාරෑ දෙක්හි; **අතන්දිතා**, නො පසුබට වීර්‍ය්‍ය ඇති; **නිපකා**, ප්‍රාඥ වූ; **තෙ**, ඔවුහු, **නිබ්බාපෙත්වා** මේ ගිනි නිවා, **අසෙසං පරිනිබ්බන්ති**, නිරවශෙෂයෙන් පිරිනිවෙත් ද; **දුක්ඛං**, සංසාර දුක; අච්චගුං, ඉක්මවූහ

**අරියද්දසා**, චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ කළා වූ; **වෙදගුනො**, ආර්‍ය්‍ය මාර්ගාවබොධය කළා වූ; **පණ්ඩිතා**, ඥානවන්තයෝ; **සම්මදඤ්ඤාය**, මනාව දැන; (දැනගත යුතු වූ කුශලාකුශලාදිය හා ස්කන්ධාදියත් ය යූ සේ සි) **ජාතික්ඛයං**, නිවන; **අභිඤ්ඤාය**, විශිෂ්ටඥානයෙන් අවබොධ කොට; **පුනබ්භවං**, පුනරුත්පත්තියට; **න ආගච්ඡන්ති**, නො පැමිණෙති;

**භාවය**:– සුගම යි.

**ධර්මවිස්තර**:–

**රාගග්ගි, දොසග්ගි, මොහග්ගි** –

රාගය තියුණුවූකල්හි ඇතුළත දවන හෙයින් **රාගාග්නිය** යයි කියනු ලැබේ. එයට උදාහරණ බොහෝ ය. ද්වෙෂ මොහ දෙක ද බහුල වූ කල්හිත් එසේයි මෙහි ද්වෙෂයෙන් සිත දැවීමෙහි මනොපදෙසික දෙවියන් නිදර්ශන කළයුතු ය ඇතැම් දෙවියකු කෙළිසෙල්ලම් පවත්වනු සඳහා පිරිවර සහිතව දිව්‍යරථයෙන් යන කල්හි ඔහුගේ යශඓශ්වර්‍ය්‍යය දුටු යම්කිසි අන්‍ය වූ දෙවියෙක් ඔහු කෙරෙහි නොඉවසීමෙන් ක්‍රොධ කෙරෙයි. ඒ ක්‍රොධය ඔවුනොවුන් අතර ද ඇතිව නොසන්සිඳී දියුණුව ගියහොත් ඉතා සියුම් වූ දිව්‍යශරීරයට **ක්‍රොධාග්නිය** නොඉවසිය හැකි හෙයින් ඔවුහු දිව්‍යාත්මයෙන් චුත වෙති. මොව්හු චාතුර්-මහාරාජික දෙව්ලොව දෙවියෝ ය.

**මොහාග්නියෙන්** දැවීමෙහි ඛිඩ්ඩාපදූසික දෙවියන් නිදර්ශන කළ හැකිය. නන්දන වන, ඵාරුසක වන, චිත්‍රලතා

වන යත මේ දිව්‍යඋද්‍යානයන්හි දිව්‍යරතියෙන් සමර්පිතව දිව්‍යක්‍රීඩායෙහි තත්පරවූ ඔවුන්ට ආහාරවේලාව පවා අමතකවීමෙන් කාලක්‍රියාව සිදුවෙයි. දෙවියන්ගේ ගින්න බලවත් හෙයින් ද ශරීරය සියුම් හෙයින් ද, බඩගින්න ඔරොත්තු නොදෙයි. එහෙයින් ඔව්හු දිව්‍ය ආත්මයෙන් චුතවෙත් මේ ඛිඩ්ඩාපදූසික දෙවියෝ තව්තිසා දෙව් ලොවට අයත් වෙති.

ද්වත්තිංසාකාර වශයෙන් හෝ උද්ධුමාතකාදි වශයෙන් අසුභභාවනාවන්හි යෙදීමෙන් රාගාග්නිය දුරුවෙයි. මෛත්‍රී භාවනාවෙන් ද්වෙෂාග්නිය දුරුවෙයි අසුභකර්මස්ථානය භාවනාවශයෙන් පුරුදුකිරීමෙන් උපදවාගත් ධ්‍යානය පාදක කොටගෙන ලබන අනාගාමි මාර්ගයෙන් රාග ද්වෙෂ දෙකම දුරුවෙයි.

විදර්ශනාප්‍රඥා සහිත මාර්ගප්‍රඥායෙන් මොහය සහිත වූ සියලු කෙලශසකන්ධය දුරුකළහැකි හෙයින් එයට “නිබ්බෙධගාමිනී ප්‍රඥා” යයි කියනුලැබේ. එහෙයින් “මොහග්ගිං පන පඤ්ඤාය යායං නිබ්බෙධගාමිනී” යනු වදාළහ මෙසේ රෑ දවල් දෙක්හි අකුසීතව භාවනා කරන යෝගාවචරයෝ අර්හත්මාර්ගයෙන් සියලු කෙලෙස්ගිනි නිවා චරිමක චිත්ත නිරොධයෙන් හෙවත් චුතිචිත්තය අතුරු දහන්වීමත් සමඟම අනුපාදිශෙෂ පරිනිර්වාණ ධාතුවෙන් අශෙෂ පිරිනිවීමට පැමිණෙත්.

**සතර වන සූත්‍ර විවරණය යි**

## 3 - 5 - 5

### වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං

තථා තථා භික්ඛවෙ භික්ඛු උපපරික්ඛෙය්‍ය; යථා යථාස්ස උපපරික්ඛතො බහිද්ධා චස්ස **විඤ්ඤාණං අවික්ඛිත්තං** හොති අවිසටං, **අජ්ඣත්තං අසණ්ඨිතං**, අනුපාදාය **න පරිතස්සෙය්‍ය**, ආයතිං ජාතිජරාමරණදුක්ඛසමුදයසම්භවො න හොතී'ති

එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති.

"සන්තසඞ්ගපපහීණස්ස නෙත්තිච්ඡින්නස්ස භික්ඛුනො
වික්ඛීණො ජාතිසංසාරො නත්ථි තස්ස පුනබ්භවො'ති.

අයං පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

**3 – 5 – 5**

අර්ථය:–

**යථා යථා**, යම් යම් පරිද්දෙකින්; **උපපරික්ඛතො**, සම්මර්ශනය කරන්නා වූ; **අස්ස**, මේ යෝගාවචරයාගේ; (සංස්කාරයන් තුලනාත්මකව පරීක්ෂාකරන මේ ආරබ්ධ විදර්ශක භික්ෂුවගේ ය යනු අ.) **විඤ්ඤාණං**, විදර්ශනා චිත්තය; **බහිද්ධා**, බැහැර අරමුණෙහි; (කමටහනින් බැහැරව පවත්නා රූපාදි අරමුණුවල ය යූ සේයි) **අවික්ඛිත්තං**, අවික්ෂිප්තව පවත්නේ වේ ද; **අවිසටං**, නො විසිර පවත්නේ වේ ද; **තථා තථා**, ඒ ඒ පරිද්දෙන්; **භික්ඛු**, ඒ යෝගාවචර මහණතෙම; **උපපරික්ඛෙය්‍ය**, පරීක්ෂා කරන්නේ ය;

(යථා යථා උපපරික්ඛතො අස්ස විඤ්ඤාණං) යනු සම්බන්ධ යි **අජ්ඣත්තං**, ගොචරජ්ඣත්ත නම් වූ කමටහනෙහි; **අසණ්ඨිතං**, (වීර්යසමත්වයෙන් යෙදූ බැවින්; ප්‍රීතිප්‍රතිපන්නව නො හැලී පවත්නේ වේ ද; (තථා තථා භික්ඛු උපපරික්ඛෙය්‍ය) යනු සම්බන්ධ යි.

(යථා යථා උපපරික්ඛතො අස්ස විඤ්ඤාණං යනු සම්බන්ධ කරනු) **අනුපාදාය**, තෘෂ්ණා දෘෂ්ටීන් නොගෙන; **න පරිතස්සෙය්‍ය**, කෙලශ සන්ත්‍රාසයට නො පැමිණේ ද; (තථා තථා භික්ඛු උපපරික්ඛෙය්‍ය යනු සම්බන්ධ යි.)

(මෙසේ කල්හි මේ යෝගාවචරයාහට) **ආයතිං**, මතු භවයෙහි; **ජාතිජරාමරණ දුක්ඛ සමුදය සම්භවො**, ජාති ජරාමරණ දුක්ඛයන්ගේ පහළවීම් සංඛ්‍යාත හටගැනීම; **න හොති**, නොවෙයි; රහත් වෙයි යූ සේ යි.

**සත්ත සඞ්ගප්පහීනස්ස**, සත් වැදෑරුම් කෙලෙශසඞ්ගයන් දුරුකළා වූ; **නෙත්තිච්ඡින්නස්ස**, භවනෙත්ති සංඛ්‍යාත තෘෂ්ණාව සිඳිනලද; **භික්ඛුනො**, යෝගාවචර භික්ෂුවගේ; **ජාතිසංසාරො**, (නොයෙක් ජාති කෝටිශත සහස්‍රයකි කියන ලද) සංසාරවෘත්තය; **පරික්ඛීණො**, ක්‍ෂයවූයේ ය; (එහෙයින්) **තස්ස**, ඒ ක්‍ෂීණාශ්‍රවයාහට; **පුනබ්භවො**, පුනරුත්පත්තියක්; **නත්ථි**, නැත්තේ ය;

**ධර්ම විස්තරයෙන්** භාවය ද දතහැකි වෙයි මෙහි දී මේ සූත්‍රයෙහි අන්වය පළමුකොට මෙසේ සැලකිය යුතු යි.

(1) යථා යථා උපපරික්ඛතො අස්ස (භික්ඛුනො) විඤ්ඤාණං බහිද්ධා අවික්ඛිත්තං අවිසටං අස්ස; තථා තථා භික්ඛු උපපරික්ඛෙය්‍ය.

(2) යථා යථා උපපරික්ඛතො අස්ස විඤ්ඤාණං අජ්ඣත්තං අසණ්ඨිතං හොති; තථා තථා භික්ඛු උපපරික්ඛෙය්‍ය.

(3) යථා යථා උපපරික්ඛතො අස්ස විඤ්ඤාණං අනුපාදාය න පරිතස්සෙය්‍ය, තථා තථා භික්ඛු උපපරික්ඛෙය්‍ය, යනු යි. (යථා යථා උපපරික්ඛතො යනු ද, අනුපාදාය අපරිතස්සතො යනු ද මුද්‍රිත පොත්හි පෙනේ.)

යම් යම් පරිද්දෙකින් සංස්කාර ධර්මයන් නුවණින් සලකන ආරබ්ධ විදර්ශක භික්ෂුව චිත්තසමථයට හේතු වූ කර්මස්ථානයක් ගෙන, එය සකස්ව මෙනෙහි කරන කල්හි තමාගේ විදර්ශනා චිත්තය කමටහනින් බැහැරවූ අරමුණෙකත් අවික්ෂිප්තව පවත්නේදැ යි කියා ඒ ඒ පරිද්දෙන් විමසා බැලිය යුතුය.

එසේ ඒ වීර්යය අඩුව සමාධිය බලවත් වූ කල්හි මැළි බව ඇතිවීමෙන් සිත හැකිළෙන බැවින්, නොහොත් කර්මස්ථාන භාවනායෙහි සිත නොයෙදෙන බැවින්, ඒ සංකොචය හෙවත් සිත්හි හැකිළීම නැතිකර ගැනීම පිණිස වීර්යසමත්වය ඇතිකර ගතයුතු ය. වීර්යය බලවත්වීමෙන්

උද්ධච්චයත්, සමාධිය බලවත්වීමෙන් කුසීතභාවයත් ඇති වන හෙයින් වීර්ය සමාධි දෙක සමව පිහිටුවා ගතයුතු ය. මෙසේ සලකන යෝගාවචරයාහට තමාගේ සිත විදර්ශනා වීථියෙහි පහසුවෙන් යොදාගත හැකිවේ දැයි ඒ ඒ පරිද්දෙන් සැලකියයුතුය

යම් යම් පරිද්දෙකින් සලකන යෝගාවචර තෙම කිසිම සංස්කාරයක් "එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා" යනුවෙන් මේ මාගේය, මේ මම වෙමි, මේ ආත්මය මට අයත් වූවකැයි සලකන තෘෂ්ණාදෘෂ්ටිග්‍රාහයෙන් සිත අවුල් නොකර ගන්නේ වේ ද ඒ ඒ පරිද්දෙන් සැලකිය යුතු යි.

මෙසේ උද්ධච්චයට (උඩඟුකමට පක්ෂවූත්, කොසජ්ජයට (කුසීතබවට) පක්ෂවූත් කරුණු දුරු කොට වීර්යසමත්වය ඇතිව පළමුකොටම විදර්ශනොපක්ලේශයන්ගෙන් සිත පිරිසුදු කොට තමාගේ විදර්ශනාඥානය විදර්ශනා වීථියෙහි නිසිපරිදි යොදවාගෙන භාවනාකරන යෝගාවචරයාහට මාර්ගඵලාවබෝධයෙන් රහත්ව සියලු සසරදුක් නැතිකර ගත හැකි වෙයි.

**සත්තසඞ්ගපහීනස්ස —**

සත්වැදෑරුම් සංගයෝ නම් තණ්හාසංග, දිට්ඨිසංග, මානසංග, කොධසංග. අවිජ්ජාසංග, කිලෙසසංග, දුච්චරිත සංග, යන සංගනාමයෙන් මෙහි දැක්වූ කෙලෙස් සත යි. "සත්තානුසයා එව සත්තසංගා" යනු ආචාර්ය මතය හෙයින් සත්ත අනුසයයෝම සත්තසංග නම් වෙත්

**පස්වන සූත්‍ර විවරණය යි**

**3 - 5 - 6**

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං**

තිස්සො ඉමා භික්ඛවෙ කාමූපපත්තියො, කතමා තිස්සො? **පච්චුපට්ඨිතකාමා, නිම්මානරතිනො**, **පරනිම්මිත වසවත්තිනො**, ඉමා ඛො භික්ඛවෙ තිස්සො කාමූප පත්තියො'ති.

එතමත්ථං භගවා අවොච, තත්ථේතං ඉති වුච්චති.

“පච්චුපට්ඨිතකාමා ච යෙ දෙවා වසවත්තිනො
නිම්මානරතිනො දෙවා යෙ චඤ්ඤෙ කාමභොගිනො
ඉත්ථභාවඤ්ඤථාභාවං කාමභොගෙසු පණ්ඩිතො
සබ්බෙ පරිච්චජෙ කාමෙ යෙ දිබ්බා යෙ ච මානුසා
පියරූපසාතගධිතං ඡෙත්වා සො තං දුරච්චයං
අසෙසං පරිනිබ්බන්ති අසෙසං දුක්ඛමච්චගුං
අරියද්දසා වෙදගුනො සම්මදඤ්ඤාය පණ්ඩිතා
ජාතික්ඛය මභිඤ්ඤාය නාගච්ඡන්ති පුනබ්භව’න්ති-

අයං පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතං ති

## 3 – 5 – 6.

**අර්ථය** :-

**කාමූපපත්තියො,** කාම ප්‍රතිලාභයෝ; (කාම ප්‍රතිසෙවන යෝ ය යු සේ යි) **පච්චුපට්ඨිතා කාමා,** තමා බැඳුණු වස්තු වෙහි සිත අලවන කාමයෝ ය; **නිම්මානරතිනො,** නිර්මාණරතී නම් දෙව්ලොව දෙවියන් විඳිනුලබන කාමයෝ ය; **පරනිම්මිත වසවත්තිනො,** පරනිර්මිත වසවර්ති දෙවියන් අයත් කාමයෝ ය;

**පච්චුපට්ඨිතකාමා ච,** ප්‍රත්‍යුපස්ථිත කාමයෝ ය; **යෙ වසවත්තිනො දෙවා,** යම් වසවර්ති දෙවිකෙනෙක් වෙත් නම් ඔවුන්ගේ කාමයෝ ය; **නිම්මානරතිනො දෙවා,** නිර්මාණරතී දිව්‍ය කාමයෝ ය; **යෙ ච අඤ්ඤෙ,** යම් මෙයින් අන්‍යවූ කාමයන් පරිභොග කරන්නෝ වෙත් ද; (යථෝක්ත දෙවියන්ගෙන් අන්‍යවූ කාමභොගී මනුෂ්‍යයන් හා ඇතැම් අපායයන්හි සත්වයන් පිළිබඳ කාමයෝ මෙහි ගැනෙත්.)

**ඉත්ථභාවඤ්ඤථාභාවං,** ලැබූ ආත්මභාවය හා මතුලබන ආත්මය ද යි යන දෙවැදෑරුම් භවසංසාරය; (**නාතිවත්තරෙ** නොඉක්මවත්,) **කාමභොගෙසු,** කාමසම්පත් කෙරෙහි; **පණ්ඩිතො,** නුවණැති පුද්ගල තෙම; **යෙ දිබ්බා,** යම් දිව්‍ය

කාමයෝ වෙත් ද; **යෙ ච මානුසා,** යම් මානුෂික කාමයෝ වෙත් ද; **සබ්බෙ කාමෙ,** ඒ සියලු කාමයන්; **පරිච්චජෙ,** දුරුකරන්නේ ය

**පියරූපසාතගධිතං,** ප්‍රියරූප මධුරරූපයන්හි සුඛ වෙදනාස්වාදයෙන් ගිජුවූ; (සත්ත්වයෝ) **දුරච්චයං,** ඉක්මවිය නොහැකිවූ; **සොතං,** තෘෂ්ණා නමැති සැඩ පහර; **ඡෙත්වා,** සිඳ; **අසෙසං,** නිරවශෙෂයෙන්; **පරිනිබ්බන්ති,** පිරිනිවෙත්; **අසෙසං දුක්ඛං,** සියලු දුක; **අච්චගුං,** ඉක්මවූහ;

**අරියද්දසා වෙදගුනො,** යන්නෙහි අර්ථ ය 3. 5. 4. යන සූත්‍රයෙහි සඳහන් කළ අයුරින් දතයුතු යි.

**භාවය :-** සුගම යි.

**ධර්ම විස්තර :-**

**පච්චුපට්ඨිතකාමා —**

මනුෂ්‍යයෝ යම් වස්තුවක් යම් අරමුණක් කෙරෙහි වසඟ වෙත් ද, යමක් කෙරෙහි පිළිබඳ සිත් ඇත්තාහු ද; එහෙයින් සියයක් දහසක් හෝ දී ඒ ස්ත්‍රිය පාවා ගෙනවුත් නිතර පරිභොග කෙරෙත් ද, ඔවුන්ගේ ඒ කාම සම්පත්තියට පච්චුපට්ඨිතකාම යයි කියනු ලැබේ. චාතුර්මහාරාජිකයෙහි පටන් එයින් උඩ දෙව්ලොව සතරෙක දෙවියන් ද එසේ ම කම්සැප විඳිනා හෙයින් හෙද 'පච්චුපට්ඨිතකාම' නම් වේ. පන්සිළු (පංචසිඛ) දෙව් පුත්හුගේ කථාව මෙයට නිදර්ශන යි.

**නිම්මානරතිනො —**

තමන් මවාගත් ස්ත්‍රීරූපයෙහි ඇලෙන දෙවියෝ නිර්මාණරතී නම් වෙත්. ඔවුහු යම් දෙවඟනක් නීල වර්ණයෙන් කැමැති වෙත් ද එසේ නිර්මිතකොටගෙන එහි ඇලෙත් යම් දෙවඟනක් පීත වර්ණව කැමැති වෙත් ද එසේ මවාගෙන එහි ඇලෙත්, මෙය නිර්මාණරතී දෙවියන්ගේ කාමසම්පත්තිය යි.

මෙසේ මේ දෙවියන්ට අභිමත රූප මවාගැනීමෙන් විනොදය ලැබියහැකි හෙයින් ඔවුන්ට **මනාපකායිකා** දේවතාවෝ යයි ද කියනු ලැබෙත්.

**පරනිම්මිතවසවත්තිනො-**

අනුන් විසින් මැවූ කාමසම්පත්තියෙහි වසඟවන දෙවියෝ පරනිම්මිතවසවත්ති නම් වෙති. මොවුහු තමන්ගේ රුචියට අනුව නිර්මානය කරනලද දෙවඟනන් හා මෛථුන්දම් සේවනය කෙරෙත්. සෙසු දෙවියෝ කෙසේ නම් මොහුගේ සිත දැනගනිත් ද යත්? ආශ්‍රයෙනි. යම් සේ රජකු ඇසුරු කරන දක්‍ෂවූ අරක්කැමියෙක් රජ්ජුරුවන් කැමට ප්‍රියකරන දේ දැන එය පිළියෙළ කොට දේ ද එසේ ය.

මෙහි ලා ඇතැම් ආචාර්‍ය්‍යවරයෝ දෙවඟනක් හා සිනා සුණු පමණකින්, බැලූ පමණකින්, අල්වාගත් පමණකින්, ආලිංගන මාත්‍රයෙන්, දෙවියන්ගේ කාමකෘත්‍යය සිද්ධවෙති යි කියතුදු එය **අට්ඨකථායෙහි** ප්‍රතිෂිද්ධ ය. ඔවුනොවුන් හා කායස්පර්ශය නැතිව මෛථුනය සිද්ධ නොවන හෙයින් සදෙව් ලොව දෙවියන්ගේ කාමප්‍රතිසේවනය ද ස්වාභාවික ය.

**සවන සූත්‍ර විවරණය යි.**

**3 – 5 – 7**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

96 **කාමයොගයුත්තො**, භික්ඛවෙ භවයොගයුත්තො ආගාමී හොති ආගන්තා ඉත්ථත්තං, **කාමයොගවිසඤ්ඤුත්තො** භික්ඛවෙ භවයොග **යුත්තො** අනාගාමී හොති අනාගන්තා ඉත්ථත්තං **කාමයොග විසඤ්ඤුත්තො** භික්ඛවෙ භවයොග **විසඤ්ඤුත්තො** අරහා හොති ඛීණාසවො'ති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

''කාමයොගෙන සංයුත්තා භවයොගෙන චූභයං
සත්තා ගච්ඡන්ති සංසාරං ජාතිමරණගාමිනො

යෙ ච කාමෙ පහන්ත්වාන අප්පත්තා ආසවක්ඛයං
භවයොගෙන සංයුත්තා අනාගාමීති වුච්චරෙ
යෙ ච ඛො ඡින්නසංසයා ඛීණමානපුනබ්භවා
තෙ වෙ පාරංගතා ලොකෙ යෙ පත්තා ආසවක්ඛය'න්ති

අයම්පි අත්‍ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

**තතිය භාණවාරං**

**3 – 5 – 7**

**කාමයොග යුත්තො**, පඤ්චකාමගුණික රාගයෙහි යෙදුණාවූ; **භවයොග යුත්තො**, දුරු නොකළ භවරාගය ඇති පුද්ගලතෙම; **ඉත්ථත්තං**, මේ මිනිසත්බවට; **ආගන්තා**, එන බැවින්; **ආගාමී හොති**, ආගාමී නම් වේ; **කාමයොග විසංයුත්තො**, කාමයොගයෙන් වෙන් වූ; **භවයොග යුත්තො**, භවයොගයෙහි යෙදුණාවූ පුද්ගල තෙම; **ඉත්ථත්තං**, මේ මිනිස්ලොවට; **අනාගන්තා**, නො එන බැවින්; **අනාගාමී හොති**, අනාගාමී නම් වේ; **කාමයොග විසංයුත්තො**, කාමබන්ධනයෙන් වෙන්වූ; **භවයොග විසංයුත්තො**, භව බන්ධනයෙන් වෙන්වූ පුද්ගලතෙම; **ඛීණාසවො**, ක්ෂයකරන ලද චතුරාශ්‍රවයන් ඇති; **අරහා හොති**, අර්හත් වේ;

**කාමයොගෙන**, කාමයොගයෙන් ද; **භවයොගෙන ච**, භවයොගයෙන් ද යන; **උභයං**, දෙකෙන්; **සංයුත්තා**, යෙදුණාවූ; **සත්තා**, සත්වයෝ; **ජාතිමරණගාමිනො**, උත්පත්ති මරණ දෙකට අනුව ගමන් කරන්නාහු; **සංසාරං**, සසරට; **ගච්ඡන්ති**, යෙත්;

**යෙ**, යම් කෙනෙක්; **කාමෙ**, කාමරාග සඞ්ඛ්‍යාත කෙලශකාමයන්; **පහන්ත්වාන**, අනාගාමි මාර්ගයෙන් දුරු කොට; **ආසවක්ඛයං**, කෙලශක්ෂයට; **අප්පත්තා**, නො පැමිණියාහු; **භවයොගෙන**, භවයොගයෙන්; **සංයුත්තා**, යෙදුණාහුද; (ඔවුන්ට) **අනාගාමීති**, අනාගාමීය යි; **වුච්චරෙ** කියනු ලැබෙත්;

**යෙ ච ඛො**, යම් කෙනෙක්; **ඡින්නසංසයා**, දුරුකරන ලද සැක ඇත්තාහු ද; **ඛීණමානපුනබ්භවා** නවවිධමානය දුරුකිරීමෙන් පුනර්භවයක් නැත්තාහු ද; **යෙ**, යම් කෙනෙක්; **ආසවක්ඛයං**, කෙලශක්ෂයට; **පත්තා**, පැමිණියාහු ද; **වෙ**, ඒකාන්තයෙන්; **තෙ**, ඔවුහු; **ලොකෙ**, ලොකයෙහි; **පාරංගතා**, පරතෙරට ගියාහු ය; (ඡින්නසංසාරා යනු මුද්‍රිත පොත්හි)

මෙහි **ධර්ම විස්තරයෙන් භාවය** ද පැහැදිලි වේ.

**ආගාමි – අනාගාමි – ඛීණාසව–**

මේ සූත්‍රයෙහි මේ **නම්වලින්** පුද්ගලයෝ තිදෙනෙක් කියවෙති කාමරාග සංයෝජනයෙන් බැඳුණු පුද්ගලයා භවරාග සංයෝජනයෙන් ද බැඳුනෙක් වෙයි. එහෙයින් මේ දෙදෙනම සම්බන්ධ කොට "කාමයොගයුත්තො භික්ඛවෙ භවයොගයුත්තො"යි වදාළේ ය. මේ දෙදෙන ම මේ සංයෝජනයන් දුරු නො කළ හෙයින් දෙව්ලොව හෝ බඹලොව උපන්නත් ආපසු මෙහි පැමිණ මේ මිනිස්ලොව පිළිසිඳගැනීම් වශයෙන් උපදින්නෝ වෙති. මේ අවස්ථා ආර්‍ය්‍ය පුද්ගලයන් සඳහා මුත් පෘථග්ජනයන් සඳහා නොවේ. එහෙයින් මෙහි මුඛ්‍යවශයෙන් ගැනෙන්නේ සොවාන් සකෘදාගාමී ආර්‍ය්‍ය පුද්ගලයන් දෙදෙනා යි. මොවුහු **ආගාමී** නම් වන්නේ ද එහෙයිනි.

යමෙක් අශුභධ්‍යානය පාදකකොට ගෙන අනාගාමි මාර්ගය උපදවා ගන්නේ වේ ද, හෙතෙම කාමරාග සංයෝජනය දුරු කළ හෙයින් කාමයොගවිසංයුත්ත වේ. එසේ ද වුවත් හෙතෙම රූපාරූප භවයන් පිළිබඳ ඡන්දරාගය හෙවත් භවරාග සංයෝජනය අනාගාමි මාර්ගයෙන් දුරු නොවන හෙයින් භවයොග සංයුත්ත වේ. මෙ තෙම කාමයොග විසංයොග වශයෙන් සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, කාමච්ඡන්ද, ව්‍යාපාද යන පඤ්ච ඕරංභාගීය සංයෝජනයන් දුරු කළ හෙයින් නොපිරිහුණු ධ්‍යානයෙන්

චුතව ගොස් බඹලොව උපදී. මොහු නැවත කාමලෝක යෙහි පිළිසිඳ ගැනීමට නො පැමිණෙන හෙයින් **අනාගාමි** නම් වේ

යමෙක් භවරාග සංයෝජනයන් සමග ඉතිරි සංයෝජනයන් නොහොත් රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන පඤ්ච උද්ධම්භාගීය සංයෝජනයන් සමග සියලු කෙලෙසුන් දුරු කෙරේ ද, හෙතෙම **ක්ෂීණාශ්‍රව** (රහත්) නම් වේ. එහෙයින් "කාමයොගවිසංයුත්තො භික්ඛවෙ භවයොග විසංයුත්තො අරහං හොති ඛීණාසවො" යනු වදාළහ

මෙහි පළමුවන කොටසෙන් සෝවාන් සකෘදාගාමි ආර්‍ය්‍ය පුද්ගලයන් සහිතව සියලු කල්‍යාණ පෘථග්ජනයන් ද, දෙවන කොටසෙන් සියලු අනාගාමී ආර්‍ය්‍ය පුද්ගලයන් ද, තුන්වන කොටසෙන් සියලු රහත්හු ද ගැනෙත්. **සත්තා ගච්ඡන්ති සංසාරං** යන මෙයින් පෘථග්ජනයන් හා සෝවාන් සකෘදාගාමී යන මේ තුන් පුද්ගලයෝ කාමයොග භවයොග සංයොජන යන් දුරු නොකළ හෙයින් සසර උපදිති. **ජාතිමරණ ගාමිනො** යනුවෙන් දක්වූයේ එහෙයිනි.

මෙහි එකබීජී, කොලංකොල, සත්තක්ඛත්තුපරම යන ත්‍රිවිධ ශ්‍රොතාපන්න ආර්‍ය්‍යපුද්ගලයන් ගැන ධම්මවිභංගය සැකෙවින් දතයුතු.

මෙහි යම්කිසි පුද්ගලයෙක් සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන තුන් සංයෝජනයන් දුරු කොට සෝවාන් වේ නම් හෙතෙම මිනිස්ලොව, දෙව්ලොව එක් වරක් ඉපිද දුක් කෙළවර කෙරෙයි එයට හේතුව නම්: මොහුට තමන් විසින් මතු ලැබියයුතු තුන්මාර්ග තුන් ඵලයන් පිළිබඳ විදර්ශනාව බලවත් හෙයිනි මේ තෙම **එකබීජී** නම් වූ ජ්‍යෙෂ්ඨ සොතාපන්න ආර්‍ය්‍ය පුද්ගලයා යි.

එහෙයින් **පුද්ගලප්‍රකරණයෙහි**

"කතමො ච පුග්ගලො **එකබීජී**? ඉධෙකච්චො පුග්ගලො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති

අවිනිපාතධම්මො, නියතො, සම්බොධිපරායණො, සො එකංයෙව මානුසකං භවං නිබ්බත්තිත්වා දුක්ඛස්සන්තං කරොති. අයං වුච්චති පුග්ගලො එකබීජී"යි වදාළහ

යමෙක් සොවාන් මාර්ග ඵලයන් ප්‍රත්‍යක්‍ෂ කළ තැන් පටන් දෙව් මිනිස් දෙගතියෙහි දෙතුන්වරක් හෝ සවනවර දක්වා හෝ ඉපද සෙසු තුන් මාර්ග තුන් ඵලයන් ද ප්‍රත්‍යක්‍ෂ කොට දුක් කෙළවර කෙරේ ද, හෙතෙම **කොලංකොල** නම් වූ මධ්‍යම ශ්‍රොතාපන්න ආර්‍ය්‍ය පුද්ගලයා යි.

එහෙයින් කීහ. **පුද්ගල ප්‍රකරණයෙහි.**

"කතමො ච පුග්ගලො **කොලංකොලො**? ඉධෙකච්චො පුග්ගලො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති; අවිනිපාතධම්මො, නියතො, සම්බොධි පරායණො, සො ද්වෙ වා තීණිවා කුලානි සංධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරොති, අයං වුච්චති පුග්ගලො කොලංකොලො"යි.

යමෙක් සෝවාන්මාර්ග ඵලයන් ලත් තැන් පටන් දෙව් මිනිස් දෙගතියෙහි සත්වනවර දක්වා නොහොත් සත්වන වරත් ඉපද සෙසු තුන් මාර්ග තුන් ඵලයන් ද ප්‍රත්‍යක්‍ෂ කොට දුක් කෙළවර කෙරේ ද හෙතෙම **සත්තක්ඛත්තුපරම** නම් කනිෂ්ඨ සොවාන් පුද්ගල තෙමේ යි.

එහෙයින් කීහ: **පුද්ගලප්‍රකරණයෙහි**.

"කතමො ච පුග්ගලො **සත්තක්ඛත්තුපරමො**? ඉධෙකච්චො පුග්ගලො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති; අවිනිපාතධම්මො, නියතො, සම්බොධි පරායණො, සො සත්තක්ඛත්තුං දෙවෙ ච මනුස්සෙ ච සංධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරොති, අයං වුච්චති පුග්ගලො සත්තක්ඛත්තුපරමො" යි.

මේ මෘදු වූ ශ්‍රොතාපන්න තෙමේ සත්වරක් පරමකොට භවොත්පත්තිය ඇති හෙයින් ද එයින් මත්තෙහි අටවන

භවයක් නො ගන්නා හෙයින් ද "තතො පරං සො අට්ඨමං භවං න ආදියතීති සත්තක්ඛත්තුපරමො"යි අට්ඨකථායෙහි කීහ.

මෙහි සකෘදාගාමී ආර්‍යපුද්ගල තෙමේ මේ ලෝකයෙහි සකෘදාගාමී මාර්ග ඵලවලට පැමිණ මෙයින් චුතව ගොස් දෙව් ලොව ඉපද එයින් අවුත් නැවතත් මෙහි උපදී ඔහුගේ ඒ ඉපදීම් දෙව්මිනිස් දෙගතියෙහිම එක්වරකට සීමා සහිතය

එහෙයින් කීහ: **පුද්ගල ප්‍රකරණයෙහි**

"කතමො ච පුග්ගලො **සකදාගාමී?** ඉධෙකච්චො තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාග දොස මොහානං තනුත්තා සකදාගාමී හොති; සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති, අයං වුච්චති පුග්ගලො සකදාගාමී"යි

පළමු කොට කියූ පරිදි පස්වැදෑරුම් ඔරංභාගිය සංයොජනයන් දුරු කිරීමෙන් පමණක් බඹලොව උපන් ආර්‍යයෝ භවයොග සංයොජනයන් හෙවත් උද්ධංභාගිය සංයෝජනයන් දුරු නොකළ හෙයින් **අනාගාමී** නම් වෙත්. ඔවුහු නැවත මිනිස්ලොවට හෝ දෙව්ලොවට නො පැමිණ ම එහි දී සියලු කෙලෙසුන් නැති කරන හෙයින් **යෙ ච කාමෙ පහන්ත්වාන** යනු ප්‍රකාශ කළහ

එහෙයින් කීහ: **පුද්ගල ප්‍රකරණයෙහි.**

"කතමො ච පුග්ගලො **අනාගාමී?** ඉධෙකච්චො පුග්ගලො පඤ්චන්නං ඔරංභාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති; තත්ථ පරිනිබ්බායී; අනාවත්තිධම්මො තස්මා ලොකා, අයං වුච්චති පුග්ගලො අනාගාමී"යි.

**ඡින්නසංසයා** යනුවෙන් සියලු සැකයන් සෝවාන් මාර්ගඥානයෙන් දුරු වුව ද අගින් මාර්ගයෙහි ගුණකථනය සඳහා මෙසේ ප්‍රකාශ කළහ. "අරහන්තො හි ඉධ ඡින්න

සංසයා" යනුවෙන් රහත්හුම මෙහි සියලු සැක දුරුකළාහු වෙත්. **ඛීණමාන පුනබ්භවා** යනුවෙන් රහතන් වහන්සේලා නවවැදෑරුම් මානයන් සමග පැවති පස්වැදෑරුම් උද්ධම්භාගීය සංයෝජනයන් සහිත සියලුම කෙලෙසුන් දුරුකිරීමෙන් රහත්වූ හෙයින් සඋපාදිසෙස නිර්වාණධාතුවටත් එයින් ම අනුපාදිසෙස නිර්වාණධාතුවටත් පැමිණි බව දැක්වූ හ.

**එහෙයින් කීහ පුද්ගල ප්‍රකරණයෙහි**

"යස්ස පුග්ගලස්ස රූපරාගො අරූපරාගො, මානො උද්ධච්චං, අවිජ්ජා අනවසෙසා පහීණා හොති අයං වුච්චති පුග්ගලො අරහා"ති.

**සත්වන සූත්‍ර විවරණය යි.**

## 3 – 5 – 8

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං**

**කල්‍යාණසීලො** භික්ඛවෙ භික්ඛු **කල්‍යාණධම්මො කල්‍යාණපඤ්ඤො** ඉමස්මිං ධම්මවිනයෙ කෙවලී වුසිතවා උත්තම පුරිසොති වුච්චති. කථඤ්ච භික්ඛවෙ භික්ඛු කල්‍යාණ සීලො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති, පාති මොක්ඛ සංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො, අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛා-පදෙසු, එවං ඛො භික්ඛවෙ භික්ඛු කල්‍යාණසීලො හොති, ඉති කල්‍යාණ සීලො.

**කල්‍යාණධම්මො** ච කථං හොති? ඉධ භික්ඛවෙ භික්ඛු සත්තන්නං බොධිපක්ඛිකානං ධම්මානං භාවනානුයොග මනුයුත්තො විහරති, එවං ඛො භික්ඛවෙ භික්ඛු කල්‍යාණ ධම්මො හොති ඉතිකල්‍යාණ සීලො, කල්‍යාණ ධම්මො,

**කල්‍යාණපඤ්ඤො** ච කථං හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤා විමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

එවං ඛො භික්ඛවෙ භික්ඛු කල්‍යාණපඤ්ඤො හොති. ඉති කල්‍යාණසීලො කල්‍යාණ ධම්මො කල්‍යාණපඤ්ඤො, ඉමස්මිං ධම්මවිනයෙ කෙවලී වුසිතවා උත්තමපුරිසොති වුච්චතී'ති.-

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"යස්ස කායෙන වාචාය මනසා නත්ථි දුක්කටං
තං වෙ කල්‍යාණසීලො'ති ආහු භික්ඛුං හිරීමනං
යස්ස ධම්මා සුභාවිතා පත්තසම්බොධගාමිනො
තං වෙ කල්‍යාණධම්මො'ති ආහු භික්ඛුං අනුස්සදං
යො දුක්ඛස්ස පජානාති ඉධෙව ඛයමත්තනො
තං වෙ කල්‍යාණපඤ්ඤො'ති ආහු භික්ඛුං අනාසවං
තෙහි ධම්මෙහි සම්පන්නං අනීඝං ඡින්නසංසයං
අසිතං සබ්බලොකස්ස ආහු සබ්බපහායින'න්ති

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති

අර්ථය:- **3 - 5 - 8**

**කල්‍යාණසීලො**, යහපත් සිල් ඇති; **කල්‍යාණ ධම්මො**, යහපත් ධම් ඇති; **කල්‍යාණ පඤ්ඤො**, යහපත් ප්‍රඥ ඇති (භික්ෂු තෙම) **ඉමස්මිං ධම්මවිනයෙ**, මේ ශාසනයෙහි; **කෙවලී**, අර්හත් ය යි ද, **වුසිතවා**, වැස නිමවනලද මාර්ග බ්‍රහමචය්‍ර්‍යා ඇත්තේ ය යි ද; **උත්තමපුරිසොති**, උතුම් පුරුෂයෙකැ යිද; **වුච්චති**, කියනු ලැබේ;

**යස්ස**, යමකු පිළිබඳව; **කායෙන වාචාය මනසා**, කය වචන සිතින්; **දුක්කටං**, දුශ්චරිතයක්; **නත්ථි**, නැත් ද; **හිරීමනං**, ලජ්ජා ඇති; තං භික්ඛුං, ඒ භික්ෂුව; **කල්‍යාණ සීලො ඉති**, සම්පූර්ණ සිල් ඇත්තෙකැ යි; **ආහු** කීහ;

**යස්ස**, යමකු විසින්; **පත්තසම්බොධගාමිනො**, පරිපූර්ණ ශීලඛයෙන් ආය්‍ර්‍යමාර්ගඥනාවබොධය කරන්නා වූ; **ධම්මා**, බොධිපාක්ෂික ධර්මයෝ; **සුභාවිතා**, මනාකොට පුරුදුකරන ලද්දාහු ද; **අනුස්සදං**, රාගාදි කෙලෙස් රහිත වූ; **තං භික්ඛුං**, ඒ භික්ෂුව; **වෙ**, ඒකාන්තයෙන්; **කල්‍යාණධම්මො ඉති**, කලණගති ඇත්තේ ය යි; **ආහු**, කීහ;

**යො**, යමෙක්; **ඉධ එව**, මේ ආත්මභාවයෙහිම; **අත්තනො**, තමාගේ; **දුක්ඛස්ස**, සංසාර දුක්ඛයාගේ; **ඛයං**, දුරුකිරීම; **පජානාති**, දනී ද; **අනාසවං**, කෙලෙස් රහිත වූ; **තං භික්ඛුං**, ඒ භික්ෂුව; **කල්‍යාණපඤ්ඤ ඉති**, යහපත් මාර්ගඵල ප්‍රඥ ඇත්තේ ය යි; **ආහ**, කීහු;

**තෙහි ධම්මෙහි**, යථෝක්ත ශීලාදි ගුණ ධර්මයන්ගෙන්; **සම්පන්නං**, යුක්තවූ; **අනීඝං**, දුක් රහිත වූ; **ඡින්නසංසයං**, සිඳිනලද සැක ඇති; (ඒ භික්ෂුව) **සබ්බලොකස්ස**, සියලු සත්වලෝකයෙහි; (සප්තම්‍යර්ථ ෂෂ්ඨී යි) **අසිතං**, තෘෂ්ණා දෘෂ්ටි දෙක ඇසුරු නො කළාවූ; **සබ්බප්පහායිනං**, සියලු කෙලෙසුන් දුරුකෙළේය යි; **ආහු**, කීහු;

**භාවය**:- සුගම යි.

**ධර්මවිස්තර**:—

**කල්‍යාණසීලො, කල්‍යාණ ධම්මො, කල්‍යාණ පඤ්ඤො,**

සීලවිපත්තියෙහි ආදීනව දැකීමෙන් හා සීල සම්පත්තියෙහි අනුසස් දැකීමෙන් දැ යි යන මේ දෙකාරණයෙන් සීලයාගේ පරිපූර්ණත්වය වේ. සියලු කෙලෙසුන්ගෙන් මිදුණු සර්වප්‍රකාර යෙන් ම පිරිසිදුවූ මාර්ගඵල සිත්වල යෙදෙන විරතිසීලයාගේ වශයෙන් මෙහි කල්‍යාණත්වය වේ. සතර සතිපට්ඨානාදි බොධිපාක්ෂික ධර්මයන්ගෙන් කල්‍යාණ ධර්මත්වය ද, මාර්ග ඵල ප්‍රඥවශයෙන් කල්‍යාණප්‍රාඥත්වය ද දතයුතු.

ලෝකොත්තර වූ ආර්යසීලය ද, ධර්මය ද, ප්‍රඥව ද ඒකාන්තයෙන් කල්‍යාණ වේ. මෙහි ලා පළවන ආචාර්යමත බොහෝ යි. ඇතැම් කෙනෙක් චතුපාරිශුද්ධිශීල වශයෙන් කල්‍යාණසීලත්වය ද, විදර්ශනාමාර්ග ධර්මවශයෙන් කල්‍යාණ ධර්මත්වය ද, මාර්ග ඵල ප්‍රඥ වශයෙන් කල්‍යාණප්‍රාඥත්වය ද, කියත්. ඇතැම්කෙනෙක් අසෙඛ වූ සීලධර්මප්‍රඥවත් කල්‍යාණ ය යි ද කියති.

ඇතැම් කෙනෙක් ශ්‍රොතාපන්න සකෘදාගාමීන්ගේ මාර්ග ඵල සීලය "කල්‍යණසීලය" යි ද, කල්‍යාණසීලො යනුවෙන්

දක්වූයේ ඒ ආර්‍ය්‍යපුද්ගල දෙකොටස ය යි ද, අනාගාමි මාර්ග ඵල ධර්ම "කල්‍යාණධර්ම" ය යි ද, එහි බොධිපාක්ෂික ධර්ම ඇතුළත් වන හෙයින් "කල්‍යාණධම්මො" යන මෙයින් අනාගාමි මාර්ගස්ථයාගේ පටන් ආර්‍ය්‍ය පුද්ගලයන් තුන් දෙනෙකුන් ගැනෙන බැව් ද, ප්‍රඥාවෙන් කෙරෙන කටයුතු රහත්ඵලයෙන් සම්පූර්ණ වන හෙයින් අර්හත්ඵලයට පැමිණි ආර්‍ය්‍යතෙම "කල්‍යාණප්‍රාඥ" ය යි ද, කියති.

මෙසේ පුද්ගල විභාගය කෙරෙතු දු මේ ප්‍රපඤ්චකථා ප්‍රමාණ නොකරන මෙහි අර්ථකථාචාර්‍ය්‍ය **භදන්ත ධම්මපාල** ස්ථවිරොත්තමයන් වහන්සේ අග්‍රමාර්ගඵල ධර්මම හෙවත් අර්හත්මාර්ගය හා අර්හත් ඵලයත් දෙකම කල්‍යාණසීලාදි නම් වලින් දක්වෙති යි ප්‍රකාශ කෙරෙති.

මෙහි සෙසු විස්තර අර්ථකථාශ්‍රයෙන් දතයුතු යි.

**අටවන සූත්‍ර විවරණය යි.**

## 3 – 5 – 9

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතා ති මෙ සුතං**

ද්වෙමානි භික්ඛවෙ දානානි, ආමිසදානඤ්ච ධම්මදානඤ්ච, එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං දානානං යදිදං **ධම්මදානං**, ද්වෙමෙ භික්ඛවෙ සංවිභාගා, ආමිසසංවිභාගො ච ධම්මසංවිභාගො ච, එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සංවිභාගානං යදිදං **ධම්මසංවිභාගො**, ද්වෙමෙ භික්ඛවෙ අනුග්ගහා, ආමිසානුග්ගහො ච ධම්මානුග්ගහො ච, එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං අනුග්ගහානං යදිදං **ධම්මානුග්ගහොති.**

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"යමාහු දානං පරමං අනුත්තරං
යං සංවිභාගං භගවා අවණ්ණයී
අග්ගම්හි ඛෙත්තම්හි පසන්නචිත්තො
විඤ්ඤූ පජානං කො න යජෙථ කාලෙ

යෙ චෙව භාසන්ති සුණන්ති චූභයං
පසන්නචිත්තා සුගතස්ස සාසනෙ
තෙසං සො අත්ථො පරමො විසුජ්ඣති
යෙ අප්පමත්තා සුගතස්ස සාසනෙ''ති.

අයං පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්ති.

**අර්ථය:-** **3 - 5 - 9**

**ආමිසදානඤ්ච**, සිව්පසය පරිත්‍යාග කිරීම ද; **ධම්මදානං ච**, නිර්වාණාවබොධය සඳහා ප්‍රතිපත්තිධර්මය දෙසීම ද; **ආමිසසංවිභාගො**, ආමිෂය හෙවත් සිව්පසය බෙදීම ද; **ධම්මසංවිභාගො**, ධර්මය බෙදා හැරීම් හෙවත් ධර්ම ප්‍රචාරය ද; **ආමිසානුග්ගහො**, සිව් පසයෙන් හෝ සතර සංග්‍රහවස්තුවෙන් අනුන්ට සංග්‍රහ කිරීම ද; **ධම්මානුග්ගහො**, ධර්මයෙන් අනුග්‍රහ කිරීම ද;

**භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **යං දානං**, යම්දානයක්; **පරමං**, ශ්‍රෙෂ්ඨය; **අනුත්තරං** උතුම්ය යි; **ආහු**, වදාළසේක් ද; **යං සංවිභාගං**, යම් බෙදීමක්; (පරමං අනුත්තරං යනු සම්බන්ධ කරනු) **අවණ්ණයී**, වර්ණනාකළසේක් ද; (එහෙයින්) **පජානං**, දන්දීමෙහි අනුසස් දන්නා වූ; **කො විඤ්ඤූ**, කවරනම් ප්‍රාඥයෙක්; **පසන්නචිත්තො**, පහන් සිත් ඇතිව; **අග්ගම්හි ඛෙත්තම්හි**, අග්‍රක්ෂෙත්‍රය වූ රත්නත්‍රය විෂයෙහි; **කාලෙ**, සුදුසු කාලයෙහි; **න යජෙථ**, නො පුදන්නේ ද;

**යෙ**, යම්කෙනෙක්; **සුගතස්ස සාසනෙ**, බුදුසස්නෙහි; **පසන්නචිත්තා**, පහන්සිත් ඇතිව; **උභයං භාසන්ති සුණන්ති ච**, කීමය ඇසීමය යන මේ දෙකම කෙරෙත් ද; **යෙ**, යම් කෙනෙක්; **සුගතස්ස සාසනෙ**, බුදුසස්නෙහි; **අප්පමත්තා**, අප්‍රමාදවූවාහු වෙත් ද; **තෙසං**, ඔවුන්ට; **සො පරමො අත්ථො**, ඒ ධර්මදාන ධර්ම සංවිභාග ධර්මානුග්‍රහ සඞ්ඛ්‍යාත පරමාර්ථය තෙමේ; **විසුජ්ඣති**, (තෘෂ්ණා සඞ්කලෂා දි කෙලශමල විශොධනයෙන්) සත්වයා පිරිසුදු කෙරෙයි;

**භාවය:-** සුගම යි.

**ධම්විස්තර:–**

**කො න යජෙථ කාලෙ:-**

යුක්ත ප්‍රාප්ත කාලයෙහි කවරෙක් නම් දන් නො දේද? දෙන්නේ ම ය. ශ්‍රද්ධාව හා දෙයධර්මයත් ප්‍රතිග්‍රාහකයනුත් හමු වූ කල්හි දියහැකි වෙයි.

**සියලු සංඝයා විෂයෙහි** දෙන **සංඝදානය,** භික්ෂූන් කීපනමක් උදෙසා දෙන **උද්දෙසික දානය,** සංඝයාට හෝ පුද්ගලයකුට ආරාධනා කොට දෙන **නිමන්ත්‍රණ දානය,** දිනපතා දෙන **සලාක දානය,** පක්ෂයකට වරක් දෙන **පක්ඛික දානය,** පොහොයදවසෙහි දෙන **පෝය දානය,** පෑලවිය දිනයෙහි දෙන **පාටිපදික දානය,** ආගන්තුකව පැමිණි භික්ෂූන්ට දෙන **ආගන්තුක දානය,** ගම්වැස්සන් එකමුතුව දෙන **ගමික දානය** හෝ **පේරු දානය,** ගිලනුන්ට දෙන **ගිලාන දානය,** ගිලන් උපස්ථායකයන්ට **ගිලානොපස්ථාන දානය,** තමා කරවූ ආවාසයෙහි වසන භික්ෂූන්ට දෙන **කුටික දානය,** හෝ විහාරස්ථානයෙහි වස් විසූ භික්ෂූන් උදෙසා දෙන **වස්දානය,** ආදි මෙසේ කී නො කී අවස්ථාවන්හි පින් සලකා දෙන දාන යුක්තප්‍රාප්ත කාලයෙහි දෙන දන් යයි සැලකිය යුතු.

මෙහි ප්‍රථම ගාථාවෙන් ආමිසදානය හා සංවිභාගයත් හෙවත් දීම හා දුන්දෙය බෙදාගෙන ප්‍රයෝජන ගැනීමත් දක්වා දෙවන ගාථායෙන් ධම්දාන ධම්සංවිභාග දෙක දක්වනු සඳහා "යෙ චෙව භාසන්ති සුණන්ති චූභයං" යනු ප්‍රකාශ කළහ. මෙහි භාසකයෝ නම්:– ධම්කථිකයෝ ය ශ්‍රවණය කරන්නෝ නම්:– ශ්‍රාවකයෝ ය. නොහොත් ධම්ප්‍රතිග්‍රාහකයෝ ය. මෙසේ ධම්දාන ධම්සංවිභාග ධම්ානුග්‍රහයෙන් ලෞකික ලොකොත්තර අර්ථය සැලසෙයි.

**නවවෙනි සූත්‍ර විවරණය යි**

## 3 – 5 – 10

## වුත්තං හෙතං භගවතා වුත්ත මරහතාති මෙ සුතං

ධම්මේනාහං භික්ඛවෙ තෙවිජ්ජං බ්‍රාහ්මණං පඤ්ඤපෙමි, නාඤ්ඤං ලපිතලාපනමත්තෙන, කථඤ්ච භික්ඛවෙ ධම්මෙන තෙවිජ්ජං බ්‍රාහ්මණං පඤ්ඤපෙමි, නාඤ්ඤං ලපිතලාපනමත්තෙන? ඉධ භික්ඛවෙ භික්ඛු අනෙකවිහිතංපුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථිදං? එකම්පි ජාතිං, ද්වෙපි ජාතියො, තිස්සොපි ජාතියො, චතස්සොපි ජාතියො, පඤ්චපි ජාතියො, දසපි ජාතියො, වීසම්පි ජාතියො, තිංසම්පි ජාතියො, චත්තාලීසම්පි ජාතියො, පඤ්ඤාසම්පි ජාතියො, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි, අනෙකෙපි සංවට්ටකප්පෙ, අනෙකෙපි විවට්ටකප්පෙ, අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ, අමුත්‍රාසිං එවං නාමො, එවං ගොත්තො, එවං වණ්ණො එවමාහාරො, එවං සුඛ දුක්ඛ පටිසංවෙදී, එවමායුපරියන්තො, සො තතො චුතො අමුත්‍ර උදපාදිං; තත්‍රාපාසිං එවං නාමො, එවං ගොත්තො, එවං වණ්ණො, එවමාහාරො, එවං සුඛදුක්ඛ පටිසංවෙදී, එවමායුපරියන්තො, සො තතො චුතො ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං **පුබ්බෙනිවාසං** අනුස්සරති අයමස්ස **පඨමා විජ්ජා** අධිගතා හොති. අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

පුනචපරං භික්ඛවෙ භික්ඛු දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති; චවමානෙ, උප්පජ්ජමානෙ, හීනෙ, පණීතෙ, සුවණ්ණෙ, දුබ්බණ්ණෙ, සුගතෙ, දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාති; ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා, වචී-පෙ-මනොදුච්චරිතෙන සමන්නාගතා, අරියානං උපවාදකා, මිච්ඡාදිට්ඨිකා, මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං

උපපන්නා, ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා පෙ-මනොසුචරිතෙන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති ඉති **දිබ්බෙන චක්ඛුනා** විසුද්ධෙන අතික්කන්ත මානුසකෙන -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානාති, අයමස්ස **දුතියා විජ්ජා** අධිගතා හොති, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා තමො විහතො, ආලොකො උප්පන්නො යථාතං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො

පුනචපරං භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති; අයමස්ස **තතියා විජ්ජා** අධිගතා හොති, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො, එවං ඛො අහං භික්ඛවෙ ධම්මෙන තෙවිජ්ජං බ්‍රාහමණං පඤ්ඤපෙමි; නාඤ්ඤං ලපිතලාපනමත්තෙනාති

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"පුබ්බෙනිවාසං යො වෙදි සග්ගාපායඤ්ච පස්සති
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤා වොසිතො මුනි
එතාහි තීහි විජ්ජාහි තෙවිජ්ජො හොති බ්‍රාහමණො
තමහං වදාමි තෙවිජ්ජං නාඤ්ඤං ලපිතලාපනන්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

**පඤ්චමො වග්ගො**

තස්සුද්දානං-

පාසාද ජීවිතසංඝාටි අග්ගි උපපරික්ඛයා
උප්පත්ති කාමකල්‍යාණං දානං ධම්මෙන තෙ දසාති

**තිකනිපාතො නිට්ඨිතො.**

අර්ථය:- **3 - 5 - 10**

**ධම්මෙන,** ධර්මයෙන්-න්‍යායයෙන්; (සම්‍යක් ප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත හේතුවෙන යයු සේයි) **තෙවිජ්ජං බ්‍රාහ්මණං,** ත්‍රෛවිද්‍යක බ්‍රාහ්මණයා; **ලපිතලාපනමත්තෙන,** ඍෂිවරයන් ප්‍රකාශ කළ පමණින්; **අනෙකවිහිතං,** අනෙක ප්‍රකාර වූ; **පුබ්බෙනිවාසං,** පෙර ඒ ඒ භවයන්හි පැවති ස්කන්ධ පරම්පරාව; **අනුස්සරති,** (උත්පත්ති පිළිවෙළින් සලකමින්) සිහි කෙරෙයි; **එකම්පි ජාතිං,** එක ජාතියක් ද; (ප්‍රතිසන්ධිය මුල් කොට ච්‍යුතියෙන් කෙළවර වූ එකභවයකට ඇතුළත් ස්කන්ධපරම්පරාව ය යු සේයි) **අනෙකෙපි සංවට්ටකප්පෙ,** නොයෙක් නස්නා කල්පයන් ද; **අනෙකෙපි විවට්ටකප්පෙ,** නොයෙක් හටගන්නා කල්පයන් ද; **අමුත්‍රාසිං,** අසවල් තැන උපන්නෙමි; **එවං නාමො,** මෙබඳු නමක් ඇති වූයෙමි; -පෙ- **සො,** ඒ මම; **තතො චුතො,** එයින් චුතවූයෙමි; **අමුත්‍ර උදපාදිං,** අසවල් තැන උපන්නෙමි;-පෙ-**ඉති,** මෙසේ; **සාකාරං,** වර්ණාදි ආකාර සහිත වූ; **සඋද්දෙසං,** නාමගොත්‍රාදි ව්‍යවහාර සහිතවූ; -පෙ- **චෙතො විමුත්තිං,** අර්හත්ඵල සමාධිය; **පඤ්ඤාවිමුත්තිං,** අර්හත්ඵල ප්‍රඥාව;

**යො,** යම් ක්ෂීණාශ්‍රවයෙක්; **පුබ්බෙනිවාසං,** පෙර විසූ කඳපිළිවෙළ; **අවෙදි,** දත්තේ ද; **සග්ගාපායං ච,** දෙව් ලොව හා අපායන්; **පස්සති,** දකී ද; **අථො,** නැවත; **ජාතික්ඛයං,** ජාතික්ෂය සංඛ්‍යාත නිවනට; **පත්තො,** පැමිණියේ ද; **අභිඤ්ඤා වොසිතො,** විශිෂ්ටඥනයෙන් දැන සතර මාර්ගයෙන් කටයුතු අවසන් කෙළේ ද; **මුනි,** මෞනෙය්‍ය ධර්මයෙන් යුක්ත වේද;

**බ්‍රාහ්මණො,** බමුණු තෙම; **එතාහි තීහි විජ්ජාහි,** මේ ත්‍රිවිද්‍යාවන් කරණකොටගෙන; **තෙවිජ්ජො හොති,** ත්‍රෛවිද්‍යක වෙයි. **අහං,** මම; **තං,** ඔහු; **තෙවිජ්ජං,** ත්‍රෛවිද්‍යකය යි; **වදාමි,** කියමි; **අඤ්ඤං,** අන්‍යවූ; **ලපිත ලාපනං,** (අනුන් විසින්) කියනලද්දක් කියන්නහු; **න ඉති,** (ත්‍රෛවිද්‍යකය යි) නො කියමි; යනු යි.

භාවය:- සුගම යි.

**ධර්මවිස්තර:-**

මේ සූත්‍රයෙහි දක්වන **ත්‍රිවිද්‍යාව** නම්:- පූර්වේනිවාසානුස්මෘතිඥානය, දිව්‍යචක්ෂුරභිඥානය, ආශ්‍රවක්ෂයකරඥානය යන ඥානසම්පත් තුන යි. බ්‍රාහ්මණයකු ත්‍රෛවිද්‍යකවන්නේ මෙකී ඥානත්‍රයෙන් ය. අට්ඨකාදි ඍෂිවරයන්ගේ කථාවලට අනුව ත්‍රෛවිද්‍යක බ්‍රාහ්මණයෙක් නොපැනවිය හැකිය. ඔවුන් සාමවේදාදි ත්‍රිවේදය හැදෑරීමෙන් හෝ වේද මන්ත්‍ර ඉගෙනීම හා ඉගැන්වීමෙන් හෝ බමුණන් ත්‍රෛවිද්‍යක ය යි සම්මත කළත් මේ දේශනායෙන් එය ප්‍රතිෂිද්ධ ය.

විද්‍යාචරණ සම්පත්තියෙන් පමණක් ශාසනයෙහි ත්‍රෛවිද්‍යක වේ. විද්‍යා නම් පළමු දැක්වූ ඥානත්‍රය යි. චරණ නම් සීල සම්පත්තිය යි. චරණසම්පදායෙන් තොරව විද්‍යා සම්පදායෙක් නැත. සීලාදි ගුණධර්ම වලින් වෙන්ව නුවණක් නැත. "සීල පඤ්ඤාණතො ජයං" යනුවෙන් සීල ප්‍රඥා දෙකින් කෙලෙසුන් ජයගැනීම වේය යි වදාළේ එහෙයිනි.

**සංවට්ටප්ප, විවට්ටකප්ප, සංවට්ටවිවට්ටකප්ප—**

විනාසවන කල්පය **සංවට්ට** නම් වේ. මෙයින්ම **සංවට්ටට්ඨායී** කල්පය ද ගත යුතුයි. **විවට්ට** නම් ඇති වන කල්පය යි. මෙයින්ම **විවට්ටට්ඨායී** කල්පය ද ගත යුතුයි. එහෙයින් "චත්තාරිමානි භික්ඛවෙ කප්පානි අසංඛෙය්‍යානි, කතමානි චත්තාරි? සංවට්ටො සංවට්ටට්ඨායී විවට්ටො විවට්ටට්ඨායී" යනු වදාළහ. "සංවර්තය" නම්- විනාශ වන කල්පය යි. "සංවර්තස්ථායී" නම්- විනාශවෙමින් පවත්නා අවස්ථාව යි. "විවර්තය" නම්- ඇති වන කල්පය යි. "විවර්තස්ථායී" නම්- ඇතිවෙමින් පවත්නා අවස්ථාව යි. එක් සංවර්තයක කාලය එක් අසංඛ්‍ය කල්පයක් හෙයින් මේ සතර අවස්ථා ම අසංඛ්‍ය කල්ප සතරෙකැ යි දත යුතුය.

**අසංඛ්‍ය කල්ප** යනු වර්ෂ සතසහශ්‍ර කෝටි ගණනින් සංඛ්‍යානියමයක් නො කළ හැකි දීර්ඝ කාලපරිච්ඡේදයකි.

එය අනන්තඃකල්ප විස්සකින් පරිමිතය. එක් අනන්තඃකල්පයක ගණන නම්:- දස හැවිරිද්දෙහි පටන් මිනිසුන්ගේ ආයුෂ ක්‍රමයෙන් නැගී අසඞ්ඛ්‍යයට පැමිණ එතැන් සිට ක්‍රමයෙන් බැසගෙන අවුත් දහ අවුරුද්ද දක්වා මේ දෙ අතර කාලය යි. මෙසේ අනන්තඃකල්ප විස්සක් එක් **අසඞ්ඛ්‍ය කල්පයෙකැයි** තාත්පර්‍ය්‍යයෙන් දතයුතු.

**සංවට්ටය** ද ත්‍රිවිධවේ. තෙජෝ සංවට්ටය, ආපො සංවට්ටය, වායො සංවට්ටය යි කියා- ගින්දරෙන් විනාශ වන කාලය, වතුරෙන් විනාශවන කාලය, සුළඟින් විනාශ වන කාලය යනු මෙහි තේරුම යි. මෙයට සීමා තුනෙකි. ආභස්සර, සුභකිණ්හ, වෙහප්ඵලය යි කියා- යම්කලෙක ගින්නෙන් කල්ප විනාශය වේනම්:- ආභාශ්වර බඹලොවෙන් යට දැවෙයි. ජලයෙන් විනාශ වේ නම්:- ශුභ කීර්ණයෙන් යට ගැලෙයි. සුළඟින් විනාශ වේනම්:- වෘහත්ඵලයෙන් යට නැති වෙයි.

එහෙයින් කිහ.

> "අග්ගිනාභස්සරා හෙට්ඨා ආපෙන සුභකිණ්ණකා
> වෙහප්ඵලතො වාතෙන එවං ලොකො විනස්සති" යි

සත්වයන් පිළිබඳ රාගද්වෙෂ මොහයන් බලවත් වීමෙන් මෙසේ ලොකවිනාශය සිදුවෙයි. රාගය බලවත්වූ කල්හි ගින්නෙන් ද, ද්වෙෂය බලවත් වූ කල්හි ජලයෙන් ද, මොහය බලවත් වූ කල්හි සුළඟින් ද, විනාශ වේ යයි කියන ලද්දේ ය.

මෙසේ නස්නා මේ ලෝකය සත්වරක් ගින්නෙන් විනාශවූ කල්හි අටවෙනිවර ජලයෙන් විනාශ වෙයි. නැවතත් සත්වරක් ගින්නෙන් නස්නා කල අටවැනිවර වතුරෙන් විනාශ වෙයි. මෙසේ අෂ්ටාෂ්ටකයක් (අටවරක් අටක්, හෙවත් හැටහතර වාරයක්) සම්පූර්ණ වූ කල්හි එහි කෙළවර දී සුළඟින් විනාශ වන්නේය.

එහෙයින් කීහ.

> "සත්ත සත්තග්ගිනා වාරා අට්ඨමෙ අට්ඨමොදකා
> චතුසට්ඨි යදා පුණ්ණා එකො වායුවරො සියා"යි

මෙහි විස්තර වශයෙන් නම්:- කොටිලක්‍ෂයෙක් සක්වළ එකට විනාශ වෙයි. පූර්වේනිවාසය අනුස්මරණය කරන භික්‍ෂුව නොයෙක් සංවර්තකල්පයන් ද, නොයෙක් විවර්ත කල්පයන් ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන් ද, සිහි කෙරෙයි.

දිව්‍යංචක්‍ෂුරභිඥානය නම්:- දිව ඇස් ලැබීමේ නුවණ යි. මෙයින් චුතිඋප්පත්ති දෙකම දැනීම දෘෂ්ටිවිශුද්ධියට හේතු වෙයි. යමෙක් සත්ත්වයෙකුගේ චුතවීම පමණක් දකියි ද; ඉපදීම නොදකියි ද, ඔහු උච්ඡේද දෘෂ්ටිය ගත්තෙක් වෙයි. යමෙක් සත්ත්වයන්ගේ ඉපදීම පමණක් දකී ද; චුතවීම නො දකී ද, හෙතෙම නොමැරෙන අලුත් අලුත් සත්ත්වයන් උපදනේය යන ශාස්වත දෘෂ්ටියට බැසගනියි. යමෙක් චුතිඋප්පත්ති දෙකම දකී නම් ඔහු විෂමදෘෂ්ටියකට බැස නොගනී යි. බුද්ධශ්‍රාවක තෙම මේ දෙක ම මැනවින් දකී. "චුතූපපාතදස්සනෙන දිට්ඨිවිසුද්ධි හෙතුභාවතො විසුද්ධං"යි ප්‍රකාශ වූයේ එහෙයිනි.

එකොළොස් උපක්ලේශයන්ගෙන් දුරු වූ හෙයින් ද, විසුද්ධ වේ. එනම් - විචිකිච්ඡාව, අයොනිසොමනසිකාරය, ථිනමිද්ධය, ඡම්භිතත්තය, (සිත්හිතැතිගැනීම) උබ්බිල්ලා විතත්වය, (උඩඟුකමෙන් ඉල්පීම) දුට්ඨුල්ලය (කයෙහි මැළිබව නොහොත් දුසිරිත් බහුල බව) අච්චාරද්ධවිරිය (දැඩි වීය්‍ර්‍යය) අතිලීනවිරිය, (හොඳටම පසු බස්නා උත්සාහය) අභිජල්පනය (කිසි ගරුත්වයක් නැතිව මහ හඬ විහිදුවා නොසරුප්සේ කථා කිරීම නොහොත් තෘෂ්ණානිශ්‍රිත ප්‍රාර්ථනය) නානාත්ත සංඥව, නානාවිධ රූපයන් මෙනෙහි කිරීම; (එක ජාතියක රූපයක් දැකීමෙන් ආසාව ඇති වූ හෙයින් නානාවිධ රූපයන් මෙනෙහි කරන්නට සිතා දිව්‍යරූප මනුෂ්‍යරූපයන් දැකීමටත් සිතීමය යූ සේ යි) අතිධ්‍යාව, (විෂමලෝභය) යන මේ යි

**චවමානෙ, උපපජ්ජමානෙ, යථා කම්මූපගෙ සත්තෙ.,**

චුතවනු ලබන, උපදිනු ලබන, කම්වූපරිදි පරලොව යන සත්වයන් දැකීම ය, යන මෙයින් දිබ්බචක්ඛුඤාණකිච්චය හා යථාකම්මෝපගඥානකෘත්‍යයත් ප්‍රකාශ කෙරෙයි. හේ කෙසේ ද යත්? මේ අභිඥඥානය ලැබූ භික්ෂුතෙම අපායෙහි ආලෝකයක් පතුරුවා එහි අනන්ත දුක් විඳින සත්වයන් දැකීම මොහුගේ දිව්‍යංචක්ෂුරභිඥාන කෘත්‍යය යි. නැවත කිනම් පාපකර්මයකින් මේ සත්වයෝ මෙසේ දුක් විඳිත්දැ යි සලකන කල මෙනම් මෙනම් පව්කම්වලින් යයි කර්මාරම්මණ ඥානය උපදී. මෙය, යථාකම්මූපගඥාන කෘත්‍යය යි.

එසේම දිව්‍යලොකවල ආලෝකය පතුරුවා නන්දන වන ඵාරුසක වන චිත්‍රලතා වන ආදි උයන්වල හා දෙව් විමන් වලත් ප්‍රීති සැප විඳිනා සත්වයන් දැකීම දිව්‍යචක්ෂුර්ඥාන කෘත්‍යය යි. මොවුහු කවර නම් පින් කොට මෙසේ උපදිත් දැ යි කර්මාරම්මණඥානය ඇතිකරගැනීම යථාකම්මූපග ඤාණය යි. එසේ ද වුවත් මෙය අමුතු නුවණක් නොව දිබ්බචක්ඛුඤාණයෙහිම විශෙෂයකැයි සැලකිය යුතු.

**ආසවානං ඛයා අනාසවං —**

ආශ්‍රවක්ෂයකරඥානය නම්:- සියලු කෙලෙසුන් දුරු කිරීමෙන් චෙතොවිමුත්ති (අර්හත් ඵල සමාධිය) පඤ්ඤාවිමුත්ති (අර්හත් ඵල ප්‍රඥාව) ප්‍රත්‍යක්ෂ කොට දත් අර්හත්වය යි එහෙයින් මේ සූත්‍රයෙහි ත්‍රිවිද්‍යානාමයෙන් දැක්වූයේ පූර්වේනිවාසානුස්මෘති විද්‍යාව, දිව්‍යචක්ෂුරභිඥාන විද්‍යාව හා අර්හත්මාර්ගඥාන විද්‍යාව යි.

**දහවෙනි සූත්‍ර විවරණය නිමි.**

**පස්වෙනි වර්ගය නිමි.**

**තිකනිපාතය සමාප්ත යි.**

# චතුක්ක නිපාතො

## 4 - 1

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං,**

අහමස්මි භික්ඛවෙ බ්‍රාහ්මණො, යාචයොගො, සදා පයතපාණි, අන්තිමදෙහධරො, අනුත්තරො භිසක්කො සල්ලකත්තො, තස්ස මෙ තුම්හෙ පුත්තා ඔරසා මුඛතො ජාතා, ධම්මජා, ධම්මනිම්මිතා, ධම්මදායාදා නො ආමිසදායාදා,

ද්වෙමානි භික්ඛවෙ දානානි; **ආමිසදානං ච ධම්මදානඤ්ච,** එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං දානානං යදිදං ධම්මදානං, ද්වෙමෙ භික්ඛවෙ සංවිභාගා; **ආමිසසංවිභාගො ච ධම්මසංවිභාගො ච.** එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සංවිභාගානං යදිදං ධම්මසංවිභාගො, ද්වෙ මෙ භික්ඛවෙ අනුග්ගහා; **ආමිසානුග්ගහො ච ධම්මානුග්ගහො ච** එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං අනුග්ගහානං යදිදං ධම්මානුග්ගහො, ද්වෙමෙ භික්ඛවෙ යාගා; **ආමිසයාගො ච ධම්මයාගො ච,** එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං යාගානං යදිදං ධම්මයාගොති. එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"යො ධම්මයාගං අයජී අමච්ඡරී
තථාගතො සබ්බභූතානුකම්පී
තං තාදිසං දෙවමනුස්සසෙට්ඨං
සත්තා නමස්සන්ති භවස්ස පාරගූ"න්ති-

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත'න්ති

## 4 - 1

**අර්ථය:-**

**අහං**, මම; **යාචයොගො**, යාච්ඤා කිරීමට යොග්‍යවූ; ("දෙසෙතු භන්තෙ භගවා ධම්මං, දෙසෙතු සුගතො ධම්මං" යනුවෙන් දහම් දෙසීම සඳහා ශ්‍රාවකයන් විසින් කරනුලබන ඉල්ලීම් පිළිගැනීමට සුදුසු වූ ය යුසේ යි.)

**පයතපාණි**, පිරිසිදු අත් ඇති (ආමිස දානයක් දෙන්නහුගේ අත් හැමකල්හි පිරිසිදු ය. භාග්‍යවතුන් වහන්සේ ද වෛනෙය ලෝකයාට හැමකල්හි නොමසුරුවම ධර්මදානය බෙදුදීමෙහි යෙදුණු සේකැ යි දක්වූ අයුරු යි ) **අන්තිම දෙහධාරො**, පශ්චිම ශරීරය දරන්නාවූ; **අනුත්තරො භිසක්කො**, උතුම් භිෂග්වරයෙක් වූ; (දහම් නමැති අමා ඔසු දෙන හෙයිනි) **සල්ලකත්තො**, ශල්‍යවෛද්‍යවරයෙක් වූ (රාගාදි උල් උදුරන හෙයිනි) **බ්‍රාහ්මණො අස්මි**, බමුණෙක් වෙමි; (බාහිතපාප ඇති හෙයින් හෙවත් බැහැර කළ පව් ඇති හෙයින් පරමාර්ථ වශයෙන් බමුණෙක් වෙමි යුසේ යි වේද මන්ත්‍රයන් හදාරන හෙයින් ද බ්‍රාහමණ ය යි කියනු ලැබේ. ඔවුහු සම්මුති බ්‍රාහමණයෝ යි ඔවුන් විසින් බමුණන් සඳහා පනවන ලද යාගාදි ෂට්කර්මයෝ ඇත්තාහ. සම්ස්කාරයෙන් පරිපූර්ණ වූ දාන සංයම ආදි ගුණ ඇති, තපස්වයීයෙහි පරතෙරට පැමිණි වැස නිමවූ බඹසර වස් ඇති, සියල්ල දත් නුවණ ඇති, පිරිසිදු විද්‍යාචරණ ගුණ ඇති, සෝදා හරින ලද පාප මල ඇති, උතුම් ආර්‍ය මාර්ග සඞ්ඛ්‍යාත ශ්‍රෙෂ්ඨ ලොකොත්තර ධර්මය හා පිරිසිදු ශාසන බ්‍රහමචර්යාව ප්‍රකාශ කළ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ තමන් වහන්සේගේ අනුත්තර බ්‍රාහමණයන්ගේ ෂට්කර්මය මෙන් තමන් වහන්සේගේ ද ෂට්කර්මයක් ඇති බව ප්‍රකාශ කරනු සඳහා යාචයොගො-පෙ-සල්ලකත්තො යි වදාළ අයුරු යි ) **තුම්හෙ**, තුඹලා; **ඔරසා**, ඖරසවූ; (ළෙහි උපන් පුත්‍රයෝ ඔරස නම්. ඔවුහු පියසතු උරුමයට කොටස්කාරයෝ වෙත්. ආර්‍ය පුද්ගලයෝ ද භාග්‍යවත්හුගේ දම්දෙසුම් කෙළවර චතුරාර්‍යසත්‍යය අවබෝධ කිරීමෙන් ආර්‍යජාතියට ඇතුළත්ව විමුක්ති සැපයට හිමියන් වන හෙයින් ඖරස නම් වෙති යි කී අයුරු යි. නැතහොත් භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදෙශනානුභාවයෙන් ආර්‍යභූමියට බැසගත් ශ්‍රාවකයෝ අප්‍රමාද විහරණයෙන් යුත් හෙයින් විශෙෂයෙන් ඖරස පුත්‍රහ යි කිවයුතු වෙත්. භාග්‍යවතුන් වහන්සේ විසින්

ඔවුන්ගේ ආසය අනුසය චරිත අධිමුක්ති ආදිය ගැන සැලකීමෙන් ඔවුන්ගේ චරිත්‍ර අදහස් දැන ඔවුන් වරදෙන් බේරා නිවරද තන්හි පිහිටුවීමෙන් ශීලාදි ගුණධර්ම වලින් පෝෂණය කරනුලබන හෙයින් ද ඖරස නම් වෙති යි දක්වූ අයුරු යි.) **මුඛතො ජාතා**, ආර්‍යජාතියෙහි උපන්නා වූ (සියලු කුශලයන්ට ප්‍රමුඛවූ ප්‍රාතිමෝක්ෂ ශීල සංවරමුඛයෙන් හෝ ව්‍යුත්ථානගාමිනී විදර්ශනා සංඛ්‍යාත විමෝක්ෂමුඛයෙන් හෝ උපන් හෙයින් මුඛතොජාත නම් වෙති) **ධම්මජා**, ධර්මයෙන් උපන්නාවූ; (ශාසන ධර්මයෙහි නොහොත් ආර්‍යමාර්ග ධර්මයෙහි උපන්නාවූ ය යු සේ යි) **ධම්මනිම්මිතා**, ධර්මයෙන් මැවුණාවූ; **ධම්මදායාදා**, ධර්මයට දායාද වූ; **නො ආමිසදායාදා**, ආමිෂයට දායාද නොවන්නාවූ **මෙ**, මාගේ; **පුත්තා භොථ**, පුත්‍රයෝ වව්; සෙස්ස සුගම යි

**සබ්බසත්තානුකම්පී**, සියලු සත්වයන් කෙරෙහි අනුකම්පා කරන්නාවූ; **යො තථාගතො**, යම් බුදුවරයෙක්; **අමච්ඡරී**, ධර්ම මාත්සර්යයක් නැතිව; **ධම්මයාගං**, ධර්මදානය; **අයජි**, දුන්නේ ද; **දෙවමනුස්සසෙට්ඨං**, දෙව්මිනිසුන් අතුරෙහි ශ්‍රෙෂ්ඨවූ; **භවස්ස පාරගුං**, සසර පරතෙරට පැමිණියා වූ; **තාදිසං**, එබඳු ගුණ ඇති **තං**, උන්වහන්සේට; **නමස්සන්ති**, වඳිත්;

**භාවය** සුගම යි.

**ධර්මවිස්තර**:—

**ධම්මදායාද, ආමිසදායාද** —

මෙහි ධර්මය ද ආමිෂය ද දෙවැදෑරුම් දෙවැදෑරුම් ම වෙයි නිෂ්පර්‍යායධර්මය - පර්‍යායධර්මය, නිෂ්පර්‍යායාමිෂය - පර්‍යායාමිෂය කියා යි. "නිෂ්පර්‍යාය" යනු විශේෂය ප්‍රධානය යන අර්ථ යි "පර්‍යාය" යනු අප්‍රධානය සාමාන්‍යය යන අර්ථ යි නවලොකොත්තරධර්මය නිෂ්පර්‍යාය යි නිවන් පතා දන්දීම, සිල් සමාදන්වීම, පෙහෙවස් විසීම, බුද්ධ පූජා කිරීම, බණ කීම, බණ ඇසීම, ධ්‍යාන ඉපදවීම, ආදි මේ කුසල් නිවනට උපනිශ්‍රය වන හෙයින් පර්‍යාය ධර්ම යි.

චිවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානපච්චය යන මේ සිව්පසය නිෂ්පය්‍යාය වශයෙන් ම ආමිෂයට අයත් වෙයි. භවසම්පත් පතමින් දන්දීම් ආදි කුසල් කෙරේ නම් එයින් දෙව්මිනිස් සැප ලැබීම පය්‍යායාමිෂය යි.

මේ දෙක ම භාග්‍යවතුන්වහන්සේ අයත් වෙති. උන්වහන්සේ විසින් වදාළ බැවින් භික්ෂූහු භාවනා කොට මග පල නිවන් ලබත්. උන් වහන්සේ වදාළ බැවින් නිවන් පතා දන්දීම් ආදිය ද කෙරෙත්. "අනුජානාමි භික්ඛවෙ ගහපති චීවරං, යො ඉච්ඡති සො පංසුකූලිකො හොතු, යො ඉච්ඡති ගහපති චීවරං සාදියතු, ඉතරීතරෙනපාහං භික්ඛවෙ සන්තුට්ඨිං එව වණ්ණෙමි" යනුවෙන් මහණෙනි, දායකයන් විසින් පිරිනමනුලබන සිවුරක් පිළිගැනීමට අවසර දෙමි. යමෙක් පංසුකූල චීවරයක් පිළිගැනීමට කැමැති නම් එසේත් පිළිගනීවා, යමෙක් ගෘහපති චීවරයක් කැමැති නම් එසේත් පිළිගනීවා, ඉතරීතර චීවරසන්තොෂය හෙවත් දළවූ හෝ සියුම් වූ හෝ රෞද්‍ර වූ හෝ ප්‍රණීත වූ හෝ අලුත් වූ හෝ පරණ වූ හෝ ලැබෙන සිවුරකින් සතුටුවීම පමණක් වර්ණනා කෙරෙමි යි වදාළ බැවින් භාග්‍යවතුන් වහන්සේගේ අවසරය ලෙස භික්ෂූහු මෙසේ චීවර ප්‍රත්‍යය පරිභොගයට කැමැති වෙත්. සෙසු ප්‍රත්‍යයන් ගැන ද මෙසේ ය භවසම්පත් කැමැතිව හෝ පින්දහම් කොට පය්‍යායාමිෂය වශයෙන් දිව්‍ය මනුෂ්‍ය සම්පත් ලබත්

එහෙයින් නිෂ්පය්‍යාය ධර්මය හා පය්‍යාය ධර්මයත් නිෂ්-පය්‍යායාමිෂය හා පය්‍යායාමිෂයත් යන දෙකේ ම ස්වාමිත්වය භාග්‍යවත්හු අයත් බැවින් මෙදෙකින් තමහට අතිශය හිත සැප පිණිස වැඩදායක වනු පිණිස පවත්නා දෙය තමන් ම තෝරා බේරාගෙන එහි ඔවුන් යොදවනු සඳහා "තස්ස මෙ තුම්හෙ පුත්තා ඔරසා -පෙ නො ආමිසදායාදා" යනු වදාළහ.

මේ සූත්‍රයෙන් බුදුහු තමන් වහන්සේගේ අනුත්තර පරමාර්ථ බ්‍රාහමණභාවය හා ආය්‍යශ්‍රාවකයන් තමන් වහන්සේගේ ඖරස පුත්‍රයන් වන බවත් ප්‍රකාශ කළසේක.

**පළමු වන සූත්‍ර විවරණය යි.**

## 4 - 2

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

චත්තාරිමානි භික්ඛවෙ අප්පානි චෙව සුලභානි ච තානි ච අනවජ්ජානි, කතමානි චත්තාරි? **පංසුකූලං** භික්ඛවෙ චීවරානං අප්පං ච සුලභඤ්ච තං ච අනවජ්ජං, **පිණ්ඩියාලොපො** භික්ඛවෙ භොජනානං අප්පං ච සුලභඤ්ච තඤ්ච අනවජ්ජං, **රුක්ඛමූලං** භික්ඛවෙ සෙනාසනානං අප්පං ච සුලභං ච තඤ්ච අනවජ්ජං, **පූතිමුත්තං** භික්ඛවෙ භෙසජ්ජානං අප්පං ච සුලභං ච තඤ්ච අනවජ්ජං,

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අප්පානිචෙව සුලභානි ච තානි ච අනවජ්ජානි, යතො ඛො භික්ඛවෙ භික්ඛු අප්පෙන ච තුට්ඨො හොති සුලභෙන ච, ඉමස්සාහං අඤ්ඤතරං සාමඤ්ඤඞ්ගන්ති වදාමි.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"අනවජ්ජෙන තුට්ඨස්ස අප්පෙන සුලභෙන ච
න සෙනාසනමාරබ්භ චීවරං පානභොජනං
විඝාතො හොති චිත්තස්ස දිසා න පටිහඤ්ඤති
යෙ චස්ස ධම්මා අක්ඛාතා සාමඤ්ඤස්සානුලොමිකා
අධිග්ගහිතා තුට්ඨස්ස අප්පමත්තස්ස සික්ඛතො"ති

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතං ති

## 4 - 2

අර්ථය:-

**ඉමානි චත්තාරි**, මේ සතර; **අප්පානි ච එව**, ස්වල්පද වෙත් **සුලභානි ච**, සුලභ ද වෙත්; **තානි**, ඔවුහු; **අනවජ්ජානි ච**, නිරවද්‍ය ද වෙත්; පෙ- **යතො ච ඛො**, යම් හෙයකින් වනාහි; **භික්ඛු**, මහණ තෙම; **අප්පෙන ච**, අල්ප දෙයින් ද; **සුලභෙන ච**. සුලභ දෙයින් ද; **තුට්ඨො හොති**, සතුටු වේ ද; **අහං**, මම; **ඉදං**, මේ චතුර්විධ සන්තෝෂය; **ඉමස්ස**, මේ භික්ෂුහුගේ; **අඤ්ඤතරං සාමඤ්ඤඞ්ගං ඉති**, එක්තරා ශ්‍රමණ ගුණාංගයකැ යි **වදාමි**, කියමි.

**අනවජ්ජෙන**, නිරවද්‍යවූ; **අප්පෙන**, ස්වල්ප වූ **සුලභෙන ච**, සුලභ ද වූ (සිවුපසයෙන්) **තුට්ඨස්ස**, සතුටුවූ; වත්නා වූ භික්ෂුවට; **සෙනාසනං ආරබ්භ**, සෙනසුනක් නිසා හෝ; **චීවරං**, සිවුරක්; **පානභොජනං**, පියයුතු පැනක් බුදියයුතු ආහාරයක් නිසා හෝ; **චිත්තස්ස**, සිතට; **විඝාතො**, දුකෙක්; **න හොති**, නොවේ; **දිසානපපටිහඤ්ඤති**, දිශාවන් හා සිත නොගැටේ;

**සාමඤ්ඤස්සානුලොමිකා**, ශ්‍රමණ භාවයට අනුකූල වූ; **යෙ ධම්මා**, යම් ප්‍රතිපත්ති ධර්ම කෙනෙක්; **අක්ඛාතා**, වදාරන ලද්දාහු ද; (ඒ ධර්මයෝ) **තුට්ඨස්ස**, ලදදෙයින් සතුටු වූ; **අප්පමත්තස්ස**, අප්‍රමාද වූ; **සික්ඛතො**, හික්මුණා වූ; **අස්ස**, මේ භික්ෂුව විසින්; **අධිගහිතා**, සිත්හි ඇතුළත් කරන ලද්දාහු ය.

භාවය:- සුගම යි.

**ධර්මවිස්තර:-**

**අප්පානි, සුලභානි, අනවජ්ජානි,**

මේ පදත්‍රය චීවර පිණ්ඩපාත සෙනාසන පූතිමුත්ත භෙසජ්ජ යන සතරප්‍රත්‍යය හා සම්බන්ධ යි. සුලභ බැවින් සොයාගැනීම සඳහා දුකක් ඇති නොවේ. ස්වල්ප බැවින් ප්‍රයෝජන ගැනීමට කරදරයක් නොවේ. නිරවද්‍ය බැවින් හා ගැරහුම්බවට පත් නොවන හෙයින් ද භික්ෂූන්ට යෝග්‍ය බව දක්වන ලද්දේ ය.

එසේ ම ස්වල්ප බැවින් තෘෂ්ණාගැනීමට හේතුවක් නොවේ. සුලභ බැවින් ආශායෙන් බැඳීමක් නොවේ නිරවද්‍ය බැවින් අයුක්ත වශයෙන් කල්පනා කොට නිස්සරණාධ්‍යාශය ඇතිකර ගැනීමට හේතු වේ. ස්වල්ප බැවින් යථාලාභ වශයෙන් ලැබීමෙහි අමුතු සොම්නසක් නූපදී. සුලභ බැවින් නොලැබීම ගැන දොම්නසක් ද නො උපදී නිරවද්‍ය බැවින් විපිළිසරයට හේතු වූ අනුවණ හැඟීමක් ද නො උපදී.

පංසුකූල චීවරය අලොභනීය බැවින් සිවුර ආරක්ෂා කර ගැනීමෙහි දුෂ්කරත්වයක් ඇති නොවේ. අනුන් අයත් පැවතුම් නැතිබවෙක් වේ. සොරබියෙන් කරදරයක් නොවේ වෙසෙසින් ම රූක්ෂබැවින් පරිභොගයෙහි තණ්හාවක් ඇති නොවේ ශ්‍රමණ සාරූප්‍ය පරිෂ්කාරයෙක් ද වේ වටිනාකමින් අඩු හෙයින් අල්ප වේ එකතැනකින් ම නොලැබිය හැකි හෙයින් සුලභ වේ. එහෙයින් නිරවද්‍යවූම ප්‍රත්‍යයෙකි.

**පංසුකූල, පූතිමුත්තභෙසජ්ජ,**

වීථියෙහි දැමූ රෙදිකඩ, සොහොනෙහි කිසිවකු විසින් හළ රෙදිකඩ, කසළගොඩක දැමූ රෙදිකඩ, යන මේ වස්ත්‍රවල ධූලි පස් ආදිය තැවරිය හැකි හෙයින් පිළිකුල් බවට යේනු යි පංසුකූල නම්. මෙයින් හදාගත් සිවුරු **පංසුකූල** චීවරයෝ යි.

**පූතිමුත්ත** නම් ගොමූත්‍ර යි. සවර්ණ වර්ණ ශරීරයත් පූතිකාය වශයෙන් සලකන්නාක් මෙන් ගොනුන් හා දෙනුන්ගේ අලුත් මූත්‍රත් පූතිමුත්ත වේ ඇතැම් ආචාර්ය කෙනෙක් අරළුකඩක් බහාලූ ගොමූත්‍රයට ද පූතිමුත්තයයි කියත් තවත් ආචාර්ය කෙනෙක් සල්පිල්වලින් තරක් වී අහක දමන බෙහෙතටත් පූතිමූත්ත යයි කියත්.

මෙසේ අල්ප බැවින් සුලභ බැවින් සතුටුවීම භික්‍ෂුවක් පිළිබඳ සීලසංවරාදීන් අතුරෙහි එක්තරා ශ්‍රමණ ගුණාංගයෙකි, "සන්තුට්ඨස්ස හි චතුපාරිසුද්ධිසීලං සුපරිපුණ්ණං හොති සමථවිපස්සනා ච භාවනා පාරිපූරිං ගච්ඡන්ති" යනු දැක්වූ හෙයින් සන්තුෂ්ට ගුණයෙන් යුත් භික්‍ෂුවට සිව් පිරිසුදු ශීලය සම්පූර්ණ වෙයි. සමථ විපස්සනා භාවනා ද වැඩේ

ශ්‍රමණභාවය පිළිබඳ බාහිරාධ්‍යාත්මික වශයෙන් අංග දෙකෙකි බාහිර වශයෙන් නම්, සත්පුරුෂාශ්‍රය ධර්ම ශ්‍රවණය යන දෙක ද ආධ්‍යාත්මික වශයෙන් නම්, යොනිසො මනසිකාරය හා ධර්මානුධර්මප්‍රතිපත්තිය ද යන දෙක යි.

මේ ගුණවලට මුල්වන්නේ අලෝභවජ්ඣබව, සන්තුෂ්ටබව, විවේකයට කැමතිබව, පුද්ගලයකු හෝ සමූහයක් සමග නොගැටුනු පැවතුම් ඇතිබව, ඇරඹූ වීය්‍ර්‍ය ඇතිබව යන මේ කරුණු යි. මේ සූත්‍රයෙහි "ඉදමස්සාහං අඤ්ඤතරං සාමඤ්ඤඞ්ගන්ති වදමි" යි වදාළේ එහෙයිනි.

**දෙවන සූත්‍ර විවරණය යි.**

## 4 - 3

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතා ති මෙ සුතං

ජානතො අහං භික්ඛවෙ පස්සතො ආසවානං ඛයං වදාමි. නො අජානතො නො අපස්සතො, කිඤ්ච භික්ඛවෙ ජානතො කිං පස්සතො ආසවානං ඛයො හොති? **ඉදං දුක්ඛ**න්ති භික්ඛවෙ ජානතො පස්සතො ආසවානං ඛයො හොති, **අයං දුක්ඛසමුදයොති** භික්ඛවෙ ජානතො පස්සතො ආසවානං ඛයො හොති, **අයං දුක්ඛනිරොධොති** භික්ඛවෙ ජානතො පස්සතො ආසවානං ඛයො හොති, **අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති** භික්ඛවෙ ජානතො පස්සතො ආසවානං ඛයො හොති. එවං ඛො භික්ඛවෙ ජානතො එවං පස්සතො ආසවානං ඛයො හොතී'ති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති

"සෙඛස්ස සික්ඛමානස්ස උජුමග්ගානුසාරිනො
ඛයස්මිං පඨමං ඤාණං තතො අඤ්ඤා අනන්තරා
තතො අඤ්ඤා විමුත්තස්ස විමුත්තිඤාණ මුත්තමං
උප්පජ්ජති ඛයෙ ඤාණං ඛීණා සංයොජනා ඉති
න ත්වෙ ඉදං කුසීතෙන බාලෙන අවිජානතා
නිබ්බානං අධිගන්තබ්බං සබ්බගන්ථප්පමොචන'න්ති

අයම්පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

**අර්ථය :-** **4 - 3**

**ජානතො**, දන්නාහට; **පස්සතො**, දක්නාහට; **ආසවානං** කෙලෙසුන්ගේ; **ඛයං**, දුරුකිරීම; **වදාමි**, කියමි; **අජානතො**, නොදන්නාහට; **නො**, නොකියමි; **අපස්සතො**, නොදක්නාහට; **නො**, නොකියමි; **කිඤ්ච ජානතො**, කුමක් දන්නාහට; **කිං පස්සතො**, කුමක් දක්නාහට; **ආසවානං**, ආශ්‍රවයන්ගේ **ඛයො හොති**, ක්‍ෂය කිරීම වේ ද? යත්;
**සෙස්ස** සුගම යි.

සෙඛස්ස යනාදි ගාථායෙහි අර්ථය තිකනිපාත 2 - 3. සූත්‍රයෙහි ලියා ඇත.

**තතො**, ඉක්බිති; **අඤ්ඤා**, අර්හත් ඵලයෙන්; **විමුත්තස්ස**, මිදුණා වූ ආයර්‍ය පුද්ගලයාහට; **උත්තමං**, උතුම් වූ; **විමුත්ති ඤාණං**, විමුක්තිඥානය වූ; **සංයොජනා**, කෙලෙස්; **ඛීණා ඉති**, දුරු කරනලද යි; **ඛයෙ ඤාණං**, ආයර්‍යමාර්ග ඥානය; **උප්පජ්ජති**, උපදියි.

**කුසීතෙන**, මැළිවූ; **අවිජානතා**, අඥානවූ; **බාලෙන**, පෘථග්ජනයා විසින්; **සබ්බගන්ථප්පමොචනං**, සියලු කෙලෙසුන් කෙරෙන් මිදුණාවූ; **ඉදං නිබ්බානං**, මේ නිවන; **න තු එව අධිගන්තබ්බං**, අවබොධ නොකළ හැකිම ය;
**භාවය** සුගම යි.

**ධර්මවිස්තර :-**

**ජානතො, පස්සතො** —

මේ වචන දෙක්හි අකුරුවලින් වෙනස මුත් අර්ථයෙන් වෙනසෙක් නොවේ ඤාණය නම්, දැනීම ලක්‍ෂණ කොට ඇත්තේ ය. පස්සනය, දැකීම ලක්‍ෂණ කොට ඇත්තේ ස. යොනිසො මනසිකාරයෙන් දක්නා තැනැත්තේ ඇසින් රූපය දකින්නාක් මෙන් සියලු සංසකාර ධර්මයන්ගේ ත්‍රිලක්‍ෂණය විදසුන් නුවණින් දකියි. එයම ආශ්‍රවක්‍ෂයට හේතු වෙයි.

එසේ ද වුවත් **‘ජානතො’** යන්නෙන් අනුබෝධ ඥානයෙන් දක්නාහට යන අර්ථය ද, **‘පස්සතො’** යන්නෙන් ප්‍රතිවේධ ඥානයෙන් දක්නාහට යන අර්ථය ද, ප්‍රතිලෝම වශයෙන් ගත්කල **‘පස්සතො’** යන්නෙන් සෝවාන් මාර්ග ඥානයෙන් දක්නාහට යන අර්ථය ද, **‘ජානතො’** යන්නෙන් භාවනා මාර්ගයෙන් දක්නාහට යන අර්ථය ද, ගතහැකි වෙයි යනු එක් ආචාර්‍ය්‍යමතයකි.

ඇතැම්කෙනෙක් **ජානතො** යන්නෙන් ඤාත තීරණ පහාන යන ත්‍රිවිධපරිඥායෙන් දක්නාහට යන අර්ථය ද, **පස්සතො** යන්නෙන් සිඛාප්‍රාප්ත විදර්ශනායෙන් හෙවත් බලවත් විදර්ශනායෙන් දක්නාහට යන අර්ථය ද කියත්. නැතහොත් දුක පිරිසිඳ දැනීමෙන් දක්නාහට යි ද, නිරොධය ප්‍රත්‍යක්ෂ කිරීම් වශයෙන් දක්නාහට යි ද අර්ථ කියති. මෙදෙක ගත් කල්හි පහාන භාවනා දෙක්හි අවබෝධය ස්වයංසිද්ධ හෙයින් මෙයින් චතුස්සත්‍යාවබෝධය කියන ලද්දේ වෙයි.

දැනීම් හා දැකීම් ද විවිධ ය. ඒ විවිධ දැනීම් සියල්ල ම ආශ්‍රවක්ෂයට හේතු නොවේ. ඇතැම් භික්‍ෂු කෙනෙක් මුසුන් බැඳීම, නල්අතු බැඳීම, ඡත්‍ර බැඳීම, සිවුරු කඩ කැපීම, ගෙත්තම් පත්තම් කිරීම කරවීම් ආදි කුදුමහත් කටයුතු වල ද, බණපොත් ලිවීම්, පිරිත් පොත් ලිවීම්, පිරිත් මණ්ඩප සෑදීම්, බණපොත් මුද්‍රණය කරවීම් ආදි කටයුතුවල ද දක්‍ෂයෝ වෙති. එය ලාභ ප්‍රයෝජන කීර්ති ප්‍රශංසාපෙක්‍ෂා රහිතව වතක් වශයෙන් කරන භික්‍ෂුවට මාර්ගඵලාවබොධයට පදස්ථාන (සමීපහේතු) නොවන්නේ ය යි නොකිව හැකි යි.

මේ දුක යයි මාර්ගඥානයෙන් පිරිසිඳ අවබෝධ කරන්නාහට ද, එසේම දුඃඛහේතු, සුඛ, සුඛ හේතු පිරිසිඳ දක්නාහට ද ආශ්‍රවක්‍ෂයෙහි නුවණ ඇතිවෙයි. ආශ්‍රවයන් අතුරෙහි දිට්ඨාසවය සෝවාන් මාර්ගඥානයෙන් ද, කාමාසවය අනාගාමි මාර්ගඥානයෙන් ද, භවාසවය හා අවිජ්ජාසවයන් අර්හත්මාර්ග ඥානයෙන් ද, ක්‍ෂය වේය යි දතයුතු.

"විමුක්තිඥානය" නම්:- ඵලය හා නිවනත් ගැන සලකන පච්චවෙක්ඛණ ඤාණය යි "ඛයෙඤාණ" නම් ආශ්‍රව නම්වූ කෙලෙසුන් දුරු කරන නුවණ යි. "ඛීණා සංයොජනා ඉති ඤාණං ඛයෙ ඤාණං" යනු සම්බන්ධකොට ගැනීමෙන් මවිසින් සංයෝජනයෝ දුරුකරන ලදහ යි සලකන ආර්‍යමාර්‍ගඥානය ඛයෙඤාණ නමින් ව්‍යවහාර වෙයි. "කිලෙසක්ඛයකරෙ අරියමග්ගෙ ඤාණං" යනු ඒ සඳහා **අර්ථශාලිනියෙහි** කියනලද අයුරු යි

මෙහි කියනලද්දේ පහීනකිලෙස පච්චවෙක්ඛණ ඤාණය යි. හෙවත් දුරු කළ කෙලෙසුන් ගැන සැලකීමේ නුවණ යි. ඒ ඒ මාර්‍ගඵල ප්‍රාප්තවූ ආර්‍ය පුද්ගලයන්ගේ ප්‍රත්‍ය වෙක්ෂාඥාන පසෙකි. එනම්:- මග්ගපච්චවෙක්ඛණ, ඵල පච්ච වෙක්ඛණ, පහීනකිලෙසපච්චවෙක්ඛණ, අවසිට්ඨකිලෙස පච්චවෙක්ඛණ, නිබ්බානපච්චවෙක්ඛණ යන පස යි.

මෙසේ මෙසේ විදසුන් වඩා මේ මාර්‍ගයට පැමිණියෙමි. ඵලයට පැමිණියෙමි. එහිදී මේ මේ කෙලෙසුන් දුරු කෙළෙමි. මේ මේ කෙලෙසුන් දුරු කරන්නට තව ඉතිරිව ඇත්තේ ය. මාර්‍ගඵලයන්ට අමුරණු වූයේ නිවන ය යි පස් ආකාරයකින් සැලකීම යි. රහත් ඵලයට පැමිණි ආර්‍ය පුද්ගලයාහට අවසිට්ඨකිලෙස පච්චවෙක්ඛණයක් නැත. අර්හත්ඵලාවබෝධ- යෙන් ඉතිරි වන ක්ලේශයක් නැති හෙයිනි. මෙසේ ප්‍රත්‍යවෙක්ෂාඥාන එකුන් විස්සෙක් හෙවත් දහනවයෙක් වෙයි.

**තුන්වන සූත්‍ර විවරණය යි.**

## 4 - 4

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

යෙහි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහමණා වා **ඉදං දුක්ඛන්ති** යථාභූතං **නප්පජානන්ති**, අයං **දුක්ඛසමුදයොති** යථාභූතං **නප්පජානන්ති**, අයං **දුක්ඛනිරොධොති** යථාභූතං නප්පජානන්ති, අයං **දුක්ඛනිරොධගාමිනී පටිපදාති** යථාභූතං **නප්පජානන්ති**. න මෙ තෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහමණා වා

සමණෙසු වා සමණසම්මතා බ්‍රාහමණෙසු වා බ්‍රාහමණසම්මතා, න ච පනෙතෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති, යෙ ච ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහමණා වා ඉදං දුක්ඛන්ති යථාභූතං **පජානන්ති**, අයං දුක්ඛසමුදයොති යථාභූතං **පජානන්ති**, අයං දුක්ඛනිරොධොති යථාභූතං **පජානන්ති**, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං **පජානන්ති**, තෙ ඛො මෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහමණා වා සමණෙසුචෙව සමණසම්මතා, බ්‍රාහමණෙසු ච බ්‍රාහමණසම්මතා, තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහමඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

එතමත්ථං භගවා අවොච, තත්ථේතං ඉති වුච්චති.

"යෙ දුක්ඛං නප්පජානන්ති අථො දුක්ඛස්ස සම්භවං
යත්ථ ච සබ්බසො දුක්ඛං අසෙසං උපරුජ්ඣති
තඤ්ච මග්ගං න ජානන්ති දුක්ඛූපසමගාමිනං
චෙතොවිමුත්තිහීනා තෙ අථො පඤ්ඤාවිමුත්තියා
අභබ්බා තෙ අන්තකිරියාය තෙ වෙ ජාතිජරූපගා
යෙ ච දුක්ඛං පජානන්ති අථො දුක්ඛස්ස සම්භවං
යත්ථ ච සබ්බසො දුක්ඛං අසෙසං උපරුජ්ඣති
තඤ්ච මග්ගං පජානන්ති දුක්ඛූපසමගාමිනං
චෙතොවිමුත්ති සම්පන්නා අථො පඤ්ඤාවිමුත්තියා
භබ්බා තෙ අන්තකිරියාය න තෙ ජාතිජරූපගා"ති

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුත්තන්ති.

**අර්ථය** :- **4 – 4**

**තෙ සමණා වා,** ඒ ශ්‍රමණයෝ හෝ: **බ්‍රාහ්මණා වා,** බමුණෝ හෝ; **සමණෙසු වා**, ශ්‍රමණයන් අතුරෙහි හෝ; **සමණසම්මතා**, ශ්‍රමණය යි සම්මත නොවෙත්; **බ්‍රාහ්මණෙසු වා** බමුණන් අතුරෙහි හෝ; **න බ්‍රාහ්මණ සම්මතා,** බ්‍රාහමණ යයි සම්මත නොවෙත්; **සාමඤ්ඤත්ථං වා,** ශ්‍රමණ සඞ්ඛ්‍යාත අර්ථය හෝ; සෙස්ස සුගම යි.

**යෙ**, යම්කෙනෙක්; **දුක්ඛං නප්පජානන්ති**, දුක නොදනිත් ද; **අථො**, නැවත; **දුක්ඛස්ස සම්භවං**, දුක්ඛ සමුදය (නොදනිත් ද) **යත්ථ**, යම් තැනෙක්හි; **සබ්බසො**, සර්වප්‍රකාරයෙන්; **දුක්ඛං**, දුක; **අසෙසං**, නිරවශෙෂයෙන්; **උපරුජ්ඣති**, නිරුද්ධවේ ද (ඒ දුක්ඛනිරොධය නොදනි ද)

**දුක්ඛූපසමගාමිනං**, දුක දුරු කරන්නාවූ; **තං ච මග්ගං**, ඒ මාර්ගයත් (දුක්ඛනිරොධගාමිනී පටිපදාව නොදනී ද) **තෙ**, ඔවුහු; **චෙතොවිමුත්තිහීනා**, චෙතොවිමුක්ති නම්වූ අර්හත්ඵල සමාධියෙන් දුරුවෙත්; **අථො**, නැවත; **පඤ්ඤාවිමුත්තියා**, අර්හත්ඵල ප්‍රඥාවෙන් (දුරුවෙත්;) **තෙ**, ඔවුහු; **අන්තකිරියාය**, දුක් කෙළවරකිරීම පිණිස; **අභබ්බා**, නුසුදුසු වෙත්; **තෙ**, ඔවුහු; **වෙ**, ඒකාන්තයෙන්; **ජාතිජරූපගා**, ජාති ජරා දුකට පැමිණියාහු ය;

**සෙස්ස** සුගම යි.

**ධර්මවිස්තර**:-

**න මෙ තෙ භික්ඛවෙ** යන ආදීන් චතුස්සත්‍ය කර්මස්ථාන යෙහි නොයෙදුණු ශ්‍රමණයෝ ප්‍රව්‍රජ්‍යාමාත්‍රයෙන් ශ්‍රමණ වනු මිස ජාති මාත්‍රයෙන් බ්‍රාහමණ ද වනු මිස

“බාහිතපාපොති බ්‍රාහ්මණො-සමචරියා සමණොති වුච්චති
පබ්බාජයත්තනො මලං-තස්මා පබ්බජිතොති වුච්චති”

යන්නෙන් දැක්වූ ශ්‍රමණ බ්‍රාහ්මණ ප්‍රව්‍රජිත ලක්‍ෂණ නැති හෙයින් ශ්‍රමණයෝ ද නොවෙත්. බ්‍රාහ්මණයෝ ද නොවෙත්. පැවිද්දෝ ද නොවෙති.

යම්හෙයකින් සිතින් බැහැරකරනලද පව් ඇති හෙයින් බ්‍රාහ්මණය යි කියනු ලැබේ ද, විසම පැවතුම් ආදියෙන් දුරුව සියලු අකුසලයන් සංසිඳුවා වසන හෙයින් ශ්‍රමණය යි කියනු ලැබේ ද, තමාගේ රාග ද්වෙෂාදි මලයන් තදඞ්ගාදි වශයෙන් දුරු කෙරේ ද, එහෙයින් ප්‍රව්‍රජිතය යි ද කියනු ලැබේ. යනු මේ ගාථාවේ අදහස යි.

**සතරවන සූත්‍ර විවරණය යි.**

## 4 – 5

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

යෙ තෙ භික්ඛවෙ භික්ඛූ සීලසම්පන්නා සමාධිසම්පන්නා පඤ්ඤාසම්පන්නා විමුත්තිසම්පන්නා විමුත්තිඤාණදස්සනසම්පන්නා ඔවාදකා විඤ්ඤාපකා සන්දස්සකා සමාදපකා සමුත්තෙජකා සම්පහංසකා අලංසමක්ඛාතාරො සද්ධම්මස්ස, දස්සනම්පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහූපකාරං වදාමි, උපසඞ්කමනම්පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහූපකාරං වදාමි, අනුස්සරණම්පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහූපකාරං වදාමි, අනුපබ්බජ්ජම්පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහූපකාරං වදාමි, තං කිස්ස හෙතු? තථාරූපෙ භික්ඛවෙ භික්ඛූ සෙවතො භජතො පයිරුපාසතො අපරිපූරොපි **සීලක්ඛන්ධො** භාවනා පාරිපූරිං ගච්ඡති, අපරිපූරොපි **සමාධික්ඛන්ධො** භාවනා පාරිපූරිං ගච්ඡති, අපරිපූරොපි **විමුත්තික්ඛන්ධො** භාවනා පාරිපූරිං ගච්ඡති, අපරිපූරොපි **විමුත්තිඤාණදස්සනක්ඛන්ධො** භාවනා පාරිපූරිං ගච්ඡති, එවරූපා ච තෙ භික්ඛවෙ භික්ඛූ සත්ථාරොතිපි වුච්චන්ති, සත්ථවාහාතිපි වුච්චන්ති, රණඤ්ජහාතිපි වුච්චන්ති, තමොනුදාතිපි වුච්චන්ති, ආලොකකරාතිපි වුච්චන්ති, ඔභාසකරාතිපි වුච්චන්ති, පජ්ජොතකරාතිපි වුච්චන්ති, උක්කාධාරාතිපි වුච්චන්ති, පභඞ්කරාතිපි වුච්චන්ති, අරියාතිපි වුච්චන්ති, චක්ඛුමන්තොතිපි වුච්චන්ති ති

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"පාමුජ්ජකරණට්ඨානං එවං හොති විජානතං
යදිදං භාවිතත්තානං අරියානං ධම්මජීවිනං
තෙ ජොතයන්ති සද්ධම්මං භාසයන්ති පභඞ්කරා
ආලොකකරණා ධීරා චක්ඛුමන්තො රණඤ්ජහා
යෙසං වෙ සාසනං සුත්වා සම්මදඤ්ඤාය පණ්ඩිතා
ජාතික්ඛයමභිඤ්ඤාය නාගච්ඡන්ති පුනබ්භව"න්ති

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති

## 4 – 5

අර්ථය:–

**සීලසම්පන්නා,** සීලයෙන් යුක්තවූවාහු ද; (ක්ෂීණාශ්‍රවයන්ගේ ලෞකික ලෝකෝත්තර සීලයෙන් ය යුසේ යි) **විමුත්තිසම්පන්නා,** අග්‍රඵල විමුක්තියෙන් යුක්තවූවාහු ය; **විමුත්තිඤාණදස්සනසම්පන්නා,** ප්‍රත්‍යවෙක්ෂණඥනයෙන් යුක්තවූවාහු ද; **ඔවාදකා,** අවවාද කරන්නාහු ද; දෘෂ්ට ධාර්මික සාම්පරායික ද්විවිධ පරමාර්ථයෙන් අනුන්ට අවවාද අනුශාසනා කෙරෙත් ද යු සේ යි) **විඤ්ඤාපකා,** ධර්මාවබෝධය කරවන්නාහු ද; (මේ කුසල් ය, මේ අකුසල් ය, මේ සාවද්‍යය, මේ අනවද්‍යය යි කුශලාදිවිභාග වශයෙන් හා ස්කන්ධාදිවිභාග වශයෙන් ද ස්වලක්ෂණ සාමාන්‍ය ලක්ෂණ වශයෙන් ද යි මෙසේ ධර්මයන් අවබෝධ කරවීමය යුසේ යි ) **සන්දස්සකා,** කරුණු පෙන්වන්නාහු ද; **සමාදපකා,** සීලාදිගුණයෙහි පිහිටුවන්නාහු ද; **සමුත්තෙජකා,** අධිචිත්තානුයෝගයෙහි හෙවත් සමථ විදර්ශනා භාවනාවෙහි සිත් තියුණු කරන්නාහු ද; **සම්පහංසකා,** ලැබුවාවූ ද මතු ලැබියයුතු වූ ද ගුණවිශේෂයන් පෙන්වීමෙන් සිත සතුටුකරන්නාහු ද; **සද්ධම්මස්ස,** ප්‍රතිවේධ සද්ධර්මය හෝ ත්‍රිවිධ සද්ධර්මය; **අලංසමක්ඛාතාරො,** ප්‍රකාශකිරීමෙහි දක්ෂවෙත් ද; **අහං,** මම; **තෙසං භික්ඛූනං,** ඒ භික්ෂූන්ගේ **දස්සනම්පි,** දැකීමත්; **බහූපකාරං වදාමි,** බොහෝ උපකාරය යි කියමි; –පෙ–**එවරූපා ච තෙ භික්ඛූ,** මෙබඳු ඒ භික්ෂූහු; **සත්ථාරො ඉති,** ශාස්තෲහු යැ යි (අනුශාසකයෝ ය යුසේ යි.) **සත්ථවාහාතිපි,** ජාතිජරාමරණ කාන්තාරයන්–ගෙන් එතර කරවන හෙයින් සාත්තුනායකයෝ ය යි ද; **රණඤ්ජහාතිපි,** රාගාදිකෙලෙසුන් දුරුකළාහු යයි ද; **තමොනුදාතිපි,** රාගාදිඅන්ධකාරය දුරුකළාහු යයි ද; **උක්කාධාරාතිපි,** ධර්මප්‍රදීප දරන්නෝ යයි ද; **පභඞ්කරාතිපි,** ධර්මාලෝකය පතුරුවන්නෝ යයි ද;

**එතං**, මේ කාරණය; **භාවිතත්තානං**, කායභාවනා චිත්තභාවනා වශයෙන් වඩනලද සිත් ඇති; **අරියානං**, ආර්‍යවූ; **ධම්මජීවිනං**, ධර්මයෙන් ජීවත්වන්නාවූ; **විජානතං**, හොඳින් දන්නවුන්ට; **යදිදං පාමොජ්ජකරණට්ඨානං**, යම් මේ ප්‍රමෝදයට හේතු වේ.

**ආලොකකරණා**, ආලෝකය ඇති කරන හෙයින්; **පභඞ්කරා**, ප්‍රභඞ්කරවූ; **ධීරා**, ධෛර්‍යසම්පන්නවූ; **චක්ඛුමන්තො**, ප්‍රඥාචක්ෂුස් ඇත්තාවූ; **රණඤ්ජහා**, කෙලෙසුන් දුරුකළාවූ; **තෙ**, ඔවුහු; **සද්ධම්මං**, සද්ධර්මය; **ජොතයන්ති** ඊ සේ සි **භාසයන්ති**, බබුළුවත්;

**පණ්ඩිතා**, ඥාණවන්තයෝ; **යෙසං**, යම් ආර්‍යයන්ගේ; **සාසනං**, අවවාදය; **සුත්වා**, අසා; **සම්මදඤ්ඤාය**, මනාකොට දැන; **ජාතික්ඛයං**, නිවන; **අභිඤ්ඤාය**, අවබෝධකොට; **පුනබ්භවං**, පුනරුත්පත්තියට; **න ආගච්ඡන්ති**, නො පැමිණෙත්;

භාවය සුගම සි

**සන්දස්සකා** යනාදි පදයන්හි සංසාරප්‍රවෘත්තිය (සසර පැවැත්ම) සංසාර නිවෘත්තිය (සසර නැවැත්ම) යන මේ දෙ ආකාරයෙන් දුක්ඛ සමුදය නිරොධ මග්ග යන චතුරාර්‍ය සත්‍යය පෙන්වීම **සන්දර්ශනය** සි චතුස්සත්‍යයන් ලක්ෂණාදි වශයෙන් සිතට නැංවීම **සමාදපනය** සි. එය අවබොධ කරගනු සඳහා උත්සාහවත් කරවීම **සමුත්තේජනය** සි. චතුස්සත්‍යාවබොධය සඳහා පිරියයුතු පිළිවෙත්හි අනුසස් පෙන්වීමෙන් සිත සතුටුකරවීම **සම්පහංසනය** සි. තමනුත් එහි ශක්තිය ඇත්තෙක්ව අනුන්ට ප්‍රකාශකිරීම **අලං සමක්ඛාතා** නම් වේ.

**අනුපබ්බජ්ජා** —

බුද්ධාදී ආර්‍යයන් කෙරෙහි සිත පහදවාගෙන උන්වහන්සේලා සමීපයෙහි පැවිදිව උන්වහන්සේලාගේ අවවාද අනුශාසනා බලාපොරොත්තුවෙන් ඔබ අනුගමනය කරන්නවුන්ගේ පැවිද්ද **අනුපබ්බජ්ජා** සි. අනුන්වෙතින්

හෝ අවවාද අනුශාසනා ලැබීමේ බලාපොරොත්තුවෙන් හැසිරෙන්නහුගේ පැවිද්ද ද **අනුපබ්බජ්ජා** යි. ආයසීයන් කෙරෙහි ඇතිකරගත් චිත්තප්‍රසාදයෙන් අනායිඅෂීවූවකු සමීපයෙහි පැවිදිව ආයසීයන් වෙත එළඹ අවවාද අනුශාසනා ලැබීමට කැමැත්තහුගේ ප්‍රව්‍රජ්‍යාව ද **අනුපබ්බජ්ජා** නම් වේ. මේ ශාසනයෙන් බැහැරවූ අන්‍ය ශාස්තෘවරයකු කෙරෙහි ප්‍රසාදයෙන් ඔවුන් වෙත පැවිදිව ඔවුන්ගේ අවවාද අනු-ශාසනා බලාපොරොත්තුවන්නහුගේ පැවිද්ද **අනුපබ්බජ්ජා** නම් නොවන්නේ ය.

මෙකියනලද ක්‍රමයෙන් පැවිද්ද ලැබූවන් අතරෙහි **මහාකාශ්‍යප** මහරහතන් වහන්සේට අනුකූලව උන්වහන්සේව අනුගමනය කෙරෙමින් පැවිදිවූවෝ ලක්‍ෂයක් පමණවූහ. උන්වහන්සේගේ සද්ධිවිහාරිකවූ **චන්දගුත්ත** සථවිරයන් වහන්සේව අනුගමනය කෙරෙමින් පැවිදිවූවෝ එමපමණම වූහ. චන්දගුත්ත සථවිරයන් වහන්සේගේ සද්ධිවිහාරික **සූරියගුත්ත** තෙරුන්ගේ ද, උන්වහන්සේගේ සද්ධිවිහාරික **අස්සගුත්ත** තෙරුන්ගේ ද, උන්වහන්සේගේ සද්ධිවිහාරික **යොනක ධම්මරක්ඛිත** තෙරුන්ගේ ද, උන්වහන්සේගේ සද්ධිවිහාරිකවූ අසෝක මහරජාණන්ගේ බාලසොහොයුරුවූ **තිස්ස** තෙරුන් වහන්සේට අනුව පැවිදිවූවෝ දෙකෝටි අඩියක් පමණ වූහ.

ද්වීපප්‍රසාදක **මහාමහෙන්ද්‍ර** මහරහතන් වහන්සේව අනුගමනය කොට පැවිදිවූවන්ගේ සංඛ්‍යානියමයක් නැත. **"යාවජ්ජ දිවසා ලංකාදීපෙ සත්ථරි පසාදෙන පබ්බජන්තා මහාමහින්දථෙරස්සෙව අනුපබ්බජන්ති නාම"** යනු **අට්ඨකථායෙහි** දැක්වූ බැවින් අද දවස දක්වා ලංකාවේ සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැහැදීමෙන් පැවිදිවන්නෝ මිහිඳු මහරහතන් වහන්සේ අනුගමනය කොට පැවිදිවූ **අනුපබ්බජිතයෝ** වෙත්. එබැවින් එබඳු ආයසීයන්ගේ දර්ශනය, ශ්‍රවණය, උපසංක්‍රමනය, අනුස්මරණය අනුප්‍රව්‍රජ්‍යාව භික්‍ෂූන්ට බොහෝ උපකාර වේ ය යි වදාළහ.

**පස්වන සූත්‍ර විවරණය යි**

## 4 - 3

### **වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති** මෙ සුතං

චත්තාරොමෙ භික්ඛවෙ **තණ්හුප්පාදා** යත්ථ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, කතමෙ චත්තාරො? **චීවරහෙතු** වා භික්ඛවෙ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, **පිණ්ඩපාතහෙතු** වා භික්ඛවෙ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, **සෙනාසනහෙතු** වා භික්ඛවෙ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, **ඉති භවාභවහෙතු** වා භික්ඛවෙ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො තණ්හුප්පාදා යත්ථ භික්ඛුනො තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජතී ති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"තණ්හාදුතියො පුරිසො දීඝමද්ධාන සංසරං
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති
එව මාදීනවං ඤත්වා තණ්හං දුක්ඛස්ස සම්භවං
වීතතණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ ති

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

## 4 - 6

අර්ථය:-

**තණ්හුප්පාදා**, තණ්හාව ඉපදීමට හේතු කාරණයෝ; **චීවරහෙතු** (මනාපවූ සිවුරු ලබමියි) සිවුරක් හේතුකොට ගෙන; **ඉති භවාභවහෙතු**, මෙසේ මෙපරිද්දෙන් (ප්‍රණීත ප්‍රණීත ගිතෙල් වෙඬරු ආදි) ග්ලාන ප්‍රත්‍යයක් ලැබීම හේතුකොටගෙන; (භවය නම් සම්පත්තිය යි, අභවය නම් විපත්තිය යි, භවය නම් වැඩිදියුණුව යි, අභවය නම් හානිය යි. ඒ නිමිතිකොටගෙනත් තණ්හාව උපදීනු යි "භවාභවහෙතු වා" යි කීහ.)

**තණ්හාදුතියො,** තෘෂ්ණාව දෙවෙනි කොට ඇති, (තණ්හාව සහාය කොට - භායසීං කොට යි ද අර්ථය ගනුලැබේ.

සසර සැරිසරන පෘථග්ජනයා එකලාව නොහැසිරෙන හෙයිනි) **පුරිසො,** පුරුෂතෙම; **දීඝමද්ධානං,** බොහෝ කලක්; **සංසරං,** හැසිරෙන්නේ; **ඉත්ථභාවඤ්ඤථාභාවං,** මේ ආත්මය හා මතු ලබන ආත්මයද යි යන; (**එත්ථ ඉත්ථභාවො** නාම අයං අත්තභාවො, **අඤ්ඤථාභාවො** නාම අනාගතත්තභාවො, එවරූපො වා අඤ්ඤොපි අත්තභාවො **ඉත්ථභාවො** නාම, න එවරූපො **අඤ්ඤථාභාවො** නාම, තං **ඉත්ථභාවඤ්ඤථාභාවං**" යනු **අංගුත්තරනිකායට්ඨකථා යි**) **සංසාරං,** සකන්ධධාතු ආයතනයන්ගේ පරම්පරාව; **න අතිවත්තති,** නො ඉක්මව යි.

**දුක්ඛස්ස සම්භවං,** දුක උපදවන්නාවූ; **තණ්හං,** තෘෂ්ණාව; **එවං ආදීනවං,** මෙබඳු දෝෂ ඇත්තේය යි (එතං ආදීනවං යි ද පාඨයි) **ඤත්වා,** දැන; **වීතතණ්හො,** පහවූ තෘෂ්ණා ඇති; **අනාදානො,** දෘෂ්ටිරහිතවූ; **සතො,** සමෘතිමත්වූ; **භික්ඛු,** මහණතෙම; **පරිබ්බජෙ;** හැසිරෙන්නේ ය; නොහොත් වාසය කරන්නේ ය.

**සෙස්ස** සුගම යි.

**සවන සූත්‍ර විවරණය යි.**

## 4 – 7

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති** මෙ සුතං

**සබ්‍රහ්මකානි** භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති, **සපුබ්බදෙවතානි** භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති, **සපුබ්බාචරියකානි** භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති, **සාහුනෙය්‍යකානි** භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති, බ්‍රහ්මාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං, පුබ්බාචරියාති භික්ඛවෙ මාතාපිතුන්නං එතං අධිවචනං, ආහු-

ණෙය්‍යාති භික්ඛවෙ මාතාපිතූන්නං එතං අධිවචනං, තං කිස්සහෙතු? බහූපකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරොති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

බ්‍රහ්මාති මාතාපිතරො පුබ්බාචරියාති වුච්චරෙ
ආහුනෙය්‍යා ච පුත්තානං පජාය අනුකම්පකා
තස්මා හි නෙ නමස්සෙය්‍ය සක්කරෙය්‍යාථ පණ්ඩිතො
අන්නෙන අථ පානෙන වත්ථෙන සයනෙන ච
උච්ඡාදනෙන නහාපනෙන පාදානං ධොවනෙන ච
තාය නං පාරිචරියාය මාතාපිතූසු පණ්ඩිතා
ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදති.

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

**අර්ථය:-** **4 - 7**

**යෙසං**, යම් කුලයන් පිළිබඳ වූ; **පුත්තානං**, දූදරුවන් විසින්; (පූජිතා යන ක්‍රියා ශබ්දයෝගය ඇති හෙයින් කරණාර්ථයෙහි ෂෂ්ඨීවචන යි.) **මාතාපිතරො**, මවුපිය දෙදෙන; **අජ්ඣාගාරෙ**, ස්වකීය ගෘහයෙහි; **පූජිතා හොන්ති**, පුදන ලද්දාහු වෙත් ද; **තානි කුලානි**, ඒ කුලයෝ; **සබ්‍රහ්මකානි**, බ්‍රහ්මයන් සහිත වෙත්; (මාතාපිතෘ පූජක කුලයෝ සබ්‍රහ්මකහ යි සේ යි) **සපුබ්බදෙවතානි**, පූර්ව දෙවියන් සහිත වෙත්; **සාහුනෙය්‍යකානි**, පිදිය යුත්තන් සහිත වෙත්; **මාතාපිතරො**, මවුපිය දෙදෙන; **පුත්තානං**, දරුවන්ට; **බහුකාරා**, බොහෝ උපකාර ඇත්තෝ වෙත්; **ආපාදකා**, ජීවිතපාලකයෝ වෙත්; **පොසකා**, (අත් පා වඩා ස්රිදී) පොෂණය කළාහු ය; **ඉමස්ස ලොකස්ස**, මේ ලෝකය; **දස්සෙතාරො**, පෙන්වූහ; (මේ ලෝකයෙහි ඉෂ්ටානිෂ්ට සියලු අරමුණු දරුවන්ට පෙන්වූහ යි සේ යි)

**මාතාපිතරො**, මවුපිය දෙදෙනා; **පුත්තානං**, දරුවන්ට **බ්‍රහ්මා ඉති**, බ්‍රහ්මහ යි ද; **පුබ්බාචරියා ඉති**, පූර්වාචාර්යහයිද; **ආහුනෙය්‍යා ච**, පිදිය යුත්තෝ යයි ද; **පජාය**, අනුප්‍රජාවට;

**අනුකම්පකා**, අනුකම්පා කරන්නෝ ය යි ද; **වුච්චරෙ**, කියනු ලැබෙත්; **තස්මා හි**, එහෙයින් ම; **පණ්ඩිතො**, නුවණ ඇති දූපුත්‍ර තෙම; **නෙ**, ඔවුන්ට; **නමස්සෙය්‍ය**, වඳින්නේ ය;

**අන්නෙන**, ආහාරයෙන් ද; **අථ**, නැවත; **පානෙන**, පානවර්ගයෙන් ද; **වත්ථෙන**, හඳනා පොරෝනා වතින් ද; **සයනෙන ච**, ඇඳ පුටු කොට්ට මෙට්ට ආදි සෙනසුන් වස්තූන්ගෙන් ද; **උච්ඡාදනෙන**, ඇඟ ඉලීමෙන් ද; **නහාපනෙන**, නැහැවීමෙන් ද; **පාදානං**, පාදයන්; **ධොවනෙන ච**, නැවීමෙන් ද (සිහිල් දියෙන් හෝ උණු දියෙන් පා සෝදා තෙල් ගැල්වීමෙන් ය යු සේ යි)

**මාතාපිතූසු**, මව්පියන් කෙරෙහි; **තාය පාරිචරියාය**, ඒ වතාවත් හේතුකොටගෙන; (තං යනු නිපාතමාත්‍ර යි.) **පණ්ඩිතා**, ඥානවන්ත සත්පුරුෂ මනුෂ්‍යයෝ; **ඉධ ච එව**, මෙලොවදීම; **නං**, ඒ මව්පියන්ට උපස්ථාන කරන දරුවාට; **පසංසන්ති**, පසසත්; **පෙච්ච**, පරලෙව්හි; **සග්ගෙ ච**, දෙව්ලොව ද; **මොදති ඉති**, සතුටුවේය යනු යි;

**ධර්මවිස්තර**:-

බ්‍රහ්ම —

"බ්‍රහ්මාති භික්ඛවෙ මාතාපිතුන්නං අධිවචනං" යි මේ සූත්‍රයෙහි ම ප්‍රකාශ වන හෙයින් බ්‍රහ්මයා බඳු පැවතුම් ඇති හෙයින් මව්පියන්ට **බ්‍රහ්ම** ය යි කියනුලැබේ මහාබ්‍රහමයා විසින් භාවනා සතරක් අත් නොහැර පුරුදු කරනලද්දහු වෙත් එනම්:- මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සතර යි. එසේ ම මව්පියන් විසිනුදු ඒ ඒ අවස්ථාවල දරුවන් කෙරෙහි මේ භාවනා සතර වඩනු ලැබෙත්.

දරුවකු කුස හොත් කල්හි කවදා නම් නීරෝගීව පිරිපුන් අඟ පසඟ ඇතිව දක්නෙමු දැ යි මව්පියන්ට මෙත් සිත උපදියි. මවුකුසින් නිරෝගීව බිහිව උඩුකුරුව ශයනය කරන දරුවා මැසි මදුරුවන්ගෙන් පීඩා ලැබ හෝ

හඬයි ද, එකල්හි කරුණාව උපදියි. දුව පැන ඇවිද සෙල්ලම් කරන දරුවාගේ සුරතල් දැක ගිතෙලෙහි දැමූ සියක්වර පිරිසිදු කළ කපුපුළුන් රොදක් මෙන් මවුපියන්ගේ සිත සතුටින් පිනා යමින් මෘදු වේ ද එකල්හි මුදිතාව උපදියි. මෙසේ දූ දරුවන් වැඩි විය පැමිණ විවාහ වී මවුපියන්ගෙන් වෙන්ව වසන කල්හි අපේ දරුවන්ට දැන් අපෙන් වෙන්ව දැහැමෙන් සෙමෙන් ජීවත්විය හැකිය යි ඔවුන් කෙරෙහි උපෙක්ෂාව හෙවත් මැදහත්කම උපදියි මෙසේ මවුපියන් දරුවන් කෙරෙහි සිව්බඹ විහරණයෙන් යුක්ත වන හෙයින් බ්‍රහ්මසදෘශ නම් වේ.

**පුබ්බාචරිය —**

මව්පියෝ දරුවන්ගේ මුල්ගුරුවරු වෙත්. ඉතා ළදරු කාලයෙහි පටන් මෙසේ හිඳගන්න, මෙසේ සිටගන්න, මෙසේ සැතපෙන්න, මෙසේ කන්න, මෙසේ බොන්න යයි යනාදීන් සියලු දෙයම උගන්වත් පියා සුළුපියා සහෝදර සහෝදරීන් හඳුන්වා දෙනු පමණක් නොවැ ඔවුන් හා කථා කරන සැටි ද කියා දෙත්. ඇසුරු කළ යුත්තන් හා නොකළ යුත්තන් ද හඳුන්වා දෙත්. එහෙයින් දෙමව් පියන් දරුවන්ගේ පෙරදුරෝ යි. මෙසේ හැදුණු වැඩුණු පසු අක්ෂර ශිල්ප ශබ්ද ශාස්ත්‍ර උගන්වන්නෝ ද, සරණ සිලාදියෙහි පිහිටුවන්නෝ ද, පැවිදි කරවන්නෝ ද. බණදහම් උගන්වන්නෝ ද. උපසම්පදා කරවන්නෝ ද කමටහන් දී භාවනා කරවා මගඵල අවබෝධ කරවන්නෝ ද පශ්චාත් ආචාය්‍යීවරයෝ වෙත්

**ආහුණෙය්‍ය —**

"ආනෙත්වා හුනිතබ්බන්ති ආහුනං" යනු හෙයින් පින් පල කැමැත්තවුන් විසින් ඈත දුරකතර සිට නමුත් ගුණවතුන් කෙරෙහි ආහාර පාන වස්ත්‍රාදියෙන් පුදනු ලැබේනු යි **ආහුන** නම්. සුසිල්වත් සඞ්ඝරත්නය එහෙයින් **ආහුණෙය්‍ය** නම් වේ. එසේ ම දරුවන්ට දෙමව්පියන් ද **ආහුණෙය්‍ය** නම් වේ.

පුබ්බදෙව —

සම්මුති උත්පත්ති විසුද්ධිදේව යයි දෙවියෝ තිදෙනෙකි. සම්මුතිදේව නම් රජහු ය උත්පත්තිදේව නම් චාතුර් මහාරාජිකයෙහි පටන් උපරිම දෙවියෝ ය. විසුද්ධිදේව නම් රහත්හු ය. මෙයින් ශ්‍රෙෂ්ඨවූවෝ විසුද්ධි දෙවියෝ ය, මොවුහු අනුවණයන් කරන අපරාධ ගණන් නොගනිත්. බ්‍රහ්මවිහාර ගුණ ඇති හෙයින් ඔවුන්ට හිත වැඩ පිණිස ම ක්‍රියා කෙරෙත්. පරම දක්ෂිණාර්හ බැවින් තමා කෙරෙහි පවත්වන සත්කාර සම්මානයන් පිළිගෙන ඔවුන්ට මහත්ඵල මහානිසංස සාධා දෙත් දරුවන්ට පළමු කොට, දෙවියන් හඳුන්වාදෙන දෙවිවරු දෙමව්පියන් බැවින් ඔවුහු පුබ්බදෙව නම් වෙත්.

මෙසේ දූ දරුවන් කෙරෙහි සලකන දෙමවුපියන්ට මෙලොව වශයෙන් කළහැකි ප්‍රත්‍යුපකාරයක් නැත්තේ ය. එසේ ද වුවත් යමෙක් ශ්‍රද්ධාව නැති මවුපියන් ශ්‍රද්ධා සම්පත්තියෙහි පිහිටුවා ද, දුස්සීලයන් සීලසම්පත්තියෙහි, මසුරන් ත්‍යාග සම්පත්තියෙහි, අනුවණයන් ප්‍රඥාසම්පත්ති යෙහි පිහිටුවා ද, මෙපමණකින් දූ දරුවන් විසින් දෙමවු පියන්ට උපකාර කරන ලද්දේ ද, ප්‍රත්‍යුපකාර කරන ලද්දේ ද, වැඩියක් උපකාර කරනලද්දේ ද වෙයි.

එසේම ''මාතාපිතු උපට්ඨානං පුත්තදාරස්ස සංගහො''- ''මාතාපිතු උපට්ඨානං භික්ඛවෙ පණ්ඩිතපඤ්ඤත්තං සප්පුරිස පඤ්ඤත්තං'' යන බුදුවදන්වලට අනුව පිළිපදනේ ද වෙයි. මෙහි අටුවාවෙන් හා සිගාලෝවාද සූත්‍රයෙන් ද විස්තර දතහැකි වෙයි.

**සත් වන සූත්‍ර විවරණය යි**

## 4 – 8

**වුත්තං හෙතං භගවතා වුත්ත මරහතා ති මෙ සුතං**

බහූපකාරා භික්ඛවෙ බ්‍රාහ්මණගහපතිකා තුම්හාකං යෙ තෙ පච්චුපට්ඨිතා චීවර පිණ්ඩපාත සෙනාසන

**ගිලානපච්චයභෙසජ්ජ පරික්ඛාරෙහි,** තුම්හෙපි භික්ඛවෙ බහූපකාරා බ්‍රාහ්මණගහපතිකානං යං තෙසං ධම්මං දෙසෙථ; ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ, එවමිදං භික්ඛවෙ අඤ්ඤමඤ්ඤං නිස්සාය බ්‍රහ්මචරියං වුස්සති; ඔඝස්ස නිත්ථරණත්ථාය, සම්මා දුක්ඛස්ස අන්තකිරියායා'ති-

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"සාගාරා අනගාරා ච උභො අඤ්ඤඤ්ඤනිස්සිතා
ආරාධයන්ති සද්ධම්මං යොගක්ඛෙමං අනුත්තරං
සාගාරෙසු ච චීවරං පච්චයං සයනාසනං
අනාගාරං පටිච්ඡන්ති පරිස්සයවිනොදනං
සුගතං පන නිස්සාය ගහට්ඨා ඝරමෙසිනො
සද්දහානො අරහතං අරියපඤ්ඤාය ඣායිනො
ඉධ ධම්මං චරිත්වාන මග්ගං සුගතිගාමිනං
නන්දිනො දෙවලොකස්මිං මොදන්ති කාමකාමිනො'ති

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

## 4 – 8

**අර්ථය :-**

**පච්චුපට්ඨිතා,** නැවත නැවත උපස්ථාන කෙරෙත්; **ඔඝස්ස නිත්ථරණත්ථාය,** චතුරොඝය දුරු කරනු පිණිස; **අඤ්ඤමඤ්ඤං නිස්සාය,** ඔවුනොවුන් ඇසුරු කොට; **බ්‍රහ්මචරියං වුස්සන්ති,** බඹසර වස් පුරයි.

**සාගාරා,** ගිහියෝ ද; **අනාගාරා** ච, පැවිද්දෝ ද යන; **උභො,** දෙපක්‍ෂය; **අඤ්ඤඤ්ඤනිස්සිතා,** ඔවුනොවුන් ඇසුරු කළාහු; **සද්ධම්මං,** ප්‍රතිපත්ති සද්ධර්මය ද; **අනුත්තරං,** උතුම්වූ; **යොගක්ඛෙමං,** අතීතවූ ප්‍රතිවෙධ සද්ධර්මය ද; **ආරාධයන්ති,** සම්පාදනය කෙරෙත්; (ගිහියෝ පැවිද්දන්

දෙන ධර්මදානය පිළිගන්නාහු ය, පැවිද්දෝ ද ගිහියන් දෙන ප්‍රත්‍යය දානය පිළිගනිමින් මෙසේ ගිහිපැවිදි දෙපක්ෂය ඔවුනොවුන් සිල්වත්ව ගුණවත්ව ඇසුරු කොට ප්‍රතිපත්ති සද්ධර්මය හා ප්‍රතිවේධ සද්ධර්මයත් පිරීමෙන් නිවන් අවබෝධ කෙරෙති යි යනු මෙහි භාව යි. එහෙයින් කීහ

**අට්ඨකථායෙහි**:–

"සාගාරා හි අනාගාරානං ධම්මදානනිස්සිතා, අනාගාරා ච සාගරානං පච්චයදානනිස්සිතා" යි)

**සාගාරෙසු**, ගිහියන්ගෙන්; (අවධි අර්ථයෙහි සප්තමී විභක්ති යි.) **පරිස්සයවිනොදනං**, උතුපරිස්සයාදි කරදර දුරු කරන්නා වූ; **චීවරං**, චීවරය ද; **පච්චයං**, සෙසු ප්‍රත්‍යය ද්වය ද (මෙයින් පිණ්ඩපාත, ගිලානපච්චයභෙසජ්ජ දෙක කියූ සේ යි) **සයනාසනං**, සෙනසුන ද; **අනාගරා**, පැවිද්දෝ; **පටිච්ඡන්ති**, පිළිගනිත්;

**ඝරමෙසිනො**, ගිහිගෙහි වසන්නා වූ, **ගහට්ඨා**, ගෘහස්ථයෝ; **සුගතං නිස්සාය**, ශොභන ගති ඇති පුද්ගලයා ඇසුරු කොට (සම්‍යක් ප්‍රතිපන්න වූ කල්‍යාණ පෘථග්ජනයා සමග අෂ්ටාර්‍ය පුද්ගල ශ්‍රාවක සංඝයා මෙහි සුගත නාමයෙන් කියනලදි ) **අරහතං**, රහතුන්; **සද්දහානො**, අදහන්නාවූ; **අරියපඤ්ඤාය**, සුවිශුද්ධ ප්‍රඥායෙන්; **ඣායිනො**, දෙවැදෑරුම් ධ්‍යානයෙන් යුක්තවූවාහු (පුග්ගලං පන නිස්සාය යනු මුද්‍රිත පොත්හි)

**ඉධ**, මෙසස්නෙහි හෝ මේ අත්බැවෙහි; **සුගතිගාමිනං මග්ගං**, සුගතිගාමී මාර්ගය වූ; **ධම්මං චරිත්වාන**, ලොවී ලොවුතුරා සැපයට හේතුවූ සීලාදිගුණධර්මයෙහි හැසිර නොහොත් ගුණදහම් පුරා; **නන්දිනො**, ප්‍රීති සොම්නසින් සතුටුවූවාහු; **දෙවලොකස්මිං**, ෂඩ්විධ කාමස්වර්ගයෙහි; **කාමකාමිනො**, යථෙප්සිත කාමවස්තු නිෂ්පත්තියෙන් කැමැතිවූවාහු; **පමොදන්ති**, සතුටු වෙත්;

**භාවය:-**

ගිහිපැවිදි දෙපක්‍ෂයෙහි ඇතිවියයුතු වූ අන්‍යොන්‍ය සම්බන්ධය ආගමානුකූලව කෙසේ පැවතිය යුතු ද? යනු මේ සූත්‍රයෙන් පැහැදිලි කෙරෙයි.

මහණෙනි, බ්‍රාහ්මණයන් හා ගෘහපතියෝ තුඹලාට මහෝපකාරී වෙත්. තුඹලාම අපගේ පුණ්‍යක්‍ෂෙත්‍රය යි ඔවුහු සිතත්. එහෙයින් ඔවුහු මතු මතු භවයෙහි ස්වර්ග සම්පත් ලැබීමට හේතුවූ දන්පින් ඔබ ඇසුරු කොට කළ යුතු ය යි සලකා චීවරාදි සිව්පසයෙන් සංග්‍රහ කෙරෙත්. මෙසේ ආමිසදානයෙන් සංග්‍රහ කරන දායකයෝ භික්‍ෂූන්ට උපකාරීහු වෙත්.

දැන් ධර්මදානයෙන් ධර්මප්‍රචාරයෙන් ධර්මානුග්‍රහයෙන් භික්‍ෂූන්ගෙන් ද ඔවුන්ට උපකාර ලැබිය යුතු බව දක්වනු සඳහා **තුම්හෙපි භික්ඛවෙ** යන ආදිය වදාළහ. එයින් කුමක් දේශනා කරන ලද ද යත්?

මහණෙනි, යම්හෙයකින් මේ දායකයෝ තුඹලාගේ නෑයෝ නොවෙත් ද, මිතුරෝ නොවෙත් ද, තුඹලා හා ගනුදෙනු කරන්නෝ නො වෙත් ද, එසේ නම්:- මේ ශ්‍රමණයෝ යහපත් මාර්ගයෙහි ගමන් කරන්නෝ ය, මනා පිළිවෙතෙහි හැසිරෙන්නෝ ය, මූන්වහන්සේලා විෂයෙහි කරන සත්කාර සම්මානයෙන් අපට මහත්ඵල මහානිසංස ලැබෙන්නේ යයි ආනිසංස ඵලවිශෙෂ කැමතිව තුඹලාට චීවරාදි ප්‍රත්‍යයෙන් සංග්‍රහ කෙරෙත්ම ය,

එහෙයින් ඔවුන්ගේ පුණ්‍යාධ්‍යාශය සඵල කරදෙනු කැමැති තුඹලා අප්‍රමාද ප්‍රතිපදාවෙන් සියලු ලෞකික ලොකොත්තර අභිසිද්ධිය සම්පාදනය කර ගනිව්, මෙසේ මනා පිළිවෙත් ඇතිව පවත්වන තුඹලාගේ ධර්මදේශනාව ද ඔවුන්ට වටින්නේය. ඔවුහු එය ආදරයෙන් පිළිගෙන පිළිපදින්නෝ ද වෙත්.

**එවමිදං භික්ඛවෙ** යනාදීන් මෙසේ කී පරිදි ගෘහස්ථ ප්‍රව්‍රජිතයන් අතර ආමිසදාන ධර්මදාන දෙකෙන් ඔවුනොවුන් ඇසුරු කොට ගෙන පැවැත්ම කාමාදි චතුර්විධ ඕඝයෙන් එතරවීම පිණිසත් උපොසථසීල, චතුපාරිශුද්ධිසීල සමාදාන වශයෙන් ශාසනබ්‍රහ්මචර්‍ය්‍යය රැකීමට හා මාර්ගබ්‍රහ්මචර්‍ය්‍ය නම් වූ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය අවබෝධ කර ගැනීමෙන් සියලු සසරදුක නැතිකරගැනීමට ද හේතු වේ.

**ධර්මවිස්තරः–** සුගම යි.

## අට වන සූත්‍ර විවරණය යි

## 4 – 9

### වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං

යෙකෙචි භික්ඛවෙ භික්ඛූ කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නලා අසමාහිතා, න මෙ තෙ භික්ඛවෙ භික්ඛූ මාමකා, අපගතා ච තෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මා ධම්මවිනයා, න ච තෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති. යෙ ච ඛො භික්ඛවෙ භික්ඛූ **නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා**, තෙ ඛො මෙ භික්ඛවෙ භික්ඛූ මාමකා; අනපගතා ච තෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මා ධම්මවිනයා, තෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්තී'ති–

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නලා අසමාහිතා
න තෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධ දෙසිතෙ
නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා
තෙ වෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධ දෙසිතෙ"ති

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

අර්ථය :- **4 - 9**

**කුහා,** නැති ගුණ හැඟවීමෙන් කුහක වෙත් ද; **ථද්ධා,** ක්‍රොධයෙන් හා මානයෙන් තද සිත් ඇත්තාහු වෙත් ද; **ලපා,** උසස්කොට බෙනෙත් ද; (ප්‍රත්‍යය ලැබීම සඳහා තමා උසස්කොට කථාකිරීම යයි සේ යි) **සිඞ්ගී,** බහල කෙලෙස් නැමැති ශෘඞ්ගයන්ගෙන් යුක්ත වෙත් ද; **උන්නළා,** උද්ගත මාන ඇත්තාහු ද; **අසමාහිතා,** චිත්තෛකාග්‍රතා මාත්‍රයකුදු නැත්තාහු ද; **තෙ,** ඔවුහු; **න මාමකා,** මා සන්තක නොවෙත්; **ඉමස්මා ධම්මවිනයා,** මේ ශාසනයෙන්; **අපගතා,** දුරුවෙත්;

සෙස්ස සුගම යි.

**කුහා,** නැතිගුණ හඟවත් ද; **ථද්ධා,** තදසිත් ඇත්තාහු ද, **ලපා,** උසස්කොට කථා කෙරෙත් ද; **සිඞ්ගී,** මාන නමැති අං ඇත්තාහු ද; **උන්නළා,** බටගස් මෙන් ඇතුළත හිස්වූ මානයෙන් හිස ඔසවා හැසිරෙත් ද; **අසමාහිතා** උඩඟුවෙත් ද; **තෙ.** ඔවුහු; **සම්මාසම්බුද්ධදෙසිතෙ,** සම්‍යක් සම්බුදුන් විසින් දෙසනලද; **ධම්මෙ,** ධර්මයෙහි; **න විරූහන්ති,** ගුණයෙන් නොවැඩෙත්,

**සෙස්ස** සුගම යි.

**නව වෙනි සූත්‍ර විවරණය යි.**

**4 - 10**

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මෙ සුතං**

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො නදියා සොතෙන ඔවුය්හෙය්‍ය පියරූප සාතරූපෙන, තමෙනං චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො දිස්වා එවං වදෙය්‍ය,

කිඤ්චාපි බො ත්වං අම්භො පුරිස නදියා සොතෙන ඔවුය්හසි; පියරූපසාතරූපෙන, අත්ථිචෙත්ථ හෙට්ඨා රහදො සඋම්මි සාවට්ටො සගහො සරක්ඛසො; යං ත්වං අම්භොපුරිස පාපුණිත්වා මරණං වා නිගච්ඡසි; මරණමත්තං වා දුක්ඛන්ති.

අථ ඛො සො භික්ඛවෙ පුරිසො තස්ස පුරිසස්ස සද්දං සුත්වා හත්ථෙහි ච පාදෙහි ච පටිසොතං වායමෙය්‍ය,

උපමා ඛො මෙ අයං භික්ඛවෙ කතා, අත්ථස්ස විඤ්ඤාපනාය, අයමෙත්ථ අත්ථො; නදියා සොතොති ඛො භික්ඛවෙ **තණ්හායෙතං** අධිවචනං, පියරූපසාතරූපන්ති ඛො භික්ඛවෙ **ඡන්නෙතං අජ්ඣත්තිකානං ආයතනානං** අධිවචනං, හෙට්ඨා රහදෛති ඛො භික්ඛවෙ **පඤ්චන්නෙතං ඔරම්භාගියානං සංයොජනානං** අධිවචනං, සඌමීති ඛො භික්ඛවෙ **කොධූපායාසස්සෙතං** අධිවචනං, සාවට්ටොති ඛො භික්ඛවෙ **පඤ්චන්නෙතං කාමගුණානං** අධිවචනං, සගහො සරක්ඛසොති ඛො භික්ඛවෙ **මාතුගාමස්සෙතං** අධිවචනං, පටිසොතොති ඛො භික්ඛවෙ **නෙක්ඛම්මස්සෙතං** අධිවචනං, හත්ථෙහි ච පාදෙහි ච වායාමොති භික්ඛවෙ **විරියාරම්භස්සෙතං** අධිවචනං, චක්ඛුමා පුරිසො තීරෙ ඨිතොති ඛො භික්ඛවෙ **තථාගතස්සෙතං** අධිවචනං අරහතො සම්මා සම්බුද්ධස්සා'ති

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

''සහාපි දුක්ඛෙන ජහෙය්‍ය කාමෙ
යොගක්ඛෙමං ආයති පත්ථයානො
සම්මප්පජානො සුවිමුත්තචිත්තො
විමුත්තියා ඵස්සයෙ තත්ථ තත්ථ
සවෙදගු වුසිතබ්‍රහ්මචරියො
ලොකන්තගු පාරගතොති වුච්චතී'ති.

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

## 4 - 10

අර්ථය:-

**සෙය්‍යථාපි**, යම්සේ; **පුරිසො**, පුරුෂයෙක්; **නදියා සොතෙන**, ගඟ සැඩපහරින්; **ඔවුය්හෙය්‍ය**, යටට ගෙන යන්නේ ය; **පියරූපසාතරූපෙන**, ප්‍රිය වස්තුවක් මධුර වස්තුවක් හේතුකොටගෙන; (ඒ ගඟෙහි හෝ ගඟෙන්

එගොඩ හෝ රත්රන් මැණික් ආදි සිත් පිනවන වස්තුවක් හෝ වෙන යම්කිසි මිහිරිවූ අතික් වස්තුවක් හෝ ගනිම් යි ගඟේ වැටී සැඩපහරින් ඇදගෙන යන්නේය යනු කියූ පරිදියි) **සඋම්මි**, රළ සහිතවූ; **සාවට්ටං**, සුළි සහිතවූ, **සගහො**, චණ්ඩ මසුන් මෝරුන් සහිතවූ; **සරක්ඛසො**, එබඳු රකුසන් සහිතවූ; **මහට්ඨං**, යට; **රහණ්ණ**, මහමුහුද; **එකො**, මෙහි; **අරුඒ ච**, ඇත්මය; (ගඟ යට ගැඹුරෙන් පළලින් විශාලවූ එක් මහාසාගරයක් ඇත යූ සේ යි) **පටිසොතං**, සැඩ පහර කැපීමට; **මායමෙයග**, උත්සාහ කරන්නේ ය; (ඉක්මනින් එගොඩට පීනන්නේ ය යූසේ යි) **අත්ථස්ස විඤ්ඤාපනාය**, (චතුස්සත්‍ය ප්‍රතිවෙධයට අනුකූල වූ) අර්ථයාගේ අවබෝධය පිණිස;

**යොගක්ඛෙමං**, නිවන; (අනාගාමිබව හෝ රහත් බව යූසේ යි) **ආයති පත්ථයානො**, මතු පතන්නාවූ පුද්ගල තෙමේ; **සහාපි දුක්ඛෙන**, දුක් සහිතවම; **කාමෙ** කාමයන්; **ජහෙය්‍ය**, දුරුකරන්නේ ය; **සම්මප්පජානො**, විදර්ශනා සහිත මාර්ගප්‍රඥයෙන් මනාකොට දන්නාවූ; **සුවිමුත්තචිත්තො**, මනාව මිදුණු සිත් ඇති (ඒ තැනැත්තේ) **තත්ථ තත්ථ**, ඒ ඒ මාර්ගඵලාධිගමකාලයෙහි; **විමුත්තියා**, නිවන; (ද්විතියාර්ථ ෂෂ්ඨී යි) **ඵස්සයෙ**, ස්පර්ශ කරන්නේ ය; (නිවනට පැමිණෙන්නේ ය; නිවන් ප්‍රත්‍යක්ෂ කරන්නේ ය, නිවනට ඇතුළත්වූ ඵල සමාපත්තියෙන් වාසය කරන්නේ ය යන අර්ථ යි) **වෙදගූ**, මාර්ගඥානයෙන් චතුස්සත්‍යය අවබෝධ කළා වූ; **වුසිත බ්‍රහ්මචරියො**, වැස නිමවනලද බඹසර වස් ඇති; **ලොකන්තගූ**, පඤ්චස්කන්ධ ලෝකයෙන් කෙළවරට පැමිණියාවූ; **සො**, ඒ ආර්‍යශ්‍රාවකතෙම; **පාරගතො ඉති වුච්චති**, පරතෙරට ගියේ යයි කියනු ලැබේ.

**භාවය:-**

මේ සූත්‍රයේ සඳහන්වූයේ උපමාවකි තමහට කැමැති වූ ප්‍රිය වූ මිහිරි වූ දෙයක් ලබාගනු කැමති පුරුෂයකු ගඟෙහි පිහිනනු දැක ගොඩ සිටි පුරුෂයෙක්

ඔහුට මෙසේ කියන්නේ ය. පින්වත! ඔබ බලාපොරොත්තු වන්නේ ප්‍රියවස්තුවක් ලැබීමට නමුත් ගඟ නම් භයානක ය, එහි යට තිබෙන මහාසාගරය ගැඹුරෙන් පළලින් විශාල ය, එහි වැටී මරණයට හෝ මරණය සමාන දුකකට පැමිණෙන්නේ ය කියා යි.

ඉක්බිති ඒ පුරුෂතෙම එය අසා මට සිදුවූයේ මහා විපතෙකැ යි දෙගුණ ත්‍රිගුණ කොට උත්සාහ ගෙන සැඩ පහර කපා පිහිනා එතරවන්නේ ය යනු ඒ උපමාව යි. මෙහි උපමෙයපක්ෂය නම්:– චතුස්සත්‍යාවබොධයට හේතු වූ අභිරාශිය යි.

“නදීශ්‍රොතස” නම්: තණ්හාව බවත්, “ප්‍රියරූප ශාතරූප” නම්: සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයන් බවත්, “රහදය” නම්: පස්වූ ඔරම්භාගිය සංයොජනයන් බවත්, “සළුම්” නම්: ක්‍රොධ උපායාස (දැඩික්‍රෝධය) බවත්, ‘සාවට්ට” නම්: පස්කම් ගුණය බවත්, “සගහ සරක්ඛස” නම්: ස්ත්‍රිය බවත්, “පටිසොතය” නම්: පැවිද්ද බවත්, අතින් පයින් කරන ව්‍යායාමය නම්; වීය්‍යාරම්භය බවත්, “එගොඩ සිටි ඇස් ඇති පුරුෂයා” නම්; තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ බවත් මෙයින් දැක්වූහ.

**ධම්මවිස්තර**

**තණ්හායෙතං අධිවචනං —**

තණ්හාව ගඟසැඩ පහරක් වැනි වූයේ කෙසේ ද යත්? “අනුක්කමපරිවුට්ඨිතො, අනුප්පබන්ධනතො, ඔසීදාපනතො, දුරුත්තරණතො ච” යනු අටුවා හෙයින් ක්‍රමයෙන් වැඩෙන නිසාත්, අතරතුර නොසිඳ ගලා බැසගෙන යන නිසාත්, ගිල්වන නිසාත්, එතරවිය නොහැකි නිසාත් යන සතරාකාරයෙන් ශ්‍රොතසදෘශත්වය වේ. උඩහට වැසිවටකල්හි ජලය පමින කඳුරැළි, මහත් වූ බිම්විවර, ඇළ දොළ පුරවා බැසගෙන අවුත් කුඩා ගංගා

මහා ගංගා උතුරුවාගෙන එකම සැඩපහරක්ව ගලායන කල්හි නදීශ්‍රොතසය යි කියනුලැබේ ද මෙපරිද්දෙන් ආධ්‍යාත්මික බාහිරාදි වශයෙන් අනෙකප්‍රභෙද රූපාදි අරමුණුවල ලොභය ඉපද ක්‍රමයෙන් දියුණු වේගන යන කල්හි **පරිවඩ්ඪනාර්‍ථයෙන්** තෘෂ්ණාශ්‍රොතසය යි කියනු ලැබේ.

එසේ ම සැඩපහර මුහුදනෙක් නොසිඳ ගලා බැස යත්නාක් මෙන් තණ්හාව ද අපායමහාසමුද්‍රය දක්වා නොසිඳ යන හෙයින් **අනුප්‍රබන්ධ** වශයෙන් ශ්‍රොතස වේ.

යම් සේ සැඩපහර එයට අසුවුණු සත්‍වයන් ගිල්වයි ද, හිස ඔසවන්නට ඉඩ නොදේ ද, මරණයට හෝ ඒ හා සමාන දුකට පමුණුවා ද, එමෙන් තෘෂ්ණාශ්‍රොතස ද එයට අසුවුණු සත්‍වයන් ගිල්වන හෙයින් ද, ප්‍රඥශීර්ෂය ඔසවන්නට ඉඩ නොදෙන හෙයින් ද, කුසල්මුල් සිඳින හෙයින් ද, මරණයට හෝ ඒ හා සමාන දුකට පමුණුවන හෙයින් ද **ඔසීදාපනාර්‍ථයෙන්** ශ්‍රොතස වේ.

යම් සේ නදීශ්‍රොතස පහුරක් හෝ ඔරුවක් අහුලක් හෝ නැවක් බඳින්නට හැකි වූ දක්ෂ පුරුෂයකු ඇති කල්හි ම උත්සාහයෙන් එතරට යාහැකි වේ ද, එපරිද්දෙන් තෘෂ්ණා ශ්‍රොතස ද, කාමොඝාදි සැඩපහරින් යුක්ත හෙයින් සිල් පුරා සමථ විපස්සනාදි බවුන් වඩා රහත් වන්නට කැමැති නුවණැත්තවුන් විසින් කලණ මිතුරන් ඇසුරු කොට ගෙන සමථ විපස්සනා නම් වූ නැව් නැගී කුසලවූ සම්‍යක් ව්‍යායාමයෙහි යෙදෙනු ලැබ තරණය කළ යුතු ම නු යි අන්කිසි ක්‍රමයකින් නො කළ හැකි හෙයින් **දුරුත්තරණාර්‍ථ යෙන්** නදීශ්‍රොතසදෘශ ය යි දතයුතු.

**මාතුගාමස්සෙතං අධිවචනං—**

යම් සේ ග්‍රාහරාක්ෂස තෙම තමහට ගොදුරුවූ පුරුෂයකු වසඟ කොටගෙන බිහිසුණු රූප පෙන්වීමෙන් සිහිය මූළා කොට ඔහුගේ වර්‍ණය, ශක්තිය, වස්තුව, කීර්තිය,

සැපය යන මේ සියල්ලක් ම නැතිකොට මහත් වූ විපතට පමුණුවා ද, එපරිද්දෙන් මාගම ද නුවණින් නොසැලකිය හැකි දුර්වල මෝඩ පුරුෂයකු ස්ත්‍රී මායම්වලින් පොළඹවා තමහට වසඟ කොට ගෙන සිල් බිඳ ගුණධර්මයන්ගෙන් තුරන් කොට මෙලොව පරලොව දෙක්හි මහත් විනාශයට පමුණුවන හෙයින් ගෘහරාක්ෂසියක බඳු ය යි සැලකිය යුතු යි.

**සභාපි දුක්ඛන ජහෙය්‍ය කාමෙ —**

දුකෙන් යුක්තව නමුත් කාමයන් දුරු කරන්නේ ය යන මෙයින් කුමක් පවසන ලද ද යත්? ධ්‍යානමාර්ගාධිගමයක් සඳහා සමථ විපස්සනා භාවනාවන්හි යෙදෙන යෝගාවචරයාහට පූර්වභාග ප්‍රතිපදායෙහි හෙවත් භාවනා කිරීමට ඇරඹූ අවස්ථායෙහි දුකසේ එයට පැමිණෙන්නට සිදුවෙයි හෙතෙම නාමරූප ධර්මයන් වෙන් කොට සැලකීමෙහි දුකෙන් කලානන වෙයි. ප්‍රත්‍යය සමුත්පාද මනසිකාරයෙහි කලානන වෙයි. අධිවත්‍රයෙහිදු කලානන වෙයි මාර්ග අමාර්ග දෙක වෙන්කොට සැලකීමෙහි ද කලානන වෙයි.

මෙසේ පස්තැනෙක කලානනවීමෙන් වෙහෙසට පත්වූ හෙතෙම විදර්ශනාවට පැමිණ ද කලානන වෙයි. එහි ද උදයබ්බය භංග භයතුපට්ඨාන ආදීනව නිබ්බිදා මුඤ්චිතුකම්‍යතා පටිසංඛානුපස්සනා සංඛාරුපෙක්ඛා අනුලොම ගොත්‍රභූ යන නව විදර්ශනාවන්හි කලානනවම ප්‍රථමධ්‍යානයෙන් පංචකාමයන් මැඩපවත්වා අනාගාමි මාර්ගඥනයෙන් කෙලශකාමයන් සමුච්ඡෙදනය කෙරෙයි. මේ යොගාවචර තෙමේ ලොභාදි දශකෙලශයන් බලවත් හෙයින් ද, ශ්‍රද්ධා ආදි පඤ්චෙන්ද්‍රියයන් තියුණු නොවන හෙයින් ද, පහසුවෙන් භාවනාවීථියට බැසගත නොහැකි වෙයි. එහෙයින් මොහුගේ ධ්‍යානයත් මාර්ගයත් දුක් සහිත වෙයි යනු මෙයින් ප්‍රකාශිත යි.

තව ද කාමවිතර්ක බහුල පුද්ගලයා කල්‍යාණමිත්‍රයකු වෙත පැමිදි ව පිරිසිදු ව සිල් රකිමින් ධ්‍යාන විදර්ශනාදීන් පිළිබඳව පූර්වභාග ප්‍රතිපදායෙහි නොහොත් ප්‍රාරබ්ධ භාවනා වීථියෙහි බැසගනිමින් කඳුළු පිරුණු මුහුණින් හඬ හඬා හෝ ඒ කාමවිතර්කයන් දුරුකරන හෙයින් **සහාපි දුක්ඛෙන ජහෙය්‍ය කාමෙ** යනු කීහ. හෙතෙම දුකසේ නමුත් කාමයන් දුරුකෙරෙමින් ධ්‍යාන උපදවා එය පාදක කොටගෙන විදසුන් වඩා රහත් වෙයි, එහෙයින් **යොගක්ඛෙමං ආයති පප්පුයාතො**, යනු කීහ ඒ ඒ මාර්ගඵලයන් ලැබූ කල්හි ඵල සමාපත්ති සැපයෙන් නිවන සපර්ශ කොට වසන හෙයින් **විමුත්තියා ඵුස්සයෙ තත්ථ තත්ථ** යනු කීහ.

දශවන සූත්‍ර විවරණය යි.

## 4 - 11

### වුත්තං හෙතං භගවතා වුත්තම රහතා ති මෙ සුතං

**චරතො** චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාම විතක්කො වා; ව්‍යාපාද විතක්කො වා; විහිංසා විතක්කො වා; තඤ්චෙ භික්ඛවෙ භික්ඛු අධිවාසෙති, නප්පජහති, න විනොදෙති, න ව්‍යන්තිකරොති, න අනභාවං ගමෙති, චරම්පි භික්ඛවෙ භික්ඛු එවංභූතො අතාතාපී අනොත්තප්පී සතතං සමිතං කුසීතො හීනවිරියොති වුච්චති.

**ඨිතස්ස** චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාම විතක්කො වා; ව්‍යාපාද විතක්කො වා; විහිංසාවිතක්කො වා; තඤ්චෙ භික්ඛවෙ භික්ඛු අධිවාසෙති; නප්පජහති, න විනොදෙති, න බ්‍යන්තිකරොති, න අනභාවං ගමෙති. ඨිතොපි භික්ඛවෙ භික්ඛු එවංභූතො අතාතාපී අනොත්තප්පී සතතං සමිතං කුසීතො හීනවිරියොති වුච්චති

**නිසින්නස්ස** චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාම විතක්කො වා; ව්‍යාපාදවිතක්කො වා; විහිංසාවිතක්කො වා; තඤ්චෙ භික්ඛවෙ භික්ඛු අධිවාසෙති, නප්පජහති, න

විනොදෙති, න බ්‍යන්තිකරොති, න අනභාවං ගමෙති. නිසින්නොපි ඛො භික්ඛු එවම්භූතො අනාතාපී අනොත්තප්පී සතතං සමිතං කුසීතො හීනවීරියොති වුච්චති.

**සයානස්ස** චෙපි භික්ඛවෙ භික්ඛුනො ජාගරස්ස උප්පජ්ජති කාමවිතක්කො වා, ව්‍යාපාදවිතක්කො වා; විහිංසා විතක්කො වා, තං චෙ භික්ඛවෙ භික්ඛු අධිවාසෙති, නප්පජහති, න විනොදෙති, න බ්‍යන්තිකරොති, න අනභාවං ගමෙති, සයානොපි භික්ඛවෙ භික්ඛු ජාගරො එවම්භූතො අනාතාපී අනොත්තප්පී සතතං සමිතං කුසීතො හීනවීරියොති වුච්චති.

චරතො චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාම විතක්කො වා, ව්‍යාපාද විතක්කො වා, විහිංසා විතක්කො වා; තඤ්චෙ භික්ඛවෙ භික්ඛු නාධිවාසෙති, පජහති, විනොදෙති, බ්‍යන්තිකරොති, අනභාවං ගමෙති, චරම්පි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තො'ති වුච්චති.

ඨිතස්ස චෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාම විතක්කො වා; ව්‍යාපාද විතක්කො වා; විහිංසා විතක්කො වා; තඤ්චෙ භික්ඛවෙ භික්ඛු නාධිවාසෙති, පජහති, විනොදෙති, බ්‍යන්තිකරොති, අනභාවං ගමෙති, ඨිතොපි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තොති වුච්චති

නිසින්නස්සචෙපි භික්ඛවෙ භික්ඛුනො උප්පජ්ජති කාම විතක්කො වා; ව්‍යාපාදවිතක්කො වා; විහිංසාවිතක්කො වා, තඤ්චෙ භික්ඛවෙ භික්ඛු නාධිවාසෙති, පජහති, විනොදෙති, බ්‍යන්තිකරොති, අනභාවං ගමෙති, නිසින්නොපි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධ විරියො පහිතත්තොති වුච්චති.

සයානස්සචෙපි භික්ඛවෙ භික්ඛුනො ජාගරස්ස උප්ප-ජ්ජති කාමවිතක්කො වා; ව්‍යාපාදවිතක්කො වා; විහිංසා

විතක්කො වා; තඤ්චෙ භික්ඛවෙ භික්ඛු නාධිවාසෙති පජහති, විනොදෙති, බ්‍යන්තිකරොති, අනභාවං ගමෙති. සයානොපි භික්ඛවෙ භික්ඛු ජාගරො එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තොති වුච්චතී'ති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

"චරං වා යදිවා තිට්ඨං නිසින්නො උදවා සයං
යො විතක්කං විතක්කෙති පාපකං ගෙහනිස්සිතං
කුම්මග්ගං පටිපන්නො සො මොහනෙය්‍යෙසු මුච්ඡිතො
අභබ්බො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධි මුත්තමං
යො චරංවාථ තිට්ඨං වා නිසින්නො උදවා සයං
විතක්කං සමයිත්වාන විතක්කූපසමෙ රතො
භබ්බො සො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධි
මුත්තම'න්ති

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

අර්ථය:-

**චරම්පි**, ඇවිදිමිනුත්; **එවංභූතො**, මෙසේ කාම විතර්කාදි පාප විතර්කයන්ගෙන් යුක්ත වූ පුද්ගලතෙම; **අනාතාපී**, කෙලෙසුන් තවන වීර්‍ය්‍යනැත්තෙක්ව; **අනොත්තප්පී**, භය නැත්තෙක්ව; **සතතං සමිතං**, නිරන්තරයෙන්; **කුසීතො**, මැලිවූ; **හීනවීරියො ඉති**, වීර්‍ය්‍යරහිත වූවෙක් යයි; **වුච්චති**, කියනු ලැබේ.

**සෙස්ස** සුගම යි.

**චරං වා**, ඇවිදිමින් හෝ; **යදි**, ඉදින්; **තිට්ඨං වා**, සිටිමින් හෝ; **නිසින්නො වා**, හිඳිමින් හෝ; **උදවා**, නොහොත්; **සයං වා**, සයනය කෙරෙමින් හෝ; **යො**, යමෙක්; **ගෙහනිස්සිතං**, ගිහිගෙයි වැස්සන් ඇසුරු කළා වූ; **පාපකං**, ලාමකවූ; **විතක්කං**, විතර්කයක්; **විතක්කෙති**, කල්පනා කෙරේ ද; **කුම්මග්ගං පටිපන්නො**, නොමගට පිළිපන්නාවූ; **මොහනෙය්‍යෙසු**, මුළා කටයුතුවූ රූපාදි

අරමුණු වල; **මුච්චිතො**, මුසපත්වූ; **සො තාදිසො භික්ඛු**, ඒ එබඳු භික්ෂු තෙම; **උත්තමං සම්බොධිං**, උතුම් වූ සම්‍යක් සම්බෝධිය; **ඵුට්ඨුං**, සපශී කරන්නට; **අභබ්බො**, අයෝග්‍ය යෙක් වේ.

**යො**, යමෙක්; **චරං වා**, ඇවිදිමින් හෝ; **අථ**, වැළි; **තිට්ඨං වා**, සිටිමින් හෝ; **නිසින්නො වා**, හිඳිමින් හෝ; **උද**, නොහොත්; **සයං වා**, සයනය කෙරෙමින් හෝ; **විතක්කං**, මිථ්‍යා විතර්කය; **සමයිත්වාන**, ප්‍රත්‍යවෙක්ෂා භාවනා බලයෙන් සන්සිඳුවා; **විතක්කූපසමෙ**, විතර්කය සන් සිඳුවීමෙහි; **රතො**, ඇලුණේ වේ ද; **සො තාදිසො භික්ඛු**, ඒ එබඳු භික්ෂු තෙම; **උත්තමං සම්බොධිං**, උතුම්වූ නිවනට; **ඵුට්ඨුං**, පැමිණෙන්නට නොහොත් උතුම් නිවන් සැපය වළඳන්නට; **භබ්බො**, සුදුස්සෙක් වේ;
සියල්ල සුගම යි.

**එකොළොස් වන සූත්‍ර විවරණය යි.**

## 4 – 12

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතා'ති මෙ සුතං**

සම්පන්නසීලා භික්ඛවෙ විහරථ සම්පන්න පාතිමොක්ඛා; පාතිමොක්ඛ සංවරසංවුතා විහරථ ආචාරගොචර සම්පන්නා; අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛථ සික්ඛා පදෙසු.

සම්පන්නසීලානං භික්ඛවෙ විහරතං සම්පන්නපාති මොක්ඛානං පාතිමොක්ඛසංවරසංවුතානං විහරතං ආචාර ගොචරසම්පන්නානං අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවිනං සමාදාය සික්ඛතං සික්ඛාපදෙසු,

කිස්ස භික්ඛවෙ උත්තරිකරණීයං?, චරතොචෙපි භික්ඛවෙ භික්ඛුනො අභිජ්ඣා විගතා හොති, ව්‍යාපාදෙ විගතො හොති, ථිනමිද්ධං විගතං හොති, උද්ධච්චකුක්කුච්චං විගතං හොති, විචිකිච්ඡා පහීනා හොති, ආරද්ධං හොති විරියං අසල්ලීනං,

උපට්ඨිතා සති; අපම්මුට්ඨා; පස්සද්ධො කායො, අසාරද්ධො, සමාහිතං චිත්තං, එකග්ගං; චරම්පි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තොති වුච්චති

**ඨිතස්ස** චෙපි භික්ඛවෙ භික්ඛුනො අභිජ්ඣා විගතා හොති, ව්‍යාපාදො විගතො හොති, ථිනමිද්ධං විගතං හොති, උද්ධච්ච කුක්කුච්චං විගතං හොති, විචිකිච්ඡා පහීනා හොති, ආරද්ධං හොති විරියං අසල්ලීනං, උපට්ඨිතා සති; අපම්මුට්ඨා, පස්සද්ධො කායො, අසාරද්ධො; සමාහිතං චිත්තං, එකග්ගං, ඨිතොපි භික්ඛවෙ භික්ඛු එවම්භූතො ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තොති වුච්චති.

**නිසින්නස්ස** චෙපි භික්ඛවෙ භික්ඛුනො අභිජ්ඣා විගතා හොති, ව්‍යාපාදො විගතො හොති, ථිනමිද්ධං විගතං හොති, උද්ධච්චකුක්කුච්චං විගතං හොති, විචිකිච්ඡා පහීනා හොති, ආරද්ධං හොති විරියං අසල්ලීනං, උපට්ඨිතා සති; අපම්මුට්ඨා, පස්සද්ධො කායො, අසාරද්ධො, සමාහිතං චිත්තං එකග්ගං, නිසින්නො භික්ඛවෙ භික්ඛු එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තොති වුච්චති.

**සයානස්ස** චෙ භික්ඛවෙ භික්ඛුනො ජාගරස්ස අභිජ්ඣා විගතා, හොති, ව්‍යාපාදො විගතො හොති, ථිනමිද්ධං විගතං හොති, උද්ධච්ච කුක්කුච්චං විගතං හොති, විචිකිච්ඡා පහීනා හොති, ආරද්ධං හොති විරියං අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා, පස්සද්ධො කායො, අසාරද්ධො, සමාහිතං චිත්තං එකග්ගං, සයානොපි භික්ඛවෙ භික්ඛු ජාගරො එවම්භූතො ආතාපී ඔත්තප්පී සතතං සමිතං ආරද්ධවිරියො පහිතත්තොති වුච්චතී'ති.

එතමත්ථං භගවා අවොච, තත්ථෙතං ඉති වුච්චති.

''යතං චරෙ යතං තිට්ඨෙ යතං අච්ඡෙ යතං සයෙ
යතං සම්මිඤ්ජයෙ භික්ඛු යතමෙනං පසාරයෙ
උද්ධං තිරියං අපාචීනං යාවතා ජගතො ගති

සමවෙක්ඛිතා ච ධම්මානං ඛන්ධානං උදයබ්බයං
එවං විහාරි මාතාපිං සන්තවුත්ති මනුද්ධතං
චෙතොසමථසාමීචිං සික්ඛමානං සදා සතං
සතතං පහිතත්තොති ආහු භික්ඛුං තථාවිධං'ති

අයං පි අත්ථො වුත්තො භගවතා, ඉති මෙ සුතන්ති.

## 4 - 12

අර්ථය:-

**සම්පන්නසීලා**, සම්පූර්ණ සිල් ඇතිව; **සම්පන්නපාතිමොක්ඛා**, සම්පූර්ණ ප්‍රාතිමොක්ෂ ඇතිව; **විහරථ**, වාසය කරව්; **පාතිමොක්ඛසංවරසංවුතා**, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තව; **ආචාරගොචරසම්පන්නා**, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව; **අනුමත්තෙසු වජ්ජෙසු**, සවල්පමාත්‍ර වරදෙහි; **භයදස්සාවී**, බිය වශයෙන් දක්නා සුලුව (විහරථ යනු හා සම්බන්ධ යි) **සික්ඛාපදෙසු**, ශික්ෂාපදයන් අතුරෙහි; **සමාදාය**, ඒ ඒ ශික්ෂාකොටසක් සමාදන්ව; **සික්ඛථ**, හික්මෙව්; **උත්තරිං**, මත්තෙහි; **කිං කරණීයං අස්ස**, කුමක් කටයුතු වන්නේ ද; (සම්පූර්ණ සිල් ඇතිව වාසය කරන්නවුන් විසින් එයින් මත්තෙහි කුමක් කටයුතු ද යනු යි.) **අභිජ්ඣා**, විෂමලොභ නම්වූ අභිධ්‍යා තොමෝ; **විගතා**, දුරු වූවා ද; **විරියං ආරද්ධං හොති**, වීර්‍ය්‍යාරම්භය කෙළේ වේ ද; **අසල්ලීනං**, නො හැකුළුණේ වේ ද; **සති**, සමෘති තොමෝ; **උපට්ඨිතා**, එළඹ සිටියා ද; **අපම්මුට්ඨා**, මුළා නොවූවා ද; **කායො**, නාමකාය හා රූපකය; **පස්සද්ධො**, සන්සිඳුණේ ද; **අසාරද්ධො**, පහවූ කෙලෙස් දරථ ඇත්තේ ද; **චිත්තං**, සිත; **සමාහිතං**, මනාව පිහිටියේ ද; **එකග්ගං**, එකඟවූයේ ද; සෙස්ස පෙරසේ මැ යි.

**භික්ඛු**, මහණතෙම; **යතං**, සතර ඉරියව්වෙන් හා සතර සම්‍යක් ප්‍රධාන වීර්‍යයෙන්; **චරෙ**, හැසිරෙන්නේ ය; (සක්මන් කිරීම් ආදි වශයෙන් ගමන් කෙරෙමින් ද, "අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති" යනාදි ක්‍රමයෙන් වීර්‍ය වඩන්නේ ය යු සේ යි.)

**යතං**, සංයතව; **තිට්ඨෙ**, සිටින්නේ ය; **යතං**, සංවරව; **අච්ඡෙ**, හිඳිනේ ය; **යතං**, සතිසංවරව; **සයෙ**, සැතපෙන්නේ ය; **යතං**, සංයතව; **සම්මිඤ්ජයෙ**, අත් පා හකුළුවන්නේ ය; **එතං**, මේ අත්පා ආදි අවයව; **යතං**, සංයතව; **පසාරයෙ**, දිගු කරන්නේ ය; (හැම තැන්හි ස්මෘති අවිප්‍රවාසය දුරුකරන්නේ ය යු සේ යි)

**උද්ධං**, උඩ දිශාවෙහි ද; **තිරියං**, සරස දිශාවෙහි ද; (පෙරදිග ආදි වශයෙන් හාත්පස සියලු දිශාභාගයන්හි යන අර්‍ථ යි) **අපාචිනං**, යට දිශාව ද; **යාවතා**, යම්තාක්; **ජගතො ගති**, ලෝකයාගේ පැවැත්මෙක් වේ ද (ඒ සියලු තන්හි යන අර්‍ථ යි ) **ධම්මානං**, සත්‍වශූන්‍යතා ස්වභාවයන් ද; **ඛන්ධානං**, ස්කන්ධයන්ගේ; **උදයබ්බයං** ච, උත්පත්තිය හා විනාශය ද; **සමවෙක්ඛිතා**, මනාව බලන්නේ ද; (අනිත්‍යාදි වශයෙන් විදර්‍ශනා කරන්නේ ද යු සේ යි)

**එවං විහාරිං**, මෙසේ වාසය කරන සුළුවූ; **ආතාපිං**, කෙලෙසුන් තවන වීර්‍ය ඇති; **සන්තවුත්තිං**, ශාන්ත පැවතුම් ඇති; **අනුද්ධතං**, උඩගු නොවූ; **චෙතොසමථසාමිචිං**, චිත්තක්ලෙශයන් සන්සිඳුවන ප්‍රතිපදා ඇති; (චිත්තසමථ සංඛ්‍යාත අර්‍හත්මාර්‍ගඥානයට සුදුසු ප්‍රතිපදාව වූ ඥානදර්‍ශන විශුද්ධිය ඇති ය යු සේ යි) **සික්ඛමානං**, මාර්‍ගඥාන පරම්පරායෙහි හික්මෙන්නා -; **සදා**, හැමකල්හි; **සතං**, චතු සම්ප්‍රජන්‍ය ස්මෘතියෙන් යුක්තවූ; **තථාවිධං භික්ඛුං**, එබඳු භික්‍ෂුව; **සතතං පහිතත්තො ඉති**, හැමකල්හි නිවනෙහි පිහිටි සිත් ඇත්තෝ යයි; **ආහු**, බුද්ධාදි ආර්‍යයෝ කීහු

**ධර්‍මවිස්තර**:-

**අභිධ්‍යාව** නම්:- අනුන්ගේ දෙය තමාට අයිතිකර ගැනීමේ බලවත් අකුශල චේතනාව යි. විෂම ලොභය යනු ද මෙයම ය. "සකභණ්ඩෙ ඡන්දරාගො අභිජ්ඣා, පරභණ්ඩෙ විසමලොභො" යනුවෙන් මජ්ඣිම නිකායට්ඨ-කථාවේ වත්ථූපම සූත්‍රවර්‍ණනායෙහි සඳහන් වන්නේ නමත්

සතු දෙයෙහි ආසාව අභිධ්‍යා යයි ද, අනුන් සතු දෙයෙහි ආශාව විසමලොභ යයි ද, එක් ආචාර්‍ය්‍ය මතයක් වශයෙනි.

සකභාණ්ඩයෙහි හෝ වේවා, පරභාණ්ඩයෙහි හෝ වේවා, තමාගේ අතට පත්වූ දෙය ගැන උපදනා ඡන්දරාගය අභිධ්‍යාව යයි ද, නොපැමිණි දෙය ලබාගන්නට පැතීම විෂමලොභ යයි ද, තවත් මතයකි.

අභිධ්‍යා – විෂම ලොභ දෙක්හි අමුතු වෙන්කිරීමක් කුමට ද? මෙහි අකුරුවල වෙනස මුත් අර්‍ථයෙහි වෙනසෙක් නැත. අභිධ්‍යා විෂම ලොභ දෙකම චිත්තොපක්ලෙශයෝ ය. විෂම නොවූ අභිධ්‍යාවකුත් නැත, විෂම නොවූ ලොභයකුත් නැත. මෙ දෙක අර්‍ථයෙන් එකක්ම යයි තවත් ආචාර්‍ය්‍ය මතයෙකි. අභිධ්‍යාව නම්:– **කාමච්ඡන්ද නීවරණය** ම ය.

යම්කිසිවකු ගැන සිත නරක්වීම **ව්‍යාපාද** යයි. එසේම අනුන් නැතිකිරීමේ විනාශකිරීමේ දුෂ්ට චේතනාව ද, එකුන්විසි ආඝාතවස්තු විෂයක ද්වේෂය ද, **ව්‍යාපාද** යයි. ථිනයත් මිද්ධයත් දෙකම **ථිනමිද්ධ** යයි. සිත වැඩෙක නොයෙදවියහැකි මැළිබව **ථින** යයි. එසේම ශරීරය ද වැඩක නොයෙදවියහැකි ගිලන්බව **මිද්ධ** යයි.

උද්ධච්චය හා කුක්කුච්චයත් දෙකම **උද්ධච්ච කුක්කුච්ච** යයි. ඖද්ධත්‍යය නම්:– සිතෙහි නොසන්සුන්බව යි. කෞකෘත්‍යය නම්:– මට පිනක් කරගත නොහැකි විය. සසරට ද පිහිටක් කරගත නොහැකි විය. කෙළේ නම්, අකුසල් ය. පව් යයි මෙසේ සිත්හි විපිළිසරබව ඇතිකර ගැනීමයි. **විචිකිච්ඡා** නම්:– බුද්ධාදි අටතැනෙක උපදනා සැක යයි. මොවුහු ද නීවරණයෝ ය.

මොවුන්ගේ උත්පත්තිය හා ප්‍රහාණයත් කෙසේ සිදු වේ ද යත්? සුභවසයෙන් ලොකයා සලකන අරමුණු ගැන අයොනිසො මනසිකාරයෙන් හෙවත් ලෝකයා

මෙන් අනුවණින් සැලකීමෙන් කාමච්ඡන්ද නීවරණය උපදියි. අසුභනිමිති ගැන යොනිසො මනසිකාරයෙන් හෙවත් අසුභ වශයෙන් සැලකීමෙන් එය දුරු වෙයි.

ප්‍රතිඝනිමිත්තෙහි අයොනිසොමනසිකාරයෙන් ව්‍යාපාදය උපදියි. ආධ්‍යාත්මිකවූ ප්‍රතිඝ සිතත් ප්‍රතිඝයට නිමිත්ත වේ. ප්‍රතිඝය ඇතිවීමට හේතුවන බාහිර අරමුණුත් ප්‍රතිඝයට නිමිත්ත වේ. එහි අයොනිසො මනසිකාරයෙන් ප්‍රතිඝය උපදියි. මෙත්තාචෙතොවිමුත්තියෙහි යොනිසොමනසිකාර-යෙන් ව්‍යාපාදය දුරුවෙයි. "මෙත්තා" යන්නෙන් අර්පණා උපචාර අවස්ථාදෙකම ගැනෙයි. "චෙතොවිමුත්ති" නම්:- අර්පණාව හෙවත් ධ්‍යානසිත් මය.

අරති ආදියෙහි අනුවණින් සැලකීම ථිනමිද්ධය ඇතිවීමට හේතු යි. "අරති" නම්.- කුසල් සිත්හි නොඇලීමයි. "තන්දි" නම්:- ශරීරය පිළිබඳ අලසකම හෝ ගිලන්කම යි. "විජම්භිකා" නම්:- ඒ මේ අතට ශරීරය හැරවීමයි. "භත්තසම්මදය" නම්:- කුස පිරෙන්නටම බත්කෑමෙන් උපදනා බත්මතය යි. "චෙතොලීනත්ත" නම්:- සිතෙහි පසුබට බවයි. මේ හැම කරුණෙහිම අනුවණින් මෙනෙහිකරන්නහුට ථිනමිද්ධය උපදියි.

"ආරම්භධාතු" නම්වූ යමක් සඳහා ඇරඹූ වීය්‍ය‍ීය, "නික්කමධාතු" නම්වූ කුසීතකමින් නික්මුණු වීය්‍ය‍ීය, "පරක්කමධාතු" නම්වූ උසස් තැනටම යන්නෙමි යි සිතන තරම් ඒ සියල්ලටම වඩා දැඩිවූ වීය්‍ය‍ීය යන මේ තෙවැදෑරුම් වීය්‍ය‍ීයෙහි නුවණින් මෙනෙහි කරන්නහුට ථිනමිද්ධය දුරුවෙයි.

සිතෙහි නොසන්සුන්කම හා පසුතැවිල්ලත් ඇතිවූ කල්හි එහි අනුවණින් සැලකීමෙන් උද්ධච්ච කුක්කුච්චය උපදියි. සිතෙහි එකග්‍රකම නම්වූ සමාධිය අරමුණුකොට නුවණින් මෙනෙහි කරන්නහුට එය දුරුවෙයි.

සැකයට හේතු වූ දෙයෙහි අනුවණින් සැලකීමෙන් **විචිකිච්ඡාව** උපදියි. කුසලාකුසල සාවද්‍යානවද්‍ය සෙවිතව්‍ය අසෙවිතව්‍ය හීන ප්‍රණීත කෘෂ්ණ ශුක්ල ධර්මයන් කෙරෙහි යොනිසො මනසිකාරයෙන් විචිකිත්සාව දුරුවෙයි.

**විගතො හොති** යනුවෙන් මේ නිවරණයන්ගේ ප්‍රහානය කියන ලද්දේය. මේ නීවරණයන් අතුරෙන් කාමච්ඡන්ද නීවරණය හා ථිනමිද්ධ, උද්ධච්ච යන නීවරණයන් අර්හත් මාර්ගඥානයෙන් ද, ව්‍යාපාද කුක්කුච්ච නීවරණ දෙක අනාගාමි මාර්ගයෙන් ද, විචිකිච්ඡා නීවරණය සෝවාන් මාර්ගයෙන් ද නිරවශෙෂයෙන් දුරුවෙයි

මෙහි විස්තර දැනගනු කැමැත්තන් විසින් දීඝනිකායට්ඨකථාවේ **සාමඤ්ඤඵල** සූත්‍ර වර්ණනායෙන් හා අංගුත්තරනිකායට්ඨකථාවේ පඤ්චකනිපාතයෙහි **නීවරණ සූත්‍ර** වර්ණනායෙන් ද, සංයුත්තනිකායෙහි **නීවරණ සංයුත්තය** හා **සුත්තනිපාතට්ඨකථා**, හා සෙසු ධර්මප්‍රකරණ වලින් ද දත යුතු.

## 4 – 13

**වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති** මෙ සුතං,

**ලොකො** භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධො ලොකස්මා තථාගතො විසඤ්ඤුත්තො, **ලොකසමුදයො** භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධො, ලොකසමුදයො තථාගතස්ස පහීනො, **ලොකනිරොධො** භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධො, ලොකනිරොධො තථාගතස්ස සච්ඡිකතො, **ලොකනිරොධගාමිනීපටිපදා** භික්ඛවෙ තථාගතෙන අභිසම්බුද්ධා, ලොකනිරොධගාමිනීපටිපදා තථාගතස්ස භාවිතා,

යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, යස්මා තං තථාගතෙන අභිසම්බුද්ධං තස්මා **තථාගතොති** වුච්චති,

යඤ්ච භික්ඛවෙ රත්තිං තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣති, යඤ්ච රත්තිං අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායති, යං එතස්මිං අන්තරෙ භාසති ලපති නිද්දිසති, සබ්බන්තං තථෙව හොති නො අඤ්ඤථා, තස්මා **තථාගතොති** වුච්චති.

යථාවාදී භික්ඛවෙ තථාගතො තථාකාරී, යථාකාරී තථාගතො තථාවාදී, ඉති යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී, තස්මා **තථාගතොති** වුච්චති,

සදෙවකෙ භික්ඛවෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය තථාගතො අභිභූ අනභිභූතො අඤ්ඤදත්‍ථු දසො වසවත්ති තස්මා **තථාගතොති** වුච්චතී'ති —

එතමත්‍ථං භගවා අවොච, තත්‍ථෙතං ඉති වුච්චති —

"සබ්බලොකං අභිඤ්ඤාය සබ්බලොකෙ යථාතථං
සබ්බලොක විසංයුත්තො සබ්බලොකෙ අනූපයො
සබ්බෙ සබ්බාභිභූ ධීරො සබ්බගන්‍ථප්පමොචනො
ඵුට්ඨස්ස පරමා සන්ති නිබ්බානං අකුතොභයං
එස ඛීණාසවො බුද්ධො එස සීහො අනුත්තරො
සදෙවකස්ස ලොකස්ස බ්‍රහ්මචක්කං පවත්තයි.
ඉති දෙවා මනුස්සා ච යෙ බුද්ධං සරණං ගතා
සංගම්ම තං නමස්සන්ති මහන්තං වීතසාරදං
දන්තො දමයතං සෙට්ඨො සන්තො සමයතං ඉසි
මුත්තො මොචයතං අග්ගො තිණ්ණො තාරයතං වරො.
ඉති හෙතං නමස්සන්ති මහන්තං වීතසාරදං
සදෙවකස්මිං ලොකස්මිං නත්‍ථි තෙ පටිපුග්ගලො" ති

**අයම්පි අත්‍ථො වුත්තො භගවතා, ඉති මෙ සුත්තන්ති—**

තස්සුද්දානං—

බ්‍රාහ්මණ චත්තාරි ජාතං සමණසීලා තණ්හා බ්‍රහ්මා
බහුකාරා කුහපුරිසා චර සම්පන්නලොකෙන තෙරසා'ති.

**චතුක්ක නිපාතො නිට්ඨිතො**

සත්තවීසෙකනිපාතං දුකං බාවීසසුත්තසඞ්ගහිතං
සමපඤ්ඤා ම'ථ තිකං තෙරස චතුක්කඤ්ච ඉති යමිදං
ද්වාදසුත්තරසුත්තසතෙ සඞ්ගායිත්වා සමාදහිංසු පුරා
අරහන්තො චිරට්ඨිතියා තමාහු නාමෙන **ඉති වුත්තං** ති

**ඉතිවුත්තක පාළි නිට්ඨිතා.**

## 4 - 13

අර්ථය:-

**භික්ඛවෙ**, මහණෙනි; **තථාගතෙන**, තථාගතයන් වහන්සේ විසින්; **ලොකො**, ලෝකයතෙම; **අභිසම්බුද්ධො**, ස්වයම්භුඥානයෙන් අවබෝධ කරන ලද්දේ ය; **ලොකස්මා**, ලෝකයෙන්; **තථාගතො**, තථාගත තෙම; **විසංයුත්තො**, වෙන්වූයේ ය; (තත් ප්‍රතිබද්ධ සංයෝජනයන් දුරුකළ හෙයිනි) **ලොක සමුදයො**, ලොකොත්පත්තිය නම්වූ තණ්හාව; **තථාගතෙන**, තථාගතයන් වහන්සේ විසින් **පහීනො**, දුරුකරන ලද්දේ ය; (බෝධි මණ්ඩයෙහි අග්‍රීත් මාර්ගඥානයෙන් ප්‍රහීන කරනලද්දේ ය යුසේ යි) **ලොක නිරොධො**, ලොකනිරොධ නම් වූ නිර්වාණය; **සච්ඡිකතො**, ප්‍රත්‍යක්ෂ කරනලද්දේ ය; **ලොකනිරොධගාමිනිපටිපදා**, ලෝකය නැති කිරීමට පමුණුවන ප්‍රතිපදාව; (ශීල, සමාධි ප්‍රඥා සංඛ්‍යාත ශික්ෂාත්‍රය සඞ්ගෘහීතවූ ආර්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය යුසේ යි.) **භාවිතා**, වඩන ලද්දී ය.

**සදෙවකස්ස**, දෙවියන් සහිත වූ; **සමාරකස්ස**, මරුන් සහිත වූ; **සබ්‍රහ්මකස්ස**, බඹුන් සහිත වූ; **සස්සමණ බ්‍රාහ්මණියා**, මහණ බමුණන් සහිත වූ; **සදෙවමනුස්සාය**, දෙව්මිනිසුන් සහිත වූ; **ලොකස්ස**, ලෝකයා විසින්; **දිට්ඨං**, ඇසින් දක්නාලද රූපය ද; **සුතං**, කනින් අසනලද ශබ්දය ද; **මුතං**, ඝ්‍රාණ ජිහ්වා කාය යන ඉන්ද්‍රියයන්ගෙන් පැමිණ ගන්නාලද ගන්ධ රස සප්‍රෂ්ටව්‍යාරම්මණයද; **විඤ්ඤාතං**, සිතින් දැනගන්නාලද සැප දුක් ආදී ධර්මාරම්මණය ද; **පත්තං**, සොයා හෝ නොසොයා හෝ

පැමිණි අරමුණු ද; **පරියෙසිතං**, ප්‍රාප්ත වූ හෝ අප්‍රාප්ත වූ හෝ පර්‍යෙෂිත අරමුණු ද; **මනසා**, සිතින්; **අනුවිචරිතං**, සලකනලද; (සදෙවක ලෝකයා විසින්ය යු සේ යි) යම් අරමුණක් වේ ද; **යස්මා**, යම් හෙයකින්; **තං**, ඒ සියල්ල; **තථාගතෙන**, තථාගතයන් වහන්සේ විසින්; **අභිසම්බුද්ධං**, අවබෝධ කරනලදද; **තස්මා**, එහෙයින්; **තථාගතො ඉති වුච්චති**, තථාගතය යි කියනු ලැබේ;

**යං ච රත්තිං**, යම් වෙසඟපුණුපොහෝ දින රාත්‍රියෙක, **අභිසම්බුජ්ඣති**, චතුස්සත්‍යය අවබෝධ කෙරේ ද, **යං ච රත්තිං**, යම් වෙසඟපුණුපොහෝදින රාත්‍රියෙක; **පරිනිබ්බායති**, අනුපාදිසෙස පරිනිර්‍වාණ ධාතුවෙන් පිරිනිවේ ද; **එතස්මිං අන්තරෙ**, මේ අතරෙහි, (උපාදිසෙස අනුපාදිසෙස නිබ්බානධාතූන් අතරෙහි පන්සාලිස් අවුරුද්දක් මුළුල්ලෙහි ප්‍රථමබොධිය, මධ්‍යමබොධිය, පශ්චිමබොධිය යන කාල පරිච්ඡේදයෙහි ය යනු යි.) **යං**, යම් ධර්‍මයක් (සුත්තගෙය්‍යාදි ප්‍රභෙද ධර්‍මයක් ය යු සේ යි) **භාසති**, ප්‍රකාශ කෙරේ ද; (ලපති නිද්දිසති, යනු ද මේ අර්ථය මැයි.) මෙහි **භාෂණය**, නම්:- නිද්දෙස වශයෙන් දක්වීම යි. **ලපනය** නම්:- උද්දෙස වශයෙන් දක්වීමයි. **නිද්දිසනය** නම්:- පටිනිද්දෙස වශයෙන් දක්වීම යි., **තස්මා තථාගතොති වුච්චති**, එහෙයින් තථාගත යයි කියනු ලැබේ. (මේ අතරෙහි වදාළ තථාගත බුද්ධවචනය අර්ථ වශයෙන් ව්‍යඤ්ජන වශයෙන් පූර්‍වාපර වශයෙන් නිදෙස් වේ අඩු වැඩි නොවේ. සර්‍වප්‍රකාරයෙන් සම්පූර්‍ණ වේ. එකම මුද්‍රාවකින් ලස් කරනලද්දක් මෙන් ද, එක නැළියකින් මිණූ දෙයක් මෙන් ද, එක තරාදියකින් කිරූ දෙයක් මෙන් ද, සවලපවූ ද වෙනසක් නැතිව පවත්නේ ය යනු මෙයින් ප්‍රකාශ කෙරෙයි.)

**තථාගතො**, තථාගත තෙම; **යථාවාදී**, යම්සේ ප්‍රකාශ කෙරේ ද; **තථාකාරී**, එසේ ම කරන්නේ ය. (මේ ධර්‍මයෝ අකුසල් ය, සාවද්‍ය ය, විඥයන් විසින් ගර්හිත ය. ඔවුන් පිළිගෙන කළොත් අහිතපිණිස දුක්පිණිස පවතිය යි වදාළ

සේක් ද තමන් වහන්සේත් එය එසේ ම පිළිගෙන කරන හෙයින් යථාවාදී තථාකාරිත්වයෙන් යුක්තබව, කියන ලදි ) **යථාකාරී** තමන් වහන්සේ යම් සේ පිළිපන්නේ ද; **තථාවාදී**, ලෝකයාටත් එසේම ප්‍රකාශ කරන සේක. **තථාගතො**, තථාගත තෙම; **අභිභූ**, ගුණයෙන් ලෝකය මැඩ පවත්නේ ය. (භවාග්‍රයෙහි පටන් අවීචිය හිම්කොට සරසින් අනන්ත අප්‍රමාණ ලෝකධාතුවෙහි සීල සමාධි පඤ්ඤා විමුත්ති විමුත්තිඤාණදස්සන යන ගුණවලින් සියලු සත්වයන් අභිභවනය කෙරෙයි යනු දක්වූ අයුරු යි) **අනභිභූතො**, කිසිවකු විසිනුත් තමන්වහන්සේ ගුණයෙන් නොමඩනා ලද්දේ ය; **අඤ්ඤදත්ථු**, ඒකාන්තයෙන්; **දසො**, සියල්ල දක්නේ වෙයි; (දතයුතු සියල්ල කරතලාමලකයක් සෙයින් දක්නේ ය යු සේ යි.) **වසවත්ති**, සියල්ල තමන්වහන්සේ වසයෙහි පවත්නේ ය (මනාව පුරුදු කළ හෙයින් සියලු සමාපත්ති හා සිතත් වසඟ කෙරෙයි යු සේ යි) එහෙයින් තථාගත ය යි කියනු ලැබේ.

(මේ තථාගතයන් වහන්සේ) **සබ්බං ලොකං අභිඤ්ඤාය**, සියලු ත්‍රෛධාතුක ලොකසන්නිවාසය දැන; **සබ්බලොකෙ**, ඒ ලෝකයෙහි; **යථාතථං**, යථාතත්වය; (නොවෙනස්ව දැන) **සබ්බලොකවිසංයුත්තො**, සියලු ලෝකයෙන් මිදුණු සේක්; **සබ්බලොකෙ**, සියලු ලෝකයෙහි; **අනූපයො**, තෘෂ්ණා දෘෂ්ටි දෙකයන් නැති කළ සේක.

**සබ්බෙ**, සියලු ක්ලෙශමාරයන් ද; **සබ්බාභිභූ**, සියලු රූපාදි අරමුණු ද මැඩසිටිසේක්; **ධීරො**, ධෛර්‍ය සම්පන්න වූසේක්; **සබ්බගන්ථපපමොචනො**, සියලු ක්ලෙශග්‍රන්ථයන් දුරුකළ සේක්; **අස්ස**, උන්වහන්සේ විසින්; **අකුතොභයං**, කිසි තැනෙකිනුත් බියක් නැති; **නිබ්බානං**, නිවනවූ; **පරමා සන්ති** උතුම්වූ ශාන්තිපදය; **ඵුට්ඨා**, ඥානස්පර්ශයෙන් වළඳනා ලද්දී ය.

**ඛීණාසවො**, දුරුකළ චතුරාශ්‍රව ඇති; **එසො බුද්ධො**, මේ සර්වඥයන් වහන්සේ; **අනීඝො**, නිදුක්සේක; **ඡින්න**

**සංසයො**, සිඳිනලද සැක ඇතිසේක; **සබ්බකම්මක්ඛයප්පත්තො**, සියලු භවගාමී කර්‍මයන් ක්‍ෂය කළ සේක; **උපධිසංඛයෙ**, නිවන් අරමුණුකොට; **විමුත්තො**, අර්හත් ඵල විමුක්තියෙන් කෙලෙසුන් ගෙන් මිදුණුසේක;

**සො එසො භගවා**, ඒ මේ භාග්‍යවතුන් වහන්සේ; **බුද්ධො**, සියල්ල දත්සේක; **අනුත්තරො**, උතුම්වූ; **එසො සීහො**, මේ තථාගත ශ්‍රෙෂ්ඨයන් වහන්සේ; **සදෙවකස්ස ලොකස්ස**, දෙවියන් සහිත ලෝකයාට; **බ්‍රහ්මචක්කං**, ශ්‍රෙෂ්ඨවූ ධර්‍මචක්‍රය; **පවත්තයී**, පැවැත්වූසේක;

**ඉති**, මෙසේ (තථාගත ගුණ දැන) **දෙවා**, දෙව්වූ ද; **මනුස්සා ච**, මනුෂ්‍යවූ ද; **යෙ**, යම් කෙනෙක්; **බුද්ධං සරණං ගතා**, බුදුන් සරණ ගියා හු ද; (ඔවුහු) **මහන්තං**, පූජ්‍යවූ; **වීතසාරදං**, චතුර් වෛශාරද්‍යයෙන් විශාරදවූ; **තං**, උන්වහන්සේ කරා; **සඞ්ගම්ම**, පැමිණ; **නමස්සන්ති**, වඳිත්;

**දමයතං**, ඉන්ද්‍රිය දමනය ඇත්තවුන් අතුරෙන්; **සෙට්ඨො දන්තො**, ශ්‍රෙෂ්ඨ දාන්තයෙක්වූ; **සමයතං**, ශාන්ත පැවතුම් ඇත්තවුන් අතුරෙන්; **සන්තො ඉසි**, ශාන්ත සෘෂිවරයෙක්වූ; **මොචයතං**, කෙලෙසුන්ගෙන් මුදවන්නවුන් අතුරෙන්; **අග්ගො මුත්තො**, ශ්‍රෙෂ්ඨ මුක්තකයෙක්වූ (නුඹවහන්සේ) **පාරයතං**, සසරින් එතර කරවන්නවුන් අතුරෙන්; **වරො තිණ්ණො**, ශ්‍රෙෂ්ඨ උත්තීර්‍ණයෙකැ යි කි යා ද;

**සදෙවකස්මිං ලොකස්මිං**, දෙවියන් සහිත ලෝකයෙහි; **තෙ**, නුඹවහන්සේට; **පටිපුග්ගලො**, සමාන පුද්ගලයෙක්; **නත්ථි ඉති**, නැතැයි කියා; **ඉතිහි**, මේ ප්‍රකාරයෙනුත්; **මහන්තං**, ශ්‍රෙෂ්ඨවූ; **වීතසාරදං**, පහවූ තැතිගැනුම් ඇති නොහොත් විශාරදවූ; **එතං**, ඔබට; **නමස්සන්ති**, වඳිත්;

**භාවය** සුගම යි.

**ධර්මවිස්තර:-**

**ලෝක —**

සත්ත්වලෝකය, සංස්කාර ලෝකය, අවකාශ ලෝකය යි ලෝකය ත්‍රිවිධ වේ. එසේ ම කාමලෝකය, රූපලෝකය, අරූපලෝකය යි ද, ස්වර්ගලෝකය, මර්ත්‍යලෝකය, පාතාල ලෝකයයි ද ලෝකය ත්‍රිවිධ වේ. ඒකවොකාරභවය, චතුවොකාරභවය, පඤ්චවොකාර භවය යි ද භවනාමයෙනුදු ත්‍රිවිධ වේ.

පොළොවෙන් උඩ ඌර්ධ්වලෝකයයි ද, එහි සුරා සුර බ්‍රහ්මාදි හැම සත්ත්වයෝම සත්ත්වගුණය මහත් කොට ඇත්තාහයි ද, පොළෝතෙලෙන් යට පාතාලලෝක යයි ද. එහි හැම සත්ත්වයෝම තමොගුණය බහුල කොට ඇත්තාහයි ද මෙදතුරෙහි මර්ත්‍යලෝකයයි ද, එහි හැම සත්ත්වයෝම රජොගුණය බහුල කොට ඇත්තාහයි ද, දර්ශනශාස්ත්‍රඥ යන්ගේ මතය යි.

කුශලාකුශල කර්මවිපාකයන්ට අනුව සැප දුක් විඳිනා අප්‍රමාණ උපාදින්නක සත්ත්වසන්තානය සත්ත්වලෝකය යි ද, භූමි පර්වත වෘක්ෂ ලතා ආදී සෘතු ගුණයන්ගෙන් හටගත් අනුපාදින්නක වස්තු සන්තතිය සංස්කාර ලෝකය යි ද, (සත්ත්වලෝකය ද සංස්කාර ලෝකයට ඇතුළත් වේ.) මේ සියලු සත්ත්වයන්ගේ පැවැත්මට හේතුවූ චක්‍රවාට කුහරය අවකාශ ලෝකයයි ද බුද්ධධර්මයෙහි සඳහන් වේ.

නවද ස්කන්ධලෝක, ධාතුලෝක, ආයතනලෝක, විපත්තිභවලෝක, විපත්තිසම්භවලෝක, සම්පත්තිභවලෝක, සම්පත්තිසම්භවලෝක යන මේ වශයෙනුදු ලෝකය විවිධ වන්නේ ය. ලුජ්ජන පලුජ්ජනාර්ථයෙන් හෙවත් විනාශ වන වෙසෙසින් විනාශ වන අර්ථයෙන් ලෝක නම් වන කල කුමක්හෙයින් පඤ්චස්කන්ධය ම ලෝක නාමයෙන් ගැනේ ද යත් ?

මෙහි පඤ්චස්කන්ධයන් කෙරෙහිම ලෝකශබ්දය නිරූඪ හෙයිනි. විනාශ නොවන වස්තුවක් ලෝකයට ඇතුළත් නොවේ. නිවන හා අහසත් හේතුප්‍රත්‍යයෙන් හටනොගන්නා හෙයින් ලෝකයට අයත් නොවූ අවිනශ්වරවූ වස්තු ය. විනාශ වන ලෝකය පමණක් දුක්ඛසත්‍යයට ඇතුළත් ය.

**සදෙවකා, සමාරකා, සබ්‍රහ්මකා, සස්සමණ බ්‍රාහ්මණියා පජාය, සදෙවමනුස්සාය.**

දෙවියන් සහිතවූයේ සදෙවකයි. සෙසු තන්හි ද මෙසේ යි. සදෙවක වචනයෙන් චාතුර්මහාරාජිකයෙහි පටන් පරිනිර්මිත වශවර්ති දිව්‍යලෝකය දක්වා පස් කාමාවචර දෙවියන් ගැනෙයි. සමාරක වචනයෙන් සවන දෙව්ලොවවූ පරනිර්මිත වසවර්ති දිව්‍යලෝකය ගැනෙයි.

මෙහි මාරදිව්‍යපුත්‍ර තෙමේ එක් ප්‍රධානයෙකි. එහෙයින් ඔහුට පජාපති ය යි ද කියනු ලැබේ. මොහු පරනිර්මිත වසවර්ති දෙව්ලොව කොටස් දෙකකට බෙදා එයින් එක් කොටසක් තමාට වසඟකොටගෙන තමන්ගේ බලය පාමින් වසන දාමරික දිව්‍යපුත්‍රයෙකි. මොහුගේ පක්ෂයෙහි සෙසු දෙව්පිරිස ද එසේම දාමරිකයෝ ය. පරනිර්මිත වසවර්තියෙහි ප්‍රධාන රජතෙමේ වසවර්ති නම් වෙයි. මොහු ඇතුළු පිරිස සදෙවක වචනයට ඇතුළත් වේ. **සමාරක** යනනෙන් මාරයා සහිත මාර පිරිස ම ගැනේ.

**සබ්‍රහ්මක** පදයෙන් බ්‍රහ්මකායික බඹලොව පටන් රූපී බ්‍රහ්මයන් ගැනේ. **සස්සමණබ්‍රාහ්මණී** පදයෙන් ශාසනයට ප්‍රතිවිරුද්ධවූ මහණබමුණන් හා ශාසනයට ඇතුළත්වූ සමිතපාපීවූ ද බාහිතපාපී වූ ද මහණ බමුණන් ගැනේ. **පජා** ශබ්දයෙන් සියලු සත්වලෝකයෙහි ප්‍රජාව ගැනේ. **සදෙවමනුස්ස** පදයෙන් සම්මුති දෙවියන් හා අවශෙෂ මිනිසුන් ද ගනුලැබේ. සම්මුති දෙවියෝ නම්:- රජු හා රජකුමරුවෝ යි. එසේ ම **සදෙවමනුස්ස** යන වචනයෙන් දෙව මාර බ්‍රහ්මයන් සහිතවූ සියලු සත්වලෝකය ගණන් ගනු ලැබේ.

තවත් ක්‍රමයකින් **සදෙවක** ශබ්දයෙන් අරූපාවචර දෙව්ලොව ගන්නාලද්දේ ය. **සමාරක** ශබ්දයෙන් සවැදෑරුම් කාමාවචර දෙව්ලොව ද, **සබ්‍රහ්ම** ශබ්දයෙන් රූපී බ්‍රහ්ම ලොක ද, **සස්සමණබ්‍රාහ්මණාදි** වචනයෙන් සම්මුති දෙවියන් සහිතවූ අවශෙෂ සත්වලෝක ද සලකනලද්දේ ය යනු එක් මතයකි.

උසස්ම පරිච්ඡේදයෙන් ගත් කල්හි **සදෙවක** යන වචනයෙන්ම සියලු සත්වලෝකය විෂයකොට ඇති භාග්‍යවතුන් වහන්සේගේ සර්වඥතාඥනය ප්‍රකාශවත් ම **මාර** යන්නෙන් සවැනි කාමාවචර දිව්‍යලෝකයෙහි අධිපති වූ වසවර්ති මාරයා ද, **බ්‍රහ්ම** පදයෙන් ඔහුටත් වඩා අධිපතිවූ දසැඟිල්ලෙන් දශදහසක් සක්වළ ආලෝකය පැතිරවියහැකි අතිශයින් මහානුභාවසම්පන්න බ්‍රහ්මයන් ද, සෙසු වචනවලින් දිවැස් ඇති පරසිත් දන්නා නුවණ ඇති සෘද්ධිමත් බොහෝ මහණබමුණෝ ද ගනුලැබෙත්. මෙසේ අතිප්‍රපඤ්චකථා කුමට යැ? අනන්තාපරියන්තවූ ලෝක-ධාතුවල සත්වප්‍රජාව බුද්ධඥන විෂයක වේ ය යි මෙහි ලා තාත්පර්‍යයෙන් සැලකියයුතු.

තවද පෞරාණිකාචාර්‍යවරයෝ මෙහි ලා මෙසේ ද විස්තරයක් කෙරෙති. එනම් "සදෙවකස්ස" යන්නෙන් දෙවියන් සහිත සියලු සත්වලෝකය ද, "සමාරකස්ස" යන්නෙන් මාරයා සහිත සෙසු ලෝක ද, "සබ්‍රහ්මකස්ස" යන්නෙන් බ්‍රහ්මයන් සහිත සෙසු ලෝක ද යි මෙසේ භවත්‍රයට ඇතුළත් සියලු සත්වයන් මේ පදතුනට ඇතුළත් කොට යළිත් "සස්සමණබ්‍රාහ්මණියාපජාය සදෙවමනුස්සාය" යන පද දෙකෙන් ඒ සියල්ලම ඇතුළත් වන සේ ගනිමින් මෙසේ මේ පස්පදයෙන් සත්වලොක සංස්කාරලොක ඕකාසලොක යන ලොකත්‍රයට ම ඇතුළත් සියලු සත්ව සංස්කාරයන් ගැනෙන බව ප්‍රකාශ කෙරෙති යි දතයුතු.

**ඉතිවුත්තක පාළිය හා එහි අර්ථ භාව ධර්මවිස්තර මෙතෙකින් සමාප්තයි.**

"Wherever the Buddha's teachings have flourished,
either in cities or countrysides,
people would gain inconceivable benefits.
The land and people would be enveloped in peace.
The sun and moon will shine clear and bright.
Wind and rain would appear accordingly,
and there will be no disasters.
Nations would be prosperous
and there would be no use for soldiers or weapons.
People would abide by morality and accord with laws.
They would be courteous and humble,
and everyone would be content without injustices.
There would be no thefts or violence.
The strong would not dominate the weak
and everyone would get their fair share."

**※ THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF
THE MAHAYANA SCHOOL ※**

## Taking Refuge with Bodhichitta

**I go for refuge, until I am enlightened,**
**to the Buddha, the Dharma and the Sangha.**
**Through the merit I create by practicing giving and the other perfections,**
**may I quickly attain the state of Buddhahood for the benefit of all sentient beings.**

## The Prayers of the Bodhisattva

**With the wish to free all beings,**
**I will always go for refuge**
**to the Buddha, Dharma and Sangha**
**till I reach full enlightenment.**
**Enthused by the compassion and wisdom,**
**Today, in Buddha's presence,**
**I generate the Mind of Enlightenment,**
**for the sake of all sentient beings.**
**For as long as space remains,**
**and as long as sentient being remain,**
**until then, may I too remain**
**to dispel the sufferings of all beings.**

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

*** The Vows of Samantabhadra ***

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

*** The Vows of Samantabhadra Avatamsaka Sutra ***

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

## NAMO AMITABHA
## 南無阿彌陀佛

【斯里蘭卡文：ITIVUTTAKA PALI OF KHUDDAKA NIKAYA 的解釋】

財團法人佛陀教育基金會　印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website:http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

නොමිලයේ බෙදාදීම පිණිසයි.

Printed in Taiwan

3,000 copies; November 2014

SR054-12720